බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 17

# සූත්‍රාන්ත පිටකයෙහි

11 වන ග්‍රන්ථය

# සංයුත්තනිකාය

පඤ්චමභාගය (1)

## මහාවග්ගය

ත්‍රිපිටකපරිවර්තන සභාවෙහි
සංයුත්තනිකාය ශෝධක මණ්ඩලය විසින් සිංහලභාෂාවෙන් පරිවර්තිත වැ

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

විසින් පාඨශෝධන පූර්වක වැ සංස්කරණය කරන ලදී.

ශ්‍රී බු. ව. 2550
රාජ්‍ය වර්‍ෂ. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 17 (i)

The Eleventh Book in the

**Suttanta-Pitaka**

**11**

# SAMYUTTANIKĀYA(V-1)

## MAHĀVAGGA

With the Sinhala Translation by

**The Samyuttanikāya Editorial Board of**
**The Tripitaka translation Committee**

Edited by

**The Tripitaka Editorial Board**

Free Distribution www.aathaapi.org

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මසාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## <u>බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා</u>
## <u>පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ</u>
## <u>මහා ධර්ම දානමය පුණ්‍යකර්මය</u>

**“අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං”**

“කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී”

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්‍වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල ‘සද්ධා’ නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව (“සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං”) මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය

මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ

සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද

පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද

අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,

සමින්ද රණසිංහ.

2009.06.28

## සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

පඤ්චමො භාගො

## මහාවග්ගො

(1)

## සූත්‍රාන්තපිටකයෙහි

# සංයුත්තනිකාය

පඤ්චම භාගය

## මහාවර්ගය

(1)

Free Distribution www.aathaapi.org

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 13 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:13 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන
# CONTENTS


| | පිටු |
|---|---|
| සංස්කාරක නිවේදනය ... .. ... | xiii – xiv |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... | xv |
| සංක්ෂිප්ත නිරූපණය .. ... ... | xvii |
| පාළි හෝඩිය ... ... ... | xix |
| මහාවග්ග (පූර්වභාග) විෂය සූචි ... ... | xxi – xxxv |
| පෙළ හා පරිවර්තනය ... ... ... | 2 – 443 |
| ගාථාදිපාද – සූචි ... ... | 445 |
| සඤ්ඤානාම අනුක්කමණිකා ... ... | 447– 448 |
| විසෙසපදානුක්කමණිකා ... ... ... | 449 – 460 |
| ශුද්ධාශුද්ධතා නිරූපණය ... ... ... | 461 – 462 |
| බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා .. ... | 463 – 466 |




Free Distribution www.aathaapi.org

# සංස්කාරක නිවේදනය

බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලායෙහි සතළොස් (17) වැනි ග්‍රන්ථය වූයේ සංයුත්ත නිකායෙහි තෙසාලිස් වැනි **මග්ගසංයුත්තයෙහි** පටන් **සච්චසංයුත්තය** අවසන් කොට ඇති සංයුත්ත දෙළොස කින් ප්‍රතිමණ්ඩිත වූ **මහාවග්ග** යයි.

සංයුත්තනිකායේ පඤ්චම භාගයය වූ මහාවග්ගය සිංහලභාෂායෙන් නැඟීම සඳහා ශ්‍රී ලංකාබෞද්ධමණ්ඩලය විසින් ආරාධිත වූවාහු **හෑගොඩ ධම්මින්ද, ගබ්බෙල උපතිස්ස** යන ස්ථවිරයන් වහන්සේ දෙනම වෙති. ඒ තෙරවරුන් විසින් යථාකාලයෙහි සිංහල භාෂාවට නගන ලද සංයුත්ත මහාවග්ගය සංයුත්තනිකාය සංශෝධකමණ්ඩලයට පත්කරනු ලැබූ පණ්ඩිත හෑගොඩ ධම්මින්ද නායක ස්ථවිරයන් වහන්සේ ය, පණ්ඩිත වතුගෙදර අමරසීහ නායකස්ථවිරයන් වහන්සේ ය, පණ්ඩිත ගලගම සරණඞ්කර ස්ථවිරයන් වහන්සේ ය යන ස්ථවිරවරුන් විසින් ලිපිදෝෂ බැහැර කොට පාඨාන්තර දක්වමින් පෙළ ද ලියා සකස් කරන ලද්දේ ය. යථානුරූප වැ සූත්‍රනාම හා සූත්‍රසංඛ්‍යා ද ඒ ස්ථවිරවරුන් විසින් මැ දක්වන ලද්දේ ය. මුද්‍රණ අවස්ථාවට පැමිණ ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයෙහි බහුශ්‍රුත මහතෙරවරුන් විසින් මහදුත්සාහයෙන් පාඨශෝධනය හා සිංහල පරිවර්තන සංස්කරණය ද සිදු කෙරෙමින් ගාථාදිපාද, සංඥානාම, විශේෂපදානුක්‍රමණිකා ද යොදන ලද්දේ විය.

තව ද සංයුත්ත මහාවග්ගය එක් මැ ග්‍රන්ථයක් ලෙස මුද්‍රණය කැරැවීමට ශ්‍රී ලංකා බෞද්ධමණ්ඩලය විසින් සම්මත කරන ලද නමුදු මුද්‍රණ අවස්ථාවට පැමිණි කල්හි සංයුත්තනිකාය පස්වැනි භාගය පරිහරණයට දුෂ්කර සේ මහත් වන බව පෙනුණු හෙයින් මහාවර්ගයේ 'මග්ගසංයුත්ත බොජ්ඣඞ්ග -සතිපට්ඨාන- ඉන්ද්‍රිය- සම්මප්පධාන සංයුත්ත යන සංයුත්ත සය පඤ්චමභාගයේ ප්‍රථමකාණ්ඩය ලෙස ද, ඉද්ධිපාදසංයුත්තයේ පටන් ශේෂය ද්විතීය කාණ්ඩය ලෙස ද පළ කරවන්නට නියම කරගතුම්හ. එහෙයින් සංයුත් සඟිය සඳහා ලියයුතු සංඥාපනය ද දෙවැනි කාණ්ඩයෙහි ලා දක්වනු ඇත.

ශ්‍රී ලංකාබෞද්ධමණ්ඩලය මඟින් සමාරබ්ධ වූ ත්‍රිපිටක බුද්ධධර්මය සියබසින් පළකරවාලීමෙ සත්කාර්‍යය සපුරාලීම සඳහා **ශ්‍රීමත් ජනාධිපති** ජයවර්ධන උතුමාණන්ගෙන් ලැබෙන අනුග්‍රහය ද, ගරු **අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස** මැතිතුමාගේ උපස්තම්භය ද, ගරු සංස්කෘතික අමාත්‍ය ඊ. ඇල්. බී. හුරුල්ලේ මැතිතුමාගේ සංවිධානය ද සමස්ත බෞද්ධ ජනතාවගේ සාතිශය සම්භාවනාවට විශේෂයෙන්



Free Distribution www.aathaapi.org

හිමිවිය යුතු ය. එසේ ම සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වූ **සෝමපාල ජයවර්ධන** මහතාණන්ගේ බුද්ධිපූර්වක සංවිධානය නිසා ත්‍රිපිටක මුද්‍රණය ඉතා ඉක්මනින් නිමහම් කරවාලීමට හැකිවී යයි කියයුතුය. සද්ධර්මප්‍රවර්තක කුශලක්‍රියාවෙහි සහාය වන '**තිසර මුද්‍රණාලයාධිකාරීන්** ඇතුළු හැම දෙන සුබභාගී වෙත්වා'යි ආශංසනය කරම්හ.

මෙ වගට, ශාස්ත්‍රශාසනෝදයකාරී,

**ලබුගම ලඞ්කානන්ද**

මහානායක ස්ථවිර

ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

$\frac{2525}{1982}$ ජුනිමස 12 වැනි දින

මහානායක චාරිකාරාමය

115, විජයරාම මාවත

කොළඹ 7.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක :**

අග්‍රමහාපණ්ඩිත, බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති :**

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය, කෝදාගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණලඞ්කාවෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වර, ලබුගම ශ්‍රී ලඞ්කානන්ද—කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝ සභාවෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක :**

කිරුළපන පූර්වාරාමාධිපති හා අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීයපණ්ඩිත, රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක — කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභාවෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී-කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභාවෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ — මාකඩවර, රේවත පරිවෙණාධිපති රාජකීයපණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති, රාජකීයපණ්ඩිත, කරඳන ශ්‍රී ප්‍රඥාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි, ත්‍රිපිටක අංශයෙහි මහාචාර්‍ය, ශාස්ත්‍රාචාර්‍ය, රාජකීයපණ්ඩිත, ත්‍රිපිටකාචාර්‍ය උඩුවේ ඤාණානන්ද ස්ථවිරයන් වහන්සේ.

**ලේකම් :**

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල—කොළඹදිසාවෙහි ප්‍රධාන සඞ්ඝ නායක ස්ථවිරයන් වහන්සේ.



Free Distribution www.aathaapi.org

# සංකෙත නිරූපණය

සී 1. - පැල්මඩුල්ල මහාවිහාරයෙහි පුස්කොළ පොත

සී 2. - ගාල්ල පරමානන්ද විහාරයෙහි පුස්කොළ පොත

සිමු. - සිංහලාක්ෂර මුද්‍රිත සංයුත්තනිකාය

ස්‍යා. - තායයක්ෂර මුද්‍රිත සංයුත්තනිකාය

මජසං. - බුරුමරට ඡට්ඨසංගීතිශොධිත සංයුත්තනිකාය

PTS. - Pali Text Society Edition



Free Distribution www.aathaapi.org

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

## VOWELS

අ a   ආ ā   ඉ i   ඊ ī   උ u   ඌ ū   එ e   ඔ o

## CONSONANTS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa | | |
| | ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña | | |
| | ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa | | |
| | ත ta | ථ tha | ද da | ධ dha | න na | | |
| | ප pa | ඵ pha | බ ba | භ bha | ම ma | | |
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

## CONJUNCT-CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ඤ්හ ñha | ද්ද dda | ම්බ, ම්බ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ඤ්ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ ñja | ද්ව, ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

ා ā   ි i   ී ī   ු ු u   ූ ූ ū   ෙ e   ෙ ා o



Free Distribution www.aathaapi.org

# සංයුත්තනිකායො

## පඤ්චමභාගො – පඨම කණ්ඩො

# මහාවග්ග (1) – විෂය සූචි

## 1. මග්ගසංයුත්තං 2 – 139

### 1. අවිජ්ජාවග්ගො 2 – 19


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අවිජ්ජා | සුත්තං | .. | .. | 2 – 3 |
| 2. | උපඩ්ඪ | ,, | .. | .. | 4 – 7 |
| 3. | සාරිපුත්ත | ,, | .. | .. | 6 – 7 |
| 4. | බ්‍රාහ්මණ | ,, | .. | .. | 8 – 11 |
| 5. | කිමත්ථිය | ,, | .. | .. | 10 – 13 |
| 6. | භික්ඛු | ,, | .. | .. | 12 – 13 |
| 7. | දුතියභික්ඛු | ,, | .. | .. | 12 – 13 |
| 8. | විභඞ්ග | ,, | .. | .. | 14 – 17 |
| 9. | සුක | ,, | .. | .. | 16 – 19 |
| 10. | නන්දිය | ,, | .. | .. | 18 – 19 |


### 2. විහාරවග්ගො 20 – 29


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | විහාර | සුත්තං | .. | .. | 20 – 21 |
| 2. | දුතියවිහාර | ,, | .. | .. | 22 – 23 |
| 3. | සෙඛ | ,, | .. | .. | 22 – 23 |
| 4. | උප්පාද | ,, | .. | .. | 24 – 25 |
| 5. | දුතියඋප්පාද | ,, | .. | .. | 24 – 25 |
| 6. | පරිසුද්ධ | ,, | .. | .. | 24 – 25 |
| 7. | දුතියපරිසුද්ධ | ,, | .. | .. | 24 – 25 |
| 8. | කුක්කුටාරාම | ,, | .. | .. | 26 – 27 |
| 9. | දුතියකුක්කුටාරාම | ,, | .. | .. | 26 – 27 |
| 10. | තතියකුක්කුටාරාම | ,, | .. | .. | 28 – 29 |


### 3. මිච්ඡත්තවග්ගො 30 – 37


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | මිච්ඡත්ත | සුත්තං | .. | .. | 30 – 31 |
| 2. | අකුසලධම්ම | ,, | .. | .. | 30 – 31 |
| 3. | පටිපදා | ,, | .. | .. | 30 – 31 |
| 4. | දුතියපටිපදා | ,, | .. | .. | 32 – 33 |
| 5. | අසප්පුරිස | ,, | .. | .. | 32 – 33 |
| 6. | දුතියඅසප්පුරිස | ,, | .. | .. | 34 – 35 |
| 7. | කුම්භ | ,, | .. | .. | 34 – 35 |
| 8. | සමාධි | ,, | .. | .. | 34 – 35 |
| 9. | වෙදනා | ,, | .. | .. | 36 – 37 |
| 10. | උත්තිය | ,, | .. | .. | 36 – 37 |




Free Distribution www.aathaapi.org

## විසය සුචි

### 4. පටිපත්තිවග්ගො 38 – 43


| | | | |
|---|---|---|---|
| 1. | පටිපත්ති | සුත්තං | 38 – 39 |
| 2. | පටිපන්න | ,, | 38 – 39 |
| 3. | විරද්ධ | ,, | 38 – 39 |
| 4. | පාරඞ්ගම | ,, | 38 – 41 |
| 5. | සාමඤ්ඤ | ,, | 40 – 41 |
| 6. | දුතියසාමඤ්ඤ | ,, | 40 – 41 |
| 7. | බ්‍රහ්මඤ්ඤ | ,, | 40 – 41 |
| 8. | දුතියබ්‍රහ්මඤ්ඤ | ,, | 42 – 43 |
| 9. | බ්‍රහ්මචරිය | ,, | 42 – 43 |
| 10. | දුතියබ්‍රහ්මචරිය | ,, | 42 – 43 |


### 5. අඤ්ඤතිත්ථියපෙය්‍යාලො 44 – 49


| | | | |
|---|---|---|---|
| 1. | විරාග | සුත්තං | 44 – 45 |
| 2. | සංයොජන | ,, | 44 – 45 |
| 3. | අනුසය | ,, | 44 – 47 |
| 4. | අද්ධාන | ,, | 46 – 47 |
| 5. | ආසවක්ඛය | ,, | 46 – 47 |
| 6. | විජ්ජාවිමුත්ති | ,, | 46 – 47 |
| 7. | ඤාණදස්සන | ,, | 48 – 49 |
| 8. | අනුපාද | ,, | 48 – 49 |


### 6. සූරියපෙය්‍යාලො 50 – 57


| | | | |
|---|---|---|---|
| 1. | කල්‍යාණමිත්ත | සුත්තං | 50 – 51 |
| 2. | සීල | ,, | 50 – 51 |
| 3. | ඡන්ද | ,, | 52 – 53 |
| 4. | අත්ත | ,, | 52 – 53 |
| 5. | දිට්ඨි | ,, | 52 – 53 |
| 6. | අප්පමාද | ,, | 52 – 53 |
| 7. | යොනිසො | ,, | 52 – 53 |
| 8. | දුතියකල්‍යාණමිත්ත | ,, | 54 – 55 |
| 9. | දුතියසීල | ,, | 54 – 55 |
| 10. | දුතියඡන්ද | ,, | 54 – 55 |
| 11. | දුතියඅත්ත | ,, | 54 – 55 |
| 12. | දුතියදිට්ඨි | ,, | 56 – 57 |
| 13. | දුතියඅප්පමාද | ,, | 56 – 57 |
| 14. | දුතියයොනිසො | ,, | 56 – 57 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි

### 7. එකධම්මපෙය්‍යාලො 58 – 65


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | කල්‍යාණමිත්ත | සුත්තං | .. | .. | 58 – 59 |
| 2. | සීල | ,, | .. | .. | 58 – 59 |
| 3. | ඡන්ද | ,, | .. | .. | 58 – 59 |
| 4. | අත්ත | ,, | .. | .. | 58 – 59 |
| 5. | දිට්ඨි | ,, | .. | .. | 60 – 61 |
| 6. | අප්පමාද | ,, | .. | .. | 60 – 61 |
| 7. | යොනිසො | ,, | .. | .. | 60 – 61 |
| 8. | දුතියකල්‍යාණමිත්ත | ,, | .. | .. | 60 – 61 |
| 9. | දුතියසීල | ,, | .. | .. | 62 – 63 |
| 10. | දුතියඡන්ද | ,, | .. | .. | 62 – 63 |
| 11. | දුතියඅත්ත | ,, | .. | .. | 62 – 63 |
| 12. | දුතියදිට්ඨි | ,, | .. | .. | 62 – 63 |
| 13. | දුතියඅප්පමාද | ,, | .. | .. | 62 – 63 |
| 14. | දුතියයොනිසො | ,, | .. | .. | 64 – 65 |


### 8. දුතියඑකධම්මපෙය්‍යාලො 66 – 73


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | කල්‍යාණමිත්ත | සුත්තං | .. | .. | 66 – 67 |
| 2. | සීල | ,, | .. | .. | 66 – 67 |
| 3. | ඡන්ද | ,, | .. | .. | 66 – 67 |
| 4. | අත්ත | ,, | .. | .. | 66 – 67 |
| 5. | දිට්ඨි | ,, | .. | .. | 68 – 69 |
| 6. | අප්පමාද | ,, | .. | .. | 68 – 69 |
| 7. | යොනිසො | ,, | .. | .. | 68 – 69 |
| 8. | දුතියකල්‍යාණමිත්ත | ,, | .. | .. | 68 – 69 |
| 9. | දුතියසීල | ,, | .. | .. | 70 – 71 |
| 10. | දුතියඡන්ද | ,, | .. | .. | 70 – 71 |
| 11. | දුතියඅත්ත | ,, | .. | .. | 70 – 71 |
| 12. | දුතියදිට්ඨි | ,, | .. | .. | 70 – 71 |
| 13. | දුතියඅප්පමාද | ,, | .. | .. | 70 – 71 |
| 14. | දුතියයොනිසො | ,, | .. | .. | 72 – 73 |


### 9. ගඞ්ගාපෙය්‍යාලො 74 – 79


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පාචීනනින්න | සුත්තං | .. | .. | 74 – 75 |
| 2. | දුතියපාචීනනින්න | ,, | .. | .. | 74 – 75 |
| 3. | තතියපාචීනනින්න | ,, | .. | .. | 74 – 75 |
| 4. | චතුත්ථපාචීනනින්න | ,, | .. | .. | 74 – 75 |
| 5. | පඤ්චමපාචීනනින්න | ,, | .. | .. | 76 – 77 |
| 6. | ඡට්ඨපාචීනනින්න | ,, | .. | .. | 76 – 77 |
| 7. | සමුද්දනින්න | ,, | .. | .. | 76 – 77 |
| 8. | දුතියසමුද්දනින්න | ,, | .. | .. | 76 – 77 |
| 9. | තතියසමුද්දනින්න | ,, | .. | .. | 76 – 77 |
| 10. | චතුත්ථසමුද්දනින්න | ,, | .. | .. | 78 – 79 |
| 11. | පඤ්චමසමුද්දනින්න | ,, | .. | .. | 78 – 79 |
| 12. | ඡට්ඨසමුද්දනින්න | ,, | .. | .. | 78 – 79 |




Free Distribution www.aathaapi.org

## 10. දුතියගඞ්ගාපෙය්‍යාලො 80 – 85


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පාචීනනින්න | සුත්තං | .. | .. | 80 – 81 |
| 2. | දුතියපාචීනනින්න | ,, | .. | .. | 80 – 81 |
| 3. | තතියපාචීනනින්න | ,, | .. | .. | 80 – 81 |
| 4. | චතුත්ථපාචීනනින්න | ,, | .. | .. | 80 – 81 |
| 5. | පඤ්චමපාචීනනින්න | ,, | .. | .. | 82 – 83 |
| 6 | ඡට්ඨපාචීනනින්න | ,, | .. | .. | 82 – 83 |
| 7. | සමුද්දනින්න | ,, | .. | .. | 82 – 83 |
| 8. | දුතියසමුද්දනින්න | ,, | .. | .. | 82 – 83 |
| 9. | තතියසමුද්දනින්න | ,, | .. | .. | 82 – 83 |
| 10. | චතුත්ථසමුද්දනින්න | ,, | .. | .. | 84 – 85 |
| 11. | පඤ්චමසමුද්දනින්න | ,, | .. | .. | 84 – 85 |
| 12. | ඡට්ඨසමුද්දනින්න | ,, | .. | .. | 84 – 85 |


## 11. තතියගඞ්ගාපෙය්‍යාලො 86 – 91


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පාචීනනින්න | සුත්තං | .. | .. | 86 – 87 |
| 2. | දුතියපාචීනනින්න | ,, | .. | .. | 86 – 87 |
| 3. | තතියපාචීනනින්න | ,, | .. | .. | 86 – 87 |
| 4. | චතුත්ථපාචීනනින්න | ,, | .. | .. | 86 – 87 |
| 5. | පඤ්චමපාචීනනින්න | ,, | .. | .. | 88 – 89 |
| 6. | ඡට්ඨපාචීනනින්න | ,, | .. | .. | 88 – 89 |
| 7. | සමුද්දනින්න | ,, | .. | .. | 88 – 89 |
| 8. | දුතියසමුද්දනින්න | ,, | .. | .. | 88 – 89 |
| 9. | තතියසමුද්දනින්න | ,, | .. | .. | 88 – 89 |
| 10. | චතුත්ථසමුද්දනින්න | ,, | .. | .. | 90 – 91 |
| 11. | පඤ්චමසමුද්දනින්න | ,, | .. | .. | 90 – 91 |
| 12. | ඡට්ඨසමුද්දනින්න | ,, | .. | .. | 90 – 91 |


## 12. චතුත්ථගඞ්ගාපෙය්‍යාලො 92 – 97


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පාචීනනින්න | සුත්තං | .. | .. | 92 – 93 |
| 2. | දුතියපාචීනනින්න | ,, | .. | .. | 92 – 93 |
| 3. | තතියපාචීනනින්න | ,, | .. | .. | 92 – 93 |
| 4. | චතුත්ථපාචීනනින්න | ,, | .. | .. | 92 – 93 |
| 5. | පඤ්චමපාචීනනින්න | ,, | .. | .. | 92 – 93 |
| 6. | ඡට්ඨපාචීනනින්න | ,, | .. | .. | 94 – 95 |
| 7. | සමුද්දනින්න | ,, | .. | .. | 94 – 95 |
| 8. | දුතියසමුද්දනින්න | ,, | .. | .. | 94 – 95 |
| 9. | තතියසමුද්දනින්න | ,, | .. | .. | 94 – 95 |
| 10. | චතුත්ථසමුද්දනින්න | ,, | .. | .. | 96 – 97 |
| 11. | පඤ්චමසමුද්දනින්න | ,, | .. | .. | 96 – 97 |
| 12. | ඡට්ඨසමුද්දනින්න | ,, | .. | .. | 96 – 97 |




Free Distribution www.aathaapi.org

විසය සූචි

## 13. අප්පමාදවග්ගො 98 – 105


| | | | | |
|---|---|---|---|---|
| 1. | තථාගත | සුත්තං | .. | 98– 99 |
| 2. | දුතියතථාගත | ,, | .. | 98– 99 |
| 3. | තතියතථාගත | ,, | .. | 100–101 |
| 4. | චතුත්ථතථාගත | ,, | .. | 100–101 |
| 5– 8. | පද | සුත්තානි | .. | 100–101 |
| 9–12. | කූට | ,, | .. | 102–103 |
| 13–16. | මූල | ,, | .. | 102–103 |
| 17–20. | සාර | ,, | .. | 102–103 |
| 21–24. | වස්සික | ,, | .. | 102–103 |
| 25–28. | රාජ | ,, | .. | 102–103 |
| 29–32. | චන්දිම | ,, | .. | 102–103 |
| 33–36. | සූරිය | ,, | .. | 104–105 |
| 37–40. | වත්ථ | ,, | .. | 104–105 |


## 14. බලකරණීයවග්ගො 106 – 121


| | | | | |
|---|---|---|---|---|
| 1. | බල | සුත්තං | .. | 106–107 |
| 2. | දුතියබල | ,, | .. | 106–107 |
| 3. | තතියබල | ,, | .. | 106–109 |
| 4. | චතුත්ථබල | ,, | .. | 108–109 |
| 5– 8. | බීජ | සුත්තානි | .. | 108–109 |
| 9–12. | නාග | ,, | .. | 110–111 |
| 13–16. | රුක්ඛ | ,, | .. | 110–111 |
| 17–20. | කුම්භ | ,, | .. | 112–113 |
| 21–24. | සූක | ,, | .. | 112–113 |
| 25–28. | ආකාස | ,, | .. | 112–115 |
| 29–32. | මෙඝ | ,, | .. | 114–115 |
| 33–36. | දුතියමෙඝ | ,, | .. | 114–117 |
| 37–40. | නාවා | ,, | .. | 116–117 |
| 41–44. | ආගන්තුක | ,, | .. | 116–119 |
| 45–48. | නදී | ,, | .. | 118–121 |


## 15. එසනාවග්ගො 122 – 131


| | | | | |
|---|---|---|---|---|
| 1. | එසනා | සුත්තං | .. | 122–123 |
| 2. | දුතියඑසනා | ,, | .. | 122–123 |
| 3. | තතියඑසනා | ,, | .. | 122–123 |
| 4. | චතුත්ථඑසනා | ,, | .. | 124–125 |
| 5– 8. | එසනා | සුත්තානි | .. | 124–125 |
| 9– 12. | එසනා | ,, | .. | 124–125 |
| 13– 16. | එසනා | ,, | .. | 124–125 |




Free Distribution www.aathaapi.org

| | | | | |
|---|---|---|---|---|
| 17– 32. | විධා | ,, | .. | 126–127 |
| 33– 48. | ආසව | ,, | .. | 126–127 |
| 44– 64. | භව | ,, | .. | 126–127 |
| 65– 80. | දුක්ඛතා | ,, | .. | 128–129 |
| 81– 96. | ඛිල | ,, | .. | 128–129 |
| 97–112. | මල | ,, | .. | 128–129 |
| 113–128. | නීඝ | ,, | .. | 130–131 |
| 129–144. | වේදනා | ,, | .. | 130–131 |
| 145–160. | තණ්හා | ,, | .. | 130–131 |


### 16. ඔඝවග්ගො 132 – 139


| | | | | |
|---|---|---|---|---|
| 1– 16. | ඔඝ | සුත්තානි | .. | 132–133 |
| 17– 32. | යොග | ,, | .. | 132–133 |
| 33– 48. | උපාදාන | ,, | .. | 132–133 |
| 49– 64. | ගන්ථ | ,, | .. | 134–135 |
| 65– 80. | අනුසය | ,, | .. | 134–135 |
| 81– 96. | කාමගුණ | ,, | .. | 134–135 |
| 97–112. | නීවරණ | ,, | .. | 136–137 |
| 113–128. | උපාදානක්ඛන්ධ | ,, | .. | 136–137 |
| 129–144. | ඔරම්භාගියසංයොජන | ,, | .. | 136–137 |
| 145–160. | උද්ධම්භාගියසංයොජන | ,, | .. | 138–139 |


## 2. බොජ්ඣඞ්ගසංයුත්තං 140 – 259

### 1. පබ්බතවග්ගො 140 – 161


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | හිමවන්ත | සුත්තං | .. | .. | 140–141 |
| 2. | කාය | ,, | .. | .. | 140–145 |
| 3. | සීල | ,, | .. | .. | 146–151 |
| 4. | වත්ථ | ,, | .. | .. | 150–153 |
| 5. | භික්ඛු | ,, | .. | .. | 152–155 |
| 6. | කුණ්ඩලිය | ,, | .. | .. | 154–157 |
| 7. | කූටාගාර | ,, | .. | .. | 158–159 |
| 8. | උපවාන | ,, | .. | .. | 158–159 |
| 9. | උප්පාද | ,, | .. | .. | 160–161 |
| 10. | දුතියඋප්පාද | ,, | .. | .. | 160–161 |




Free Distribution www.aathaapi.org

## 2. ගිලානවග්ගො 162 – 171


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පාණ | සුත්තං | .. | .. | 162–163 |
| 2. | සුරිය | ,, | .. | .. | 162–163 |
| 3. | දුතියසුරිය | ,, | .. | .. | 162–163 |
| 4. | ගිලාන | ,, | .. | .. | 164–165 |
| 5. | දුතියගිලාන | ,, | .. | .. | 166–167 |
| 6. | තතියගිලාන | ,, | .. | .. | 166–169 |
| 7. | අපාර | ,, | .. | .. | 168–169 |
| 8. | ආරද්ධ | ,, | .. | .. | 170–171 |
| 9. | අරිය | ,, | .. | .. | 170–171 |
| 10. | නිබ්බිද | ,, | .. | .. | 170–171 |


## 3. උදායිවග්ගො 172 – 183


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | බොධාය | සුත්තං | .. | .. | 172–173 |
| 2. | දෙසනා | ,, | .. | .. | 172–173 |
| 3. | ඨාන | ,, | .. | .. | 172–175 |
| 4. | යොනිසො | ,, | .. | .. | 174–175 |
| 5. | අපරිහානිය | ,, | .. | .. | 174–175 |
| 6. | ඛය | ,, | .. | .. | 176–177 |
| 7. | නිරොධ | ,, | .. | .. | 176–177 |
| 8. | නිබ්බෙධ | ,, | .. | .. | 178–179 |
| 9. | එකධම්ම | ,, | .. | .. | 178–179 |
| 10. | උදායි | ,, | .. | .. | 180–183 |


## 4. නීවරණවග්ගො 184 – 195


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | කුසල | සුත්තං | .. | .. | 184–185 |
| 2. | දුතියකුසල | ,, | .. | .. | 184–185 |
| 3. | කිලෙස | ,, | .. | .. | 186–187 |
| 4. | අනාවරණ | ,, | .. | .. | 188–189 |
| 5. | යොනිසො | ,, | .. | .. | 188–189 |
| 6. | බුද්ධි | ,, | .. | .. | 188–189 |
| 7. | ආවරණ | ,, | .. | .. | 190–191 |
| 8. | අනීවරණ | ,, | .. | .. | 190–191 |
| 9. | මහාරුක්ඛ | ,, | .. | .. | 192–193 |
| 10. | නීවරණ | ,, | .. | .. | 194–195 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි

### 5. චක්කවත්තිවග්ගො 196 – 201


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | විධා | සුත්තං | .. | .. | 196–197 |
| 2. | චක්කවත්ති | ,, | .. | .. | 196–197 |
| 3. | මාර | ,, | .. | .. | 196–197 |
| 4. | දුප්පඤ්ඤ | ,, | .. | .. | 198–199 |
| 5. | පඤ්ඤවා | ,, | .. | .. | 198–199 |
| 6. | දළිද්ද | ,, | .. | .. | 198–199 |
| 7. | අදළිද්ද | ,, | .. | .. | 198–199 |
| 8. | ආදිච්ච | ,, | .. | .. | 200–201 |
| 9. | අඞ්ග | ,, | .. | .. | 200–201 |
| 10. | දුතියඅඞ්ග | ,, | .. | .. | 200–201 |


### 6. බොජ්ඣඞ්ගවග්ගො 202 – 239


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ආහාර | සුත්තං | .. | .. | 202–209 |
| 2. | පරියාය | ,, | .. | .. | 210–215 |
| 3. | අග්ගි | ,, | .. | .. | 216–219 |
| 4. | මෙත්ත | ,, | .. | .. | 218–227 |
| 5. | සඞ්ගාරව | ,, | .. | .. | 228–235 |
| 6. | අභය | ,, | .. | .. | 234–239 |


### 7. ආනාපානවග්ගො 240 – 245


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අට්ඨික | සුත්තං | .. | .. | 240–241 |
| 2. | දුතියඅට්ඨික | ,, | .. | .. | 240–241 |
| 3. | තතියඅට්ඨික | ,, | .. | .. | 240–241 |
| 4. | චතුත්ථඅට්ඨික | ,, | .. | .. | 242–243 |
| 5. | පඤ්චමඅට්ඨික | ,, | .. | .. | 242–243 |
| 6. | ඡට්ඨඅට්ඨික | ,, | .. | .. | 242–243 |
| 7–12. | පුළවක | සුත්තානි | .. | .. | 242–243 |
| 13–18. | විනීලක | ,, | .. | .. | 244–245 |
| 19–24. | විච්ඡිද්දක | ,, | .. | .. | 244–245 |
| 25–30. | උද්ධුමාතක | ,, | .. | .. | 244–245 |
| 31–36. | මෙත්තා | ,, | .. | .. | 244–245 |
| 37–42. | කරුණා | ,, | .. | .. | 244–245 |
| 43–48. | මුදිතා | ,, | .. | .. | 244–245 |
| 49–54. | උපෙක්ඛා | ,, | .. | .. | 244–245 |
| 55–60. | ආනාපානසති | ,, | .. | .. | 244–245 |




Free Distribution www.aathaapi.org

## 8. නිරොධවග්ගො 246 – 251


| | | | | |
|---|---|---|---|---|
| 1– 6. | අසුභ | සුත්තානි | .. | 246–247 |
| 12. | මරණ | ,, | .. | 246–247 |
| 18. | ආහාරෙපටිකූල | ,, | .. | 246–247 |
| 24. | සබ්බලොකෙඅනභිරත | ,, | .. | 246–247 |
| 30. | අනිච්ච | ,, | .. | 246–247 |
| 36. | අනිච්චෙදුක්ඛ | ,, | .. | 246–247 |
| 42. | දුක්ඛෙඅනත්ත | ,, | .. | 246–247 |
| 48. | පහාන | ,, | .. | 246–247 |
| 54. | විරාග | ,, | .. | 248–249 |
| 55. | නිරොධ | සුත්තං | .. | 248–249 |
| 56. | දුතියනිරොධ | ,, | .. | 248–249 |
| 57. | තතියනිරොධ | ,, | .. | 248–249 |
| 58. | චතුත්ථනිරොධ | ,, | .. | 250–251 |
| 59. | පඤ්චමනිරොධ | ,, | .. | 250–251 |
| 60. | ඡට්ඨනිරොධ | ,, | .. | 250–251 |

9. ගඞ්ගාපෙය්‍යාලො 252–253

10. අප්පමාදවග්ගො 252–253

11. බලකරණීයවග්ගො 254–255

12. එසනාවග්ගො 254–255

13. ඔඝවග්ගො 254–255

14. පුන ගඞ්ගාපෙය්‍යාලො 256–257

15. පුන අප්පමාදවග්ගො 256–257

16. පුන බලකරණීයවග්ගො 256–257

17. පුන එසනාවග්ගො 258–259

18. පුන ඔඝවග්ගො

120. ඔඝාදිසුත්තානි 258–259




Free Distribution www.aathaapi.org

## 3. සතිපට්ඨානසංයුත්තං 260 – 345

### 1. අම්බපාලිවග්ගො 260–285


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | අම්බපාලි | සුත්තං | .. | .. | 260–261 |
| 2. | සතො | ,, | .. | .. | ,, 263 |
| 3. | භික්ඛු | ,, | .. | .. | 262–260 |
| 4. | සාලා | ,, | .. | .. | 264–267 |
| 5. | කුසලරාසි | ,, | .. | .. | 266–267 |
| 6. | සකුණග්ඝි | ,, | .. | .. | 268–271 |
| 7. | මක්කට | ,, | .. | .. | 270–273 |
| 8. | සූද | ,, | .. | .. | 272–277 |
| 9. | ගිලාන | ,, | .. | .. | 276–279 |
| 10. | භික්ඛුනුපස්සය | ,, | .. | .. | 280–285 |


### 2. නාලන්දවග්ගො 286–305


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | මහාපුරිස | සුත්තං | .. | .. | 286–287 |
| 2. | නාලන්ද | ,, | .. | .. | 286–291 |
| 3. | චුන්ද | ,, | .. | .. | 292–295 |
| 4. | උක්කචෙල | ,, | .. | .. | 294–297 |
| 5. | බාහිය | ,, | .. | .. | 298–299 |
| 6. | උත්තිය | ,, | .. | .. | 298–299 |
| 7. | අරිය | ,, | .. | .. | 300–301 |
| 8. | බ්‍රහ්ම | ,, | .. | .. | 300–303 |
| 9. | සෙදක | ,, | .. | .. | 302–305 |
| 10. | ජනපදකල්‍යාණි | ,, | .. | .. | 304–305 |


### 3. සීලට්ඨිතිවග්ගො 306–319


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සීල | සුත්තං | .. | .. | 306–307 |
| 2. | ඨිති | ,, | .. | .. | 306–309 |
| 3. | පරිහාන | ,, | .. | .. | 308–309 |
| 4. | සුද්ධක | ,, | .. | .. | 310–311 |
| 5. | බ්‍රාහ්මණ | ,, | .. | .. | 310–311 |
| 6. | පදෙස | ,, | .. | .. | 312–313 |
| 7. | සමත්ත | ,, | .. | .. | 312–313 |
| 8. | ලොක | ,, | .. | .. | 314–315 |
| 9. | සිරිවඩ්ඪ | ,, | .. | .. | 314–317 |
| 10. | මානදින්න | ,, | .. | .. | 318–319 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි


### 4. අනනුස්සුත වග්ගො 320–329

| | | | |
|---|---|---|---|
| 1. | අනනුස්සුත | සුත්තං | 320–321 |
| 2. | විරාග | ,, | 320–321 |
| 3. | විරද්ධ | ,, | 322–323 |
| 4. | භාවිත | ,, | 322–323 |
| 5. | සතො | ,, | 322–323 |
| 6. | අඤ්ඤ | ,, | 324–325 |
| 7. | ඡන්ද | ,, | 324–325 |
| 8. | පරිඤ්ඤාත | ,, | 324–325 |
| 9. | භාවනා | ,, | 326–327 |
| 10. | විභඞ්ග | ,, | 326–329 |

### 5. අමත වග්ගො 330–339

| | | | |
|---|---|---|---|
| 1. | අමත | සුත්තං | 330–331 |
| 2. | සමුදය | ,, | 330–331 |
| 3. | මග්ග | ,, | 330–333 |
| 4. | සතො | ,, | 334–335 |
| 5. | කුසලරාසි | ,, | 334–335 |
| 6. | පාතිමොක්ඛ | ,, | 334–337 |
| 7. | දුච්චරිත | ,, | 336–337 |
| 8. | මිත්ත | ,, | 338–339 |
| 9. | වෙදනා | ,, | 338–339 |
| 10. | ආසව | ,, | 338–339 |

6. ගඞ්ගා පෙය්‍යාලො 340–341

7. අප්පමාද වග්ගො 340–341

8. බලකරණීය වග්ගො 342–343

9. එසනා වග්ගො 342–343

10. ඔඝ වග්ගො 344–345

1. 159. ඔඝාදි සුත්තානි 344–345

160. උද්ධංභාගිය සුත්තං 344–345




Free Distribution www.aathaapi.org

විසය සූචි

# 4. ඉන්ද්‍රිය සංයුත්තං 346 – 425

## 1. සුද්ධක වග්ගො 346- 355


| | | | | |
|---|---|---|---|---|
| 1. | සුද්ධක | සුත්තං | .. | 346–347 |
| 2. | සෝත | ,, | .. | 346–347 |
| 3. | දුතියසෝත | ,, | .. | 346–347 |
| 4. | අරහන්ත | ,, | .. | 346–347 |
| 5. | දුතියඅරහන්ත | ,, | .. | 348–349 |
| 6. | සමණ | ,, | .. | 348–349 |
| 7. | දුතියසමණ | ,, | .. | 348–351 |
| 8. | දට්ඨබ්බ | ,, | .. | 350–351 |
| 9. | විභඞ්ග | ,, | .. | 350–353 |
| 10. | දුතියවිභඞ්ග | ,, | .. | 354–355 |


## 2. මුදුතරවග්ගො 356 – 363


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පටිලාභ | සුත්තං | .. | .. | 356–357 |
| 2. | සඞ්ඛිත්ත | ,, | .. | .. | 356–357 |
| 3. | දුතියසඞ්ඛිත්ත | ,, | .. | .. | 356–357 |
| 4. | තතියසඞ්ඛිත්ත | ,, | .. | .. | 358–359 |
| 5. | විත්ථාර | ,, | .. | .. | 358–359 |
| 6. | දුතියවිත්ථාර | ,, | .. | .. | 358–359 |
| 7. | තතියවිත්ථාර | ,, | .. | .. | 360–361 |
| 8. | පටිපන්න | ,, | .. | .. | 360–361 |
| 9. | සම්පන්න | ,, | .. | .. | 362–363 |
| 10. | ආසවක්ඛය | ,, | .. | .. | 362–363 |


## 3. ඡළින්ද්‍රියවග්ගො 364 – 369


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පුනබ්භව | සුත්තං | .. | .. | 364–365 |
| 2. | ජීවිතින්ද්‍රිය | ,, | .. | .. | 364–365 |
| 3. | අඤ්ඤින්ද්‍රිය | ,, | .. | .. | 364–365 |
| 4 | ඒකබීජී | ,, | .. | .. | 366–367 |
| 5 | සුද්ධක | ,, | .. | .. | 366–367 |
| 6. | සෝතාපන්න | ,, | .. | .. | 366–367 |
| 7. | අරහන්ත | ,, | .. | .. | 366–367 |
| 8. | බුද්ධ | ,, | .. | .. | 368–369 |
| 9. | සමණබ්‍රාහ්මණ | ,, | .. | .. | 368–369 |
| 10. | දුතියසමණබ්‍රාහ්මණ | ,, | .. | .. | 368–369 |




Free Distribution www.aathaapi.org

විසය සූචි

## 4. සුඛින්ද්‍රියවග්ගො 370 – 383


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සුද්ධක | සුත්තං | .. | .. | 370–371 |
| 2. | සොතාපන්න | ,, | .. | .. | 370–371 |
| 3. | අරහන්ත | ,, | .. | .. | 370–371 |
| 4. | සමණබ්‍රාහ්මණ | ,, | .. | .. | 372–373 |
| 5. | දුතියසමණබ්‍රාහ්මණ | ,, | .. | .. | 372–373 |
| 6. | විභඞ්ග | ,, | .. | .. | 372–373 |
| 7. | දුතියවිභඞ්ග | ,, | .. | .. | 374–375 |
| 8. | තතියවිභඞ්ග | ,, | .. | .. | 374–377 |
| 9. | කට්ඨෝපම | ,, | .. | .. | 376–379 |
| 10. | උප්පටිපාටික | ,, | .. | .. | 378–383 |


## 5. ජරාවග්ගො 384 – 399


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ජරා | සුත්තං | .. | .. | 384–385 |
| 2. | උණ්ණාභබ්‍රාහ්මණ | ,, | .. | .. | 384–387 |
| 3. | සාකෙත | ,, | .. | .. | 386–389 |
| 4. | පුබ්බකොට්ඨක | ,, | .. | .. | 388–391 |
| 5. | පුබ්බාරාම | ,, | .. | .. | 392–393 |
| 6. | දුතියපුබ්බාරාම | ,, | .. | .. | 392–393 |
| 7. | තතියපුබ්බාරාම | ,, | .. | .. | 394–395 |
| 8. | චතුත්ථපුබ්බාරාම | ,, | .. | .. | 394–395 |
| 9. | පිණ්ඩොල | ,, | .. | .. | 394–397 |
| 10. | ආපණ | ,, | .. | .. | 396–399 |


## 6. සූකරඛතවග්ගො 400 – 411


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | සාලා | සුත්තං | .. | .. | 400–401 |
| 2. | මල්ලක | ,, | .. | .. | 400–403 |
| 3. | සෙඛ | ,, | .. | .. | 402–405 |
| 4. | පද | ,, | .. | .. | 404–405 |
| 5. | සාර | ,, | .. | .. | 406–407 |
| 6. | පතිට්ඨිත | ,, | .. | .. | 406–407 |
| 7. | බ්‍රහ්ම | ,, | .. | .. | 406–409 |
| 8. | සූකරඛත | ,, | .. | .. | 408–411 |
| 9. | උප්පාද | ,, | .. | .. | 410–411 |
| 10. | දුතියඋප්පාද | ,, | .. | .. | 410–411 |




Free Distribution www.aathaapi.org

### 7. සම්බොධිවග්ගො 412-417


| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | සංයොජන | සුත්තං | .. | .. | 412-413 |
| 2. | අනුසය | ,, | .. | .. | 412-413 |
| 3. | අද්ධාන | ,, | .. | .. | 412-413 |
| 4. | ආසවක්ඛය | ,, | .. | .. | 412-413 |
| 5. | ඵල | ,, | .. | .. | 414-415 |
| 6. | දුතියඵල | ,, | .. | .. | 414-415 |
| 7. | රුක්ඛ | ,, | .. | .. | 414-415 |
| 8. | දුතියරුක්ඛ | ,, | .. | .. | 416-417 |
| 9. | තතියරුක්ඛ | ,, | .. | .. | 416-417 |
| 10. | චතුත්ථරුක්ඛ | ,, | .. | .. | 416-417 |

8. ගඞ්ගාපෙය්‍යාලො 418-419

9. අප්පමාදවග්ගො 418-419

10. බලකරණීයවග්ගො 418-419

11. එසනාවග්ගො 420-421

12. ඔඝවග්ගො 420-421

13. පුන ගඞ්ගාපෙය්‍යාලො 420-421

14. පුන අප්පමාදවග්ගො 422-423

15. පුන බලකරණීයවග්ගො 422-423

16. පුන එසනාවග්ගො 422-423

17. පුන ඔඝවග්ගො 424-425


## 5. සම්මප්පධානසංයුත්තං 426 - 433

### 1. ගඞ්ගාපෙය්‍යාලො 426-429


| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | පාචීනනින්න | සුත්තං | .. | .. | 426-427 |
| 2-48. | දුතියපාචීනනින්නාදි | සුත්තානි | .. | .. | 428-429 |

2. අප්පමාදවග්ගො 428-429

3. බලකරණීයවග්ගො 430-431

4. එසනාවග්ගො 430-433

5. ඔඝවග්ගො 432-433




Free Distribution www.aathaapi.org

## 6. බලසංයුත්තං 434 – 443

1. ගඞ්ගාපෙය්‍යාලො 434–435

2. අප්පමාදවග්ගො 434–435

3. බලකරණීයවග්ගො 436–437

4. එසනාවග්ගො 436–437

5. ඔඝවග්ගො 436–439

1–39. ඔඝාදි සුත්තානි .. .. 436–437
40. උද්ධම්භාගිය සුත්තං .. .. 438–439

6. පුන ගඞ්ගාපෙය්‍යාලො 438–439

7. පුන අප්පමාදවග්ගො 440–441

8. පුන බලකරණීයවග්ගො 440–441

9. පුන එසනාවග්ගො 440–441

10. පුන ඔඝවග්ගො 442–443



Free Distribution www.aathaapi.org

### සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

### පඤ්චමො භාගො

## මහාවග්ගො

Free Distribution www.aathaapi.org

### සුත්තන්තපිටකෙ

# සංයුත්තනිකායො

### පඤ්චමො භාගො

---

# මහාවග්ගො

---

# 1. මග්ගසංයුත්තං

## 1. අවිජ්ජාවග්ගො

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

### 1. 1. 1

### අවිජ්ජාසුත්තං

1. එවං මෙ සුතං, එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච: අවිජ්ජා භික්ඛවෙ පුබ්බඞ්ගමා අකුසලානං ධම්මානං සමාපත්තියා අන්වදෙව[1] අහිරිකං අනොත්තප්පං අවිජ්ජාගතස්ස භික්ඛවෙ අවිද්දසුනො මිච්ඡාදිට්ඨි පහොති. මිච්ඡාදිට්ඨිස්ස මිච්ඡාසඞ්කප්පො පහොති. මිච්ඡාසඞ්කප්පස්ස මිච්ඡාවාචා පහොති. මිච්ඡාවාචස්ස මිච්ඡාකම්මන්තො පහොති. මිච්ඡාකම්මන්තස්ස මිච්ඡාආජීවො පහොති. මිච්ඡාආජීවස්ස මිච්ඡාවායාමො පහොති. මිච්ඡාවායාමස්ස මිච්ඡාසති පහොති. මිච්ඡාසතිස්ස මිච්ඡාසමාධි පහොති.

විජ්ජා ච ඛො භික්ඛවෙ පුබ්බඞ්ගමා කුසලානං ධම්මානං සමාපත්තියා අන්වදෙව හිරොත්තප්පං. විජ්ජාගතස්ස භික්ඛවෙ විද්දසුනො සම්මාදිට්ඨි පහොති. සම්මාදිට්ඨිස්ස සම්මාසඞ්කප්පො පහොති. සම්මාසඞ්කප්පස්ස සම්මාවාචා පහොති. සම්මාවාචස්ස සම්මාකම්මන්තො පහොති. සම්මාකම්මන්තස්ස සම්මාආජීවො පහොති. සම්මාආජීවස්ස සම්මාවායාමො පහොති. සම්මාවායාමස්ස සම්මාසති පහොති. සම්මාසතිස්ස සම්මාසමාධි පහොතීති.

---

1. අනුදෙව - සීමු, සී, 1, 2.

Free Distribution www.aathaapi.org

සූත්‍රාන්තපිටකයෙහි

# සංයුත්තනිකාය

පස්වම භාගය

---

# මහාවර්ගය

---

## 1. මග්ගසංයුත්තය

### 1. අවිජ්ජාවර්ගය

ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා

### 1. 1. 1

### අවිජ්ජා සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලද, එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර සමීපයෙහි ජේතවන** නම් අනේපිඩු සිටුහුගේ අරමෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණෙනි යි භික්ෂූන් ඇමතූසේක. පින්වතුන් වහන්සැ යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක: මහණෙනි, පවට ලජ්ජා නැතිකම හා බිය නැතිකම සමග ම උපදනා අවිද්‍යාව අකුසල්දහම් ඉපැද්මට පෙරටු වෙයි. අවිද්‍යාවෙන් යුත් අඥානයාහට මිථ්‍යාදෘෂ්ටිය උපදී. මිථ්‍යාදෘෂ්ටි ඇත්තහුට මිථ්‍යාසඞ්කල්පය උපදී. මිථ්‍යාසඞ්කල්පය ඇත්තහුට මිථ්‍යාවචන උපදී. මිථ්‍යාවචන ඇත්තහුට මිථ්‍යාකර්මාන්ත වෙයි. මිථ්‍යාකර්මාන්ත ඇත්තහුට මිථ්‍යාආජීවය වෙයි. මිථ්‍යාආජීව ඇත්තහුට මිථ්‍යාව්‍යායාම වෙයි. මිථ්‍යාව්‍යායාම ඇත්තහුට මිථ්‍යාස්මෘති වෙයි. මිථ්‍යාස්මෘති ඇත්තහුට මිථ්‍යාසමාධි වේ.

මහණෙනි, හිරිඔතප් දෙක සමග ම උපදනා විද්‍යාව කුසල්දහම් ඉපැද්මට පෙරටු වෙයි. විද්‍යාවෙන් යුත් පණ්ඩිතයාහට සම්‍යග්දෘෂ්ටි උපදී. සම්‍යග්දෘෂ්ටිය ඇත්තහුට සම්‍යක්සඞ්කල්ප උපදී. සම්‍යක්සඞ්කල්ප ඇත්තහුට සම්‍යග්වචන උපදී. සම්‍යග්වචන ඇත්තහුට සම්‍යක්කර්මාන්ත වෙයි. සම්‍යක්කර්මාන්ත ඇත්තහුට සම්‍යග්ආජීව වෙයි. සම්‍යක් ආජීව ඇත්තහුට සම්‍යග්ව්‍යායාම වෙයි. සම්‍යග්ව්‍යායාම ඇත්තහුට සම්‍යක්ස්මෘති වෙයි. සම්‍යක්ස්මෘති ඇත්තහුට සම්‍යක්සමාධි වේ.

## 1. 1. 2

## උපඩ්ඪසුත්තං

2. එවං මෙ සුතං, එකං සමයං භගවා **සක්කෙසු**[1] විහරති, **නාගරකං**[2] නාම සක්‍යානං නිගමො. අථ ඛො ආයස්මා **ආනන්දො** යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: උපඩ්ඪමිදං භන්තෙ, බ්‍රහ්මචරියස්ස යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතාති. මා හෙවං ආනන්ද,[3] මා හෙවං ආනන්ද, සකලමෙව හිදං ආනන්ද, බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතා. කල්‍යාණමිත්තස්සෙතං ආනන්ද, භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සති.

කථඤ්චානන්ද, භික්ඛු කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධානන්ද, භික්ඛු **සම්මාදිට්ඨිං** භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං **සම්මාසඞ්කප්පං** භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, **සම්මාවාචං** භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, **සම්මාකම්මන්තං** භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, **සම්මාආජීවං** භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, **සම්මාවායාමං** භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. **සම්මාසතිං** භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, **සම්මාසමාධිං** භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, එවං ඛො ආනන්ද, භික්ඛු කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති.

තදමිනාපෙතං ආනන්ද, පරියායෙන වෙදිතබ්බං: යථා සකලමෙවහිදං බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතා[4]ති. මමං හි ආනන්ද, කල්‍යාණමිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති, ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති,

1. සක්‍යෙසු - මජ්සං. ස්‍යා
2. නඞ්ගරකං - සී 1, 2. සක්කරං - මජ්සං, ස්‍යා.
3. ආනන්ද අවච - ස්‍යා.
4. කල්‍යාණසම්පවඞ්කතාති - ස්‍යා.

Free Distribution www.aathaapi.org

## 1. 1. 2

## උපඩ්ඪ සූත්‍රය

2. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වෙහි නාගරක නම් ශාක්‍යයන්ගේ නියම්ගම්හි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ. වහන්ස, යම් කලණ මිතුරන් ඇති බවෙක් කලණ යහළුවන් ඇති බවෙක් කලණයන් කෙරෙහි නැමෙනසුලු බවෙක් වේ ද මෙය බඹසර පිළිබඳ සමඅඩෙකැ යි. ආනන්දය, එසේ නො කිය, ආනන්දය, එසේ නො කිය, ආනන්දය යම් කලණ මිතුරන් ඇති බවෙක් කලණ යහළුවන් ඇති බවෙක් කලණයන් කෙරෙහි නැමෙනසුලු බවෙක් වේ ද, මෙය මුළුබඹසර යි. ආනන්දය කලණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණයන් කෙරෙහි නැමෙනසුලු මහණ අරිඅටඟිමග වඩන්නේ ය. අරිඅටඟමග බහුල කරන්නේය යන මෙය කැමැති විය යුතු යි.

ආනන්දය, කලණමිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණයන් කෙරෙහි නැමෙන සුලු මහණ කෙසේ නම් අරිඅටඟිමග වඩා ද, අරිඅටඟිමග බහුල කෙරේ ද: ආනන්දය, මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කොට විරාගය ඇසුරු කොට නිරෝධය ඇසුරු කොට නිවනට නැමෙන සුලු කොට සම්‍යග්දෘෂ්ටිය වඩයි. විවෙකය ඇසුරු කොට විරාගය ඇසුරු කොට නිරෝධය ඇසුරු කොට නිවනට නැමෙන සුලු කොට සම්‍යක් සංකල්පය වඩයි. විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙන සුල්ලක් කොට සම්‍යග්වචනය වඩයි. විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙන සුල්ලක් කොට සම්‍යක් කර්මාන්තය වඩයි. විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙන සුල්ලක් කොට සම්‍යග්ආජීවය වඩයි. විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙන සුල්ලක් කොට සම්‍යග්ව්‍යායාමය වඩයි. විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙනසුල්ලක් කොට සම්‍යක් ස්මෘතිය වඩයි. විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙන සුල්ලක් කොට සම්‍යක් සමාධිය වඩයි. ආනන්දය කලණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණයන් කෙරෙහි නැමෙන සුලු මහණ මෙසේ අරිඅටඟිමග වඩයි අරිඅටඟිමග බහුල කෙරෙයි.

ආනන්දය, යම් කලණ මිතුරන් ඇති බවෙක් කලණ යහළුවන් ඇති බවෙක් කලණයන් කෙරෙහි නැමෙන සුලු බවෙක් වේ ද, මෙය ම යම්සේ මුළු බඹසර වේ නම් මෙය මේ නයෙනු දු දත යුතු: ආනන්දය, කලණ මිත් වූ මා කරා ම පැමිණ උපත ස්වභාව කොට ඇති සත්ත්වයෝ උපතින් මිදෙත්, ජරාව ස්වභාව කොට ඇති සත්ත්වයෝ ජරායෙන් මිදෙත්,

මරණධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි පරිමුච්චන්ති. ඉමිනා ඛො එතං ආනන්ද, පරියායෙන වෙදිතබ්බං. යථා: සකලමෙවිදං බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතාති.

## 1. 1. 3

## සාරිපුත්තසුත්තං

3. සාවත්ථියං:

අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: සකලමෙවිදං භන්තෙ, බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතාති. සාධු, සාධු, සාරිපුත්ත, සකලමෙවිදං සාරිපුත්ත බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතා. කල්‍යාණමිත්තස්සෙතං සාරිපුත්ත, භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සති.

කථඤ්ච සාරිපුත්ත, භික්ඛු කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ සාරිපුත්ත, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සම්මාසඞ්කප්පං භාවෙති -පෙ- සම්මාවාචං භාවෙති -පෙ- සම්මාකම්මන්තං භාවෙති -පෙ- සම්මාආජීවං භාවෙති -පෙ- සම්මාවායාමං භාවෙති -පෙ- සම්මාසතිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො සාරිපුත්ත, භික්ඛු කල්‍යාණමිත්තො කල්‍යාණසහායො කල්‍යාණසම්පවඞ්කො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සති.

තදමිනාපෙතං සාරිපුත්ත, පරියායෙන වෙදිතබ්බං: යථා සකලමෙවිදං බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතා. මමං හි සාරිපුත්ත, කල්‍යාණමිත්තං ආගම්ම ජාතිධම්මා සත්තා ජාතියා පරිමුච්චන්ති, ජරාධම්මා සත්තා ජරාය පරිමුච්චන්ති, මරණධම්මා සත්තා මරණෙන පරිමුච්චන්ති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මා සත්තා සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි පරිමුච්චන්ති. ඉමිනා ඛො එතං සාරිපුත්ත, පරියායෙන වෙදිතබ්බං: යථා සකලමෙවිදං බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතාති.

1. කල්‍යාණසම්පවඞ්කතාති - සතා,

Free Distribution www.aathaapi.org

මරණය ස්වභාව කොට ඇති සත්ත්වයෝ මරණින් මිදෙත්. ශෝකය පරිදේවය දුක දෙම්නස දැඩි ආයාසය ස්වභාව කොට ඇති සත්ත්වයෝ ශෝකය පරිදේවය දුක දෙම්නස දැඩි ආයාසය යන මෙයින් මිදෙත්. ආනන්දය යම් කලණ මිතුරන් ඇති බවෙක් කලණ යහළුවන් ඇති බවෙක් කලණයන් කෙරෙහි නැමෙනසුලු බවෙක් වේද, මෙය ම යම්සේ මුළු බඹසර වේ නම් මෙය මේ නයෙනුදු දතයුතු යි.

## 1. 1. 3

## සාරිපුත්ත සූත්‍රය

3. සැවැත්නුවර :

ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂ්මත් සැයුරිත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ; වහන්ස, යම් කල්‍යාණමිත්‍රත්වයෙක් කල්‍යාණසහායත්වයෙක් කල්‍යාණසම්ප්‍රවඞ්කත්වයෙක් වේ නම් මෙය ම මුළු බඹසර යි. ශාරිපුත්‍රය මැනවි මැනවි. සාරිපුත්‍රය යම් කල්‍යාණ මිත්‍රත්වයෙක් කල්‍යාණසහායත්වයෙක් කල්‍යාණසම්ප්‍රවඞ්කත්වයෙක් වේ නම් මෙය ම මුළු බඹසර යි. ශාරිපුත්‍රය, අරිඅටඟිමග වඩන්නේ ය. අරිඅටඟිමග බහුල කරන්නේ ය යන මෙය කලණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණයන් කෙරෙහි නැමෙනසුලු මහණහු විසින් කැමති වියයුතු යි.

ශාරිපුත්‍රය කලණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණයන් කෙරෙහි නැමෙනසුලු මහණ කෙසේ නම් අරිඅටඟිමග වඩා ද, අරිඅටඟිමග බහුල කෙරේ ද: ශාරිපුත්‍රය මෙසස්නෙහි මහණ විවෙකනිශ්‍රිත කොට විරාගනිශ්‍රිත කොට නිරෝධනිශ්‍රිත කොට ව්‍යවසර්ගපරිණාම කොට සම්‍යග්දෘෂ්ටිය වඩයි. ...සම්‍යක්සඞ්කල්පය වඩයි... සම්‍යග්වචනය වඩයි ... සම්‍යක්කර්මාන්තය වඩයි ... සම්‍යගාජීවය වඩයි ... සම්‍යග්ව්‍යායාමය වඩයි...සම්‍යක්ස්මෘතිය වඩයි...විවෙකනිශ්‍රිත කොට විරාගනිශ්‍රිත කොට නිරොධනිශ්‍රිත කොට ව්‍යවසර්ගපරිණාම කොට සම්‍යක්සමාධිය වඩයි. ශාරිපුත්‍රය, කලණ මිතුරන් ඇති කලණ යහළුවන් ඇති කලණයන් කෙරෙහි නැමෙන සුලු මහණ මෙසේ අරිඅටඟිමග වඩන්නේ ය. අරිඅටඟිමග බහුල කරන්නේ ය.

ශාරිපුත්‍රය, යම් කල්‍යාණමිත්‍රත්වයෙක් කල්‍යාණසහායත්වයෙක් කල්‍යාණසම්ප්‍රවඞ්කත්වයෙක් වේ ද, මෙය යම්සේ මුළු බඹසර වේ නම් මෙය මේ නයෙනුදු දතයුතු: එසේ මැ ය, ශාරිපුත්‍රය කල්‍යාණමිත්‍ර වූ මා කරා පැමිණ ජාතිධර්මසත්ත්වයෝ ජාතියෙන් මිදෙත්. ජරාධර්මසත්ත්වයෝ ජරායෙන් මිදෙත්. මරණධර්මසත්ත්වයෝ මරණයෙන් මිදෙත්. ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍යොපායාසධර්ම සත්ත්වයෝ ශෝක පරිදේව දුඃඛ දෞර්මනස්‍යොපායාසයෙන් මිදෙත්. ශාරිපුත්‍රය යම් කල්‍යාණමිත්‍රත්වයෙක් කල්‍යාණසහායත්වයෙක් කල්‍යාණසම්ප්‍රවඞ්කත්වයෙක් වේ ද මෙය ම යම්සේ මුළු බඹසර වේ නම් මෙය මේ නයෙනුදු දතයුතු යි.

## 1. 1. 4

## බ්‍රාහ්මණසුත්තං

**4. සාවත්ථියං:**

අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අද්දසා ඛො ආයස්මා ආනන්දො ජාණුස්සොණිං බ්‍රාහ්මණං සබ්බසෙතෙන වළභීරථෙන[1] සාවත්ථියා නිය්‍යායන්තං, සෙතා සුදං අස්සා යුත්තා හොන්ති. සෙතාලඞ්කාරා සෙතො රථො සෙතපරිවාරො සෙතා රස්මියො සෙතා පතොදලට්ඨි සෙතං ඡත්තං සෙතං උණ්හීසං සෙතානි වත්ථානි සෙතා උපාහනා සෙතාය සුදං වාලවීජනියා වීජියන්ති.[2] තමෙනං ජනො දිස්වා එවමාහ: "බ්‍රහ්මං වත භො යානං බ්‍රහ්මයානරූපං[3] වත භො"ති.

අථ ඛො ආයස්මා ආනන්දො සාවත්ථියං පිණ්ඩාය පවිසිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ඉධාහං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසිං. අද්දසං ඛ්වාහං භන්තෙ ජාණුස්සොණිං බ්‍රාහ්මණං සබ්බසෙතෙන වළභීරථෙන සාවත්ථියා නිය්‍යායන්තං. සෙතා සුදං අස්සා යුත්තා හොන්ති. සෙතාලඞ්කාරා, සෙතො රථො සෙතපරිවාරො, සෙතා රස්මියො, සෙතා පතොදලට්ඨි, සෙතං ඡත්තං, සෙතං උණ්හීසං, සෙතානි වත්ථානි, සෙතා උපාහනා, සෙතාය සුදං වාලවීජනියා වීජියන්ති. තමෙනං ජනො දිස්වා එවමාහ: "බ්‍රහ්මං වත භො යානං බ්‍රහ්මයානරූපං[3] වත භො"ති. සක්කා නු ඛො භන්තෙ ඉමස්මිං ධම්මවිනයෙ බ්‍රහ්මයානං පඤ්ඤාපෙතුන්ති.

සක්කා ආනන්දාති භගවා අවොච. ඉමස්සෙව ඛො එතං ආනන්ද අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස අධිවචනං බ්‍රහ්මයානං ඉතිපි ධම්මයානං ඉතිපි අනුත්තරො සඞ්ගාමවිජයො ඉතිපි. සම්මාදිට්ඨි ආනන්ද භාවිතා බහුලීකතා රාගවිනයපරියොසානා හොති. දොසවිනයපරියොසානා හොති. මොහවිනයපරියොසානා හොති සම්මාසඞ්කප්පො ආනන්ද භාවිතො බහුලීකතො රාගවිනයපරියොසානො හොති, දොසවිනයපරියොසානො හොති, මොහවිනයපරියොසානො හොති. සම්මාවාචා ආනන්ද භාවිතා බහුලීකතා රාගවිනයපරියොසානා හොති, දොසවිනයපරියොසානා හොති, මොහවිනයපරියොසානා හොති. සම්මාකම්මන්තො ආනන්ද භාවිතො බහුලීකතො රාගවිනයපරියොසානො හොති, දොසවිනයපරියොසානො හොති,

1. වළවාභිරථෙ - මජසං. සාං.
2. වීජියති - මජසං.
3. බ්‍රහ්මයානං රූපං - සී, 1, 2.

Free Distribution www.aathaapi.org

# 1. 1. 4

## බ්‍රාහ්මණ සූත්‍රය

4. **සැවැත්නුවර:**

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පෙරවරු හැඳ පෙරෙව පාසිවුරු ගෙන සැවතට පිඩු පිණිස පිවිසියහ. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ හැම සුදු වෙළඹුන් යෙදූ රියෙකින් සැවැත්නුවරින් නික්මෙන ජාණුස්සොනි බමුණා දුටහ. (එ රියෙහි) සුදු පළඳනා ඇති සුදු වූ ම අශ්වයෝ යොදන ලද්දාහු වෙති. රිය සුදු ය, පරිවාරෝපකරණ ද සුදු ය රැහැන් සුදු ය. කෙවිට සුදු ය. ඡත්‍රය සුදු ය. නළල්පට සුදු ය. වස්ත්‍ර සුදුය. වහන් සුදු ය. සුදු වූ ම වල්විදූනායෙකින් පවන් සලනු ලැබේ. තුලුන් දුක ජනයා මෙසේ කියයි; ''පින්වත්නි, එකාන්තයෙන් ශ්‍රේෂ්ඨ යානයෙකි, පින්වත්නි, එකාන්තයෙන් බ්‍රහ්මයාගේ යානය වැනි යානයෙකැ''යි.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ සැවැත්නුවර පිඩු පිණිස පිවිස පසුබතැ පිණ්ඩපාතයෙන් වැළැකුණාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ, එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: ''වහන්ස, මම පෙරවරු හැඳ පෙර ව පාසිවුරු ගෙන සැවතට පිඩු පිණිස පිවිසියෙමි. වහන්ස මම හැම සුදු වෙළඹුන් යෙදූ රියෙකින් සැවැත්නුවරින් නික්මෙන ජාණුස්සොනි බමුණා දිටිමි. සුදු වූ ම අශ්වයෝ යොදන ලද්දාහු වෙති. සුදු අබරණ ය, සුදු රිය ය, (ඇතිරිලි ඈ) සුදු පිරිවර ය, සුදු රැහැන් ය, සුදු කෙවිටි ය, සුදු ඡත්‍ර ය, සුදු නළල්පට ය, සුදු වස්ත්‍ර ය, සුදු වහන් ය, සුදු වූ ම වල්විදූනායෙකින් පවන් සලනු ලැබේ. මොහු දුක ජනයා මෙසේ කියයි: 'පින්වත්නි, ඒකාන්තයෙන් ශ්‍රේෂ්ඨ යානයෙකි, පින්වත්නි, ඒකාන්තයෙන් බ්‍රහ්ම-යානය වැනි යානයෙකැ'' යි වහන්ස, මෙ සස්නෙහි බ්‍රහ්මයානයක් පනවන්නට හැකි වේ ද යි.

''හැකි ය ආනන්දය''යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. ආනන්දය, බ්‍රහ්මයාන යනු ද ධම්මයාන යනු ද අනුත්තරසඞ්ගාමවිජය යනු ද මේ අරිඅටඟිමඟට ම තෙල නමෙකි. ආනන්දය වඩන ලද බහුල කරන ලද සම්මාදිට්ඨිය රාගය දුරලීම කෙළවර කොට ඇති වෙයි. ද්වේෂය දුරලීම කෙළවර කොට ඇති වෙයි. මෝහය දුරලීම කෙළවර කොට ඇති වෙයි. ආනන්දය, වඩන ලද බහුල කරන ලද සම්මාසඞ්කප්පය රාගය දුරලීම කෙළවර කොට ඇති වෙයි, ද්වේෂය දුරලීම කෙළවර කොට ඇති වෙයි. මෝහය දුරලීම කෙළවර කොට ඇති වෙයි. ආනන්දය වඩන ලද බහුල කරන ලද සම්මාවාචාව රාගය දුරලීම කෙළවර කොට ඇති වෙයි. ද්වේෂය දුරලීම කෙළවර කොට ඇති වෙයි, මෝහය දුරලීම කෙළවර කොට ඇති වෙයි. ආනන්දය වඩන ලද බහුල කරන ලද සම්මාකම්මන්-තය රාගය දුරලීම කෙළවර කොට ඇති වෙයි, ද්වේෂය දුරලීම කෙළවර කොට ඇති වෙයි, මෝහය දුරලීම කෙළවර කොට ඇති වෙයි. ආනන්දය

මොහවිනයපරියොසානො හොති. සම්මාආජීවො ආනන්ද භාවිතො බහුලීකතො රාගවිනයපරියොසානො හොති, දොසවිනයපරියොසානො හොති, මොහවිනයපරියොසානො හොති, සම්මා වායාමො ආනන්ද භාවිතො බහුලීකතො රාගවිනයපරියොසානො හොති, දොසවිනය-පරියොසානො හොති, මොහවිනයපරියොසානො හොති, සම්මාසති ආනන්ද භාවිතා බහුලීකතා රාගවිනයපරියොසානා හොති, දොසවිනය-පරියොසානා හොති, මොහවිනයපරියොසානා හොති, සම්මාසමාධි ආනන්ද භාවිතො බහුලීකතො රාගවිනයපරියොසානො හොති, දොසවිනයපරියොසානො හොති, මොහවිනයපරියොසානො හොති.

ඉමිනා ඛො එතං ආනන්ද පරියායෙන වෙදිතබ්බං යථා ඉමස්සෙතං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස අධිවචනං බ්‍රහ්මයානං ඉතිපි ධම්මයානං ඉතිපි අනුත්තරො සඞ්ගාමවිජයො ඉතිපීති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

1. යස්ස සද්ධා ච පඤ්ඤා ච – ධම්මා යුත්තා සදා[1] ධුරං,
හිරි ඊසා මනො යොත්තං – සති ආරක්ඛසාරථී.

2. රථො සීලපරික්ඛාරො – ඣානක්ඛො චක්කවීරියො,
උපෙඛා[2] ධුරසමාධි – අනිච්ඡා පරිවාරණං.

3. අව්‍යාපාදො[3] අවිහිංසා – විවෙකො යස්ස ආවුධං,
තිතික්ඛා චම්මසන්නාහො[4] – යොගක්ඛෙමාය වත්තති.

4. එතදත්තනි සම්භූතං – බ්‍රහ්මයානං අනුත්තරං
නීයන්ති ධීරා ලොකම්හා – අඤ්ඤදත්ථු ජයං ජයන්ති.

## 1. 1. 5

## කිමත්ථියසුත්තං

5. සාවත්ථියං:

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ නො භන්තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා අම්හෙ එවං පුච්ඡන්ති. කිමත්ථියං ආවුසො සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතීති.? එවං පුට්ඨා මයං භන්තෙ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරොම. දුක්ඛස්ස ඛො ආවුසො පරිඤ්ඤත්ථං භගවති බ්‍රහ්මචරියං වුස්සතීති. කච්චි මයං භන්තෙ එවං පුට්ඨා එවං ව්‍යාකරමානා වුත්තවාදිනො චෙව භගවතො හොම? න ච භගවන්තං අභූතෙන අබ්භාචික්ඛාම. ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොම. න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡතීති?

1. සද්ධාධුරං –ස්‍යා.
2. උපෙක්ඛා – මජ්ඣං, ස්‍යා.
3. අබ්‍යාපාදො – මජ්ඣං. ස්‍යා,
4. චම්මසන්නාහො – මජ්ඣං, ධම්මසන්නාහො – ස්‍යා.

වඩන ලද බහුල කරන ලද සම්මාආජීවය රාගය දුරලීම කෙළවර කොට ඇති වෙයි, ද්වේෂය දුරලීම කෙළවර කොට ඇති වෙයි, මෝහය දුරලීම කෙළවර කොට ඇති වෙයි. ආනන්දය වඩන ලද බහුල කරන ලද සම්මාවායාමය රාගය දුරලීම කෙළවර කොට ඇති වෙයි, ද්වේෂය දුරලීම කෙළවර කොට ඇති වෙයි, මෝහය දුරලීම කෙළවර කොට ඇති වෙයි. ආනන්දය, වඩන ලද බහුල කරන ලද සම්මාසතිය රාගය දුරලීම කෙළවර කොට ඇති වෙයි. ද්වේෂය දුරලීම කෙළවර කොට ඇති වෙයි, මෝහය දුරලීම කෙළවර කොට ඇති වෙයි. ආනන්දය වඩන ලද බහුල කරන ලද සම්මාසමාධිය රාගය දුරලීම කෙළවර කොට ඇති වෙයි, ද්වේෂය දුර ලීම කෙළවර කොට ඇති වෙයි, මෝහය දුරලීම කෙළවර කොට ඇති වෙයි.

''ආනන්දය බ්‍රහ්මයාන යනු ද ධම්මයාන යනු ද අනුත්තරසඞ්ගාමවිජය යනු ද යි යම් සේ මේ අරිඅටඟි මඟට තෙල නමෙක් වේ නම් එය මෙ නයින් දතයුතු ය''යි මෙය භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. සුගත වූ ශාස්තෲන් වහන්සේ මෙය වදරා යළි මතු ද මෙය වදළ සේක:

1. යම් ආර්‍යමාර්ගයානයෙක ශ්‍රද්ධාව ද ප්‍රඥාව ද යන ධර්මයෝ හැම කල්හි ධුරයෙහි යෙදුණාහු ද, ලජ්ජාව රියහිස වේ ද, (විදර්ශනා හා මාර්ග) සිත යොත වේ ද, සිහිය ආරක්ෂක රියැදුරා වේ ද,

2. (ආර්‍ය) අෂ්ටාඞ්ගික මාර්ග නමැති රථය ශීලය අලඞ්කාර කොට ඇත්තේ ද ධ්‍යානය අකුර කොට ඇත්තේ ද වීර්‍යය චක්‍ර කොට ඇත්තේ ද, උපෙක්ෂාව ධුර සමත්වය කොට ඇත්තේ ද, අලොභය ආවරණය කොට ඇත්තේ ද,

3. අව්‍යාපාද අවිහිංසා (ත්‍රිවිධ) විවෙක යන පස යම් රථයෙක ආවුධ වේ ද ඉවසීම පැළඳගත් යුද්ධ සැට්ටය වේ ද, නිවන පිණිස පවතී ද,

4. නිරුත්තර වූ මේ බ්‍රහ්මයානය හෙවත් ශ්‍රෙෂ්ඨ යානය තමා කෙරෙහි හටගත්තේ නම් (ඒ) ප්‍රාඥයෝ ඒකාන්තයෙන් (රාගාදීන්) දිනමින් ලෝකයෙන් නික්මෙති යි.

## 1. 1. 5

## කිමත්ථිය සූත්‍රය

**5. සැවැත්නුවර ;**

**ඉක්බිති බොහෝ භික්ෂූහු** භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. **එළඹ භාග්‍යවතුන්** වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් **ඒ භික්ෂූහු භාග්‍යවතුන්** වහන්සේට මෙය සැලකළහ: වහන්ස, මෙහි **අන්තොටු පිරිවැජ්ජෝ** මෙසේ අප පුළුවුසිත්: ''ඇවැත්නි කුමක් පිණිස මහණගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ ද?''යි වහන්ස, මෙසේ පුළුවුස්නා ලද අපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසම්හ: ''ඇවැත්නි දුක පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ'' යි. වහන්ස, කිම? එසේ පුළුවුස්නා ලද අපි මෙසේ පවසන්නමෝ භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දක් කියන්නමෝ වමු ද? ''භාග්‍යවතුන් වහන්සේට අභූතයෙන් නො ද චොදනා කරමෝ ද? දහමට ද අනුදහමක් පවසමෝ ද? කරුණු සහිත කිසියම් වාදනුවාදයෙක් ගැරහියයුතු තැනට නො ද පැමිණේ ද?''යි.

තස්ස තුම්හෙ භික්ඛවෙ, එවං පුට්ඨා එවං ව්‍යාකරමානා වුත්තවාදිනො චෙව මෙ හොථ, න ච මං අභූතෙන අබ්භාචික්ඛථ, ධම්මස්ස චානුධම්මං ව්‍යාකරොථ, න ච කොචි සහධම්මිකො වාදනුවාදො ගාරය්හං ඨානං ආගච්ඡති. දුක්ඛස්ස හි භික්ඛවෙ, පරිඤ්ඤත්ථං මයි බ්‍රහ්මචරියං වුස්සති. සචෙ වො[1] භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං, අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපදා එතස්ස දුක්ඛස්ස පරිඤ්ඤායාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: ''අත්ථි ඛො ආවුසො, මග්ගො අත්ථි පටිපදා එතස්ස දුක්ඛස්ස පරිඤ්ඤායා''ති. කතමො ච භික්ඛවෙ, මග්ගො කතමා පටිපදා එතස්ස දුක්ඛස්ස පරිඤ්ඤාය: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං භික්ඛවෙ, මග්ගො අයං පටිපදා එතස්ස දුක්ඛස්ස පරිඤ්ඤායාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

## 1. 1. 6

## භික්ඛුසුත්තං

6. සාවත්ථියං:

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ''බ්‍රහ්මචරියං බ්‍රහ්මචරිය''න්ති භන්තෙ, වුච්චති, කතමන්නු ඛො භන්තෙ, බ්‍රහ්මචරියං? කතමං බ්‍රහ්මචරියපරියොසානන්ති? අයමෙව ඛො භික්ඛු, අරියො අට්ඨඞ්ගිකො මග්ගො බ්‍රහ්මචරියං. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. යො ඛො භික්ඛු, රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං බ්‍රහ්මචරියපරියොසානන්ති.

## 1. 1. 7

## දුතිය භික්ඛුසුත්තං

7. සාවත්ථියං:

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: රාගවිනයො දොසවිනයො මොහවිනයොති භන්තෙ, වුච්චති, කිස්ස නු ඛො එතං භන්තෙ, අධිවචනං රාගවිනයො දොසවිනයො මොහවිනයොති? නිබ්බානධාතුයා ඛො එතං භික්ඛු, අධිවචනං රාගවිනයො දොසවිනයො මොහවිනයොති. ආසවානං ඛයො තෙන වුච්චතීති. එවං වුත්තෙ සො භික්ඛු භගවන්තං එතදවොච: අමතං අමතන්ති භන්තෙ, වුච්චති, කතමන්නු ඛො භන්තෙ, අමතං, කතමො අමතගාමිමග්ගොති? යො සො භික්ඛු රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං වුච්චති අමතං. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො අමතගාමිමග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධීති.

---

1. සචෙ ඛො - සී 1, 2.

මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි මෙසේ පවසන්නහු එකාන්තයෙන් මා විසින් කියන ලද්දක් කියන්නහු වවු. මට අභූතයෙන් නො ද චෝදනා කරවු. දහමට ද අනුදහමක් පවසවු. කරුණු සහිත කිසියම් වාදනුවාදයෙක් ගැරහියයුතු තැනට නො ද පැමිණේ. ''මහණෙනි දුක පිරිසිඳ දැනගැනුම පිණිස මා කෙරෙහි බඹසර වෙසේ ''මහණෙනි ඉදින් මේ දුක පිරිසිඳ දැනගනු පිණිස මඟෙක් ඇද්ද? පිළිවෙතෙක් ඇද්ද''යි අන්තොටු පිරිවැජියෝ මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසවු: ''ඇවැත්නි, මේ දුක පිරිසිඳ දැන ගැනීම පිණිස මඟෙක් ඇත, පිළිවෙතෙක් ඇතැ''යි. මහණෙනි, මේ දුක පිරිසිඳ දැන ගැනීම පිණිස මඟ කවරේ ද, පිළිවෙත කවර ද යත්: මේ අරිඅටඟිමග ම ය. ඒ මෙසේ යි: සම්මාදිට්ඨි ය, සම්මා සඞ්කප්ප ය, සම්මාවාචා ය, සම්මා කම්මන්ත ය, සම්මාආජීව ය, සම්මා වායාම ය, සම්මාසති ය, සම්මාසමාධි යි. මහණෙනි, මේ දුක පිරිසිඳ දැන ගැනීම පිණිස මේ මග ය, මේ පිළිවෙතැ යි. මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජ්ජන්ට මෙසේ විසඳන්නහු යි.

## 1. 1. 6

## භික්ඛු සූත්‍රය

**6. සැවැත්නුවර :**

ඉක්බිති එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''වහන්ස, ''බ්‍රහ්මචරිය ය බ්‍රහ්මචරිය''යි කියනු ලැබේ. වහන්ස, බ්‍රහ්මචරියය කවරේ ද, බ්‍රහ්මචරියෙහි කෙළවර කවරේ දැ?යි. මහණ මේ අරි අටඟිමග ම බ්‍රහ්මචරිය ය. ඒ මෙසේ යි: සම්මාදිට්ඨි ය ... සම්මාසමාධි යි. මහණ, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ නම් මේ බ්‍රහ්මචර්යායෙහි කෙළවර යි.

## 1. 1. 7

## දුතිය භික්ඛු සූත්‍රය

**7. සැවැත්නුවර :**

ඉක්බිති එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''වහන්ස, ''රාගවිනය ය දෙසවිනය ය මොහවිනය''යි කියනු ලැබේ. වහන්ස, රාගවිනය ය දෙසවිනය ය මොහවිනය යි තෙල කුමකට නම් වේ දැ? යි ''මහණ, රාගවිනය ය දෙසවිනය ය මොහවිනය යි තෙල නිර්වාණ ධාතුවට මේ නම් ය. එයින් ආස්‍රවක්ෂය කියනු ලැබේ'' යි. මෙසේ කී කල්හි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, ''අමත ය අමත ය''යි කියනු ලැබේ, වහන්ස, අමෘතය කවරේ ද, අමෘතගාමී මාර්ගය කවරේ දැ?යි. මහණ, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ නම්, මේ ''අමෘත ය''යි කියනු ලැබේ. මේ අරි අටඟි මග ම ''අමෘතගාමී මාර්ග යි. ඒ මෙසේ යි: ''සම්‍යග්දෘෂ්ටි ය... සම්‍යක්සමාධි යි.

## 1. 1. 8

## විභඞ්ගසුත්තං

8. **සාවත්ථියං :**

අරියං වො භික්ඛවෙ, අට්ඨඞ්ගිකං මග්ගං දෙසිස්සාමි, විභජිස්සාමි, තං සුණාථ, සාධුකං මනසි කරොථ, භාසිස්සාමීති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච: කතමො ච භික්ඛවෙ, අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. කතමා ච භික්ඛවෙ, සම්මාදිට්ඨි? යං ඛො භික්ඛවෙ, දුක්ඛෙ ඤාණං දුක්ඛසමුදයෙ ඤාණං දුක්ඛනිරොධෙ ඤාණං දුක්ඛ-නිරොධගාමිනියා පටිපදාය ඤාණං, අයං වුච්චති භික්ඛවෙ, සම්මාදිට්ඨි.

කතමො ච භික්ඛවෙ, සම්මාසඞ්කප්පො: යො ඛො භික්ඛවෙ, නෙක්ඛම්මසඞ්කප්පො අව්‍යාපාදසංකප්පො අවිහිංසාසඞ්කප්පො, අයං වුච්චති භික්ඛවෙ, සම්මාසඞ්කප්පො.

කතමා ච භික්ඛවෙ, සම්මාවාචා: යා ඛො භික්ඛවෙ, මුසාවාදා වෙරමණී පිසුනාය වාචාය වෙරමණී ඵරුසාය වාචාය වෙරමණී සම්ඵප්පලාපා වෙරමණී අයං වුච්චති භික්ඛවෙ, සම්මාවාචා.

කතමො ච භික්ඛවෙ, සම්මාකම්මන්තො: යා ඛො භික්ඛවෙ, පාණාතිපාතා වෙරමණී අදින්නාදානා වෙරමණී අබ්‍රහ්මචරියා වෙරමණී, අයං වුච්චති භික්ඛවෙ, සම්මාකම්මන්තො.

කතමො ච භික්ඛවෙ, සම්මාආජීවො: ඉධ භික්ඛවෙ, අරියසාවකො මිච්ඡාආජීවං පහාය සම්මාආජීවෙන ජීවිකං කප්පෙති, අයං වුච්චති භික්ඛවෙ, සම්මාආජීවො.

කතමො ච භික්ඛවෙ, සම්මාවායාමො: ඉධ භික්ඛවෙ, භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අයං වුච්චති භික්ඛවෙ, සම්මාවායාමො.

# 1. 1. 8

## විභඞ්ග සූත්‍රය

8. සැවැත්නුවර :

මහණෙනි, අරි අටඟි මඟ තොපට දේශනා කරන්නෙමි බෙද දක්වන්නෙමි. එය අසවු, මැනවින් මෙනෙහි කරවු, කියමි යි. වහන්ස එසේ ය යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්සූහ. භාග්‍යවතුන් වහන්සේ තෙල වදළ සේක: මහණෙනි, අරි අටඟි මඟ කවරේ ද, ඒ මෙසේ යි: 'සම්මාදිට්ඨිය...සම්මාසමාධි යි. මහණෙනි, සම්මාදිට්ඨිය කවර යත්: මහණෙනි දුකෙහි යම් දැනීමෙක් දුක හටගැනීමෙහි යම් දැනීමෙක් දුක වැළකීමෙහි යම් දැනීමෙක් දුක වැළකීමට යන පිළිවෙතෙහි යම් දැනීමෙක් වේ නම් මහණෙනි මේ ''සම්මාදිට්ඨි'' යයි කියනු ලැබේ.

මහණෙනි සම්මාසඞ්කප්පය කවරේ ද යත්: මහණෙනි යම් නෛෂ්ක්‍රම්‍ය සඞ්කල්පයෙක් අව්‍යාපාදසඞ්කල්පයෙක් අවිහිංසාසඞ්කල්පයෙක් වේ නම් මහණෙනි, මේ 'සම්මාසඞ්කප්ප'යි කියනු ලැබේ.

මහණෙනි, සම්මාවාචා කවර යත්: මහණෙනි, යම් මුසවායෙන් වැළකීමෙක් පිසුනු වදනින් වැළකීමෙක් රළු වදනින් වැළකීමෙක් හිස්වදනින් වැළකීමෙක් වේ නම් මහණෙනි මේ 'සම්මාවාචා' යි කියනු ලැබේ.

මහණෙනි, සම්මාකම්මන්තය කවරේ ද යත්: මහණෙනි, යම් පණිවායෙන් වැළකීමෙක් අයිනාදනින් වැළකීමෙක් අබ්‍රම්සරින් වැළකීමෙක් වේ නම් මහණෙනි, මේ 'සම්මාකම්මන්ත' යි කියනු ලැබේ.

මහණෙනි, සම්මා ආජීවය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවු තෙමේ වැරදි දිවිපෙවෙත හැර යහපත් දිවිපෙවෙතින් ජීවිකාව කෙරෙයි. මහණෙනි, මේ 'සම්මාආජීව'යි කියනු ලැබේ.

මහණෙනි, සම්මාවායාමය කවරේ ද යත්: මහණෙනි, මෙහි මහණ නූපන් පවිටු අකුසල් දහම් නො ඉපදීම පිණිස ඡන්දය උපදවයි, වැයම් කෙරෙයි, වෙර අරඹයි, සිත දැඩි කොට ගනියි, ප්‍රධන් වීර්‍ය්‍යය කෙරේ. උපන් පවිටු අකුසල් දහම් පැහීම පිණිස ඡන්දය උපදවයි. වැයම් කෙරෙයි, වෙර අරඹයි. සිත දැඩි කොට ගනියි, ප්‍රධන් වීර්‍ය්‍යය කෙරේ. නූපන් කුසල් දහම් ඉපදීම පිණිස ඡන්දය උපදවයි, වැයම් කෙරෙයි, වෙර අරඹයි, සිත දැඩි කොට ගනියි. ප්‍රධන් වීර්‍ය්‍යය කෙරේ. උපන් කුසල් දහමුන්ගේ පැවැත්ම පිණිස නො මුළාව පිණිස බොහෝබව පිණිස විපුලබව පිණිස වැඩීම පිණිස පිරිපුන්බව පිණිස ඡන්දය උපදවයි, වැයම් කෙරෙයි, වෙර අරඹයි, සිත දැඩි කොට ගනියි. ප්‍රධන් වීර්‍ය්‍යය කෙරේ. මහණෙනි, මේ 'සම්මාවායාම' යි කියනු ලැබේ.

කතමා ච භික්ඛවෙ, සම්මාසති: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අයං වුච්චති භික්ඛවෙ, සම්මාසති.

කතමො ච භික්ඛවෙ, සම්මාසමාධි: ඉධ භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති, සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං වුච්චති භික්ඛවෙ, සම්මාසමාධීති.

## 1. 1. 9

### සූකසුත්තං

9. සාවත්ථියං :

සෙය්‍යථාපි භික්ඛවෙ, සාලිසූකං වා යවසූකං වා මිච්ඡාපණිහිතං හත්ථෙන වා පාදෙන වා අක්කන්තං හත්ථං වා පාදං වා භෙච්ඡති[1] ලොහිතං වා උප්පාදෙස්සතීති නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු: මිච්ඡාපණිහිතත්තා භික්ඛවෙ, සූකස්ස. එවමෙව ඛො භික්ඛවෙ, සො වත භික්ඛු මිච්ඡාපණිහිතාය දිට්ඨියා මිච්ඡාපණිහිතාය මග්ගභාවනාය අවිජ්ජං භෙච්ඡති[1] විජ්ජං උප්පාදෙස්සති නිබ්බානං සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු: මිච්ඡාපණිහිතත්තා භික්ඛවෙ, දිට්ඨියා.

සෙය්‍යථාපි භික්ඛවෙ, සාලිසූකං වා යවසූකං වා සම්මාපණිහිතං, හත්ථෙන වා පාදෙන වා අක්කන්තං හත්ථං වා පාදං වා භෙච්ඡති[1] ලොහිතං වා උප්පාදෙස්සතීති ඨානමෙතං විජ්ජති. තං කිස්ස හෙතු. සම්මාපණිහිතත්තා භික්ඛවෙ, සූකස්ස. එවමෙව ඛො භික්ඛවෙ, සො වත භික්ඛු සම්මාපණිහිතාය දිට්ඨියා සම්මාපණිහිතාය මග්ගභාවනාය අවිජ්ජං භෙච්ඡති විජ්ජං උප්පාදෙස්සති නිබ්බානං සච්ඡිකරිස්සතීති. ඨානමෙතං විජ්ජති. තං කිස්ස හෙතු, සම්මාපණිහිතත්තා භික්ඛවෙ, දිට්ඨියා.

1. භිජ්ජති - සී, 1, 2. භින්දිස්සති - මජසං, සයා.

මහණෙනි, සම්මාසතිය කවර යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව බලනසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා නුවණැති ව සිහි ඇති ව කාය ලෝකයෙහි දැඩිලොබ හා දොම්නස දුරුකොට වෙසෙයි. වේදනාවන්හි වේදනා අනුව බලන සුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා නුවණැති ව සිහි ඇති ව (විඳුම්) ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. සිත්හි සිත් අනුව බලන සුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා නුවණැති ව සිහි ඇති ව (සිත්) ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. දහම්හි දහම් අනුව බලන සුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා නුවණැති ව සිහි ඇති ව (දහම්) ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මේ සම්මාසති යි කියනු ලැබේ.

මහණෙනි, සම්මාසමාධිය කවරේ ද යත්: මහණෙනි, මෙහි මහණ කාමයන්ගෙන් වෙන් ව ම අකුසල ධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි. විතර්ක විචාර සන්හිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකඟ බැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුඛය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වෙසෙයි. ප්‍රීතිය ද වැළකීමෙන් උපේක්ෂා ද ඇති ව වෙසේ. සිහි ද ඇති ව මනාදැනුමුත් ඇතිව කයින් සුවත් විඳී, උපේක්ෂා ඇත්තේ ය, සිහි ඇත්තේ ය, සුව විහරණ ඇත්තේ ය යි ආර්‍යයෝ ඒ යමක් සඳහා කියත් නම් ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසේ. සුවත් පැහීමෙන් දුකත් පැහීමෙන් පෙර ම සොම්නස්දොම්නසුන්ගේ පහ ව යැමෙන් නොදුක් වූ නොසුව වූ උපේක්ෂාවෙන් හා සිහියෙන් හටගත් පිරිසිදු බැව් ඇති චතුර්ත්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. මහණෙනි, මේ සම්මාසමාධි යි කියනු ලැබේ යි.

## 1. 1. 9

## සූකසූත්‍රය

**9. සැවැත් නුවර:**

මහණෙනි, යම්සේ හැල් නණ්ඩුවක් හෝ යව නණ්ඩුවක් හෝ වරදවා තබන ලද්දේ ද (එය) අතින් හෝ පයින් හෝ ඇක්මුණේ අත හෝ පය හෝ බිඳින්නේ ය, ලේ හෝ උපදවන්නේ ය යන මෙකරුණ නැත. ඒ කවර හෙයින යත්: මහණෙනි, නණ්ඩුව තමා වරදවා තබන ලද බැවිනි. මහණෙනි එසෙයින් ම ඒ මහණ තෙමේ වරදවා පිහිටුවන ලද දෘෂ්ටියෙන් වරදවා පිහිටුවන ලද මාර්ගභාවනායෙන් අවිද්‍යාව බිඳින්නේ ය, විද්‍යාව උපදවන්නේ ය, නිවන පසක් කරන්නේ ය යන මෙකරුණ නැත. ඒ කවර හෙයින යත්: මහණෙනි, දෘෂ්ටිය තමා වරදවා පිහිටුවන ලද බැවිනි.

මහණෙනි, යම්සේ හැල් නණ්ඩුවක් හෝ යව නණ්ඩුවක් හෝ මැනවින් තබන ලද්දේ ද (එය) අතින් හෝ පයින් හෝ ඇක්මුණේ අත හෝ පය හෝ බිඳින්නේ ය. ලේ හෝ උපදවන්නේ ය යන මෙකරුණ ඇත. ඒ කවර හෙයින යත්: මහණෙනි, නණ්ඩුව තමා මැනවින් තබන ලද බැවිනි. මහණෙනි, එසෙයින් ම ඒ මහණ තෙමේ මැනවින් පිහිටුවන ලද දෘෂ්ටියෙන් මැනවින් පිහිටුවන ලද මාර්ගභාවනායෙන් අවිද්‍යාව බිඳින්නේ ය, විද්‍යාව උපදවන්නේ ය, නිවන පසක් කරන්නේ ය යන මෙකරුණ ඇත. ඒ කවර හෙයින යත්: මහණෙනි, දෘෂ්ටිය තමා මැනවින් පිහිටුවන ලද බැවිනි.



Free Distribution www.aathaapi.org

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සම්මාපණිහිතාය දිට්ඨියා සම්මාපණිහිතාය මග්ගභාවනාය අවිජ්ජං භින්දති විජ්ජං උප්පාදෙති[1] නිබ්බානං සච්ඡිකරොති[2], ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං එවඤ්ඤ සො[3] භික්ඛවෙ, භික්ඛු සම්මාපණිහිතාය දිට්ඨියා සම්මාපණිහිතාය මග්ගභාවනාය අවිජ්ජං භින්දති විජ්ජං උප්පාදෙති නිබ්බානං සච්ඡිකරොතීති.

## 1. 1. 10

## නන්දියසුත්තං

10. සාවත්ථියං :

අථ ඛො නන්දියො පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො නන්දියො පරිබ්බාජකො භගවන්තං එතදවොච: කති නු ඛො භො ගොතම, ධම්මා භාවිතා බහුලීකතා නිබ්බානගමා[4] හොන්ති නිබ්බානපරායණා නිබ්බානපරියොසානාති? අට්ඨ[5] ඛො නන්දිය, ධම්මා භාවිතා බහුලීකතා නිබ්බානගමා හොන්ති නිබ්බානපරායණා නිබ්බානපරියොසානා. කතමෙ අට්ඨ, සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉමෙ ඛො නන්දිය, අට්ඨ ධම්මා භාවිතා බහුලීකතා නිබ්බානගමා හොන්ති නිබ්බානපරායණා නිබ්බානපරියොසානාති.

එවං වුත්තෙ නන්දියො පරිබ්බාජකො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ, භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

අවිජ්ජාවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

අවිජ්ජා ච උපඩ්ඪං ච සාරිපුත්තො ච බ්‍රාහ්මණො,
කිමත්ථියො ච ද්වෙ භික්ඛූ විභඞ්ගො සූකනන්දියාති.

1. උප්පාදෙස්සති - ස්‍යා.
2. සච්ඡිකරිස්සති - ස්‍යා.
3. එවං ඛො - මජසං, ස්‍යා.
4. නිබ්බානඞ්ගමා - මජසං.
5. අට්ඨිමෙ - මජසං, ස්‍යා.

මහණෙනි, මැනවින් පිහිටුවන ලද දෘෂ්ටියෙන් මැනවින් පිහිටුවන ලද මාර්ගභාවනායෙන් මහණ තෙමේ කෙසේ නම් අවිද්‍යාව බිඳී ද, විද්‍යාව උපදවා ද නිවන පසක් කෙරේ ද, මහණෙනි, මෙහි මහණ තෙමේ විවෙකනිස්සිත කොට විරාගනිස්සිත කොට නිරෝධනිස්සිත කොට වොස්සග්ගපරිණාමී කොට සම්මාදිට්ඨිය වඩයි... විවෙකනිස්සිත කොට විරාගනිස්සිත කොට නිරෝධනිස්සිත කොට වොස්සග්ගපරිණාමී කොට සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේත් මේ මහණ තෙමේ මැනවින් පිහිටුවන ලද දෘෂ්ටියෙන් මැනවින් පිහිටුවන ලද මාර්ගභාවනායෙන් අවිද්‍යාව බිඳියි, විද්‍යාව උපදවයි, නිවන පසක් කෙරේ යි.

## 1. 1. 10

## නන්දිය සූත්‍රය

**10. සැවැත්නුවර:**

එකල්හි නන්දිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් නන්දිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: භවත් ගෞතමයෙනි, කෙතෙක් දහම්හු වඩන ලද්දහු බහුල කරන ලද්දහු නිවනට යන්නාහු නිවන පිහිට කොට ඇත්තාහු නිවන කෙළවර කොට ඇත්තාහු වෙද්ද? යි නන්දිය, අට දහම් කෙනෙක් වඩන ලද්දහු බහුල කරන ලද්දහු නිවනට යන්නාහු නිවන පිහිට කොට ඇත්තාහු නිවන කෙළවර කොට ඇත්තාහු වෙත්. කවර අටෙක යත්: සම්මාදිට්ඨි ය ... සම්මාසමාධි යි. නන්දිය, මේ අට දහම්හු වඩන ලද්දහු බහුල කරන ලද්දහු නිවනට යන්නාහු නිවන පිහිට කොට ඇත්තාහු නිවන කෙළවර කොට ඇත්තාහු වෙති යි.

මෙසේ වදළ කල්හි නන්දිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි, භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස යම්සේ යටිහුරු වූවක් උඩුහුරු කරන්නේ හෝ වේ ද, පිළිසන් දෑයක් විවර කරන්නේ හෝ වේ ද, මංමුළා වූවකුට මග කියන්නේ හෝ වේද, ඇස් ඇත්තෝ රූ දක්නාහ යි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ හෝ වේ ද එසෙයින් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරෙන් දහම් පවසන ලද්දේ ය. වහන්ස, මම භාග්‍යවත් ගෞතමයන් වහන්සේත් දහමත් බික්සඟනත් සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවි හිම් කොට සරණ ගිය උවසුවකු කොට මා දරන සේක්වා යි.

## පළමුවැනි අවිජ්ජාවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

අවිජ්ජාසූත්‍රය ද උපඩ්ඪසූත්‍රය ද සාරිපුත්තසූත්‍රය ද බ්‍රාහ්මණසූත්‍රය ද කිමත්ථියසූත්‍රය ද භික්ඛුසූත්‍ර දෙක ද විභඞ්ගසූත්‍රය ද සූකනන්දිය සූත්‍ර දෙක ද යි දශ සූත්‍ර කෙනෙකි.

## 2. විහාරවග්ගො

### 1. 2. 1

### විහාරසුත්තං

11. සාවත්ථියං :

ඉච්ඡාමහං භික්ඛවෙ, අඩ්ඪමාසං[1] පතිසල්ලීයිතුං[2], නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙනාති. එවං භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා නාස්සුධ කොචි භගවන්තං උපසඞ්කමති අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙන. අථ ඛො භගවා තස්ස අඩ්ඪමාසස්ස අච්චයෙන පටිසල්ලානා වුට්ඨිතො භික්ඛූ ආමන්තෙසි. යෙන ස්වාහං භික්ඛවෙ, විහාරෙන පඨමාභිසම්බුද්ධො විහරාමි, තස්ස පදෙසෙන විහාසිං. සො එවං පජානාමි. මිච්ඡාදිට්ඨිපච්චයාපි වෙදයිතං, සම්මාදිට්ඨිපච්චයාපි වෙදයිතං, මිච්ඡාසඞ්කප්පපච්චයාපි වෙදයිතං, සම්මාසඞ්කප්පපච්චයාපි වෙදයිතං, මිච්ඡාවාචාපච්චයාපි වෙදයිතං, සම්මාවාචාපච්චයාපි වෙදයිතං, මිච්ඡාකම්මන්තපච්චයාපි වෙදයිතං, සම්මාකම්මන්තපච්චයාපි වෙදයිතං, මිච්ඡාආජීවපච්චයාපි වෙදයිතං, සම්මාආජීවපච්චයාපි වෙදයිතං, මිච්ඡාවායාමපච්චයාපි වෙදයිතං, සම්මාවායාමපච්චයාපි වෙදයිතං, මිච්ඡාසතිපච්චයාපි වෙදයිතං, සම්මාසතිපච්චයාපි වෙදයිතං, මිච්ඡාසමාධිපච්චයාපි වෙදයිතං, සම්මාසමාධිපච්චයාපි වෙදයිතං, ඡන්දපච්චයාපි වෙදයිතං, විතක්කපච්චයාපි වෙදයිතං, සඤ්ඤාපච්චයාපි වෙදයිතං.

ඡන්දො ච අවූපසන්තො හොති, විතක්කා ච[3] අවූපසන්තා හොන්ති, සඤ්ඤා ච අවූපසන්තා හොන්ති[4] තප්පච්චයාපි වෙදයිතං. (ඡන්දො ච වූපසන්තො හොති විතක්කා ච අවූපසන්තා හොන්ති, සඤ්ඤා ච අවූපසන්තා හොන්ති, තප්පච්චයාපි වෙදයිතං, ඡන්දො ච වූපසන්තො හොති, විතක්කා ච වූපසන්තා හොන්ති, සඤ්ඤා ච අවූපසන්තා හොන්ති, තප්පච්චයාපි වෙදයිතං[5].) ඡන්දො ච වූපසන්තො හොති, විතක්කා ච වූපසන්තා හොන්ති, සඤ්ඤා ච වූපසන්තා හොන්ති, තප්පච්චයාපි වෙදයිතං. අප්පත්තස්ස පත්තියා අත්ථි වායාමො,[6] තස්මිම්පි ඨානෙ අනුප්පත්තෙ තප්පච්චයාපි වෙදයිතන්ති.

---

1. අද්ධමාසං - සී 1, 2
2. පටිසල්ලීයිතුං - මජසං. ස්‍යා.
3. විතක්කා ච - මජසං.
4. හොති - මජසං - ස්‍යා, සී 2.
5. අඞ්කිතපාඨො න දිස්සතෙ - මජසං, ස්‍යා පොත්ථකෙසු.
6. ආයාමං - මජසං.

Free Distribution www.aathaapi.org

# 2. විහාර වර්ගය

## 1. 2. 1

## විහාර සූත්‍රය

**11. සැවැත්නුවර:**

මහණෙනි, මම අඩමසක් එකලා වැ වසන්නට කැමැත්තෙමි. පිණ්ඩපාතය රැගෙන එන එක් මහණකු හැර අන් කිසිවකු විසින් නො එළඹිය යුත්තෙම් වෙමි යි. වහන්ස, එසේ යයි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. ඉක්බිති පිණ්ඩපාතය රැගෙන එන එක් මහණකු හැර අන් කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත නො එළඹෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ අඩමස ඇවෑමෙන් විවේකසුවයෙන් නැඟී සිටි සේක් භික්ෂූන් ඇමතූසේක. මහණෙනි, මම බුදු වැ පළමු කොට යම් විහරණයෙකින් විසුයෙම් නම් එහි පෙදෙසකින් යුතු ව විසුවෙමි. මම මෙසේ දනිමි: ''මිච්ඡාදිට්ඨි හේතුවෙන් ද වේදනාව වෙයි, සම්මාදිට්ඨි හේතුවෙන් ද වේදනාව වෙයි, මිච්ඡාසඞ්කප්පහේතුවෙන් ද වේදනාව වෙයි, සම්මාසඞ්කප්පහේතුවෙන් ද වේදනාව වෙයි. මිච්ඡාවාචාහෙතුවෙන් ද වේදනාව වෙයි. සම්මාවාචාහෙතුවෙන් ද වෙදනාව වෙයි, මිච්ඡාකම්මන්තහෙතුවෙන් ද වේදනාව වෙයි, සම්මාකම්මන්තහෙතුවෙන් ද වේදනාව වෙයි, මිච්ඡාආජීවහෙතුවෙන් ද වෙදනාව වෙයි, සම්මාආජීව හේතුවෙන් ද වේදනාව වෙයි, මිච්ඡාවායාමහෙතුවෙන් ද වේදනාව වෙයි, සම්මාවායාමහෙතුවෙන් ද වේදනාව වෙයි, මිච්ඡාසතිහේතුවෙන් ද වේදනාව වෙයි, සම්මාසතිහේතුවෙන් ද වේදනාව වෙයි, මිච්ඡාසමාධි හේතුවෙන් ද වේදනාව වෙයි, සම්මාසමාධිහේතුවෙන් ද වෙදනාව වෙයි, ඡන්දහෙතුවෙන් ද වේදනාව වෙයි, විතක්කහේතුවෙන් ද වෙදනාව වෙයි, සඤ්ඤාහේතුවෙන් ද වේදනාව වේ.

ඡන්දයත් නො සන්හුන්නේ වෙයි. විතක්කයෝත් නො සන්හුන්නාහු වෙති. සඤ්ඤාවෝත් නො සන්හුන්නාහු වෙති. ඒ හේතුවෙන් ද වේදනාව වේ. ඡන්දය සන්හුන්නේ වේ. විතක්කයෝත් නො සන්හුන්නාහු වෙති. සඤ්ඤාවෝත් නො සන්හුන්නාහු වෙති. ඒ හේතුවෙන් ද වේදනාව වේ. ඡන්දයත් සන්හුන්නේ වේ. විතක්කයෝත් සන්හුන්නාහු වෙති. සඤ්ඤාවෝ නො සන්හුන්නාහු වෙති. ඒ හේතුවෙන් ද වේදනාව වේ. ඡන්දයත් සන්හුන්නේ වේ. විතක්කයෝත් සන්හුන්නාහු වෙති. සඤ්ඤාවෝත් සන්හුන්නාහු වෙති. ඒ හේතුවෙන් ද වේදනාව වේ. නො පැමිණි (රහත්බවට) පැමිණීමට වෑයමෙක් ඇත. එකරුණ ද පැමිණි කල්හි ඒ හේතුවෙනුදු වේදනාව වේ ය යි.

## 1. 2. 2

## දුතියවිහාරසුත්තං

12. සාවත්ථියං :

ඉච්ඡාමහං භික්ඛවෙ, තෙමාසං පටිසල්ලීයිතුං, නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙනා'ති. ''එවං භන්තෙ''ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා නාස්සුධ කොචි භගවන්තං උපසඞ්කමති අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙන. අථ ඛො භගවා තස්ස තෙමාසස්ස අච්චයෙන පටිසල්ලානා වුට්ඨිතො භික්ඛූ ආමන්තෙසි: යෙන ස්වාහං භික්ඛවෙ, විහාරෙන පඨමාභිසම්බුද්ධො විහරාමි, තස්ස පදෙසෙන[1] විහාසිං. සො එවං පජානාමි, මිච්ඡාදිට්ඨිපච්චයාපි වෙදයිතං, මිච්ඡාදිට්ඨිවූපසමපච්චයාපි වෙදයිතං, සම්මාදිට්ඨිපච්චයාපි වෙදයිතං, සම්මාදිට්ඨිවූපසමපච්චයාපි වෙදයිතං, (සබ්බං විත්ථාරෙතබ්බං) -පෙ- මිච්ඡාසමාධිපච්චයාපි වෙදයිතං, මිච්ඡාසමාධිවූපසමපච්චයාපි වෙදයිතං, සම්මාසමාධිපච්චයාපි වෙදයිතං, සම්මාසමාධිවූපසමපච්චයාපි වෙදයිතං, ඡන්දපච්චයාපි වෙදයිතං, ඡන්දවූපසමපච්චයාපි වෙදයිතං, විතක්කපච්චයාපි වෙදයිතං, විතක්කවූපසමපච්චයාපි වෙදයිතං, සඤ්ඤාපච්චයාපි වෙදයිතං, සඤ්ඤාවූපසමපච්චයාපි වෙදයිතං.

ඡන්දො ච අවූපසන්තො හොති විතක්කා ච අවූපසන්තා හොන්ති, සඤ්ඤා ච අවූපසන්තා හොන්ති, තප්පච්චයාපි වෙදයිතං. ඡන්දො ච වූපසන්තො හොති, විතක්කා ච අවූපසන්තා හොන්ති, සඤ්ඤා ච අවූපසන්තා හොන්ති, ඡන්දො ච වූපසන්තො හොති, විතක්කා ච වූපසන්තා හොන්ති. තප්පච්චයාපි වෙදයිතං. සඤ්ඤා ච අවූපසන්තා හොන්ති. තප්පච්චයාපි වෙදයිතං. ඡන්දො ච වූපසන්තො හොති, විතක්කා ච වූපසන්තා හොන්ති, සඤ්ඤා ච වූපසන්තා හොන්ති, තප්පච්චයාපි වෙදයිතං. අප්පත්තස්ස පත්තියා අත්ථි වායාමං, තස්මිම්පි ඨානෙ අනුප්පත්තෙ තප්පච්චයාපි වෙදයිතන්ති.

## 1. 2. 3

## සෙඛසුත්තං

13. සාවත්ථියං :

අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ''සෙඛො සෙඛො''ති භන්තෙ, වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ, සෙඛො හොතීති? ඉධ භික්ඛු සෙඛාය සම්මාදිට්ඨියා සමන්නාගතො හොති, සෙඛෙන සම්මාසඞ්කප්පෙන සමන්නාගතො හොති, සෙඛාය සම්මාවාචාය සමන්නාගතො හොති, සෙඛෙන සම්මාකම්මන්තෙන සමන්නාගතො හොති, සෙඛෙන සම්මාආජීවෙන සමන්නාගතො හොති, සෙඛෙන සම්මාවායාමෙන සමන්නාගතො හොති, සෙඛාය සම්මාසතියා සමන්නාගතො හොති, සෙඛෙන සම්මාසමාධිනා සමන්නාගතො හොති, එත්තාවතා ඛො භික්ඛු සෙඛො හොතීති.

---

1. පදෙසෙනෙව - සී 1, 2.

## 1. 2. 2

## දෙවන විහාර සූත්‍රය

**12. සැවැත්නුවර :**

මහණෙනි, මම තෙමසක් එකලා වැ වසන්නට කැමැත්තෙමි. පිණ්ඩපාතය රැගෙන එන එක් මහණකු හැර අන් කිසිවකු විසින් නො එළඹිය යුත්තෙම් වෙමි යි. වහන්ස, එසේ ය යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. (ඉක්බිති) පිණ්ඩපාතය රැගෙන එන එක් මහණකු හැර අන් කිසිවෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත නො එළඹෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ තෙමස ඇවෑමෙන් විවේකයෙන් නැගී සිටිසේක් භික්ෂූන් ඇමතූ සේක. මහණෙනි, මම බුදු ව පළමු කොට යම් විහරණයෙකින් විසුවෙම් නම් එහි පෙදෙසකින් යුතු ව විසුවෙමි. මම මෙසේ දනිමි. මිච්ඡාදිට්ඨි හේතුවෙන් ද වෙදනාව වෙයි. මිච්ඡාදිට්ඨි වූපසම හෙතුවෙන් ද වේදනාව වෙයි. සම්මාදිට්ඨි හේතුවෙන් ද වෙදනාව වෙයි. සම්මාදිට්ඨි වූපසම හේතුවෙන් ද වෙදනාව වෙයි. (සියල්ල විතර කට යුතු යි) ... මිච්ඡාසමාධිහෙතුවෙන් ද වෙදනාව වෙයි. මිච්ඡාසමාධි වූපසම හෙතුවෙන් ද වේදනාව වෙයි. සම්මාසමාධි හෙතුවෙන් ද වෙදනාව වෙයි. සම්මාසමාධි වූපසම හෙතුවෙන් ද වේදනාව වෙයි. ඡන්ද හෙතුවෙනුදු වෙදනාව වෙයි. ඡන්ද වූපසම හේතුවෙන් ද වේදනාව වෙයි. විතක්ක හෙතුවෙන් ද වේදනාව වෙයි. විතක්ක වූපසම හේතුවෙන් ද වේදනාව වෙයි. සඤ්ඤාහේතුවෙන් ද වේදනාව වෙයි. සඤ්ඤාවූපසම හේතුවෙනුදු වේදනාව වේ.

ඡන්දයත් නො සන්හුන්නේ වේ. විතක්කයෝත් නො සන්හුන්නාහු වෙති. සඤ්ඤාවෝත් නො සන්හුන්නාහු වෙති. ඒ හෙතුවෙන් ද වෙදනාව වේ. ඡන්දය සන්හුන්නේ වේ. විතක්කයෝත් නො සන්හුන්නාහු වෙති. සඤ්ඤාවෝත් නො සන්හුන්නාහු වෙති. ඒ හෙතුවෙන් ද වෙදනාව වේ. ඡන්දයත් සන්හුන්නේ වේ. විතක්කයෝත් සන්හුන්නාහු වෙති. සඤ්ඤාවෝ නො සන්හුන්නාහු වෙති. ඒ හේතුවෙන් ද වේදනාව වේ. ඡන්දයත් සන්හුන්නේ වේ. විතක්කයෝත් සන්හුන්නාහු වෙති. සඤ්ඤාවෝත් සන්හුන්නාහු වෙති. ඒ හේතුවෙන් ද වෙදනාව වේ. නො පැමිණි (අර්හත්වයට) පැමිණීම පිණිස වෑයමෙක් ඇත. එකරුණ ද පැමිණි කල්හි ඒ හේතුවෙනුදු වේදනාව වේ යි.

## 1. 2. 3

## සේඛ සූත්‍රය

**13. සැවැත්නුවර :**

එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. වහන්ස, ''සේඛ ය, සේඛ යයි කියනු ලැබේ''යි වහන්ස, කෙතෙකින් සේඛ වේ දෝ?''යි මෙසස්නෙහි මහණ සේඛ වූ සම්මාදිට්ඨියෙන් යුතු වූයේ වේ ද සේඛ වූ සම්මාසඞ්කප්පයෙන් යුතු වූයේ වේ ද සේඛ වූ සම්මාවාචායෙන් යුතු වූයේ වේ ද සේඛ වූ සම්මාකම්මන්තයෙන් යුතු වූයේ වේ ද, සේඛ වූ සම්මා ආජීවයෙන් යුතු වූයේ වේ ද සේඛ වූ සම්මාවායාමයෙන් යුතු වූයේ වේ ද සේඛ වූ සම්මාසතියෙන් යුතු වූයේ වේ ද සේඛ වූ සම්මාසමාධියෙන් යුතු වූයේ වේ ද, මෙතෙකින් මහණ සේඛ වේ යි.

## 1. 2. 4

## උප්පාදසුත්තං

14. සාවත්ථියං:

අට්ඨිමෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා අනුප්පන්නා උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර තථාගතස්ස පාතුභාවා අරහතො සම්මාසම්බුද්ධස්ස. කතමෙ අට්ඨ: සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨ ධම්මා භාවිතා බහුලීකතා අනුප්පන්නා උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර තථාගතස්ස පාතුභාවා අරහතො සම්මාසම්බුද්ධස්සාති.

## 1. 2. 5

## දුතියඋප්පාදසුත්තං

15. සාවත්ථියං:

අට්ඨිමෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා අනුප්පන්නා උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර සුගතවිනයා, කතමෙ අට්ඨ: සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨ ධම්මා භාවිතා බහුලීකතා අනුප්පන්නා උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## 1. 2. 6

## පරිසුද්ධසුත්තං

16. සාවත්ථියං:

අට්ඨිමෙ භික්ඛවෙ, ධම්මා පරිසුද්ධා පරියොදාතා අනඞ්ගණා විගතූපක්කිලෙසා අනුප්පන්නා උප්පජ්ජන්ති, නාඤ්ඤත්‍ර තථාගතස්ස පාතුභාවා අරහතො සම්මාසම්බුද්ධස්ස. කතමෙ අට්ඨ: සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉමෙ ඛො භික්ඛවෙ අට්ඨධම්මා පරිසුද්ධා පරියොදාතා අනඞ්ගණා විගතූපක්කිලෙසා අනුප්පන්නා උප්පජ්ජන්ති, නාඤ්ඤත්‍ර තථාගතස්ස පාතුභාවා අරහතො සම්මාසම්බුද්ධස්සාති.

## 1. 2. 7

## දුතියපරිසුද්ධසුත්තං

17. සාවත්ථියං:

අට්ඨිමෙ භික්ඛවෙ, ධම්මා පරිසුද්ධා පරියොදාතා අනඞ්ගණා විගතූපක්කිලෙසා අනුප්පන්නා උප්පජ්ජන්ති. නාඤ්ඤත්‍ර සුගතවිනයා. කතමෙ අට්ඨ: සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉමෙ ඛො භික්ඛවෙ අට්ඨ ධම්මා පරිසුද්ධා පරියොදාතා අනඞ්ගණා විගතූපක්කිලෙසා අනුප්පන්නා උප්පජ්ජන්ති. නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## 1. 2. 4

## උප්පාද සූත්‍රය

14. සැවැත්නුවර :

මහණෙනි, මේ අටදහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු තථාගත අර්හත් සම්මාසම්බුද්ධ රජාණන් වහන්සේගේ පහළවීමෙන් අන්කලෙක නූපන්නාහු නූපදිත්. කවර අටෙක යත්: එනම්...සම්මාදිට්ඨිය ...සම්මාසමාධිය... යි මහණෙනි, මේ අට දහම්හු වඩන ලදහු බහුල කරන ලදහු තථාගත අර්හත් සම්මාසම්බුද්ධ රජාණන් වහන්සේගේ පහළවීමෙන් අන්කලෙක නූපන්නාහු නූපදිති යි.

## 1. 2. 5

## දෙවන උප්පාද සූත්‍රය

15. සැවැත්නුවර :

මහණෙනි, මේ අට දහම් කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු බුද්ධසසුනෙන් අන්තැනෙක නූපන්නාහු නූපදිත්. කවර අටෙක් ද යත්: එනම් සම්මාදිට්ඨි ය...සම්මාසමාධි යි. මහණෙනි. මේ අට දහම්හු වඩන ලදහු බහුල කරන ලදහු බුද්ධසස්නෙන් අන් තැනෙක නූපන්නාහු නූපදිති යි.

## 1. 2. 6

## පරිසුද්ධ සූත්‍රය

16. සැවැත්නුවර :

පරිශුද්ධ පයර්‍යවදාත අනඞ්ගණ විගතොපක්ලෙශ මේ අට දහම් කෙනෙක් තථාගත අර්හත් සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේගේ පහළ වීමෙන් අන්කලෙක නූපන්නාහු නූපදිත්. කවර අටෙක යත්: සම්මා-දිට්ඨි ය...සම්මාසමාධි යි. මහණෙනි, පරිශුද්ධ පයර්‍යවදාත අනඞ්ගණ විගතොපක්ලෙශ මේ අට දහම්හු තථාගත අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේගේ පහළ වීමෙන් අන්කලෙක නූපන්නාහු නූපදිති යි.

## 1. 2. 7

## දෙවන පරිසුද්ධ සූත්‍රය

17. සැවැත්නුවර :

මහණෙනි, පරිශුද්ධ පයර්‍යවදාත අනඞ්ගණ විගතොපක්ලෙශ මේ අට දහම් කෙනෙක් බුද්ධසසුනෙන් අන්තැනෙක නූපන්නාහු නූපදිත්. කවර අටෙක යත්: සම්මාදිට්ඨි ය ... සම්මාසමාධි යි. මහණෙනි, පරිශුද්ධ පයර්‍යවදාත අනඞ්ගණ විගතෝපක්ලේශ මේ අට දහම්හු බුද්ධසසුනෙන් අන් තැනෙක නූපන්නාහු නූපදිති යි.

## 1. 2. 8

## කුක්කුටාරාමසුත්තං

18. එවං මෙ සුතං, එකං සමයං ආයස්මා ච ආනන්දො ආයස්මා ච භද්දො පාටලිපුත්තෙ විහරන්ති කුක්කුටාරාමෙ. අථ ඛො ආයස්මා භද්දො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා භද්දො ආයස්මන්තං ආනන්දං එතදවොච: ''අබ්‍රහ්මචරියං අබ්‍රහ්මචරියන්ති ආවුසො ආනන්ද, වුච්චති. කතමං නු ඛො ආවුසො අබ්‍රහ්මචරිය''න්ති?

සාධු සාධු ආවුසො භද්ද, භද්දකො තෙ ආවුසො භද්ද උම්මඟ්ගො, භද්දකං පටිභානං, කල්‍යාණී පරිපුච්ඡා එවං හි ත්වං ආවුසො භද්ද, පුච්ඡසි ''අබ්‍රහ්මචරියං අබ්‍රහ්මචරිය''න්ති ආවුසො ආනන්ද වුච්චති කතමං නු ඛො ආවුසො අබ්‍රහ්මචරියන්ති. එවමාවුසොති. අයමෙව ඛො ආවුසො අට්ඨඞ්ගිකො මිච්ඡාමග්ගො අබ්‍රහ්මචරියං. සෙය්‍යථීදං: මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තො මිච්ඡාආජීවො මිච්ඡාවායාමො මිච්ඡාසති මිච්ඡාසමාධීති.

## 1. 2. 9

## දුතිය කුක්කුටාරාමසුත්තං

19. පාටලිපුත්තෙ:

එකමන්තං නිසින්නො ඛො ආයස්මා භද්දො ආයස්මන්තං ආනන්දං එතදවොච: ''බ්‍රහ්මචරියං බ්‍රහ්මචරිය''න්ති ආවුසො ආනන්ද වුච්චති. කතමං නු ඛො ආවුසො බ්‍රහ්මචරියං? කතමං බ්‍රහ්මචරියපරියොසානන්ති?

සාධු සාධු ආවුසො භද්ද, භද්දකො තෙ ආවුසො භද්ද, උම්මඟ්ගො, භද්දකං පටිභානං, කල්‍යාණී පරිපුච්ඡා, එවං හි ත්වං ආවුසො භද්ද, පුච්ඡසි ''බ්‍රහ්මචරියං බ්‍රහ්මචරිය''න්ති ආවුසො ආනන්ද, වුච්චති. කතමං නු ඛො ආවුසො බ්‍රහ්මචරියං කතමං බ්‍රහ්මචරියපරියොසානන්ති? එවමාවුසොති,

අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො බ්‍රහ්මචරියං. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. යො ඛො ආවුසො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං බ්‍රහ්මචරියපරියොසානන්ති.

## 1. 2. 8

## කුක්කුටාරාම සූත්‍රය

18. මා විසින් මෙසේ අසන ලදී. එක්සමයෙක ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝත් ආයුෂ්මත් භද්ද තෙරණුවෝත් පැළලුප් නුවර කුක්කුටාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් භද්ද තෙරණුවෝ සවස්කල විවේකයෙන් නැගී සිටියාහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් සමඟ සතුටු වූහ. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස් ව වැඩහුන්හ. එකත්පස් ව වැඩ හුන් ආයුෂ්මත් භද්ද තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය කීහ: ''ඇවැත් ආනන්දයෙනි, ''අබ්‍රහ්මචරිය ය අබ්‍රහ්මචරිය යි කියනු ලැබේ. ඇවැත්නි, අබ්‍රහ්මචරියය කවරේ ද?''යි.

ඇවැත් භද්දයෙනි, මැනවි මැනවි. ඇවැත් භද්දයෙනි, තොපගේ පැන විමසීම යහපති. වැටහීම යහපති. පිළිවිසීම යහපති. ඇවැත් භද්දයෙනි, තෙපි ''ඇවැත් ආනන්දයෙනි, අබ්‍රහ්මචරිය ය අබ්‍රහ්මචරිය යි කියනු ලැබේ. ඇවැත්නි, අබ්‍රහ්මචරිය ය කවරේ ද? යි මෙසේ පුළුවුසිවු ද?''යි ඇවැත්නි, එසේ ය යි. ඇවැත්නි, මේ අෂ්ටාංගිකමිච්ඡා මාර්ගය ම අබ්‍රහ්මචරිය යයි. එනම්, මිච්ඡාදිට්ඨි මිච්ඡාසංකප්ප මිච්ඡාවාචා මිච්ඡාකම්මන්ත මිච්ඡාආජීව මිච්ඡාවායාම මිච්ඡාසති මිච්ඡාසමාධි යි.

## 1. 2. 9

## දෙවන කුක්කුටාරාම සූත්‍රය

19. **පැළලුප්නුවර:**

**එකත්පස්ව හුන් ආයුෂ්මත් භද්ද තෙරණුවෝ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය කීහ: ''ඇවැත් ආනන්දයෙනි, බඹසර බඹසර''යි කියනු ලැබේ. ඇවැත්නි, බඹසර කවරේ ද?බඹසර කෙළවර කවරේ ද?යි.**

ඇවැත් භද්දයෙනි, මැනවි මැනවි. ඇවැත් භද්දයෙනි, තොපගේ පැන විමසීම යහපති, වැටහීම යහපති, පිළිවිසුම යහපති. ඇවැත්නි, භද්දයෙනි, තෙපි''ඇවැත්නි ආනන්දයෙනි, බඹසර බඹසර යි කියනු ලැබේ. ඇවැත්නි, බඹසර කවරේ ද? බඹසර කෙළවර කවරේ ද''යි මෙසේ පුළුවුසිවු ද?යි. ඇවැත්නි, එසේ යයි.

ඇවැත්නි, මේ අරි අටඟි මග ම බඹසර ය. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. ඇවැත්නි, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මොහක්ෂයයෙක් වේ නම් මේ බඹසර කෙළවර යි.

## 1. 2. 10

## තතියකුක්කුටාරාමසුත්තං

**20.** පාටලිපුත්තෙ:

"බ්‍රහ්මචරියං බ්‍රහ්මචරිය"න්ති ආවුසො ආනන්ද වුච්චති, කතමං නු ඛො ආවුසො බ්‍රහ්මචරියං? කතමො බ්‍රහ්මචාරී? කතමං බ්‍රහ්මචරිය-පරියොසානන්ති?

සාධු සාධු ආවුසො භද්ද, භද්දකො තෙ ආවුසො භද්ද උම්මඞ්ගො, භද්දකං පටිභානං, කල්‍යාණී පරිපුච්ඡා, එවං හි ත්වං ආවුසො භද්ද, පුච්ඡසි. "බ්‍රහ්මචරියං බ්‍රහ්මචරියන්ති ආවුසො ආනන්ද වුච්චති කතමං නු ඛො ආවුසො බ්‍රහ්මචරියං, කතමො බ්‍රහ්මචාරී, කතමං බ්‍රහ්මචරිය පරියොසාන"න්ති? එවමාවුසොති.

අයමෙව ඛො ආවුසො අරියො අට්ඨඞ්ගිකො මග්ගො බ්‍රහ්මචරියං සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. යො ඛො ආවුසො ඉමිනා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතො අයං වුච්චති බ්‍රහ්මචාරී. යො ඛො ආවුසො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං බ්‍රහ්මචරියපරියොසානන්ති.

### විහාරවග්ගො දුතියො.

තස්සුද්දානං:

ද්වෙ විහාරා සෙඛො ච උප්පාද අපරෙ දුවෙ,
පරිසුද්ධෙන ද්වෙ වුත්තා කුක්කුටාරාමෙන තයොති.

## 1. 2. 10

## තෙවන කුක්කුටාරාම සූත්‍රය

**20. පැළලුප්නුවර:**

ආයුෂ්මත් ආනන්දයෙනි, බඹසර බඹසරයි කියනු ලැබේ. ඇවැත්නි, බඹසර කවරේ ද බඹසැරිහු කවරෙක් ද බඹසර කෙළවර කවරේ දැ? යි.

ආයුෂ්මත් භද්දයෙනි, මැනවි මැනවි. ආයුෂ්මත් භද්දයෙනි, තොපගේ පැන විමසීම යහපති, වැටහීම යහපති, පිළිවිසුම යහපති. ඇවැත් භද්දයෙනි, තෙපි "ඇවැත් ආනන්දයෙනි, බඹසර බඹසරයි කියනු ලැබේ. ඇවැත්නි, බඹසර කවරේ ද බඹසැරිහු කවරෙක් ද බඹසර කෙළවර කවරේ දැ" යි මෙසේ පුළුවුසිවු දැ? යි. ඇවැත්නි, එසේ ය යි.

ඇවැත්නි, මේ අරිඅටඟි මග ම බඹසර ය එනම් සම්මාදිට්ඨි ... සම්මා-සමාධි යි. ඇවැත්නි, යමෙක් මේ අරිඅටඟි මගින් සමන්වාගත ද, මේ තෙමේ බඹසැරි ය යි කියනු ලැබේ. ඇවැත්නි, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ නම් මෙය බඹසර කෙළවර යි.

## දෙවෙනි විහාරවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

විහාරසූත්‍ර දෙකෙකි. සෙඛසූත්‍රයෙකි. අනෙක් උප්පාදසූත්‍ර දෙකෙකි. පරිසුද්ධ නමින් දෙකෙක් ද කුක්කුටාරාම නමින් තුනෙක් ද කියන ලදී. (මුළුල්ල දශයෙකි).

# 3. මිච්ඡත්තවග්ගො

## 1. 3. 1

### මිච්ඡත්තසුත්තං

**21.** සාවත්ථියං:

මිච්ඡත්තඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි සම්මත්තඤ්ච. තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ, මිච්ඡත්තං, සෙය්‍යථීදං: මිච්ඡාදිට්ඨි, මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචා මිච්ඡාකම්මන්තො මිච්ඡාආජීවො මිච්ඡාවායාමො මිච්ඡාසති මිච්ඡාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ, මිච්ඡත්තං.

කතමඤ්ච භික්ඛවෙ, සම්මත්තං, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ, සම්මත්තන්ති.

## 1. 3. 2

### අකුසලධම්මසුත්තං

**22.** සාවත්ථියං:

අකුසලෙ ච වො භික්ඛවෙ, ධම්මෙ දෙසිස්සාමි කුසලෙ ච ධම්මෙ. තං සුණාථ. කතමෙ ච භික්ඛවෙ, අකුසලා ධම්මා, සෙය්‍යථීදං: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාසමාධි. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, අකුසලා ධම්මා.

කතමෙ ච භික්ඛවෙ, කුසලා ධම්මා, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉදං වුච්චන්ති භික්ඛවෙ, කුසලා ධම්මාති.

## 1. 3. 3

### පටිපදසුත්තං

**23.** සාවත්ථියං:

මිච්ඡාපටිපදඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි සම්මාපටිපදඤ්ච. තං සුණාථ. කතමා ච භික්ඛවෙ, මිච්ඡාපටිපදා, සෙය්‍යථීදං: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාසමාධි, අයං වුච්චති භික්ඛවෙ, මිච්ඡාපටිපදා.

කතමා ච භික්ඛවෙ, සම්මාපටිපදා, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, සම්මාපටිපදාති.

# 3. මිච්ඡත්ත වර්ගය

## 1. 3. 1

## මිච්ඡත්ත සූත්‍රය

**21. සැවැත්නුවර :**

මහණෙනි, මිථ්‍යාස්වභාවය ද සම්‍යක්ස්වභාවය ද තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, මිථ්‍යා ස්වභාවය කවරේ ද යත්: මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්ප මිච්ඡාවාචා මිච්ඡාකම්මන්ත මිච්ඡාආජීව මිච්ඡාවායාම මිච්ඡාසති මිච්ඡාසමාධි යි. මහණෙනි, මෙ මිථ්‍යා-ස්වභාව යයි කියනු ලැබේ.

මහණෙනි, සම්‍යක්ස්වභාවය කවරේ ද යත්: එනම සම්මාදිට්ඨි සම්මාසඞ්කප්ප සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව සම්මාවායාම සම්මාසති සම්මාසමාධි යි. මහණෙනි, මෙ සම්‍යක්ස්වභාව ය යි කියනු ලැබේ.

## 1. 3. 2

## අකුසලධම්ම සූත්‍රය

**22. සැවැත්නුවර :**

මහණෙනි, අකුසල්දහම් ද කුසල් දහම් ද තොපට දේශනා කරන්නෙමි එය අසවු. මහණෙනි, අකුසල් දහම්හු කවරහු ද යත්: එනම මිච්ඡාදිට්ඨි... මිච්ඡාසමාධි යි. මහණෙනි, මොහු අකුසල්දහම්හු ය යි කියනු ලැබෙත්.

මහණෙනි, කුසල්දහම් කවරෙ යත්: එනම් සම්මාදිට්ඨි ... සම්මා-සමාධි යි. මහණෙනි, මොහු කුසල්දහම්හු යයි කියනු ලැබෙත් යි.

## 1. 3. 3

## පටිපද සූත්‍රය

**23. සැවැත්නුවර :**

මහණෙනි, මිච්ඡාපටිපදව (වැරදි පිළිවෙත) ද සම්මාපටිපදව (නොවැරදි පිළිවෙත) ද තොපට දෙශනා කරන්නෙමි එය අසවු. මහණෙනි, මිච්ඡාපටිපදව කවර යත්: මිච්ඡාදිට්ඨි...මිච්ඡාසමාධි යි. මහණෙනි, මෙ මිච්ඡාපටිපද ය යි කියනු ලැබෙ.

මහණෙනි, සම්මාපටිපදව කවර යත්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි, මේ සම්මාපටිපදව යයි කියනු ලැබේ.

## 1. 3. 4

## දුතිය පටිපදසුත්තං

24. සාවත්ථියං:

ගිහිනො වාහං භික්ඛවෙ, පබ්බජිතස්ස වා මිච්ඡාපටිපදං න වණ්ණෙමි. ගිහී වා භික්ඛවෙ, පබ්බජිතො වා මිච්ඡාපටිපන්නො මිච්ඡාපටිපත්තාධිකරණහෙතු නාරාධකො හොති ඤායං ධම්මං කුසලං. කතමා ච භික්ඛවෙ, මිච්ඡාපටිපද, සෙය්‍යථීදං: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, මිච්ඡාපටිපද. ගිහිනො වාහං භික්ඛවෙ, පබ්බජිතස්ස වා මිච්ඡාපටිපදං න වණ්ණෙමි. ගිහී වා භික්ඛවෙ, පබ්බජිතො වා මිච්ඡාපටිපන්නො මිච්ඡාපටිපත්තාධිකරණහෙතු නාරාධකො හොති ඤායං ධම්මං කුසලං.

ගිහිනො වාහං භික්ඛවෙ, පබ්බජිතස්ස වා සම්මාපටිපදං වණ්ණෙමි. ගිහී වා භික්ඛවෙ, පබ්බජිතො වා සම්මාපටිපන්නො සම්මාපටිපත්තාධිකරණහෙතු ආරාධකො හොති ඤායං ධම්මං කුසලං. කතමා ච භික්ඛවෙ, සම්මාපටිපද, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, සම්මාපටිපද. ගිහිනො වාහං භික්ඛවෙ, පබ්බජිතස්ස වා සම්මා පටිපදං වණ්ණෙමි. ගිහී වා භික්ඛවෙ, පබ්බජිතො වා සම්මාපටිපන්නො සම්මාපටිපත්තාධිකරණහෙතු ආරාධකො හොති ඤායං ධම්මං කුසලන්ති.

## 1. 3. 5

## අසප්පුරිසසුත්තං

25. සාවත්ථියං:

අසප්පුරිසඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි සප්පුරිසඤ්ච. තං සුණාථ. කතමො ච භික්ඛවෙ, අසප්පුරිසො: ඉධ භික්ඛවෙ, එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවාචො මිච්ඡාකම්මන්තො මිච්ඡාආජීවො මිච්ඡාවායාමො මිච්ඡාසති මිච්ඡාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, අසප්පුරිසො.

කතමො ච භික්ඛවෙ, සප්පුරිසො: ඉධ භික්ඛවෙ, එකච්චො සම්මාදිට්ඨිකො හොති සම්මාසඞ්කප්පො සම්මාවාචො සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, සප්පුරිසොති.

## 1. 3. 4

## දෙවන පටිපද සූත්‍රය

**24. සැවැත්නුවර :**

මහණෙනි, මම ගිහියාගේ හෝ පැවිද්දගේ හෝ වැරදි පිළිවෙත නො වනමි. මහණෙනි, ගිහියා හෝ පැවිද්ද හෝ වරදවා පිළිපන්නේ වැරදි පිළිවෙත්හි පිහිටීම හේතු කොට ආයඞ්මාර්ගධම්ය නො සපයන්නෙක් වේ. මහණෙනි, වැරදි පිළිවෙත කවරේ ද යත්: එනම් මිච්ඡාදිට්ඨිය ... මිච්ඡා සමාධි යි. මහණෙනි, මේ වැරදි පිළිවෙතැ යි කියනු ලැබේ. මහණෙනි, මම ගිහියාගේ හෝ පැවිද්දගේ හෝ වැරදි පිළිවෙත නො වනමි. මහණෙනි ගිහියා හෝ පැවිද්ද හෝ වරදවා පිළිපන්නේ වැරදි පිළිවෙත හෙතු කොට ආයඞ්මාර්ග ධම්ය නො සපයන්නෙක් වෙයි.

මහණෙනි, මම ගිහියාගේ හෝ පැවිද්දගේ හෝ නිවැරදි පිළිවෙත වනමි. මහණෙනි, ගිහියා හෝ පැවිද්ද හෝ මැනවින් පිළිපන්නේ නිවැරදි පිළිවෙත හේතු කොට ආයඞ්මාර්ග ධම්ය සපයන්නෙක් වේ. මහණෙනි, නිවැරදි පිළිවෙත කවරේ ද යත්: එනම් සම්මාදිට්ඨී... සම්මා සමාධි යි. මහණෙනි, මේ නිවැරදි පිළිවෙතැයි කියනු ලැබේ. මහණෙනි මම ගිහියාගේ හෝ පැවිද්දගේ හෝ නිවැරදි පිළිවෙත වනමි. මහණෙනි, ගිහියා හෝ පැවිද්ද හෝ මැනවින් පිළිපන්නේ නිවැරදි පිළිවෙත හෙතු කොට ආයඞ්මාර්ගධම්ය සපයන්නෙක් වේ යි.

## 1. 3. 5

## අසප්පුරිස සූත්‍රය

**25. සැවැත්නුවර :**

මහණෙනි, අසත්පුරුෂයාත් සත්පුරුෂයාත් තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, අසත්පුරුෂයා කවරේ ද යත්: මහණෙනි, මෙහි එකෙක් මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ මිථ්‍යාසඞකල්ප ඇත්තේ මිථ්‍යාවචන ඇත්තේ මිථ්‍යාකර්මාන්ත ඇත්තේ මිථ්‍යාආජීව ඇත්තේ මිථ්‍යාව්‍යායාම ඇත්තේ මිථ්‍යාස්මෘති ඇත්තේ මිථ්‍යාසමාධි ඇත්තේ වේ. මහණෙනි මේ අසත්පුරුෂයා යි කියනු ලැබේ.

මහණෙනි, සත්පුරුෂයා කවරේ ද යත්: මහණෙනි, මෙහි එකෙක් සම්‍යග්දෘෂ්ටි ඇත්තේ සම්‍යක්සඞකල්ප ඇත්තේ සම්‍යග්වචන ඇත්තේ සම්‍යක්කර්මාන්ත ඇත්තේ සම්‍යගාජීව ඇත්තේ සම්‍යග්ව්‍යායාම ඇත්තේ සම්‍යක්ස්මෘති ඇත්තේ සම්‍යක්සමාධි ඇත්තේ වෙයි. මහණෙනි, මේ සත්පුරුෂයා යි කියනු ලැබේ.

## 1. 3. 6

## දුතියඅසප්පුරිසසුත්තං

**26.** සාවත්ථියං:

අසප්පුරිසඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි. අසප්පුරිසෙන අසප්පුරිසතරඤ්ච. සප්පුරිසඤ්ච[1] දෙසිස්සාමි සප්පුරිසෙන සප්පුරිසතරඤ්ච. තං සුණාථ. කතමො ච භික්ඛවෙ, අසප්පුරිසො: ඉධ භික්ඛවෙ, එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති -පෙ- මිච්ඡාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, අසප්පුරිසො. කතමො ච භික්ඛවෙ, අසප්පුරිසෙන අසප්පුරිසතරො: ඉධ භික්ඛවෙ, එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති -පෙ- මිච්ඡාසමාධි මිච්ඡාඤාණී[2] මිච්ඡාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ, අසප්පුරිසෙන අසප්පුරිසතරො. කතමො ච භික්ඛවෙ, සප්පුරිසො: ඉධ භික්ඛවෙ, එකච්චො සම්මාදිට්ඨිකො හොති -පෙ- සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ සප්පුරිසො. කතමො ච භික්ඛවෙ, සප්පුරිසෙන සප්පුරිසතරො: ඉධ භික්ඛවෙ, එකච්චො සම්මාදිට්ඨිකො හොති -පෙ- සම්මාසමාධි සම්මාඤාණී සම්මාවිමුත්ති. අයං වුච්චති භික්ඛවෙ, සප්පුරිසෙන සප්පුරිසතරොති.

## 1. 3. 7

## කුම්භසුත්තං

**27.** සාවත්ථියං:

සෙය්‍යථාපි භික්ඛවෙ, කුම්භො අනාධාරො සුප්පවත්තියො හොති. සාධාරො දුප්පවත්තියො හොති. එවමෙව ඛො භික්ඛවෙ, චිත්තං අනාධාරං සුප්පවත්තියං හොති. සාධාරං දුප්පවත්තියං හොති. කො ච භික්ඛවෙ, චිත්තස්ස ආධාරො අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං වුච්චති චිත්තස්ස ආධාරො. සෙය්‍යථාපි භික්ඛවෙ, කුම්භො අනාධාරො සුප්පවත්තියො හොති. සාධාරො දුප්පවත්තියො හොති. එවමෙව ඛො භික්ඛවෙ, චිත්තං අනාධාරං සුප්පවත්තියං හොති. සාධාරං දුප්පවත්තියං හොතීති.

## 1. 3. 8

## සමාධිසුත්තං

**28.** සාවත්ථියං:

අරියං වො භික්ඛවෙ, සම්මාසමාධිං දෙසිස්සාමි සඋපනිසං සපරික්ඛාරං. තං සුණාථ. කතමො ච භික්ඛවෙ, අරියො සම්මාසමාධි සඋපනිසො සපරික්ඛාරො, සෙය්‍යථීදං; සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති[3] යා ඛො භික්ඛවෙ, ඉමෙහි සත්තහඞ්ගෙහි චිත්තස්ස එකග්ගතා සපරික්ඛාරතා[4] අයං වුච්චති භික්ඛවෙ, අරියො සම්මාසමාධි සඋපනිසො ඉතිපි සපරික්ඛාරො ඉතිපීති.

1. සප්පුරිසඤ්ච වො - මජ්ඣං,
2. ඤාණං – සීමු, සී 2.
3. සම්මාසමාධි – සීමු, සයා.
4. සපරික්ඛතා – සීමු, සයා.

## 1. 3. 6

## දෙවන සප්පුරිස සූත්‍රය

26. සැවැත්නුවර:

මහණෙනි, අසත්පුරුෂයාත් අසත්පුරුෂයාට වඩා අසත්පුරුෂතරයාත් නොපට දේශනා කරන්නෙමි. සත්පුරුෂයාත් සත්පුරුෂයාට වඩා සත්පුරුෂතරයාත් දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, අසත්පුරුෂයා කවරේ ද යත්: මහණෙනි, මෙහි එකෙක් මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ...මිථ්‍යා සමාධි ඇත්තේ වෙයි. මහණෙනි, මේ අසත්පුරුෂයා යයි කියනු ලැබේ. මහණෙනි, අසත්පුරුෂයාට වඩා අසත්පුරුෂතරයා කවරේ ද යත්: මහණෙනි, මෙහි එකෙක් මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ .. මිථ්‍යාසමාධි ඇත්තේ මිථ්‍යාඥාන ඇත්තේ මිථ්‍යාවිමුක්ති ඇත්තේ වෙයි. මහණෙනි, මේ අසත්පුරුෂයාට වඩා අසත්පුරුෂතරයා යයි කියනු ලැබේ. මහණෙනි, සත්පුරුෂයා කවරේ ද යත්: මහණෙනි, මෙහි එකෙක් සම්‍යග්දෘෂ්ටි ඇත්තේ... සම්‍යක්සමාධි ඇත්තේ වෙයි. මහණෙනි, මේ සත්පුරුෂයා යි කියනු ලැබේ. මහණෙනි, සත්පුරුෂයාට වඩා සත්පුරුෂතරයා කවරේ ද? යත්: මහණෙනි, මෙහි එකෙක් සම්‍යග්දෘෂ්ටි ඇත්තේ...සම්‍යක්සමාධි ඇත්තේ සම්‍යග්ඥාන ඇත්තේ සම්‍යග්විමුක්ති ඇත්තේ වෙයි. මහණෙනි, මේ සත්පුරුෂයාට වඩා සත්පුරුෂතරයා යයි කියනු ලැබේ යි.

## 1. 3. 7

## කුම්භ සූත්‍රය

27. සැවැත්නුවර:

මහණෙනි, යම්සේ කළය ආධාර (දරනු) රහිත වූයේ පහසුවෙන් **පෙරළිය හැක්කේ වේ ද,** ආධාර (දරනු) සහිත වූයේ පහසුවෙන් නො **පෙරළිය හැක්කේ වේ ද, මහණෙනි,** එසෙයින් ම සිත ආධාර රහිත වූයේ **පහසුවෙන්** පෙරළිය හැක්කේ වෙයි, ආධාර සහිත වූයේ පහසුවෙන් **නො පෙරළිය** හැක්කේ වේ. මහණෙනි, සිතට ආධාරය කිමෙක් ද යත්: **මේ අරි අටඟි මග** මැ යි. එනම්: සම්මාදිට්ඨී...සම්මාසමාධි යි. මේ සිතට ආධාර ය යි කියනු ලැබේ. මහණෙනි, යම්සේ කළය ආධාර රහිත වූයේ පහසුවෙන් පෙරළිය හැක්කේ වේ ද, ආධාර සහිත වූයේ පහසුවෙන් පෙරළිය නො හැක්කේ වේ ද, මහණෙනි, එසෙයින් ම සිතට ආධාර රහිත වූයේ පහසුවෙන් පෙරළිය හැක්කේ වෙයි. ආධාර සහිත වූයේ පහසුවෙන් පෙරළිය නො හැක්කේ වේ යි.

## 1. 3. 8

## සමාධි සූත්‍රය

28. සැවැත්නුවර:

මහණෙනි, තොපට ප්‍රත්‍යය සහිත පිරිවර සහිත ආර්‍ය්‍ය වූ සම්‍යක් සමාධිය දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, සප්‍රත්‍යය සපරිෂ්කාර ආර්‍ය්‍ය සම්‍යක් සමාධිය කවරේ ද යත්: ''හේ මෙසේය: සම්මාදිට්ඨිය සම්මාසඞ්කප්පය සම්මාවාචා ය සම්මාකම්මන්තය සම්මාආජීව ය සම්මාවායාමය සම්මාසති''යි මහණෙනි, මේ සත්අඟින් සිතේ යම් එකඟබවෙක් වේ නම් එය සපරිෂ්කාර බවයි. මහණෙනි, මේ ආර්‍ය්‍ය සම්‍යක්සමාධිය මෙසේ ප්‍රත්‍යය සහිත ය යි ද මෙසේ පිරිවර සහිත ය යි ද කියනු ලැබේ යි.

## 1. 3. 9

## වෙදනාසුත්තං

29. සාවත්ථියං:

තිස්සො ඉමා භික්ඛවෙ, වෙදනා. කතමා තිස්සො: සුඛා වෙදනා දුක්ඛා වෙදනා අදුක්ඛමසුඛා වෙදනා. ඉමා ඛො භික්ඛවෙ, තිස්සො වෙදනා ඉමාසං ඛො භික්ඛවෙ තිස්සන්නං වෙදනානං පරිඤ්ඤාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං වෙදනානං පරිඤ්ඤාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 3. 10

## උත්තියසුත්තං

30. සාවත්ථියං:

අථ ඛො ආයස්මා උත්තියො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උත්තියො භගවන්තං එතදවොච: ඉධ මය්හං භන්තෙ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි. පඤ්ච කාමගුණා වුත්තා භගවතා. කතමෙ නු ඛො පඤ්ච කාමගුණා වුත්තා භගවතාති.

සාධු සාධු උත්තිය, පඤ්චිමෙ ඛො උත්තිය, කාමගුණා වුත්තා මයා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො උත්තිය, පඤ්ච කාමගුණා වුත්තා මයා. ඉමෙසං ඛො උත්තිය, පඤ්චන්නං කාමගුණානං පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉමෙසං ඛො උත්තිය, පඤ්චන්නං කාමගුණානං පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

**මිච්ඡත්තවග්ගො තතියො.**

තත්‍රුද්දානං:

මිච්ඡත්තං අකුසලධම්මං ද්වෙ පටිපදාපි ච,
අසප්පුරිසෙන ද්වෙ කුම්භො සමාධි වෙදනුත්තියාති.

## 1. 3. 9

## වේදනා සූත්‍රය

29. **සැවැත්නුවර:**

මහණෙනි, මේ වේදනා තුනෙකි. කවරතුනෙක් ද යත්: සුව වේදනා යැ දුක් වේදනා යැ නොදුක්නොසුව වේදනා යි. මහණෙනි, මේ තුන් වේදනා යි. මහණෙනි, මේ තුන් වේදනාවන් පිරිසිඳ දැනීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු යි. කවර අරිඅටඟිමඟෙක් ද යත් හේ මෙසේ ය: සම්මාදිට්ඨි ය ... සම්මාසමාධි යි. මහණෙනි, මේ තුන් වේදනාවන් පිරිසිඳ දැනීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩියයුතු යි.

## 1. 3. 10

## උත්තිය සූත්‍රය

30. **සැවැත්නුවර:**

එකල්හි ආයුෂ්මත් **උත්තිය** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් උත්තිය තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: ''වහන්ස, මෙහි එකලා ව විවේකයෙන් හුන් මට මෙබඳු චිත්ත විතර්කයෙක් පහළවිය: භාග්‍යවතුන් වහන්සේ විසින් පස්කම්ගුණ කෙනෙක් වදරන ලදහ. කවර පස්කම්ගුණ කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද්දහු ද''යි.

උත්තිය, මැනව මැනව. උත්තිය, මේ පස්කම්ගුණ කෙනෙක් **මවිසින් පවසන ලදහ.** කවර පයෙක යත්: ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාම සංහිත වූ ඇලුම් කටයුතු වූ ඇසින් දක්කයුතු රූපයෝ ය ... කනින් ඇසියයුතු වූ ශබ්දයෝ ය ... නැහැයෙන් දතයුතු ගන්ධයෝ ය ... දිවෙන් දතයුතු රසයෝ ය... ඉෂ්ට වූ කාන්තවූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමසංහිත වූ ඇලුම් කටයුතු කයින් දතයුතු ස්පර්ශයෝ ය. උත්තිය, ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමසංහිත වූ ඇලුම් කටයුතු මේ පස්කම්ගුණයෝ මා විසින් පවසන ලදහ. උත්තිය, මේ පස්කම්ගුණයන්ගේ ප්‍රහානය පිණිස අරිඅටඟිමඟ වැඩියයුතු. කවර අරිඅටඟිමඟෙක යත්: සම්මාදිට්ඨි .. සම්මාසමාධි යි. උත්තිය, මේ පස්කම් ගුණයන්ගේ ප්‍රහානය පිණිස මේ අරිඅටඟිමඟ වැඩියයුතු යි.

## තෙවැනි මිච්ඡත්ත වර්ග යි.

එහි සූත්‍රනාමාවලිය මෙසේ ය:

මිච්ඡත්ත සූත්‍රය, අකුසලධම්ම සූත්‍රය පටිපද සූත්‍ර දෙක ය. අසප්පුරිස සූත්‍ර දෙක ය, කුම්භ සමාධි වේදනා උත්තිය සූත්‍ර සතර යැ යි සූත්‍ර දශයෙකි.

# 4. පටිපත්තිවග්ගො

## 1. 4. 1

### පටිපත්තිසුත්තං

31. සාවත්ථියං:

මිච්ඡාපටිපත්තිඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි සම්මාපටිපත්තිඤ්ච. තං සුණාථ. කතමා ච භික්ඛවෙ, මිච්ඡාපටිපත්ති සෙය්‍යථීදං: මිච්ඡාදිට්ඨි -පෙ- මිච්ඡාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, මිච්ඡාපටිපත්ති. කතමා ච භික්ඛවෙ, සම්මාපටිපත්ති සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, සම්මාපටිපත්තීති.

## 1. 4. 2

### පටිපන්නසුත්තං

32. සාවත්ථියං:

මිච්ඡාපටිපන්නඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි සම්මාපටිපන්නඤ්ච, තං සුණාථ. කතමො ච භික්ඛවෙ, මිච්ඡාපටිපන්නො: ඉධ භික්ඛවෙ, එකච්චො මිච්ඡාදිට්ඨිකො හොති -පෙ- මිච්ඡාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, මිච්ඡාපටිපන්නො. කතමො ච භික්ඛවෙ, සම්මාපටිපන්නො ඉධ භික්ඛවෙ, එකච්චො සම්මාදිට්ඨිකො හොති -පෙ- සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, සම්මාපටිපන්නොති.

## 1. 4. 3

### විරද්ධසුත්තං

33. සාවත්ථියං:

යෙසං කෙසඤ්චි භික්ඛවෙ, අරියො අට්ඨඞ්ගිකො මග්ගො විරද්ධො, විරද්ධො තෙසං අරියො අට්ඨඞ්ගිකො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, අරියො අට්ඨඞ්ගිකො මග්ගො ආරද්ධො, ආරද්ධො තෙසං අරියො අට්ඨඞ්ගිකො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී. කතමො ච භික්ඛවෙ අරියො[1] අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො විරද්ධො, විරද්ධො තෙසං අරියො අට්ඨඞ්ගිකො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො ආරද්ධො, ආරද්ධො තෙසං අරියො අට්ඨඞ්ගිකො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමීති.

## 1. 4. 4

### පාරඞ්ගමසුත්තං

34. සාවත්ථියං:

අට්ඨිමෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා අපාරා පාරඞ්ගමනාය සංවත්තන්ති. කතමෙ අට්ඨ: සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉමෙ ඛො භික්ඛවෙ, අට්ඨ ධම්මා භාවිතා බහුලීකතා අපාරා පාරඞ්ගමනාය සංවත්තන්තීති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

---

1. කතමො අරියො-සීමු.

# 4. පටිපත්ති වර්ගය

## 1. 4. 1

## පටිපත්ති සූත්‍රය

31. සැවැත්නුවර:

මහණෙනි, තොපට මිථ්‍යාප්‍රතිපත්තිය ද සම්‍යක්ප්‍රතිපත්තිය ද දෙසමි. එය අසවු. මහණෙනි, මිථ්‍යාප්‍රතිපත්ති කවර යත්: මිථ්‍යාදෘෂ්ටී යැ ... මිථ්‍යාසමාධි යි. මහණෙනි මේ මිථ්‍යාප්‍රතිපද යි කියනු ලැබෙ යි. මහණෙනි, සම්‍යක්ප්‍රතිපත්ති කවර යත්: සම්‍යක්දෘෂ්ටී ... සම්‍යක්සමාධි යි. මහණෙනි, මේ සම්‍යක්ප්‍රතිපද යි කියනු ලැබේ.

## 1. 4. 2

## පටිපන්න සූත්‍රය

32. සැවැත් නුවර:

මහණෙනි, මිථ්‍යාප්‍රතිපත් ඇත්තහු ද සම්‍යක්ප්‍රතිපත් ඇත්තහු ද තොපට දෙසමි එය අසවු. මහණෙනි, මිථ්‍යාප්‍රතිපත් ඇත්තේ කවරෙ යත්: මහණෙනි, මෙහි එකෙක් මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වෙයි ... මිථ්‍යාසමාධි ඇත්තේ වෙයි. මහණෙනි, මේ මිථ්‍යාප්‍රතිපත් ඇත්තේ ය යි කියනු ලැබෙ යි. මහණෙනි, සම්‍යක්ප්‍රතිපත් ඇත්තේ කවරෙ යත්: මහණෙනි මෙහි එකෙක් සම්‍යග්දෘෂ්ටි ඇත්තේ වෙයි...සම්‍යක්සමාධි ඇත්තේ වෙයි. මහණෙනි මේ සම්‍යක්ප්‍රතිපත් ඇත්තේ ය යි කියනු ලැබේ.

## 1. 4. 3

## විරද්ධ සූත්‍රය

33. සැවැත් නුවර:

මහණෙනි, යම් කෙනකුන් විසින් අරිඅටඟිමඟ වරදවන ලද ද, මැනවින් දුක් ගෙවීමට යන අරිඅටඟිමඟ ඔවුන් විසින් වරදවන ලද ය. මහණෙනි, යම් කෙනකුන් විසින් අරිඅටඟිමග අරඹන ලද ද, මැනවින් දුක් ගෙවීමට යන අරිඅටඟිමඟ ඔවුන් විසින් අරඹන ලදී. මහණෙනි අරිඅටඟිමඟ කවරෙ යත්: හේ මෙසේ ය: සම්මාදිට්ඨී ... සම්මාසමාධි යි. මහණෙනි, යම් කෙනකුන් විසින් මේ අරිඅටඟිමඟ වරදවන ලද ද, මැනවින් දුක් ගෙවීමට යන මේ අරිඅටඟිමඟ ඔවුන් විසින් වරදවන ලද ය. මහණෙනි, යම් කෙනකුන් විසින් මේ අරිඅටඟිමඟ අරඹන ලද ද, මැනවින් දුක් ගෙවීමට යන මේ අරිඅටඟිමඟ ඔවුන් විසින් අරඹන ලද්දේ යි.

## 1. 4. 4

## පාරඞ්ගම සූත්‍රය

34. සැවැත්නුවර:

මහණෙනි, මේ අට දහම් කෙනෙක් වඩන ලද්දහු බහුල කරන ලද්දහු මෙතෙරින් එතෙරට (-සසරින් නිවනට) යෑම පිණිස පවතිත්. කවර අටෙක් යත්: සම්මාදිට්ඨී...සම්මාසමාධි යි. මහණෙනි, මේ අටදහම්හු වඩන ලද්දහු බහුල කරන ලද්දහු මෙතෙරින් එතරට යෑම පිණිස පවතිත්. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. සුගත වූ ශාස්තෲන් වහන්සේ මෙය වදරා යළි මතු ද මෙය වදළ සේකි:

1. අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති.

2. යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො,
තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං.

3. කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො,
ඔකා අනොකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං.

4. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො,
පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

5. යෙසං සම්බොධිඅඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං,
ආදානපටිනිස්සග්ගෙ අනුපාදාය යෙ රතා
ඛීණාසවා ජුතිමන්තො තෙ ලොකෙ පරිනිබ්බුතාති.

## 1. 4. 5

### සාමඤ්ඤසුත්තං

35. සාමඤ්ඤඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි සාමඤ්ඤඵලානි ච. තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ, සාමඤ්ඤං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ, සාමඤ්ඤං. කතමානි ච භික්ඛවෙ, සාමඤ්ඤඵලානි: සොතාපත්තිඵලං සකදාගාමිඵලං අනාගාමිඵලං අරහත්තඵලං[1]. ඉමානි වුච්චන්ති භික්ඛවෙ, සාමඤ්ඤඵලානීති.

## 1. 4. 6

### දුතිය සාමඤ්ඤසුත්තං

36. සාමඤ්ඤඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි සාමඤ්ඤත්ථඤ්ච. තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ, සාමඤ්ඤං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ, සාමඤ්ඤං. කතමො ච භික්ඛවෙ, සාමඤ්ඤත්ථො: යො ඛො භික්ඛවෙ, රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො අයං වුච්චති භික්ඛවෙ, සාමඤ්ඤත්ථොති.

## 1. 4. 7

### බ්‍රහ්මඤ්ඤසුත්තං

37. බ්‍රහ්මඤ්ඤඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි බ්‍රහ්මඤ්ඤඵලානි ච. තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ, බ්‍රහ්මඤ්ඤං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ, බ්‍රහ්මඤ්ඤං. කතමානි ච භික්ඛවෙ, බ්‍රහ්මඤ්ඤඵලානි: සොතාපත්තිඵලං සකදාගාමිඵලං අනාගාමිඵලං අරහත්තඵලං ඉමානි වුච්චන්ති භික්ඛවෙ, බ්‍රහ්මඤ්ඤඵලානීති.

---

1. අරහත්තං - සී 1, 2.

1. යම් ජන කෙනෙක් පරතෙරට යනසුලු වෙද්ද, මිනිසුන් අතර ඔහු අල්පයහ. වැලි මේ තදන්‍ය ප්‍රජාව මෙතෙර ම (සසරෙහි ම) ධාවන කෙරෙයි.

2. යම් කෙනෙකුත් මොනවට වදහළ දහම්හි දහම් අනුව පවතිනා සුලු වෙද්ද, ඒ ජනයෝ සුදුස්තර වූ මාරධෙයය (සසර) හැර පරතෙරට යන්නාහ.

3-4. පණ්ඩිත තෙමේ අකුසල්දහම් දුරු කොට කුසල්දහම් වඩනේ ය. නිවන ඇරබ සසරින් කාමයන් අත්හැර පලිබෝධ නැති ව යම් විවේකයක දුකසේ ඇලියයුතු වේ නම් එහි ඇලීම කැමති වන්නේ ය. පණ්ඩිත තෙමේ කෙලෙසුන් කෙරෙන් සිත පිරිසිදු කරන්නේ යි.

5. යම් කෙනකුන්ගේ සිත බෝධ්‍යඞ්ගයන්හි මැනවින් වඩන ලද ද, යම් කෙනෙක් උපාදන රහිත ව නිවනෙහි ඇලුණාහු ද, ලෙව්හි බැබළීම් ඇති ඒ රහත්හු පිරිනිවියාහු යි.

## 1. 4. 5

## සාමඤ්ඤ සූත්‍රය

35. මහණෙනි, මහණුවම් ද මහණුවම්හි ඵල ද තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි මහණුවම කවරෙ යත්: මේ අරි අටඟිමග මැ යි. එ කවරෙ යත්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි මේ මහණුවමැ යි කියනු ලැබෙ. මහණෙනි, මහණුවම්හි ඵල කවරෙ යත්: සෝතාපත්තිඵලය සකදාගාමිඵලය අනාගාමිඵලය අරහත්ත ඵල යි. මහණෙනි, මොහු මහණුවම්හි ඵලැ යි කියනු ලැබෙ යි.

## 1. 4. 6

## දෙවන සාමඤ්ඤ සූත්‍රය

36. මහණෙනි, ශ්‍රමණධර්මයත් ශ්‍රමණධර්මයෙහි ඵලත් තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, ශ්‍රමණධර්මය කවරෙ යත්: මේ අරිඅටඟිමග මැ යි ඒ කවරැ යත්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි මේ ශ්‍රමණධර්මය යි කියනු ලැබෙ. මහණෙනි, ශ්‍රමණධර්මයෙහි ඵල කවරෙ යත්: මහණෙනි, යම් රාගක්ෂයයෙක් ද්වෙෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ නම් මහණෙනි මේ ශ්‍රමණධර්මයෙහි ඵලැ යි කියනු ලැබෙ යි.

## 1. 4. 7

## බ්‍රහ්මඤ්ඤ සූත්‍රය

37. මහණෙනි, ශ්‍රේෂ්ඨත්වයත් ශ්‍රේෂ්ඨත්වයෙහි ඵලත් තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, ශ්‍රේෂ්ඨත්වය කවරෙ යත්: මේ අරිඅටඟිමග මැ යි. එ කෙසේ යැ යත්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි, මේ ශ්‍රේෂ්ඨත්වය යි කියනු ලැබෙ. මහණෙනි, ශ්‍රේෂ්ඨත්වයෙහි ඵල කවරෙ යත්: සෝතාපත්තිඵලය සකදාගාමිඵලය අනාගාමිඵලය අරහත්තඵල යි. මහණෙනි මොහු ශ්‍රේෂ්ඨත්වයෙහි ඵලැ යි කියනු ලැබෙ යි.

## 1. 4. 8

## දුතිය බ්‍රහ්මඤ්ඤසුත්තං

38. බ්‍රහ්මඤ්ඤඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච. තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ, බ්‍රහ්මඤ්ඤං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ, බ්‍රහ්මඤ්ඤං. කතමො ච භික්ඛවෙ, බ්‍රහ්මඤ්ඤත්ථො: යො ඛො භික්ඛවෙ, රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො අයං වුච්චති භික්ඛවෙ, බ්‍රහ්මඤ්ඤත්ථොති.

## 1. 4. 9

## බ්‍රහ්මචරියසුත්තං

39. බ්‍රහ්මචරියඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි බ්‍රහ්මචරියඵලානි ච. තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ, බ්‍රහ්මචරියං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ, බ්‍රහ්මචරියං. කතමානි ච භික්ඛවෙ, බ්‍රහ්මචරියඵලානි: සොතාපත්තිඵලං සකදාගාමිඵලං අනාගාමිඵලං අරහත්තඵලං. ඉමානි වුච්චන්ති භික්ඛවෙ, බ්‍රහ්මචරියඵලානීති.

## 1. 4. 10

## දුතිය බ්‍රහ්මචරියසුත්තං

40. බ්‍රහ්මචරියඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි බ්‍රහ්මචරියත්ථඤ්ච. තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ, බ්‍රහ්මචරියං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ, බ්‍රහ්මචරියං. කතමො ච භික්ඛවෙ, බ්‍රහ්මචරියත්ථො: යො ඛො භික්ඛවෙ, රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො අයං වුච්චති භික්ඛවෙ, බ්‍රහ්මචරියත්ථොති.

(සබ්බං සාවත්ථිනිදානමෙව)

**පටිපත්තිවග්ගො චතුත්ථො.**

තත්‍රුද්දානං:

පටිපත්තිපටිපන්නො ච විරද්ධො ච පාරඞ්ගමො
සාමඤ්ඤෙන ද්වෙ වුත්තා බ්‍රහ්මඤ්ඤෙනපරෙ ද්වෙ
බ්‍රහ්මචරියෙන ද්වෙ වුත්තා වග්ගො තෙන පවුච්චතීති.

## 1. 4. 8

## දෙවන බ්‍රහ්මඤ්ඤ සූත්‍රය

38. මහණෙනි, ශ්‍රේෂ්ඨත්වයත් ශ්‍රේෂ්ඨත්වයෙහි ප්‍රයෝජනත් තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි ශ්‍රේෂ්ඨත්වය කවරෙ යත්: මේ අරිඅටඟිමඟ මැ යි. එ කෙසේ යැ යත්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි, මේ ශ්‍රේෂ්ඨත්ව යැ යි කියනු ලැබේ. මහණෙනි, ශ්‍රේෂ්ඨත්වයෙහි ප්‍රයෝජන කවරෙ යත්: මහණෙනි, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ නම් මහණෙනි, මේ ශ්‍රේෂ්ඨත්වයෙහි ප්‍රයෝජනැ යි කියනු ලැබේ යි.

## 1. 4. 9

## බ්‍රහ්මචරිය සූත්‍රය

39. මහණෙනි, තොපට බඹසරත් බඹසරෙහි ඵලත් දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, බඹසර කවරෙ යත්: මේ අරිඅටඟිමඟ මැ යි එ කෙසේ යැ යත්: සම්මාදිට්ඨි .. සම්මාසමාධි යි. මහණෙනි, මේ බඹසර යි කියනු ලැබේ. මහණෙනි, බඹසරඵල කවරෙ යත් සෝවත්ඵල සෙදගැමිඵල අනගැමිඵල රහත්ඵල යි. මහණෙනි, මොහු බඹසරඵලැ යි කියනු ලැබේ යි.

## 1. 4. 10

## දෙවන බ්‍රහ්මචරිය සූත්‍රය

40. මහණෙනි, තොපට බඹසරත් බඹසරෙහි අර්ථත් දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි බඹසර කවරෙ යත්: මේ අරිඅටඟිමඟ මැ යි. එ කෙසේ යැ යත්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි මේ බඹසර යි කියනු ලැබේ. මහණෙනි, බඹසරෙහි අර්ත්ථ කවරෙ යත්: මහණෙනි, යම් රාගක්ෂයයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ නම් මේ බඹසරෙහි අර්ත්ථ යි කියනු ලැබේ යි.

(සියල්ල සැවැත්නුවර ම නිදන කොට ඇත.)

## සිවුවැනි පටිපත්ති වර්ග යි.

**එහි සූත්‍ර නාමමාලාව:**

පටිපත්ති, පටිපන්න, විරද්ධ, පාරඞ්ගම යි සූත්‍ර සතරෙකි. සාමඤ්ඤ නමින් දෙකෙක් ද, බ්‍රහ්මඤ්ඤ නමින් දෙකෙක් ද, බ්‍රහ්මචරිය නමින් දෙකෙක් ද කියන ලදහ. මේ සූත්‍ර දශයෙන් වර්ග යයි කියනු ලැබේ.

# 5. අඤ්ඤතිත්ථියපෙය්‍යාලො

## 1. 5. 1

## විරාගසුත්තං

41. සාවත්ථියං:

අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ භගවා එතදවොච: සචෙ ඛො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං, "කිමත්ථියං ආවුසො, සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං "අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ. රාගවිරාගත්ථං ඛො ආවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සතී"ති.

සචෙ පන වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "අත්ථි පනාවුසො මග්ගො අත්ථි පටිපද රාගවිරාගායා"ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: "අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපද රාගවිරාගායා"ති. කතමො ච භික්ඛවෙ, මග්ගො කතමා ච පටිපද රාගවිරාගාය: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං භික්ඛවෙ, මග්ගො අයං පටිපද රාගවිරාගායාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

## 1. 5. 2

## සංයොජනසුත්තං

42. සචෙ වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: 'කිමත්ථියං ආවුසො, සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: සංයොජනපහානත්ථං[1] ඛො ආවුසො, භගවති බ්‍රහ්මචරියං වුස්සතීති.

සචෙ පන වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "අත්ථි පනාවුසො මග්ගො, අත්ථි පටිපද සංයොජනපහානායා',ති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: "අත්ථි ඛො ආවුසො මග්ගො අත්ථි පටිපද සංයොජනපහානායා"ති. කතමො ච භික්ඛවෙ, මග්ගො කතමා පටිපද සංයොජනපහානාය: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං භික්ඛවෙ මග්ගො අයං පටිපද සංයොජනපහානායාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

## 1. 5. 3

## අනුසයසුත්තං

43. සචෙ වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "කිමත්ථියං ආවුසො, සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: "අනුසයසමුග්ඝාතත්ථං[1] ඛො ආවුසො භගවති බ්‍රහ්මචරියං වුස්සතී"ති.

1. අනුසයසමුග්ඝාතනත්ථං - මජසං.

# 5. අඤ්ඤතිත්ථියපෙය්‍යාලය

## 1. 5. 1

## විරාග සූත්‍රය

**41. සැවැත්නුවර:**

එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක: ''මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ ''ඇවැත්නි, කුමක් පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ දැ''යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ ප්‍රකාශ කරවු. ''ඇවැත්නි, රාගය දුරලීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ යි.

මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ ''ඇවැත්නි, රාගය දුරලීම පිණිස මගෙක් ඇද්ද, පිළිවෙතෙක් ඇද්දැ''යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ ප්‍රකාශ කරවු. ''ඇවැත්නි, රාගය දුරලීම පිණිස මගෙක් ඇත. 'පිළිවෙතෙක් ඇතැ'' යි මහණෙනි රාගය දුරලීම පිණිස මග කවරෙ යැ පිළිවෙත කවරෙ යැ යත්: මේ අරිඅටඟිමග මැ යි. ඒ කෙසේ ය යත්: සම්මාදිට්ඨි යැ... සම්මාසමාධි යි. මහණෙනි, රාගය දුරලීම පිණිස මේ මග යැ, මේ පිළිවෙත යි. මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ ප්‍රකාශ කරවු.

## 1. 5. 2

## සංයෝජන සූත්‍රය

**42.** මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ ''ඇවැත්නි, කුමක් පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ දැ''යි මෙසේ තොප පුළුවුස්නාහු නම් එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ ප්‍රකාශ කරවු: ''ඇවැත්නි, සංයෝජන ප්‍රහාණය පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ''යයි.

මහණෙනි, ඉදින් අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ ''ඇවැත්නි සංයෝජන-ප්‍රහාණය පිණිස මගෙක් ඇද්ද, පිළිවෙතක් ඇද්ද?''යි මෙසේ තොප පුළු-වුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්‍යතීර්ත්ථක පරිව්‍රාජකයනට මෙසේ විසඳන්නාහු ය: ''ඇවැත්නි, සංයෝජනප්‍රහාණය පිණිස මගෙක් ඇත, පිළිවෙතෙක් ඇතැ යි. මහණෙනි, සංයෝජනප්‍රහාණය පිණිස මග කවරෙ යැ පිළිවෙත කවරේ යැ යත්: මේ අරිඅටඟිමග මැ යි. ඐ මෙසේ ය: සම්මාදිට්ඨි...සම්මාසමාධි යි. මහණෙනි, සංයෝජන-ප්‍රහාණය පිණිස මේ මග ය, මේ පිළිවෙත යි. මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්‍යතීර්ථක පරිව්‍රාජකයනට මෙසේ විසඳන්නාහු යි.

## 1. 5. 3

## අනුසය සූත්‍රය

**43.** මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ ''ඇවැත්නි කුමක් පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ දැ''යි මෙසේ තොප පුළුවුස්නාහු නම් ''මහණෙනි එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට ''මෙසේවිසඳන්නාහු ය: ඇවැත්නි, අනුසය (නිදි ගත් කෙලෙස්) නැසීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ යි. මහණෙනි,

සචෙ පන වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "අත්ථි පනාවුසො, මග්ගො අත්ථි පටිපදා අනුසයසමුග්ඝාතායා"ති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: "අත්ථි ඛො ආවුසො මග්ගො, අත්ථි පටිපදා අනුසයසමුග්ඝාතායා"ති. කතමො ච භික්ඛවෙ මග්ගො, කතමා පටිපදා අනුසයසමුග්ඝාතාය: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං භික්ඛවෙ මග්ගො, අයං පටිපදා අනුසයසමුග්ඝාතායාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

## 1. 5. 4

## අද්ධානසුත්තං

44. සචෙ වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "කිමත්ථියං ආවුසො, සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: අද්ධානපරිඤ්ඤත්ථං ඛො ආවුසො, භගවති බ්‍රහ්මචරියං වුස්සතී"ති -පෙ- කතමො ච භික්ඛවෙ, මග්ගො කතමා පටිපදා අද්ධානපරිඤ්ඤාය: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං භික්ඛවෙ මග්ගො, අයං පටිපදා අද්ධානපරිඤ්ඤායාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

## 1. 5. 5

## ආසවක්ඛයසුත්තං

45. සචෙ වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "කිමත්ථියං ආවුසො, සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: "ආසවානං ඛයත්ථං ඛො ආවුසො, භගවති බ්‍රහ්මචරියං වුස්සතී"ති -පෙ- කතමො ච භික්ඛවෙ මග්ගො, කතමා පටිපදා ආසවානං ඛයාය අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං භික්ඛවෙ මග්ගො, අයං පටිපදා ආසවානං ඛයායාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

## 1. 5. 6

## විජ්ජාවිමුත්තිසුත්තං

46. සචෙ වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "කිමත්ථියං ආවුසො, සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: "විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියත්ථං ඛො ආවුසො, භගවති බ්‍රහ්මචරියං වුස්සතී"ති. -පෙ- කතමො ච භික්ඛවෙ මග්ගො, කතමා පටිපදා විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං භික්ඛවෙ මග්ගො, අයං පටිපදා විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියායාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, අනුසය නැසීම පිණිස මගෙක් ඇද්ද, පිළිවෙතෙක් ඇද්ද?යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහුය: "ඇවැත්නි අනුසය නැසීම පිණිස මගෙක් ඇත පිළිවෙතෙක් ඇතැ"යි. මහණෙනි, අනුසය නැසීම පිණිස මඟ කවරේ යැ පිළිවෙත කවරේ යැ යත්: මේ අරිඅටඟිමග මැ යි හෙ මෙසේය: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි අනුසය නැසීම පිණිස මේ මග ය, මේ පිළිවෙත යි. මහණෙනි එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු යි.

## 1. 5. 4

## අද්ධාන සූත්‍රය

44. මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ: "ඇවැත්නි, කුමක් පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ ද?"යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි මේ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු ය: "ඇවැත්නි, සසර අදන්මඟ පිරිසිඳ දැනීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ"යි... මහණෙනි සසර අදන්මග පිරිසිඳ දැනීම පිණිස මග කවරෙ යැ පිළිවෙත කවරෙ යැ යත්: මේ අරිඅටඟිමග මැ යි එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි, සසර අදන්මඟ පිරිසිඳ දැනීම පිණිස මේ මග ය, මේ පිළිවෙත යි. මහණෙනි එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු යි.

## 1. 5. 5

## ආසවක්ඛය සූත්‍රය

45. මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ: "ඇවැත්නි කුමක් පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ ද?"යි මෙසේ තොප පුළුවුස්නාහු නම් එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු ය: "ඇවැත්නි, ආසුවක්ෂය පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ"යි...මහණෙනි, ආසුවක්ෂය පිණිස මග කවරේ ද, පිළිවෙත කවරේ ද යත්: මේ අරිඅටඟිමග මැ යි. එනම්: සම්මාදිට්ඨි...සම්මාසමාධි"යි මහණෙනි, ආසුවක්ෂය පිණිස මේ මගය, මේ පිළිවෙත යි. මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු යි.

## 1. 5. 6

## විජ්ජාවිමුත්ති සූත්‍රය

46. මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ: "ඇවැත්නි කුමක් පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ ද යි මෙසේ තොප පුළුවුස්නාහු නම් එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු ය: "ඇවැත්නි, අර්හත්මාර්ගඥානවිද්‍යාව හා අර්හත්-ඵලවිමුක්තිය පසක් කරනු පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ"යි....මහණෙනි, අර්හත්මාර්ගඥානවිද්‍යාව හා අර්හත්ඵල විමුක්තිය පසක් කරනු පිණිස මග කවරේ ද, පිළිවෙත කවරේ ද යත්: මේ අරිඅටඟිමග මැ යි. ඒ කෙසේ යැ යත්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි, අර්හත්මාර්ගඥානවිද්‍යාව හා අර්හත්ඵල-විමුක්තිය පසක් කරනු පිණිස මේ මග ය, මේ පිළිවෙත යි. මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු යි.

## 1. 5. 7

### ඤාණදස්සනසුත්තං

47. සචෙ වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "කිමත්ථියං ආවුසො සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: "ඤාණදස්සනත්ථං ඛො ආවුසො, භගවති බ්‍රහ්මචරියං වුස්සතී"ති -පෙ- කතමො ච භික්ඛවෙ, මග්ගො කතමා පටිපද ඤාණදස්සනාය. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං භික්ඛවෙ, මග්ගො අයං පටිපද ඤාණදස්සනායාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

## 1. 5. 8

### අනුපාදසුත්තං

48. සචෙ වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "කිමත්ථියං ආවුසො, සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතී"ති? එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ: "අනුපාදපරිනිබ්බානත්ථං ඛො ආවුසො, භගවති බ්‍රහ්මචරියං වුස්සතී"ති. සචෙ පන වො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං: "අත්ථි පනාවුසො, මග්ගො අත්ථි පටිපද අනුපාදපරිනිබ්බානායා"[1]ති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථ, අත්ථි ඛො ආවුසො, මග්ගො අත්ථි පටිපද අනුපාදපරිනිබ්බානායාති: කතමො ච භික්ඛවෙ, මග්ගො කතමා පටිපද අනුපාදපරිනිබ්බානාය, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං භික්ඛවෙ, මග්ගො අයං පටිපද අනුපාද පරිනිබ්බානායාති. එවං පුට්ඨා තුම්හෙ භික්ඛවෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං එවං ව්‍යාකරෙය්‍යාථාති.

(සබ්බං සාවත්ථිනිදානං.)

## අඤ්ඤතිත්ථියපෙය්‍යාලි

තස්සුද්දානං:

විරාගසංයොජනානුසයා අද්ධාන ආසවක්ඛයා
විජ්ජාවිමුත්තිඤාණඤ්ච අනුපාදති අට්ඨිමෙති.

1. පරිනිබ්බානාය - මජසං, සයා, පී I

## 1. 5. 7

## ඤාණදස්සන සූත්‍රය

47. මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, කුමක් පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ ද?"යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු ය: "ඇවැත්නි, ඤානදර්‍ශනය පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ"යි ...මහණෙනි, ඤානදර්‍ශනය පිණිස මග කවරේ ද, පිළිවෙත කවරේ ද යත්: මේ අරිඅටඟිමග මැ යි. එ මෙසේ යැ "සම්මාදිට්ඨි ... සම්මාසමාධි"යි. මහණෙනි, ඤානදර්‍ශනය පිණිස මේ මග ය, මේ පිළිවෙත ය. මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු යි.

## 1. 5. 8

## අනුපාද සූත්‍රය

48. මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, කුමක් පිණිස මහණ ගොයුම්හු කෙරෙහි බඹසර වෙසේ ද?"යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු ය: "ඇවැත්නි, උපාදන රහිත වැ පිරිනිවීම පිණිස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බඹසර වෙසේ"යි, මහණෙනි, ඉදින් අන්තොටු පිරිවැජියෝ "ඇවැත්නි, උපාදන රහිත ව පිරිනිවීම පිණිස මගෙක් ඇද්ද, පිළිවෙතෙක් ඇද්ද?"යි මෙසේ තොප පුළුවුස්නාහු නම් මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියන්ට මෙසේ පවසන්නහු ය: "ඇවැත්නි, උපාදන රහිත වැ පිරිනිවීම පිණිස මගෙක් ඇත. පිළිවෙතෙක් ඇතැ යි. මහණෙනි, උපාදන රහිත වැ පිරිනිවීම පිණිස මග කවරේ ද පිළිවෙත කවරේ ද යත්: මේ අරිඅටඟිමග මැ යි. එ මෙසේ යැ: "සම්මාදිට්ඨි ... සම්මාසමාධි"යි. මහණෙනි, උපාදන රහිත වැ පිරිනිවීම පිණිස මේ මග ය, මේ පිළිවෙත යි. මහණෙනි, එසේ පුළුවුස්නා ලද තෙපි ඒ අන්තොටු පිරිවැජියනට මෙසේ පවසන්නහු යි.

(සියල්ල සැවත නිදන කොට ඇත)

## අඤ්ඤතිත්ථිය පෙය්‍යාල යි.

**එහි සූත්‍රනාමාවලිය:**

විරාග, සංයොජන, අනුසය, අද්ධාන, ආසවක්ඛය, විජ්ජාවිමුත්ති, ඤාණදස්සන, අනුපාද යි මේ සූත්‍රාන්ත අටෙකි යි.



Free Distribution www.aathaapi.org

# 6. සූරියපෙය්‍යාලො

## 1. 6. 1

## කල්‍යාණමිත්තසුත්තං

සබ්බං සාවත්ථිනිදානං.

49. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං[1] එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං, එතං පුබ්බනිමිත්තං, යදිදං කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං: අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සම්මාසඞ්කප්පං භාවෙති -පෙ- සම්මාවාචං භාවෙති, -පෙ- සම්මාකම්මන්තං භාවෙති -පෙ- සම්මාආජීවං භාවෙති -පෙ- සම්මාවායාමං භාවෙති -පෙ- සම්මාසතිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 6. 2

## සීලසුත්තං

50. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං[1]; එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං සීලසම්පදා. සීලසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- සම්මාසමාධිං භාවෙති: විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති. අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

1. අරුණුග්ගං – මජසං, සයා.

# 6. සූරියපෙය්‍යාලය

## 1. 6. 1

## කල්‍යාණමිත්ත සූත්‍රය

සියල්ල සැවැත් නිදන යැ.

49. මහණෙනි, යම් මේ අරුණෝදයෙක් වේ ද, උදවන හිරුට මෙ පූර්වඞ්ගම වෙයි, මෙ පූර්ව නිමිත්ත වෙයි. මහණෙනි, එසෙයින් ම යම් කලණමිතුරන් ඇති බවෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මෙ පූර්වඞ්ගම වෙයි, මෙ පූර්ව නිමිත්ත වෙයි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය කලණ මිතුරන් ඇති මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, කලණ මිතුරන් ඇති මහණ කෙසේ නම් අරිඅටගිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමෙනසුලු සම්‍යග්දෘෂ්ටිය වඩයි ... සම්‍යක්සඞ්කල්පය වඩයි...සම්‍යග්වචනය වඩයි...සම්‍යක්කර්මාන්තය වඩයි ...සම්‍යගාජීවය වඩයි...සම්‍යග්ව්‍යායාමය වඩයි.. සම්‍යක්ස්මෘතිය වඩයි.. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමෙනසුලු සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි කලණ මිතුරන් ඇති මහණ මෙසේ අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 6. 2

## සීල සූත්‍රය

50. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද උද වන හිරුට මේ පූර්වඞ්ගම වෙයි. මේ පූර්වනිමිත්ත වෙයි. මහණෙනි, එසෙයින් ම යම් සීලසම්පදව (සිවු පිරිසිදු සීලය) ක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මෙය පූර්වඞ්ගම වෙයි, මෙ පූර්ව නිමිත්ත වෙයි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය. අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය සීලසම්පන්න මහණහු විසින් කැමැති වියයුතු යි. මහණෙනි, සීලසම්පන්න මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි මෙ සස්නෙහි මහණ විවෙකනිඃශ්‍රිත වූ විරාගනිඃශ්‍රිත වූ නිරෝධ-නිඃශ්‍රිත වූ වොස්සග්ගපරිණාමි වූ සම්මාදිට්ඨිය වඩයි ... විවෙකනිඃශ්‍රිත වූ විරාගනිඃශ්‍රිත වූ නිරොධනිඃශ්‍රිත වූ වොස්සග්ගපරිණාමි වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි, සීලසම්පන්න මහණ මෙසේ අරිඅටඟිමග වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 6. 3

### ඡන්දසුත්තං

51. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං ඡන්දසම්පද -පෙ- බහුලීකරොතීති.

## 1. 6. 4

### අත්තසුත්තං

52. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අත්තසම්පද -පෙ- බහුලීකරොතීති.

## 1. 6. 5

### දිට්ඨිසුත්තං

53. සූරියස්ස භික්ඛවෙ උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං දිට්ඨිසම්පද -පෙ- බහුලීකරොතීති.

## 1. 6. 6

### අප්පමාදසුත්තං

54. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං, එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අප්පමාදසම්පද -පෙ- බහුලීකරොතීති.

## 1. 6. 7

### යොනිසොසුත්තං

55. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං යොනිසොමනසිකාරසම්පද. යොනිසොමනසිකාරසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති, ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, එවං ඛො භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 6. 3

## ඡන්ද සූත්‍රය

51. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උද වන හිරුට මේ පූර්වඞ්ගම වෙයි. මේ පූර්ව නිමිත්ත වෙයි. මහණෙනි, එසෙයින් ම යම් කත්තුකම්‍යතාකුසලච්ඡන්දයෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පූර්වඞ්ගම ය, මේ පූර්ව නිමිත්ත යි.. බහුල කෙරේ යයි.

## 1. 6. 4

## අත්ත සූත්‍රය

52. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උද වන හිරුට මෙ පූර්වඞ්ගම ය, මෙ පූර්ව නිමිත්ත ය. මහණෙනි, එසෙයින් ම යම් චිත්තසම්පද්ධත්වයෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පූර්වඞ්ගම ය, මේ පූර්ව නිමිත්ත යි.. බහුල කෙරේ යයි.

## 1. 6. 5

## දිට්ඨි සූත්‍රය

53 මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උද වන හිරුට මෙ පූර්වඞ්ගම ය, මේ පූර්ව නිමිත්ත ය. මහණෙනි, එසෙයින් ම යම් ඥාන සම්පත්තියෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පූර්වඞ්ගම ය, මේ පූර්ව නිමිත්ත යි ... බහුල කෙරේ යයි.

## 1. 6. 6

## අප්පමාද සූත්‍රය

54. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උද වන හිරුට මේ පූර්වඞ්ගම ය, මේ පූර්ව නිමිත්ත ය. මහණෙනි, එසෙයින් ම යම් අප්‍රමාද සම්පත්තියෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පූර්වඞ්ගම ය, මේ පූර්ව නිමිත්ත යි ... බහුල කෙරේ යයි.

## 1. 6. 7

## යෝනිසො සූත්‍රය

55. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උද වන හිරුට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, එසෙයින් ම යම් යෝනිසො මනසිකාරසම්පත්තියෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පෙරටු වෙයි, මේ පෙර නිමිති වෙයි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය, අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මේ නුවණින් මෙනෙහි කිරීමෙන් යුත් මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, නුවණින් මෙනෙහි කිරීමෙන් යුත් මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ විවේකනිස්සිත වූ විරාග නිස්සිත වූ නිරෝධනිස්සිත වූ වොස්සග්ගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි ... විවේකනිස්සිත වූ විරාගනිස්සිත වූ නිරෝධනිස්සිත වූ වොස්සග්ගපරිණාමී වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි, නුවණින් මෙනෙහි කිරීමෙන් යුත් මහණ මෙසේ අරිඅටඟිමඟ වඩයි, අරිඅටඟිමඟ බහුල කෙරේ යි.

## 1. 6. 8

### දුතිය කල්‍යාණමිත්තසුත්තං

56. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං, එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං -පෙ- සම්මාසමාධිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනය-පරියොසානං මොහවිනයපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 6. 9

### දුතිය සීලසුත්තං

57. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං සීලසම්පදා. සීලසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති. (විත්ථාරෙතබ්බං)

## 1. 6. 10

### දුතිය ඡන්දසුත්තං

58. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං, යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං ඡන්දසම්පදා. ඡන්දසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති:

## 1. 6. 11

### දුතිය අත්තසුත්තං

59. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අත්තසම්පදා. අත්තසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 6. 8

## දුතිය කල්‍යාණමිත්ත සූත්‍රය

56. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උදවන හිරුට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, එසෙයින් ම යම් කල්‍යාණමිත්‍රත්වයෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය. අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය කල්‍යාණමිත්‍ර මහණහු විසින් කැමැති වියයුතු යි. මහණෙනි, කල්‍යාණමිත්‍ර මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟමඟ බහුල කෙරේ ද යත්; මහණෙනි, මෙහි මහණ රාගවිනයෙහි පර්‍ය්‍යවසානය වූ ද්වේෂවිනයෙහි පර්‍ය්‍යවසාන වූ මෝහවිනයෙහි පර්‍ය්‍යවසාන වූ සම්‍යග්දෘෂ්ටිය වඩයි ... රාගවිනයෙහි පර්‍ය්‍යවසාන වූ ද්වෙෂවිනයෙහි පර්‍ය්‍යවසාන වූ මෝහවිනයෙහි පර්‍ය්‍යවසාන වූ සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, කල්‍යාණමිත්‍ර මහණ මෙසේ අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරේ යි.

## 1. 6. 9

## දුතිය සීලසූත්‍රය

57. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උදවන හිරුට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, එසෙයින් ම යම් සිවුපිරිසිදු සීලයෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, සීලසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි. ... බහුල කෙරේ යි.

(විතර කට යුතු යි.)

## 1. 6. 10

## දුතිය ඡන්දසූත්‍රය

58. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උදවන හිරුට මේ පෙරටු වෙයි මේ පෙර නිමිති වෙයි. මහණෙනි, එසෙයින් ම යම් කත්තුකම්‍යතාකුසලච්ඡන්දයෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, ඡන්දසම්පන්න මහණහු විසින් මෙය ැමති වියයුතු යි. ... බහුල කෙරේ යි.

## 1. 6. 11

## දුතිය අත්තසූත්‍රය

59. මහණෙනි, යම් අරුණොදයෙක් වේ ද, උදවන හිරුට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, එසෙයින් ම යම් චිත්තසමෘද්ධත්වයෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මෙය පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, චිත්තසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 6. 12

### දුතිය දිට්ඨිසුත්තං

60. සූරියස්ස භික්ඛවෙ උදයතො එතං පුබ්බඞ්ගමං. එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං දිට්ඨිසම්පද -පෙ- බහුලීකරොතීති.

## 1. 6. 13

### දුතිය අප්පමාදසුත්තං

61. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අප්පමාදසම්පද, අප්පමාදසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 6. 14

### දුතිය යොනිසොසුත්තං

62. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං යොනිසොමනසිකාරසම්පද. යොනිසොමනසිකාරසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති? ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනය-පරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාර-සම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

සූරියපෙය්‍යාලි.

තත්‍රුද්දානං:

කල්‍යාණමිත්තං සීලඤ්ච ඡන්දො ච අත්තසම්පද
දිට්ඨි ච අප්පමාදො ච යොනිසො භවති සත්තමන්ති.

## 1. 6. 12

## ද්‍විතිය දිට්ඨිසූත්‍රය

60. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උදවන හිරුට මේ පෙරටු වෙයි මේ පෙර නිමිති වෙයි. මහණෙනි, එසෙයින් ම යම් ඥාන සම්පත්තියෙක් වේ ද මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. ... බහුල කෙරේ යයි.

## 1. 6. 13

## ද්‍විතිය අප්පමාද සූත්‍රය

61. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උදවන හිරුට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, එසෙයින් ම යම් අප්‍රමාදසම්පත්තියෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, අප්‍රමාදසම්පන්න මහණහු විසින් මේ කැමැති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 6. 14

## ද්‍විතිය යොනිසො සූත්‍රය

62. මහණෙනි, යම් අරුණෝදයෙක් වේ ද, උදවන හිරුට මේ පෙරටු වෙයි. මේ පෙර නිමිති වෙයි. මහණෙනි, එසෙයින් ම යම් යෝනිසොමනසිකාරසම්පත්තියෙක් වේ ද, මහණහට අරිඅටඟිමඟ ඉපදීමට මේ පෙරටු වෙයි. මේ පූර්ව නිමිත්ත වෙයි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය. අරිඅටඟිමඟ බහුල කරන්නේ ය. යන මෙය යෝනිසො-මනසිකාරසම්පන්න මහණහු විසින් කැමැති වියයුතු යි. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද. අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙහි මහණ රාගවිනයෙහි පර්‍ය්‍යවසානය වූ ද්වෙෂවිනයෙහි පර්‍ය්‍යවසානය වූ මෝහවිනයෙහි පර්‍ය්‍යව-සානය වූ සම්‍යක්දෘෂ්ටිය වඩයි ... සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ මෙසේ අරිඅටඟිමඟ වඩයි. අරි-අටඟිමඟ බහුල කෙරේ යයි.

සූරියපෙය්‍යාල යි.

**එහි සූත්‍රනාමාවලිය:**

කල්‍යාණමිත්ත, සීල, ඡන්ද, අත්ත, දිට්ඨි, අප්පමාද යි සූත්‍ර යුගල සයෙකි. යෝනිසො සූත්‍ර යුගලය සත් වැනි වේ. (වර්ගයෙහි සූත්‍ර මුළුල්ල තුදුසෙකි) යි.

# 7. ඒකධම්මපෙය්‍යාලො

## 1. 7. 1

### කල්‍යාණමිත්තසුත්තං

63. **සාවත්ථියං** :

ඒකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය. කතමො ඒකධම්මො, යදිදං කල්‍යාණමිත්තතා, කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, එවං ඛො භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 7. 2

### සීලසුත්තං

64. ඒකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය. කතමො ඒකධම්මො: යදිදං සීලසම්පදා. සීලසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 7. 3

### ඡන්දසුත්තං

65. ඒකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය. කතමො ඒකධම්මො: යදිදං ඡන්දසම්පදා. ඡන්දසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 7. 4

### අත්තසුත්තං

66. ඒකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය. කතමො ඒකධම්මො: යදිදං අත්තසම්පදා. අත්තසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

# 7. ඒකධම්මපෙය්‍යාලය

## 1. 7. 1

## කල්‍යාණමිත්ත සූත්‍රය

63. සැවැත්නුවර:

මහණෙනි, අරිඅටඟිමඟ ඉපදීම පිණිස එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක යත්: මේ කල්‍යාණමිත්‍රත්වය යි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය, අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය කලණමිතුරන් ඇති මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, කලණමිතුරන් ඇති මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට නතු වූ සම්මා දිට්ඨිය වඩයි...සම්මාසමාධිය වඩයි. මහණෙනි, කල්‍යාණමිතුරන් ඇති මහණ තෙමේ මෙසේ අරිඅටඟිමඟ වඩයි, අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 7. 2

## සීල සූත්‍රය

64. මහණෙනි, අරිඅටඟිමඟ ඉපදීමට එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ සිවුපිරිසිදු සීලය යි. මහණෙනි, සීලසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 7. 3

## ඡන්ද සූත්‍රය

65. මහණෙනි, අරිඅටඟිමඟ ඉපදීමට මේ එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ කත්තුකම්‍යතා කුසලච්ඡන්දය යි. මහණෙනි, ඡන්දසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 7. 4

## අත්ත සූත්‍රය

66. මහණෙනි, අරිඅටඟිමඟ ඉපදීමට මේ එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ චිත්තසම්පත්තිය යි· මහණෙනි, චිත්තසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යි.

## 1. 7. 5

## දිට්ඨිසුත්තං

67. එකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය. කතමො එකධම්මො: යදිදං දිට්ඨිසම්පදා. දිට්ඨිසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 7. 6

## අප්පමාදසුත්තං

68. එකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය. කතමො එකධම්මො: යදිදං අප්පමාදසම්පදා, අප්පමාදසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 7. 7

## යොනිසොසුත්තං

68. එකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය. කතමො එකධම්මො: යදිදං යොනිසො මනසිකාරසම්පදා. යොනිසොමනසිකාරසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යොනිසො මනසිකාරසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති, ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 7. 8

## දුතිය කල්‍යාණමිත්තසුත්තං

**70.** සාවත්ථියං:

එකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය. කතමො එකධම්මො: යදිදං කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති, රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං -පෙ- සම්මාසමාධිං භාවෙති, රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං, එවං ඛො භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 7. 5

## දිට්ඨි සූත්‍රය

67. මහණෙනි, අරිඅටඟිමග ඉපදීමට එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්; මේ ඤාණසම්පත්තිය යි. මහණෙනි, ඤාණසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 7. 6

## අප්පමාද සූත්‍රය

68. මහණෙනි, අරිඅටඟිමග ඉපදීමට එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ අප්‍රමාද සම්පත්තිය යි. මහණෙනි, අප්පමාදසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 7. 7

## යෝනිසො සූත්‍රය

69. මහණෙනි, අරිඅටඟිමග ඉපදීමට එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ යෝනිසොමනසිකාර සම්පත්තිය යි. මහණෙනි, අරිඅටඟිමග වඩන්නේ ය. අරිඅටඟිමග බහුල කරන්නේ ය යන මෙය යෝනිසොමනසිකාරසම්පන්න මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, යෝනිසොමනසිකාර සම්පන්න මහණ තෙමේ කෙසේ නම අරිඅටඟිමග වඩා ද, අරිඅටඟිමග බහුල කෙරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ තෙමෙ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නම්‍ය වූ සම්මාදිට්ඨිය වඩයි ... සම්මාසමාධිය වඩයි. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ මෙසේ අරිඅටඟිමග වඩයි, අරිඅටඟිමග බහුල කෙරේ යයි.

## 1. 7. 8

## දුතිය කල්‍යාණමිත්ත සූත්‍රය

70. **සැවැත්නුවර** :

මහණෙනි, අරිඅටඟිමග ඉපදීම පිණිස එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ කල්‍යාණමිත්‍රත්වය යි. මහණෙනි, අරිඅටඟිමග වඩන්නේ ය. අරිඅටඟිමග බහුල කරන්නේ ය යන මෙය කල්‍යාණමිත්‍ර මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, කල්‍යාණමිත්‍ර මහණ තෙමේ කෙසේ නම් අරිඅටඟිමග වඩා ද, අරිඅටඟිමග බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙමේ රාගවිනයෙහි පය්‍ර්‍යවසානය වූ ද්වේෂවිනයෙහි පය්‍ර්‍යවසානය වූ මෝහවිනයෙහි පය්‍ර්‍යවසානය වූ සම්මාදිට්ඨිය වඩයි ... රාගවිනයෙහි පය්‍ර්‍යවසානය වූ ද්වේෂ විනයෙහි පය්‍ර්‍යවසානය වූ මෝහවිනයෙහි පය්‍ර්‍යවසානය වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි; කල්‍යාණමිත්‍ර මහණ තෙමේ මෙසේ අරිඅටඟිමග වඩයි, අරිඅටඟිමග බහුල කෙරේ යි.

## 1. 7. 9

### දුතිය සීලසුත්තං

71. එකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදාය. කතමො එකධම්මො: යදිදං සීලසම්පදා. සීලසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 7. 10

### දුතිය ඡන්දසුත්තං

72. එකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදාය. කතමො එකධම්මො: යදිදං ඡන්දසම්පදා. ඡන්දසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 7. 11

### දුතිය අත්තසුත්තං

73. එකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදාය. කතමො එකධම්මො: යදිදං අත්තසම්පදා. අත්තසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 7. 12

### දුතිය දිට්ඨිසුත්තං

74. එකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදාය. කතමො එකධම්මො: යදිදං දිට්ඨිසම්පදා. දිට්ඨිසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 7. 13

### දුතිය අප්පමාදසුත්තං

75. එකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදාය. කතමො එකධම්මො: යදිදං අප්පමාදසම්පදා. අප්පමාදසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 7. 9

## ද්විතිය සීල සූත්‍රය

71. මහණෙනි, අරිඅටඟිමඟ ඉපදීමට එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ සිවු පිරිසිදු සීලය යි. මහණෙනි, සීලසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යි.

## 1. 7. 10

## ද්විතිය ඡන්ද සූත්‍රය

72. මහණෙනි, අරිඅටඟිමඟ ඉපදීමට එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ කත්තුකම්‍යතාකුසලඑඡන්දය යි. මහණෙනි, ඡන්දසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යි.

## 1. 7. 11

## ද්විතිය අත්ත සූත්‍රය

73. මහණෙනි, අරිඅටඟිමඟ ඉපදීමට එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්; මේ චිත්තසම්පත්තිය යි. මහණෙනි, චිත්තසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යි.

## 1. 7. 12

## ද්විතිය දිට්ඨි සූත්‍රය

74. මහණෙනි, අරිඅටඟිමඟ ඉපදීමට එක් දහමෙක් බොහෝ උදව් ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ ඤාණසම්පත්තිය යි. මහණෙනි, ඤාණසම්පන්න මහණහු විසින් මෙය කැමැති වියයුතු යි ... බහුල කෙරේ යි.

## 1. 7. 13

## ද්විතිය අප්පමාද සූත්‍රය

75. මහණෙනි, අරිඅටඟිමඟ ඉපදීමට එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ අප්‍රමාද සම්පත්තිය යි මහණෙනි. අප්‍රමාදසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි... බහුල කෙරේ යි.

## 1. 7. 14

## දුතිය යොනිසොසුත්තං

76. එකධම්මො භික්ඛවෙ, බහුකාරො අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදය. කතමො එකධම්මො: යදිදං යොනිසොමනසිකාරසම්පද. යොනිසොමනසිකාරසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං. අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො. අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති, රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

**එකධම්මපෙය්‍යාලි.**

**තත්‍රුද්දානං:**

කල්‍යාණමිත්තං සීලඤ්ච ඡන්දො ච අත්තසම්පද<br>
දිට්ඨි ච අප්පමාදො ච යොනිසො භවති සත්තමන්ති..

## 1. 7. 14

## දුතිය යෝනිසො සූත්‍රය

76. මහණෙනි, අරිඅටඟිමඟ ඉපදීමට එක් දහමෙක් බොහෝ උපකාර ඇත්තේ වේ. කවර එක් දහමෙක් ද යත්: මේ යෝනිසොමනසිකාර සම්පත්තිය යි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය, අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය යෝනිසොමනසිකාරසම්පන්න මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙමේ රාගය දුරලීම කෙළවර කොට ද්වේෂය දුරලීම කෙළවර කොට මෝහය දුරලීම කෙළවර කොට සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, යොනිසොමනසිකාරසම්පන්න මහණ මෙසේ අරිඅටඟිමඟ වඩයි, අරිඅටඟිමඟ බහුල කෙරේ යි.

## ඒකධම්මපෙයාාල යි.

**එහි සූත්‍රනාමාවලිය:**

කල්‍යාණමිත්ත, සීල, ඡන්ද, අත්ත, දිට්ඨි, අපප්මාද යි.
සූත්‍රයුගල සයෙකි. යොනිසො සූත්‍ර යුගලය සත් වැනි වේ.
(වර්ගයෙහි සූත්‍ර මුළුල්ල තුදුසෙකි.) යි

# 8. දුතිය එකධම්මපෙය්‍යාලො

## 1. 8. 1

### කල්‍යාණමිත්තසුත්තං

**77.** සාවත්ථියං:

නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති. යථයිදං භික්ඛවෙ, කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති. -පෙ- සම්මාසමාධිං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො කල්‍යාණසහායො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 8. 2

### සීලසුත්තං

**78.** නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති. යථයිදං භික්ඛවෙ, සීලසම්පදා. සීලසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 8. 3

### ඡන්දසුත්තං

**79.** නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති, යථයිදං භික්ඛවෙ ඡන්දසම්පදා. ඡන්දසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 8. 4

### අත්තසුත්තං

**80.** නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති, යථයිදං භික්ඛවෙ, අත්තසම්පදා. අත්තසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

# 8 දුතිය ඒකධම්මපෙය්‍යාලය

## 1. 8. 1

## කල්‍යාණමිත්ත සූත්‍රය

77. සැවැත්නුවර:

මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ කල්‍යාණමිත්‍රත්වය යම් බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය. අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය කල්‍යාණමිත්‍ර මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, කල්‍යාණමිත්‍ර මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකය ඇසුර කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැඹුරු වූ සම්මාදිට්ඨිය වඩයි...සම්මාසමාධිය වඩයි. මහණෙනි, කල්‍යාණමිත්‍ර මහණ තෙමේ මෙසේ අරිඅටඟිමඟ වඩයි, අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 8. 2

## සීල සූත්‍රය

78. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ සිවුපිරිසිදු සීලය යම්බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, සිල්සපන් මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 8. 3

## ඡන්ද සූත්‍රය

79. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ කත්තුකම්‍යතාකුසලච්ඡන්දය යම්බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, ඡන්දසම්පන්න මහණහු විසින් මෙය කැමති විය යුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 8. 4

## අත්ත සූත්‍රය

80. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ චිත්තසම්පත්තිය යම්බඳු නම් එබඳු අන් දහමක් මම නො ම දකිමි. මහණෙනි, සිත්සපන් මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 8. 5

## දිට්ඨිසුත්තං

81. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති. උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති. යථයිදං භික්ඛවෙ, දිට්ඨිසම්පදා. දිට්ඨිසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 8. 6

## අප්පමාදසුත්තං

82. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති. යථයිදං භික්ඛවෙ, අප්පමාදසම්පදා. අප්පමාදසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 8. 7

## යොනිසොසුත්තං

83. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති, යථයිදං භික්ඛවෙ, යොනිසොමනසිකාරසම්පදා. යොනිසොමනසිකාරසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති. -පෙ- සම්මාසමාධිං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 8. 8

## දුතිය කල්‍යාණමිත්තතාසුත්තං

84. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති, යථයිදං භික්ඛවෙ, කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ, පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති, රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 8. 5
## දිට්ඨි සූත්‍රය

81. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ ඤාණ-සම්පත්තිය යම්බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, නැණසපන් මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යි.

## 1. 8. 6
## අප්පමාද සූත්‍රය

82. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ අප්‍රමාද-සම්පත්තිය යම්බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, අප්‍රමාදසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යි.

## 1. 8. 7
## යොනිසො සූත්‍රය

83. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ යෝනිසොමනසිකාරසම්පත්තිය යම්බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය, අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය යෝනිසොමනසිකාරසම්පන්න මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැඹුරු වූ සම්මාදිට්ඨිය වඩයි...සම්මා සමාධිය වඩයි. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ මෙසේ අරිඅටඟිමඟ වඩයි, අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 8. 8
## දුතිය කල්‍යාණමිත්ත සූත්‍රය

84. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මේ කල්‍යාණ මිත්‍රත්වය යම් බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය. අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය කලණමිතුරන් ඇති මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, කලණ මිතුරන් ඇති මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි රාගවිනයාගේ පර්‍යවසානය කොට ද්වේෂවිනයාගේ පර්‍යවසානය කොට මෝහවිනයාගේ පර්‍යවසානය කොට සම්‍යග්දෘෂ්ටිය වඩයි... සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, කලණමිතුරන් ඇති මහණ තෙමේ මෙසේ අරිඅටඟිමඟ වඩයි, අරිඅටඟිමඟ බහුල කෙරේ යි.

## 1. 8. 9

### දුතිය සීලසුත්තං

85. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති, යථයිදං භික්ඛවෙ, සීලසම්පදා. සීලසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 8. 10

### දුතිය ඡන්දසුත්තං

86. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති, යථයිදං භික්ඛවෙ, ඡන්දසම්පදා. ඡන්දසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 8. 11

### දුතිය අත්තසුත්තං

87. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති, යථයිදං භික්ඛවෙ, අත්තසම්පදා. අත්තසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 8. 12

### දුතිය දිට්ඨිසුත්තං

88. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති, යථයිදං භික්ඛවෙ, දිට්ඨිසම්පදා දිට්ඨිසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 8. 13

### දුතිය අප්පමාදසුත්තං

89. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති, යථයිදං භික්ඛවෙ, අප්පමාදසම්පදා. අප්පමාදසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං -පෙ- බහුලීකරොතීති.

## 1. 8. 9

## දුතිය සීල සූත්‍රය

85. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ සිවුපිරිසිදු සීලය යම් බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, සිල්සපන් මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යි.

## 1. 8. 10

## දුතිය ඡන්ද සූත්‍රය

86. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ කත්තුකම්‍යතාකුසලච්ඡන්දය යම්බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, ඡන්දසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යි.

## 1. 8. 11

## දුතිය අත්ත සූත්‍රය

87. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ චිත්තසම්පත්තිය යම්බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, චිත්තසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 8. 12

## දුතිය දිට්ඨි සූත්‍රය

88. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ ඥාණසම්පත්තිය යම්බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො දකිමි. මහණෙනි, ඥාණසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 8. 13

## දුතිය අප්පමාද සූත්‍රය

89. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ අප්‍රමාදසම්පත්තිය යම්බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, අප්‍රමාදසම්පන්න මහණහු විසින් මෙය කැමති වියයුතු යි ... බහුල කෙරේ යයි.

## 1. 8. 14

### දුතිය යොනිසොසුත්තං

44. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි, යෙන අනුප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො උප්පජ්ජති, උප්පන්නො වා අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවනාපාරිපූරිං ගච්ඡති, යථයිදං භික්ඛවෙ, යොනිසොමනසිකාරසම්පද. යොනිසොමනසිකාරසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති. රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති. අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

### දුතිය එකධම්මපෙය්‍යාලො.

තස්සුද්දානං :

කල්‍යාණමිත්තං සීලඤ්ච ඡන්දො ච අත්තසම්පද
දිට්ඨි ච අප්පමාදො ච යොනිසො භවති සත්තමන්ති.

# 1. 8. 14

## ද්‍රිතිය යෝනිසො සූත්‍රය

90. මහණෙනි, යම් දහමක් හේතු කොට නූපන් අරිඅටඟිමඟත් උපදී ද, උපන් අරිඅටඟිමඟත් වැඩීමෙන් පිරීමට යේ ද, මහණෙනි, මේ යෝනිසොමනසිකාරසම්පත්තිය යම්බඳු නම් එබඳු අන් එක් දහමකුදු මම නො ම දකිමි. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය යෝනිසොමනසිකාරසම්පන්න මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙහි මහණ රාගවිනයාගේ පය්‍යීවසානය කොට ද්වේෂවිනයාගේ පය්‍යීවසානය කොට මෝහවිනයාගේ පය්‍යීවසානය කොට සම්‍යග්දෘෂ්ටිය වඩයි... සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ මෙසේ අරිඅටඟිමඟ වඩයි, අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## ද්‍රිතිය ඒකධම්ම පෙය්‍යාල යි.

**එහි සූත්‍රනාමාවලිය:**

කල්‍යාණමිත්ත, සීල, ඡන්ද, අත්ත, දිට්ඨි, අප්පමාද යි සූත්‍ර යුගල සයෙකි. යෝනිසො සූත්‍රයුගලය සත් වැනි වේ. (වර්ගයෙහි සූත්‍ර මුළුල්ල තුදුසෙකි) යි.

# 9. ගඞ්ගාපෙය්‍යාලො

## 1. 9. 1

### පාචීනනින්නසුත්තං

91. සාවත්ථියං :

සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී පාචීනනින්නා, පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති, නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

## 1. 9. 2

### දුතිය පාචීනනින්නසුත්තං

92. සෙය්‍යථාපි භික්ඛවෙ, යමුනා නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බාන පබ්භාරොති.

## 1. 9. 3

### තතිය පාචීනනින්නසුත්තං

93. සෙය්‍යථාපි භික්ඛවෙ, අචිරවතී නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බාන-පබ්භාරොති.

## 1. 9. 4

### චතුත්ථ පාචීනනින්නසුත්තං

94. සෙය්‍යථාපි භික්ඛවෙ, සරභූ නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

# 9. ගඞ්ගාපෙය්‍යාලය

## 1. 9. 1

## පාචීනනින්න සූත්‍රය

91. සැවැත්නුවර:

මහණෙනි, යම්සේ ගඞ්ගා නම් ගඟ පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් අරිඅටඟිමග වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙහි මහණ විවේකනිස්සිත වූ විරාගනිස්සිත වූ නිරෝධනිස්සිත වූ වොස්සග්ගයට නැඹුරු වූ සම්මාදිට්ඨිය වඩයි ... විවේකනිස්සිත වූ විරාගනිස්සිත වූ නිරෝධනිස්සිත වූ වොස්සග්ගයට නැඹුරු වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි, මහණ මෙසේ අරිඅටඟිමග වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## 1. 9. 2

## දුතියපාචීනනින්න සූත්‍රය

92. මහණෙනි, යම්සේ යමුනා ගඟ පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 9. 3

## තතිය පාචීනනින්න සූත්‍රය

93. මහණෙනි, යම්සේ අචිරවතී ගඟ පැදුම් දිගට නැමුණී පැදුම් දිගට නැඹුරු වූවා පැදුම් දිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ නිවනට බර වූයේ වේ යයි.

## 1. 9. 4

## චතුත්ථ පාචීනනින්න සූත්‍රය

94. මහණෙනි, යම්සේ සරභූ ගඟ පැදුම් දිගට නැමුණී පැදුම් දිගට නැඹුරු වූවා පැදුම්දිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ ...නිවනට බර වූයේ වේ යයි.

## 1. 9. 5

### පඤ්චම පාචීනනින්නසුත්තං

95. සෙය්‍යථාපි භික්ඛවෙ, මහී නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බාන පබ්භාරොති.

## 1. 9. 6

### ඡට්ඨ පාචීනනින්නසුත්තං

96. සෙය්‍යථාපි භික්ඛවෙ, යා කාචි මහානදියො, සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී. සබ්බා තා පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති

## 1. 9. 7

### සමුද්දනින්නසුත්තං

97. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බාන පබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බාන-පබ්භාරොති.

## 1. 9. 8

### දුතිය සමුද්දනින්නසුත්තං

98. සෙය්‍යථාපි භික්ඛවෙ, යමුනා නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 9. 9

### තතිය සමුද්දනින්නසුත්තං

99. සෙය්‍යථාපි භික්ඛවෙ, අචිරවතී නදී සමුද්දනින්නා සමුද්ද-පොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 9. 5

## පඤ්චම පාචීනනින්න සූත්‍රය

95. මහණෙනි, යම්සේ **මහී** ගඟ පැදුම්දිගට නැමුණී පැදුම් දිගට නැඹුරු වූවා පැදුම් දිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 9. 6

## ඡට්ඨ පාචීනනින්න සූත්‍රය

96. මහණෙනි, යම් කිසි මහානදීහු එනම්: **ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී** නදීහු වෙද් ද, යම්සේ ඒ සියල්ලෝ පෙරදිගට නැමුණාහු පෙරදිගට නැඹුරු වූවාහු පෙරදිගට බර වූවාහු වෙද්ද මහණෙනි, එසෙයින් ම මහණ...නිවනට බරවූයේ වේ යයි.

## 1. 9. 7

## සමුද්දනින්න සූත්‍රය

97. මහණෙනි, යම්සේ **ගඞ්ගා** නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, මහණ කෙසේ නම් අරිඅටඟි මඟ වඩන්නේ අරිඅටඟිමග බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු සම්මාදිට්ඨිය වඩයි ... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මහණ මෙසේ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## 1. 9. 8

## දුතිය සමුද්දනින්න සූත්‍රය

98. මහණෙනි, යම්සේ **යමුනා** නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 9. 9

## තතිය සමුද්දනින්න සූත්‍රය

99. මහණෙනි, යම්සේ **අචිරවතී** නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ...නිවනට බර වූයේ වේ යයි.

## 1. 9. 10

### චතුත්ථ සමුද්දනින්නසුත්තං

100. සෙය්‍යථාපි භික්ඛවෙ සරභූ නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 9. 11

### පඤ්චම සමුද්දනින්නසුත්තං

101. සෙය්‍යථාපි භික්ඛවෙ, මහී නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 9. 12

### ඡට්ඨ සමුද්දනින්නසුත්තං

102. සෙය්‍යථාපි භික්ඛවෙ, යා කාචි මහානදියො. සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී. සබ්බා තා සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො, හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

### ගඞ්ගාපෙය්‍යාලි*

තස්සුද්දානං:

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො
එතෙ ද්වෙ ඡ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

* ඉතො පරං අසම්මාතා දුතියගඞ්ගාපෙය්‍යාලවග්ගො තතියගඞ්ගාපෙය්‍යාලවග්ගො චතුත්ථගඞ්ගාපෙය්‍යාලවග්ගොති තයො වග්ගා සීහළපොත්ථකෙසු පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා.

## 1. 9. 10

## චතුත්ථ සමුද්දනින්න සූත්‍රය

100. මහණෙනි, යම්සේ සරභූ නදිය මුහුදට නැමුණි මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 9. 11

## පඤ්චම සමුද්දනින්න සූත්‍රය

101. මහණෙනි, යම්සේ මහී නදිය මුහුදට නැමුණි මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ...නිවනට බරවූයේ වේ යයි.

## 1. 9. 12

## ඡට්ඨ සමුද්දනින්න සූත්‍රය

102. මහණෙනි, යම්කිසි මහා නදීහු එනම්: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී නදීහු වෙද්ද, යම්සේ ඒ සියල්ලෝ මුහුදට නැමුණාහු මුහුදට නැඹුරු වූවාහු මුහුදට බර වූවාහු වෙද්ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, කෙසේ නම් මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට නැමුණු සම්මාදිට්ඨිය වඩයි...සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## ගඞ්ගාපෙය්‍යාල යි.

**එහි සූත්‍රනාමාවලිය:**

පාචීනනින්න සූත්‍ර සයෙකි. සමුද්දනින්න සූත්‍ර ද සයෙකි. මේ ඡක්ක දෙක සූත්‍ර දොළසෙක් වේ. එයින් වර්ගය යි කියනු ලැබේ යි.

# 10. දුතියගඞ්ගාපෙය්‍යාලො

## 1. 10. 1

### පාචීනනින්නසුත්තං

103. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති රාගවිනය-පරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං –පෙ– සම්මාසමාධිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලී-කරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බාන-පබ්භාරොති.

## 1. 10. 2

### දුතිය පාචීනනින්නසුත්තං

104. සෙය්‍යථාපි භික්ඛවෙ, යමුනා නදී පාචීනනින්නා පාචීන-පොණා පාචීනපබ්භාරා, එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු –පෙ– නිබ්බානපබ්භාරොති.

## 1. 10. 3

### තතිය පාචීනනින්නසුත්තං

105. සෙය්‍යථාපි භික්ඛවෙ, අචිරවතී නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු –පෙ– නිබ්බානපබ්භා-රොති.

## 1. 10. 4

### චතුත්ථ පාචීනනින්නසුත්තං

106. සෙය්‍යථාපි භික්ඛවෙ, සරභූ නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු –පෙ– නිබ්බානපබ්භාරොති.

# 10. දුතිය ගඞ්ගාපෙය්‍යාලය

## 1. 10. 1

## පාචීනනින්න සූත්‍රය

103. මහණෙනි, යම්සේ ගඞ්ගා නදිය පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ, වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බරවූයේ වෙයි. මහණෙනි, මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ රාගවිනය පර්‍ය්‍යවසානය වූ ද්වේෂ විනය පර්‍ය්‍යවසානය වූ මෝහවිනය පර්‍ය්‍යවසානය වූ සම්‍යග්දෘෂ්ටිය වඩයි ... රාගවිනය පර්‍ය්‍යව සානය වූ ද්වේෂවිනය පර්‍ය්‍යවසානය වූ මෝහවිනය පර්‍ය්‍යවසානය වූ සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමග වඩනතේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## 1. 10. 2

## දුතිය පාචීනනින්න සූත්‍රය

104. මහණෙනි, යම්සේ යමුනා ගඟ පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ...නිවනට බර වූයේ වේ යයි.

## 1. 10. 3

## තතිය පාචීනනින්න සූත්‍රය

105. මහණෙනි, යම්සේ අචිරවතී ගඟ පෙරදිගට නැමුණී පෙර දිගට නැඹුරු වූවා පෙරදිගට බරවූවා වේ ද, මහණෙනි, එසෙයින්ම මහණ ... නිවනට බරවූයේ වේ යයි.

## 1. 10. 4

## චතුත්ථ පාචීනනින්න සූත්‍රය

106. මහණෙනි, යම්සේ සරභූ ගඟ පැදුම්දිගට නැමුණී පැදුම් දිගට නැඹුරු වූවා පැදුම්දිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ නිවනට බර වූයේ වේ යයි.



Free Distribution www.aathaapi.org

## 1. 10. 5

### පඤ්චම පාචීනනින්නසුත්තං

107. සෙය්‍යථාපි භික්ඛවෙ, මහී නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 10. 6

### ඡට්ඨ පාචීනනින්නසුත්තං

108. සෙය්‍යථාපි භික්ඛවෙ, යා කාචි මහානදියො, සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී, සබ්බා තා පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 10. 7

### සමුද්දනින්නසුත්තං

109. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං -පෙ- සම්මාසමාධිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

## 1. 10. 8

### දුතිය සමුද්දනින්නසුත්තං

110. සෙය්‍යථාපි භික්ඛවෙ, යමුනා නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 10. 9

### තතිය සමුද්දනින්නසුත්තං

111. සෙය්‍යථාපි භික්ඛවෙ, අචිරවතී නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 10. 5

## පඤ්චම පාචීනනින්න සූත්‍රය

107. මහණෙනි, යම්සේ මහී ගඟ පැදුම්දිගට නැමුණී පැදුම්දිගට නැඹුරු වූවා පැදුම්දිගට බරවූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 10. 6

## ඡට්ඨ පාචීනනින්න සූත්‍රය

108. මහණෙනි, යම් කිසි මහානදීහු ඇද්ද, ඔහු නම්: **ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී** යන මොහු යි. යම්සේ ඒ සියල්ලෝ පැදුම්දිගට නැමුණාහු පැදුම්දිගට නැඹුරු වූවාහු පැදුම්දිගට බරවූවාහු වෙද්ද, මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 10. 7

## සමුද්දනින්න සූත්‍රය

109. මහණෙනි, යම්සේ ගඞ්ගා නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බරවූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, කෙසේ නම් මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ රාගවිනය පයර්‍යවසානය වූ ද්වේෂවිනය පයර්‍යවසානය වූ මෝහවිනය පයර්‍යවසානය වූ සම්‍යග්දෘෂ්ටිය වඩයි...රාගවිනය පයර්‍යවසානය වූ ද්වේෂවිනය පයර්‍යවසානය වූ මෝහවිනය පයර්‍යවසානය වූ සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## 1. 10. 8

## ද්‍රතිය සමුද්දනින්න සූත්‍රය

110. මහණෙනි, යම්සේ යමුනා නදිය මුහුදට නැමුණී, මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 10. 9

## තතිය සමුද්දනින්න සූත්‍රය

111. මහණෙනි, යම්සේ අචිරවතී නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 10. 10

### චතුත්ථසමුද්දනින්නසුත්තං

112. සෙය්‍යථාපි භික්ඛවෙ, සරභූ නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 10. 11

### පඤ්චම සමුද්දනින්නසුත්තං

113. සෙය්‍යථාපි භික්ඛවෙ, මහී නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 10. 12

### ඡට්ඨ සමුද්දනින්නසුත්තං

ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී, සබ්බා තා සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති. රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං -පෙ- සම්මාසමාධිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං, එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

දුතියගඞ්ගාපෙය්‍යාලි.

තස්සුද්දානං:

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො;
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

## 1. 10. 10

## චතුත්ථ සමුද්දනින්න සූත්‍රය

112. මහණෙනි, යම්සේ **සරභූ** නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ...නිවනට නැමුණේ වේ යයි.

## 1. 10. 11

## පඤ්චම සමුද්දනින්න සූත්‍රය

113. මහණෙනි, යම්සේ **මහී** නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ...නිවනට බර වූයේ වේ යයි.

114. මහණෙනි, යම් කිසි මහානදීහු වෙත් ද ඔහු කවරහ: **ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී** නදීහු වෙති. යම්සේ එ හැම නදීහු මුහුදට නැමුණාහු මුහුදට නැඹුරු වූවාහු මුහුදට බර වූවාහු වෙද්ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමග බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ රාගවිනය පර්‍ය්‍යවසානය වූ ද්වේෂවිනය පර්‍ය්‍යවසානය වූ මෝහවිනය පර්‍ය්‍යවසානය වූ සම්‍යග්දෘෂ්ටිය වඩයි... රාගවිනය පර්‍ය්‍යවසානය වූ ද්වේෂවිනය පර්‍ය්‍යවසානය වූ මෝහ විනය පර්‍ය්‍යවසානය වූ සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## දුතිය ගඞ්ගාපෙය්‍යාල යි.

**එහි සූත්‍ර නාමාවලිය:**

පාචීනනින්නසූත්‍ර සයෙකි. සමුද්දනින්න සූත්‍ර ද සයෙකි. මේ ඡක්ක දෙක දෙළොස් සූත්‍රාන්ත කෙනෙක් වෙති. එයින් වර්ගය යි කියනු ලැබෙයි.

# 11. තතිය ගඞ්ගාපෙය්‍යාලො

## 1. 11. 1

### පාචීනනින්නසුත්තං

115. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති අමතොගධං අමතපරායණං අමතපරියොසානං -පෙ- සම්මාසමාධිං භාවෙති අමතොගධං අමතපරායණං අමතපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

## 1. 11. 2

### දුතිය පාචීනනින්නසුත්තං

116. සෙය්‍යථාපි භික්ඛවෙ, යමුනා නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 11. 3

### තතිය පාචීනනින්නසුත්තං

117. සෙය්‍යථාපි භික්ඛවෙ, අචිරවතී නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 11. 4

### චතුත්ථ පාචීනනින්නසුත්තං

118. සෙය්‍යථාපි භික්ඛවෙ. සරභූ නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

# 11. තතිය ගඞ්ගාපෙය්‍යාලය

## 1. 11. 1

## පාචීනනින්න සූත්‍රය

115. මහණෙනි, යම්සේ ගඞ්ගා නම් ගඟ පැදුන්දිගට නැමුණී පැදුන්දිගට නැඹුරු වූවා පැදුන් දිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බරවූයේ වෙයි. මහණෙනි, කෙසේ නම් මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ නිවනට ඇතුළත් වූවක් නිවන පිහිට කොට ඇත්තක් නිවන කෙළවර කොට ඇත්තක් කොට සම්‍යග්දෘෂ්ටිය වඩයි...නිවනට ඇතුළත් වූවක් නිවන පිහිට කොට ඇත්තක් නිවන කෙළ-වර කොට ඇත්තක් කොට සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 2

## දුතිය පාචීනනින්න සූත්‍රය

116. **මහණෙනි යම්සේ** යමුනා ගඟ පැදුන්දිගට නැමුණී පැදුන්දිගට නැඹුරු වූවා පැදුන්දිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 3

## තතිය පාචීනනින්න සූත්‍රය

117. මහණෙනි, යම්සේ අචිරවතී ගඟ පැදුන්දිගට නැමුණී පැදුන් දිගට නැඹුරු වූවා පැදුන්දිගට බර වූවා වේ ද මහණෙනි, එසෙයින් ම මහණ ...නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 4

## චතුත්‍ථ පාචීනනින්න සූත්‍රය

118. මහණෙනි, යම්සේ සරභූ ගඟ පැදුන්දිගට නැමුණී පැදුන්දිගට නැඹුරු වූවා පැදුන්දිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 5

### පඤ්චම පාචීනනින්නසුත්තං

119. සෙය්‍යථාපි භික්ඛවෙ, මහී නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 11. 6

### ඡට්ඨ පාචීනනින්නසුත්තං

120. සෙය්‍යථාපි භික්ඛවෙ, යා කාචි මහානදියො සෙය්‍යථීදං: **ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී**, සබ්බා තා පාචීනනින්නා පාචීනපොණා, පාචීනපබ්භාරා, එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 11. 7

### සමුද්දනින්නසුත්තං

121. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති අමතොගධං අමතපරායණං අමතපරියොසානං -පෙ- සම්මාසමාධිං භාවෙති අමතොගධං අමතපරායණං අමතපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

## 1. 11. 8

### දුතිය සමුද්දනින්නසුත්තං

122. සෙය්‍යථාපි භික්ඛවෙ, යමුනා නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 11. 9

### තතිය සමුද්දනින්නසුත්තං

123. සෙය්‍යථාපි භික්ඛවෙ, අචිරවතී නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 11. 5

## පඤ්චම පාචීනනින්න සූත්‍රය

119. මහණෙනි, යම්සේ මහී ගඟ පැදුන්දිගට නැමුණි පැදුන්දිගට නැඹුරු වූවා පැදුන්දිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ… නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 6

## ඡට්ඨ පාචීනනින්න සූත්‍රය

120. මහණෙනි, යම්කිසි මහාගඞ්ගාවෝ වෙත් ද, ඔහු කවරහ: **ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී** ගඞ්ගාවෝ යැ. යම්සේ ඒ සියල්ලෝ පැදුන්දිගට නැමුණාහු පැදුන්දිගට නැඹුරු වූවාහු පැදුන්දිගට බර වූවාහු වෙද්ද, මහණෙනි, එසෙයින් ම මහණ…නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 7

## සමුද්දනින්න සූත්‍රය

121. මහණෙනි, යම්සේ **ගඞ්ගා** නදිය මුහුදට නැමුණි මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, කෙසේ නම් මහණ අරිඅටඟි මඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නිවනට ඇතුළත් වූ නිවන පිහිට කොට ඇති නිවන කෙළවර කොට ඇති සම්‍යග්දෘෂ්ටිය වඩයි…නිවනට ඇතුළත් වූ නිවන පිහිට කොට ඇති නිවන කෙළවර කොට ඇති සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි මෙසේ මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 8

## දුතිය සමුද්දනින්න සූත්‍රය

122. මහණෙනි, යම්සේ **යමුනා** නදිය මුහුදට නැමුණි මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ…නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 9

## තතිය සමුද්දනින්න සූත්‍රය

123. මහණෙනි, යම්සේ **අචිරවතී** ගඟ මුහුදට නැමුණි මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ … නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 10

### චතුත්ථ සමුද්දනින්නසුත්තං

124. සෙය්‍යථාපි භික්ඛවෙ, සරභූ නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 11. 11

### පඤ්චම සමුද්දනින්නසුත්තං

125. සෙය්‍යථාපි භික්ඛවෙ, මහී නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 11. 12

### ඡට්ඨ සමුද්දනින්නසුත්තං

126. සෙය්‍යථාපි භික්ඛවෙ, යා කාචි මහානදියො සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී, සබ්බා තා සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති අමතොගධං අමතපරායණං අමතපරියොසානං -පෙ- සම්මාසමාධිං භාවෙති අමතොගධං අමතපරායණං අමතපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

තතිය ගඞ්ගාපෙය්‍යාලො.

තත්‍රුද්දානං:

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො,
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

## 1. 11. 10

## චතුත්‍ථ සමුද්දනින්න සූත්‍රය

124. මහණෙනි, යම්සේ **සරභූ** නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 11

## පඤ්චම සමුද්දනින්න සූත්‍රය

125. මහණෙනි, යම්සේ **මහී** නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද මහණෙනි, එසෙයින් ම මහණ ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 11. 12

## ඡට්ඨ සමුද්දනින්න සූත්‍රය

126. **මහණෙනි, යම්කිසි** මහානදීහු වෙත් ද ඔහු කවරහ යත්: **ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී** නදීහු යි. යම්සේ එ සියල්ලෝ මුහුදට නැමුණාහු මුහුදට නැඹුරු වූවාහු මුහුදට බර වූවාහු වෙද්ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බරවූයේ වෙයි. මහණෙනි, කෙසේ නම් මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙහි මහණ නිවනට ඇතුළත් වූ නිවන පිහිට කොට ඇති නිවන කෙළවර කොට ඇති සම්‍යග්දෘෂ්ටිය වඩයි ... නිවනට ඇතුළත් වූ නිවන පිහිට කොට ඇති නිවන කෙළවර කොට ඇති සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමග බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

**තතිය ගඞ්ගා පෙය්‍යාල යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

පාචීනනින්නසූත්‍ර සයෙකි. සමුද්දනින්නසූත්‍ර ද සයෙකි. මේ ඡක්ක දෙක දොළොස් සූත්‍ර කෙනෙක් වෙත්. එයින් වර්ග යයි කියනු ලැබේ යි.

# 12. චතුත්ථ ගඞ්ගාපෙය්‍යාලො

## 1. 12. 1

### පාචීනනින්නසුත්තං

127. සෙය්‍යථාපි භික්ඛවෙ, **ගඞ්ගා** නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, **භික්ඛු** අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො? ඉධ භික්ඛවෙ, **භික්ඛු** සම්මාදිට්ඨිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං -පෙ- සම්මාසමාධිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. එවං ඛො භික්ඛවෙ, **භික්ඛු** අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

## 1. 12. 2

### දුතිය පාචීනනින්නසුත්තං

128. සෙය්‍යථාපි භික්ඛවෙ, **යමුනා** නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, **භික්ඛු** -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 12. 3

### තතිය පාචීනනින්නසුත්තං

129. සෙය්‍යථාපි භික්ඛවෙ, **අචිරවතී** නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, **භික්ඛු** -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 12. 4

### චතුත්ථ පාචීනනින්නසුත්තං

130. සෙය්‍යථාපි භික්ඛවෙ, **සරභූ** නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, **භික්ඛු** -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 12. 5

### පඤ්චම පාචීනනින්නසුත්තං

131. සෙය්‍යථාපි භික්ඛවෙ, **මහී** නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, **භික්ඛු** -පෙ- නිබ්බානපබ්භාරොති.

# 12. චතුත්ථ ගඞ්ගා පෙය්‍යාලය

## 1. 12. 1

## පාචීනනින්න සූත්‍රය

127. මහණෙනි, යම්සේ ගඞ්ගා නම් ගඟ පැදුන්දිගට නැමුණී පැදුම් දිගට නැඹුරු වූවා පැදුන්දිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බරවූ සම්‍යග්දෘෂ්ටිය වඩයි ... නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මහණ තෙමේ මෙසේ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 2

## දුතිය පාචීනනින්න සූත්‍රය

128. මහණෙනි, යම්සේ යමුනා නදිය පැදුන්දිගට නැමුණී පැදුන්දිගට නැඹුරු වූවා පැදුන්දිගට බරවූවා වේ ද මහණෙනි, එසෙයින් ම මහණ ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 3

## තතිය පාචීනනින්න සූත්‍රය

129. මහණෙනි, යම්සේ අචිරවතී නදිය පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ.. නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 4

## චතුත්ථ පාචීනනින්න සූත්‍රය

130. මහණෙනි, යම්සේ සරභූ නදිය පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ.. නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 5

## පඤ්චම පාචීනනින්න සූත්‍රය

131. මහණෙනි, යම්සේ මහී නදිය පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ.. නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 6

### ඡට්ඨ පාචීනනින්නසුත්තං

132. සෙය්‍යථාපි භික්ඛවෙ, යා කාචි මහානදියො, සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී සබ්බා තා පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. –පෙ– සම්මාසමාධිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

## 1. 12. 7

### සමුද්දනින්නසුත්තං

133. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා, එවමෙව ඛො භික්ඛවෙ. භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං –පෙ– සම්මාසමාධිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

## 1. 12. 8

### දුතිය සමුද්දනින්නසුත්තං

134. සෙය්‍යථාපි භික්ඛවෙ, යමුනා නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු –පෙ– නිබ්බානපබ්භාරොති.

## 1. 12. 9

### තතිය සමුද්දනින්නසුත්තං

135. සෙය්‍යථාපි භික්ඛවෙ, අචිරවතී නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු –පෙ– නිබ්බානපබ්භාරොති.

Free Distribution www.aathaapi.org

## 1. 12. 6

## ඡට්ඨ පාචීනනින්න සූත්‍රය

132. මහණෙනි, යම් කිසි මහානදීහු ඇද්ද ඔහු කවරහ: ගඞ්ගා **යමුනා අචිරවතී සරභූ මහී** යන නදීහු යි. යමසේ ඒ සියල්ලෝ පෙරදිගට නැමුණාහු පෙරදිගට නැඹුරු වූවාහු පෙරදිගට බර වූවාහු වෙත් ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බරවූයේ වෙයි. මහණෙනි, මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරුවූයේ නිවනට බරවූයේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාදිට්ඨිය වඩයි ... නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමඟ වඩනුයේ අරිඅටඟිමඟ බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 7

## සමුද්දනින්න සූත්‍රය

133. මහණෙනි, යමසේ ගඞ්ගානදිය මුහුදට නැමුණි මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩනනේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාදිට්ඨිය වඩයි.. නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 8

## දුතිය සමුද්දනින්න සූත්‍රය

134. මහණෙනි, යමසේ යමුනා නදිය මුහුදට නැමුණි මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 9

## තතිය සමුද්දනින්න සූත්‍රය

135. මහණෙනි, යමසේ අචිරවතී නදිය මුහුදට නැමුණි මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 10

### චතුත්ථ සමුද්දනින්නසුත්තං

136. සෙය්‍යථාපි භික්ඛවෙ, සරභූ නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 12. 11

### පඤ්චම සමුද්දනින්නසුත්තං

137. සෙය්‍යථාපි භික්ඛවෙ, මහී නදී සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු -පෙ- නිබ්බානපබ්භාරොති.

## 1. 12. 12

### ඡට්ඨ සමුද්දනින්නසුත්තං

138. සෙය්‍යථාපි භික්ඛවෙ, යා කාචි මහානදියො සෙය්‍යථීදං: ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී, සබ්බා තා සමුද්දනින්නා සමුද්දපොණා සමුද්දපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො, කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං -පෙ- සම්මාසමාධිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

චතුත්ථ ගඞ්ගාපෙය්‍යාලි

තස්සුද්දානං:

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො,
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

## 1. 12. 10

## චතුත්ථ සමුද්දනින්න සූත්‍රය

136. මහණෙනි, යම්සේ **සරභූ** නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේද, මහණෙනි, එසෙයින් ම මහණ...නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 11

## පඤ්චම සමුද්දනින්න සූත්‍රය

137. මහණෙනි, යම්සේ **මහී** නදිය මුහුදට නැමුණී මුහුදට නැඹුරු වූවා මුහුදට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ... නිවනට බර වූයේ වේ යයි.

## 1. 12. 12

## ඡට්ඨ සමුද්දනින්න සූත්‍රය

128. මහණෙනි, යම් කිසි මහානදීහු ඇත් ද ඔහු කවරහ: **ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී** නදීහු යි. යම්සේ ඒ සියල්ලෝ මුහුදට නැමුණාහු මුහුදට නැඹුරු වූවාහු මුහුදට බර වූවාහු වෙත් ද, මහණෙනි, එසෙයින් ම මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාදිට්ඨිය වඩයි...නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## දෙළොස්වැනි චතුත්ථ ගඞ්ගා පෙය්‍යාල යි.

**එහි සූත්‍රනාමමාලාව:**

පාචීනනින්න සුතුරු සයෙකි. සමුද්දනින්න සුතුරු ද සයෙකි. මේ ඡක්ක දෙක දෙළොස්සුතුරෙක් වේ. එයින් වර්ග යයි කියනු ලැබේ යයි.



Free Distribution www.aathaapi.org

# 13. අප්පමාදවග්ගො

## 1. 13. 1

### තථාගතසුත්තං

**139.** සාවත්ථියං:

යාවතා භික්ඛවෙ, සත්තා අපද වා දිපද[1] වා චතුප්පද වා බහුප්පද වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි කුසලා ධම්මා, සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. අප්පමත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති. අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 13. 9

### දුතිය තථාගතසුත්තං

**140.** යාවතා භික්ඛවෙ, සත්තා අපද වා දිපද වා චතුප්පද වා බහුප්පද වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. අප්පමත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං: අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති. අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං -පෙ- සම්මාසමාධිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

---

1. ද්විපද - මජ්ඣං., සං., සී 2.

# 13. අප්පමාද වර්ගය

## 1. 13. 1

## තථාගත සූත්‍රය

139. සැවැත්නුවර:

මහණෙනි, පා නැත්තා වූ ද දෙපා ඇත්තා වූ ද සිවුපා ඇත්තා වූ ද බොහෝ පා ඇත්තා වූ ද රූ ඇත්තා වූ ද රූ නැත්තා වූ ද සඤ්ඤා ඇත්තා වූ ද සඤ්ඤා නැත්තා වූ ද නේවසඤ්ඤානාසඤ්ඤී වූ ද යම්තාක් සත්ත්වයෝ වෙද්ද තථාගත වූ අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේ ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබෙත්. මහණෙනි, එසෙයින් ම යම් කිසි කුසල්දහම්හු වෙත් නම් ඒ සියල්ලෝ අප්‍රමාදය මුල් කොට ඇතියහ. අප්‍රමාදය සමග පවත්නාහ. අප්‍රමාදය ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය, අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය නොපමා මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, නොපමා මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමෙනසුලු සම්‍යග්දෘෂ්ටිය වඩයි...විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමෙනසුලු සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, නොපමා මහණ මෙසේ අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 13. 2

## දුතිය තථාගත සූත්‍රය

140. මහණෙනි, පා නැත්තා වූ ද දෙපා ඇත්තා වූ ද සිවුපා ඇත්තා වූ ද බොහෝ පා ඇත්තා වූ ද රූ ඇත්තා වූ ද රූ නැත්තා වූ ද සඤ්ඤා ඇත්තා වූ ද සඤ්ඤා නැත්තා වූ ද නේවසඤ්ඤානාසඤ්ඤී වූ ද යම් තාක් සත්ත්වයෝ වෙත් නම් තථාගත අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබෙත්. මහණෙනි, එසෙයින් ම යම් කිසි කුසල්දහම්හු වෙත් නම් ඒ සියල්ලෝ අප්‍රමාදය මුල් කොට ඇතියහ. අප්‍රමාදය සමග පවත්නාහ. අප්‍රමාදය ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය නොපමා මහණහු විසින් කැමැති වියයුතු යි. මහණෙනි, නොපමා මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ රාගවිනය පර්‍යවසාන වූ ද්වේෂවිනය පර්‍යවසාන වූ මොහවිනය පර්‍යවසාන වූ සම්මාදිට්ඨිය වඩයි ... රාගවිනය පර්‍යවසානය වූ ද්වේෂවිනය පර්‍යවසාන වූ මොහ විනය පර්‍යවසානය වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි, නොපමා මහණ මෙසේ අරිඅටඟිමඟ වඩයි අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 13. 3

### තතිය තථාගතසුත්තං

141. යාවතා භික්ඛවෙ, සත්තා අපද වා දිපද වා චතුප්පද වා බහුප්පද වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. අප්පමත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං "අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතී"ති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති අමතොගධං අමතපරායනං අමතපරියොසානං -පෙ- සම්මාසමාධිං භාවෙති අමතොගධං අමතපරායනං අමතපරියොසානං. එවං ඛො භික්ඛවෙ,[1] භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 13. 4

### චතුත්ථ තථාගතසුත්තං

142. යාවතා භික්ඛවෙ, සත්තා අපද වා දිපද වා චතුප්පද වා බහුප්පද වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනාසඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා. අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. අප්පමත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං: "අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතී"ති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං -පෙ- සම්මාසමාධිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 13. 5–8

### පදසුත්තානි

143–146 සෙය්‍යථාපි භික්ඛවෙ, යානි කානිචි ජඞ්ගමානං[2] පාණානං පදජාතානි, සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති. හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති යදිදං මහන්තත්තෙන. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාදමූලකා, අප්පමාදසමොසරණා. අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. අප්පමත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං: අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති -පෙ- බහුලීකරොතීති.

(යථා තථාගතසුත්තානි තථා විත්ථාරෙතබ්බානි)

1. එවමෙව ඛො - සී 1,
2. ජඞ්ගලානං - මජ්සං., සයා.

## 1. 13. 3

## තතිය තථාගත සූත්‍රය

141. මහණෙනි, අපා වූ ද දෙපා වූ ද සිවුපා වූ ද බහුපා වූ ද රූපී වූ ද අරූපී වූ ද සඤ්ඤී වූ ද අසඤ්ඤී වූ ද නේවසඤ්ඤීනාසඤ්ඤී වූ ද යම්තාක් සත්ත්වයෝ වෙත් නම් තථාගත අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේ ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබෙත්. මහණෙනි, එසෙයින් ම යම්කිසි කුසල්දහම්හු වෙත් නම් ඒ සියල්ලෝ අප්‍රමාදය මුල් කොට ඇතියහ. අප්‍රමාදය සමඟ පවත්නාහ. අප්‍රමාදය ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය නොපමා මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, නොපමා මහණ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නිවනට ඇතුළත් වූ නිවන පිහිට කොට ඇති නිවන කෙළවර කොට ඇති සම්මාදිට්ඨිය වඩයි ... නිවනට ඇතුළත් වූ නිවන පිහිට කොට ඇති නිවන කෙළවර කොට ඇති සම්මාසමාධිය වඩයි. මහණෙනි, නොපමා මහණ මෙසේ අරිඅටඟිමඟ වඩයි අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 13. 4

## චතුත්ථ තථාගත සූත්‍රය

142. මහණෙනි, අපාදක වූ ද දෙපා වූ ද සිවුපා වූ ද බහුපා වූ ද රූපී වූ ද අරූපී වූ ද සඤ්ඤී වූ ද අසඤ්ඤී වූ ද නේවසඤ්ඤීනාසඤ්ඤී වූ ද යම්තාක් සත්ත්වයෝ වෙත් නම් තථාගත අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ ඔවුන්ට අග්‍ර ය යි කියනු ලැබෙත්. මහණෙනි, එසෙයින් ම යම්කිසි කුසල්දහම්හු වෙත් නම් ඒ සියල්ලෝ අප්‍රමාදය මුල් කොට ඇතියහ අප්‍රමාදය සමඟ පවත්නාහ. අප්‍රමාදය ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය නොපමා මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, නොපමා මහණ තෙමේ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාදිට්ඨිය වඩයි ... නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි, නොපමා මහණ තෙමේ මෙසේ අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 13. 5–8

## පද සූත්‍ර

143–146 මහණෙනි, යම්සේ ඇවිදිනසතුන්ගේ යම් කිසි පා සටහන්හු වෙද්ද, ඒ සියල්ලෝ ඇත්පියෙහි ඇතුළත්වීමට යෙත්. ඇත්පිය මහත් බැවින් ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම යම් කිසි කුසල්දහම්හු වෙත් නම් ඒ සියල්ලෝ අප්‍රමාදය මුල් කොට ඇතියහ. අප්‍රමාදය සමඟ පවත්නාහු අප්‍රමාදය ඔවුන්ට අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය, අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය නොපමා මහණහු විසින් කැමති වියයුතු යි...බහුල කෙරේ යයි.

(තථාගත සූත්‍ර මෙන් විස්තර කටයුතු යි)

## 1. 13. 9–12

### කූටසුත්තානි

147–150. සෙය්‍යථාපි භික්ඛවෙ, කූටාගාරස්ස යා කාචි ගොපානසියො සබ්බා තා කූටඞ්ගමා කූටනින්නා කූටසමොසරණා, කූටං තාසං[1] අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි කුසලා ධම්මා –පෙ– බහුලීකරොතීති.

## 1. 13. 13–16

### මූලසුත්තානි

151–154. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි මූලගන්ධා, කාලානුසාරි[2] තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, –පෙ– බහුලීකරොතීති.

## 1. 13. 17–20

### සාරසුත්තානි

155–158. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි සාරගන්ධා, ලොහිතචන්දනං තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, –පෙ– බහුලීකරොතීති.

## 1. 13. 21–24

### වස්සිකසුත්තානි

159–162. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි පුප්ඵගන්ධා, වස්සිකං තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, –පෙ– බහුලීකරොතීති.

## 1.13 25–28

### රාජසුත්තානි

163–166. සෙය්‍යථාපි භික්ඛවෙ. යෙ කෙචි කුඩ්ඩරාජානො[3] සබ්බෙ තෙ රඤ්ඤො චක්කවත්තිස්ස අනුයන්තා[4] භවන්ති. රාජා තෙසං චක්කවත්ති අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, –පෙ– බහුලීකරොතීති.

## 1. 13. 29–32

### චන්දිමසුත්තානි

167–170. සෙය්‍යථාපි භික්ඛවෙ, යා කාචි තාරකරූපානං පභා. සබ්බා තා චන්දිමප්පභාය[5] කලං නාග්ඝන්ති සොළසිං චන්දප්පභා තාසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, –පෙ– බහුලීකරොතීති.

---

1. තෙසං – සී 1, 2.
2. කාල නුසාරි – සී 1, 2. කොට්ඨානුසාරිය – සයා.
3. කුට්ටරාජානො – මජ්ඣං, සයා.
4. අනුයුත්තා – සීමු.
5. චන්දිමාභා – සයා.

## 1. 13. 9–12

## කූට සූත්‍ර

147–150. මහණෙනි, යම්සේ කූළුගෙයක යම් කිසි ගොනැස්හු (–පරාල) වෙත් නම් ඒ සියල්ලෝ මුදුනට ගියාහු මුදුනට නැමුණාහු මුදුන සමඟ පවත්නාහු වෙති. මුදුන ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම යම් කිසි කුසල්දහම්හු ... බහුල කෙරේ යයි.

## 1. 13. 13–16

## මූල සූත්‍ර

151–154. මහණෙනි, යම්සේ යම් කිසි මුල්ගඳහු වෙද්ද කළුඅගිල් ඔවුනට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම...බහුල කෙරේ යයි.

## 1. 13. 17–20

## සාර සූත්‍ර

155–158. මහණෙනි, යම්සේ යම් කිසි හර ගඳහු වෙද්ද, රත්සඳුන් ඔවුනට අග්‍ර ය යි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම...බහුල කෙරේ යයි.

## 1. 13. 21–24

## වස්සික සූත්‍ර

159–162. මහණෙනි, යම්සේ යම් කිසි මල්ගඳහු වෙද්ද දැසමන් ඔවුනට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම.. බහුල කෙරේ යයි.

## 1. 13. 25–28

## රාජ සූත්‍ර

163–166 මහණෙනි, යම්සේ යම් කිසි කුඩාරජහු වෙද්ද, ඒ සියල්ලෝ සක්විතිරජුට අනුව යත්තෝ වෙති සක්විති රජ ඔවුනට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම.. බහුල කෙරේ යයි.

## 1. 13. 29–32

## චන්දිම සූත්‍ර

167–170. මහණෙනි, යම්සේ තරු පිළිබඳ යම් කිසි එළියක් වේ ද, ඒ සියල්ල සඳඑළියෙහි සොළොස්වැනි කලාවෙන් කලාවකුත් නො අගී. සඳඑස් ඔවුනට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම ... බහුල කෙරේ යයි.

## 1. 13. 33-36

## සූරියසුත්තානි

171-174. සෙය්‍යථාපි භික්ඛවෙ, සරදසමයෙ විද්ධෙ විගතවලාහකෙ දෙවෙ ආදිච්චො නභං අබ්භුස්සක්කමානො සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච භාසතෙ ච තපතෙ ච විරොචති ච. එවමෙව ඛො භික්ඛවෙ, -පෙ- බහුලීකරොතීති.

## 1. 13 37-40

## වත්ථසුත්තානි

175-178. සෙය්‍යථාපි භික්ඛවෙ යානි කානිචි තන්තාවුතානං වත්ථානං කාසිකං වත්ථං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා. අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. අප්පමත්තස්සෙතං භික්ඛවෙ භික්ඛුනො පාටිකඞ්ඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති,

(සබ්බමෙව සාවත්ථිනිදානං යථා තථාගතසුත්තානි සබ්බානි තථා විත්ථාරෙතබ්බානි.)

**අප්පමාදවග්ගො තෙළසමො.**

තස්සුද්දානං:

තථාගතං පදං කූටං මූලං සාරෙන වස්සිකං,
රාජා චන්දිමසූරියා ච වත්ථෙන දසමං පදන්ති.

## 1. 13. 33–36

## සූරිය සූත්‍ර

171–174. මහණෙනි, ශරත්කල්හි පහ ව ගිය වලාකුළු ඇති වැස්ස නැවති කල්හි හිරු අහසට නැගෙනුයේ අහසෙහි වූ සියලු අඳුර වෙසෙසින් නසා යම්සේ දිලියේ ද, තවා ද, බබළා ද, මහණෙනි එසෙයින් ම...බහුල කෙරේ යි.

## 1. 13. 37–40

## වත්‍ථ සූත්‍ර

**175–178** මහණෙනි, යම්සේ තුලින් වියන ලද යම් කිසි වස්ත්‍ර වේ ද, කසිවත ඔවුනට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම යම් කිසි කුසල්දහම්හු වෙද්ද, ඒ සියල්ලෝ අප්‍රමාදය මුල් කොට ඇතියහ. අප්‍රමාදය සමඟ පවත්නාහ. අප්‍රමාදය ඔවුනට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, අරිඅටඟිමඟ වඩන්නේ ය, අරිඅටඟිමඟ බහුල කරන්නේ ය යන මෙය නොපමා මහණහු විසින් කැමති වියයුතු යි. මහණෙනි, නොපමා මහණ තෙමේ කෙසේ නම් අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකනිස්සිත වූ විරාගනිස්සිත වූ නිරොධනිස්සිත වූ නිවනට නැමෙන සම්මාදිට්ඨිය වඩයි...සම්මාසමාධිය වඩයි. මහණෙනි, නොපමා මහණ තෙමේ මෙසේ අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

(සියල්ල සැවත ම නිදන කොට ඇත.)

(සියලු සූත්‍ර තථාගතසූත්‍ර මෙන් විස්තර කටයුතු).

## තෙළෙස්වැනි අප්‍රමාද වර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

තථාගත, පද, කූට, මූල, සාර, වස්සික, රාජ, චන්දිම, සූරිය යී චතුෂ්ක නවයෙකි. වත්ථ නමින් දශවන චතුෂ්ක පදය වේ.

(වර්ගයෙහි සූත්‍රමුළුල්ල සාළිසෙකි)

# 14. බලකරණීයවග්ගො

## 1. 14. 1

## බලසුත්තං

179. සාවත්ථියං;

සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කරීයන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය එවමෙතෙ බලකරණීයා කම්මන්තා කරීයන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති: අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 14. 2

## දුතියබලසුත්තං

180. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කරීයන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය. එවමෙතෙ බලකරණීයා කම්මන්තා කරීයන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං -පෙ- සම්මාසමාධිං භාවෙති. රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනයපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති. අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 14. 3

## තතියබලසුත්තං

181. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කරීයන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය, එවමෙතෙ බලකරණීයා කම්මන්තා කරීයන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති. අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති. අමතොගධං අමතපරායනං අමතපරියොසානං -පෙ-

# 14. බලකරණීය වර්ගය

## 1. 14. 1

## බල සූත්‍රය

179. සැවැත්නුවර :

මහණෙනි, යම්සේ කායබලයෙන් කළ යුතු යම් කිසි කර්මාන්තයෝ කරනු ලැබෙද්ද, ඒ සියල්ලෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා මෙසේ මේ බලකරණීය කර්මාන්තයෝ කරනු ලැබෙත්. මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරෙයි. මහණෙනි, මහණ කෙසේ නම් ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩා ද අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට පිරිනැමෙන සම්මාදිට්ඨිය වඩයි... විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට පිරිනැමෙන සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 14. 2

## දුතියබල සූත්‍රය

180. මහණෙනි, යම්සේ කාය බලයෙන් කළයුතු යම් කිසි කර්මාන්තයෝ කරනු ලැබෙද්ද, ඒ සියල්ලෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා මෙසේ මේ බලකරණීය කර්මාන්තයෝ කරනු ලැබෙත්. මහණෙනි එසෙයින් ම මහණ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරෙයි. මහණෙනි, මහණ කෙසේ නම් ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩාද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ රාගවිනය පර්‍යවසාන වූ දෙසවිනය පර්‍යවසාන වූ මොහවිනය පර්‍යවසාන වූ සම්මාදිට්ඨිය වඩයි...රාගවිනය පර්‍යවසාන දෙසවිනය පර්‍යවසාන වූ මොහවිනය පර්‍යවසාන වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩයි, අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 14. 3

## තතියබල සූත්‍රය

181. මහණෙනි, යම්සේ කායබලයෙන් කළයුතු යම් කිසි කර්මාන්තයෝ කරනු ලැබෙද්ද, ඒ සියල්ලෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා මෙසේ මේ බලකරණීය කර්මාන්තයෝ කරනු ලැබෙත්. මහණෙනි, එසෙයින් ම මහණ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරෙයි. මහණෙනි මහණ කෙසේ නම් ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නිවනට ඇතුළත් වූ නිවන පිහිට කොට ඇති නිවන කෙළවර කොට ඇති සම්මාදිට්ඨිය වඩයි ...

සම්මා සමාධිං භාවෙති අමතොගධං අමතපරායනං අමතපරියොසානං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති. අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1. 14. 4

### බලසුත්තං

182. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කරීයන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය, එවමෙතෙ බලකරණීයා කම්මන්තා කරීයන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති. අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං -පෙ- සම්මාසමාධිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති. අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

## 1.14. 5-8

### බීජසුත්තානි.

183-186. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙකෙචි බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියා පතිට්ඨාය, එවමෙතෙ බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසූති.

නිවනට ඇතුළත් වූ නිවන පිහිට කොට ඇති නිවන කෙළෙවර කොට ඇති සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩයි, අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 14. 4

## චක්ඛුබල සූත්‍රය

182. මහණෙනි, යම්සේ යම් කිසි බලකරණීය කර්මාන්තයෝ කරනු ලැබෙද්ද, ඒ සියල්ලෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා මෙසේ මේ බලකරණීය කර්මාන්තයෝ කරනු ලැබෙත්. මහණෙනි, එසෙයින් ම මහණ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරෙයි. මහණෙනි, මහණ කෙසේ නම් ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩා ද අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි මෙසස්නෙහි මහණ නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාදිට්ඨිය වඩයි... නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරේ යයි.

## 1. 14. 5-8

## බීජ සූත්‍ර

183-186. මහණෙනි, යම්සේ යම් කිසි ඇටවර්ග පැලවර්ගයෝ වැඩීමට ස්ථිරත්වයට විපුලත්වයට පැමිණෙද්ද, ඒ සියල්ලෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා මෙසේ මේ ඇටවර්ග පැලවර්ගයෝ වැඩීමට ස්ථිරත්වයට විපුලත්වයට පැමිණෙත්. මහණෙනි, එසෙයින් ම මහණ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩන්නේ අරි අටඟි මඟ බහුල කරන්නේ දහම්හි ලා වැඩීමට ස්ථිරත්වයට විපුලත්වයට පැමිණේ. මහණෙනි, මහණ තෙමේ කෙසේ නම් ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟි මඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ දහම්හි ලා වැඩීමට ස්ථිරත්වයට විපුලත්වයට පැමිණේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි මෙසේ මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ දහම්හි ලා වැඩීමට ස්ථිරත්වයට විපුලත්වයට පැමිණේ යයි.

## 1.14. 9-12

### නාගසුත්තානි

187-190. සෙය්‍යථාපි භික්ඛවෙ, හිමවන්තං[1] පබ්බතරාජං නිස්සාය නාගා කායං වඩ්ඪෙන්ති, බලං ගාහෙන්ති. තෙ තත්ථ කායං වඩ්ඪෙත්වා බලං ගාහෙත්වා කුසුබ්භෙ[2] ඔතරන්ති. කුසුබ්භෙ[2] ඔතරිත්වා මහාසොබ්භෙ ඔතරන්ති. මහාසොබ්භෙ ඔතරිත්වා කුන්නදියො ඔතරන්ති, කුන්නදියො ඔතරිත්වා මහානදියො ඔතරන්ති. මහානදියො ඔතරිත්වා මහාසමුද්දං සාගරං ඔතරන්ති. තෙ තත්ථ මහන්තත්තං වෙපුල්ලත්තං[3] ආපජ්ජන්ති කායෙන. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො මහන්තත්තං වෙපුල්ලත්තං[3] පාපුණාති ධම්මෙසු. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො මහන්තත්තං වෙපුල්ලත්තං[3] පාපුණාති ධම්මෙසු: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො මහන්තත්තං වෙපුල්ලත්තං[3] පාපුණාති ධම්මෙසූති.

## 1.14. 13-16

### රුක්ඛසුත්තානි

191-194 සෙය්‍යථාපි භික්ඛවෙ රුක්ඛො පාචීනනින්නො පාචීනපොණො පාචීනපබ්භාරො සො මූලෙ[4] ඡින්නො කතමෙන පපාතෙන පපතෙය්‍යාති[5] යෙන භන්තෙ, නින්නො යෙන පොණො යෙන පබ්භාරොති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ' භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො, නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

---

1. හිමවන්තං භික්ඛවෙ - සී 1, 2, සයා
2. කුසොබ්භෙ - මජසං, කුසුබ්භෙ සයා.
3. වෙපුල්ලතං - සී 1, 2
4. මූලච්ඡින්නො - මජසං.
5. පපතෙය්‍යන්ති - සයා.

## 1. 14. 9–12

### නාග සූත්‍ර

187–190. මහණෙනි, යම්සේ හිමවත් පර්වතරාජයා නිසා නාගයෝ කය වඩද්ද, බල ගනිද්ද, ඔහු එහි කය වඩා බල ගෙන කුඩා හෙබ්වලට බසිත්. කුඩා හෙබ්වලට බැස මහහෙබ්වලට බසිත්. මහහෙබ්වලට බැස කුඩාගඞ්ගාවලට බසිත්. කුඩාගඞ්ගාවලට බැස මහාගඞ්ගාවලට බසිත්. මහාගඞ්ගාවලට බැස මහමුහුදුසයුරට බසිත්. ඔහු එහි කයින් මහත්වයට විපුලත්වයට පැමිණෙත්. මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ දහම්හි ලා මහත්වයට විපුලත්වයට පැමිණේයි. මහණෙනි, මහණ කෙසේ නම් ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ දහම්හි ලා මහත්වයට විපුලත්වයට පැමිණේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට නැමුණු සම්මාදිට්ඨිය වඩයි...සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ ශීලය නිසා ශීලයෙහි පිහිටා අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ දහම්හි ලා මහත්වයට විපුලත්වයට පැමිණේ යයි.

## 1. 14. 13–16

### රුක්ඛ සූත්‍ර

191–194. මහණෙනි, යම්සේ රුකෙක් පැදුන්දිගට නැමුණේ පැදුන්දිගට නැඹුරු වූයේ පැදුන්දිගට බරවූයේ වේ ද, එය මුල සිඳින ලද්දේ කවර ප්‍රපාතයකට වැටෙන්නේ ද යි. වහන්ස, යම්දිගකට නැමුණේ යම්දිගකට නැඹුරු වූයේ යම් දිගකට බර වූයේ නම් (ඒදිගට) ය. මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බරවූයේ වෙයි. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ විවේකනිස්සිත වූ විරාග නිස්සිත වූ නිරෝධනිස්සිතවූ නිවනට නැමුණු සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යයි.

## 1. 14. 17-20

### කුම්භසුත්තානි

195-198. සෙය්‍යථාපි භික්ඛවෙ, කුම්භො නික්කුජ්ජො වමතෙව උදකං නො පච්චාවමති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වමතෙව පාපකෙ අකුසලෙ ධම්මෙ නො පච්චාවමති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වමතෙව පාපකෙ අකුසලෙ ධම්මෙ නො පච්චාවමති; ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වමතෙව පාපකෙ අකුසලෙ ධම්මෙ නො පච්චාවමතීති.

## 1. 14. 21-24

### සූක සුත්තානි

199-202. සෙය්‍යථාපි භික්ඛවෙ, සාලිසූකං වා යවසූකං වා සම්මා පණිහිතං හත්ථෙන වා පාදෙන වා අක්කන්තං හත්ථං වා පාදං වා භෙච්ඡති ලොහිතං වා උප්පාදෙස්සතීති ඨානමෙතං විජ්ජති. තං කිස්ස හෙතු: සම්මා පණිහිතත්තා භික්ඛවෙ, සූකස්ස. එවමෙව ඛො සො වත[1] භික්ඛු සම්මා පණිහිතාය දිට්ඨියා සම්මා පණිහිතාය මග්ගභාවනාය අවිජ්ජං භෙච්ඡති[2] විජ්ජං උප්පාදෙස්සති නිබ්බානං සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති. තං කිස්ස හෙතු: සම්මා පණිහිතත්තා භික්ඛවෙ දිට්ඨියා, කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සම්මා පණිහිතාය දිට්ඨියා සම්මා පණිහිතාය මග්ගභාවනාය අවිජ්ජං භින්දති විජ්ජං උප්පාදෙති නිබ්බානං සච්ඡිකරොති: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මා සමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සම්මා පණිහිතාය දිට්ඨියා සම්මා පණිහිතාය මග්ගභාවනාය අවිජ්ජං භින්දති විජ්ජං උප්පාදෙති නිබ්බානං සච්ඡිකරොතීති.

## 1. 14. 25-28

### ආකාස සුත්තානි

203-206. සෙය්‍යථාපි භික්ඛවෙ, ආකාසෙ විවිධා වාතා වායන්ති පුරත්ථිමාපි වාතා වායන්ති. පච්ඡිමාපි වාතා වායන්ති. උත්තරාපි වාතා වායන්ති දක්ඛිණාපි වාතා වායන්ති. සරජාපි වාතා වායන්ති අරජාපි වාතා වායන්ති. සීතාපි වාතා වායන්ති. උණ්හාපි වාතා වායන්ති පරිත්තාපි වාතා වායන්ති. අධිමත්තාපි වාතා වායන්ති,

1. එවමෙව ඛො භික්ඛවෙ - මජසං., සයා.
2. භින්දිස්සති - මජසං., සයා.

## 1. 14. 17-20

## කුම්භ සූත්‍ර

195-198. මහණෙනි, යම්සේ කළය යටිහුරු වූයේ දිය වගුරුවන්නේ මැ වේ, නො ම පෙරළා ගනී ද මහණෙනි, එසෙයින් ම මහණ අරීඅටඟිමග වඩන්නේ අරීඅටඟිමග බහුල කරන්නේ ලාමක අකුසල් දහම් වමාරන්නුයේ නො ම පෙරළා ගනී. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ අරීඅටඟිමග වඩන්නේ අරීඅටඟිමග බහුල කරන්නේ ලාමක අකුසල් දහම් වමාරන්නුයේ නො ම පෙරළා ගනී ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකනිස්සිත වූ විරාගනිස්සිත වූ නිරෝධනිස්සිත වූ වොස්සග්ගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි ... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ අරීඅටඟිමග වඩන්නේ අරීඅටඟිමග බහුල කරන්නේ ලාමක අකුසල් දහම් වමාරා ම ය නො ම පෙරළා ගනී යි.

## 1. 14. 21-24

## සූක සූත්‍ර

199-202. මහණෙනි, යම්සේ හැල්නණ්ඩුවක් හෝ යවනණ්ඩුවක් හෝ මැනැවින් තබන ලද්දේ අතින් හෝ පයින් හෝ ඇක්මුණේ අත හෝ පය හෝ බිඳින්නේ ය, ලේ හෝ උපදවන්නේ ය යන මෙ කරුණ ඇද්ද, ඒ කවර හෙයින යත්: මහණෙනි, නණ්ඩුව තමා මැනවින් තබන ලද බැවිනි. මහණෙනි, එසෙයින් ම ඒ මහණ මැනවින් පිහිටුවන ලද දෘෂ්ටියෙන් මැනැවින් පිහිටු වන ලද මාර්ගභාවනායෙන් අවිද්‍යාව බිඳින්නේ ය, විද්‍යාව උපදවන්නේ ය, නිවන පසක් කරන්නේ ය යන මෙකරුණ ඇත. ඒ කවර හෙයින යත්: මහණෙනි, දෘෂ්ටිය මැනැවින් පිහිටුවන ලද බැවිනි. මහණෙනි, කෙසේ නම් මහණ මැනැවින් පිහිටුවන ලද දෘෂ්ටියෙන් මැනැවින් පිහිටුවන ලද මාර්ගභාවනායෙන් අවිද්‍යාව බිඳී ද, විද්‍යාව උපදවා ද, නිවන පසක් කෙරේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ විවේකනිස්සිත විරාගනිස්සිත නිරෝධනිස්සිත වොස්සග්ගපරිණාමී සම්මාදිට්ඨිය වඩයි ... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ මැනවින් පිහිටුවන ලද දෘෂ්ටියෙන් මැනැවින් පිහිටුවන ලද මාර්ගභාවනායෙන් අවිද්‍යාව බිඳියි විද්‍යාව උපදවයි නිවන පසක් කෙරේ යයි.

## 1. 14. 25-28

## ආකාස සූත්‍ර

203-206. මහණෙනි, යම්සේ අහසෙහි විවිධවාතයෝ හමද්ද පෙරදිගිනුදු වාතය හමයි, පැළදිගිනුදු වාතය හමයි. උතුරු දිගිනුදු වාතය හමයි. දකුණු දිගිනුදු වාතය හමයි. රජස් සහිත වාතය ද හමයි, රජස් රහිත වාතය ද හමයි, සිහිල් වාතය ද හමයි. උණුසුම් වාතය ද හමයි, මඳ වූ වාතය ද හමයි, බොහෝ වූ වාතය ද හමයි.

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවයතො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතො චත්තාරොපි සතිපට්ඨානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. චත්තාරොපි සම්මප්පධානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, චත්තාරොපි ඉද්ධිපාද භාවනා පාරිපූරිං ගච්ඡන්ති. පඤ්චපි ඉන්ද්‍රියානි භාවනා පාරිපූරිං ගච්ඡන්ති. පඤ්චපි බලානි භාවනා පාරිපූරිං ගච්ඡන්ති. සත්තපි බොජ්ඣඞ්ගා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛුනො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවයතො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතො චත්තාරොපි සතිපට්ඨානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. චත්තාරොපි සම්මප්පධානා -පෙ- චත්තාරොපි ඉද්ධිපාද -පෙ- පඤ්චපි ඉන්ද්‍රියානි -පෙ- පඤ්චපි බලානි -පෙ- සත්තපි බොජ්ඣඞ්ගා භාවනා පාරිපූරිං ගච්ඡන්ති, ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවයතො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතො චත්තාරොපි සතිපට්ඨානා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. චත්තාරොපි සම්මප්පධානා -පෙ- චත්තාරොපි ඉද්ධිපාද -පෙ- පඤ්චපි ඉන්ද්‍රියානි -පෙ- පඤ්චපි බලානි -පෙ- සත්තපි බොජ්ඣඞ්ගා භාවනා පාරිපූරිං ගච්ඡන්තීති.

## 1. 14. 29–32

## මෙඝසුත්තානි

207–210 සෙය්‍යථාපි භික්ඛවෙ, ගිම්හානං පච්ඡිමෙ මාසෙ උග්ගතං[1] රජොජල්ලං. තමෙනං මහාඅකාලමෙඝො ඨානසො අන්තරධාපෙති වූපසමෙති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති වූපසමෙති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති, වූපසමෙති; ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති–පෙ– සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරධාපෙති, වූපසමෙතීති.

## 1. 14. 33–36

## දුතියමෙඝසුත්තානි

211-214. සෙය්‍යථාපි භික්ඛවෙ, උප්පන්නං මහාමෙඝං, තමෙනං මහාවාතො අන්තරායෙව අන්තරධාපෙති වූපසමෙති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ

1. උපහත, - අට්ඨකථා.

මහණෙනි, එසෙයින් ම අරිඅටඟිමඟ වඩන අරිඅටඟිමඟ බහුල කරන මහණහුගේ සතරසතිපට්ඨානයෝත් භාවනායෙන් පිරිපුන් බවට යෙති. සතරසම්මප්පධානයෝත් භාවනායෙන් පිරිපුන් බවට යෙති. සතරඍද්ධිපාදයෝත් භාවනායෙන් පිරිපුන් බවට යෙති. පඤ්ච ඉන්ද්‍රියයෝත් භාවනායෙන් පිරිපුන් බවට යෙති. පඤ්ච බලයෝත් භාවනායෙන් පිරිපුන් බවට යෙති. සත්ත බොජ්ඣඞ්ගයෝත් භාවනායෙන් පිරිපුන් බවට යෙති. මහණෙනි, කෙසේ නම් අරි-අටඟිමඟ වඩන අරිඅටඟිමඟ බහුල කරන මහණහුගේ සතර සති-පට්ඨානයෝත් භාවනායෙන් පිරිපුන් බවට යෙත් ද, සතර සම්මප්ප-ධානයෝත් ... සතර ඉද්ධිපාදයෝත් ... පඤ්ච ඉන්ද්‍රියයෝත් ... පඤ්ච බලයෝත් ... සත්ත බොජ්ඣඞ්ගයෝත් භාවනායෙන් පිරීමට යෙත් ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට නැමුණු සම්මාදිට්ඨිය වඩයි ... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ අරිඅටඟිමග වඩන අරිඅටඟිමඟ බහුල කරන මහණහුගේ සතර සතිපට්ඨානයෝත් භාවනායෙන් පිරිපුන් බවට යෙති. සතර සම්මප්ප-ධානයෝත් ... සතර ඉද්ධිපාදයෝත් ... පඤ්ච ඉන්ද්‍රියයෝත් ... පඤ්ච බලයෝත් ... සත්ත බොජ්ඣඞ්ගයෝත් භාවනායෙන් පිරීමට යෙති යි.

## 1. 14. 29-32

## මේඝසූත්‍ර

207-210. මහණෙනි, යම් සේ ග්‍රීෂ්ම ඍතුයෙහි පැසුළුමස (ඇසළමස) උඩට නැගුණු ඒ මේ රජස්දල්ල මහත් නොකල්වැස්-සෙක් සහමුලින් අතුරුදන් කෙරේ ද, සන්හිඳුවා ද; මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ අරිඅටඟිමග වඩන්නේ අරිඅටඟිමග බහුල කරන්නේ උපනුපන් ලාමක අකුසල් සහමුලින් අතුරුදන් කෙරෙයි. සන්හිඳුවයි. මහණෙනි, කෙසේ නම් මහණ අරිඅටඟිමග වඩන්නේ අරිඅටඟිමග බහුල කරන්නේ උපනුපන් ලාමක අකුසල් දහම් සහමුලින් අතුරුදන් කෙරේ ද, සන්හිඳුවා ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ විවේක-නිඃසිත විරාගනිඃසිත නිරෝධනිඃසිත වොස්සග්ගපරිණාමී සම්මාදිට්ඨිය වඩයි ... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමග වඩන්නේ අරිඅටඟිමග බහුල කරන්නේ උපනුපන් ලාමක අකුසල් දහම් සහමුලින් අතුරුදන් කෙරේ, සන්හිඳුවා යයි.

## 1. 14. 33-36

## දුතියමේඝසූත්‍ර

211-214. මහණෙනි, යම්සේ උපන් ඒ මේ මහාමේඝය මහා වාතය අතරමඟ ම අතුරුදන් කෙරේ ද, සන්හිඳුවා ද, මහණෙනි, එසෙයින් ම මහණතෙමේ අරිඅටඟිමග වඩන්නේ අරිඅටඟිමග බහුල කරන්නේ උපනුපන් ලාමක අකුසල දහම් අතරමග ම අතුරුදන් කෙරෙයි. සන්හිඳුවයි. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ අරිඅටඟිමග වඩන්නේ අරිඅටඟිමග බහුල කරන්නේ උපනුපන් ලාමක අකුසල් දහම්

අන්තරායෙව අන්තරධාපෙති, වූපසමෙති. කථඤ්ච භික්ඛවෙ භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ අන්තරායෙව අන්තරධාපෙති, වූපසමෙති; ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ අන්තරායෙව අන්තරධාපෙති වූපසමෙතීති.

## 1. 14. 37-40

### නාවාසුත්තානි

215-218. සෙය්‍යථාපි භික්ඛවෙ, සාමුද්දිකාය නාවාය වෙත්තබන්ධන බද්ධාය ඡම්මාසානි උදකෙ පරියාතාය[1] හෙමන්තිකෙන ථලං[2] උක්ඛිත්තාය වාතාතපපරෙතානි බන්ධනානි තානි පාවුස්සකෙන මෙඝෙන අභිප්පවුට්ඨානි[3] අප්පකසිරෙන පටිප්පස්සම්භන්ති[4]. පූතිකානි භවන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවයතො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතො අප්පකසිරෙනෙව සංයොජනානි පටිප්පස්සම්භන්ති. පූතිකානි භවන්ති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛුනො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවයතො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතො අප්පකසිරෙනෙව සංයොජනානි පටිප්පස්සම්භන්ති[4] පූතිකානි භවන්ති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛුනො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවයතො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතො අප්පකසිරෙනෙව සංයොජනානි පටිප්පස්සම්භන්ති පූතිකානි භවන්තීති.

## 1. 14. 41-44

### ආගන්තුකසුත්තානි

219-222 සෙය්‍යථාපි භික්ඛවෙ, ආගන්තුකාගාරං, තත්‍ථ පුරත්ථිමාය[5] දිසාය ආගන්ත්වා වාසං කප්පෙන්ති. පච්ඡිමාය දිසාය ආගන්ත්වා වාසං කප්පෙන්ති. උත්තරාය දිසාය ආගන්ත්වා වාසං කප්පෙන්ති. දක්ඛිණාය දිසාය ආගන්ත්වා වාසං කප්පෙන්ති. ඛත්තියාපි ආගන්ත්වා වාසං කප්පෙන්ති. බ්‍රාහ්මණාපි ආගන්ත්වා වාසං කප්පෙන්ති. වෙස්සාපි ආගන්ත්වා වාසං කප්පෙන්ති. සුද්දාපි ආගන්ත්වා වාසං කප්පෙන්ති.

1. පරියාදය - මජ්ඣං, සයා, සීමු.
2. ථලෙ - සි 1. 2.
3. අභිප්පබද්ධානි සි 1, 2.
4. පටිප්පස්සමෙහන්ති 1, 2.
5. පුරත්ථිමායපි - මජ්ඣං සයා.

අතරමග ම අතුරුදන් කෙරේ ද, සන්හිඳුවා ද යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු සම්මාදිට්ඨිය වඩයි ... සම්මා සමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ උපනුපන් ලාමක අකුසල්දහම් අතරමග ම අතුරුදන් කෙරෙයි. සන්හිඳුවා යයි.

## 1. 14. 37-40

### නාවාසූත්‍ර

215-218. මහණෙනි, වේවැල්බැඳුමෙන් බඳනා ලද සමසක් මුළුල්ලෙහි දියෙහි ඔබ්බොබ ගමන් කළ හේමන්තවාතයෙන් ගොඩ නගන ලද මුහුදෙහි වූ නැවක් පිළිබඳ අව්‍යුළඟින් ඔඩනා ලද (යම්) බන්ධනයෝ වෙත් ද ඔහු වැසිකල්හි වූ වැස්සෙන් හාත්පසින් තෙමුණාහු නිතැතින් ම යම්සේ ලිහෙද්ද කුණුවූවාහු වෙත් ද, මහණෙනි, එසෙයින් ම අරිඅටඟිමඟ වඩන අරිඅටඟිමඟ බහුල කරන මහණහුගේ සංයෝජනයෝ නිදුකින් ම සන්හිඳෙත්. ක්‍ෂය වෙත්. මහණෙනි, කෙසේ නම් අරිඅටඟිමඟ වඩන අරිඅටඟිමඟ බහුල කරන මහණහුගේ සංයෝජනයෝ නිදුකින් ම සන්හිඳෙද්ද ක්‍ෂය වූවාහු වෙද්ද යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙනසුල්ලක් කොට සම්‍යක්-දෘෂ්ටිය වඩයි... සම්‍යක් සමාධිය වඩයි. මහණෙනි, මෙසේ අරිඅටඟිමඟ වඩන අරිඅටඟිමඟ බහුල කරන මහණහුගේ සංයෝජනයෝ නිදුකින් ම සන්හිඳෙත් ක්ෂය වූවාහු වෙති යී.

## 1. 14. 41-44

### ආගන්තුකසූත්‍ර

219-222. මහණෙනි, ආගන්තුක ගෘහය යම්සේ ද, එහි පෙරදිගින් ද අවුත් වාස කෙරෙති. පැළදිගින් ද අවුත් වාස කෙරෙති. උතුරු දිගින් ද අවුත් වාස කෙරෙති. දකුණුදිගින් ද අවුත් වාස කෙරෙති. ක්‍ෂත්‍රියයෝ ද අවුත් වාස කෙරෙති. බ්‍රාහ්මණයෝ ද අවුත් වාස කෙරෙති. වෛශ්‍යයෝ ද අවුත් වාස කෙරෙති ශුද්‍රයෝ ද අවුත් වාස කෙරෙත්.

මහණෙනි, එපරිද්දෙන් ම මහණ අරිඅටඟිමඟ වඩන්නේ අරිඅටඟිමඟ බහුල කරන්නේ යම් දහම් කෙනෙක් වෙසෙස් නුවණින් පිරිසිඳ දත යුතු වෙත් නම් ඒ දහම් වෙසෙස්නුවණින් පිරිසිඳ දනී. යම් දහම් කෙනෙක් වෙසෙස් නුවණින් ප්‍රහාණය කටයුතු වෙත් නම් ඒ දහම් වෙසෙස්නුවණින් ප්‍රහාණය කරයි. යම් දහම් කෙනෙක් වෙසෙස් නුවණින් පසක් කළ යුතු වෙත් නම් ඒ දහම් වෙසෙස් නුවණින් පසක්කෙරෙයි. යම් දහම් කෙනෙක් වෙසෙස් නුවණින් වැඩිය යුතු වෙත් නම් ඒ දහම් වෙසෙස් නුවණින් වඩයි.

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො යෙ ධම්මා අභිඤ්ඤා[1] පරිඤ්ඤෙය්‍යා තෙ ධම්මෙ අභිඤ්ඤා පරිජානාති. යෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා පජහති. යෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා සච්ඡිකරොති. යෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා භාවෙති.

කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා[1] පරිඤ්ඤෙය්‍යා: පඤ්චුපාදානක්ඛන්ධාතිස්ස වචනීයා. කතමෙ පඤ්ච, සෙය්‍යථීදං: රූපුපාදානක්ඛන්ධො –පෙ– විඤ්ඤාණුපාදානක්ඛන්ධො. ඉමෙ ඛො භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා. කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා පහාතබ්බා: අවිජ්ජා ච භවතණ්හා ච. ඉමෙ භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා පහාතබ්බා. කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා: විජ්ජා ච විමුත්ති ච, ඉමෙ භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා. කතමෙ ච භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා: සමථො ච විපස්සනා ච. ඉමෙ භික්ඛවෙ, ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො. යෙ ධම්මා අභිඤ්ඤා පරිඤ්ඤෙය්‍යා, තෙ ධම්මෙ අභිඤ්ඤා පරිජානාති –පෙ– යෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා භාවෙති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති –පෙ– සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො, යෙ ධම්මා අභිඤ්ඤා[1] පරිඤ්ඤෙය්‍යා, තෙ ධම්මෙ අභිඤ්ඤා පරිජානාති. යෙ ධම්මා අභිඤ්ඤා පහාතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා පජහති. යෙ ධම්මා අභිඤ්ඤා සච්ඡිකාතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා සච්ඡිකරොති. යෙ ධම්මා අභිඤ්ඤා භාවෙතබ්බා, තෙ ධම්මෙ අභිඤ්ඤා භාවෙතීති.

## 1. 14. 45–48

## නදීසුත්තානි

223–226. සෙය්‍යථාපි භික්ඛවෙ ගඞ්ගා නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. අථ මහාජනකායො ආගච්ඡෙය්‍ය, කුද්දාලපිටකං ආදාය මයං ඉමං ගඞ්ගානදිං[2] පච්ඡානින්නං කරිස්සාම පච්ඡාපොණං පච්ඡාපබ්භාරන්ති. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො මහාජනකායො තං ගඞ්ගානදිං පච්ඡානින්නං කරෙය්‍ය පච්ඡාපොණං පච්ඡාපබ්භාරන්ති? නො හෙතං භන්තෙ, තං කිස්ස හෙතු? ගඞ්ගා භන්තෙ, නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා, සා න සුකරා පච්ඡානින්නං කාතුං පච්ඡාපොණං පච්ඡාපබ්භාරං. යාවදෙව ච පන සො මහාජනකායො කිලමථස්ස විඝාතස්ස භාගී අස්සාති.

---

1. අභිවිඤ්ඤෙය්‍යා – සී 2.
2. ගඞ්ගං නදිං – මජ්ඣං පය්‍යා.

මහණෙනි, කවර දහම් කෙනෙක් වෙසෙස්නුවණින් පිරිසිඳ දත යුත්තාහු ද: පඤ්චොපාදනස්කන්ධ යයි කිය යුතු වෙයි. කවර පසෙක් ද යත්: රූපොපාදනස්කන්ධය ... විඥානොපාදනස්කන්ධ යි. මහණෙනි, මේ දහම්හු වෙසෙස්නුවණින් පිරිසිඳ දත යුත්තාහු ය මහණෙනි කවර දහම් කෙනෙක් වෙසෙස්නුවණින් ප්‍රහාණයකට යුත්තාහු ද: අවිද්‍යාවත් භවතෘෂ්ණාවත් ය. මහණෙනි, මේ දහම්හු වෙසෙස්නුවණින් ප්‍රහාණය කළ යුත්තාහු ය. මහණෙනි, කවර දහම් කෙනෙක් වෙසෙස්නුවණින් පසක්කළ යුත්තාහු ද: විද්‍යාවත් විමුක්තියත් ය. මහණෙනි, මේ දහම්හු වෙසෙස්නුවණින් පසක්කළ යුත්තාහු ය. මහණෙනි, කවර දහම් කෙනෙක් වෙසෙස්නුවණින් වැඩිය යුත්තාහු ද: සමථයත් විදර්‍ශනාවත් ය. මහණෙනි, මේ දහම්හු වෙසෙස් නුවණින් වැඩිය යුත්තාහු ය. මහණෙනි, කෙසේ නම් මහණ අරීඅටඟිමඟ වඩන්නේ අරීඅටඟිමඟ බහුල කරන්නේ යම් දහම් කෙනෙක් වෙසෙස්නුවණින් පිරිසිඳ දත යුතු වෙත් නම් ඒ දහම් වෙසෙස්නුවණින් පිරිසිඳ දනී ද... යම් දහම් කෙනෙක් වෙසෙස්නුවණින් වැඩිය යුතු වෙත් නම් ඒ දහම් වෙසෙස්නුවණින් වඩා ද යත්: මහණෙනි, මෙහි මහණ විවෙකනිඃසිත විරාගනිඃසිත වොෂ්සඟගාපරිණාමී කොට සම්‍යග්-දිට්ඨිය වඩයි ... සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරීඅටඟිමඟ වඩන්නේ අරීඅටඟිමඟ බහුල කරන්නේ යම් දහම් කෙනෙක් වෙසෙස්නුවණින් පිරිසිඳ දත යුතු වෙත් නම් ඒ දහම් වෙසෙස්නුවණින් පිරිසිඳ දනී. යම් දහම් කෙනෙක් වෙසෙස් නුවණින් ප්‍රහාණය කළ යුතු වෙත් නම් ඒ දහම් වෙසෙස්නුවණින් ප්‍රහාණය කරයි. යම් දහම් කෙනෙක් වෙසෙස්නුවණින් පසක්කළ යුතු වෙත් නම් ඒ දහම් වෙසෙස්නුවණින් පසක් කෙරෙයි. යම් දහම් කෙනෙක් වෙසෙස් නුවණින් වැඩිය යුතු වෙත් නම් ඒ දහම් වෙසෙස් නුවණින් වඩා යි.

## 1. 14. 45-48

## නදීසූත්‍ර

223-226. මහණෙනි, යම්සේ ගඞ්ගානදිය පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, ඉදින් මහා ජනසමූහයෙක් උදලුපැහි රැගෙන අපි මේ ගඞ්ගානදිය පැළදිගට නැමුණක් පැළදිගට නැඹුරු වූවක් පැළදිගට බර වූවක් කරන්නෙමු යි එන්නේ ද, මහණෙනි, ඒ කිමැ යි හඟිවූ ද, ඒ මහාජනසමූහයා ඒ ගඞ්ගානදිය පැළදිගට නැමුණක් පැළදිගට නැඹුරු වූවක් පැළදිගට බර වූවක් කරන්නේ ද? වහන්ස, එය නො වේ ම ය. ඒ කවර හෙයින යත්: වහන්ස, ගඞ්ගානදිය පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා ය. ඒ ගඟ පැළදිගට නැමුණක් පැළදිගට නැඹුරු වූවක් පැළදිගට බර වූවක් කරන්නට පහසු නො වෙයි. ඒ මහාජනසමූහයා හුදෙක් විඩාවට පෙළීමට භාජන වන්නේ යයි.

එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුං[1] අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තං[2] අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තං[3] රාජානො වා රාජමහාමත්තා වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා භොගෙහි අභිහට්ඨුං පවාරෙය්‍යුං. එහම්භො[4] පුරිස, කිං තෙ ඉමෙ කාසාවා අනුදහන්ති. කිං මුණ්ඩො කපාලමනුසඤ්චරසි. එහි. හීනායාවත්තිත්වා භොගෙ ච භුඤ්ජස්සු. පුඤ්ඤානි ච කරොහී ති. සො වත භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තෙය්‍යාති[5]. නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු: යං හි තං භික්ඛවෙ, චිත්තං දීඝරත්තං විවෙකනින්නං විවෙකපොණං විවෙකපබ්භාරං. තං වත හීනායාවත්තිස්සතීති නෙතං ඨානං විජ්ජති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොතීති.

(යථා බලසුත්තානි සබ්බානි තථා විත්ථාරෙතබ්බානි.)

## බලකරණීයවග්ගො චුද්දසමො.

**තස්සුද්දානං:**

බලං බීජං ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකිනා
ආකාසෙන ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදී ති.

1. භික්ඛු - සිමු. සී 1, 2.
2. භාවෙන්තො - සිමු, සී 1, 2.
3. බහුලීකරොන්තො - සිමු, සී 1, 2.
4. එවම්භො - සිමු සී 1, 2.
5. හීනායාවත්තිස්සතීති - මජසං, සයා,

මහණෙනි, එසේයින්ම අරිඅටඟිමඟ වඩන අරිඅටඟිමඟ බහුල කරන මහණහු රජවරු හෝ රජමහඇමතියෝ හෝ මිතුරෝ හෝ සහචරයෝ හෝ නෑයෝ හෝ සහලේ නෑයෝ හෝ එම්බල පුරුෂය, "එව මේ කහවත් කුමකට තා විසින් හඳිනු (දරනු) ලැබේ ද? කිම මුඩු වැ කබලෙකින් යුක්ත ව හැසිරෙහි ද? එව ගිහිබවට පෙරළී භෝගයන් ද අනුභව කරව පින් ද කරව"යි භෝගයෙන් එළවා පවරන්නාහු නම් මහණෙනි, අරිඅටඟිමඟ වඩන අරිඅටඟිමඟ බහුල කරන ඒ මහණ තෙමේ ඒකාන්තයෙන් ශික්‍ෂා ප්‍රතික්‍ෂේප කොට ගිහිබවට පෙරළෙන්නේ ය යන මෙකරුණ නැත්තේ ය. ඊට හේතු කිම? මහණෙනි, යම් හෙයෙකින් ඒ සිත බොහෝ කලක් විවේකයට නැමුණේ විවේකයට නැඹුරු වූයේ විවේකයට බර වූයේ වේ නම් ඒ සිත ඒකාන්තයෙන් ලාමකබවට පෙරළෙන්නේ ය යන මෙකරුණ නැත්තේ ම ය. මහණෙනි, කෙසේ නම් මහණ අරිඅටඟිමඟ වඩා ද, අරිඅටඟිමඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධ-නිඃසිත වොස්සග්ගපරිණාමි වූ සම්මාදිට්ඨිය වඩයි ... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මෙසේ මහණ අරිඅටඟිමඟ වඩයි. අරිඅටඟිමඟ බහුල කෙරේ යි.

(බලසූත්‍ර මෙන් සියලුසූත්‍ර විස්තර කටයුතු යි.)

**තුදුස්වැනි බලකරණීයවර්ගය යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාස යි චතුෂ්ක සතෙකි. මෙඝසූත්‍ර චතුෂ්ක දෙකෙකි. නාවා ආගන්තුක නදී යි චතුෂ්ක තුනෙකි. (සූත්‍ර මුළුල්ල අටසාළිසකි).

# 15. එසනාවග්ගො

## 1. 15. 1

### එසනාසුත්තං

227. තිස්සො ඉමා භික්ඛවෙ එසනා. කතමා තිස්සො: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො එසනා. ඉමාසං ඛො භික්ඛවෙ තිස්සන්නං එසනානං අභිඤ්ඤාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො. ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමාසං ඛො භික්ඛවෙ තිස්සන්නං එසනානං අභිඤ්ඤාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.*

## 1. 15. 2

### දුතිය එසනාසුත්තං

228. තිස්සො ඉමා ඛො භික්ඛවෙ එසනා. කතමා තිස්සො: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො එසනා. ඉමාසං ඛො භික්ඛවෙ තිස්සන්නං එසනානං අභිඤ්ඤාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති රාගවිනයපරියොසානං දොසවිනයපරියොසානං මොහවිනය-පරියොසානං. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං අභිඤ්ඤාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 15. 3

### තතිය එසනාසුත්තං

229. තිස්සො ඉමා ඛො භික්ඛවෙ එසනා. කතමා තිස්සො: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො එසනා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං අභිඤ්ඤාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති, අමතොගධං අමතපරායණං අමතපරියොසානං. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං අභිඤ්ඤාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

* ඉතො පරං දිස්සමානානි එසනාසුත්තානි සීහළපොත්ථකෙසු න දිස්සන්ති.

# 15. ඒසනාවර්ගය

## 1. 15. 1

## ඒසනාසූත්‍රය

227. මහණෙනි, මේ එසනා (-සෙවුම්) තුනෙකි. කවර තුනෙක යත්: කාමෙසනා (-කම්සැප සෙවුම්) භවෙසනා (-භවසෙවුම්) බ්‍රහ්මචරියෙසනා (-මිසදිටු බඹසර සෙවුම්) යි. මහණෙනි, මේ එසනා තුන යි. මහණෙනි, මේ එසනා තුන වෙසෙසින් දැනීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතුයි. කවර අරිඅටඟිමඟෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවෙකනිශ්‍රිත විරාගනිශ්‍රිත නිරොධනිශ්‍රිත ව්‍යවසර්ගයට නැඹුරු වූ සම්‍යග්දෘෂ්ටිය වඩයි ... සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මේ එසනා තුන පිරිසිඳ දැනීම පිණිස මේ අරි-අටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 2

## දුතිය ඒසනාසූත්‍රය

228. මහණෙනි, මේ ඒසනා තුනෙකි. කවර තුනෙක යත්: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා යි. මහණෙනි, මේ එසනා තුනයි. මහණෙනි, මේ එසනා තුන වෙසෙසින් දැනීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු යි. කවර අරිඅටඟිමඟෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ රාගය දුරලීමේ කෙළවර කොට ද්වෙෂය දුරලීමේ කෙළවර කොට මොහය දුරලීමේ කෙළවර කොට සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි මේ එසනා තුන වෙසෙසින් දැනීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 3

## තතිය ඒසනාසූත්‍රය

229. මහණෙනි, මේ ඒසනා තුනෙකි. කවර තුනෙක යත්: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා යි. මහණෙනි, මොහු තුන් ඒසනාවෝ යි. මහණෙනි, මේ තුන් ඒසනාවන් වෙසෙසින් දැනීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු යි. කවර අරිඅටඟිමඟෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ නිවනට ඇතුළත් වූවක් නිවන පිහිට කොට ඇත්තක් නිවන කෙළවර කොට ඇත්තක් කොට සම්මා-දිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ තුන් එසානාවන් වෙසෙසින් දැනීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 4

## චතුත්ථ එසනාසුත්තං

230. තිස්සො ඉමා භික්ඛවෙ, එසනා. කතමා තිස්සො: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. ඉමා ඛො භික්ඛවෙ, තිස්සො එසනා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං අභිඤ්ඤාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං අභිඤ්ඤාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 15. 5–8

## 5–8 එසනාසුත්තානි

231–234. තිස්සො ඉමා භික්ඛවෙ, එසනා. කතමා තිස්සො: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. ඉමා ඛො භික්ඛවෙ, තිස්සො එසනා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං පරිඤ්ඤාය -පෙ- අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

(යථා අභිඤ්ඤාවාරො තථා විත්ථාරෙතබ්බා.)

## 1. 15. 9–12

## 9–12 එසනාසුත්තානි

235–238. තිස්සො භික්ඛවෙ, එසනා. කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. ඉමා ඛො භික්ඛවෙ, තිස්සො එසනා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං පරික්ඛයාය -පෙ- අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

(යථා අභිඤ්ඤාවාරො තථා විත්ථාරෙතබ්බා.)

## 1. 15. 13–16

## 13–16 එසනාසුත්තානි

239–242. තිස්සො ඉමා භික්ඛවෙ, එසනා, කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. ඉමා ඛො භික්ඛවෙ, තිස්සො එසනා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති. -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

(යථා අභිඤ්ඤාවාරො තථා විත්ථාරෙතබ්බා.)

## 1. 15. 4

## චතුත්ථ එසනාසූත්‍රය

230. මහණෙනි, මේ එසනා තුනෙකි. කවර තුනෙක යත්: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා යි. මහණෙනි, මොහු තුන් එසනාවෝ යි. මහණෙනි, මේ තුන් එසනාවන් පිරිසිඳ දැනීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ නිවනට නැමුණු නිවනට නැඹුරු වූ නිවනට බර වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ තුන් එසනාවන් වෙසෙසින් දැනීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 5-8

## 5-8. එසනාසූත්‍ර

231-234. මහණෙනි, මේ එසනා තුනෙකි. කවර තුනෙක යත්: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා යි. මහණෙනි, මොහු තුන් එසනාවෝ යි. මහණෙනි, මේ තුන් එසනාවන් පිරිසිඳ දැනීම පිණිස... මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

(අභිඤ්ඤාවාරය මෙන් විස්තර කටයුතු)

## 1. 15. 9-12

## 9-12. එසනාසූත්‍ර

235-238. මහණෙනි, මේ එසනා තුනෙකි. කවර තුනෙක යත්: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා යි. මහණෙනි, මොහු තුන් එසනාවෝ යි. මහණෙනි, මේ තුන් එසනාවන් ක්‍ෂය කිරීම පිණිස... මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

(අභිඤ්ඤාවාරය මෙන් විතර කටයුතු)

## 1. 15. 13-16

## 13-16. එසනාසූත්‍ර

239-242. මහණෙනි, මේ එසනා තුනෙකි. කවර තුනෙක යත්: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා යි. මහණෙනි, මොහු තුන් එසනාවෝ යි. මහණෙනි, මේ තුන් එසනාවන් පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමි වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ තුන් එසනාවන් පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 17–32

### විධාසුත්තානි

243–258. තිස්සො ඉමා භික්ඛවෙ, විධා. කතමා තිස්සො: ‘‘සෙය්‍යො හමස්මී’’ති විධා, ‘‘සදිසො හමස්මී’’ති විධා, ‘‘හීනො හමස්මී’’ති විධා. ඉමා ඛො භික්ඛවෙ, තිස්සො විධා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං විධානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො, භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති –පෙ– සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං විධානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

(යථා එසනාසුත්තානි තථා විත්ථාරෙතබ්බානි.)

## 1. 15. 33–48

### ආසවසුත්තානි

259–274. තයො මෙ භික්ඛවෙ, ආසවා. කතමෙ තයො: කාමාසවො භවාසවො අවිජ්ජාසවො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො ආසවා. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං ආසවානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො? ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති –පෙ– සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං ආසවානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 15. 49–64

### භවසුත්තානි

275–290. තයො මෙ භික්ඛවෙ, භවා. කතමෙ තයො: කාමභවො රූපභවො අරූපභවො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො භවා. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං භවානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං –පෙ– සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං භවානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 15. 17-32

### විධාසූත්‍ර

243-258. මහණෙනි, මේ විධා (-මාන) තුනෙකි. කවර තුනෙක යත්: "මම ශ්‍රේෂ්ඨයෙමි"යි මානයෙකි. "මම සදෘශයෙමි"යි මානයෙකි. "මම හීනයෙමි"යි මානයෙකි. මහණෙනි, මේ මාන-තුනයි. මහණෙනි, මේ මාන තුන වෙසෙසින් දැනීම පිණිස... පිරිසිඳ දැනීම පිණිස ... ක්‍ෂය කිරීම පිණිස ... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත ව්‍යොසසග්ගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි ... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ මාන කොටස් තුන වෙසෙසින් දැනීම පිණිස පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

(එසනා සුතුරු මෙන් විතර කටයුතු)

## 1. 13. 33-48

### ආසවසූත්‍ර

259-274 මහණෙනි, මේ ආස්‍රව තුනෙකි. කවර තුනෙක යත්: කාමාස්‍රව භවාස්‍රව අවිද්‍යාස්‍රව යි. මහණෙනි, මේ ආස්‍රව තුන යි. මහණෙනි, මේ ආස්‍රව තුන වෙසෙසින් දැනීම පිණිස ... පිරිසිඳ දැනීම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ විවෙක-නිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත ව්‍යොසසග්ගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි මහණෙනි, මේ ආස්‍රව තුන වෙසෙසින් දැනීම පිණිස... පිරිසිඳ දැනීම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 49-64

### භවසූත්‍ර

275-294. මහණෙනි, මේ භව තුනෙකි. කවර තුනෙක යත්: කාමභව රූපභව අරූපභව යි. මහණෙනි, මේ භව තුන යි. මහණෙනි, මේ භවත්‍රය වෙසෙසින් දැනීම පිණිස... පිරිසිඳ දැනීම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත ව්‍යොසසග්ගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ භවත්‍රය වෙසෙසින් දැනීම පිණිස.. පිරිසිඳ දැනීම පිණිස... ගෙවීම පිණිස... පැහුම් පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 65–80

### දුක්ඛතාසුත්තානි

291–306. තිස්සො ඉමා භික්ඛවෙ, දුක්ඛතා. කතමා තිස්සො: දුක්ඛදුක්ඛතා සඞ්ඛාරදුක්ඛතා විපරිණාමදුක්ඛතා. ඉමා ඛො භික්ඛවෙ, තිස්සො දුක්ඛතා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං දුක්ඛතානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති –පෙ– සම්මාසමාධිං භාවෙති. විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං දුක්ඛතානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 15. 81–96

### ඛිලසුත්තානි

307–322. තයොමෙ භික්ඛවෙ, ඛිලා. කතමෙ තයො: රාගො ඛිලො දොසො ඛිලො මොහො ඛිලො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො ඛිලා. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං ඛිලානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති –පෙ– සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං ඛිලානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 14. 97–112

### මලසුත්තානි

323–338. තීණිමානි භික්ඛවෙ, මලානි. කතමානි තීණි: රාගො මලං. දොසො මලං. මොහො මලං. ඉමානි ඛො භික්ඛවෙ, තීණි මලානි. ඉමෙසං භික්ඛවෙ, තිණ්ණන්නං මලානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති –පෙ– සම්මාසමාධිං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං මලානං අභිඤ්ඤාය –පෙ– පරිඤ්ඤාය –පෙ– පරික්ඛයාය –පෙ– පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 15. 65–80

## දුක්ඛතාසූත්‍ර

291–306. මහණෙනි, මේ දුක්ඛතා (දුක්බැව්) තුනෙකි. කවර තුනෙක යත්: දුක්ඛදුක්ඛතා සංඛාරදුක්ඛතා විපරිණාමදුක්ඛතා යි. මහණෙනි, මේ දුක්ඛතා තුන යි. මහණෙනි, මේ ත්‍රිවිධ දුඃඛතාවන්ගේ වෙසෙස් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු යි. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවෙකනිඃසෘත විරාගනිඃසෘත නිරොධනිඃසෘත වොසසගපරිණාමී සම්මාදිට්ඨිය වඩයි... සම්මා සමාධිය වඩයි. මහණෙනි, මේ ත්‍රිවිධ දුඃඛතාවන්ගේ වෙසෙස් දැනුම් පිණිස... පිරිසිඳ දැනුම් පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 81–96

## ඛිලසූත්‍ර

307–322. මහණෙනි, මේ ඛිල (හුල්) තුනෙකි. කවර තුනෙක යත්: රාගඛිල දෙසඛිල මොහඛිල යි. මහණෙනි, මේ ඛිල තුන යි. මහණෙනි, මේ ත්‍රිවිධ ඛිලයන්ගේ වෙසෙස් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස.. පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු යි. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිඃසෘත විරාගනිඃසෘත නිරොධනිඃසෘත වොසසගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ ත්‍රිවිධ ඛිලයන්ගේ වෙසෙස් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස.. පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 97–112

## මලසූත්‍ර

323–338. මහණෙනි, මේ මල (කිලිටි) තුනෙකි. කවර තුනෙක යත්: රාගමල යැ දෙසමල යැ මොහමල යැ යි. මහණෙනි, මේ මල තුන යි. මහණෙනි, මේ මල තුන වෙසෙසින් දැනීම පිණිස... පිරිසිඳ දැනීම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු යි. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිඃසෘත විරාගනිඃසෘත නිරොධනිඃසෘත වොසසගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි. සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ තුන්මල් වෙසෙසින් දැනීම පිණිස... පිරිසිඳ දැනීම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 113–128

### නීඝසුත්තානි

339–354. තයොමෙ භික්ඛවෙ, නීඝා[1]. කතමෙ තයො: රාගො නීඝො දොසො නීඝො. මොහො නීඝො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො නීඝා. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං නීඝානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති. විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං නීඝානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 15. 129–144

### වෙදනාසුත්තානි

355–370. තිස්සො ඉමා භික්ඛවෙ, වෙදනා. කතමා තිස්සො: සුඛා වෙදනා. දුක්ඛා වෙදනා. අදුක්ඛමසුඛා වෙදනා. ඉමා ඛො භික්ඛවෙ, තිස්සො වෙදනා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං වෙදනානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං වෙදනානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 15. 145–160

### තණ්හාසුත්තානි

371–386. තිස්සො ඉමා භික්ඛවෙ, තණ්හා. කතමා තිස්සො: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා. ඉමා ඛො භික්ඛවෙ, තිස්සො තණ්හා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං තණ්හානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං තණ්හානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

(යථා එසනාසුත්තානි තථා සබ්බං විත්ථාරෙතබ්බං)

**එසනාවග්ගො පණ්ණරසමො.**

**තත්‍රුද්දානං:**

එසනා විධා ආසවා භවා දුක්ඛතා ච තිස්සො
ඛීලා මලානි නීඝා ච වෙදනාහි තණ්හාහි චාති.

1. නීඝා – සයා.

## 1. 15. 113-128

### නීඝසූත්‍ර

339-354. මහණෙනි, මේ නීඝ (දුක්) තුනෙකි. කවර තුනෙක යත්: රාගනීඝ, දෙසනීඝ, මොහනීඝ යි. මහණෙනි, මේ නීඝ තුන යි. මහණෙනි, මේ නීඝතුන වෙසෙසන් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමග වැඩිය යුතු. කවර අරිඅටඟිමගෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ නීඝතුන වෙසෙසින් දැනුම පිණිස.. පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස.. මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 129-144

### වෙදනාසූත්‍ර

355-370 මහණෙනි, මේ වෙදනා තුනෙකි. කවර තුනෙක යත් සුවවෙදනා දුක්වෙදනා නොදුක්නොසුවවෙදනා යි. මහණෙනි, මොහු තුන් වෙදනාවෝ යි. මහණෙනි, මේ තුන් වෙදනාවන් වෙසෙසින් ... පිණිස... පිරිසිඳ දැනුම පිණිස.. ගෙවීම පිණිස.. පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමගෙක යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවේකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ තුන් වෙදනාවන් වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස.. ගෙවීම පිණිස... පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 15. 145-160

### තණ්හාසූත්‍ර

371-386. මහණෙනි, මේ තණ්හා තුනෙකි. කවර තුනෙක යත්: කාමතණ්හා භවතණ්හා විභවතණ්හා යි. මහණෙනි, මොහු තුන් තණ්හාවෝ යි. මහණෙනි, මේ තුන් තණ්හාවන් වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමගෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ තුන් තණ්හාවන් වෙසෙසින් දැනීම පිණිස... පිරිසිඳ දැනීම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

(ඒසනා සූත්‍ර මෙන් සියල්ල විතර කටයුතු)

**පසළොස්වැනි ඒසනාවර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

එසනා විධා, ආසව, භව, ත්‍රිවිධ දුක්ඛතා, ඛිල, මල, නීඝ, වෙදනා, තණ්හා යී ෂොඩසක දශයෙකි. හෙවත් සූත්‍ර එක්සිය සැටෙකි යි.

# 16. ඔඝවග්ගො

## 1. 16. 1–16

### ඔඝසුත්තානි

387–402. චත්තාරොමෙ භික්ඛවෙ, ඔඝා. කතමෙ චත්තාරො: කාමොඝො භවොඝො දිට්ඨොඝො අවිජ්ජොඝො. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඔඝා. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඔඝානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඔඝානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

(යථා එසනා සොළසසුත්තන්තානි තථා විත්ථාරෙතබ්බානි.)

## 1. 16. 17–32

### යොගසුත්තානි

403–418. චත්තාරොමෙ භික්ඛවෙ, යොගා. කතමෙ චත්තාරො: කාමයොගො භවයොගො දිට්ඨියොගො අවිජ්ජායොගො. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො යොගා. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං යොගානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං යොගානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 16. 33–48

### උපාදානසුත්තානි

419–434. චත්තාරිමානි භික්ඛවෙ, උපාදානානි, කතමානි චත්තාරි කාමුපාදානං දිට්ඨුපාදානං සීලබ්බතුපාදානං අත්තවාදුපාදානං. ඉමානි ඛො භික්ඛවෙ, චත්තාරි උපාදානානි. ඉමෙසං ඛො භික්ඛවෙ චතුන්නං උපාදානානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං උපාදානානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

# 16. ඔඝ වර්ගය

## 1. 16. 1-16

### ඔඝ සූත්‍ර

387-402. මහණෙනි, මේ ඔඝ (සැඩදියපහර) සතරෙකි. කවර සතරෙක යත්: කාමෞඝ (කාමගුණයන්හි දැඩි රාගය) භවෞඝ (රූපාරූපභවයන්හි දැඩිරාගය) දිට්ඨෞඝ (දෙසැටදිටු) අවිජ්ජෞඝය. මහණෙනි, මොහු සිවු ඔඝයෝ යි. මහණෙනි, මේ සිවුඔඝයන්ගේ වෙසෙස් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ සිවු ඔඝයන් වෙසෙසින් දැනීම පිණිස... පිරිසිඳ දැනීම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

(එසනාසූත්‍ර මෙන් සොළොස් සූත්‍රාන්ත විතරකටයුතුයි.)

## 1. 16. 17-32

### යොග සූත්‍ර

403-418. මහණෙනි, මේ යොග (යෙදීම්) සතරෙකි. කවර සතරෙක යත්: කාමයොග භවයොග දිට්ඨියොග අවිජ්ජායොග යි. මහණෙනි, මේ යෝග සතර යි. මහණෙනි, මේ යෝග සතර වෙසෙසින් දැනීම පිණිස... පිරිසිඳ දැනීම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ සිවු යෝගයන් වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස.. ගෙවීම පිණිස.. පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 16. 33-48

### උපාදාන සූත්‍ර

419-434. මහණෙනි, මේ උපාදාන (දැඩි ගැනුම්) සතරෙකි. කවර සතරෙක යත්: කාමූපාදාන දිට්ඨූපාදාන, සීලබ්බතූපාදාන, අත්තවාදූපාදාන යි. මහණෙනි, මේ උපාදාන සතර යි. මහණෙනි, මේ උපාදාන සතර වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ සිවු උපාදානයන් වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 16. 49-64

### ගන්ථසුත්තානි

435-450. චත්තාරොමෙ භික්ඛවෙ, ගන්ථා. කතමෙ චත්තාරො: අභිජ්ඣා කායගන්ථො ව්‍යාපාදො කායගන්ථො සීලබ්බතපරාමාසො කායගන්ථො ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ගන්ථා. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ගන්ථානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ගන්ථානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 16. 65-80

### අනුසයසුත්තානි

351-466. සත්තිමෙ භික්ඛවෙ, අනුසයා. කතමෙ සත්ත: කාමරාගානුසයො පටිඝානුසයො දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො මානානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො. ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත අනුසයා. ඉමෙසං ඛො භික්ඛවෙ, සත්තන්නං අනුසයානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, සත්තන්නං අනුසයානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 16. 81-96

### කාමගුණසුත්තානි

467-482. පඤ්චිමෙ භික්ඛවෙ, කාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච කාමගුණා. ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං කාමගුණානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං කාමගුණානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 16. 49–64

### ගන්ථ සූත්‍ර

435–450. මහණෙනි, මේ ගණ්ඨ (ගෙතීම්) සතරෙකි. කවර සතරෙක යත්: අභිජ්ඣාකායගණ්ඨ ව්‍යාපාදකායගණ්ඨ සීලබ්බතපරාමාස-කායගණ්ඨ ඉදංසච්චාභිනිවෙසකායගණ්ඨ යි. මහණෙනි, මේ ගණ්ඨ සතර යි. මහණෙනි, මේ ගණ්ඨසතර වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී කොට සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ සිවු ග්‍රන්ථයන් වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 16. 65–80

### අනුසය සූත්‍ර

451–466. මහණෙනි, මේ අනුසය (නිදිගත්කෙලෙස්) සතෙකි. කවර සතෙක යත්: කාමරාගානුසය පටිඝානුසය දිට්ඨානුසය විචිකිච්ඡානු-සය මානානුසය භවරාගානුසය අවිජ්ජානුසය යි. මහණෙනි, මොහු සත් අනුසයයෝ යි. මහණෙනි, මේ සත් අනුසයයන් වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී කොට සම්මාදිට්ඨිය වඩයි.. සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ සත් අනුසයයන් වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 16. 81–96

### කාමගුණ සූත්‍ර

467–482. මහණෙනි, මේ කාමගුණ පසෙකි. කවර පසෙක යත්: ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමොපසංහිත වූ රජනීය වූ ඇසින් දතයුතු රූපයෝ ය... කනින් දතයුතු ශබ්දයෝ ය... නැහැයෙන් දතයුතු ගන්ධයෝ ය.. දිවින් දතයුතු රසයෝ ය ඉෂ්ට වූ කාන්ත වූ මනවඩන ප්‍රියස්වභාව වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු ස්පර්ශයෝ යි. මහණෙනි, මොහු පස්කම් ගුණයෝ යි. මහණෙනි, මේ පස්කම් ගුණයන් වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ගෙවීම පිණිස... ප්‍රහාණය පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී කොට සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ පස්කම් ගුණයන් වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස.. ගෙවීම පිණිස... පැහීම පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 16, 97-112

## නීවරණසුත්තානි

483-498. පඤ්චිමානි භික්ඛවෙ, නීවරණානි. කතමානි පඤ්ච: කාමච්ඡන්දනීවරණං ව්‍යාපාදනීවරණං ථීනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්ච නීවරණානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං නීවරණානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ පඤ්චන්නං නීවරණානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 16. 113-128

## උපාදානක්ඛන්ධසුත්තානි

499-514. පඤ්චිමෙ භික්ඛවෙ, උපාදානක්ඛන්ධා. කතමෙ පඤ්ච: රූපූපාදානක්ඛන්ධො වෙදනූපාදානක්ඛන්ධො සඤ්ඤූපාදානක්ඛන්ධො සඞ්ඛාරූපාදානක්ඛන්ධො විඤ්ඤාණූපාදානක්ඛන්ධො. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්චුපාදානක්ඛන්ධා. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 16. 129-144

## ඔරම්භාගියසංයොජනසුත්තානි

515-530. පඤ්චිමානි භික්ඛවෙ, ඔරම්භාගියානි සංයොජනානි. කතමානි පඤ්ච: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො කාමච්ඡන්දො ව්‍යාපාදො. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චොරම්භාගියානි සංයොජනානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

## 1. 16. 97–112

## නීවරණ සූත්‍ර

483–498. මහණෙනි, මේ නීවරණ පසෙකි. කවර පසෙක යත්: කාමච්ඡන්දනීවරණ ය ව්‍යාපාදනීවරණ ය ථීනමිද්ධනීවරණ ය උද්ධච්චකුක්කුච්චනීවරණ ය විචිකිච්ඡානීවරණ ය යි. මහණෙනි, මේ නීවරණ පස යි. මහණෙනි, මේ නීවරණ පස වෙසෙසින් දනීම පිණිස... පිරිසිඳ දනීම පිණිස... ගෙවීම පිණිස.. පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිඝ්‍රිත විරාගනිඝ්‍රිත නිරොධනිඝ්‍රිත වොස්සග්ගපරිණාමී කොට සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ නීවරණ පස වෙසෙසින් දනුම පිණිස... පිරිසිඳ දනුම පිණිස.. ක්‍ෂය කරන පිණිස... ප්‍රහාණය පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 16. 113–128

## උපාදනස්කන්ධ සූත්‍ර

499–514. මහණෙනි, මේ උපාදනස්කන්ධ පසෙකි. කවර පසෙක යත්: රූපූපාදනස්කන්ධය වෙදනූපාදනස්කන්ධය සඤ්ඤූපාදනස්කන්ධය සඞ්ඛාරූපාදනස්කන්ධය විඤ්ඤාණූපාදනස්කන්ධ යි. මහණෙනි, මේ උපාදනස්කන්ධ පස යි. මහණෙනි, මේ උපාදනස්කන්ධ පස වෙසෙසින් දනීම පිණිස.. පිරිසිඳ දනීම පිණිස .. ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට නමාවූ සම්මාදිට්ඨිය වඩයි... සම්මා-සමාධිය වඩයි. මහණෙනි, මේ උපාදනස්කන්ධ පස වෙසෙසින් දනුම පිණිස... පිරිසිඳ දනුම පිණිස .. ක්‍ෂය කරන පිණිස... ප්‍රහාණය පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 16. 129–144

## ඕරම්භාගියසංයොජනසූත්‍ර

515-530. මහණෙනි, මේ ඕරම්භාගිය සංයොජන පසෙකි. කවර පසෙක යත්: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස කාමච්ඡන්ද ව්‍යාපාද යි. මහණෙනි, මේ ඕරම්භාගිය සංයොජන පස යි. මහණෙනි, මේ ඕරම්භාගිය සංයොජන පස වෙසෙසින් දනුම පිණිස.. පිරිසිඳ දනුම පිණිස... ගෙවීම පිණිස... පැහීම පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට නැමුණු සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ ඕරම්භාගිය සංයොජන පස වෙසෙසින් දනුම පිණිස... පිරිසිඳ දනුම පිණිස... ක්‍ෂය කරනු පිණිස.. ප්‍රහාණය පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

## 1. 16. 145-160

## උද්ධම්භාගියසංයොජනසුත්තානි

531-546. පඤ්චිමානි භික්ඛවෙ, උද්ධම්භාගියානි සංයොජනානි. කතමානි පඤ්ච: රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බො. කතමො අරියො අට්ඨඞ්ගිකො මග්ගො: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං අභිඤ්ඤාය -පෙ- පරිඤ්ඤාය -පෙ- පරික්ඛයාය -පෙ- පහානාය අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවෙතබ්බොති.

(යථා එසනා සුත්තන්තා තථා සබ්බෙසු පෙය්‍යාලෙසු සොළස සොළස සුත්තන්තා විත්ථාරෙතබ්බා.)

**ඔඝවග්ගො සොළසමො.**

**තත්‍රුද්දානං:**

ඔඝා යොගා උපාදානා ගන්ථා අනුසයාපි ච
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධම්භාගියාති.

**මග්ගසංයුත්තං සමත්තං.**

**තත්‍ර වග්ගුද්දානං:**

අවිජ්ජා වග්ගො පඨමො දුතියො විහාරො වුච්චති.
මිච්ඡත්තවග්ගො තතියො චතුත්ථො පටිපත්ති ච.
අඤ්ඤතිත්ථියා පඤ්චමො ඡට්ඨො සුරියපෙය්‍යාලො,
එකධම්මා දුවෙ ගඞ්ගා පෙය්‍යාලාපි ච චත්තාරො.
අප්පමාදෙ තෙළසමො බලවග්ගො ච චුද්දසො,
එසනා පණ්ණරසමො ඔඝවග්ගො සොළසමොති.

# 1. 16. 145–160

## උද්ධම්භාගියසංයෝජනසූත්‍ර

531–546. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පසෙකි. කවර පසෙක් ද යත්: රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යි. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පසයි. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පස වෙසෙසින් දැනුම පිණිස... පිරිසිඳ දැනුම පිණිස... ක්‍ෂය කරනු පිණිස ... ප්‍රහාණය පිණිස අරිඅටඟිමඟ වැඩිය යුතු. කවර අරිඅටඟිමඟෙක් ද යත්: මහණෙනි, මෙසස්නෙහි සමණ විවෙකනිඃශ්‍රිත වූ විරාගනිඃශ්‍රිත වූ නිරොධනිඃශ්‍රිත වූ නිර්වාණයට නම්‍ය වූ සම්මාදිට්ඨිය වඩයි... සම්මාසමාධිය වඩයි. මහණෙනි, මේ පඤ්චඋද්ධම්භාගිය සංයොජනයන්ගේ අභිඥාව පිණිස... පරිඥාව පිණිස ක්‍ෂය කරන පිණිස... ප්‍රහාණය පිණිස මේ අරිඅටඟිමඟ වැඩිය යුත්තේ යි.

(එසනා සූත්‍ර මෙන් සිසලු පෙයාලයන්හි සූත්‍ර සොළස සොළස විතර කටයුතු යි.)

## සොළොස් වැනි ඕඝවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

**ඕඝ, යොග, උපාදාන, ගන්‍ථ, අනුසය. කාමගුණ, නීවරණ, ඛන්‍ධ, ඕරම්භාගිය, උද්ධම්භාගිය යි කොඩසක දශයෙකි. සූත්‍ර එක්සිය සැටෙකි යි.**

## මග්ගසංයුත්තය නිමියේ යි.

**එහි වර්ගනාමාවලිය:**

පළමුවැන්න අවිජ්ජාවර්ගය යි. දෙවැන්න විහාරවර්ගය යි කියනු ලැබේ. තෙවැන්න මිච්ඡත්තවර්ගය යි. සිවුවැන්න පටිපත්ති වර්ගය යි. පස්වැන්න අඤ්ඤතිත්ථියවර්ගය යි. සවැන්න සූරියපෙයාල යි. එකධම්මවර්ග දෙකෙකි. ගඞ්ගාපෙයාල ද සතරෙකි. තෙළෙස්වැන්න අප්පමාදවර්ගය යි. තුදුස්වැන්න බලකරණීයවර්ගය යි. පසළොස්වැන්න එසනාවර්ගය යි. සොළොස්වැන්න ඕඝවර්ගය යි.

# 2. බොජ්ඣඞ්ගසංයුත්තං

## 1. පබ්බතවග්ගො

### 2. 1. 1

### හිමවන්තසුත්තං

547. සාවත්ථියං:

හිමවන්තං භික්ඛවෙ, පබ්බතරාජානං[1] නිස්සාය නාගා කායං වඩ්ඪෙන්ති බලං ගාහෙන්ති. තෙ තත්ථ කායං වඩ්ඪෙත්වා බලං ගාහෙත්වා කුසුබ්භෙ ඔතරන්ති. කුසුබ්භෙ ඔතරිත්වා මහාසොබ්භෙ ඔතරන්ති. මහාසොබ්භෙ ඔතරිත්වා කුන්නදියො ඔතරන්ති. කුන්නදියො ඔතරිත්වා මහානදියො ඔතරන්ති. මහානදියො ඔතරිත්වා මහාසමුද්දං සාගරං ඔතරන්ති. තෙ තත්ථ මහන්තත්තං වෙපුල්ලත්තං ආපජ්ජන්ති කායෙන. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය සත්තබොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්තබොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණාති ධම්මෙසු.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය සත්තබොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්තබොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණාති ධම්මෙසු: ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. විරියසම්බොජ්ඣඞ්ගං භාවෙති. විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සමාධිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය සත්තබොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්තබොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණාති ධම්මෙසූති.

### 2. 1. 2

### කායසුත්තං

548. සාවත්ථියං:

සෙය්‍යථාපි භික්ඛවෙ, අයං කායො ආහාරට්ඨිතිකො ආහාරං පටිච්ච තිට්ඨති, අනාහාරො නො තිට්ඨති. එවමෙව ඛො භික්ඛවෙ, පඤ්ච නීවරණා ආහාරට්ඨිතිකා ආහාරං පටිච්ච තිට්ඨන්ති, අනාහාරා නො තිට්ඨන්ති.

කො ච භික්ඛවෙ ආහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස උප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය. අත්ථි භික්ඛවෙ සුභනිමිත්තං. තත්ථ අයොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස උප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය.

1. පබ්බතරාජං - සී 1, ස්‍යා

# 2. බොජ්ඣඞ්ග සංයුත්තය

## 1. පබ්බත වර්ගය

### 2. 1. 1

### හිමවන්තසූත්‍රය

547. සැවැත්නුවර:

මහණෙනි, හිමවත් පවුරජ නිසා නාගයෝ කය වඩත්, බල ගන්වත්. ඔහු එහි කය වඩා, බල ගන්වා කුඩා හෙබ්වලට බසිති. කුඩා හෙබ්වලට බැස මහ හෙබ්වලට බසිති. මහ හෙබ්වලට බැස කුඩා ගඞගාවලට බසිති. කුඩා ගඞගාවලට බැස මහ ගඞගාවලට බසිති. මහ ගඞගාවලට බැස මහමුහුදට සයුරට බසිති. ඔහු එහි කයින් මහත්භවයට විපුලත්වයට පැමිණෙත්. මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා සප්තබොධ්‍යඞගයන් වඩන්නේ සප්තබොධ්‍යඞගයන් බහුල කරන්නේ දහම්හි ලා මහත්භවයට විපුලත්වයට පැමිණේ.

මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා සප්තබොධ්‍යඞගයන් වඩන්නේ සප්තබොධ්‍යඞගයන් බහුල කරන්නේ දහම්හි ලා මහත්භවයට විපුලත්වයට පැමිණේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකනිඃසිත වූ විරාගනිඃසිත වූ නිරොධනිඃසිත වූ වොස්සග්ගපරිණාමී වූ සතිසම්බොජ්ඣඞගය වඩයි. විවේකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී වූ ධම්මවිචයසම්බොජ්ඣඞගය වඩයි. විවේකනිඃසිත විරාගනිඃසිත නිරොධ නිඃසිත වොස්සග්ගපරිණාමී වූ විරියසම්බොජ්ඣඞගය වඩයි. විවේක නිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී වූ පීතිසම්බොජ්ඣඞගය වඩයි. විවේකනිඃසිත විරාගනිඃසිත නිරොධ-නිඃසිත වොස්සග්ගපරිණාමී වූ පස්සද්ධිසම්බොජ්ඣඞගය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිවනට නැමුණු සමාධිසම්බොජ්ඣඞගය වඩයි. විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරොධය ඇසුරු කළ නිවනට නැමුණු උපෙක්ඛා සම්බොජ්ඣඞගය වඩයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා සත්බොජ්ඣඞ වඩන්නේ සත්බොජ්ඣඞ බහුල කරන්නේ දහම්හි ලා මහත්භවයට විපුලත්වයට පැමිණේ යී.

### 2. 1. 2

### කායසූත්‍රය

548. සැවැත්නුවර:

මහණෙනි, යම්සේ ආහාර ප්‍රත්‍යයෙන් සිටුනා මේ කය අහර නිසා පවතී ද, අහර නැති ව නො පවතී ද, මහණෙනි, එසෙයින් ම ආහාරප්‍රත්‍යයෙන් සිටුනා පඤ්ච නීවරණයෝ අහර නිසා පවතිත්, අහර නැති ව නො පවතිත්.

මහණෙනි, නූපන් කාමච්ඡන්දය ඉපදීම පිණිස ද උපන් කාමච්ඡන්දයාගේ බහුල බව විපුල බව පිණිස ද ප්‍රත්‍යය කවරේ ද යත්: මහණෙනි, ශුභනිමිත්තයක් ඇත. එහි ලා නුනුවණින් මෙනෙහි කිරීමෙක් බහුල කිරීමෙක් වේ ද නූපන් කාමච්ඡන්දය ඉපදීම පිණිසත්, උපන් කාමච්ඡන්දය බොහෝ වීම පිණිසත් විපුලත්වය පිණිසත් මේ ප්‍රත්‍යය යි.

කො ච භික්ඛවෙ ආහාරො අනුප්පන්නස්ස වා බ්‍යාපාදස්ස උප්පාදාය උප්පන්නස්ස වා බ්‍යාපාදස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය; අත්ථි භික්ඛවෙ, පටිඝනිමිත්තං. තත්ථ අයොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා බ්‍යාපාදස්ස උප්පාදාය උප්පන්නස්ස වා බ්‍යාපාදස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ ආහාරො අනුප්පන්නස්ස වා ථීනමිද්ධස්ස උප්පාදාය, උප්පන්නස්ස වා ථීනමිද්ධස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය; අත්ථි භික්ඛවෙ අරති තන්දී විජම්භිකා භත්තසම්මදො චෙතසො ලීනත්තං. තත්ථ අයොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා ථීනමිද්ධස්ස උප්පාදාය උප්පන්නස්ස වා ථීනමිද්ධස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය.

අත්ථි භික්ඛවෙ ආහාරො අනුප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස උප්පාදාය උප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය. අත්ථි භික්ඛවෙ චෙතසො අවූපසමො. තත්ථ අයොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස උප්පාදාය උප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ ආහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය උප්පාදාය උප්පන්නාය වා විචිකිච්ඡාය භිය්‍යොභාවාය වෙපුල්ලාය? අත්ථි භික්ඛවෙ විචිකිච්ඡාඨානීයා ධම්මා. තත්ථ අයොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය උප්පාදාය උප්පන්නාය වා විචිකිච්ඡාය භිය්‍යොභාවාය වෙපුල්ලාය. සෙය්‍යථාපි භික්ඛවෙ, අයං කායො ආහාරට්ඨිතිකො ආහාරං පටිච්ච තිට්ඨති. අනාහාරො නො තිට්ඨති. එවමෙව ඛො භික්ඛවෙ ඉමෙ පඤ්ච නීවරණා ආහාරට්ඨිතිකා ආහාරං පටිච්ච තිට්ඨන්ති. අනාහාරා නො තිට්ඨන්ති.

සෙය්‍යථාපි භික්ඛවෙ අයං කායො ආහාරට්ඨිතිකො, ආහාරං පටිච්ච තිට්ඨති, අනාහාරො නො තිට්ඨති. එවමෙව ඛො භික්ඛවෙ සත්ත බොජ්ඣඞ්ගා ආහාරට්ඨිතිකා ආහාරං පටිච්ච තිට්ඨන්ති. අනාහාරා නො තිට්ඨන්ති. කො ච භික්ඛවෙ ආහාරො අනුප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා අත්ථි භික්ඛවෙ සතිසම්බොජ්ඣඞ්ගට්ඨානීයා ධම්මා. තත්ථ යොනිසොමනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා.

කො ච භික්ඛවෙ ආහාරො අනුප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා: අත්ථි භික්ඛවෙ කුසලාකුසලා ධම්මා, සාවජ්ජානවජ්ජා ධම්මා හීනප්පණීතා ධම්මා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා. තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා.

මහණෙනි, නූපන් ව්‍යාපාදය ඉපදීම පිණිසත් උපන් ව්‍යාපාදයාගේ බහුල බව විපුල බව පිණිසත් ප්‍රත්‍යය කවරේ ද යත්: මහණෙනි, ප්‍රතිඝනිමිත්තෙක් ඇත. එහි ලා නුනුවණින් මෙනෙහි කිරීමෙක් බහුල කිරීමෙක් වේ ද, නූපන් ව්‍යාපාදය ඉපදීම පිණිසත් උපන් ව්‍යාපාදයේ බොහෝ බව විපුලත්වය පිණිසත් මේ ප්‍රත්‍යය යි.

මහණෙනි, නූපන් ථීනමිද්ධය ඉපදීම පිණිසත් උපන් ථීනමිද්ධයාගේ බහුල බව විපුලත්වය පිණිසත් ප්‍රත්‍යය කවරේ ද යත්: මහණෙනි (ප්‍රාන්තාසෙනාසනයන්හි හා අධිකුශල) ධර්මයන්හි නො ඇල්මෙක් නෙමරීයෙක් (මැලිබවෙක්) මැලි හැරීමෙක් (කායවිජ්‍රම්භණයෙක්) බත්මතයෙක් සිතේ මැලිබවෙක් ඇත. එහි ලා නුනුවණින් මෙනෙහි කිරීමෙක් බහුල කිරීමෙක් වේ ද, නූපන් ථීනමිද්ධය ඉපදීම පිණිසත් උපන් ථීනමිද්ධයාගේ බොහෝ බව විපුලත්වය පිණිසත් මේ ප්‍රත්‍යය යි.

මහණෙනි, නූපන් උද්ධච්චකුක්කුච්චය ඉපදීමටත් උපන් උද්ධච්ච-කුක්කුච්චයාගේ බොහෝබවටත් විපුලත්වයටත් ප්‍රත්‍යය කවරේ ද යත්: මහණෙනි, සිතේ නො සන්හිඳුමෙක් ඇත. එහි ලා නුනුවණින් මෙනෙහි කිරීමෙක් බහුල කිරීමෙක් වේ ද, නූපන් උද්ධච්චකුක්කුච්ච-යාගේ ඉපදීමටත් උපන් උද්ධච්චකුක්කුච්චයාගේ බොහෝ බවටත් විපුලත්වයටත් මේ ප්‍රත්‍යය යි.

මහණෙනි, නූපන් විචිකිච්ඡාව ඉපදීමටත් උපන් විචිකිච්ඡාවගේ බොහෝ බවටත් විපුලත්වයටත් ප්‍රත්‍යය කවරේ ද යත්: මහණෙනි, විචිකිච්ඡාවට හිත වූ ධර්මයෝ ඇතියහ. එහි ලා නුනුවණින් මෙනෙහි කිරීමෙක් බහුල කිරීමෙක් වේ ද, නූපන් විචිකිච්ඡාව ඉපදීමටත් උපන් විචිකිච්ඡාවෙ බොහෝ බවටත් විපුලත්වයටත් මේ ප්‍රත්‍යය යි. මහණෙනි, යම්සේ මේ කය ප්‍රත්‍යයසපීතික වේ ද ප්‍රත්‍යය නිසා පවතී ද, ප්‍රත්‍යය නැති ව නො පවති ද, මහණෙනි, එසෙයින් ම මේ පඤ්ච නීවරණයෝ ප්‍රත්‍යයසපීතිකයහ. ප්‍රත්‍යය නිසා පවතිත්, ප්‍රත්‍යය නැතිව නො පවතිත්.

මහණෙනි, යම්සේ මේ කය ප්‍රත්‍යයසපීතික වේ ද, ප්‍රත්‍යය නිසා පවතී ද, ප්‍රත්‍යය නැති ව නො පවතී ද, මහණෙනි, එසෙයින් ම සප්ත බොජ්ඣඞ්ගයෝ ප්‍රත්‍යයසපීතිකයහ, ප්‍රත්‍යය නිසා පවතිත්. ප්‍රත්‍යය නැති ව නො පවතිත්. මහණෙනි, නූපන් සතිසම්බොජ්ඣඞ්ගය ඉපදීමටත් උපන් සතිසම්බොජ්ඣඞ්ගය වැඩීමටත් පිරීමටත් ප්‍රත්‍යය කවරේ ද යත්: මහණෙනි, සතිසම්බොජ්ඣඞ්ගයට හිත වූ ධර්මයෝ ඇතියහ. එහි ලා නුවණින් මෙනෙහි කිරීමෙක් බහුල කිරීමෙක් වේ ද නූපන් සතිසම්බොජ්ඣඞ්ගය ඉපදීමටත් උපන් සතිසම්බොජ්ඣයාගේ වැඩීමටත් පිරීමටත් මේ ප්‍රත්‍යය යි.

මහණෙනි, නූපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත් උපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමටත් පිරීමටත් ප්‍රත්‍යය කවරේ ද: මහණෙනි, කුශලාකුශලධර්මයෝ සාවද්‍යානවද්‍යධර්මයෝ හීනප්‍රණීතධර්මයෝ කෘෂ්ණශුක්ලසප්‍රතිභාගධර්මයෝ ඇතියහ. එහි ලා නුවණින් මෙනෙහි කිරීමෙක් බහුල කිරීමෙක් වේ ද, නූපන් ධම්මවිචය-සම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත් උපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමටත් පිරීමටත් මේ ප්‍රත්‍යය යි.

කො ච භික්ඛවෙ ආහාරො අනුප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා: අත්ථි භික්ඛවෙ, ආරම්භධාතු නික්කමධාතු පරක්කමධාතු, තත්ථ යොනිසොමනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා.

කො ච භික්ඛවෙ ආහාරො අනුප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා: අත්ථි භික්ඛවෙ පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා, තත්ථ යොනිසොමනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා.

කො ච භික්ඛවෙ ආහාරො අනුප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා: අත්ථි භික්ඛවෙ කායපස්සද්ධි, චිත්තපස්සද්ධි, තත්ථ යොනිසොමනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා: අත්ථි භික්ඛවෙ, සමථනිමිත්තං[1] අබ්‍යග්ගනිමිත්තං, තත්ථ යොනිසොමනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා: අත්ථි භික්ඛවෙ, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගට්ඨානියා[2] ධම්මා තත්ථ යොනිසොමනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරියා. සෙය්‍යථාපි භික්ඛවෙ, අයං කායො ආහාරට්ඨිතිකො ආහාරං පටිච්ච තිට්ඨති, අනාහාරො නො තිට්ඨති. එවමෙව ඛො භික්ඛවෙ, ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා ආහාරට්ඨිතිකා ආහාරං පටිච්ච තිට්ඨන්ති, අනාහාරා නො තිට්ඨන්තීති.

1. සමාධිනිමිත්තං – සතං.
2. බොජ්ඣඞ්ගට්ඨානියා – සතං.

මහණෙනි, නූපන් විරියසම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත් උපන් විරියසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමටත් පිරීමටත් ප්‍රත්‍යය කවරේ ද: මහණෙනි, පළමු ඇරඹුණු වීර්යයෙක්, මැලිබැවින් නික්මුණු වීර්යයෙක්, මතුමතු තැන් ඇක්මෙනා වීර්යයෙක් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් විරියසම්බොජ්ඣඞ්ගයේ ඉපැද්මටත් උපන් විරියසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමෙන් පිරීමටත් මේ ප්‍රත්‍යය යි.

මහණෙනි. නූපන් පීතිසම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත් උපන් පීතිසම්බොජ්ඣඞ්ගයේ වැඩීමටත් පිරීමටත් ප්‍රත්‍යය කවරේ ද: මහණෙනි, පීතිසම්බොජ්ඣඞ්ගයට හිත වූ ධර්මයෝ ඇතියහ. එහි ලා නුවණින් මෙනෙහි කිරීමෙක්, බහුල කිරීමෙක් වේ ද, නූපන් පීති සම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත් උපන් පීතිසම්බොජ්ඣඞ්ගයේ වැඩීමටත් පිරීමටත් මේ ප්‍රත්‍යය යි.

මහණෙනි, නූපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත් උපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමටත් පිරීමටත් ප්‍රත්‍යය කවරේ ද: (වේදනා සඤ්ඤා සඞ්ඛාර යන) නාම කයෙහි බර හැරීමෙක්, සිතෙහි බර හැරීමෙක් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත් උපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමටත් පිරීමටත් මේ ප්‍රත්‍යය යි.

මහණෙනි, නූපන් සමාධිසම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත් උපන් සමාධිසම්බොජ්ඣඞ්ගය වැඩීමටත් පිරීමටත් ප්‍රත්‍යය කවරේ ද: මහණෙනි, සමථනිමිත්තයෙක් එකාළම්බනනිමිත්තයෙක් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීමෙක් බහුල කිරීමෙක් වේ ද, නූපන් සමාධි-සම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත් උපන් සමාධිසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමටත් පිරීමටත් මේ ප්‍රත්‍යය යි.

මහණෙනි, නූපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත්, උපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමටත් පිරීමටත් ප්‍රත්‍යය කවරේ ද: මහණෙනි, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයට හිත වූ ධර්මයෝ ඇතියහ. එහි ලා නුවණින් මෙනෙහි කිරීමෙක් බහුල කිරීමෙක් වේ ද, නූපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයාගේ ඉපැද්මටත් උපන් උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගයාගේ වැඩීමටත් පිරීමටත් මේ ප්‍රත්‍යය යි. මහණෙනි, යම්සේ මේ කය ප්‍රත්‍යයසපීතික වේ ද, ප්‍රත්‍යය නිසා පවතී ද, ප්‍රත්‍යය නැති ව නො පවතී ද, මහණෙනි, එසෙයින් ම මේ සප්ත බොධ්‍යඞ්ගයෝ ප්‍රත්‍යයසපීතිකයහ. ප්‍රත්‍යය නිසා පවතිත්. ප්‍රත්‍යය නැති ව නො පවතිත් යි.



Free Distribution www.aathaapi.org

## 2. 1. 3

## සීලසුත්තං

549. යෙ තෙ භික්ඛවෙ භික්ඛූ සීලසම්පන්නා සමාධිසම්පන්නා පඤ්ඤාසම්පන්නා විමුත්තිසම්පන්නා විමුත්තිඤාණදස්සනසම්පන්නා. දස්සනම්පහං[1] භික්ඛවෙ, තෙසං භික්ඛූනං බහුකාරං[2] වදමි. සවනම්පහං භික්ඛවෙ, තෙසං භික්ඛූනං බහුකාරං වදමි. උපසඞ්කමනම්පහං භික්ඛවෙ, තෙසං භික්ඛූනං බහුකාරං වදමි. පයිරුපාසනම්පහං භික්ඛවෙ, තෙසං භික්ඛූනං බහුකාරං වදමි, අනුස්සතිම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහුකාරං වදමි. අනුපබ්බජ්ජම්පහං භික්ඛවෙ තෙසං භික්ඛූනං බහුකාරං වදමි. තං කිස්ස හෙතු: තථාරූපානං භික්ඛවෙ භික්ඛූනං ධම්මං සුත්වා ද්වයෙන[3] වූපකට්ඨො විහරති කායවූපකාසෙන ච චිත්තවූපකාසෙන ච. සො තථා වූපකට්ඨො විහරන්තො තං ධම්මං අනුස්සරති අනුවිතක්කෙති.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු යථා[4] වූපකට්ඨො විහරන්තො තං ධම්මං අනුස්සරති අනුවිතක්කෙති. සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ තස්ස භික්ඛුනො ආරද්ධො හොති. සතිසම්බොජ්ඣඞ්ගං යස්මිං සමයෙ භික්ඛු භාවෙති, සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති. සො තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනති පවිචරති පරිවීමංසමාපජ්ජති.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු තථා සතො විහරන්තො තං ධම්මං පඤ්ඤාය පවිචිනති පවිචරති පරිවීමංසමාපජ්ජති, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ තස්ස භික්ඛුනො ආරද්ධො හොති. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගං යස්මිං සමයෙ භික්ඛු භාවෙති, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ තස්ස භික්ඛුනො භාවනා පාරිපූරිං ගච්ඡති. තස්ස තං ධම්මං පඤ්ඤාය පවිචිනතො පවිචරතො පරිවීමංසමාපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො තං ධම්මං පඤ්ඤාය පවිචිනතො පවිචරතො පරිවීමංසමාපජ්ජතො ආරද්ධං හොති විරියං අසල්ලීනං, විරියසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. විරියසම්බොජ්ඣඞ්ගං යස්මිං සමයෙ භික්ඛු භාවෙති, විරියසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනා පාරිපූරිං ගච්ඡති. ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො ආරද්ධවිරියස්ස උප්පජ්ජති පීති නිරාමිසා, පීතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. පීතිසම්බොජ්ඣඞ්ගං යස්මිං සමයෙ භික්ඛු භාවෙති, පීතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනා පාරිපූරිං ගච්ඡති. පීතිමනස්ස කායොපි පස්සම්භති චිත්තම්පි පස්සම්භති,

1. පාහං - මජසං.
2. බහුපකාරං - සයා.
3. ද්වයෙන වූපකාසෙන වූපකට්ඨා - මජසං.
4. තථා - මජසං, සයා.

## 2. 1. 3

## සීලසූත්‍රය

549. මහණෙනි, යම් ඒ භික්‍ෂු කෙනෙක් ශීලසම්පන්න වෙත් ද, සමාධිසම්පන්න වෙත් ද, ප්‍රඥාසම්පන්න වෙත් ද, විමුක්තිසම්පන්න වෙත් ද, විමුක්තිඥානදර්‍ශනසම්පන්න වෙත් ද, මහණෙනි, ඒ භික්ෂූන්ගේ දක්මත් බොහෝ උපකාර යැ යි මම කියමි. මහණෙනි, ඒ භික්ෂූන්ගේ (වදන්) ඇසීමත් බොහෝ උපකාර යැ යි මම කියමි. මහණෙනි, ඒ භික්ෂූන් වෙත එළඹීමත් බොහෝ උපකාර යැ යි මම කියමි. ඒ භික්ෂූන් ඇසුරු කිරීමත් බොහෝ උපකාර යැ යි මම කියමි. ඒ භික්ෂූන් සිහි කිරීමත් බොහෝ උපකාර යැ යි මම කියමි. ඒ භික්ෂූන් අනුව පැවිදිවීමත් බොහෝ උපකාර යැ යි මම කියමි. ඒ කවර හෙයින යත්: මහණෙනි, එබඳු භික්ෂූන්ගේ දහම් අසා කායවිවේකය චිත්තවිවේකය යන උභයවිවේකයෙන් යුතු වැ වෙසේ. හෙතෙමේ එසේ වෙන් ව වසන්නේ ඒ දහම සිහිකරයි, පුනපුනා සිතයි.

මහණෙනි, මහණ යම්කලෙක යම්සේ වෙන් ව වසන්නේ ඒ ධර්මය සිහි කෙරේ ද පුනපුනා සිතා ද එසමයෙහි ඒ මහණහු විසින් සතිසම්බොජ්ඣඞ්ගය පටන් ගන්නා ලද වෙයි. යම් කලෙක මහණ සතිසම්බොජ්ඣඞ්ගය වඩා ද එසමයෙහි මහණහුගේ සති-සම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. එසේ සිහි ඇති ව වෙසෙන්නේ ඒ දහම නුවණින් සොයයි. නුවණ හසුරුවයි. විමසීමට පැමිණේ.

මහණෙනි, මහණ යම්කලෙක එසේ සිහි ඇති ව වෙසෙන්නේ ඒ දහම නුවණින් සොයා ද, නුවණ හසුරුවා ද, විමසීමට පැමිණේ ද, එසමයෙහි ඒ මහණහු විසින් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය පටන්ගන්නා ලද වෙයි. මහණ යම් සමයක ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වඩා ද එසමයෙහි ඒ මහණහුගේ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. ඒ දහම නුවණින් සොයන නුවණ හසුරුවන විමසීමට පැමිණෙන ඔහුගේ වීර්‍ය්‍යය අරඹන ලද වෙයි, සංලීන නො වේ.

මහණෙනි, යම් කලෙක ඒ දහම නුවණින් සොයන නුවණ හසුරුවන විමසීමට පැමිණෙන මහණහුගේ වීර්‍ය්‍යය අරඹන ලද වේ ද අසංලීන වේ ද, එසමයෙහි මහණ වීරියසම්බොජ්ඣඞ්ගය වඩා ද එසමයෙහි මහණහුගේ වීරියසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. ඇරඹූ වැර ඇත්තහුට නිරාමිෂ ප්‍රීතිය උපදී.

මහණෙනි, යම් කලෙක ඇරඹූ වැර ඇති මහණහුට නිරාමිස ප්‍රීතිය උපදී ද එසමයෙහි මහණහු විසින් ප්‍රීතිසම්බොජ්ඣඞ්ගය අරඹන ලද වෙයි. යම් කලෙක මහණ තෙමේ පීතිසම්බොජ්ඣඞ්ගය වඩා ද එසමයෙහි මහණහුගේ පීතිසම්බොජ්ඣඞ්ගය භාවනායෙන් පිරීමට යේ. ප්‍රීත සිත් ඇත්තහුගේ නාම කයත් සැහැල්ලු වේ, සිතත් සැහැල්ලු වේ.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො පීතිමනස්ස කායොපි පස්සම්භති, චිත්තම්පි පස්සම්භති, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං යස්මිං[1] සමයෙ භික්ඛු භාවෙති, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනා පාරිපූරිං ගච්ඡති. පස්සද්ධකායස්ස සුඛං හොති සුඛිනො චිත්තං සමාධියති.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛුනො පස්සද්ධකායස්ස සුඛිනො චිත්තං සමාධියති, සමාධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. සමාධිසම්බොජ්ඣඞ්ගං යස්මිං සමයෙ භික්ඛු භාවෙති, සමාධිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනා පාරිපූරිං ගච්ඡති. සො තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති.

යස්මිං සමයෙ භික්ඛවෙ, භික්ඛු තථා සමාහිතං චිත්තං සාධුකං අජ්ඣුපෙක්ඛිතා හොති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො ආරද්ධො හොති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං යස්මිං සමයෙ භික්ඛු භාවෙති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භික්ඛුනො භාවනාපාරිපූරිං ගච්ඡති.

එවං භාවිතෙසු ඛො භික්ඛවෙ සත්තසු බොජ්ඣඞ්ගෙසු එවං බහුලීකතෙසු සත්ත ඵලා සත්තානිසංසා පාටිකඞ්ඛා. කතමෙ සත්ත ඵලා සත්තානිසංසා: දිට්ඨෙව ධම්මෙ පටිගච්ච[2] අඤ්ඤං ආරාධෙති. නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, අථ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති. නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, නො චෙ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති, අථ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති. නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, නො චෙ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති, නො චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති, අථ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා උපහච්ච පරිනිබ්බායී හොති. නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, නො චෙ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති, නො චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති, නො චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා උපහච්ච පරිනිබ්බායී හොති, අථ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අසංඛාරපරිනිබ්බායී හොති.

---

1. තස්මිං - මජසං, සයා.
2. පටිකච්ච - මජසං, සයා.

මහණෙනි, යම් කලෙක ප්‍රීති සිත් ඇති මහණහුගේ කයත් සැහැල්ලු වේ ද සිතත් සැහැල්ලු වේ ද එසමයෙහි මහණහු විසින් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය අරඹන ලද වෙයි. යම් කලෙක මහණ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වඩා ද එසමයෙහි මහණහුගේ පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගය භාවනායෙන් පිරීමට යේ. සැහැල්ලු කාය ඇතියහුට සුවය වේ. සුව ඇතියහුගේ සිත එකඟ වේ.

මහණෙනි, යම් සමයෙක සැහැල්ලු කය ඇති මහණහුගේ සිත එකඟ වේ ද එසමයෙහි මහණහු විසින් සමාධිසම්බොජ්ඣඞ්ගය අරඹන ලද වෙයි. යම් සමයෙක මහණ සමාධිසම්බොජ්ඣඞ්ගය වඩා ද එසමයෙහි මහණහුගේ සමාධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ. ඒ මහණ එසේ එකඟ වූ සිත මැනවින් මැදහත් ව බලන්නේ වෙයි.

මහණෙනි, යම් කලෙක මහණ එසේ එකඟ වූ සිත මනා කොට මැදහත් ව බලන්නේ වේ ද එසමයෙහි මහණහු විසින් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය අරඹන ලද වෙයි. යම් කලෙක මහණ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩා ද, එසමයෙහි මහණහුගේ උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමට යේ.

මහණෙනි, සප්ත බොජ්ඣඞ්ගයන් මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි සත් පල කෙනෙක් සත් අනුසස් කෙනෙක් කැමතිවිය යුතුහ. කවර සත් පල කෙනෙක් ද කවර සත් අනුසස් කෙනෙක් ද, යත්: දිටුදැමියෙහි ම මරණින් පෙර රහත්බව ලබයි. ඉදින් දිටුදැමියෙහි ම මරණින් පෙර රහත්බව නො ලබා නම් එකල්හි මැරෙන කළ රහත්බව ලබයි. ඉදින් දිටුදැමියෙහි ම මරණින් පෙර රහත්බව නො ලබා නම් ඉදින් මැරෙන කල රහත්බව නො ලබා නම් එකල්හි ඔරම්භාගිය සංයොජන පස ගෙවීමෙන් (බඹ ලොව ඉපිද ආයු අඩක් නො ගෙවා) අතර පිරිනිවෙනසුලු වෙයි. ඉදින් දිටුදැමියෙහි ම මරණින් පෙර රහත්බව නො ලබා නම් ඉදින් මැරෙනකල රහත්බව නො ලබා නම් ඉදින් ඔරම්භාගිය සංයොජන පස ගෙවීමෙන් අතර පිරිනිවෙනසුලු නො වේ නම් එකල්හි ඔරම්භාගිය සංයොජන පස ගෙවීමෙන් (බඹලොව ඉපද ආයු අඩක් ගෙවා කෙළවර) ළඟට පැමිණ පිරිනිවෙනසුලු වෙයි. ඉදින් දිටුදැමියෙහි ම මරණින් පෙර රහත්බව නො ලබා නම් ඉදින් මැරෙන කල රහත්බව නො ලබා නම් ඉදින් ඔරම්භාගිය සංයෝජන පස ගෙවීමෙන් අතර පිරිනිවෙනසුලු නො වේ නම්, ඉදින් ඔරම්භාගිය සංයෝජන පස ගෙවීමෙන් ආයු කෙළවර ළඟට පැමිණ පිරිනිවෙනසුලු නො වේ නම් එකල්හි ඔරම්භාගියසංයෝජන පස ගෙවීමෙන් උත්සාහරහිත ව පිරිනිවෙනසුලු වෙයි.

නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, නො චෙ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති, නො චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරා පරිනිබ්බායී හොති, නො චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා උපහච්ච පරිනිබ්බායී හොති, නො චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අසංඛාරපරිනිබ්බායී හොති, අථ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා සසංඛාරපරිනිබ්බායී හොති, නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, නො චෙ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති, නො චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අන්තරාපරිනිබ්බායී හොති, නො චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා උපහච්ච පරිනිබ්බායී හොති, නො චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා අසංඛාරපරිනිබ්බායී හොති, නො චෙ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා සසඞ්ඛාරපරිණිබ්බායී හොති. අථ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. එවං භාවිතෙසු ඛො භික්ඛවෙ, සත්තසු බොජ්ඣඞ්ගෙසු එවං බහුලීකතෙසු ඉමෙ සත්ත ඵලා සත්තානිසංසා පාටිකඞ්ඛාති.

## 2. 1. 4

## වත්ථසුත්තං

550. එකං සමයං ආයස්මා **සාරිපුත්තො** සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ.** තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි "ආවුසො භික්ඛවො"ති. "ආවුසො"ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං. ආයස්මා සාරිපුත්තො එතදවොච:

සත්තිමෙ ආවුසො, බොජ්ඣඞ්ගා කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගොති, ඉමෙ ඛො ආවුසො සත්තබොජ්ඣඞ්ගා. ඉමෙසං[1] ආවුසො, සත්තන්නං බොජ්ඣඞ්ගානං යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි පුබ්බන්හසමයං විහරිතුං. තෙන තෙන බොජ්ඣඞ්ගෙන පුබ්බන්හසමයං විහරාමි. යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි මජ්ඣන්තිකං[2] සමයං විහරිතුං, තෙන තෙන බොජ්ඣඞ්ගෙන මජ්ඣන්තිකං සමයං විහරාමි. යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි සායන්හසමයං විහරිතුං, තෙන තෙන බොජ්ඣඞ්ගෙන සායන්හසමයං විහරාමි.

1. ඉමෙසංඛ්වාහං - මජසං, සතා.
2. මජ්ඣණ්හිකං - මජසං.

ඉදින් දිටුදැමියෙහි ම මරණින් පෙර රහත්බව නො ලබා නම්, ඉදින් මැරෙන කල රහත්බව නො ලබා නම්, ඉදින් ඔරම්භාගිය සංයෝජන පස ගෙවීමෙන් අතර පිරිනිවෙනසුලු නො වේ නම්, ඉදින් ඔරම්භාගියසංයෝජන පස ගෙවීමෙන් ආයු කෙළවර ළඟට පැමිණ පිරිනිවෙනසුලු නො වේ නම්, ඉදින් ඔරම්භාගියසංයෝජන පස ගෙවීමෙන් උත්සාහ රහිත ව පිරිනිවෙනසුලු නො වේ නම්, එකල්හි ඔරම්භාගිය සංයෝජන පස ගෙවීමෙන් උත්සාහ සහිත ව පිරිනිවෙනසුලු වෙයි. ඉදින් දිටුදැමියෙහි ම මරණින් පෙර රහත් බව නො ලබා නම්, ඉදින් මැරෙන කල රහත්බව නො ලබා නම්, ඉදින් ඔරම්භාගිය සංයෝජන පස ගෙවීමෙන් අතර පිරිනිවෙනසුලු නො වේ නම්, ඉදින් ඔරම්භාගිය සංයෝජන පස ගෙවීමෙන් ආයු කෙළවර ළඟට පැමිණ පිරිනිවෙනසුලු නො වේ නම්, ඉදින් ඔරම්භාගියසංයෝජන පස ගෙවීමෙන් උත්සාහ රහිත ව පිරිනිවෙනසුලු නො වේ නම්, ඉදින් ඔරම්භාගිය සංයෝජන පස ගෙවීමෙන් උත්සාහ සහිත ව පිරිනිවෙනසුලු නො වේ නම්, එකල්හි ඔරම්භාගිය සංයෝජන පස ගෙවීමෙන් අකනිටා යනසුලු උද්ධංසොතයෙක් වෙයි. මහණෙනි, සප්තබොධ්‍යඞ්ගයන් මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි මේ සත් ඵලයෝ සත් අනුසස්හු කැමති විය යුත්තාහු යි.

## 2. 1. 4

## වත්ථසූත්‍රය

550. එක්කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඩුසිටුහුගේ අරමෙහි වැඩවෙසෙති. එහි දී ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ 'ඇවැත්නි' මහණෙනි, යි භික්ෂූන් ඇමතූහ. ඒ භික්ෂූහු 'ඇවැත්නි' යි ආයුෂ්මත් සැරියුත් තෙරණුවනට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මෙය වදාළහ:

"ඇවැත්නි, මේ බොජ්ඣඞ්ග සතෙකි. කවර සතෙක් ද යත්: සතිසම්බොජ්ඣඞ්ගය ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය විරියසම්බොජ්ඣඞ්ගය පීතිසම්බොජ්ඣඞ්ය පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය සමාධිසම්බොජ්ඣඞ්ගය උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය යි. මහණෙනි, මොහු සත් බොජ්ඣඞ්ගයෝ යි. ඇවැත්නි, මේ සත් බොජ්ඣඞ්ගයන් අතුරෙන් යම් යම් බොජ්ඣඞ්ග-යෙකින් යුතු ව පෙරවරු වසන්නට කැමැති වෙම් නම් ඒ ඒ බොජ්ඣඞ්ගයෙන් යුතු ව පෙරවරු වෙසෙමි. යම් යම් බොජ්ඣඞ්ගයෙකින් යුතු ව මැදියම වෙසෙන්නට කැමති වෙම් නම් ඒ ඒ බොජ්ඣඞ්ගයෙන් යුතු ව මැදියම වෙසෙමි. යම් යම් බොජ්ඣඞ්ගයෙකින් යුතු ව සවස් කල වසන්නට කැමැති වෙම් නම් ඒ ඒ බොජ්ඣඞ්ගයෙන් යුතු ව සවස් කල වෙසෙමි.

සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො, හොති අප්පමාණොති මෙ හොති. සුසමාරද්ධොති මෙ හොති. තිට්ඨන්තං[1] තිට්ඨතීති පජානාමි. සචෙපි මෙ චවති, ඉදප්පච්චයා මෙ චවතීති පජානාමි, -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො හොති. අප්පමාණොති මෙ හොති. සුසමාරද්ධොති මෙ හොති. තිට්ඨන්තං තිට්ඨතීති පජානාමි. සචෙපි මෙ චවති, ඉදප්පච්චයා මෙ චවතීති පජානාමි. සෙය්‍යථාපි ආවුසො. රඤ්ඤො වා රාජමහාමත්තස්ස වා නානාරත්තානං දුස්සානං දුස්සකරණ්ඩකො පූරො අස්ස සො යඤ්ඤදෙව[2] දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය පුබ්බණ්හසමයං පාරුපිතුං. තං තදෙව දුස්සයුගං පුබ්බණ්හසමයං පාරුපෙය්‍ය. යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය මජ්ඣන්තිකං සමයං පාරුපිතුං. තං තදෙව දුස්සයුගං මජ්ඣන්තිකං සමයං පාරුපෙය්‍ය. යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය සායන්හසමයං පාරුපිතුං තං තදෙව දුස්සයුගං සායන්හසමයං පාරුපෙය්‍ය.

එවමෙව ඛො'හං ආවුසො, ඉමෙසං සත්තන්නං බොජ්ඣඞ්ගානං යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි පුබ්බණ්හසමයං විහරිතුං. තෙන තෙන බොජ්ඣඞ්ගෙන පුබ්බණ්හසමයං විහරාමි. යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි මජ්ඣන්තිකං සමයං විහරිතුං. තෙන තෙන බොජ්ඣඞ්ගෙන මජ්ඣන්තිකං සමයං විහරාමි. යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි සායන්හසමයං විහරිතුං තෙන තෙන බොජ්ඣඞ්ගෙන සායන්හසමයං විහරාමි. සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො, හොති අප්පමාණොති මෙ හොති. සුසමාරද්ධොති මෙ හොති. තිට්ඨන්තං තිට්ඨතීති පජානාමි. සචෙපි මෙ චවති ඉදප්පච්චයා මෙ චවතීති පජානාමි -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො හොති, අප්පමාණොති මෙ හොති. සුසමාරද්ධොති මෙ හොති. තිට්ඨන්තං තිට්ඨතීති පජානාමි. සචෙපි මෙ චවති, ඉදප්පච්චයා මෙ චවතීති පජානාමීති.

## 2. 1. 5

## භික්ඛුසුත්තං

551. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: බොජ්ඣඞ්ගා බොජ්ඣඞ්ගාති භන්තෙ, වුච්චන්ති කිත්තාවතා නු ඛො භන්තෙ, බොජ්ඣඞ්ගාති වුච්චන්ති?ති බොධාය සංවත්තන්තීති ඛො භික්ඛු තස්මා බොජ්ඣඞ්ගාති වුච්චන්ති. ඉධ භික්ඛු, භික්ඛු[3] සති- සම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං.

---

1. ඨිටඨන්තං ඨ තං - මජසං.
2. පූරො යඤ්ඤදෙව - සී 1, 2. සීමු.
3. ඉධ භික්ඛු සතිසම්බොජ්ඣඞ්ග - මජසං.

ඇවැත්නි, ඉදින් සතිසම්බොජ්ඣඞ්ග ය යි මට සිත් වේ නම් නො පමණ ය යි මට සිත් වේ. මැනැවින් පිරුණේ ය යි මට සිත් වේ. පවත්නා බොජ්ඣඞ්ගය පවත්නේ ය යි දැනගනිමි. ඉදිනුදු මාගේ බොජ්ඣඞ්ගය ච්‍යුත වේ නම් මේ හේතුවෙන් මාගේ බොජ්ඣඞ්ගය ච්‍යුත වේ යයි දැනගනිමි... ඇවැත්නි, ඉදින් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග ය යි මට සිත් වේ නම් නො පමණ ය යි මට සිත් වේ මැනවින් පිරුණේ යයි මට සිත් වේ. පවත්නා බොජ්ඣඞ්ගය පවතී ය යි දැනගනිමි. ඉදිනුදු මාගේ බොජ්ඣඞ්ගය ච්‍යුත වේ නම් මේ හේතුවෙන් මාගේ බොජ්ඣඞ්ගය ච්‍යුත වේ ය යි දැනගනිමි. ඇවැත්නි යම්සේ රජකුගේ හෝ රජමගඇමතියකුගේ හෝ නොයෙක් වර්ණයෙන් රඳනා ලද වතින් පිරුණු වත්කරඬුවෙක් වන්නේ ද ඔහුතෙමේ පෙරවරු යම් යම් වත්යුවලක් පොරවන්නට කැමැති වන්නේ නම් ඒ ඒ වත් යුවල ම පෙරවරු පොරවන්නේ ය. යම් යම් වත්යුවලක් මැදියම පොරවන්නට කැමැති වන්නේ නම් ඒ ඒ වත්යුවල ම මැදියම පොරවන්නේ ය. යම් යම් වත්යුවලක් පස්වරු පොරවන්නට කැමැති වන්නේ නම් ඒ ඒ වත්යුවල ම පස්වරු පොරවන්නේ ය.

ඇවැත්නි, එසෙයින් ම මේ සත් බොජ්ඣඞ්ගයන් අතුරෙන් යම් යම් බොජ්ඣඞ්ගයෙකින් යුතු ව පෙරවරු වසන්නට මම කැමැති වෙම් නම් ඒ ඒ බොජ්ඣඞ්ගයෙන් යුතු ව පෙරවරු වෙසෙමි. යම් යම් බොජ්ඣඞ්ගයෙකින් යුතු ව මැදියම වසන්නට කැමැති වෙම් නම් ඒ ඒ බොජ්ඣඞ්ගයෙන් යුතු ව මැදියම වෙසෙමි. යම් යම් බොජ්ඣඞ්ගයෙකින් යුතු ව පස්වරු වසන්නට කැමැති වෙම් නම් ඒ ඒ බොජ්ඣඞ්ගයෙන් යුතු ව පස්වරු වෙසෙමි. ඇවැත්නි, ඉදින් සතිසම්බොජ්ඣඞ්ග ය යි මට සිත් වේ නම් නො පමණ ය යි මට සිත් වේ. මැනැවින් පිරුණේ ය යි මට සිත් වේ. පවත්නා බොජ්ඣඞ්ගය පවතී ය යි දැනගනිමි. ඉදිනුදු මාගේ බොජ්ඣඞ්ගය ච්‍යුත වේ නම් මේ හෙ වෙන් මාගේ බොජ්ඣඞ්ගය ච්‍යුත වේ ය යි දැනගනිමි... ඇවැත්නි, ඉදින් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය ය යි මට සිත් වේ නම් නො පමණ ය යි මට සිත් වේ. මැනැවින් පිරුණේ ය යි මට සිත් වේ. පවත්නා බොජ්ඣඞ්ගය පවතී ය යි දැනගනිමි. ඉදිනුදු මාගේ බොජ්ඣඞ්ගය ච්‍යුත වේ නම් මේ හෙතුවෙන් මාගේ බොජ්ඣඞ්ගය ච්‍යුත වේ ය යි දැනගනිමි යි.

## 2. 1. 5

## භික්ඛුසූත්‍රය

551. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය... එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. වහන්ස, ''බොජ්ඣඞ්ගහ බොජ්ඣඞ්ගහ'' යි කියනු ලැබෙත්. වහන්ස, කොතෙකින් ''බොජ්ඣඞ්ගහ'' යි කියනු ලැබෙද්දෝ?යි. මහණ, අවබෝධය පිණිස පවතිත් නු යි එහෙයින් බොජ්ඣඞ්ගහ යි කියනු ලැබෙත්. මහණ, මෙහි මහණ තෙමේ විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙනසුල්ලක් කොට සතිසම්බොජ්ඣඞ්ගය වඩයි... විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙනසුල්ලක් කොට උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි.

තස්සිමෙ සත්තබොජ්ඣඞ්ගෙ භාවයතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති. බොධාය සංවත්තන්තීති ඛො භික්ඛු, තස්මා බොජ්ඣඞ්ගාති වුච්චන්තීති.

## 2. 1. 6

## කුණ්ඩලියසුත්තං

552. එකං සමයං භගවා **සාකෙතෙ** විහරති **අඤ්ජනවනෙ මිගදායෙ**, අථ ඛො **කුණ්ඩලියො** පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො කුණ්ඩලියො පරිබ්බාජකො භගවන්තං එතදවොච: අහමස්මි භො ගොතම, ආරාමනිසාදී[1] පරිසාවචරො. තස්ස මය්හං භො ගොතම, පච්ඡාභත්තං භුත්තපාතරාසස්ස අයමාචාරො[2] හොති: ආරාමෙන ආරාමං උය්‍යානෙන උය්‍යානං අනුචඞ්කමාමි, අනුවිචරාමි. සො තත්ථ පස්සාමි: "එකෙ සමණබ්‍රාහ්මණෙ ඉතිවාදප්පමොක්ඛානිසංසඤ්චෙව කථං කථෙන්තෙ උපාරම්භානිසංසඤ්ච." භවං පන ගොතමො කිමානිසංසො විහරතීති. විජ්ජාවිමුත්තිඵලානිසංසො ඛො කුණ්ඩලිය, තථාගතො විහරතීති. කතමෙ පන භො ගොතම, ධම්මා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති?ති සත්ත ඛො කුණ්ඩලිය, බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්තීති.

කතමෙ පන භො ගොතම, ධම්මා භාවිතා බහුලීකතා සත්තබොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති?ති චත්තාරො ඛො කුණ්ඩලිය, සතිපට්ඨානා භාවිතා බහුලීකතා සත්තබොජ්ඣඞ්ගෙ පරිපූරෙන්තීති.

කතමෙ භො ගොතම, ධම්මා භාවිතා බහුලීකතා චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙන්ති?ති තීණි ඛො කුණ්ඩලිය, සුචරිතානි භාවිතානි බහුලීකතානි චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙන්තීති.

කතමෙ පන භො ගොතම, ධම්මා භාවිතා බහුලීකතා තීණි සුචරිතානි පරිපූරෙන්ති?ති, ඉන්ද්‍රියසංවරො ඛො කුණ්ඩලිය, භාවිතො බහුලීකතො තීණි සුචරිතානි පරිපූරෙතීති.

කථං භාවිතො ච කුණ්ඩලිය, ඉන්ද්‍රියසංවරො කථං බහුලීකතො තීණි සුචරිතානි පරිපූරෙති? ඉධ කුණ්ඩලිය, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා මනාපං නාභිජ්ඣති[3], නාභිහංසති[4], න රාගං ජනෙති, තස්ස ඨිතො ච කායො හොති, ඨිතං චිත්තං, අජ්ඣත්තං සුසණ්ඨිතං[5], සුවිමුත්තං. චක්ඛුනා ඛො පනෙව රූපං දිස්වා අමනාපං න මඞ්කු හොති, අපතිට්ඨිතචිත්තො[6] අදීනමනසො[7] අබ්‍යාපන්නචෙතසො. තස්ස ඨිතො ච කායො හොති, ඨිතං චිත්තං, අජ්ඣත්තං සුසණ්ඨිතං, සුවිමුත්තං.

1. ආරාම නිස්සයී – මජසං, ආරාමනියාදි – සයා.
2. අයමාභාරො – සයා.
3. නාභිජ්ඣායති – සයා.
4. නාභිහසති – සීමු.
5. සුසං විහිතං – සී 1, 2.
6. අපාසිට්ඨිතචිත්තො – මජසං, සයා, අපච්චුත්ථිකචිත්තො – සී 1, 2.
7. අදීනමානසො – මජසං, ආදීනමානසො – සයා.

මේ සත් බොජ්ඣ වඩන ඔහුගේ සිත කාමාසුවයෙනුදු මිදෙයි. භවාසුවයෙනුදු සිත මිදෙයි අවිද්‍යාසුවයෙනුදු සිත මිදෙයි. මිදුණු කල්හි මිදුණේ ය යි දැනීම වෙයි. ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බව පිණිස අනෙකක් නැතැයි දැනගනී. මහණ අවබෝධය පිණිස පවතිත් නු යි එහෙයින් බොජ්ඣඞ යි කියනු ලැබෙති යි.

## 2. 1. 6

## කුණ්ඩලියසූත්‍රය

552. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සාකේතනුවර සමීපයෙහි **මිගදය** නම් **අඳුන්වෙනෙහි** වැඩවසන සේක. එකල්හි **කුණ්ඩලිය** පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස් ව හුන්නේය. එකත්පස් ව හුන් කුණ්ඩලිය පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: "භවත් ගෞතමයෙනි, මම අරම් නිසා වෙසෙන (මෙරමා මතය මැඩ ලා සවමතය තිර කිරීමට සමත්) පිරිස්හි හැසිරෙන්නෙක් වෙමි. භවත් ගෞතමයෙනි, උදයබත වැළඳූ ඒ මාගේ පසුබත මෙබඳු සිරිතෙක් වෙයි: අරමින් අරම උයනෙන් උයන අනුව සක්මන් කරමි. අනුව හැසිරෙමි. ඒ මම "වාදය මෙසේ ය, වාදයෙන් මිදීම මෙසේ ය"යි මෙය අනුසස් කොට ඇති කථා කියන ඇතැම් මහණබමුණන් එහි දකිමි. භවත් ගෞතම තෙමේ කුමක් අනුසස් කොට ඇති ව වෙසේ ද?"යි. කුණ්ඩලිය, තථාගත තෙමේ විද්‍යාවිමුක්තිඵල අනුසස් කොට ඇති ව වෙසෙයි. භවත් ගෞතමයෙනි, කවර දහම්හු වඩන ලදහු බහුල කරන ලදහු විජ්ජාවිමුත්ති සම්පූර්ණ කෙරෙද්ද? යි. කුණ්ඩලිය, සත් බොජ්ඣඞගයෝ වඩන ලදහු බහුල කරන ලදහු විජ්ජාවිමුත්ති සම්පූර්ණ කෙරෙති යි.

"භවත් ගෞතමයෙනි, කවර දහම්හු වඩන ලදහු කෙරෙද්ද?"යි කුණ්ඩලිය, සිවුසිවටන්හු වඩන ලදහු බහුල කරන ලදහු සත් බොජ්ඣ පිරිපුන් කෙරෙති යි.

"භවද් ගෞතමයෙනි, කවර දහම්හු වඩන ලදහු බහුල කරන ලදහු සිවු සිවටන් පිරිපුන් කෙරෙද්ද?"යි. කුණ්ඩලිය, ත්‍රිවිධ සුචරිතයෝ වඩන ලදහු බහුල කරන ලදහු සිවු සිවටන් පිරිපුන් කෙරෙති යි.

"භවද් ගෞතමයෙනි, කවර දහම්හු වඩන ලදහු බහුල කරන ලදහු තුන් සුසිරිත් පිරිපුන් කෙරෙද්ද?"යි කුණ්ඩලිය, ඉන්ද්‍රියසංවරය වඩන ලද්දේ බහුල කරන ලද්දේ තුන් සුසිරිත් පිරිපුන් කෙරේ යි.

කුණ්ඩලිය, ඉන්ද්‍රියසංවරය කෙසේ වඩන ලද්දේ කෙසේ බහුල කරන ලද්දේ තුන් සුසිරිත් පිරිපුන් කෙරේ ද? යත්: කුණ්ඩලිය, මෙහි මහණ තෙමේ ඇසින් දැක ඉටු අරමුණ නො පතයි. සාමිස සතුටින් නො පෙළෙයි. රාගය නූපදවයි. ඔහුගේ නාම කයත් අරමුණෙහි සිටියේ සිතත් සිටියේ (කමටහන් වශයෙන්) මැනවින් සිටියේ (කමටහනින් මිදීමෙන්) මැනවින් මිදුණේ වෙයි. ඇසින් ම අනිටු රූ දැක ද මකු නො වෙයි. (නො හැකිලෙයි) නො සන්හුන් සිත් නැත්තේ බැගෑපත් සිත් නැත්තේ දුෂ්ට සිත් නැත්තේ වෙයි. ඔහුගේ නාමකයත් අරමුණෙහි සිටියේ සිතත් සිටියේ මැනවින් සිටියේ මැනවින් මිදුණේ වෙයි

පුනචපරං කුණ්ඩලිය, භික්ඛු සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය මනාපං නාභිජ්ඣති, නාභිහංසති, න රාගං ජනෙති. තස්ස ඨිතො ච කායො හොති, ඨිතං චිත්තං, අජ්ඣත්තං සුසණ්ඨිතං, සුවිමුත්තං. මනසා ඛො පනෙව ධම්මං විඤ්ඤාය අමනාපං න මඞ්කු හොති. අපතිත්ථීනචිත්තො අදීනමනසො අබ්‍යාපන්නචෙතසො. තස්ස ඨිතො ච කායො හොති, ඨිතං චිත්තං, අජ්ඣත්තං සුසණ්ඨිතං, සුවිමුත්තං යතො ඛො කුණ්ඩලිය, භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා මනාපාමනාපෙසු රූපෙසු ඨිතො ච කායො හොති, ඨිතං චිත්තං, අජ්ඣත්තං සුසණ්ඨිතං, සුවිමුත්තං. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය මනාපාමනාපෙසු ධම්මෙසු ඨිතො ච කායො හොති, ඨිතං චිත්තං, අජ්ඣත්තං සුසණ්ඨිතං, සුවිමුත්තං. එවං භාවිතො ඛො කුණ්ඩලිය, ඉන්ද්‍රියසංවරො එවං බහුලීකතො තීණි සුචරිතානි පරිපූරෙතීති.

කථං භාවිතානි ච කුණ්ඩලිය, තීණි සුචරිතානි කථං බහුලීකතානි චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙන්ති? ඉධ කුණ්ඩලිය, භික්ඛු කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙති. වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙති. මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙති. එවං භාවිතානි ඛො කුණ්ඩලිය, තීණි සුචරිතානි එවං බහුලීකතානි චත්තාරො සතිපට්ඨානෙ පරිපූරෙන්තීති.

කථං භාවිතා ච කුණ්ඩලිය, චත්තාරො සතිපට්ඨානා කථං බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්ති? ඉධ කුණ්ඩලිය, භික්ඛු කායෙ කායානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති. ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එවං භාවිතා ඛො කුණ්ඩලිය, චත්තාරො සතිපට්ඨානා එවං බහුලීකතා සත්ත බොජ්ඣඞ්ගෙ පරිපූරෙන්තීති.

කථං භාවිතා ච ඛො කුණ්ඩලිය, සත්ත බොජ්ඣඞ්ගා කථං බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්ති? ඉධ කුණ්ඩලිය, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො කුණ්ඩලිය, සත්ත බොජ්ඣඞ්ගා එවං බහුලීකතා විජ්ජාවිමුත්තිං පරිපූරෙන්තීති. එවං වුත්තෙ කුණ්ඩලියො පරිබ්බාජකො භගවන්තං එතදවොච: ''අභික්කන්තං භො ගොතම -පෙ- පාණුපෙතං සරණං ගත''න්ති.

''කුණ්ඩලිය, නැවත අනෙකක් ද කියමි. මහණ තෙමේ කනින් හඩ අසා... නැහැයෙන් ගඳ ගෙන... දිවින් රස විඳ... කයින් පහස් පැහැස... සිතින් දහම් දැන ඉටු අරමුණ නො පතයි. සාමිස සතුටින් නො පෙලෙයි. රාගය නූපදවයි. ඔහුගේ නාමකයත් අරමුණෙහි සිටියේ සිතත් සිටියේ මැනවින් සිටියේ මැනවින් මිදුණේ වෙයි. සිතින් දහම් දැන අනිටු අරමුණෙහි මකු නො වෙයි. නො සන්හුන් සිත් නැත්තේ බැගෑපත් සත් නැත්තේ දුෂ්ට සිත් නැත්තේ වෙයි. ඔහුගේ නාම කයත් අරමුණෙහි සිටියේ සිතත් සිටියේ මැනවින් සිටියේ මැනවින් මිදුණේ වෙයි. කුණ්ඩලිය, යම්, කලෙක පටන් මහණහුගේ සිත ඇසින් රූ දැක ඉටු අනිටු රූහි නාම කයත් අරමුණෙහි සිටියේ සිතත් සිටියේ මැනවින් සිටියේ මැනවින් මිදුණේ වේ ද, කනින් සද අසා... නැහැයෙන් ගඳ ගෙන... දිවෙන් රස විඳ... කයින් පහස් පැහැස... සිතින් දහම් දැන ඉටු අනිටු දහම්හි නාමකයත් අරමුණෙහි සිටියේ සිතත් සිටියේ මැනවින් සිටියේ මැනවින් මිදුණේ වේ ද, කුණ්ඩලිය, ඉන්ද්‍රියසංවරය මෙසේ වඩන ලද්දේ මෙසේ බහුල කරන ලද්දේ තුන්සුසිරිත් පිරිපුන් කෙරේ'' යි.

''කුණ්ඩලිය, තුන් සුසිරිත් කෙසේ වඩන ලද්දේ කෙසේ බහුල කරන ලද්දේ සිවු සිවටන් පිරිපුන් කෙරේ ද? යත්: කුණ්ඩලිය, මෙහි මහණ තෙමේ කායදුශ්චරිතය හැර කායසුචරිතය වඩයි. වාග්දුශ්චරිතය හැර වාක්සුචරිතය වඩයි. මනොදුශ්චරිතය හැර මනඃසුචරිතය වඩයි. කුණ්ඩලිය, තුන් සුසිරිත් මෙසේ වඩන ලද්දේ මෙසේ බහුල කරන ලද්දේ සිවු සිවටන් පිරිපුන් කෙරේ'' යි.

''කුණ්ඩලිය, සිවුසිවටන්හු කෙසේ වඩන ලදහු කෙසේ බහුල කරන ලදහු සත් බොජඟ පිරිපුන් කෙරෙද්ද? යත්: කුණ්ඩලිය මෙහි මහණ තෙමේ කයෙහි කය අනුව බලමින් කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇතිව සිහි ඇතිව කාලොව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ, විඳුම්හි... සිත්හි... දහම්හි දහම් අනුව බලමින් කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇතිව සිහි ඇතිව දහම්ලොව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. කුණ්ඩලිය. සිවු සිවටන්හු මෙසේ වඩන ලදහු මෙසේ බහුල කරන ලදහු සත් බොජඟ පිරිපුන් කෙරෙති'' යි.

''කුණ්ඩලිය, සත්තබොජ්ඣඞ්ගයෝ කෙසේ වඩන ලදහු කෙසේ බහුල කරන ලදහු අර්හත්මාර්ගවිද්‍යාව හා ඵලවිමුක්තිය පිරිපුන් කෙරෙද්ද යත්: කුණ්ඩලිය, මෙහි මහණ තෙමේ විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙනසුල්ලක් කොට සතිසම්බොජ්ඣඞ්ගය වඩයි... විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමෙනසුල්ලක් කොට උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. කුණ්ඩලිය, සත්ත බොජ්ඣඞ්ගයෝ මෙසේ වඩන ලදහු මෙසේ බහුල කරන ලදහු විජ්ජාවිමුත්ති පිරිපුන් කෙරෙති'' යි.

මෙසේ වදාළ කල්හි කුණ්ඩලිය පිරිවැජි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය. ''භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි... දිවිහිම්යෙන් සරණ ගිය (මා උවසු කොට දරන සේක්වා)'' යි.

## 2. 1. 7

### කූටාගාරසුත්තං

553. සෙය්‍යථාපි භික්ඛවෙ, කූටාගාරස්ස යා කාචි ගොපානසියො සබ්බා තා කූටනින්නා කූටපොණා කූටපබ්භාරා, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො? ඉධ භික්ඛවෙ භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධ-නිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ භික්ඛු[1] සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

## 2. 1. 8

### උපවානසුත්තං

554. එකං සමයං ආයස්මා ච උපවානො ආයස්මා ච සාරිපුත්තො කොසම්බියං විහරන්ති ඝොසිතාරාමෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා උපවානො තෙනුපසඞ්කමි. උපසංකමිත්වා ආයස්මතා උපවානෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං උපවානං එතදවොච: ''ජානෙය්‍ය නු ඛො ආවුසො උපවාන භික්ඛු පච්චත්තං යොනිසො මනසිකාරා[2] එවං සුසමාරද්ධා මෙ සත්ත බොජ්ඣඞ්ගා ඵාසුවිහාරාය සංවත්තන්තී''ති.

ජානෙය්‍ය ඛො ආවුසො සාරිපුත්ත භික්ඛු පච්චත්තං යොනිසො මනසිකාරා එවං සුසමාරද්ධා මෙ සත්ත බොජ්ඣඞ්ගා ඵාසුවිහාරාය සංවත්තන්තීති. සතිසම්බොජ්ඣඞ්ගං ඛො ආවුසො භික්ඛු ආරභමානො පජානාති ''චිත්තං ච මෙ සුවිමුත්තං-ථීනමිද්ධං ච මෙ සුසමූහතං. උද්ධච්චකුක්කුච්චඤ්ච මෙ සුපටිවිනීතං. ආරද්ධං ච මෙ විරියං අට්ඨිකත්වා මනසිකරොමි. නො ච ලීනන්ති'' -පෙ- උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගං ආවුසො භික්ඛු ආරභමානො පජානාති චිත්තඤ්ච මෙ සුවිමුත්තං. ථීනමිද්ධඤ්ච මෙ සුසමූහතං උද්ධච්චකුක්කුච්චඤ්ච මෙ සුපටිවිනීතං. ආරද්ධං ච මෙ විරියං අට්ඨිකත්වා[3] මනසිකරොමි නො ච ලීනන්ති. එවං ඛො ආවුසො සාරිපුත්ත භික්ඛු ජානෙය්‍ය පච්චත්තං යොනිසො මනසිකාරා සුසමාරද්ධා මෙ සත්ත බොජ්ඣඞ්ගා ඵාසු විහාරාය සංවත්තන්තීති.

---

1. එවං ඛො භික්ඛු - සීමු, ස්‍යා.
2. මනසිකාරෙන - සී 1, 2.
3. අට්ඨී කත්වා - මජ්සං.

## 2. 1. 7

## කූටාගාර සූත්‍රය

553. මහණෙනි, යම්සේ කුළුගෙයක යම්කිසි ගොනැස්හු වෙද්ද ඒ සියල්ලෝ මුදුනට නැමුණාහු මුදුනට නැඹුරු වූවාහු මුදුනට බර වූවාහු වෙති. මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ සත්බොජ්ඣඞ්ග වඩන්නේ සත්බොජ්ඣඞ්ග බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ සත්බොජ්ඣඞ්ග වඩන්නේ සත් බොජ්ඣඞ්ග බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේද යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවේකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී වූ සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... විවේකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී වූ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ සත් බොජ්ඣඞ්ග වඩන්නේ සත් බොජ්ඣඞ්ග බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යි.

## 2. 1. 8

## උපවාන සූත්‍රය

554. එක් කලෙක ආයුෂ්මත් උපවාන තෙරණුවෝත් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝත් කොසඹෑනුවර සමීපයෙහි ඝොසිතාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සවස්කල විවේකයෙන් නැඟී සිටියාහු ආයුෂ්මත් උපවාන තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් උපවාන තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පස්ව වැඩ හුන්හ. එකත් පස්ව වැඩ හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් උපවාන තෙරණුවනට මෙය කීහ: "ඇවැත්නි, උපවානයෙනි, මහණ තෙමේ නුවණින් මෙනෙහි කිරීමෙන් මෙසේ මා විසින් මොනවට අරඹන ලද සප්ත බොධ්‍යඞ්ගයෝ පහසු විහරණය පිණිස පවතිත් යි තෙමේ ම දැනගන්නේ ද?"යි.

ඇවැත්නි, ශාරිපුත්‍රයෙනි, මහණ තෙමේ නුවණින් මෙනෙහි කිරීමෙන් "මෙසේ මා විසින් මොනවට අරඹන ලද සප්ත බොධ්‍යඞ්ගයෝ පහසු විහරණය පිණිස පවතිත්"යි තෙමේ ම දැනගන්නේ ය. ඇවැත්නි, මහණ තෙමේ සතිසම්බොජ්ඣඞ්ගය අරඹනුයේ "මාගේ සිත ද මැනවින් මිදුණේ ය. ථීනමිද්ධය ද මවිසින් සහමුලින් නසන ලද්දේ ය. උද්ධච්ච-කුක්කුච්චය ද මවිසින් මැනවින් දුරුකරන ලද්දේ ය. වීර්‍ය්‍යය ද මවිසින් අරඹන ලද්දේ නො ද සැහවුණේ ය. අර්ථවත් කොට (ප්‍රයෝජන සලකා) මෙනෙහි කරමි යි දැනගනී. ... ඇවැත්නි, මහණ තෙමේ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය අරඹනුයේ මාගේ සිත ද මැනවින් මිදුණේ ය. ථීනමිද්ධය ද මා විසින් සහමුලින් නසන ලද්දේ ය. උද්ධච්චකුක්කුච්චය ද මා විසින් මැනවින් දුරු කරන ලද්දේ ය. වීර්‍ය්‍යය ද මා විසින් අරඹන ලද්දේ නො ද සැහවුණේ ය. අර්ථවත් කොට මෙනෙහි කරමි යි. ඇවැත්නි, සාරිපුත්‍රයෙනි, මහණ තෙමේ නුවණින් මෙනෙහි කිරීමෙන්" මෙසේ මා විසින් මැනවින් අරඹන ලද සප්තබොධ්‍යඞ්ගයෝ පහසු විහරණය පිණිස පවති යි මෙසේ දැනගන්නේ" යි.

## 2. 1. 9

### උප්පාදසුත්තං

555. සත්තිමෙ භික්ඛවෙ, බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා අනුප්පන්නා උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර තථාගතස්ස පාතුභාවා අරහතො සම්මාසම්බුද්ධස්ස. කතමෙ සත්ත සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා අනුප්පන්නා උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර තථාගතස්ස පාතුභාවා අරහතො සම්මාසම්බුද්ධස්සාති.

## 2. 1. 10

### දුතිය උප්පාදසුත්තං

556. සත්තිමෙ භික්ඛවෙ, බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා අනුප්පන්නා උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර සුගතවිනයා. කතමෙ සත්ත සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා අනුප්පන්නා උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

### පබ්බතවග්ගො පඨමො.

**තත්‍රුද්දානං:**

හිමවන්තං කායො සීලං වත්ථං භික්ඛු ච කුණ්ඩලී
කූටාගාරමුපවානං උප්පාදෙ අපරෙ දුවෙති.

## 2. 1. 9

## උප්පාද සූත්‍රය

555. මහණෙනි, මේ සප්තබෝධ්‍යඞ්ග කෙනෙක් වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධරජාණන් වහන්සේගේ පහළ වීමෙන් අන් කල්හි නූපන්නාහු නූපදිති. කවර සතෙක් ද යත්: සතිසම්බොජ්ඣඞ්ගය... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය යි. මහණෙනි, මේ සත්ත බොජ්ඣඞ්ගයෝ වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධරජාණන් වහන්සේගේ පහළ වීමෙන් අන් කල්හි නූපන්නාහු නූපදිති යි.

## 2. 1. 10

## දුතිය උප්පාද සූත්‍රය

556. මහණෙනි, මේ සප්තබෝධ්‍යඞ්ග කෙනෙක් වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු බුද්ධසසුනෙන් අන්තන්හි නූපදනාහු නූපදිති. කවර සතෙක් ද යත්: සතිසම්බොජ්ඣඞ්ගය ... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය යි. මහණෙනි, මේ සත්ත බොධ්‍යඞ්ගයෝ වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු බුද්ධසසුනෙන් අන්තන්හි නූපන්නාහු නූපදිති යි.

**පළමුවැනි පබ්බතවර්ගය යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

හිමවන්ත, කාය, සීල, වත්‍ථ, භික්ඛු, කුණ්ඩලී, කූටාගාර උපවාන සූත්‍රය, අනෙක් උප්පාදසූත්‍ර දෙක ය යි දශ සූත්‍ර කෙනෙකි.

# 2. ගිලානවග්ගො

## 2. 2. 1

### පාණසුත්තං

557. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි පාණා චත්තාරො ඉරියාපථෙ කප්පෙන්ති කාලෙන ගමනං කාලෙන ඨානං කාලෙන නිසජ්ජං කාලෙන සෙය්‍යං, සබ්බෙ තෙ පථවිං නිස්සාය පථවියං පතිට්ඨාය එවමෙතෙ චත්තාරො ඉරියාපථෙ කප්පෙන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති. සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොති? ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති සත්තබොජ්ඣඞ්ගෙ බහුලීකරොතීති.

## 2. 2. 2

### සූරියසුත්තං

558. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො සත්තන්නං බොජ්ඣඞ්ගානං උප්පාදාය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං සත්තබොජ්ඣඞ්ගෙ භාවෙස්සති සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරිස්සති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො සත්තබොජ්ඣඞ්ගෙ භාවෙති සත්තබොජ්ඣඞ්ගෙ බහුලීකරොති ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොතීති.

## 2. 2. 3

### දුතියසූරියසුත්තං

559. සූරියස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො සත්තන්නං බොජ්ඣඞ්ගානං උප්පාදාය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං යොනිසොමනසිකාරො. යොනිසොමනසිකාරසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙස්සති සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරිස්සතීති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොති? ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොතීති.

# 2. ගිලානවර්ගය

## 2. 2. 1

### පාන සූත්‍රය

557. මගණෙනි, යම් සේ යම් කිසි ප්‍රාණීහු කලෙක ගමන ද කලෙක සිටුම ද කලෙක හිඳුම ද කලෙක ශයනය ද යි සිවු ඉරියව්වූ කෙරෙද්ද, ඒ සියල්ලෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා එසේ ඒ සිවු ඉරියව්වූ කෙරෙති. මහණෙනි, එසෙයින්ම මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා සත් බොජ්ඣඟ වඩයි. සත් බොජ්ඣඟ බහුල කෙරෙයි. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා සත් බොජ්ඣඟ වඩා ද, සත් බොජ්ඣඟ බහුල කෙරේ ද? යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ විවේකය ඇසුරු කළ විරාගය ඇසුරුකළ නිරෝධය ඇසුරුකළ නිවනට පිරිනැමුනු සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. විවේකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා සත් බොජ්ඣඟ වඩයි. සත් බොජ්ඣඟ බහුල කෙරෙ යි.

## 2. 2. 2

### සූරිය සූත්‍රය

558. මහණෙනි, යම් මේ අරුණොදයෙක් වේ ද, උදවන හිරුට මෙය පෙරටු ය, මෙය පෙරනිමිත්ත ය. මහණෙනි, එසෙයින් ම යම් මේ කලණ මිතුරන් ඇති බවෙක් වේ ද, මහණහට සත් බොජ්ඣඟ ඉපදීම පිණිස මෙය පෙරටු ය, මෙය පෙරනිමිත්ත ය. මහණෙනි, සත් බොජ්ඣඟ වඩන්නේ ය සත්බොජ්ඣඟ බහුල කරන්නේ ය යන මෙය කලණ මිතුරන් ඇති මහණහු විසින් කැමති විය යුතු. මහණෙනි, කෙසේ නම් කලණ මිතුරන් ඇති මහණ තෙමේ සත් බොජ්ඣඟ වඩා ද, සත් බොජ්ඣඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ කලණ මිතුරන් ඇති මහණ තෙමේ සත් බොජ්ඣඟ වඩයි. සත් බොජ්ඣඟ බහුල කෙරේ යි.

## 2. 2. 3

### දුතිය සූරිය සූත්‍රය

559. මහණෙනි, යම් මේ අරුණ නැගීමෙක් වේ ද උදවන හිරුට මෙය පෙරටු ය, මෙය පෙරනිමිත්ත ය. මහණෙනි, එසෙයින් ම යම් මේ යෝනිසොමනසිකාරයෙක් වේ ද, මහණහට සත් බොජ්ඣඟ ඉපදීමට මෙය පෙරටු ය, මෙය පෙරනිමිත්ත ය. මහණෙනි, සත් බොජ්ඣඟ වඩන්නේ ය, සත් බොජ්ඣඟ බහුල කරන්නේ ය යන මෙය යෝනිසොමනසිකාරයෙන් යුත් මහණහු විසින් කැමැති විය යුතු. මහණෙනි, කෙසේ නම් යොනිසෝමනසිකාරයෙන් යුත් මහණ තෙමේ සත්බොජ්ඣඟ වඩා ද සත් බොජ්ඣඟ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙ මහණ තෙමේ විවේකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමි සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, යෝනිසොමනසිකාරයෙන් යුත් මහණ තෙමේ මෙසේ සත් බොජ්ඣඟ වඩයි. සත් බොජ්ඣඟ බහුල කෙරේ යි.

## 2. 2. 4

## ගිලානසුත්තං

560. එවං මෙ සුතං. එකං සමයං භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ**. තෙන ඛො පන සමයෙන ආයස්මා **මහාකස්සපො පිප්ඵලි[1]ගුහායං** විහරති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාකස්සපො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං මහාකස්සපං එතදවොච: ‘‘කච්චි තෙ කස්සප, ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වෙදනා? පටික්කමන්ති නො අභික්කමන්ති? පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමො?’’ති න මෙ භන්තෙ, ඛමනීයං. න යාපනීයං. බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති, නො පටික්කමන්ති. අභික්කමොසානං පඤ්ඤායති, නො පටික්කමො’’ති.

‘‘සත්තිමෙ කස්සප බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො. අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. විරියසම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. පීතිසම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. සමාධිසම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඛො කස්සප, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. ඉමෙ ඛො කස්සප, සත්ත බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තී’’ති. තග්ඝ භගවා,[2] බොජ්ඣඞ්ගා, තග්ඝ සුගත, බොජ්ඣඞ්ගා’’ති.

ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා මහාකස්සපො භගවතො භාසිතං අභිනන්දි. වුට්ඨාහි[3] චායස්මා මහාකස්සපො තම්හා ආබාධා. තථා පහීනො ච ආයස්මතො මහාකස්සපස්ස සො ආබාධො අහොසී’’ති.

---

1. පිප්පලි - මජසං,
2. භගවා - මජසං, සභා,
3. වුට්ඨහි - මජසං, සභා.

## 2. 2. 4

## ගිලාන සූත්‍රය

560. මවිසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්‍දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි ඇවත් මහසුප් තෙරණුවෝ රෝගී ව දුකට පැමිණ දැඩිගිලන් ව පිප්ඵලිගුහාවෙහි වැඩවෙසෙති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් කල පලසමවතින් නැගී සිටිසේක් ඇවත් මහසුප් තෙරණුවන් වෙත එළඹිසේක. එළඹ පැනවූ අසුන්හි වැඩහුන්සේක. භාග්‍යවතුන් වහන්සේ වැඩහිඳ ඇවත් මහසුප් තෙරණුවනට මෙය වදළසේක: "කස්සපයෙනි, කිම තොපට ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? කිම දුක් වේදනාවෝ අඩු වෙද් ද? වැඩී නො වෙද් ද? මොවුන් ගේ අඩුවීමක් පෙනේ ද? වැඩීවීමෙක් නො පෙනේ ද?"යි. "වහන්ස, මට ඉවසිය නො හැකි ය, යැපිය නො හැකිය. මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩි වෙත්, අඩු නො වෙත්. ඔවුන්ගේ වැඩි වීම පෙනේ. අඩු වීම නො පෙනේ'' යි.

කස්සපයෙනි, මේ සත් බොජ්ඣඞ්ග කෙනෙක් මවිසින් මැනවින් පවසන ලද්දහු වඩන ලද්දහු බහුල කරන ලද්දහු වෙසෙසින් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතිත්. කවර සතෙක් ද? යත්: කස්සපයෙනි, සතිසම්බොජ්ඣඞ්ගය මවිසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතී. කස්සපයෙනි, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය මවිසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතී. කස්සපයෙනි, විරියසම්බොජ්ඣඞ්ගය මවිසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ, බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතී. කස්සපයෙනි, පීතිසම්බොජ්ඣඞ්ගය මවිසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතී. කස්සපයෙනි, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය මවිසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස්දැනුම පිණිස මනාඅවබෝධය පිණිස නිවන පිණිස පවතී. කස්සපයෙනි, සමාධිසම්බොජ්ඣඞ්ගය මවිසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතී. කස්සපයෙනි, උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගය, මවිසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතී. කස්සපයෙනි, මේ සත්ත බොජ්ඣඞ්ගයෝ මවිසින් මැනවින් පවසන ලද්දහු වඩන ලද්දහු බහුල කරන ලද්දහු වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතිත්'' යි.

''භාග්‍යවතුන්වහන්ස, බොජ්ඣඞ්ගයෝ ඒකාන්තයහ. සුගතයන් වහන්ස, බොජ්ඣඞ්ගයෝ ඒකාන්තයහ'' යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදළ සේක. සතුටු සිත් ඇති ඇවත් මහසුප් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ ගේ දේශනාව සතුටින් පිළිගත්හ. ඇවත් මහසුප් තෙරණුවෝ ඒ ආබාධයෙන් ද නැගී සිටියහ. ඇවත් මහසුප් තෙරණුවන්ගේ ඒ ආබාධය එසේ පහවූයේ ම විය.

## 2. 2. 5

## දුතිය ගිලානසුත්තං

561. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා මහාමොග්ගල්ලානො ගිජ්ඣකූටෙ පබ්බතෙ විහරති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා මහාමොග්ගල්ලානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා ආයස්මන්තං මහාමොග්ගල්ලානං එතදවොච: කච්චි තෙ මොග්ගල්ලාන, ඛමනීයං? කච්චි යාපනීයං? කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති? පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති? න මෙ භන්තෙ ඛමනීයං න යාපනීයං. බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති, නො පටික්කමන්ති. අභික්කමොසානං පඤ්ඤායති, නො පටික්කමොති.

සත්තිමෙ මොග්ගල්ලාන, බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඛො මොග්ගල්ලාන, මයා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. ඉමෙ ඛො මොග්ගල්ලාන, සත්ත බොජ්ඣඞ්ගා මයා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තීති.

තග්ඝ භගව, බොජ්ඣඞ්ගා තග්ඝ සුගත, බොජ්ඣඞ්ගාති.

''ඉදමවොච භගවා. අත්තමනො ආයස්මා මහාමොග්ගල්ලානො භගවතො භාසිතං අභිනන්දි. වුට්ඨාහි චායස්මා මහාමොග්ගල්ලානො තම්හා ආබාධා. තථා පහීනො චායස්මතො මහාමොග්ගල්ලානස්ස සො ආබාධො අහොසීති.

## 2. 2. 6

## තතිය ගිලානසුත්තං

562. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන භගවා ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො ආයස්මා මහාචුන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො ආයස්මන්තං මහාචුන්දං භගවා එතදවොච:

## 2. 2. 5

## දුතියගිලාන සූත්‍රය

561. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝ රෝගී ව හටගත් දුක් ඇති ව දැඩි-ගිලන් ව ගිජ්ඣකූළපර්වතයෙහි වැඩවෙසෙති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කල පලසමවතින් නැගී සිටිසේක් ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන් වෙත එළඹි සේක. එළඹ පැනවූ අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් මහමුගලන් තෙරණුවන්ට මෙය වදාළ සේක. ''මොග්ගල්ලානයෙනි, කිම තොපට ඉවසිය හැකි ද? කිම? යැපිය හැකි ද? කිම දුක්වේදනාවෝ අඩු වෙද්ද? වැඩි නො වෙද්ද? මොවුන්ගේ අඩුවීම පෙණේ ද? වැඩිවීමෙක් නො පෙණේ ද?''යි. ''වහන්ස, මට ඉවසිය නො හැක්ක. යැපිය නො හැක්ක. මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩි වෙත්. අඩු නො වෙත්. මොවුන්ගේ වැඩිවීම පෙණේ. අඩුවීමෙක් නො පෙණේ'' යි.

''මොග්ගල්ලානයෙනි, මේ සත් බොජ්ඣඞ්ග කෙනෙක් මවිසින් මැනවින් පවසන ලද්දහු වඩන ලද්දහු බහුල කරන ලද්දහු වෙසෙස් දැනුම පිණිස මනාඅවබෝධය පිණිස නිවන පිණිස පවතිත්. කවර සතෙක් ද යත්: මුගලන, සිහිසම්බොජ්ඣඞ්ග මවිසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනාඅවබෝධය පිණිස නිවන පිණිස පවතී ... මුගලන, උපේක්ඛාසම්බොජ්ඣඞ්ග මවිසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතී. මුගලන, මේ සත් බොජ්ඣඞ්ග මවිසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනාඅවබෝධය පිණිස නිවන පිණිස පවතී''යි.

''භාග්‍යවතුන් වහන්ස, සත් බොජ්ඣඞ්ග ඒකාන්ත ය, සුගතයන් වහන්ස, සත්බොජ්ඣඞ්ග ඒකාන්ත ය'' යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටුසිත් ඇති ඇවත් මහමුගලන් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ. ඇවත් මහමුගලන් තෙරණුවෝ ද ඒ ආබාධයෙන් නැගී සිටියහ. ඇවත් මහමුගලන් තෙරණුවන් ගේ ඒ ආබාධය එසේ පහවූයේ ම වී ය.

## 2. 2. 6

## තතියගිලාන සූත්‍රය

562. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ හටගත් ආබාධ ඇත්සේක් දුක් ඇතිසේක් දැඩි ගිලන් වූ සේක් වෙති. එකල්හි ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් මහාචුන්ද තෙරණු-වනට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක:

පටිභාතු තං චුන්ද, බොජ්ඣඞ්ගාති. සත්තිමෙ භන්තෙ බොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො ඛො භන්තෙ, භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඛො භන්තෙ, භගවතා සම්මදක්ඛාතො භාවිතො බහුලීකතො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. ඉමෙ ඛො භන්තෙ, සත්ත බොජ්ඣඞ්ගා භගවතා සම්මදක්ඛාතා භාවිතා බහුලීකතා අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තීති.

තග්ඝ චුන්ද, බොජ්ඣඞ්ගා තග්ඝ චුන්ද, බොජ්ඣඞ්ගාති.

ඉදමවොචායස්මා මහාචුන්දො, සමනුඤ්ඤො සත්ථා අහොසි. වුට්ඨාහි ච භගවා තම්හා ආබාධා. තථා පහීනො ච භගවතො සො ආබාධො අහොසීති.

## 2. 2. 7

## අපාරසුත්තං

563. සත්තිමෙ භික්ඛවෙ, බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා අපාරා පාරං ගමනාය සංවත්තන්ති. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉමෙ ඛො භික්ඛවෙ, සත්තබොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා අපාරා පාරං ගමනාය සංවත්තන්තීති. ඉදමවොච -පෙ- සත්ථා.[1]

1. අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො,
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති.

2. යෙ ච ඛො සම්මදක්ඛාතෙ ධම්මෙ ධම්මානුවත්තිනො,
තෙ ජනා පාරමෙස්සන්ති මච්චුධෙය්‍යං සුදුත්තරං.

3. කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො,
ඔකා අනොකං ආගම්ම[1] විවෙකෙ යත්ථ දූරමං.

4. තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො,
පරියොදපෙය්‍ය අත්තානං චිත්තක්ලෙසෙහි පණ්ඩිතො.

5. යෙසං සම්බොධිඅඞ්ගෙසු[2] සම්මා චිත්තං සුභාවිතං,
ආදානපටිනිස්සග්ගෙ අනුපාදාය යෙ රතා,
ඛීණාසවා ජුතිමන්තො තෙ ලොකෙ පරිනිබ්බුතාති.

---

1. අනොකමාගම්ම – මජසං, සයා,
2. සම්බොධියඞ්ගෙසු – මජසං, සයා.

"චුන්දයෙනි, තොපට බොජ්ඣඞ්ගයෝ වැටහෙත්වා" යි. "වහන්ස, මේ සප්තබොජ්ඣඞ්ග කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් පවසන ලද්දහු වඩන ලද්දහු බහුල කරන ලද්දහු වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතිත්. කවර සතෙක් ද? යත්: වහන්ස, සතිසම්බොජ්ඣඞ්ගය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතී. ... වහන්ස, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් පවසන ලද්දේ වඩන ලද්දේ බහුල කරන ලද්දේ වෙසෙස් දැනුම පිණිස මනා අවබෝධය පිණිස නිවන පිණිස පවතී. වහන්ස, මේ සත් බොජ්ඣඞ්ගයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් මැනවින් පවසන ලද්දහු වඩන ලද්දහු බහුල කරන ලද්දහු වෙසෙස් දැනුම පිණිස මනාඅවබෝධය පිණිස නිවන පිණිස පවතිත්" යි.

"චුන්දයෙනි, බොජ්ඣඞ්ගයෝ ඒකාන්තයහ. චුන්දයෙනි, බොජ්ඣඞ්ගයෝ ඒකාන්තයහ" යි.

ආයුෂ්මත් මහාචුන්ද තෙරණුවෝ මෙය වදළහ: ශාස්තෲන් වහන්සේ පිළිගත්සේක් වූහ. භාග්‍යවතුන් වහන්සේ ඒ ආබාධයෙන් නැගී සිටි සේක. භාග්‍යවතුන් වහන්සේගේ ඒ ආබාධය එසේ පහවූයේ ම වී ය.

## 2. 2. 7

## අපාර සූත්‍රය

**183. මහණෙනි,** මේ සත් බොජඞ්ග කෙනෙක් වඩන ලද්දහු බහුල කරන ලද්දහු මෙතෙරින් එතෙරට යෑම පිණිස පවතිත්. කවර සතෙක් ද යත්: සතිසම්බොජ්ඣඞ්ගය ... උපේක්ඛාසම්බොජ්ඣඞ්ග යි. මහණෙනි, මේ සත්බොජඞ්ග දහම්හු වඩන ලද්දහු බහුල කරන ලද්දහු මෙතෙරින් එතෙරට යෑම පිණිස පවතිති යි. මෙය වදළ සේක ... ශාස්තෲන් වහන්සේ:

1. "යම් ජනකෙනෙක් පරතෙරට යනසුලු වෙද්ද මිනිසුන් අතර ඔහු අල්පයහ. වැලි මේ ඉතිරි ප්‍රජාව ඉවුර අනුව ම (-සසරෙහිම) දුවයි.

2. යම් කෙනෙකුත් මොනවට වදහළ දහම්හි දහම් අනුව පවතිනසුලු වෙද්ද ඒ ජනයෝ සුදුස්තර වූ මාරධෙයය (-සසර) හැර පරතෙරට යන්නාහ.

3.4. පණ්ඩිත තෙමේ අකුසල් දහම් දුරු කොට කුසල් දහම් වඩන්නේ ය. නිවණ් ඇරබ සසරින් කාමයන් අත්හැර පලිබෝධ නැති ව යම් විවේකයෙක දුක්කරයේ ඇලිය යුතු නම් එහි ඇලීම කැමැති වන්නේ ය. පණ්ඩිත තෙමේ කෙලෙසුන්ගෙන් සිත පිරිසිදු කරන්නේ ය.

5. යම් කෙනකුන්ගේ සිත බොධ්‍යඞ්ගයන්හි මැනැවින් වඩන ලද ද, යම් කෙනෙක් උපාදාන රහිත ව නිවනෙහි ඇලුණාහු ද ලොවෙහි බැබළීම් ඇති ඒ රහත්හු පිරිනිවියාහු යි.

## 2. 2. 8

## ආරද්ධසුත්තං

564. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා විරද්ධා විරද්ධො තෙසං අරියො මග්ගො සම්මා දුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා ආරද්ධා ආරද්ධො තෙසං අරියො මග්ගො සම්මා දුක්ඛක්ඛයගාමී. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො යෙසං කෙසඤ්චි භික්ඛවෙ, ඉමෙ සත්ත-බොජ්ඣඞ්ගා විරද්ධා. විරද්ධො තෙසං අරියො මග්ගො සම්මා දුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා ආරද්ධා, ආරද්ධො තෙසං අරියො මග්ගො සම්මාදුක්ඛක්ඛයගාමීති.

## 2. 2. 9

## අරියසුත්තං

565. සත්තිමෙ භික්ඛවෙ, බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා අරියා නිය්‍යානිකා නිය්‍යන්ති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා අරියා නිය්‍යානිකා නිය්‍යන්ති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති.

## 2. 2. 10

## නිබ්බිදසුත්තං

566. සත්තිමෙ භික්ඛවෙ, බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තන්ති. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තීති.

### ගිලානවග්ගො දුතියො.

තත්‍රුද්දානං:

පාණා ද්වෙ සුරියූපමෙ ගිලානා අපරෙ තයො,
අපාරමාරද්ධාති ච අරියො නිබ්බිදාය වාති.

## 2. 2. 8

## ආරද්ධසූත්‍රය

564. මහණෙනි, යම් කිසි කෙනකුන් විසින් සත් බොජ්ඣඞ්ගයෝ වරදනලද නම් ඔවුන් විසින් මැනවින් දුක් ගෙවීමට යන අයථිමාගී වරදන ලද්දේ ය. මහණෙනි, යම් කිසි කෙනකුන් විසින් සත් බොජ්ඣඞ්ගයෝ අරඹන ලද්දහු නම් ඔවුන් විසින් මැනවින් දුක් ගෙවීමට යන ආයථිමාර්ගය අරඹන ලද්දේ ය. කවර සතෙක් ද? යත්: සතිසම්බොජ්ඣඞ්ගය... උපෙඛාසම්බොජ්ඣඞ්ග යි. මහණෙනි, යම් කිසි කෙනකුන් විසින් මේ සත් බොජ්ඣඞ්ගයෝ වරදන ලද්දහු නම් ඔවුන් විසින් මැනවින් දුක් ගෙවීමට යන ආයථිමාර්ගය වරදන ලද්දේ ය. මහණෙනි, යම් කිසි කෙනකුන් විසින් මේ සත් බොජ්ඣඞ්ගයෝ අරඹන ලද්දහු නම් ඔවුන් විසින් මැනවින් දුක් ගෙවීමට යන ආයථිමාර්ගය අරඹන ලද්දේ යි.

## 2. 2. 9

## අරිය සූත්‍රය

565. මහණෙනි, ආයථි වූ නෛයථිාණික වූ (තිවන කරා පමුණුවන) මේ සත් බොජඟ කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු ඒ අනුව පිළිපදින්නහු මැනවින් දුක් ගෙවීමට පමුණුවත්. කවර සතෙක් ද යත්: සිතිබොජඟ ... උපේසම්බොජඟ යි. මහණෙනි, ආයථි වූ නෛයථිාණික වූ මේ සත් බොජ්ඣඞ්ගයෝ වඩන ලදහු බහුල කරන ලදහු ඒ අනුව පිළිපදින්නහු මැනවින් දුක් ගෙවීමට පමුණුවති යි.

## 2. 2. 10

## නිබ්බිද සූත්‍රය

566. මහණෙනි, මේ සත් බොජ්ඣඞ්ග කෙනෙක් වඩන ලද්දහු බහුල කරන ලද්දහු ඒකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස ව්‍යුපශමය පිණිස විශිෂ්ට ඥානය පිණිස සම්බොධිය පිණිස නිර්වාණය පිණිස පවතිත්. කවර සතෙක් ද? යත්: සතිසම්බොජ්ඣඞ්ගය... උපෙඛාසම්බොජ්ඣඞ්ගය යි. මහණෙනි, මේ සත් බොජ්ඣඞ්ගයෝ වඩන ලද්දහු බහුල කරන ලද්දහු ඒකාන්ත නිර්වේදය පිණිස විරාගය පිණිස නිරෝධය පිණිස ව්‍යුපශමය පිණිස විශිෂ්ට ඥානය පිණිස සම්බොධිය පිණිස නිර්වාණය පිණිස පවතිත් යි.

## දෙවෙනි ගිලානවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

පාණසූත්‍රය ද සූරියූපම සූත්‍ර දෙක ද අනෙක් ගිලාන සූත්‍ර තුන ද අපාර, ආරද්ධ, අරිය, නිබ්බිද සූත්‍ර සතර ද යි දශ සූත්‍ර කෙනෙකි යි.

# 3. උදායිවග්ගො

## 2. 3. 1

### බොධායසුත්තං

567. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ''බොජ්ඣඞ්ගා බොජ්ඣඞ්ගාති'' භන්තෙ, වුච්චන්ති කිත්තාවතා නු ඛො භන්තෙ, බොජ්ඣඞ්ගාති වුච්චන්තීති. බොධාය[1] සංවත්තන්තීති ඛො භික්ඛු තස්මා බොජ්ඣඞ්ගාති වුච්චන්ති. ඉධ භික්ඛු[2] භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. බොධාය සංවත්තන්තීති ඛො භික්ඛු තස්මා බොජ්ඣඞ්ගාති වුච්චන්තීති.

## 2. 3. 2

### දෙසනාසුත්තං

568. සත්තිමෙ[3] භික්ඛවෙ, බොජ්ඣඞ්ගෙ දෙසිස්සාමි, තං සුණාථ. කතමෙ ච භික්ඛවෙ, සත්තබොජ්ඣඞ්ගා: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගාති.

## 2. 3. 3

### ඨානසුත්තං

569. කාමරාගට්ඨානියානං භික්ඛවෙ, ධම්මානං මනසිකාරබහුලීකාරා අනුප්පන්නො චෙව කාමච්ඡන්දො උප්පජ්ජති, උප්පන්නො ච කාමච්ඡන්දො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. බ්‍යාපාදට්ඨානියානං භික්ඛවෙ, මනසිකාරබහුලීකාරා අනුප්පන්නො චෙව බ්‍යාපාදො උප්පජ්ජති, උප්පන්නො ච බ්‍යාපාදො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. ථීනමිද්ධට්ඨානියානං භික්ඛවෙ, ධම්මානං මනසිකාරබහුලීකාරා අනුප්පන්නඤ්චෙව ථීනමිද්ධං උප්පජ්ජති, උප්පන්නඤ්ච ථීනමිද්ධං භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. උද්ධච්චකුක්කුච්චට්ඨානියානං භික්ඛවෙ, ධම්මානං මනසිකාරබහුලීකාරා අනුප්පන්නඤ්චෙව උද්ධච්චකුක්කුච්චං උප්පජ්ජති, උප්පන්නඤ්ච උද්ධච්චකුක්කුච්චං භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. විචිකිච්ඡාට්ඨානියානං භික්ඛවෙ, ධම්මානං මනසිකාරබහුලීකාරා අනුප්පන්නා චෙව විචිකිච්ඡා උප්පජ්ජති, උප්පන්නා ච විචිකිච්ඡා භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති.

---

1. සම්බොධාය - ස්‍යා,
2. ඉධ භික්ඛවෙ භික්ඛු - සී, 1, 2, ස්‍යා,
3. සත්ත ඉමෙ භික්ඛවෙ - මජ්සං, ස්‍යා.

# 3. උදායීවර්ගය

## 2. 3. 1

## බෝධාය සූත්‍රය

567. ඉක්බිති එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: "වහන්ස, බොජ්ඣඞ්ගයෝ යැ බොජ්ඣඞ්ගයෝ යැ යි කියනු ලැබෙත්. වහන්ස, කෙතෙකින් බොජ්ඣඞ්ගයෝයි කියනු ලැබෙද්ද" යි. මහණ, අවබෝධය පිණිස පවතිත් නු යි. එහෙයින් බොජ්ඣඞ්ගයෝ යි කියනු ලැබෙත්. මහණ, මෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත සතිසම්බොජ්ඣඞ්ගය ව්‍යොස්සග්ගපරිණාමී කොට වඩ යි. ... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩ යි. මහණ, අවබෝධය පිණිස පවතිත් නු යි. එහෙයින් බොජ්ඣඞ්ගයෝ යි කියනු ලැබෙති යි.

## 2. 3. 2

## දේසනා සූත්‍රය

568. මහණෙනි, මේ සත් බොජ්ඣඞ්ග දේශනා කරමි. එය අසව. මහණෙනි, සත් බොජ්ඣඞ්ගු කවරහු ද යත්: සිහිසම්බොජ්ඣඞ්ග ... උපේසම්බොජ්ඣඞ්ග යි. මහණෙනි, මොහු සත් බොජ්ඣඞ්ග යි.

## 2. 3. 3

## ඨාන සූත්‍රය

569. මහණෙනි, කාමරාගයට කරුණු වූ දහම් මෙනෙහි කිරීම බහුල කිරීමෙන් නූපන් කාමච්ඡන්දයත් උපදී. උපන් කාමච්ඡන්දයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. මහණෙනි, ව්‍යාපාදයට කරුණු වූ දහම් මෙනෙහි කිරීම බහුල කිරීමෙන් නූපන් ව්‍යාපාදයත් උපදී. උපන් ව්‍යාපාදයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. මහණෙනි, ථීනමිද්ධයට කරුණු වූ දහම් මෙනෙහි කිරීම බහුල කිරීමෙන් නූපන් ථීනමිද්ධයත් උපදී. උපන් ථීනමිද්ධයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. මහණෙනි, උද්ධච්චකුක්කුච්චයට කරුණු වූ දහම් මෙනෙහි කිරීම බහුල කිරීමෙන් නූපන් උද්ධච්චකුක්කුච්චයත් උපදී. උපන් උද්ධච්චකුක්කුච්චයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. මහණෙනි, විචිකිච්ඡාවට කරුණු වූ දහම් මෙනෙහි කිරීම බහුල කිරීමෙන් නූපන් විචිකිච්ඡාවත් උපදී, උපන් විචිකිච්ඡාවත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී.

සතිසම්බොජ්ඣඞ්ගට්ඨානියානං භික්ඛවෙ, ධම්මානං මනසිකාරබහුලීකාරා අනුප්පන්නො චෙව සතිසම්බොජ්ඣඞ්ගො උප්පජ්ජති, උප්පන්නො ච සතිසම්බොජ්ඣඞ්ගො භාවනාපාරිපූරිං ගච්ඡති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගට්ඨානියානං භික්ඛවෙ, ධම්මානං මනසිකාරබහුලීකාරා අනුප්පන්නො චෙව උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො උප්පජ්ජති, උප්පන්නො ච උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො භාවනාපාරිපූරිං ගච්ඡතීති.

## 2. 3. 4

## යොනිසොසුත්තං

570. අයොනිසො භික්ඛවෙ, මනසිකරොතො අනුප්පන්නො චෙව කාමච්ඡන්දො උප්පජ්ජති, උප්පන්නො ච කාමච්ඡන්දො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අනුප්පන්නො චෙව ව්‍යාපාදො උප්පජ්ජති, උප්පන්නො ච ව්‍යාපාදො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අනුප්පන්නඤ්චෙව ථීනමිද්ධං උප්පජ්ජති උප්පන්නඤ්ච ථීනමිද්ධං භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අනුප්පන්නඤ්චෙව උද්ධච්චකුක්කුච්චං උප්පජ්ජති, උප්පන්නඤ්ච උද්ධච්චකුක්කුච්චං භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අනුප්පන්නා චෙව විචිකිච්ඡා උප්පජ්ජති උප්පන්නා ච විචිකිච්ඡා භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති. අනුප්පන්නො ච සතිසම්බොජ්ඣඞ්ගො නුප්පජ්ජති, උප්පන්නො ච සතිසම්බොජ්ඣඞ්ගො නිරුජ්ඣති -පෙ- අනුප්පන්නො ච උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො නුප්පජ්ජති, උප්පන්නො ච උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො නිරුජ්ඣති.

යොනිසො භික්ඛවෙ, මනසිකරොතො අනුප්පන්නො චෙව කාමච්ඡන්දො නුප්පජ්ජති උප්පන්නො ච කාමච්ඡන්දො පහීයති. අනුප්පන්නො චෙව ව්‍යාපාදො නුප්පජ්ජති, උප්පන්නො ච ව්‍යාපාදො පහීයති. අනුප්පන්නඤ්චෙව ථීනමිද්ධං නුප්පජ්ජති, උප්පන්නඤ්ච ථීනමිද්ධං පහීයති. අනුප්පන්නඤ්චෙව උද්ධච්චකුක්කුච්චං නුප්පජ්ජති, උප්පන්නඤ්ච උද්ධච්චකුක්කුච්චං පහීයති. අනුප්පන්නා චෙව විචිකිච්ඡා නුප්පජ්ජති, උප්පන්නා ච විචිකිච්ඡා පහීයති. අනුප්පන්නො ච සතිසම්බොජ්ඣඞ්ගො උප්පජ්ජති, උප්පන්නො ච සතිසම්බොජ්ඣඞ්ගො භාවනාපාරිපූරිං ගච්ඡති -පෙ- අනුප්පන්නො ච උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො උප්පජ්ජති, උප්පන්නො ච උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො භාවනාපාරිපූරිං ගච්ඡතීති.

## 2. 3. 5

## අපරිහානියසුත්තං

571. සත්ත වො භික්ඛවෙ, අපරිහානියෙ ධම්මෙ දෙසිස්සාමි, තං සුණාථ. කතමෙ ච භික්ඛවෙ, සත්ත අපරිහානියා ධම්මා: යදිදං සත්ත බොජ්ඣඞ්ගා. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත අපරිහානියා ධම්මාති.

මහණෙනි, සතිසම්බොජ්ඣඞ්ගයට කරුණු වූ දහම් මෙනෙහි කිරීම බහුල කිරීමෙන් නූපන් සතිසම්බොජ්ඣඞ්ගයත් උපදී උපන් සතිසම්බොජ්ඣඞ්ගයත් වැඩීමෙන් පිරීමට යේ ... මහණෙනි, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයට කරුණු වූ දහම් මෙනෙහි කිරීම බහුල කිරීමෙන් නූපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයත් උපදී. උපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයත් වැඩීමෙන් පිරීමට යේ යි.

## 2. 3. 4

## යෝනිසෝ සූත්‍රය

570. මහණෙනි, නුනුවණින් මෙනෙහි කරන්නහුට නූපන් කාමච්ඡන්දයත් උපදී. උපන් කාමච්ඡන්දයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. නූපන් ව්‍යාපාදයත් උපදී. උපන් ව්‍යාපාදයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. නූපන් ථීනමිද්ධයත් උපදී. උපන් ථීනමිද්ධයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. නූපන් උද්ධච්චකුක්කුච්චයත් උපදී. උපන් උද්ධච්චකුක්කුච්චයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. නූපන් විචිකිච්ඡාවත් උපදී. උපන් විචිකිච්ඡාවත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. නූපන් සතිසම්බොජ්ඣඞ්ගයත් නූපදී. උපන් සතිසම්බොජ්ඣඞ්ගයත් නිරුද්ධ වෙයි ... නූපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයත් නූපදී. උපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයත් නිරුද්ධ වේ.

මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නහුට නූපන් කාමච්ඡන්දයත් නූපදී. උපන් කාමච්ඡන්දයත් ප්‍රහීණ වෙයි. නූපන් ව්‍යාපාදයත් නූපදී. උපන් ව්‍යාපාදයත් ප්‍රහීණ වෙයි. නූපන් ථීනමිද්ධයත් නූපදී. උපන් ථීනමිද්ධයත් ප්‍රහීණ වෙයි. නූපන් උද්ධච්චකුක්කුච්චයත් නූපදී. උපන් උද්ධච්චකුක්කුච්චයත් ප්‍රහීණ වෙයි. නූපන් විචිකිච්ඡාවත් නූපදී. උපන් විචිකිච්ඡාවත් ප්‍රහීණ වෙයි. නූපන් සතිසම්බොජ්ඣඞ්ගයත් උපදී. උපන් සතිසම්බොජ්ඣඞ්ගයත් වැඩීමෙන් පිරීමට යෙයි. ... නූපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයත් උපදී. උපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයත් වැඩීමෙන් පිරීමට යේ යි.

## 2. 3. 5

## අපරිහානිය සූත්‍රය

571. මහණෙනි, සත්අපරිහානිය (නො පිරිහීමට කරුණු වූ) දහම් තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, සත්අපරිහානිය දහම් කවරහු ද යත්: මේ සත්තබොජ්ඣඞ්ගයෝ යි. කවර සතෙක් ද යත්: සතිසම්බොජ්ඣඞ්ගය ... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය යි. මහණෙනි, මොහු සත්අපරිහානිය දහම්හු යි.

## 2. 3. 6

## භයසුත්තං

572. යො භික්ඛවෙ, මග්ගො යා පටිපදා තණ්හක්ඛයාය සංවත්තති[1], තං මග්ගං තං පටිපදං භාවෙථ. කතමො ච භික්ඛවෙ, මග්ගො කතමා ච පටිපදා තණ්හක්ඛයාය සංවත්තති: යදිදං සත්ත-බොජ්ඣඞ්ගා. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගොති. එවං වුත්තෙ ආයස්මා උදායි භගවන්තං එතදවොච: කථං භාවිතා නු බො භන්තෙ, සත්ත බොජ්ඣඞ්ගා කථං බහුලීකතා තණ්හක්ඛයාය සංවත්තන්තීති.

ඉධුදායි, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං විපුලං[2] මහග්ගතං අප්පමාණං අබ්‍යාපජ්ඣං. තස්ස සතිසම්බොජ්ඣඞ්ගං භාවයතො විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං විපුලං මහග්ගතං අප්පමාණං අබ්‍යාපජ්ඣං. තණ්හා පහීයති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං විපුලං මහග්ගතං අප්පමාණං අබ්‍යාපජ්ඣං. තස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවයතො විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං විපුලං මහග්ගතං අප්පමාණං අබ්‍යාපජ්ඣං. තණ්හා පහීයති. තණ්හාය පහානා කම්මං පහීයති. කම්මස්ස[3] පහානා දුක්ඛං පහීයති. ඉති ඛො උදායි, තණ්හක්ඛයා කම්මක්ඛයො. කම්මක්ඛයා දුක්ඛක්ඛයොති.

## 2. 3. 7

## නිරොධසුත්තං

573. යො භික්ඛවෙ, මග්ගො යා පටිපදා තණ්හානිරොධාය සංවත්තති, තං මග්ගං තං පටිපදං භාවෙථ. කතමො ච භික්ඛවෙ, මග්ගො කතමා පටිපදා තණ්හානිරොධාය සංවත්තති: යදිදං සත්ත බොජ්ඣඞ්ගා. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගො. කථං භාවිතා ච භික්ඛවෙ සත්ත බොජ්ඣඞ්ගා කථං බහුලීකතා තණ්හානිරොධාය සංවත්තන්ති: ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා එවං බහුලීකතා තණ්හානිරොධාය සංවත්තන්තීති.

1. සංවත්තන්ති - සී, 1, 2.
2. වෙපුල්ලං - සී 1, 2.
3. පහානාය - සී 1, 2.

## 2. 3. 6

## ඛයසූත්‍රය

572. මහණෙනි, යම් මඟෙක් යම් පිළිවෙතෙක් තෘෂ්ණාක්ෂයය පිණිස පවතී නම් ඒ මඟ ඒ පිළිවෙත වඩවු. මහණෙනි, කවර මඟෙක් කවර පිළිවෙතෙක් තෘෂ්ණාක්ෂයය පිණිස පවතී ද: මේ සත්තබොජ්ඣඞ්ග-යෝ යි. කවර සතෙක් ද යත්: සතිසම්බොජ්ඣඞ්ග ය ... උපෙක්ඛා සම්බොජ්ඣඞ්ග යි. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් උදායි ස්ථවිර භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: "වහන්ස, සත්-බොජ්ඣඞ්ගයෝ කෙසේ වඩන ලද්දාහු කෙසේ බහුල කරන ලද්දාහු තෘෂ්ණාක්ෂය පිණිස පවතිද්දෝ යි.

උදායි, මෙහි මහණ විවේකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත ව්‍යවස්සග්ගපරිණාමී කොට පැතුරුණක් මහත් බවට පැමිණියක් අප්‍රමාණ වූවක් නිදුක් වූවක් කොට සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත ව්‍යවස්සග්ගපරිණාමී කොට විපුල මහග්ගත අප්‍රමාණ අව්‍යාපජ්ඣ කොට සතිසම්බො-ජ්ඣඞ්ගය වඩන ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණ වෙයි ... විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත ව්‍යවස්සග්ගපරිණාමී කොට විපුල මහග්ගත අප්පමාණ අව්‍යාපජ්ඣ කොට උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත ව්‍යවස්සග්ගපරිණාමී කොට විපුල මහග්ගත අප්පමාණ අව්‍යාපජ්ඣ කොට උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩන ඔහුගේ තෘෂ්ණාව ප්‍රහීණ වේ. තෘෂ්ණාව ප්‍රහීණ වීමෙන් කර්මය ප්‍රහීණ වේ. කර්මය ප්‍රහීණ වීමෙන් දුක ප්‍රහීණ වේ. උදායි, මෙසේ තෘෂ්ණාක්ෂයයෙන් කර්මක්ෂය වේ. කර්මක්ෂයයෙන් දුඃඛක්ෂය වේ යි.

## 2. 3. 7

## නිරෝධසූත්‍රය

573. මහණෙනි, යම් මඟෙක් යම් පිළිවෙතෙක් තෘෂ්ණානිරෝධය පිණිස පවතී නම් ඒ මඟ ඒ පිළිවෙත වඩවු. මහණෙනි, කවර මඟෙක් කවර පිළිවෙතෙක් තෘෂ්ණානිරෝධය පිණිස පවතී ද? මේ සත් බොජ්ඣඞ්ගයෝ යි, කවර සතෙක් ද යත්: සතිසම්බොජ්ඣඞ්ග ය ... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග යි. මහණෙනි, සත් බොජ්ඣඞ්ගයෝ කෙසේ වඩන ලද්දාහු කෙසේ බහුල කරන ලද්දාහු තෘෂ්ණානිරෝධය පිණිස පවතිද් ද යත්: මහණෙනි, මෙහි මහණ විවේකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත ව්‍යවස්සග්ගපරිණාමී කොට සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, සත් බොජ්ඣඞ්ගයෝ මෙසේ වඩන ලද්දාහු මෙසේ බහුල කරන ලද්දාහු තෘෂ්ණානිරෝධය පිණිස පවතිත් යි.



Free Distribution www.aathaapi.org

## 2. 3. 8

## නිබ්බෙධසුත්තං

574. නිබ්බෙධභාගියං වො භික්ඛවෙ, මග්ගං දෙසිස්සාමි. තං සුණාථ. කතමො ච භික්ඛවෙ, නිබ්බෙධභාගියො මග්ගො යදිදං සත්ත බොජ්ඣඞ්ගා. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගොති. එවං වුත්තෙ ආයස්මා උදායි භගවන්තං එතදවොච: කථං භාවිතා නු ඛො භන්තෙ, සත්ත බොජ්ඣඞ්ගා කථං බහුලීකතා නිබ්බෙධාය සංවත්තන්තීති.

ඉධුදායි, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං විපුලං මහග්ගතං අප්පමාණං අබ්‍යාපජ්ඣං. සො සතිසම්බොජ්ඣඞ්ගං භාවිතෙන[1] චිත්තෙන අනිබ්බිද්ධපුබ්බං අප්පදලිතපුබ්බං ලොභක්ඛන්ධං නිබ්බිජ්ඣති, පදලෙති. අනිබ්බිද්ධපුබ්බං අප්පදලිතපුබ්බං දොසක්ඛන්ධං නිබ්බිජ්ඣති පදලෙති. අනිබ්බිද්ධපුබ්බං අප්පදලිතපුබ්බං මොහක්ඛන්ධං නිබ්බිජ්ඣති පදලෙති. -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං විපුලං මහග්ගතං අප්පමාණං අබ්‍යාපජ්ඣං. සො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවිතෙන චිත්තෙන අනිබ්බිද්ධපුබ්බං අප්පදලිතපුබ්බං ලොභක්ඛන්ධං නිබ්බිජ්ඣති පදලෙති. අනිබ්බිද්ධපුබ්බං අප්පදලිතපුබ්බං දොසක්ඛන්ධං නිබ්බිජ්ඣති පදලෙති, අනිබ්බිද්ධපුබ්බං අප්පදලිතපුබ්බං මොහක්ඛන්ධං නිබ්බිජ්ඣති පදලෙති. එවං භාවිතා ඛො උදායි, සත්ත බොජ්ඣඞ්ගා එවං බහුලීකතා නිබ්බෙධාය[2] සංවත්තන්තීති.

## 2. 3. 9

## එකධම්මසුත්තං

575. නාහං භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙ[3] එවං භාවිතා බහුලීකතා[4] සංයොජනියානං ධම්මානං පහානාය සංවත්තන්ති[5]. යථයිදං භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. කථං භාවිතා ච භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා කථං බහුලීකතා සංයොජනියානං ධම්මානං පහානාය සංවත්තන්ති. ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා එවං බහුලීකතා සංයොජනියානං ධම්මානං පහානාය සංවත්තන්ති. කතමෙ ච භික්ඛවෙ, සංයොජනියා ධම්මා: චක්ඛුං භික්ඛවෙ, සංයොජනියො ධම්මො. එත්ථෙතෙ උප්පජ්ජන්ති සංයොජනවිනිබද්ධා අජ්ඣොසානා. -පෙ- ජිව්හා සංයොජනියො ධම්මො. එත්ථෙතෙ උප්පජ්ජන්ති සංයොජනවිනිබද්ධා අජ්ඣොසානා -පෙ- මනොසංයොජනියො ධම්මො. එත්ථෙතෙ උප්පජ්ජන්ති සංයොජනවිනිබද්ධා අජ්ඣොසානා. ඉමෙ වුච්චන්ති භික්ඛවෙ, සංයොජනියා ධම්මාති.

1. සතිසම්බොජ්ඣඞ්ගභාවිතෙන - සයා.
2. නිබ්බානාය සී 1. 2.
3. යො - මජසං, සයා.
4. භාවිතො බහුලීකතො - මජසං, සයා.
5. සංවත්තති - මජසං, සයා.

## 2. 3. 8

## නිබ්බේධ සූත්‍රය

674. මහණෙනි, නිබ්බේධභාගිය (කෙලෙස් නැසීමට හිත) මාර්ගය තොපට දේශනා කරන්නෙමි, එය අසව්. මහණෙනි, නිබ්බේධභාගිය මාර්ගය කවරේ ද: මේ සත් බොජ්ඣඞ්ගයෝ යි. කවර සතෙක් ද යත්: සතිසම්බොජ්ඣඞ්ගය ... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග යි. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් උදායි ස්ථවිර භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය. "වහන්ස, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද සත් බොජ්ඣඞ්ගයෝ කෙලෙස් නැසීම පිණිස පවතිද් ද යි.

උදායි, මෙසස්නෙහි මහණ විවේකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත සතිසම්බොජ්ඣඞ්ගය වොස්සග්ගපරිණාමි කොට විපුල මහග්ගත අප්පමාණ අබ්‍යාපජ්ඣ කොට වඩයි. හෙතෙමේ සතිසම්බොජ්ඣඞ්ගය වැඩූ සිතින් නොනැසූවිරූ නොපැලූවිරූ ලොභසමූහය නසයි, පලයි. නොනැසූවිරූ නොපැලූවිරූ ද්වේෂසමූහය නසයි, පලයි. නොනැසූවිරූ නොපැලූවිරූ මෝහසමූහය නසයි, පලයි ... විවේකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වොස්සග්ගපරිණාමි කොට විපුල මහග්ගත අප්පමාණ අබ්‍යාපජ්ඣ කොට වඩයි. හෙතෙමේ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වැඩූ සිතින් නොනැසූවිරූ නොපැලූවිරූ ලෝභසමූහය නසයි, පලයි. නොනැසූවිරූ නොපැලූවිරූ ද්වේෂසමූහය නසයි, පලයි. නොනැසූවිරූ නොපැලූවිරූ මෝහසමූහය නසයි, පලයි. උදායි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද සත් බොජ්ඣඞ්ගයෝ කෙලෙස් නැසීම පිණිස පවතිත් යි.

## 2. 3. 9

## ඒකධම්ම සූත්‍රය

575. මහණෙනි, යම් දහම් කෙනෙක් මෙසේ වඩන ලදහු මෙසේ බහුල කරන ලදහු සංයෝජනයන්ට කරුණු වූ දහම් ප්‍රහාණ පිණිස පවතිද්ද මහණෙනි, මේ සත්බොජඞ්ග යම්බඳු නම් එබඳු එක් දහමකු දු මම නො ම දකිමි. කවර සතෙක් ද යත්: සිහිසම්බොජඞ්ග ... උපේසම්බොජඞ්ග යි. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද සත්බොජඞ්ග සංයෝජනයන් ට කරුණු වූ දහම් ප්‍රහාණ පිණිස පවතී ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත සිහිසම්බොජඞ්ග වොස්සග්ගපරිණාමි කොට වඩයි ... උපේසම්බොජඞ්ග වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද සත් බොජඞ්ග සංයෝජනයන් ට කරුණු වූ දහම් ප්‍රහාණ පිණිස පවතී. මහණෙනි, සංයෝජනයන් ට කරුණු වූ දහම් කවරහු ද යත්: මහණෙනි, ඇස සංයොජනයන් ට කරුණු වූ දහමෙකි. මෙහි තෙල සංයොජනයන් විසින් බඳනාලද අධ්‍යවසානයෝ (බැසැගැනීම්) උපදනාහ. ... දිව සංයෝජනයන්ට කරුණු වූ දහමෙකි. මෙහි තෙල සංයෝජනයන් විසින් බඳනාලද අධ්‍යවසානයෝ (බැසැගැනීම්) උපදනාහ. ... සිත සංයෝජනයන්ට කරුණු වූ දහමෙකි. මෙහි තෙල සංයෝජනයන් විසින් බඳනාලද අධ්‍යවසානයෝ (බැසැගැනීම්) උපදනාහ. මහණෙනි, මොහු සංයෝජනයන්ට කරුණු වූ දහම්හු යි කියනු ලැබෙත් යි.

## 2. 3. 10

## උදයීසුත්තං

576. එකං සමයං භගවා සුම්භෙසු විහරති සෙතකං[1] නාම සුම්භානං නිගමො. අථ ඛො ආයස්මා උදයී යෙන භගවා තෙනුපසඞ්කමි. -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා උදයී භගවන්තං එතදවොච: අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, යාව බහුකතං ච[2] මෙ භන්තෙ, භගවති පෙමං ච ගාරවො ච හිරි ච ඔත්තප්පඤ්ච. අහං හි භන්තෙ, පුබ්බෙ 'අගාරිකභූතො සමානො අබහුකතො අහොසිං ධම්මෙන. අබහුකතො සඞ්ඝෙන. සො ඛ්වාහං භන්තෙ, භගවති පෙමං ච ගාරවං ච හිරිං[3] ච ඔත්තප්පඤ්ච සම්පස්සමානො අගාරස්මා අනගාරියං පබ්බජිං[4]. තස්ස මෙ භගවා ධම්මං දෙසෙසි: "ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො, ඉති වෙදනා -පෙ- ඉති සඤ්ඤා -පෙ- ඉති සඞ්ඛාරා -පෙ- ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථගමො"ති.

සො ඛ්වාහං භන්තෙ, සුඤ්ඤාගාරගතො ඉමෙසු පඤ්චසු උපාදානක්ඛන්ධෙසු[5] උක්කුජ්ජාවකුජ්ජං සම්පරිවත්තෙන්තො ඉදං දුක්ඛන්ති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛසමුදයොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛනිරොධොති යථාභූතං අබ්භඤ්ඤාසිං, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං අබ්භඤ්ඤාසිං. ධම්මො ච මෙ භන්තෙ, අභිසමිතො[6], මග්ගො ච පටිලද්ධො[7], යො මෙ භාවිතො බහුලීකතො තථා තථා විහරන්තං තථත්තාය උපනෙස්සති. යථාහං "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා"ති පජානිස්සාමි. සතිසම්බොජ්ඣඞ්ගො මෙ භන්තෙ, පටිලද්ධො, යො මෙ භාවිතො බහුලීකතො තථා තථා විහරන්තං තථත්තාය උපනෙස්සති; යථාහං "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා"ති පජානිස්සාමි -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඛො මෙ භන්තෙ, පටිලද්ධො යො මෙ භාවිතො බහුලීකතො තථා තථා විහරන්තං තථත්තාය උපනෙස්සති, යථාහං "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා"ති පජානිස්සාමි. අයං ඛො මෙ භන්තෙ, මග්ගො පටිලද්ධො, යො මෙ භාවිතො බහුලීකතො තථා තථා විහරන්තං තථත්තාය උපනෙස්සති; යථාහං "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා"ති පජානිස්සාමීති.

---

1. සෙදකං - සී 1, 2.
2. බහුකාරාපි - සයා.
3. ගාරවො ච හිරි ච - සී 1, 2.
4. පබ්බජිතො - මජසං, සීමු.
5. ඉමෙසං පඤ්චුපාදානක්ඛන්ධානං - මජසං, සයා.
6. අභිසමෙතො - සී 1, 2, සයා.
7. මග්ගො ච මෙ පටිලද්ධො - මජසං, සයා.

## 2. 3. 10

## උදායි සූත්‍රය

576. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සුම්භ දනව්වෙහි සේතක නම් සුම්භයන්ගේ නියම්ගම්හි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් උදායි ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පස්ව හුන් ආයුෂ්මත් උදායි ස්ථවිර භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, අසිරියෙකි. වහන්ස පුදුමයෙකි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වූ මාගේ ප්‍රේමයත් ගෞරවයත් හිරිඔතප් දෙකත් කෙතෙක් බුහුමන් කරන ලද ද, වහන්ස, මම පෙර ගිහි වූයෙම් ම දහමින් බුහුමන් නො කරන ලද්දෙම් වීමි. සඟන විසින් බුහුමන් නො කරන ලද්දෙම් වීමි. වහන්ස, ඒ මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රේමයත් ගෞරවයත් හිරිඔතප් දෙකත් දකිමින් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවීමි. ඒ මට භාග්‍යවතුන් වහන්සේ "රූපය මෙසේ ය, රූපයේ හටගැන්ම මෙසේ ය, රූපයේ අස්තඞ්ගමය මෙසේ ය, වේදනාව මෙසේ ය ... සංඥාව මෙසේ ය ... සංස්කාරයෝ මෙසේ ය ... විඥානය මෙසේ ය ... විඥානයේ හටගැන්ම මෙසේ ය ... විඥානයේ අස්තඞ්ගමය මෙසේ ය යි දහම් දෙසූ සේක.

වහන්ස, ඒ මම ශූන්‍යාගාරයට ගියෙම් මේ පඤ්චොපාදානස්කන්ධයෙහි උදයව්‍යය සම්මර්ශන කෙරෙමින් මේ (පඤ්චස්කන්ධය) දුකැ' යි තතුසේ දැනැගතිමි. මේ (තෘෂ්ණාසමුදය) දුඃඛසමුදයැ''යි තතු සේ දැනැ ගතිමි. මේ (තෘෂ්ණානිරොධය) දුඃඛනිරොධැයැ' යි තතුසේ දැන ගතිමි. මේ (ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගමාර්ගය) දුඃඛ නිරොධගාමිනීප්‍රතිපද යැ'යි තතුසේ දැනැගතිමි. වහන්ස, මා විසින් (විදර්ශනා) ධර්ම ද අවබෝධ කරන ලද යැ. (විදර්ශනා) මාර්ගය ද ලබන ලදි. මා විසින් යම් ධර්ම මාර්ගයෙක් භාවිත බහුලීකෘත වේ ද (හෙ) ඒ ඒ අයුරින් වාස කරන්නහු යම්සේ ''ජාතිය ක්ෂය විය. මහබඹසර වැසැ නිමවන ලද, කරණී කරන ලද, මෙ අත්බව පිණිස අන් කිසෙක් නැති''යි මම දනිම් නම් තථාභාවයට පමුණුවන්නේ යැ: වහන්ස, මා විසින් ස්මෘතිසම්බොධ්‍යඞ්ග ලබන ලද යැ. යම් බොධ්‍යඞ්ගයෙක් මා විසින් භාවිත බහුලීකෘත වූයේ ඒ ඒ අයුරින් වාස කරන්නහු යම්සේ ''ජාති ක්ෂය විය. මහබඹසර වැසැ නිමවන ලද, කරණී කරනලද, මෙ අත්බව පිණිස අන් කිසෙක් නැතැ''යි මම දනිම් නම් තථාභාවයට පමුණු වන්නේ යැ. ... වහන්ස, මා විසින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ග ලබන ලද. යම් බොධ්‍යඞ්ගයෙක් මා විසින් භාවිත බහුලීකෘත වූයේ ඒ ඒ අයුරින් වාස කරන්නහු යම්සේ ''ජාති ක්ෂය විය. මහබඹසර වැසැ නිමවන ලද, කරණී කරන ලද, මෙ අත්බවට අන් කිසෙක් නැතැ''යි මම දනිම් නම් තථාභාවයට පමුණුවන්නේ යැ. වහන්ස, මා විසින් මේ මාර්ගය ලබන ලද. මා විසින් යම් මාර්ගයෙක් භාවිත බහුලීකෘත වූයේ ඒ ඒ අයුරින් වාස කරන්නහු යම්සේ ''ජාති ක්ෂය විය, මහබඹසර වැසැ නිමවන ලද, කරණී කරන ලද මෙ අත්බවට අන් කිසෙක් නැතැ''යි මම දනිම් නම් තථාභාවයට පමුණු වන්නේ යැ''යි.

සාධු සාධු උදයි, එසො හි තෙ උදයි, මග්ගො පටිලද්ධො, යො තෙ භාවිතො බහුලීකතො තථා තථා විහරන්තං තථත්තාය උපනෙස්සති යථා ත්වං "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා"ති පජානිස්සසීති.

## උදයිවග්ගො තතියො.

තස්සුද්දානං :

බොධාය දෙසනා ඨානා යොනිසො'පරිහානියා,
ඛයො නිරොධො නිබ්බෙධො එකධම්මො උදයි චාති.

උදයි, මැනවි, මැනවි. උදයි, මේ මඟ තොප විසින් පිළිලදී. යමෙක් තොප විසින් වඩන ලද ද, බහුල කරන ලද ද, (එය) "ඉපැද්ම ගෙවිණ බඹසර වැස නිමවන ලදී, කටයුතු කරන ලදී. මේ බැව් පිණිස අනිකක් නැතැ'' යි යම්සේ තෙපි දනගන්නහු නම් එසේ එසේ වෙසෙන තොප ඒ බැව් පිණිය පමුණුවන්නේ යි.

## තෙවැනි උදයිවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

බොධාය, දෙසනා, ඨාන, යොනිසො, අපරගානිය, ඛය, නිරොධ, නිබ්බෙධ, එකධම්ම, උදයි යයි සූත්‍ර දසයකි යි.

# 4. නීවරණවග්ගො

## 2. 4. 1

### කුසලසුත්තං

577. යෙ කෙචි භික්ඛවෙ, ධම්මා කුසලා කුසලභාගියා කුසලපක්ඛියා, සබ්බෙ තෙ අප්පමාදමූලකා අප්පමාදසමොසරණා අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. අප්පමත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙස්සති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරිස්සති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අප්පමත්තො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අප්පමත්තො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොතීති.

## 2. 4. 2

### දුතියකුසලසුත්තං

578. යෙ කෙචි භික්ඛවෙ, ධම්මා කුසලා කුසලභාගියා කුසලපක්ඛියා, සබ්බෙ තෙ යොනිසොමනසිකාරමූලකා යොනිසොමනසිකාරසමොසරණා යොනිසොමනසිකාරො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. යොනිසොමනසිකාරසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙස්සති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරිස්සති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොතීති.

# 4. නීවරණ වර්ගය

## 2. 4. 1

## කුසල සූත්‍රය

577. මහණෙනි, යම්කිසි දහම් කෙනෙක් කුසල් ද, කුසල් කොටස්හි වූවෝ ද කුසල් පක්හි වූවෝ ද, ඒ සියල්ලෝ අප්‍රමාදය මුල් කොට ඇත්තෝ ය. අප්‍රමාදයෙහි ඇතුළත් වූවෝ ය. අප්‍රමාදය ඒ ධර්මයන්ට අග්‍රය යි කියනු ලැබේ. මහණෙනි, ''සත්බොජ්ඣ වඩන්නේ ය සත්-බොජ්ඣ බහුල කරන්නේ ය'' යන මෙය නොපමා මහණහු විසින් කැමති වියයුතු. මහණෙනි, නොපමා මහණ කෙසේ නම් සත්බොජ්ඣ වඩා ද සත්බොජ්ඣ බහුල කෙරේ ද යත්; මහණෙනි, මෙහි මහණ තෙමේ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත සිහිසම්බොජ්ඣ වොස්සග්ගපරිණාමි කොට වඩයි ... උපේක්ෂාසම්බොජ්ඣ වඩයි. මහණෙනි, මෙසේ නොපමා මහණ තෙමේ සත්බොජ්ඣ වඩයි. සත්බොජ්ඣ බහුල කෙරේ යි.

## 2. 4. 2

## දුතියකුසල සූත්‍රය

578. මහණෙනි, යම්කිසි දහම් කෙනෙක් කුසල් ද කුසල්කොටස්හි වූවෝ ද කුසල්පක්හි වූවෝ ද ඒ සියල්ලෝ නුවණින් මෙනෙහි කිරීම මුල් කොට ඇතියහ. නුවණින් මෙනෙහි කිරීමෙහි ඇතුළත්හ. නුවණින් මෙනෙහි කිරීම ඒ දහමුන්ට අග්‍රය යි කියනු ලැබේ. මහණෙනි, ''සත්බොජ්ඣ වඩන්නේ ය සත්බොජ්ඣ බහුල කරන්නේ ය'' යන මෙය නුවණින් මෙනෙහි කිරීමෙන් යුත් මහණහු විසින් කැමති වියයුතු. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ කෙසේ නම් සත්බොජ්ඣ වඩා ද සත්බොජ්ඣ බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත සිහිසම්බොජ්ඣ වොස්සග්ග පරිණාමි කොට වඩයි ... උපේක්ෂාසම්බොජ්ඣ වඩයි. මහණෙනි, යොනිසොමනසිකාරසම්පන්න මහණ මෙසේ සත්බොජ්ඣ වඩයි. සත්බොජ්ඣ බහුල කෙරේ යි.

## 2. 4. 3

## කිලෙසසුත්තං

579. පඤ්චිමෙ භික්ඛවෙ, ජාතරූපස්ස උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං ජාතරූපං න චෙව මුදු හොති, න ච කම්මනියං න ච පභස්සරං පභඞ්ගු ච, න ච සම්මා උපෙති කම්මාය. කතමෙ පඤ්ච: අයො භික්ඛවෙ, ජාතරූපස්ස උපක්කිලෙසො, යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨං ජාතරූපං න චෙව මුදු හොති න ච කම්මනියං න ච පභස්සරං පභඞ්ගු ච, න ච සම්මා උපෙති කම්මාය. ලොහං භික්ඛවෙ, ජාතරූපස්ස උපක්කිලෙසො -පෙ- තිපු භික්ඛවෙ, ජාතරූපස්ස උපක්කිලෙසො -පෙ- සීසං භික්ඛවෙ, ජාතරූපස්ස උපක්කිලෙසො -පෙ- සජ්ඣු භික්ඛවෙ, ජාතරූපස්ස උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨං ජාතරූපං න චෙව මුදු හොති, න ච කම්මනියං න ච පභස්සරං පභඞ්ගු ච. න ච සම්මා උපෙති කම්මාය. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ජාතරූපස්ස උපක්කිලෙසා, යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං ජාතරූපං න චෙව මුදු හොති න ච කම්මනියං න ච පභස්සරං පභඞ්ගු ච, න ච සම්මා උපෙති කම්මාය.

එවමෙව ඛො භික්ඛවෙ, පඤ්චිමෙ චිත්තස්ස උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං චිත්තං න චෙව මුදු හොති න ච කම්මනියං න ච පභස්සරං පභඞ්ගු ච, න ච සම්මාසමාධියති ආසවානං ඛයාය. කතමෙ පඤ්ච: කාමච්ඡන්දො භික්ඛවෙ, චිත්තස්ස උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨං චිත්තං න චෙව මුදු හොති න ච කම්මනියං න ච පභස්සරං පභඞ්ගු ච, න ච සම්මාසමාධියති ආසවානං ඛයාය. ව්‍යාපාදො භික්ඛවෙ, චිත්තස්ස උපක්කිලෙසො -පෙ- ථීනමිද්ධං භික්ඛවෙ, චිත්තස්ස උපක්කිලෙසො -පෙ- උද්ධච්චකුක්කුච්චං භික්ඛවෙ, චිත්තස්ස උපක්කිලෙසො -පෙ- විචිකිච්ඡා භික්ඛවෙ. චිත්තස්ස උපක්කිලෙසො යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨං චිත්තං න චෙව මුදු හොති න ච කම්මනියං න ච පභස්සරං පභඞ්ගු ච, න ච සම්මාසමාධියති ආසවානං ඛයාය. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච චිත්තස්ස උපක්කිලෙසා, යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං චිත්තං න චෙව මුදු හොති, න ච කම්මනියං, න ච පභස්සරං, පභඞ්ගු ච, න ච සම්මාසමාධියති ආසවානං ඛයායාති.

## 2. 4. 3

# කිලේස සූත්‍රය

579. මහණෙනි, යම් කෙලෙසුන්ගෙන් කෙලෙසුණු ස්වර්ණය මෘදුත් නො වේ ද කර්මණ්‍යත් නො වේ ද ප්‍රභාස්වරත් නො වේ ද බිඳෙනසුලුත් වේ ද කම් පිණිස (–ආභරණ ආදිය තැනීම සඳහා) මැනැවින් නො ද පැමිණේ (සුදුසු නො වේ) ද ස්වර්ණයට මේ (එබඳු) කෙලෙස් පසෙකි:– කවර පසෙක් ද යත්: මහණෙනි, යම් කෙලෙසුමෙකින් කෙලෙසුණු ස්වර්ණය මෘදුත් නො වේ ද කර්මණ්‍යත් නො වේ ද ප්‍රභාස්වරත් නො වේ ද බිඳෙනසුලුත් වේ ද කම් පිණිස මැනැවින් නො ද පැමිණේ ද, යකඩ ස්වර්ණයට (එබඳු) කෙලෙසුමෙකි. මහණෙනි, ... ලෝහ ස්වර්ණයට (එබඳු) කෙලෙසුමෙකි. මහණෙනි, ... කළුතුඹු ස්වර්ණයට (එබඳු) කෙලෙසුමෙකි. මහණෙනි, ... සුදුතුඹු ස්වර්ණයට (එබඳු) කෙලෙසුමෙකි. මහණෙනි, යම් කෙලෙසුමෙකින් කෙලෙසුණු ස්වර්ණය මෘදුත් නො වේ ද කර්මණ්‍යත් නො වේ ද. බබළනසුලුත් නො වේ ද බිඳෙනසුලුත් වේ ද කම් පිණිස නො ද පැමිණේ ද රිදී ස්වර්ණයට (එබඳු) කෙලෙසුමෙකි. මහණෙනි, යම් කෙලෙසුන්ගෙන් කිලිටි වූ ස්වර්ණය මෘදුත් නො වේ ද, කර්මණ්‍යත් නො වේ ද බබළන සුලුත් නො වේ ද, බිඳෙනසුලුත් වේ ද, කම් පිණිස නො ද පැමිණේ ද මේ පස ස්වර්ණයට එබඳු කෙලෙසුම් ය.

මහණෙනි, එසෙයින් ම යම් කෙලෙසුන්ගෙන් කිලිටි වූ සිත මෘදුත් නො වේ ද, කර්මණ්‍යත් නො වේ ද, ප්‍රභාස්වරත් නො වේ ද, බිඳෙනසුලුත් වේ ද ආස්‍රවක්ෂය පිණිස නො ද මැනැවින් එකඟ වේ ද, සිතට මේ (එබඳු) කෙලෙස් පසෙකි. කවර පසෙක් ද යත්: මහණෙනි, යම් කෙලෙසුමෙකින් කිලිටි වූ සිත මෘදුත් නො වේ ද, කර්මණ්‍යත් නො වේ ද, ප්‍රභාස්වරත් නො වේ ද, බිඳෙනසුලුත් වේ ද, ආස්‍රවක්ෂයය පිණිස නො ද මැනැවින් එකඟ වේද, කාමච්ඡන්දය සිතට (එබඳු)කෙලෙසුමෙකි. මහණෙනි, ... ව්‍යාපාදය සිතට (එබඳු) කෙලෙසුමෙකි. මහණෙනි, ... ථිනමිද්ධය සිතට (එබඳු) කෙලෙසුමෙකි. මහණෙනි, ... උද්ධච්චකුක්කුච්චය සිතට (එබඳු) කෙලෙසුමෙකි. මහණෙනි, යම් කෙලෙසුමෙකින් කිලිටි වූ සිත මෘදුත් නො වේ ද, කර්මණ්‍යත් නො වේ ද, ප්‍රභාස්වරත් නො වේ ද, බිඳෙනසුලුත් වේ ද, ආස්‍රවක්ෂයය පිණිස නො ද මැනැවින් එකඟ වේ ද, විචිකිච්ඡාව සිතට (එබඳු) කෙලෙසුමෙකි. මහණෙනි, යම් කෙලෙසුන්ගෙන් කිලිටි වූ සිත මෘදුත් නො වේ ද, කර්මණ්‍යත් නො වේ ද, ප්‍රභාස්වරත් නො වේ ද, බිඳෙනසුලුත් වේ ද, ආස්‍රවක්ෂයය පිණිස නො ද මැනැවින් එකඟ වේ ද, මොහු පස සිතට එබඳු කෙලෙස් යි.

## 2. 4. 4

## අනාවරණසුත්තං

580. සත්තිමෙ භික්ඛවෙ, බොජ්ඣඞ්ගා අනාවරණා අනීවරණා චෙතසො අනුපක්කිලෙසා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තන්ති. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො ඛො භික්ඛවෙ, අනාවරණො අනීවරණො චෙතසො අනුපක්කිලෙසො භාවිතො බහුලීකතො විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඛො භික්ඛවෙ, අනාවරණො අනීවරණො චෙතසො අනුපක්කිලෙසො භාවිතො බහුලීකතො විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තති. ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා අනාවරණා අනීවරණා චෙතසො අනුපක්කිලෙසා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තන්තීති.

## 2. 4. 5

## යොනිසොසුත්තං

581. අයොනිසො භික්ඛවෙ, මනසිකරොතො අනුප්පන්නො චෙව කාමච්ඡන්දො උප්පජ්ජති, උප්පන්නො ච කාමච්ඡන්දො භීයොභාවාය වෙපුල්ලාය සංවත්තති. අනුප්පන්නො චෙව ව්‍යාපාදො උප්පජ්ජති, උප්පන්නො ච ව්‍යාපාදො භීයොභාවාය වෙපුල්ලාය සංවත්තති. අනුප්පන්නඤ්චෙව ථීනමිද්ධං උප්පජ්ජති, උප්පන්නඤ්ච ථීනමිද්ධං භීයොභාවාය වෙපුල්ලාය සංවත්තති. අනුප්පන්නඤ්චෙව උද්ධච්චකුක්කුච්චං උප්පජ්ජති, උප්පන්නඤ්ච උද්ධච්චකුක්කුච්චං භීයොභාවාය වෙපුල්ලාය සංවත්තති. අනුප්පන්නා චෙව විචිකිච්ඡා උප්පජ්ජති, උප්පන්නා ච විචිකිච්ඡා භීයොභාවාය වෙපුල්ලාය සංවත්තති.

යොනිසො ච භික්ඛවෙ, මනසිකරොතො අනුප්පන්නො චෙව සතිසම්බොජ්ඣඞ්ගො උප්පජ්ජති; උප්පන්නො ච සතිසම්බොජ්ඣඞ්ගො භාවනාපාරිපූරිං ගච්ඡති -පෙ- අනුප්පන්නො චෙව උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො උප්පජ්ජති, උප්පන්නො ච උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො භාවනාපාරිපූරිං ගච්ඡතීති.

## 2. 4. 6

## බුද්ධිසුත්තං

582. සත්තිමෙ භික්ඛවෙ, බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා බුද්ධියා අපරිහානාය සංවත්තන්ති. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා භාවිතා බහුලීකතා බුද්ධියා අපරිහානාය සංවත්තන්තීති.

## 2. 4. 4

## අනාවරණ සූත්‍රය

580. මහණෙනි, මේ සත්බොජ්ඣ කෙනෙක් නො අවුරන්නෝ ය. නො වසන්නෝ ය. සිත නො කෙලෙසන්නෝ ය. වඩන ලද්දහු බහුල කරන ලද්දහු විජ්ජාවිමුක්තිඵල පසක් කිරීම පිණිස පවතිත්. කවර සතෙක් ද යත්: මහණෙනි, සිහිසම්බොජ්ඣ නො අවුරන්නෙකි. නො වසන්නෙකි. සිත නො කෙලෙසන්නෙකි. වඩන ලද්දේ බහුල කරන ලද්දේ විජ්ජාවිමුක්තිඵල පසක් කිරීම පිණිස පවතී ... මහණෙනි, උපේක්ෂාසම්බොජ්ඣ නො අවුරන්නෙකි, නො වසන්නෙකි. සිත නො කෙලෙසන්නෙකි. වඩන ලද්දේ බහුල කරන ලද්දේ විජ්ජාවිමුක්තිඵල පසක් කිරීම පිණිස පවතී. මහණෙනි, මේ සත්බොජ්ඣ නො අවුරන්නෝය. නො වසන්නෝ ය. සිත නො කෙලෙසන්නෝ ය. වඩන ලද්දහු බහුල කරන ලද්දහු විජ්ජාවිමුක්තිඵල පසක්කිරීම පිණිස පවතිත් යි.

## 2. 4. 5

## යොනිසො සූත්‍රය

**581. මහණෙනි,** නුනුවණින් මෙනෙහි කරන්නහුට නූපන් කාමච්ඡන්දයත් උපදී. උපන් කාමච්ඡන්දයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. නූපන් ව්‍යාපාදයත් උපදී. උපන් ව්‍යාපාදයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී, නූපන් ථිනමිද්ධයත් උපදී. උපන් ථිනමිද්ධයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. නූපන් උද්ධච්චකුක්කුච්චයත් උපදී. උපන් උද්ධච්චකුක්කුච්චයත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. නූපන් විචිකිච්ඡාවත් උපදී. උපන් විචිකිච්ඡාවත් බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී.

මහණෙනි, නුවණින් මෙනෙහි කරන්නහුට නූපන් සිහිසම්බොජ්ඣත් උපදී. උපන් සිහිසම්බොජ්ඣත් වැඩීමෙන් පිරීමට යේ ... නූපන් උපේක්ෂාසම්බොජ්ඣත් උපදී, උපන් සම්බොජ්ඣත් වැඩීමෙන් පිරීමට යේ යි.

## 2. 4. 6

## බුද්ධි සූත්‍රය

582. මහණෙනි, මේ සත්බොජ්ඣ කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු බුද්ධිය නො පිරිහීම පිණිස පවතිත්. කවර සතෙක් ද යත්: සතිසම්බොජ්ඣ ... උපේක්ෂාසම්බොජ්ඣ යි. මහණෙනි, මේ සත් බොජ්ඣහු වඩන ලදහු බහුල කරන ලදහු බුද්ධිය නො පිරිහීම පිණිස පවතිත් යි,

## 2. 4. 7

## ආවරණසුත්තං

583. පඤ්චිමෙ භික්ඛවෙ, ආවරණා නීවරණා චෙතසො උපක්කිලෙසා පඤ්ඤාය දුබ්බලීකරණා. කතමෙ පඤ්ච: කාමච්ඡන්දො භික්ඛවෙ, ආවරණො නීවරණො චෙතසො උපක්කිලෙසො පඤ්ඤාය දුබ්බලීකරණො. ව්‍යාපාදො භික්ඛවෙ, ආවරණො නීවරණො චෙතසො උපක්කිලෙසො පඤ්ඤාය දුබ්බලීකරණො. ථීනමිද්ධං භික්ඛවෙ, ආවරණං නීවරණං චෙතසො උපක්කිලෙසං පඤ්ඤාය දුබ්බලීකරණං. උද්ධච්චකුක්කුච්චං භික්ඛවෙ, ආවරණං නීවරණං චෙතසො උපක්කිලෙසං පඤ්ඤාය දුබ්බලීකරණං. විචිකිච්ඡා භික්ඛවෙ ආවරණා නීවරණා චෙතසො උපක්කිලෙසා පඤ්ඤාය දුබ්බලීකරණා, ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආවරණා නීවරණා චෙතසො උපක්කිලෙසා පඤ්ඤාය දුබ්බලීකරණාති.

## 2. 4. 8

## අනීවරණසුත්තං

584. යස්මිං භික්ඛවෙ, සමයෙ අරියසාවකො අට්ඨිකත්වා මනසිකත්වා සබ්බචෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතො ධම්මං සුණාති. පඤ්චස්ස නීවරණා තස්මිං සමයෙ න හොන්ති. සත්ත බොජ්ඣඞ්ගා තස්මිං සමයෙ භාවනාපාරිපූරිං ගච්ඡන්ති. කතමස්ස පඤ්චනීවරණා තස්මිං සමයෙ න හොන්ති: කාමච්ඡන්දනීවරණං තස්මිං සමයෙ න හොති. ව්‍යාපාදනීවරණං -පෙ- ථීනමිද්ධනීවරණං -පෙ- උද්ධච්චකුක්කුච්චනීවරණං -පෙ- විචිකිච්ඡානීවරණං තස්මිං සමයෙ න හොති. ඉමස්ස පඤ්චනීවරණා තස්මිං සමයෙ න හොන්ති.

කතමෙ සත්ත බොජ්ඣඞ්ගා තස්මිං සමයෙ භාවනාපාරිපූරිං ගච්ඡන්ති: සතිසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භාවනාපාරිපූරිං ගච්ඡති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තස්මිං සමයෙ භාවනාපාරිපූරිං ගච්ඡති. යස්මිං භික්ඛවෙ, සමයෙ අරියසාවකො අට්ඨිකත්වා මනසිකත්වා සබ්බචෙතසො සමන්නාහරිත්වා ඔහිතසොතො ධම්මං සුණාති. ඉමස්ස පඤ්චනීවරණා තස්මිං සමයෙ න හොන්ති. ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා තස්මිං සමයෙ භාවනාපාරිපූරිං ගච්ඡන්තීති.

## 2. 4. 7

## ආවරණ සූත්‍රය

583. මහණෙනි, මේ අවුරන්නෝ වසන්නෝ සිත කෙලෙසන්නෝ නුවණ දුබල කරන්නෝ පස් දෙනෙකි. කවර පස්දෙනෙක් ද යත්: මහණෙනි, කාමච්ඡන්දය (කුසල්සිත) අවුරන්නෙකි, වසන්නෙකි, සිත කෙලෙසන්නෙකි, නුවණ දුබල කරන්නෙකි. මහණෙනි, ව්‍යාපාදය අවුරන්නෙකි, වසන්නෙකි, සිත කෙලෙසන්නෙකි, නුවණ දුබල කරන්නෙකි. මහණෙනි, ථීනමිද්ධය අවුරන්නෙකි, වසන්නෙකි, සිත කෙලෙසන්නෙකි, නුවණ දුබල කරන්නෙකි. මහණෙනි, උද්ධච්චකුක්කුච්චය අවුරන්නෙකි, වසන්නෙකි, සිත කෙලෙසන්නෙකි, නුවණ දුබල කරන්නෙකි. මහණෙනි. විචිකිච්ඡාව අවුරන්නෙකි, වසන්නෙකි, සිත කෙලසන්නෙකි, නුවණ දුබල කරන්නෙකි. මහණෙනි, මේ පස අවුරන්නෝ ය, වසන්නෝ ය, සිත කෙලෙසන්නෝ ය, නුවණ දුබල කරන්නෝ යි.

## 2. 4. 8

## අනීවරණ සූත්‍රය

584. මහණෙනි, යම් කලෙක අරිසවු තෙමේ බලාපොරොත්තු සහිත ව මෙනෙහි කොට මුළුහිතින් මෙහෙයා යොමු කළ කන් ඇති ව දහම් අසා ද එසමයෙහි ඔහුට පඤ්චනීවරණයෝ නො වෙත්. එසමයෙහි සත් බොජ්ඣඞ්ගයෝ වැඩීමෙන් පිරීමට යෙත්. කවර පඤ්චනීවරණයෝ එසමයෙහි ඔහුට නො වෙද් ද කාමච්ඡන්දනීවරණය එසමයෙහි ඔහුට නො වේ. ව්‍යාපාද නීවරණය ... ථීනමිද්ධනීවරණය ... උද්ධච්චකුක්කුච්චනීවරණය ... විචිකිච්ඡානීවරණය එසමයෙහි ඔහුට නො වේ. මේ පස් නීවරණයෝ එසමයෙහි ඔහුට නො වෙත්.

එසමයෙහි ඔහුගේ කවර සත් බොජ්ඣඞ්ගයෝ වැඩීමෙන් පිරීමට යෙද්ද: සතිසම්බොජ්ඣඞ්ගය එසමයෙහි වැඩීමෙන් පිරීමට යේ... උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය එසමයෙහි වැඩීමෙන් පිරීමට යේ. මහණෙනි, යම් කලෙක අරිසවු තෙමේ අර්ථි ව මෙනෙහි කොට මුළුසිතින් මෙහෙයා යොමු කළ කන් ඇති ව දහම් අසා ද එසමයෙහි මේ පස් නීවරණයෝ ඔහුට නො වෙත්. එසමයෙහි මේ සත් බොජ්ඣඞ්ගයෝ වැඩීමෙන් පිරීමට යෙති යි.

## 2. 4. 9

## මහාරුක්ඛසුත්තං

585. සන්ති[1] භික්ඛවෙ, මහාරුක්ඛා අනුබීජා මහාකායා රුක්ඛානං අජ්ඣාරුහා, යෙහි රුක්ඛා අජ්ඣාරුළ්හා ඔභග්ගවිභග්ගා විපතිතා සෙන්ති. කතමෙ ච භික්ඛවෙ, මහාරුක්ඛා අනුබීජා මහාකායා රුක්ඛානං අජ්ඣාරුහා යෙහි රුක්ඛා අජ්ඣාරුළ්හා ඔභග්ගවිභග්ගා විපතිතා සෙන්ති, සෙය්‍යථීදං: අස්සත්ථො නිග්‍රොධො පිලක්ඛො උදුම්බරො කච්ඡකො කපිත්ථනො. ඉමෙ ඛො භික්ඛවෙ, මහාරුක්ඛා අනුබීජා මහාකායා රුක්ඛානං අජ්ඣාරුහා, යෙහි රුක්ඛා අජ්ඣාරුළ්හා ඔභග්ගවිභග්ගා විපතිතා සෙන්ති[2].

එවමෙව ඛො භික්ඛවෙ, ඉධෙකච්චො කුලපුත්තො යාදිසකෙ කාමෙ ඔහාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති, සො තාදිසකෙහි වා කාමෙහි තතො වා පාපිට්ඨතරෙහි ඔභග්ගවිභග්ගො විපතිතො සෙති.

පඤ්චිමෙ භික්ඛවෙ, ආවරණා නීවරණා චෙතසො අජ්ඣාරුහා පඤ්ඤාය දුබ්බලීකරණා කතමෙ පඤ්ච: කාමච්ඡන්දො භික්ඛවෙ, ආවරණො නීවරණො චෙතසො අජ්ඣාරුහො පඤ්ඤාය දුබ්බලීකරණො ව්‍යාපාදො භික්ඛවෙ, ආවරණො නීවරණො චෙතසො අජ්ඣාරුහො පඤ්ඤාය දුබ්බලීකරණො, ථිනමිද්ධං භික්ඛවෙ, ආවරණං නීවරණං චෙතසො අජ්ඣාරුහං පඤ්ඤාය දුබ්බලීකරණං. උද්ධච්චකුක්කුච්චං භික්ඛවෙ, ආවරණං නීවරණං චෙතසො අජ්ඣාරුහං පඤ්ඤාය දුබ්බලී-කරණං විචිකිච්ඡා භික්ඛවෙ, ආවරණා නීවරණා චෙතසො අජ්ඣාරුහා පඤ්ඤාය දුබ්බලීකරණා. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්ච ආවරණා නීවරණා චෙතසො අජ්ඣාරුහා පඤ්ඤාය දුබ්බලීකරණා.

සත්තිමෙ භික්ඛවෙ; බොජ්ඣඞ්ගා අනාවරණා අනීවරණා චෙතසො අනජ්ඣාරුහා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තන්ති. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො භික්ඛවෙ, අනාවරණො අනී-වරණො චෙතසො අ ජ්ඣාරුහො භාවිතො බහුලීකතො විජ්ජාවිමුත්ති ඵලසච්ඡිකිරියාය සංවත්තති -පෙ- උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො භික්ඛවෙ, අනාවරණො අනීවරණො චෙතසො අනජ්ඣාරුහො භාවිතො බහුලී-කතො විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තති. ඉමෙ ඛො භික්ඛවෙ, සත්ත බොජ්ඣඞ්ගා අනාවරණා අනීවරණා චෙතසො අනජ්ඣාරුහා. භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තන්තීති·

1. සන්තිමෙ - සී 2.
2. හොන්ති - සී 2.

## 2. 4. 9

## මහාරුක්ඛ සූත්‍රය

585. මහණෙනි, ගස් මැඩගෙන වැඩුණු වෘක්ෂයෝ යම් මහගස්වලින් හාත්පසින් බිඳුනා ලද්දෝ සරස වැටී හොවිද් ද, බීජයෙහි පටන් ක්‍රමයෙන් වැඩෙන මහසිරුරු ඇති ගස් මැඩගෙන වැඩෙන එබඳු මහගස් ඇත. මහණෙනි, ගස් මැඩගෙන වැඩෙන වෘක්ෂයෝ යම් මහගස්වලින් හාත්පසින් බිඳුනාලද්දෝ සරස වැටී හොවිත් නම් බීජයෙහි පටන් ක්‍රමයෙන් වැඩෙන මහසිරුරු ඇති ගස් මැඩ ගෙන වැඩුණු ඒ මහාවෘක්ෂයෝ කවරහු ද ඒ මෙසේ යි: ඇසතු, නුග, පුලිල, දිඹුල්, ඇටකසුක්, ශිවුළු යන මොහු යි. මහණෙනි, ගස් මැඩගෙන වැඩෙන වෘක්ෂයෝ යම් මහගස්වලින් හාත්පසින් බිඳුනා ලද්දෝ සරස වැටී හොවිත් නම් බීජයෙහි පටන් ක්‍රමයෙන් වැඩෙන මහසිරුරු ඇති ගස් මැඩගෙන වැඩෙන මහාවෘක්ෂයෝ මොහු යි.

මහණෙනි, එ සෙයින් ම මෙහි ඇතැම් කුලපුත්‍රයෙක් යම්බඳු කාමයන් හැරදමා ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදි වූයේ වේ ද, හෙතෙමේ එබඳු වූ කාමයන්ගෙන් හෝ එයිනුදු ඉතා පවිටු වූ කාමයන් ගෙන් හෝ හාත්පසින් බිඳුනා ලද්දේ සරසට (-අපායට) වැටී හොවී.

මහණෙනි, මේ පස්දෙනෙක් අවුරන්නෝ ය, වසන්නෝ ය, සිත යටපත් කරන්නෝ ය, නුවණ දුබල කරන්නෝ ය. කවර පසෙක් ද යත්: මහණෙනි, කාමච්ඡන්දය අවුරන්නෙකි, වසන්නෙකි, සිත යටපත් කරන්නෙකි, නුවණ දුබල කරන්නෙකි. මහණෙනි. ව්‍යාපාදය අවුරන්නෙකි, වසන්නෙකි, සිත යටපත් කරන්නෙකි, නුවණ දුබල කරන්නෙකි. මහණෙනි, ථිනමිද්ධය අවුරන්නෙකි, වසන්නෙකි, සිත යටපත් කරන්නෙකි, නුවණ දුබල කරන්නෙකි. මහණෙනි, උද්ධච්චකුක්කුච්චය අවුරන්නෙකි, වසන්නෙකි, සිත යටපත් කරන්නෙකි, නුවණ දුබල කරන්නෙකි. මහණෙනි, විචිකිච්ඡාව අවුරන්නෙකි, වසන්නෙකි, සිත යටපත් කරන්නෙකි, නුවණ දුබල කරන්නෙකි මහණෙනි, මොහු පස් දෙන අවුරන්නෝ ය, වසන්නෝ ය, සිත යටපත් කරන්නෝ ය, නුවණ දුබල කරන්නෝ ය.

මහණෙනි, මේ සත් බොජ්ඣඞ්ගයෝ නො අවුරන්නෝ ය, නො වසන්නෝ ය, සිත යටපත් නො කරන්නෝ ය, වඩන ලද්දහු බහුල කරන ලද්දහු විජ්ජාවිමුත්තිඵල පසක් කිරීම පිණිස පවතිත්. කවර සතෙක් ද යත්: මහණෙනි, සතිසම්බොජ්ඣඞ්ගය නො අවුරන්නෙකි, නො වසන්නෙකි, සිත යටපත් නො කරන්නෙකි. වඩන ලද්දේ බහුල කරන ලද්දේ විජ්ජාවිමුත්තිඵල පසක් කිරීම පිණිස පවතී ... මහණෙනි. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය නො අවුරන්නෙකි, නො වසන්නෙකි, සිත යටපත් නො කරන්නෙකි, වඩන ලද්දේ බහුල කරන ලද්දේ විජ්ජාවිමුත්තිඵල පසක් කිරීම පිණිස පවතී. මහණෙනි, මේ සත් බොජ්ඣඞ්ගයෝ නො අවුරන්නෝ ය, නො වසන්නෝ ය, සිත යටපත් නො කරන්නෝ ය, වඩන ලද්දහු බහුල කරන ලද්දහු විජ්ජාවිමුත්තිඵල පසක් කිරීම පිණිස පවතිත් යි.



Free Distribution www.aathaapi.org

## 2. 4. 10

## නීවරණසුත්තං

586. පඤ්චිමෙ භික්ඛවෙ, නීවරණා අන්ධකරණා අචක්ඛුකරණා අඤ්ඤාණකරණා පඤ්ඤානිරොධියා විඝාතපක්ඛියා අනිබ්බානසංවත්තනිකා. කතමෙ පඤ්ච: කාමච්ඡන්දනීවරණං භික්ඛවෙ, අන්ධකරණං අචක්ඛුකරණං අඤ්ඤාණකරණං පඤ්ඤානිරොධියං විඝාතපක්ඛියං අනිබ්බානසංවත්තනිකං. ව්‍යාපාදනීවරණං භික්ඛවෙ -පෙ- ථිනමිද්ධනීවරණං භික්ඛවෙ -පෙ- උද්ධච්චකුක්කුච්චනීවරණං භික්ඛවෙ -පෙ- විචිකිච්ඡානීවරණං භික්ඛවෙ, අන්ධකරණං අචක්ඛුකරණං අඤ්ඤාණකරණං පඤ්ඤානිරොධියං විඝාතපක්ඛියං අනිබ්බානසංවත්තනිකං. ඉමෙ ඛො භික්ඛවෙ, පඤ්චනීවරණා අන්ධකරණා අචක්ඛුකරණා අඤ්ඤාණකරණා පඤ්ඤානිරොධියා විඝාතපක්ඛියා අනිබ්බානසංවත්තනිකා.

සත්තිමෙ භික්ඛවෙ, බොජ්ඣඞ්ගා චක්ඛුකරණා ඤාණකරණා පඤ්ඤාවුද්ධියා අවිඝාතපක්ඛියා නිබ්බානසංවත්තනිකා. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො භික්ඛවෙ, චක්ඛුකරණො ඤාණකරණො පඤ්ඤාවුද්ධියො අවිඝාතපක්ඛියො නිබ්බානසංවත්තනිකො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො භික්ඛවෙ, චක්ඛුකරණො ඤාණකරණො පඤ්ඤාවුද්ධියො අවිඝාතපක්ඛියො නිබ්බානසංවත්තනිකො. ඉමෙ ඛො භික්ඛවෙ සත්තබොජ්ඣඞ්ගා චක්ඛුකරණා ඤාණකරණා පඤ්ඤාවුද්ධියා අවිඝාතපක්ඛියා නිබ්බානසංවත්තනිකාති.

## නීවරණවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

ද්වෙ කුසලා කිලෙසො ච අනාවරණඤ්ච යොනිසො,
බුද්ධාවරණානීවරණා මහාරුක්ඛනීවරණාති.

## 1. 4. 10

## නීවරණ සූත්‍රය

586. මහණෙනි, මේ පස්නීවරණ කෙනෙක් අඳබව කරන්නෝ ය. නුවණැස නො කරන්නෝ ය. මොහය කරන්නෝ ය. නුවණ වළකන්නෝ ය. දුක්පසෙහි වූවෝ ය. නිවන් පිණිස නො පවත්නෝ ය. කවර පසෙක් ද යත්: මහණෙනි, කාමච්ඡන්දනීවරණය අඳබව කරන්නෙකි. නුවණැස නො කරන්නෙකි. මෝහය කරන්නෙකි. නුවණ වළකන්නෙකි. දුක්පසෙහි වූවෙකි. නිවන් පිණිස නො පවත්නෙකි. මහණෙනි, ව්‍යාපාද නීවරණය ... මහණෙනි, ථිනමිද්ධනීවරණය .. මහණෙනි, උද්ධච්චකුක්කුච්චනීවරණය ... මහණෙනි, විචිකිච්ඡානීවරණය අඳබව කරන්නෙකි. නුවණැස නො කරන්නෙකි. මෝහය කරන්නෙකි. නුවණ වළකන්නෙකි. දුක්පසෙහි වූවෙකි. නිවන් පිණිස නො පවත්නෙකි. මහණෙනි, මේ පස් නීවරණයෝ අඳබව කරන්නෝ ය. නුවණැස නො කරන්නෝ ය. මෝහය කරන්නෝ ය. නුවණ වළකන්නෝ ය. දුක්පසෙහි වූවෝ ය නිවන් පිණිස නො පවත්නෝ ය.

මහණෙනි, මේ සත් බොජ්ඣඞ්ගයෝ නුවණැස කරන්නෝ ය. නුවණ කරන්නෝ ය. නුවණ වැඩීම පිණිස වූවෝ ය. නොදුක්පසෙහි වූවෝ ය. නිවන් පිණිස පවත්නෝ ය. කවර සතෙක් ද යත්: මහණෙනි, සති සම්බොජ්ඣඞ්ගය නුවණැස කරන්නෙකි. නුවණ කරන්නෙකි. නුවණ වැඩීම පිණිස වූවෙකි. නො දුක්පසෙහි වූවෙකි. නිවන් පිණිස පවත්නෙකි ... මහණෙනි, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය නුවණැස කරන්නෙකි. නුවණ කරන්නෙකි. නුවණ වැඩීම පිණිස වූවෙකි. නොදුක්පසෙහි වූවෙකි. නිවන් පිණිස පවත්නෙකි. මහණෙනි, මේ සත් බොජ්ඣඞ්ගයෝ නුවණැස කරන්නෝ ය. නුවණ කරන්නෝ ය. නුවණ වැඩීම පිණිස වූවෝ ය. නො දුක්පසෙහි වූවෝ ය. නිවන් පිණිස පවත්නෝ යි.

## සිවුවැනි නීවරණ වර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

කුසල සූත්‍ර දෙක ද කිලෙස, අනාවරණ, යොනිසො, බුද්ධි, ආවරණ, අනීවරණ, මහාරුක්ඛ, නීවරණ යන සූත්‍ර අට ද යි දශ සූත්‍ර කෙනෙකි යි.

# 5. චක්කවත්තිවග්ගො

## 2. 5. 1

## විධාසුත්තං

587. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා තිස්සො විධා පජහිංසු. සබ්බෙ තෙ සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තා. යෙ හි කෙචි භික්ඛවෙ, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා තිස්සො විධා පජහිස්සන්ති සබ්බෙ තෙ සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තා. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි සමණා වා බ්‍රාහ්මණා වා තිස්සො විධා පජහන්ති, සබ්බෙ තෙ සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තා. කතමෙසං සත්තන්නං[1]: සතිසම්බොජ්ඣඞ්ගස්ස -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස. යෙ හි කෙචි භික්ඛවෙ, අතීතමද්ධානං සමණා වා බ්‍රාහ්මණා වා තිස්සො විධා පජහිංසු -පෙ- පජහිස්සන්ති -පෙ- පජහන්ති, සබ්බෙ තෙ ඉමෙසං ව සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තාති.

## 2. 5. 2

## චක්කවත්තිසුත්තං

588. රඤ්ඤො භික්ඛවෙ, චක්කවත්තිස්ස පාතුභාවා සත්තන්නං රතනානං පාතුභාවො හොති. කතමෙසං සත්තන්නං: චක්කරතනස්ස පාතුභාවො හොති, හත්ථිරතනස්ස පාතුභාවො හොති, අස්සරතනස්ස පාතුභාවො හොති, මණිරතනස්ස පාතුභාවො හොති ඉත්ථිරතනස්ස පාතුභාවො හොති, ගහපතිරතනස්ස පාතුභාවො හොති පරිනායකරතනස්ස පාතුභාවො හොති. රඤ්ඤො භික්ඛවෙ, චක්කවත්තිස්ස පාතුභාවා ඉමෙසං සත්තන්නං රතනානං පාතුභාවො හොති. තථාගතස්ස භික්ඛවෙ, පාතුභාවා අරහතො සම්මාසම්බුද්ධස්ස සත්තන්නං බොජ්ඣඞ්ගරතනානං පාතුභාවො හොති. කතමෙසං සත්තන්නං[2]: සතිසම්බොජ්ඣඞ්ගරතනස්ස[3] පාතුභාවො හොති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගරතනස්ස[4] පාතුභාවො හොති. තථාගතස්ස භික්ඛවෙ, පාතුභාවා අරහතො සම්මාසම්බුද්ධස්ස ඉමෙසං සත්තන්නං බොජ්ඣඞ්ගරතනානං පාතුභාවො හොතීති.

## 2. 5. 3

## මාරසුත්තං

589. මාරසෙනප්පමද්දනං වො භික්ඛවෙ, මග්ගං දෙසිස්සාමි. තං සුණාථ. කතමො ච භික්ඛවෙ, මාරසෙනප්පමද්දනො මග්ගො යදිදං සත්තබොජ්ඣඞ්ගා. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො. අයං ඛො භික්ඛවෙ, මාරසෙනප්පමද්දනො මග්ගොති.

---

1. සත්තන්නං බොජ්ඣඞ්ගානං – මජසං, සයා.
2. සත්තන්නං බොජ්ඣඞ්ගරතනානං – සයා.
3. සතිසම්බොජ්ඣඞ්ගස්ස රතනස්ස – මජසං.
4. උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස රතනස්ස – මජසං.

# 5. චක්කවත්ති වර්ගය

## 2. 5. 4

## විධා සූත්‍රය

287. මහණෙනි, ඉකුත්කල යම්කිසි මහණකෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ත්‍රිවිධ මානය හළාහු ද, ඒ සියල්ලෝ සත්බොජ්ඣ වැඩූ බැවින් බහුල කළ බැවින් ත්‍රිවිධ මානය හළහ. මහණෙනි, මතුකල යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ත්‍රිවිධ මානය දුරු කරන්නාහු ද ඒ සියල්ලෝ සත්බොජ්ඣ වැඩූ බැවින් බහුල කළ බැවින් ත්‍රිවිධ මානය දුරුකරන්නාහ. මහණෙනි, මෙකල යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ත්‍රිවිධ මානය දුරු කෙරෙද් ද ඒ සියල්ලෝ සත් බොජ්ඣ වැඩූ බැවින් බහුල කළ බැවින් දුරු කෙරෙති. කවර සතෙක් ද යත්: සිහිසම්බොජ්ඣ ... උපේසම්බොජ්ඣ යී. මහණෙනි, ඉකුත්කල යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ ත්‍රිවිධ මානය දුරු කළාහු ද ... දුරු කරන්නාහු ද ... දුරු කෙරෙද් ද ඒ සියල්ලෝ මේ සත් බොජ්ඣ වැඩූ බැවින් බහුල කළ බැවින් ත්‍රිවිධ මානය දුරු කෙරෙති.

## 2. 5. 2

## චක්කවත්ති සූත්‍රය

588. මහණෙනි, සක්විති රජුගේ පහළවීමෙන් සත්රුවනෙක පහළවීම වේ. කවර සතෙක් ද යත්: සක්රුවනෙහි පහළ වීම වේ. ඇත්රුවනෙහි පහළවීම වේ. අස්රුවනෙහි පහළවීම වේ. මිණිරුවනෙහි පහළවීම වේ. ඉතිරි රුවනෙහි පහළවීම වේ. ගැහැවිරුවනෙහි පහළ වීම වේ පුත් රුවනෙහි සහළවීම වේ. මහණෙනි, සක්විති රජුගේ පහළවීමෙන් මේ සත් රුවනුන්ගේ පහළවීම වේ. මහණෙනි, තථාගත අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ පහළවීමෙන් සත් බොජ්ඣරුවනුන්ගේ පහළවීම වේ. කවර සතෙක යත්: සිහිසම්බොජ්ඣ රුවනෙහි පහළවීම වේ ... උපේසම්බොජ්ඣරුවනෙහි පහළවීම වේ. මහණෙනි, තථාගත අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ පහළ වීමෙන් මේ සත්බොජ්ඣරුවනුන්ගේ පහළවීම වේ යි.

## 2. 5. 3

## මාර සූත්‍රය

589. මහණෙනි, මරසෙන් මඩින මඟ තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, මරසෙන් මඩින මඟ කවරේ ද යත්: මේ සත් බොජ්ඣ යි. කවර සතෙක් ද යත්: සිහිසම්බොජ්ඣ..උපෙසම්බොජ්ඣ යි. මහණෙනි, මේ මරසෙන් මඩින මඟ යි.

## 2. 5. 4

### දුප්පඤ්ඤසුත්තං

590. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ''දුප්පඤ්ඤො එළමූගො දුප්පඤ්ඤො එළමූගො''ති භන්තෙ, වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ, ''දුප්පඤ්ඤො එළමූගොති වුච්චතී''ති? සත්තන්නං ඛො භික්ඛු, බොජ්ඣඞ්ගානං අභාවිතත්තා අබහුලීකතත්තා ''දුප්පඤ්ඤො එළමූගො''ති වුච්චති. කතමෙසං සත්තන්නං: සතිසම්බොජ්ඣඞ්ගස්ස -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස. ඉමෙසං ඛො භික්ඛු, සත්තන්නං බොජ්ඣඞ්ගානං අභාවිතත්තා අබහුලීකතත්තා ''දුප්පඤ්ඤො එළමූගො''ති වුච්චතීති.

## 2. 5. 5

### පඤ්ඤවසුත්තං

591. ''පඤ්ඤවා අනෙළමූගො පඤ්ඤවා අනෙළමූගො''ති භන්තෙ, වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ, ''පඤ්ඤවා අනෙළමූගො''ති වුච්චතීති? සත්තන්නං ඛො භික්ඛු, බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තා ''පඤ්ඤවා අනෙළමූගො''ති වුච්චති. කතමෙසං සත්තන්නං සතිසම්බොජ්ඣඞ්ගස්ස -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස. ඉමෙසං ඛො භික්ඛු සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තා ''පඤ්ඤවා අනෙළමූගො''ති වුච්චතීති.

## 2. 5. 6

### දලිද්දසුත්තං

592. ''දලිද්දො දලිද්දොති භන්තෙ, වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ, දලිද්දො''ති වුච්චතීති? සත්තන්නං ඛො භික්ඛු, බොජ්ඣඞ්ගානං අභාවිතත්තා අබහුලීකතත්තා දලිද්දොති වුච්චති. කතමෙසං සත්තන්නං: සතිසම්බොජ්ඣඞ්ගස්ස -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස. ඉමෙසං ඛො භික්ඛු, සත්තන්නං බොජ්ඣඞ්ගානං අභාවිතත්තා අබහුලීකතත්තා දලිද්දොති වුච්චතීති.

## 2. 5. 7

### අදලිද්දසුත්තං

593. ''අදලිද්දො අදලිද්දො''ති භන්තෙ, වුච්චති කිත්තාවතා නු ඛො භන්තෙ, ''අදලිද්දොති වුච්චතී''ති? සත්තන්නං ඛො භික්ඛු බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තා ''අදලිද්දො''ති වුච්චති කතමෙසං සත්තන්නං? සතිසම්බොජ්ඣඞ්ගස්ස -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස. ඉමෙසං ඛො භික්ඛු සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවිතත්තා බහුලීකතත්තා ''අදලිද්දො''ති වුච්චතීති.

## 2. 5. 4

## දුප්පඤ්ඤ සූත්‍රය

590. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය: වහන්ස, "අනුවණ කෙළතොලු ය, අනුවණ කෙළතොලු ය" යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් "අනුවණ කෙළතොලු ය"යි කියනු ලැබේ දෝ යි. මහණ, සත්බොජ්ඣඞ්ග නොවැඩූ බැවින් නො බහුල කළ බැවින් "අනුවණ කෙළතොලු ය" යි කියනු ලැබේ. කවර සතක් ද යත්: සිහිසම්බොජ්ඣඞ්ග ... උපේක්ඛාසම්බොජ්ඣඞ්ග යි. මහණ, මේ සත්බොජ්ඣඞ්ග නොවැඩූ බැවින් නොබහුල කළ බැවින් "අනුවණකෙළතොලු ය" යි කියනු ලැබේ.

## 2. 5. 5

## පඤ්ඤව සූත්‍රය

591. වහන්ස, "නුවණැති නොකෙළතොලු ය, නුවණැති නොකෙළ-තොලු ය" යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් "නුවණැති නො කෙළතොලු ය" යි කියනු ලැබේ දෝ යි. මහණ, සත්බොජ්ඣඞ්ග වැඩූ බැවින් බහුල කළ බැවින් නුවණැති නොකෙළතොලු ය යි කියනු ලැබේ. කවර සතක් ද යත්: සිහිසම්බොජ්ඣඞ්ග ... උපේක්ඛාසම්බොජ්ඣඞ්ග යි. මහණ, මේ සත් බොජ්ඣඞ්ග වැඩූ බැවින් බහුල කළ බැවින්" නුවණැති නොකෙළතොලු ය" යි කියනු ලැබේ යි.

## 2. 5: 6

## දළිද්ද සූත්‍රය

592. වහන්ස, "දිළිඳු ය දිළිඳු ය" යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් "දිළිඳු ය" යි කියනු ලැබේ දෝ යි. මහණ, සත්බොජ්ඣඞ්ග නොවැඩූ බැවින් නොබහුල කළ බැවින් "දිළිඳු ය" යි කියනු ලැබේ. කවර සතක් ද යත්: සිහිසම්බොජ්ඣඞ්ග .. උපේක්ඛාසම්බොජ්ඣඞ්ග යි. මහණ, මේ සත්බොජ්ඣඞ්ග නොවැඩූ බැවින් නොබහුල කළ බැවින් "දිළිඳු ය" යි කියනු ලැබේ යි.

## 2. 5. 7

## අදළිද්ද සූත්‍රය

593 වහන්ස, "නොදිළිඳු ය නොදිළිඳු ය" යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් නොදිළිඳු ය යි කියනු ලැබේ දෝ යි මහණ, සත් බොජ්ඣඞ්ග වැඩූ බැවින් බහුල කළ බැවින් නොදිළිඳු ය යි කියනු ලැබේ. කවර සතක් ද යත්: සිහිසම්බොජ්ඣඞ්ග ... උපේක්ඛාසම්බොජ්ඣඞ්ග යි. මහණ, මේ සත් බොජ්ඣඞ්ග වැඩූ බැවින් බහුල කළ බැවින් නොදිළිඳු ය යි කියනු ලැබේ යි.

## 2. 5. 8

## ආදිච්චසුත්තං

594. ආදිච්චස්ස භික්ඛවෙ, උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අරුණුග්ගං. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛුනො සත්තන්නං බොජ්ඣඞ්ගානං උප්පාදාය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙස්සති සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරිස්සති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොති: ඉධ භික්ඛවෙ. භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොතීති.

## 2. 5. 9

## අඞ්ගසුත්තං

595. අජ්ඣත්තිකං භික්ඛවෙ, අඞ්ගන්ති කරිත්වා නාඤ්ඤං එකඞ්ගම්පි සමනුපස්සාමි සත්තන්නං බොජ්ඣඞ්ගානං උප්පාදාය යථයිදං භික්ඛවෙ, යොනිසොමනසිකාරො. යොනිසොමනසිකාරසම්පන්නස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙස්සති සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරිස්සති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොති. ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු යොනිසොමනසිකාරසම්පන්නො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොතීති.

## 2. 5. 10

## දුතිය අඞ්ගසුත්තං

596. බාහිරං භික්ඛවෙ, අඞ්ගන්ති කරිත්වා නාඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි සත්තන්නං බොජ්ඣඞ්ගානං උප්පාදාය. යථයිදං භික්ඛවෙ, කල්‍යාණමිත්තතා කල්‍යාණමිත්තස්සෙතං භික්ඛවෙ, භික්ඛුනො පාටිකඞ්ඛං. සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙස්සති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරිස්සති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං එවං ඛො භික්ඛවෙ, භික්ඛු කල්‍යාණමිත්තො සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොතීති.

**චක්කවත්තිවග්ගො පඤ්චමො.**

තත්‍රුද්දානං:

විධා චක්කවත්තිමාරෙ දුප්පඤ්ඤො පඤ්ඤවෙන ච
දළිද්දො අදළිද්දො ච ආදිච්චඞ්ගෙහි තෙ දසා ති.

## 2. 5. 8

## ආදිච්ච සූත්‍රය

594. මහණෙනි, යම් මේ අරුණෝදයෙක් වේ ද, උදවන හිරුට මේ පෙරටු ය, මේ පෙරනිමිත්ත ය. මහණෙනි, එසෙයින් ම යම් මේ කල්‍යාණමිත්‍රත්වයෙක් වේ ද, මහණහට සත්බොජ්ඣඞ්ග ඉපදීමට මෙය පෙරටු ය, මෙය පෙරනිමිත්ත ය. මහණෙනි, සත්බොජ්ඣඞ්ග වඩන්නේ ය සත්බොජ්ඣඞ්ග බහුල කරන්නේ ය යන මෙය කල්‍යාණමිතුරන් ඇති මහණහු විසින් කැමති වියයුතු. මහණෙනි, කල්‍යාණමිතුරන් ඇති මහණ කෙසේ නම් සත්බොජ්ඣඞ්ග වඩා ද, සත් බොජ්ඣඞ්ග බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙහි මහණ විවෙකනිස්සිත සිහිසම්බොජ්ඣඞ්ග විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී කොට වඩයි ... උපේසම්බොජ්ඣඞ්ග වඩයි. මහණෙනි, කල්‍යාණමිතුරන් ඇති මහණ තෙමේ මෙසේ සත් බොජ්ඣඞ්ග වඩයි, සත් බොජ්ඣඞ්ග බහුල කෙරේ යි.

## 2. 5. 9

## අඞ්ගසූත්‍රය

595. මහණෙනි, මේ යෝනිසොමනසිකාරය යම් බඳු ද, මහණෙනි සත්බොජ්ඣඞ්ග ඉපදීමට ඇතුළත වූ අවයවයක් කොට අන් එක් අවයවයකුදු නො ම දකිමි. මහණෙනි, සත්බොජ්ඣඞ්ග වඩන්නේ ය, සත්බොජ්ඣඞ්ග බහුල කරන්නේ ය යන මෙය යෝනිසොමනසිකාරසම්පන්න මහණහු විසින් කැමති වියයුතු. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ තෙමේ කෙසේ නම් සත්බොජ්ඣඞ්ග වඩා ද සත් බොජ්ඣඞ්ග බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී කොට සිහිසම්බොජ්ඣඞ්ග වඩයි...උපේසම්බොජ්ඣඞ්ග වඩයි. මහණෙනි, යෝනිසොමනසිකාරසම්පන්න මහණ මෙසේ සත්බොජ්ඣඞ්ග වඩයි, සත්බොජ්ඣඞ්ග බහුල කෙරේ යි.

## 2. 5. 10

## දුතියඅඞ්ග සූත්‍රය

596. මහණෙනි, මේ කල්‍යාණමිත්‍රත්වය යම්බඳු නම් මහණෙනි, සත්බොජ්ඣඞ්ග ඉපදීම පිණිස බාහිර වූ අවයවයක් කොට අන් එක් දහමකුදු නො ම දකිමි. මහණෙනි, සත්බොජ්ඣඞ්ග වඩන්නේ ය, සත්-බොජ්ඣඞ්ග බහුල කරන්නේ ය යන මෙය කල්‍යාණමිතුරන් ඇති මහණහු විසින් කැමති වියයුතු. මහණෙනි, කල්‍යාණමිතුරන් ඇති මහණ තෙමේ කෙසේ නම් සත්බොජ්ඣඞ්ග වඩා ද සත්බොජ්ඣඞ්ග බහුල කෙරේ ද යත්: මහණෙනි. මෙහි මහණ තෙමේ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී කොට සිහිසම්බොජ්ඣඞ්ග වඩයි...උපෙ-සම්බොජ්ඣඞ්ග වඩයි. මහණෙනි, කල්‍යාණමිතුරන් ඇති මහණ මෙසේ සත්බොජ්ඣඞ්ග වඩයි, සත්බොජ්ඣඞ්ග බහුල කෙරේ යි.

## පස්වැනිචක්කවත්ති වර්ග යි.

එහි සූත්‍රනාමාවලිය:

විධා, චක්කවත්ති, මාර, දුප්පඤ්ඤ, පඤ්ඤව, දලිද්ද, අදලිද්ද, ආදිච්චයි සූත්‍ර අටෙකි. අඞ්ගසූත්‍ර දෙකෙකි. ඔහු (මුළුල්ල) දශයෙකි යි.

# 6. බොජ්ඣඞ්ගවග්ගො

## 2. 6. 1

### ආහාරසුත්තං

597. පඤ්චන්නං ච භික්ඛවෙ' නීවරණානං සත්තන්නං ච බොජ්ඣඞ්ගානං ආහාරං ච අනාහාරං ච දෙසිස්සාමි. තං සුණාථ. කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස උප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය: අත්ථි භික්ඛවෙ, සුභනිමිත්තං. තත්ථ අයොනිසොමනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස උප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා ව්‍යාපාදස්ස උප්පාදාය උප්පන්නස්ස වා ව්‍යාපාදස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය: අත්ථි භික්ඛවෙ, පටිඝනිමිත්තං. තත්ථ අයොනිසොමනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා ව්‍යාපාදස්ස උප්පාදාය උප්පන්නස්ස වා ව්‍යාපාදස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා ථීනමිද්ධස්ස උප්පාදාය උප්පන්නස්ස වා ථීනමිද්ධස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය: අත්ථි භික්ඛවෙ, අරති තන්දි විජම්භිතා භත්තසම්මදො චෙතසො ච ලීනත්තං. තත්ථ අයොනිසොමනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා ථීනමිද්ධස්ස උප්පාදාය, උප්පන්නස්ස වා ථීනමිද්ධස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස උප්පාදාය උප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය: අත්ථි භික්ඛවෙ, චෙතසො අවූපසමො. තත්ථ අයොනිසොමනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස උප්පාදාය උප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය උප්පාදාය උප්පන්නාය වා විචිකිච්ඡාය භිය්‍යොභාවාය වෙපුල්ලාය: අත්ථි භික්ඛවෙ, විචිකිච්ඡාට්ඨානියා ධම්මා. තත්ථ අයොනිසොමනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය උප්පාදාය උප්පන්නාය වා විචිකිච්ඡාය භිය්‍යොභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා අත්ථි භික්ඛවෙ සතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා. තත්ථ යොනිසොමනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

# 6. බොජ්ඣඞ්ග වර්ගය

## 2. 6. 1

## ආහාර සූත්‍රය

597. මහණෙනි, පඤ්චනීවරණයන්ගේ ද සත්බොජ්ඣඞ්ගයන්ගේ ද ආහාරයත් අනාහාරයත් තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, නූපන් කාමච්ඡන්දය ඉපදීම පිණිසත් උපන් කාමච්ඡන්දයේ බොහෝ බව විපුල බව පිණිසත් ආහාර (-ප්‍රත්‍යය) කිමෙක් ද යත්: මහණෙනි, සුභනිමිත්තෙක් ඇත. එහි ලා නුනුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් කාමච්ඡන්දය ඉපදීම පිණිසත්, උපන් කාමච්ඡන්දයේ බොහෝ බව විපුල බව පිණිසත් මේ ආහාර යි.

මහණෙනි, නූපන් ව්‍යාපාදය ඉපදීම පිණිසත්, උපන් ව්‍යාපාදයේ බොහෝ බව විපුල බව පිණිසත් ආහාර කිමෙක් ද යත්: මහණෙනි, ප්‍රතිඝනිමිත්තෙක් ඇත. එහි ලා නුනුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද; නූපන් ව්‍යාපාදය ඉපදීම පිණිසත්, උපන් ව්‍යාපාදයේ බොහෝ බව විපුල බව පිණිසත් මේ ආහාර යි.

මහණෙනි, නූපන් ථීනමිද්ධය ඉපදීම පිණිසත් උපන් ථීනමිද්ධයේ බොහෝ බව විපුල බව පිණිසත් ආහාර කිමෙක් ද යත්: මහණෙනි, (අයිකුශලධර්මයන්හි) නො ඇල්මෙක් තෙමරියෙක් මැලිකැඩීමෙක් බත්-මතයෙක් සිතේ සැහැවුණු බවෙක් ඇත. එහි ලා නුනුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද; නූපන් ථීනමිද්ධයේ ඉපැද්ම පිණිසත් උපන් ථීනමිද්ධයේ බොහෝ බව විපුල බව පිණිසත් මේ ආහාර යි.

මහණෙනි, නූපන් උද්ධච්චකුක්කුච්චයේ ඉපැදීම පිණිසත් උපන් උද්ධච්චකුක්කුච්චයේ බොහෝ බව විපුල බව පිණිසත් ආහාර කිමෙක් ද යත්: මහණෙනි, සිතේ නො සන්සුන් කමෙක් ඇත. එහි ලා නුනුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද: නූපන් උද්ධච්ච-කුක්කුච්චයේ ඉපැද්ම පිණිසත්, උපන් උද්ධච්චකුක්කුච්චයේ බොහෝ බව විපුල බව පිණිසත් මේ ආහාර යි.

මහණෙනි, නූපන් විචිකිච්ඡාවේ ඉපැද්ම පිණිසත්, උපන් විචිකිච්ඡාවේ බොහෝ බව විපුල බව පිණිසත් ආහාර කිමෙක් ද යත්: මහණෙනි, විචිකිච්ඡාවට කරුණු වූ දහම්හු ඇතියහ. එහි ලා නුනුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් විචිකිච්ඡාවේ ඉපැද්ම පිණිසත්, උපන් විචිකිච්ඡාවේ බොහෝ බව විපුල බව පිණිසත් මේ ආහාර යි.

මහණෙනි, නූපන් සතිසම්බොජ්ඣඞ්ගයේ ඉපැද්මටත්, උපන් සති-සම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් ආහාර කිමෙක් ද යත්: මහණෙනි, සතිසම්බොජ්ඣඞ්ගයට කරුණු වූ දහම්හු ඇතියහ. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් සති-සම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත්, උපන් සතිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ ආහාර යි.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා. අත්ථි භික්ඛවෙ, කුසලාකුසලා ධම්මා, සාවජ්ජානවජ්ජා ධම්මා, හීනප්පණීතා ධම්මා, කණ්හසුක්කසප්පටිභාගා ධම්මා, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා. අත්ථි භික්ඛවෙ, ආරම්භධාතු නික්කමධාතු පරක්කමධාතු. තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනා පාරිපූරියා. අත්ථි භික්ඛවෙ, පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා. තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය උප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනා පාරිපූරියා: අත්ථි භික්ඛවෙ, කායපස්සද්ධි,[1] චිත්තපස්සද්ධි, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා අත්ථි භික්ඛවෙ, සමථනිමිත්තං[3] අබ්‍යග්ගනිමිත්තං, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා,

කො ච භික්ඛවෙ, ආහාරො අනුප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනා පාරිපූරියා: අත්ථි භික්ඛවෙ, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

---

1. කායපස්සද්ධි - මජ්ඣං, ස්‍යා.
2. චිත්තපස්සද්ධි - මජ්ඣං, ස්‍යා.
3. සමාධිනිමිත්තං - සී 1, 2, ස්‍යා.

මහණෙනි, නූපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත්, උපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් ආහාර කිමෙක් ද යත්: මහණෙනි, කුශලාකුශල ධර්මයෝ සාවද්‍ය අනවද්‍ය ධර්මයෝ හීනප්‍රණීත ධර්මයෝ කෘෂ්ණ ශුක්ල සප්‍රතිභාග ධර්මයෝ ඇතියහ. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ ආහාර යි.

මහණෙනි, නූපන් විරියසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත්, උපන් විරියසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් ආහාරය කිමෙක් ද යත්: මහණෙනි, පළමු ඇරඹුණු වීර්‍ය්‍යයෙක් මැළිබැවින් නික්මෙනවීර්‍ය්‍යයෙක් මතු මතු තැන් ඇක්මෙන වීර්‍ය්‍යයෙක් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් විරියසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත්, උපන් විරියසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ ආහාර යි.

මහණෙනි, නූපන් පීතිසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත්, උපන් පීති-සම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් ආහාරය කිමෙක් ද යත්: මහණෙනි, පීතිසම්බොජ්ඣඞ්ගයට කරුණු වූ දහම් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුලකිරීමෙක් වේ ද නූපන් පීති-සම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් පීතිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ ආහාර යි.

මහණෙනි, නූපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත්, උපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් ආහාරය කිමෙක් ද යත්: මහණෙනි, කයෙහි සැහැල්ලු බවෙක් සිතෙහි සැහැල්ලු බවෙක් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද නූපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත්, උපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ ආහාර යි.

මහණෙනි, නූපන් සමාධිසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත්, උපන් සමාධිසම්බොජ්ඣඞ්ගය පිරීමටත් ආහාරය කිමෙක් ද යත්: මහණෙනි, සමථ නිමිත්තෙක් අව්‍යග්‍ර නිමිත්තෙක් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් සමාධි සම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත්, උපන් සමාධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ ආහාර යි.

මහණෙනි, නූපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත්, උපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් ආහාරය කිමෙක් ද යත්: මහණෙනි, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයට කරුණු වූ දහම්හු ඇතියහ. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය ඉපැදීමටත්, උපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ ආහාර යි.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස උප්පාදය, උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස භියෙයාභාවාය වෙපුල්ලාය: අත්ථි භික්ඛවෙ අසුභනිමිත්තං, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො. අයමනාහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස උප්පාදය, උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස භියෙයාභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා ව්‍යාපාදස්ස උප්පාදය, උප්පන්නස්ස වා ව්‍යාපාදස්ස භියෙයාභාවාය වෙපුල්ලාය: අත්ථි භික්ඛවෙ, මෙත්තාචෙතොවිමුත්ති. තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමනාහාරො අනුප්පන්නස්ස වා ව්‍යාපාදස්ස උප්පාදය, උප්පන්නස්ස වා ව්‍යාපාදස්ස භියෙයාභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා ථීනමිද්ධස්ස උප්පාදය, උප්පන්නස්ස වා ථීනමිද්ධස්ස භියෙයාභාවාය වෙපුල්ලාය: අත්ථි භික්ඛවෙ, ආරම්භධාතු නික්කමධාතු පරක්කමධාතු, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමනාහාරො අනුප්පන්නස්ස වා ථීනමිද්ධස්ස උප්පාදය, උප්පන්නස්ස වා ථීනමිද්ධස්ස භියෙයාභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස උප්පාදය, උප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස භියෙයාභාවාය වෙපුල්ලාය: අත්ථි භික්ඛවෙ, චෙතසො වූපසමො. තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමනාහාරො අනුප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස උප්පාදය, උප්පන්නස්ස වා උද්ධච්චකුක්කුච්චස්ස භියෙයාභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය උප්පාදය, උප්පන්නාය වා විචිකිච්ඡාය භියෙයාභාවාය වෙපුල්ලාය: අත්ථි භික්ඛවෙ, කුසලාකුසලා ධම්මා, සාවජ්ජානවජ්ජා ධම්මා, හීනප්පණීතා ධම්මා, කණ්හසුක්කසප්පටිභාගා ධම්මා, තත්ථ යොනිසො මනසිකාරබහුලීකාරො, අයමනාහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය උප්පාදය, උප්පන්නාය වා විචිකිච්ඡාය භියෙයාභාවාය වෙපුල්ලාය.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා: අත්ථි භික්ඛවෙ, සතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා, තත්ථ අමනසිකාර බහුලීකාරො, අයමනාහාරො අනුප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය උප්පන්නස්ස වා සතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

මහණෙනි, නූපන් කාමච්ඡන්දයේ ඉපැද්ම පිණිසත් උපන් කාමච්ඡන්දයේ බොහෝ බව විපුලත්වය පිණිසත් කිමෙක් අනාහාර (-ප්‍රත්‍යය නො වේ) ද යත්: මහණෙනි, අසුබ නිමිත්තෙක් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක්වේ ද, නූපන් කාමච්ඡන්දයේ ඉපැද්ම පිණිසත් උපන් කාමච්ඡන්දයේ බොහෝ බව විපුලබව පිණිසත් මේ අනාහාර යි.

මහණෙනි, නූපන් ව්‍යාපාදයේ ඉපැද්ම පිණිසත් උපන් ව්‍යාපාදයේ බොහෝ බව විපුලත්වය පිණිසත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, මෛත්‍රීචිත්තවිමුක්තියෙක් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් ව්‍යාපාදයේ ඉපැද්ම පිණිසත් උපන් ව්‍යාපාදයේ බොහෝ බව විපුලබව පිණිසත් මේ අනාහාර යි.

මහණෙනි, නූපන් ථීනමිද්ධයේ ඉපැද්ම පිණිසත් උපන් ථීනමිද්ධයේ බොහෝ බව විපුලත්වය පිණිසත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, පළමු ඇරඹුණු වීර්‍ය්‍යයෙක් මැලි බැවින් නික්මුණු වීර්‍ය්‍යයෙක් මතු මතු තැන් ඇක්මෙන වීර්‍ය්‍යයෙක් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් ථීනමිද්ධයේ ඉපැද්ම පිණිසත් උපන් ථීනමිද්ධයේ බොහෝ බව විපුලබව පිණිසත් මේ අනාහාර යි.

මහණෙනි, නූපන් උද්ධච්චකුක්කුච්චයේ ඉපැද්ම පිණිසත් උපන් උද්ධච්චකුක්කුච්චයේ බොහෝ බව විපුලබව පිණිසත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, සිතේ සංසිඳීමෙක් ඇත. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීම වේ ද, නූපන් උද්ධච්චකුක්කුච්චයේ ඉපැද්ම පිණිසත් බොහෝ බව විපුලබව පිණිසත් මේ අනාහාර යි.

මහණෙනි, නූපන් විචිකිච්ඡාවේ ඉපැද්ම පිණිසත් උපන් විචිකිච්ඡාවේ බොහෝ බව විපුලබව පිණිසත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, කුශලාකුශලධර්මයෝ සාවද්‍ය අනවද්‍ය ධර්මයෝ හීනප්‍රණීතධර්මයෝ කෘෂ්ණශුක්ලසප්‍රතිභාගධර්මයෝ ඇතියහ. එහි ලා නුවණින් මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් විචිකිච්ඡාවේ ඉපැද්ම පිණිසත් උපන් විචිකිච්ඡාවේ බොහෝ බව විපුලබව පිණිසත් මේ අනාහාර යි.

මහණෙනි, නූපන් සතිසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් සති-සම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, සතිසම්බොජ්ඣඞ්ගයට කරුණු වූ දහම්හු ඇතියහ. එහි ලා නො මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් සතිසම්බො-ජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් සතිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ අනාහාර යි.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා ධම්මවිචය-සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා: අත්ථි භික්ඛවෙ, කුසලාකුසලා ධම්මා, සාවජ්ජානවජ්ජා ධම්මා, හීනප්පණීතා ධම්මා කණ්හසුක්කසප්පටිභාගා ධම්මා, තත්ථ අමනසිකාරබහුලීකාරො, අයමනාහාරො අනුප්පන්නස්ස වා ධම්මවිචය-සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා විරියසම්බොජ්ඣ-ඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනා-පාරිපූරියා: අත්ථි භික්ඛවෙ, ආරම්භධාතු නික්කමධාතු පරක්කමධාතු. තත්ථ අමනසිකාරබහුලීකාරො, අයමනාහාරො අනුප්පන්නස්ස වා විරිය-සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා: අත්ථි භික්ඛවෙ, පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා, තත්ථ අමනසිකාර-බහුලීකාරො, අයමනාහාරො අනුප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය උප්පන්නස්ස වා පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා: අත්ථි භික්ඛවෙ, කායපස්සද්ධි, චිත්තපස්සද්ධි. තත්ථ අමනසිකාරබහුලීකාරො, අයමනාහාරො අනුප්පන්නස්ස වා පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා,

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා සමාධි-සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා: අත්ථි භික්ඛවෙ, සමථනිමිත්තං, අබ්‍යග්ගනිමිත්තං. තත්ථ අමනසිකාරබහුලීකාරො. අයමනාහාරො අනුප්පන්නස්ස වා සමාධි-සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා.

කො ච භික්ඛවෙ, අනාහාරො අනුප්පන්නස්ස වා උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියා: අත්ථි භික්ඛවෙ, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගට්ඨානියා ධම්මා· තත්ථ අමනසිකාරබහුලීකාරො, අයමනාහාරො අනුප්පන්නස්ස වා උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාපාරිපූරියාති.

මහණෙනි, නූපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, කුශලාකුශලධර්මයෝ සාවද්‍ය අනවද්‍ය ධර්මයෝ හීන-ප්‍රණීතධර්මයෝ කෘෂ්ණශුක්ලසප්‍රතිභාගධර්මයෝ ඇතියහ. එහි ලා නො මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ අනාහාර යි.

මහණෙනි, නූපන් විරියසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් විරිය-සම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, පළමු ඇරඹුණු වීර්‍ය්‍යයෙක් මැලිබැවින් නික්මෙන වීර්‍ය්‍යයෙක්, මතු මතු තැන් ඇක්මෙන වීර්‍ය්‍යයෙක් ඇත. එහි ලා නො මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් විරියසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් විරියසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ අනාහාර යි.

මහණෙනි, නූපන් පීතිසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් පීති සම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, පීතිසම්බොජ්ඣඞ්ගයට කරුණු වූ දහම්හු ඇතියහ. එහි ලා නො මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් පීතිසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් පීතිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ අනාහාර යි.

මහණෙනි, නූපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, කයෙහි සැහැල්ලු බවෙක් සිතෙහි සැහැල්ලු බවෙක් ඇත. එහි ලා නො මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් පස්සද්ධි-සම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වැඩී-මෙන් පිරීමටත්, මේ අනාහාර යි.

මහණෙනි, නූපන් සමාධිසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් සමාධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, සමථනිමිත්තෙක් අබ්‍යග්ගනිමිත්තෙක් ඇත. එහි ලා නො මෙනෙහි කිරීම බහුලකිරීමෙක් වේ ද, නූපන් සමාධිසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් සමාධිසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටක් මේ අනාහාර යි.

මහණෙනි, නූපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය ඉපැද්මටත් උපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් කිමෙක් අනාහාර ද යත්: මහණෙනි, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයට කරුණු වූ දහම්හු ඇතියහ. එහි ලා නො මෙනෙහි කිරීම බහුල කිරීමෙක් වේ ද, නූපන් උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගයේ ඉපැද්මටත් උපන් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වැඩීමෙන් පිරීමටත් මේ අනාහාරවේ යි.



Free Distribution www.aathaapi.org

## 2. 6. 2

## පරියායසුත්තං

298. අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: "අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූන මයං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යාමා''ති. අථ ඛො තෙ භික්ඛූ යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එතදවොචුං: "සමණො ආවුසො ගොතමො සාවකානං එවං ධම්මං දෙසෙති. "එථ තුම්හෙ භික්ඛවෙ, පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙථා''ති. මයම්පි ඛො ආවුසො, සාවකානං එවං ධම්මං දෙසෙම. "එථ තුම්හෙ ආවුසො, පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙථා''ති. ඉධ නො ආවුසො කො විසෙසො, කො අධිප්පායො[1], කිං නානාකරණං, සමණස්ස වා ගොතමස්ස අම්හාකං වා යදිදං ධම්මදෙසනාය වා ධම්මදෙසනං අනුසාසනියා වා අනුසාසනින්ති ''

අථ ඛො තෙ භික්ඛූ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිංසු, නප්පටික්කොසිංසු. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිංසු, "භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමා''ති. අථ ඛො තෙ භික්ඛූ සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "ඉධ මයං භන්තෙ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිම්හ, තෙසං නො භන්තෙ, අම්හාකං එතදහොසි: "අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං. යන්නූන මයං යෙන ඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යාමා''ති.

අථ ඛො මයං භන්තෙ, යෙන ඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිම්හ. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිම්හ. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිම්හ. එකමන්තං නිසින්නෙ ඛො අම්හෙ භන්තෙ, තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එතදවොචුං: "සමණො ආවුසො ගොතමො සාවකානං එවං ධම්මං දෙසෙති. "එථ තුම්හෙ භික්ඛවෙ, පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙථා''ති.

1. අධිප්පායසො – මජ්සං, සත්‍ය.

## 2. 6. 2

## පරියාය සූත්‍රය

598. එකල්හි බොහෝ භික්ෂූහු පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන සැවතට පිඩු පිණිස පිවිසියහ. ඉක්බිති ඒ භික්ෂූන්ට මෙබඳු සිතෙක් විය: "සැවතෙහි පිඩු පිණිස හැසිරෙන්ට තව ම කල් වැඩි ය අපි අන්තොටු පිරිවැජ්ජන්ගේ අරම වෙත එළැඹෙන්නමෝ නම් මැනැවැ'' යි. එකල්හි ඒ භික්ෂූහු අන්තොටු පිරිවැජ්ජන්ගේ අරම කරා එළඹියහ. එළඹ ඒ අන්තොටු පිරවැජ්ජන් සමඟ සතුටු වූහ. සතුටු විය යුතු සිහි කට යුතු කථා කොට නිමවා එකත් පස්ව හුන්හ. එකත් පස් ව හුන් ඒ භික්ෂූන්ට ඒ අන්තොටු පිරිවැජ්ජෝ මෙය කීහ: ඇවැත්නි, "මහණ ගොයුම් සව්වන්ට මෙසේ දහම් දෙසයි "මහණෙනි, එව, තෙපි සිත කෙලෙසන නුවණ දුබල කරන පස්නීවරණ පහ කොට සත්බොජඟ තතු සේ වඩව'' යි. ඇවැත්නි, අපිදු සව්වනට මෙසේ දහම් දෙසමු.'' ඇවැත්නි, එව. තෙපි සිත කෙලෙසන නුවණ දුබල කරන පස්නීවරණ පහ කොට සත් බොජඟ තතු සේ වඩව'' යි. ඇවැත්නි, ශ්‍රමණ ගෞතමයන්ගේ හා අපගේ යම් මේ ධර්මදෙශනාව හා සමග ධර්මදෙශනාවක් හෝ අනුශාසනාව හා සමග අනුශාසනාවක් ඇද්ද, අප දෙදෙනාගේ මේ පැනවීමෙහි ලා විශෙෂ කිම? අධික ප්‍රයෝග කිම? නානාත්ව කිමැයි.

ඉක්බිති ඒ භික්ෂූහු ඒ අන්තොටු පිරිවැජ්ජන්ගේ දෙසුම නො ම පිළිගත්හ, නොම පිළිකෙව් කළහ. නො පිළිගෙන නො පිළිකෙව් කොට "භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මේ දෙසුම්හි අරුත දැන ගන්නමෝයි හුනස්නෙන් නැඟිට ගියහ. ඉක්බිති ඒ භික්ෂූහු සැවතෙහි පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්-පසෙක හුන්හ. එකත් පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්-සේට මෙය සැලකළහ: "වහන්ස, මෙහි අපි පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන සැවතට පිඩු පිණිස පිවිසියෙමු. වහන්ස, ඒ අපට මේ සිතවිය: "සැවතෙහි පිඩු පිණිස හැසිරෙන්නට තවම කල් වැඩිය. අපි අන්තොටු පිවැජ්ජන්ගේ අරම කරා එළඹෙන්නමෝ නම් මැනැවැ'' යි.

වහන්ස, ඉක්බිති අපි අන්තොටු පිරිවැජ්ජන්ගේ අරම වෙත එළඹ ඒ අන්තොටු පිරිවැජ්ජන් සමග සතුටු වූමු. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත් පසෙක හුන්නෙමු. වහන්ස එකත්පසෙක හුන් අපට ඒ අන්තොටු පිරිවැජ්ජෝ මෙය කීහ: "ඇවැත්නි, මහණ ගොයුම් සව්වන්ට මෙසේ දහම් දෙසයි: "මහණෙනි එව, තෙපි සිත කෙලෙසන නුවණ දුබල කරන පස්නීවරණ පහ කොට සත්බොජඟ තතු සේ වඩව'' යි. ඇවැත්නි, අපිත් සව්වනට මෙසේ දහම් දෙසමු: "ඇවැත්නි, එව තෙපි සිත කෙලෙසන නුවණ දුබල කරන පස්නීවරණ පහ කොට සත්බොජඟ තතු සේ වඩව'' යි.

මයම්පි ඛො ආවුසො, සාවකානං එවං ධම්මං දෙසෙම: ''එථ තුම්හෙ ආවුසො, පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ, සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙථා''ති. ඉධ නො ආවුසො, කො විසෙසො කො අධිප්පායො කිං නානාකරණං සමණස්ස වා ගොතමස්ස අම්හාකං වා යදිදං ධම්මදෙසනාය වා ධම්මදෙසනං අනුසාසනියා වා අනුසාසනින්ති. අථ ඛො මයං භන්තෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිම්හ; නප්පටික්කොසිම්හ. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිම්හ. ''භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමා''ති.

එවං වාදිනො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා. අත්ථි පනාවුසො පරියායො යං පරියායං ආගම්ම පඤ්චනීවරණා දස හොන්ති. සත්තබොජ්ඣඞ්ගා චතුද්දසාති? එවං පුට්ඨා භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා න චෙව සම්පායිස්සන්ති[1]. උත්තරිඤ්ච විඝාතං ආපජ්ජිස්සන්ති. තං කිස්ස හෙතු: යථා තං භික්ඛවෙ, අවිසයස්මිං. නාහං තං භික්ඛවෙ, පස්සාමි[2] සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය. යො ඉමෙසං පඤ්හානං වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතෙන වා තථාගතසාවකෙන වා ඉතො වා පන සුත්වා.

කතමො ච භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම පඤ්චනීවරණා දස හොන්ති: යදපි භික්ඛවෙ, අජ්ඣත්තං කාමච්ඡන්දො තදපි නීවරණං. යදපි බහිද්ධා කාමච්ඡන්දො තදපි නීවරණං. කාමච්ඡන්දනීවරණන්ති ඉතිහිදං උද්දෙසං ගච්ඡති.[3] තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති.

යදපි භික්ඛවෙ, අජ්ඣත්තං බ්‍යාපාදො තදපි නීවරණං. යදපි බහිද්ධා බ්‍යාපාදො තදපි නීවරණං. බ්‍යාපාදනීවරණන්ති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති.

යදපි භික්ඛවෙ, ථීනං තදපි නීවරණං, යදපි මිද්ධං තදපි නීවරණං. ථීනමිද්ධනීවරණන්ති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති.

යදපි භික්ඛවෙ, උද්ධච්චං තදපි නීවරණං. යදපි කුක්කුච්චං තදපි නීවරණං. උද්ධච්චකුක්කුච්චනීවරණන්ති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති.

---

1. සමුපායිස්සන්ති – සී 2
2. පස්සිස්සාමි - සී 1.
3. ආගච්ඡති. – ස්‍යා.

ඇවැත්නි, ශ්‍රමණ ගෞතමයන්ගේ හා අපගේ යම් මේ ධර්මදේශනාව හා සමග ධර්මදේශනාවක් හෝ අනුශාසනාව හා සමග අනුශාසනාවක් ඇද්ද, අපදෙදෙනාගේ මේ පැනවීමෙහි ලා විශේෂත්‍වය, අධික ප්‍රයෝග කිම නානාත්‍වකිමැ' යි. වහන්ස, ඉක්බිති අපි ඒ අන්‍යතොවුු පිරිවැජ්ජන්ගේ දෙසුම නො ම පිළිගතුම්හ. නො ම පිළිකෙව් කළම්හ. නො පිළිගෙන නො පිළිකෙව් කොට භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි මෙ වදනෙහි අරුත දැනගන්නමෝ යි හුනස්නෙන් නැඟිට පිටත් ව ගියෙමු.

මහණෙනි, මෙසේ කියන ඒ අන්‍යතොවුු පිරිවැජ්ජෝ මෙසේ කිව යුතු වන්නාහ: "ඇවැත්නි, යම් නයකට පැමිණ පඤ්චනීවරණ දසයෙක් වේ නම්, සත්බොජ්ඣඞ්ග තුදුසෙක් වේ නම් එබඳු නයෙක් ඇත්ද" යි. මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද අන්‍යතොවුු පිරිවැජ්ජෝ (පිළිතුරු) සපයා කියන්නට නො ද හැකි වන්නාහ. මතු දුකටත් පැමිණෙන්නාහ. ඒ කවර හෙයින යත්: මහණෙනි, අවිෂය කරුණෙහි ලා (පුළුවුස්නා ලද්දේ) යම් සේ නම් එහෙයිනි. මහණෙනි, තථාගත කෙනෙකුන් විසින් හෝ තථාගත සව්වකු විසින් හෝ මෙයින් (-මාගේ සස්නෙන්) අසා (-ඉගෙන) හෝ හැර යමෙක් මේ පැන විසඳීමෙන් සිත සතුටු කරන්නේ නම් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජායෙහි එබන්දකු මම නො ම දකිමි.

මහණෙනි, යම් නයකට පැමිණ පස්නීවරණ දසයෙක් වේ නම් ඒ නය කවරේ ද යත්: මහණෙනි: ඇතුළත (සිය පස් කඳ ඇරබ) යම් කාමච්ඡන්දයකුත් වේ නම් එද නීවරණයෙකි. පිටත (මෙරමා පස් කඳ ඇරබ) යම් කාමච්ඡන්දයකුත් වේ නම් එද නීවරණයෙකි. **මෙසේ මෙය කාමච්ඡන්දනීවරණය යි ගණනට යේ. ඒ මෙ නයිනුදු දෙකෙක් වේ.**

මහණෙනි, **ඇතුළත යම් ව්‍යාපාදයෙකුත්** වේ නම් එ ද නීවරණයෙකි. **පිටත යම් ව්‍යාපාදයෙකුත් වේ** නම් එ ද නීවරණයෙකි. මෙසේ **මෙය ව්‍යාපාදනීවරණය** යි උදෙසීමට යෙයි. ඒ මෙ නයිනු දු **දෙකෙක් වේ.**

යම් ථිනයකුත් වේ නම් එ ද නීවරණයෙකි. යම් මිද්ධයකුත් වේ නම් එද නීවරණයෙකි. මෙසේ මෙය ථිනමිද්ධනීවරණය යි උදෙසීමට යෙයි. ඒ මෙනයිනුදු දෙකෙක් වේ.

මහණෙනි, යම් උද්ධච්චයකුත් වේ නම් එ ද නීවරණයෙකි. යම් කුක්කුච්චයකුත් වේ නම් එ ද නීවරණයෙකි. මෙසේ මෙය උද්ධච්චකුක්කුච්චනීවරණය යි උදෙසීමට යෙයි ඒ මෙ නයිනුදු දෙකෙක් වේ.

යදපි භික්ඛවෙ, අජ්ඣත්තං ධම්මෙසු විචිකිච්ඡා තදපි නීවරණං. යදපි බහිද්ධා ධම්මෙසු විචිකිච්ඡා තදපි නීවරණං. විචිකිච්ඡා නීවරණන්ති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති. අයං ඛො භික්ඛවෙ පරියායො යං පරියායං ආගම්ම පඤ්චනීවරණා දස හොන්ති.

කතමො ච භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම සත්ත බොජ්ඣඞ්ගා චතුද්දස හොන්ති: යදපි භික්ඛවෙ, අජ්ඣත්තං ධම්මෙසු[1] සති තදපි සතිසම්බොජ්ඣඞ්ගො. යදපි බහිද්ධා ධම්මෙසු සති තදපි සතිසම්බොජ්ඣඞ්ගො. සතිසම්බොජ්ඣඞ්ගොති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති.

යදපි භික්ඛවෙ, අජ්ඣත්තං ධම්මෙසු[1] පඤ්ඤාය පවිචිනති පවිචරති[2] පරිවීමංසමාපජ්ජති තදපි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො. යදපි බහිද්ධා ධම්මෙසු පඤ්ඤාය පවිචිනති පවිචරති[2] පරිවීමංසමාපජ්ජති තදපි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගොති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති.

යදපි භික්ඛවෙ, කායිකං විරියං තදපි විරියසම්බොජ්ඣඞ්ගො. යදපි චෙතසිකං විරියං තදපි විරියසම්බොජ්ඣඞ්ගො. විරියසම්බොජ්ඣඞ්ගොති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති.

යදපි භික්ඛවෙ, සවිතක්කසවිචාරා පීති තදපි පීතිසම්බොජ්ඣඞ්ගො. යදපි අවිතක්කඅවිචාරා පීති තදපි පීතිසම්බොජ්ඣඞ්ගො. පීතිසම්බොජ්ඣඞ්ගොති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති.

යදපි භික්ඛවෙ, කායපස්සද්ධි තදපි පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, යදපි චිත්තපස්සද්ධි, තදපි පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගොති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති.

යදපි භික්ඛවෙ, සවිතක්කො සවිචාරො සමාධි තදපි සමාධිසම්බොජ්ඣඞ්ගො, යදපි අවිතක්කො අවිචාරො සමාධි තදපි සමාධිසම්බොජ්ඣඞ්ගො, සමාධිසම්බොජ්ඣඞ්ගොති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති.

යදපි භික්ඛවෙ, අජ්ඣත්තං ධම්මෙසු උපෙක්ඛා තදපි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො; යදපි බහිද්ධාධම්මෙසු උපෙක්ඛා තදපි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගොති ඉතිහිදං උද්දෙසං ගච්ඡති. තදමිනාපෙතං පරියායෙන ද්වයං හොති. අයං ඛො භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම සත්තබොජ්ඣඞ්ගා චතුද්දසාති.

1. අජ්ඣත්තිකධම්මෙසු - සීමු.
2. පවිචිනිපවිචරිණ - පී 1, 2.

මහණෙනි, ඇතුළත (සිය පස්කඳෙහි) යම් විචිකිච්ඡාවකුත් වේ නම් එ ද නීවරණයෙකි. පිටත (අන්තැන්හි) යම් විචිකිච්ඡාවකුත් වේ නම් එ ද නීවරණයෙකි. මෙසේ මෙය විචිකිච්ඡානීවරණය යි උදෙසීමට යේ. ඒ මේ නයිනුදු දෙකෙක් වේ. මහණෙනි, යම් නයකට පැමිණ පස්නීවරණ දසයෙක් වේ නම් මේ (ඒ) නයයි.

මහණෙනි, යම් නයකට පැමිණ සත්බොජ්ඣඞ්ග තුදුසෙක් වේ නම් (ඒ) නය කවරේ ද යත්: මහණෙනි, ඇතුළත දහම්හි (–ආධ්‍යාත්මික–සංස්කාරයන්හි) යම් සිහියකුත් වේ නම් එ ද සතිසම්බොජ්ඣඞ්ගයෙකි. පිටත දහම්හි (–බාහිර සංස්කාරයන්හි) යම් සිහියකුත් වේ නම් එ ද සතිසම්බොජ්ඣඞ්ගයෙකි. මෙසේ මෙය සතිසම්බොජ්ඣඞ්ගයයි උදෙසීමට යේ. ඒ මේ නයිනුදු දෙකෙක් වේ.

මහණෙනි, ඇතුළත දහම්හි නුවණින් සොයයි, පරීක්‍ෂා කෙරෙයි හාත්පසින් විමසීමට පැමිණෙයි යන යමක් වේ නම් එ ද ධම්මවිචයසම්බොජ්ඣඞ්ගයෙකි. පිටත දහම්හි නුවණින් සොයයි, පරීක්‍ෂා කෙරෙයි හාත්පසින් විමසීමට පැමිණෙයි යන යමක් වේ නම් ඒ ද ධම්මවිචය සම්බොජ්ඣඞ්ගයෙකි. මෙසේ මෙය ධම්මවිචයසම්බොජ්ඣඞ්ග ය යි උදෙසීමට යෙ යි. ඒ මේ නයිනුදු දෙකෙක් වේ.

මහණෙනි, යම් කායික වීර්‍ය්‍යයෙකුත් වේ නම් එ ද වීරියසම්බොජ්ඣඞ්ගයෙකි. යම් චෛතසික වීර්‍ය්‍යයෙකුත් වේ නම් එ ද වීරිය සම්බොජ්ඣඞ්ගයෙකි. මෙසේ මෙය වීරියසම්බොජ්ඣඞ්ග ය යි උදෙසීමට යේ. ඒ මේ නයිනුදු දෙකෙක් වේ.

මහණෙනි. යම් සවිතර්කසවිචාර ප්‍රීතියෙකුත් වේ නම් එ ද ප්‍රීති–සම්බොජ්ඣඞ්ගයෙකි. යම් අවිතර්කඅවිචාර ප්‍රීතියෙකුත් වේ නම් එ ද පීතිසම්බොජ්ඣඞ්ගයෙකි. මෙසේ මෙය පීතිසම්බොජ්ඣඞ්ගය යි උදෙසීමට යේ. ඒ මේ නයිනුදු දෙකෙක් වේ.

මහණෙනි, යම් කායපස්සද්ධියෙකුත් වේ නම් එ ද පස්සද්ධිසම්බොජ්ඣඞ්ගයෙකි. යම් චිත්තපස්සද්ධියෙකුත් වේ නම එ ද පස්සද්ධි–සම්බොජ්ඣඞ්ගයෙකි. මෙසේ මෙය පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය යි උදෙසීමට යේ. ඒ මේ නයිනුදු දෙකෙක් වේ.

මහණෙනි, යම් සවිතර්කසවිචාර සමාධියෙකුත් වේ නම් එ ද සමාධිසම්බොජ්ඣඞ්ගයෙකි. යම් අවිතක්කඅවිචාර සමාධියෙකුත් වේ නම් එ ද සමාධිසම්බොජ්ඣඞ්ගයෙකි. මෙසේ මෙය සමාධි සම්බොජ්ඣඞ්ගය යි උදෙසීමට යේ. ඒ මේ නයිනුදු දෙකෙක් වේ.

මහණෙනි, ඇතුළත දහම්හි යම් මැදහත් බවෙකුත් වේ නම් එ ද උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයෙකි. පිටත දහම්හි යම් මැදහත්බවෙකුත් වේ නම් එ ද උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයෙකි. මෙසේ මෙය උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගයයි උදෙසීමට යේ. ඒ මේ නයිනුදු දෙකෙක් වේ මහණෙනි, යම් නයකට පැමිණ සත්බොජ්ඣඞ්ග තුදුසෙක් වේ නම් මේ (ඒ) නය යි.

## 2. 6. 3

## අග්ගිසුත්තං

599. අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිංසු -පෙ- (පරියාය සුත්තනෙත-වණ්ණිතකඤ්ඤෙවෙත්ථ) එවංවාදිනො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: "යස්මිං ආවුසො, සමයෙ ලීනං චිත්තං හොති, කතමෙසං තස්මිං සමයෙ බොජ්ඣඞ්ගානං අකාලො භාවනාය, කතමෙසං තස්මිං සමයෙ බොජ්ඣඞ්ගානං කාලො භාවනාය: යස්මිං පනාවුසො සමයෙ උද්ධතං චිත්තං හොති, කතමෙසං තස්මිං සමයෙ බොජ්ඣඞ්ගානං අකාලො භාවනාය, කතමෙසං තස්මිං සමයෙ බොජ්ඣඞ්ගානං කාලො භාවනායා"ති. එවං පුට්ඨා භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා න චෙව සම්පායිස්සන්ති, උත්තරිඤ්ච විඝාතං ආපජ්ජිස්සන්ති. තං කිස්ස හෙතු: යථා තං භික්ඛවෙ අවිසයස්මිං. නාහං තං භික්ඛවෙ, පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යො ඉමෙසං පඤ්හානං වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතෙන වා තථාගතසාවකෙන වා ඉතො වා පන සුත්වා.

යස්මිං භික්ඛවෙ, සමයෙ ලීනං චිත්තං හොති අකාලො තස්මිං සමයෙ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. අකාලො සමාධිසම්බො-ජ්ඣඞ්ගස්ස භාවනාය. අකාලො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු: ලීනං භික්ඛවෙ චිත්තං. තං එතෙහි ධම්මෙහි දුස්සමුට්ඨාපයං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො පරිත්තං අග්ගිං උජ්ජාලෙතුකාමො අස්ස, සො තත්ථ අල්ලානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය, අල්ලානි ච ගොමයානි පක්ඛිපෙය්‍ය, අල්ලානි ච කට්ඨානි පක්ඛිපෙය්‍ය, උදකවාතඤ්ච දදෙය්‍ය, පංසුකෙන ච ඔකිරෙය්‍ය, භබ්බො නු ඛො සො පුරිසො පරිත්තං අග්ගිං උජ්ජාලෙතුන්ති? නො හෙතං භන්තෙ. එවමෙව ඛො භික්ඛවෙ, යස්මිං සමයෙ ලීනං චිත්තං හොති, අකාලො තස්මිං සමයෙ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. අකාලො සමාධිසම්බො-ජ්ඣඞ්ගස්ස භාවනාය. අකාලො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු: ලීනං භික්ඛවෙ චිත්තං. තං එතෙහි ධම්මෙහි දුස්සමුට්ඨාපයං හොති.

යස්මිං ච ඛො භික්ඛවෙ, සමයෙ ලීනං චිත්තං හොති. කාලො තස්මිං සමයෙ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. කාලො විරිය-සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. කාලො පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු: ලීනං භික්ඛවෙ චිත්තං. තං එතෙහි ධම්මෙහි සුසමුට්ඨාපයං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො පරිත්තං අග්ගිං උජ්ජාලෙතුකාමො අස්ස. සො තත්ථ සුක්ඛානි චෙව තිණානි පක්ඛි-පෙය්‍ය. සුක්ඛානි ගොමයානි පක්ඛිපෙය්‍ය. සුක්ඛානි කට්ඨානි පක්ඛි-පෙය්‍ය. මුඛවාතං ච දදෙය්‍ය. න ච පංසුකෙන ඔකිරෙය්‍ය භබ්බො නු ඛො සො පුරිසො පරිත්තං අග්ගිං උජ්ජාලෙතුන්ති. එවං භන්තෙ. එවමෙව ඛො භික්ඛවෙ, යස්මිං සමයෙ ලීනං චිත්තං හොති, කාලො තස්මිං සමයෙ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. කාලො විරිය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. කාලො පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු: ලීනං භික්ඛවෙ චිත්තං, තං එතෙහි ධම්මෙහි සුසමුට්ඨාපයං හොති.

## 2. 6. 3

## අග්ගි සූත්‍රය

599. එකල්හි බොහෝ භික්ෂූහු පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන සැවතට පිඬු පිණිස පිවිසියහ...(පරියාය සූත්‍රයේ වර්ණනා කළ ක්‍රමය මැ යි) මහණෙනි, මෙබඳු වාද ඇති අන්තොටු පිරිවැජ්ජෝ මෙසේ කිය යුතු වන්නාහු: ඇවැත්නි, යම් කලෙක සිත සැහවුණේ වේ නම් එසමයෙහි කවර බොජ්ඣඞ්ගයන් වැඩීමට නො කල් ද? එසමයෙහි කවර බොජ්ඣඞ්ගයන් වැඩීමට කල් ද? ඇවැත්නි, යම් කලෙක සිත නොසන්සුන් වූයේ වේ නම් එසමයෙහි කවර බොජ්ඣඞ්ගයන් වැඩීමට නො කල් ද? එසමයෙහි කවර බොජ්ඣඞ්ගයන් වැඩීමට කල් ද යි. මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජ්ජෝ (පිළිතුරු) සපයා කියන්නට නො හැකි වන්නාහ. මතු දුකටත් පැමිණෙන්නාහ. ඒ කවර හෙයින යත්: මහණෙනි, අවිෂය කරුණෙහි ලා යම් සේ නම් එමෙනි. මහණෙනි, තථාගත කෙනකුන් විසින් හෝ තථාගත සව්වකු විසින් හෝ මෙයින් අසා හෝ හැර යමෙක් මේ පැන විසඳීමෙන් සිත සතුටු කරන්නේ නම් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි එබන්දකු මම නොම දකිමි.

මහණෙනි, යම් කලෙක සිත සැහවුණේ වේ නම් එසමයෙහි පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වැඩීමට නො කලි. සමාධිසම්බොජ්ඣඞ්ගය වැඩීමට නො කලි. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වැඩීමට නො කලි. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිත සැහවුණේ ය. එය මෙ දහමින් නො නගාලිය හැක්කේ වේ. මහණෙනි, යම්සේ පුරුෂයෙක් මඳ ගින්නක් දල්වනු කැමැත්තේ වන්නේ ද, හෙතෙමේ එහි අමු තණත් බහාලන්නේ නම් අමුගොමත් බහා ලන්නේ නම් අමු දරත් බහා ලන්නේ නම් සිහිල් සුලඟත් දෙන්නේ නම් වැලිත් ඉසින්නේ නම් ඒ පුරිස් තෙමේ මඳ ගින්න දල්වන්නට සුදුසු ද යි. වහන්ස මෙය නොවේ ම ය. මහණෙනි, එසෙයින් ම යම් කලෙක සිත සැහවුණක් වේ නම් එසමයෙහි පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වඩන්නට නො කලි. සමාධිසම්බොජ්ඣඞ්ගය වඩන්නට නො කලි. උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගය වඩන්නට නො කලි. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිත සැහවුණේ ය. එය මේ දහමින් නො නගාලිය හැක්කේ වෙයි.

මහණෙනි, යම් කලෙක සිත සැහවුණේ වේ ද; එසමයෙහි ධම්ම-විචයසම්බොජ්ඣඞ්ගය වඩනට කලි. විරියසම්බොජ්ඣඞ්ගය වඩනට කලි. පීතිසම්බොජ්ඣඞ්ගය වඩනට කලි. ඒ කවර හෙයින යත්, මහණෙනි, සිත සැහවුණේ ය. එය මේ දහමින් මැනැවින් නගාලිය හැක්කේ වෙයි. මහණෙනි, යම් සේ පුරුෂයෙක් මඳ ගින්-නක් දල්වනු කැමැත්තේ වන්නේ ද, හෙතෙමේ එහි වියලි තණත් බහා ලන්නේ නම් වියලි ගොමත් බහා ලන්නේ නම් වියලි දරත් බහා ලන්නේ නම් මුවසුලඟත් දෙන්නේ නම් වැලි නො ද ඉසින්නේ නම් ඒ පුරිස් තෙමේ මඳ ගින්න දල්වන්නට සුදුසු ද යි. වහන්ස, එසේ ය. මහණෙනි, එසෙයින් ම යම් කලෙක සිත සැහවුණේ වේ නම් එසමයෙහි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වඩනට කලි. විරිය සම්බොජ්ඣඞ්ගය වඩනට කලි. පීතිසම්බොජ්ඣඞ්ගය වඩනට කලි. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිත සැහවුණේ ය. එය මේ දහමින් මැනැවින් නගාලිය හැක්කේ වෙයි.

යස්මිං භික්ඛවෙ, සමයෙ උද්ධතං චිත්තං හොති, අකාලො තස්මිං සමයෙ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. අකාලො විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. අකාලො පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු? උද්ධතං භික්ඛවෙ චිත්තං, තං එතෙහි ධම්මෙහි දුවූපසමං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුකාමො අස්ස, සො තත්ථ සුක්ඛානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය. සුක්ඛානි ගොමයානි පක්ඛිපෙය්‍ය, සුක්ඛානි කට්ඨානි පක්ඛිපෙය්‍ය මුඛවාතඤ්ච දදෙය්‍ය, න ච පංසුකෙන ඔකිරෙය්‍ය. භබ්බො නු ඛො සො පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුන්ති? නො හෙතං භන්තෙ, එවමෙව ඛො භික්ඛවෙ, යස්මිං සමයෙ උද්ධතං චිත්තං හොති, අකාලො තස්මිං සමයෙ ධම්මවිචයසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. අකාලො විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, අකාලො පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු උද්ධතං භික්ඛවෙ චිත්තං. තං එතෙහි ධම්මෙහි දුවූපසමං හොති.

යස්මිං භික්ඛවෙ, සමයෙ උද්ධතං චිත්තං හොති කාලො තස්මිං සමයෙ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. කාලො සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. කාලො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු, උද්ධතං භික්ඛවෙ චිත්තං. තං එතෙහි ධම්මෙහි සුවූපසමං හොති. සෙය්‍යථාපි භික්ඛවෙ, පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුකාමො අස්ස, සො තත්ථ අල්ලානි චෙව තිණානි පක්ඛිපෙය්‍ය, අල්ලානි චෙව ගොමයානි පක්ඛිපෙය්‍ය, අල්ලානි ච කට්ඨානි පක්ඛිපෙය්‍ය, උදකවාතඤ්ච දදෙය්‍ය, පංසුකෙන ච ඔකිරෙය්‍ය, භබ්බො නු ඛො සො පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුන්ති? එවම්භන්තෙ. එවමෙව ඛො භික්ඛවෙ, යස්මිං සමයෙ උද්ධතං චිත්තං හොති, කාලො තස්මිං සමයෙ පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. කාලො සමාධිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, කාලො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය. තං කිස්ස හෙතු, උද්ධතං භික්ඛවෙ චිත්තං. තං එතෙහි ධම්මෙහි සුවූපසමං හොති. සතිං ඛ්වාහං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමීති.

## 2. 6. 4

## මෙත්තසුත්තං

600. එකං සමයං භගවා කොලියෙසු විහරති හලිද්දවසනං නාම කොලියානං නිගමො. අථ ඛො සම්බහුලා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය හලිද්දවසනං පිණ්ඩාය පවිසිංසු. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: ''අතිප්පගො ඛො තාව හලිද්දවසනෙ පිණ්ඩාය චරිතුං, යන්නූන මයං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යාමා''ති. අථ ඛො තෙ භික්ඛූ යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නෙ ඛො තෙ භික්ඛූ තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එතදවොචුං:

1. සතිං ච ඛ්වාහං - මජසං, සභා. සති ඛ්වාහං - සී 1, 2

Free Distribution www.aathaapi.org

මහණෙනි, යම් කලෙක සිත නොසන්සුන් වේ ද; එසමයෙහි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වඩනට නො කලි. විරියසම්බොජ්ඣඞ්ගය වඩනට නො කලි. පීතිසම්බොජ්ඣඞ්ගය වඩනට නො කලි. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිත නො සන්සුන් ය. එය මේ දහමින් නොසන්සිඳුවිය හැක්කේ වෙයි. මහණෙනි, යම් සේ පුරුෂයෙක් මහත් ගිනිකඳක් නිවනු කැමැත්තේ වන්නේ ද; හෙතෙමේ එහි වියලි තණත් බහා ලන්නේ නම් වියලි ගොමත් බහා ලන්නේ නම් වියලි දරත් බහා ලන්නේ නම් මුවසුළඟත් දෙන්නේ නම් වැලි නො ද ඉසින්නේ නම් ඒ පුරිස් තෙමේ මහත් ගිනිකඳ නිවන්නට සුදුසු දෑ යි. වහන්ස, මෙය නො වේ ම ය. මහණෙනි, එසෙයින් ම යම්කලෙක සිත නොසන්සුන් වේ නම් එසමයෙහි ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය වඩනට නො කලි. විරියසම්බොජ්ඣඞ්ගය වඩනට නො කලි. පීති-සම්බොජ්ඣඞ්ගය වඩනට නො කලි. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිත නො සන්සුන් ය. එය මේ දහමින් නො සන්සිඳුවිය හැකි වෙයි.

මහණෙනි, යම් කලෙක සිත නොසන්සුන් වේ නම් එසමයෙහි පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වඩනට කලි. සමාධිසම්බොජ්ඣඞ්ගය වඩනට කලි. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩනට කලි. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිත නොසන්සුන් ය. එය මේ දහමින් මැනැවින් සන්-සිඳු විය හැක්කේ වෙයි. මහණෙනි, යම් සේ පුරුෂයෙක් මහත් ගිනි කඳක් නිවනු කැමැත්තේ වන්නේ ද; හෙතෙමේ එහි අමු තණත් බහා ලන්නේ නම් අමු ගොමත් බහා ලන්නේ නම් අමු දරත් බහා ලන්නේ නම් සිහිල් සුළඟත් දෙන්නේ නම් වැලිත් ඉසින්නේ නම් ඒ පුරිස් තෙමේ මහත් ගිනිකඳ නිවන්නට සුදුසු දෑ යි. වහන්ස, එසේ ය. මහණෙනි, එසෙයින් ම යම් කලෙක සිත නො සන්සුන් වේ නම් එසමයෙහි පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය වඩනට කලි. සමාධි-සම්බොජ්ඣඞ්ගය වඩනට කලි. උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩනට කලි. ඒ කවර හෙයින යත්: මහණෙනි, සිත නො සන්සුන් ය. එය මේ දහම්වලින් මැනැවින් සන්හිඳු විය හැක්කේ වෙයි. මහණෙනි, සිහිය වූ කලී සියලු තන්හී ම කැමති විය යුතු යයි මම කියම් යි.

## 2. 6. 4

## මෙත්ත සූත්‍රය

600. එක්කලෙක භාග්‍යවතුන් වහන්නේ කෝලිය දනව්වෙහි හලිද්ද වසන නම් කෝලියයන්ගේ නියම්ගම්හි වැඩවසන සේක. එකල්හි බොහෝ භික්ෂූහු පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන හලිද්දවසන නියම්ගමට පිඬු පිණිස පිවිසියහ. ඉක්බිති ඒ භික්ෂූන්ට මේ සිත විය: හලිද්ද වසනයෙහි පිඬු පිණිස හැසිරෙන්නට තවම කල් වැඩි ය. අපි අන් නොවූ පිරිවැජ්ජන්ගේ අරම වෙත එළඹෙන්නමෝ නම් මැනැවැ'' යි. එකල්හි ඒ භික්ෂූහු අන්තොවූ පිරිවැජ්ජන්ගේ අරම වෙත එළඹියහ. එළඹ ඒ අන්තොවූ පිරිවැජ්ජන් සමඟ සතුටු වූහ. සතුටු විය යුතු සිහි කට යුතු කතා කොට නිමවා එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූන්ට ඒ අන්තොවූ පිරිවැජ්ජෝ මෙය කීහු:

සමණො ආවුසො, ගොතමො සාවකානං එවං ධම්මං දෙසෙති: "එථ තුම්හෙ භික්ඛවෙ, පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරථ. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ජෙන[1] ඵරිත්වා විහරථ. කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරථ. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං කරුණාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන[1] ඵරිත්වා විහරථ. මුදිතාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරථ. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මුදිතාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන[1] ඵරිත්වා විහරථ. උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරථ. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන[1] ඵරිත්වා විහරථා"ති.

මයම්පි ඛො ආවුසො, සාවකානං එවං ධම්මං දෙසෙම: "එථ තුම්හෙ ආවුසො, පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරථ -පෙ- කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරථ. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරථා"ති. ඉධ නො ආවුසො, කො විසෙසො කො අධිප්පායො කිං නානාකරණං සමණස්ස වා ගොතමස්ස අම්හාකං වා යදිදං ධම්මදෙසනාය වා ධම්මදෙසනං අනුසාසනියා වා අනුසාසනින්ති.

අථ ඛො තෙ භික්ඛූ තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිංසු, නප්පටික්කොසිංසු. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිංසු, භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමාති. අථ ඛො තෙ භික්ඛූ හලිද්දවසනෙ පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: ඉධ මයං භන්තෙ, පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය හලිද්දවසනං පිණ්ඩාය පවිසිම්හ. තෙසං නො භන්තෙ, අම්හාකං එතදහොසි: "අතිප්පගො ඛො තාව හලිද්දවසනෙ පිණ්ඩාය චරිතුං, යන්නූන මයං යෙන අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමෙය්‍යාමා"ති.

1. අබ්‍යාපජ්ජෙන සී 1, 2 ස්‍යා.

ඇවැත්නි, මහණ ගොයුම් සව්වනට මෙසේ දහම් දෙසයි: "මහණෙනි, එවු, තෙපි සිත කෙලෙසන නුවණ දුබල කරන පඤ්ච නීවරණ පහකොට මෙත්සහගිය සිතින් එක්දිගක් පතුරුවා වෙසෙව. එසේ දෙවන දිග ද එසේ තෙවන දිග ද එසේ සිවුවන දිග ද (පතුරුවා වෙසෙව) මෙසේ උඩ යට සරස සියලු තන්හි සර්වාත්මතායෙන් සියල්ලෙන් යුත් ලොව විපුල වූ මහත් බවට පැමිණි නො පමණ වූ වෛර නැති දොම්නස් රහිත මෙත්සහගිය සිතින් පතුරුවා වෙසෙව, කුළුණුසහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙව. එසේ දෙවන දිග ද එසේ තෙවන දිග ද එසේ සිවුවන දිග ද (පතුරුවා වෙසෙව) මෙසේ උඩ යට සරස සියලු තැන්හි සර්වාත්මයෙන් සියල්ලෙන් යුත් ලොව විපුල වූ මහත් බවට පැමිණි නො පමණ වූ වෛර නැති දොම්නස් රහිත කුළුණුසහගිය සිතින් පතුරුවා වෙසෙව. මුදිතා සහගත සිතින් එක් දිගක් පතුරුවා වෙසෙව. එසේ දෙවන දිග ද, එසේ තෙවන දිග ද. එසේ සිවුවන දිග ද. (පතුරුවා වෙසෙව) මෙසේ උඩ යට සරස සියලු තන්හි සර්වාත්මතායෙන් සියල්ලෙන් යුත් ලොව විපුල වූ මහත්බවට ගිය නොපමණ වූ වෛර නැති දොම්නස් රහිත මුදිතා සහගත සිතින් පතුරුවා වෙසෙව. මැදහත් බව සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙව. එසේ දෙවන දිග ද, එසේ තෙවන දිග ද, එසේ සිව්වන දිග ද (පතුරුවා වෙසෙව) මෙසේ උඩ යට සරස සියලු තන්හි සර්වාත්මතායෙන් සියලු ලොව පැතුරුණු මහත්බවට ගිය නොපමණ වූ වෛර නැති දොම්නස් රහිත උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වෙසෙව යි.

ඇවැත්නි, අපි ද සව්වනට මෙසේ දහම් දෙසමු: "ඇවැත්නි එව තෙපි සිත කෙලෙසන නුවණ දුබල කරන නීවරණ පහ කොට මෙත් සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙව...කරුණා සහගත සිතින් ... මුදිතා සහගත සිතින් ... උපේක්ෂාසහගත සිතින් එක් දිගක් පතුරුවා වෙසෙවු. එසේ දෙවන දිග ද එසේ තෙවන දිග ද එසේ සිවුවන දිග ද (පතුරුවා වෙසෙව) මෙසේ උඩ යට සරස සියලු තන්හි සර්වාත්මතායෙන් සියලු ලොව පැතුරුණු මහත්බවට ගිය නො පමණ වූ වෛර නැති, දොම්නස් රහිත උපේක්ෂාසහගත සිතින් පතුරුවා වෙසෙව" යි. ඇවැත්නි. මෙහි මහණ ගොයුම්හුගේ හා අපගේ යම් මේ ධර්මදෙශනාව හා සමග ධර්මදෙශනාවක් හෝ අනුශාසනාව හා සමග අනුශාසනාවක් ඇද්ද, අප දෙදෙනාගේ මේ පැනවීමෙහිලා විශෙෂ කිම, අධික ප්‍රයෝග කිම, නානාත්‍වකිමැ' යි.

එකල්හි ඒ භික්ෂූහු ඒ අන්තොටු පිරිවැජ්ජන්ගේ භාෂිතය නො ම පිළිගත්හ. නොම පිළිකෙව් කළහ. නොපිළිගෙන නොපිළිකෙව් කොට "මේ භාෂිතයේ අරුත භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි දී දැනගන්නෙමු" යී හුනස්නෙන් නැගී පිටත්ව ගියහ. ඉක්බිති ඒ භික්ෂූහු හලිද්දවසනයෙහි පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළහ. වහන්ස, මෙහි අපි පෙරවරු හැඳපෙරව පාසිවුරු ගෙන හලිද්දවසනයට පිඩු පිණිස පිවිසියෙමු. වහන්ස, ඒ අපට මෙබඳු සිතෙක් විය: "හලිද්දවසනයෙහි පිඩු පිණිස හැසිරෙන්නට තව ම කල් වැඩිය, අපි අන්තොටු පිරිවැජ්ජන්ගේ අරම කරා එළඹෙන්නෙමෝ නම් ඉතා යෙහෙකැයි. වහන්ස, එකල්හි අපි අන්තොටු පිරිවැජ්ජන්ගේ

අථ ඛො මයං භන්තෙ, යෙනඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං ආරාමො තෙනුපසඞ්කමිම්හ. උපසඞ්කමිත්වා තෙහි අඤ්ඤතිත්ථියෙහි පරිබ්බාජකෙහි සද්ධිං සම්මෝදිම්හ. සම්මෝදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිම්හ. එකමන්තං නිසින්නෙ ඛො අම්හෙ භන්තෙ, තෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එතදවොචුං:

සමණො ආවුසො, ගොතමො සාවකානං එවං ධම්මං දෙසෙති: "එථ තුම්හෙ භික්ඛවෙ, පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරථ -පෙ- කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරථ. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරථා"ති.

මයම්පි ඛො ආවුසො, සාවකානං එවං ධම්මං දෙසෙම: "එථ තුම්හෙ ආවුසො, පඤ්ච නීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරථ -පෙ- කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරථ. තථා දුතියං, තථා තතියං, තථා චතුත්ථිං, ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරථා"ති. ඉධ නො ආවුසො, කො විසෙසො කො අධිප්පායො කිං නානාකරණං, සමණස්ස වා ගොතමස්ස අම්හාකං වා යදිදං ධම්මදෙසනාය වා ධම්මදෙසනං අනුසාසනියා වා අනුසාසනින්ති.

අථ ඛො මයං භන්තෙ, තෙසං අඤ්ඤතිත්ථියානං පරිබ්බාජකානං භාසිතං නෙව අභිනන්දිම්හ. නප්පටික්කොසිම්හ. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා උට්ඨායාසනා පක්කමිම්හ, "භගවතො සන්තිකෙ එතස්ස භාසිතස්ස අත්ථං ආජානිස්සාමා"ති. එවංවාදිනො භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා: "කථං භාවිතා පනාවුසො මෙත්තා චෙතොවිමුත්ති කිංගතිකා හොති කිංපරමා කිම්ඵලා කිම්පරියොසානා? කථං භාවිතා පනාවුසො, කරුණාචෙතොවිමුත්ති කිංගතිකා හොති කිංපරමා කිම්ඵලා කිංපරියොසානා? කථං භාවිතා පනාවුසො, මුදිතා චෙතොවිමුත්ති කිංගතිකා හොති කිංපරමා කිම්ඵලා කිංපරියොසානා? කථං භාවිතා පනාවුසො උපෙක්ඛාචෙතොවිමුත්ති කිංගතිකා හොති කිංපරමා කිම්ඵලා කිංපරියොසානා"ති. එවං පුට්ඨා භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා න චෙව සම්පායිස්සන්ති, උත්තරිඤ්ච විඝාතං ආපජ්ජිස්සන්ති. තං කිස්ස හෙතු: යථා තං භික්ඛවෙ අවිසයස්මිං. නාහං තං භික්ඛවෙ, පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යො ඉමෙසං පඤ්හානං වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතෙන වා තථාගතසාවකෙන වා ඉතො වා පන සුත්වා.

අරම කරා එළඹුණෙමු. එළඹ ඒ අන්තොටු පිරිවැජ්ජන් සමග සතුටු වූමු. සතුටු විය යුතු සිහි කටයුතු කතා කොට නිමවා එකත් පසෙක හිඳගත්තෙමු. වහන්ස, එකත්පසෙක හුන් අපට ඒ අන්තොටු පිරිවැජ්ජෝ මෙය කීහ :

ඇවැත්නි, මහණ ගොයුම් සව්වනට මෙසේ දහම් දෙසයි: ''මහණෙනි එව, තෙපි සිත කෙලෙසන නුවණ දුබල කරන පඤ්චනීවරණ පහ කොට මෙත්සහගිය සිතින් ...එක් දිගක් පතුරුවා වෙසෙව... කුළුණු සහගිය සිතින් ... මුදිතා සහගත සිතින් ... උපෙක්ෂා සහගත සිතින් එක් දිගක් පතුරුවා වෙසෙව, එසේ දෙවන දිග ද එසේ තෙවන දිග ද එසේ සිවුවන දිග ද (පතුරුවා වෙසෙව). මෙසේ උඩ යට සරස සර්වාත්මතායෙන් සියලු ලොව පැතුරුණු මහත්බවට ගිය නො පමණ වූ වෙර නැති දෙම්නස් රහිත උපෙක්ෂාසහගත සිතින් පතුරුවා වෙසෙව''යි.

ඇවැත්නි, අපිදු සව්වනට මෙසේ දහම් දෙසමු. ''ඇවැත්නි, එව තෙපි සිත කෙලෙසන නුවණ දුබල කරන පඤ්චනීවරණ පහ කොට මෙත් සහගිය සිතින් එක් දිගක් පතුරුවා වෙසෙව,...කුළුණු සහගිය සිතින් ... මුදිතා සහගත සිතින් ... උපෙක්ෂාසහගත සිතින් එක් දිගක් පතුරුවා වෙසෙව. එසේ දෙවන දිග ද එසේ තෙවන දිග ද එසේ සිවුවන දිග ද (පතුරුවා වෙසෙව) මෙසේ උඩ යට සරස සියලු තන්හි සර්වාත්මතායෙන් සියලු ලොව පැතුරුණු මහත් බවට ගිය නො පමණ වූ වෙර නැති දෙම්නස් රහිත උපෙක්ෂාසහගත සිතින් පතුරුවා වෙසෙව'' යි. ඇවැත්නි, මෙහි මහණ ගොයුම්හුගේ හා අපගේ යම් මේ ධර්මදේශනාව සමග ධර්මදේශනාවක් හෝ අනුශාසනාව හා සමග අනුශාසනාවක් හෝ ඇද්ද, අප දෙදෙනාගේ මේ පැනවීමෙහි ලා විශෙෂ කිම, අධික ප්‍රයෝග කිම, නානාත්වකිමැ යි.

වහන්ස, ඉක්බිති අපි ඒ අන්තොටුපිරිවැජ්ජන්ගේ වදන් නොම පිළිගතුම්හ. නො ම පිළිකෙව් කළම්හ. නො පිළිගෙන නො පිළිකෙව් කොට මේ වදනෙහි අරුත භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි දී දනගන්නෙමු යි හුනස්නෙන් නැඟී පිටත්ව ගියෙමු යි. මහණෙනි, මෙබඳු වාද ඇති අන්තොටු පිරිවැජ්ජෝ මෙසේ කියයුතු වන්නාහ: ඇවැත්නි, කෙසේ වඩනලද මෛත්‍රීචිත්තවිමුක්තිය (අර්පණාසමාධිය) කිනම් ගති ඇත්තී කුමක් උතුම් කොට ඇත්තී කිනම් අනුසස් ඇත්තී කුමක් කෙළවර කොට ඇත්තී වේ ද? ඇවැත්නි, කෙසේ වඩන ලද කරුණාචිත්තවිමුක්තිය කිනම් ගති ඇත්තී කුමක් උතුම් කොට ඇත්තී කිනම් අනුසස් ඇත්තී කුමක් කෙළවර කොට ඇත්තී වේ ද? ඇවැත්නි, කෙසේ වඩනලද මුදිතා චිත්තවිමුක්තිය කිනම් ගති ඇත්තී කුමක් උතුම් කොට ඇත්තී කිනම් අනුසස් ඇත්තී කුමක් කෙළවර කොට ඇත්තී වේ ද? ඇවැත්නි, කෙසේ වඩනලද උපෙක්ෂා-චිත්තවිමුක්තිය කිනම් ගති ඇත්තී කුමක් උතුම් කොට ඇත්තී කිනම් අනුසස් ඇත්තී කුමක් කෙළවර කොට ඇත්තී වේ ද යි. මහණෙනි, මෙසේ පුළුවුස්නා ලද අන්තොටු පිරිවැජ්ජෝ සපයා කියන්නට නො ද හැකි වන්නාහ. මතු දුකටත් පැමිණෙන්නාහ. හේ කවර හෙයින යත්: මහණෙනි, අවිෂය කරුණෙහිලා යම්සේ නම් එමෙනි. මහණෙනි, තථාගත කෙනකුන් විසින් හෝ තථාගත සව්වකු විසින් හෝ මෙයින් අසා හෝ හැර යමෙක් මේ පැන විසඳීමෙන් සිත් ගන්නේ නම් දෙවියන් සහිත මරුන් බඹුන් සහිත ලොව්හි මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාවෙහි එබන්දකු මම නො ම දකිමි.

කථං භාවිතා ච භික්ඛවෙ, මෙත්තාචෙතොවිමුත්ති කිංගතිකා හොති කිංපරමා කිංඵලා කිංපරියොසානා: ඉධ භික්ඛවෙ, භික්ඛු මෙත්තා-සහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- මෙත්තා සහගතං උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං: සො සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ පටිකූල[1] සඤ්ඤී විහරෙය්‍යන්ති පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති අප්පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති අප්පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ ච අප්පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලඤ්ච පටිකූලඤ්ච තදුභයං අභි-නිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානොති උපෙක්ඛකො තත්‍ථ විහරති සතො සම්පජානො. සුභං වා ඛො පන විමොක්ඛං උපසම්පජ්ජ විහරති, සුභපරමාහං භික්ඛවෙ, මෙත්තා චෙතොවිමුත්තිං වදාමි ඉධ පඤ්ඤස්ස භික්ඛුනො උත්තරිං විමුත්තිං අප්පටිවිජ්ඣතො.

කථං භාවිතා ච භික්ඛවෙ, කරුණාචෙතොවිමුත්ති කිංගතිකා හොති කිංපරමා කිංඵලා කිං පරියොසානා: ඉධ භික්ඛවෙ, භික්ඛු කරුණා-සහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- කරුණාසහගතං උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සො සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති. පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති, සචෙ ආකඞ්ඛති පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති. අප්පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහ-රෙය්‍යන්ති, පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍යන්ති, අප්පටිකූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටිකූලං ච පටිකූලං ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානොති, උපෙක්ඛකො තත්‍ථ විහරති සතො සම්පජානො. සබ්බසො වා රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්‍ථගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. ආකාසානඤ්චායතනපරමාහං භික්ඛවෙ, කරුණාචෙතොවිමුත්තිං වදාමි; ඉධ පඤ්ඤස්ස භික්ඛුනො උත්තරිං විමුත්තිං අප්පටිවිජ්ඣතො.

1. අප්පටිකූලෙ පටිකූල - මජසං, සයා.

මහණෙනි, කෙසේ වඩන ලද මෛත්‍රීචිත්තවිමුක්තිය කිනම ගති ඇත්තී කුමක් උතුම් කොට ඇත්තී කිනම් අනුසස් ඇත්තී කුමක් කෙළවර කොට ඇත්තී වේ ද යත්; මහණෙනි, මෙහි මහණ විවෙකනිඃශ්‍රිත විරාගනිඃශ්‍රිත නිරොධනිඃශ්‍රිත වොසසග්ගපරිණාමී කොට මෙත්තාසහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි... මෙත්තාසහගත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. ඉදින් හෙතෙමේ ඉටුඅරමුණෙහි අනිටු හැඟීම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා අනිටු හැඟීම් ඇතිව වෙසෙයි. ඉදින් අනිටු අරමුණෙහි ඉටුහැඟීම් ඇතිව වෙසෙන්නෙමි යි කැමති වේ නම් එහිලා ඉටුහැඟීම් ඇතිව වෙසෙයි. ඉදින් ඉටු අරමුණෙහිත් අනිටු අරමුණෙහිත් ඉටු හැඟීම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා ඉටුහැඟුම් ඇතිව වෙසෙයි. ඉදින් ඉටු අරමුණෙහිත් අනිටු අරමුණෙහිත් අනිටු හැඟුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා අනිටුහැඟුම් ඇතිව වෙසෙයි. ඉදින් ඉටු අරමුණත් අනිටු අරමුණත් යන දෙක දුරු කොට උපෙක්ෂා ඇතිව සිහි ඇතිව මනාදැනුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා උපේක්ෂා ඇතිව සිහි ඇතිව මනාදැනුම් ඇතිව වෙසේ. ශුභවිමෝක්ෂයට හෝ පැමිණ වෙසේ. මහණෙනි, ලෞකිකප්‍රඥා ඇති මතු විමුක්තිය (අර්හත්වය) අවබෝධ නොකරන මහණහට මෛත්‍රීචිත්තවිමුක්තිය ශුභය කෙළවර කොට ඇත්තියයි මම කියමි.

මහණෙනි, කෙසේ වඩන ලද කරුණාචෙතොවිමුක්තිය කිනම් ගති ඇත්තී කුමක් උතුම් කොට ඇත්තී කිනම් අනුසස් ඇත්තී කුමක් කෙළවර කොට ඇත්තී වේ ද යත්: මහණෙනි, මෙහි මහණ විවෙකනිඃශ්‍රිත විරාගනිඃශ්‍රිත නිරොධනිඃශ්‍රිත වොසසග්ගපරිණාමී කොට කරුණා සහගතසතිසම්බොජ්ඣඞ්ගය වඩයි... කරුණා සහගත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. ඉදින් හෙතෙමේ ඉටු අරමුණෙහි අනිටුහැඟුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා අනිටු හැඟුම් ඇතිව වෙසෙයි. ඉදින් අනිටු අරමුණෙහි ඉටුහැඟුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා ඉටු හැඟුම් ඇතිව වෙසෙයි. ඉදින් ඉටු අරමුණෙහිත් අනිටු අරමුණෙහිත් අනිටු හැඟුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා අනිටු හැඟුම් ඇතිව වෙසෙයි. ඉදින් අනිටු අරමුණෙහිත් ඉටු අරමුණෙහිත් ඉටු හැඟුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා ඉටුහැඟුම් ඇතිව වෙසෙයි. ඉදින් ඉටු අරමුණත් අනිටු අරමුණත් යන දෙක දුරු කොට උපෙක්ෂා ඇතිව සිහි ඇතිව මනාදැනුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා උපේක්ෂා ඇතිව සිහි ඇතිව මනාදැනුම් ඇතිව වෙසේ. සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝසංඥාවන්ගේ අස්තඞ්ගමයෙන් නානාත්වසංඥාවන්ගේ නොමෙනෙහි කිරීමෙන් ආකාසය අනන්තයයි ආකාසානඤ්චායතනයට පැමිණ හෝ වෙසේ. මහණෙනි, ලෞකිකප්‍රඥා ඇති මතු විමුක්තිය අවබෝධ නොකරන මහණහට කරුණාචිත්තවිමුක්තිය ආකාසානඤ්චායතනය පරම කොට ඇත්තීය යි මම කියමි.



Free Distribution www.aathaapi.org

කථං භාවිතා ච භික්ඛවෙ, මුදිතා චෙතොවිමුත්ති කිංගතිකා හොති කිංපරමා කිංඵලා කිංපරියොසානා: ඉධ භික්ඛවෙ, භික්ඛු මුදිතාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- මුදිතාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සො සචෙ ආකඞ්ඛති අප්පටික්කූලෙ පටික්කූලසඤ්ඤී විහරෙය්‍යන්ති, පටික්කූලසඤ්ඤී තත්‍ථ විහරති -පෙ- සචෙ ආකඞ්ඛති අප්පටික්කූලඤ්ච පටික්කූලඤ්ච තදුභයං අභිනිවජ්ජෙත්‍වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානොති, උපෙක්ඛකො තත්‍ථ විහරති සතො සම්පජානො. සබ්බසො වා පන ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. විඤ්ඤාණඤ්චායතනපරමාහං භික්ඛවෙ, මුදිතාචෙතොවිමුත්තිං වදාමි, ඉධපඤ්ඤස්ස භික්ඛුනො උත්තරිං විමුත්තිං අප්පටිවිජ්ඣතො.

කථං භාවිතා ච භික්ඛවෙ, උපෙක්ඛාචෙතොවිමුත්ති කිංගතිකා හොති කිංපරමා කිංඵලා කිංපරියොසානා: ඉධ භික්ඛවෙ, භික්ඛු උපෙක්ඛාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- උපෙක්ඛාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සො සචෙ ආකඞ්ඛති අප්පටික්කූලෙ පටික්කූලසඤ්ඤී විහරෙය්‍යන්ති, පටික්කූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටික්කූලෙ අප්පටික්කූලසඤ්ඤී විහරෙය්‍යන්ති, අප්පටික්කූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති අප්පටික්කූලෙ ච පටික්කූලෙ ච පටික්කූලසඤ්ඤී විහරෙය්‍යන්ති, පටික්කූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති පටික්කූලෙ ච අප්පටික්කූලෙ ච අප්පටික්කූලසඤ්ඤී විහරෙය්‍යන්ති, අප්පටික්කූලසඤ්ඤී තත්‍ථ විහරති. සචෙ ආකඞ්ඛති, අප්පටික්කූලඤ්ච පටික්කූලඤ්ච තදුභයං අභිනිවජ්ජෙත්‍වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානොති, උපෙක්ඛකො තත්‍ථ විහරති සතො සම්පජානො. සබ්බසො වා පන විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්‍ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. ආකිඤ්චඤ්ඤායතනපරමාහං භික්ඛවෙ, උපෙක්ඛාචෙතොවිමුත්තිං වදාමි, ඉධ පඤ්ඤස්ස භික්ඛුනො උත්තරිං විමුත්තිං අප්පටිවිජ්ඣතොති.

මහණෙනි, කෙසේ වඩන ලද මුදිතාචිත්තවිමුක්තිය කිනම් ගති ඇත්තී කුමක් උතුම් කොට ඇත්තී කිනම් අනුසස් ඇත්තී කුමක් කෙළවර කොට ඇත්තී වේ ද යත්; මහණෙනි, මෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී කොට මුදිතාසහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි... මුදිතාසහගත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. ඉදින් හෙතෙමේ ඉටු අරමුණෙහි ඉටුහැඟුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහි ලා අනිටු හැඟුම් ඇතිව වෙසේ... ඉදින් ඉටු අරමුණත් අනිටු අරමුණත් යන දෙක දුරු කොට උපේක්ෂා ඇතිව සිහි ඇතිව මනාදැනුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහි ලා උපේක්ෂා ඇතිව සිහි ඇතිව මනාදැනුම් ඇතිව වෙසේ. සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ හෝ වෙසේ. මහණෙනි, ලෞකිකප්‍රඥා ඇති මතු විමුක්තිය අවබොධ නොකරන මහණහට මුදිතාචේතෝවිමුක්තිය විඤ්ඤාණඤ්චායතනය පරම කොට ඇත්තී ය යි මම කියමි.

මහණෙනි, කෙසේ වඩන ලද උපෙක්ෂාචිත්තවිමුක්තිය කිනම් ගති ඇත්තී කුමක් උතුම් කොට ඇත්තී කිනම් අනුසස් ඇත්තී කුමක් කෙළවර කොට ඇත්තී වේ ද යත්: මහණෙනි, මෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ග-පරිණාමී කොට උපෙක්ඛාසහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි... උපෙක්ඛාසහගත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. ඉදින් හෙතෙමේ ඉටු අරමුණෙහි අනිටු හැඟුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා අනිටු හැඟුම් ඇතිව වෙසේ. ඉදින් අනිටු අරමුණෙහි ඉටුහැඟුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා ඉටුහැඟුම් ඇතිව වෙසේ. ඉදින් ඉටුඅරමුණෙහිත් අනිටුඅරමුණෙහිත් අනිටුහැඟුම් ඇතිව වෙසෙන්-නෙමියි කැමති වේ නම් එහිලා අනිටුහැඟුම් ඇතිව වෙසේ. ඉදින් අනිටුඅරමුණෙහිත් ඉටුඅරමුණෙහිත් ඉටුහැඟුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා ඉටුහැඟුම් ඇතිව වෙසේ. ඉදින් ඉටුඅරමුණත් අනිටුඅරමුණත් යන දෙක දුරු කොට උපේක්ෂා ඇතිව සිහි ඇතිව මනා දැනුම් ඇතිව වෙසෙන්නෙමියි කැමති වේ නම් එහිලා උපේක්ෂා ඇතිව සිහි ඇතිව මනාදැනුම් ඇතිව වෙසේ. සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ හෝ වෙසේ. මහණෙනි, ලෞකිකප්‍රඥා ඇති මතු විමුක්තිය අවබෝධ නොකරන මහණහට උපෙක්ෂා චිත්තවිමුක්තිය ආකිඤ්චඤ්ඤා-යතනය පරම කොට ඇත්තී ය යි මම කියමියි.

## 2. 6. 5

## සඞ්ගාරවසුත්තං

601. අථ ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සඞ්ගාරවො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: කො නු ඛො භො ගොතම, හෙතු කො පච්චයො යෙනෙකදා දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා? කො පන භො ගොතම, හෙතු කො පච්චයො යෙනෙකදා දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති. පගෙව සජ්ඣායකතාති.

යස්මිං ඛො බ්‍රාහ්මණ, සමයෙ කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති කාමරාගපරෙතෙන. උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති[1]. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති[2] න පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති න පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති. පගෙව අසජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො සංසට්ඨො ලාඛාය වා හලිද්දියා වා නීලාය[3] වා මඤ්ජෙට්ඨාය වා, තත්‍ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං න ජානෙය්‍ය න පස්සෙය්‍ය. එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති කාමරාගපරෙතෙන උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං නජානාති න පස්සති. පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති පගෙව අසජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ බ්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති බ්‍යාපාදපරෙතෙන. උප්පන්නස්ස ච බ්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං න ජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති න පස්සති. පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති. පගෙව අසජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො අග්ගිනා සන්තත්තො උක්කුට්ඨිතො[4] උස්සදකජාතො[5], තත්‍ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං න ජානෙය්‍ය න පස්සෙය්‍ය. එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ බ්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති බ්‍යාපාදපරෙතෙන. උප්පන්නස්ස ච බ්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති න පස්සති. පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති. පගෙව අසජ්ඣායකතා.

---

1. නප්පටිජානාති - සී 1, 2.
2. නප්පජානාති - මජ්ඣං, ස්‍යා.
3. හලිද්දය වා මඤ්ජෙට්ඨාය වා - සී 1, 2. නීලියා ස්‍යා
4. පක්කුථිතො - මජ්ඣං, උක්කුට්ඨිතො - ස්‍යා,
5. උස්මුදකජාත - මජ්ඣං, උස්මොදකජාත - ස්‍යා.

## 2. 6. 5

## සඞ්ගාරව සූත්‍රය

601. එකල්හි සඞ්ගාරව බමුණු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පස්ව හුන්නේය. එකත්පස්ව හුන් සඞ්ගාරව බමුණු භාග්‍යවතුන් වහන්සේට මේය සැල කෙළේය. භවත් ගෞතමයෙනි, යම් හෙයෙකින් ඇතැම් දිනෙක දිගුකලක් මුළුල්ලෙහි නොහදළ මන්ත්‍ර තබා හදළ මන්ත්‍ර පවා නොවැටහේ ද, එයට හේතු කිම? ප්‍රත්‍යය කිම? භවත් ගෞතමයෙනි, යම් හෙයෙකින් ඇතැම් දිනෙක දිගුකලක් මුළුල්ලෙහි හදළ මන්ත්‍ර තබා නො හදළ මන්ත්‍ර පවා වැටහේ ද, එයට හේතු කිම? ප්‍රත්‍යය කිමැ යි.

බමුණ, යම් කලෙක කාමරාගයෙන් මඩනා ලද කාමරාගය අනුව ගිය සිතින් යුතුව වෙසේ ද, උපන් කාමරාගය දුරු කිරීමත් තතුසේ නො දනී ද; එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ නො දනී, නො දකී. එසමයෙහි පරාර්ථයත් තතුසේ නො දනී නො දකී. එසමයෙහි උභයාර්ථයත් තතුසේ නො දනී නො දකී. දිගුකලක් මුළුල්ලෙහි හදළ මන්ත්‍ර පවා නො වැටහේ. නො හදළ මන්ත්‍ර කැල මැ නො වැටහෙයි. බමුණ, යම්සේ දියබඳුනෙක් ලතුයෙන් හෝ කහ පැහැයෙන් හෝ නිල්පැහැයෙන් හෝ මදටිය පැහැයෙන් හෝ මුසු වූයේ වේ ද, ඇස් ඇති පුරුෂයෙක් එහි සිය මුවසටහන බලන්නේ තතුසේ නො දන්නේය, නො දක්නේ ය. බමුණ, එසෙයින් ම යම් කලෙක කාමරාගයෙන් මඩනාලද කාමරාගය අනුව ගිය සිතින් යුතුව වෙසේ ද; උපන් කාමරාගය දුරු කිරීමත් තතුසේ නො දනී ද; එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ නො දනී, නො දකී. පරාර්ථයත්... එසමයෙහි උභයාර්ථයත් තතුසේ නො දනී නො දකී. දිගුකලක් මුළුල්ලෙහි හදළ මන්ත්‍ර පවා නො වැටහේ. නො හදළ මන්ත්‍ර කැලැ මැ නො වැටහෙයි.

බමුණ, නැවත අනෙකක් ද කියමි. යම්කලෙක ව්‍යාපාදයෙන් මඩනා ලද ව්‍යාපාදය අනුව ගිය සිතින් යුතුව වෙසේ ද, උපන් ව්‍යාපාද දුරු කිරීමත් තතුසේ නො දනී ද; එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ නො දනී, නො දකී. පරාර්ථයත්... එසමයෙහි උභයාර්ථයත් තතුසේ නො දනී, නො දකී. දිගුකලක් මුළුල්ලෙහි නො හදළ මන්ත්‍ර තබා හදළ මන්ත්‍ර පවා නො වැටහේ. බමුණ, යම්සේ දියබඳුනෙක් ගින්නෙන් තැවුණේ කැකෑරුණේ හටගත් උණුසුම ඇත්තේ වේ ද, ඇස් ඇති පුරුෂයෙක් සිය මුවසටහන බලන්නේ තතුසේ නො දන්නේ ය, නො දක්නේ ය. බමුණ, එසෙයින් ම යම්කලෙක ව්‍යාපාදයෙන් මඩනා ලද ව්‍යාපාදය අනුව ගිය සිතින් යුතුව වෙසේ ද උපන් ව්‍යාපාද දුරු කිරීමත් තතුසේ නො දනී ද; එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ නො දනී, නො දකී. පරාර්ථයත් ... එසමයෙහි උභයාර්ථයත් තතුසේ නො දනී, නො දකී. දිගුකලක් මුළුල්ලෙහි නොහදළ මන්ත්‍ර තබා හදළ මන්ත්‍ර පවා නො වැටහේ.

පුනචපරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ ථීනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති ථීනමිද්ධපරෙතෙන, උප්පන්නස්ස ච ථීනමිද්ධස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති න පස්සති. පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති. පගෙව අසජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො සෙවාලපණකපරියොනද්ධො, තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං න ජානෙය්‍ය, න පස්සෙය්‍ය, එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ ථීනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති ථීනමිද්ධපරෙතෙන, උප්පන්නස්ස ච ථීනමිද්ධස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති, අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති, න පස්සති, පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති න පස්සති, දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති උද්ධච්චකුක්කුච්චපරෙතෙන. උප්පන්නස්ස ච උද්ධච්චකුක්කුච්චස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති. න පස්සති. පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති. න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ උදපත්තො වාතෙරිතො චලිතො භන්තො ඌමිජාතො, තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං න ජානෙය්‍ය, න පස්සෙය්‍ය. එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති උද්ධච්චකුක්කුච්චපරෙතෙන. උප්පන්නස්ස ච උද්ධච්චකුක්කුච්චස්ස නිස්සරණං යථාභූතං නප්පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති, න පස්සති. පරත්ථම්පි -පෙ- උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති, න පස්සති, දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති විචිකිච්ඡාපරෙතෙන. උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං නප්පජානාති අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති, න පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති, න පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො ආවිලො ලුළිතො කලලීභූතො අන්ධකාරෙ නික්ඛිත්තො. තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං න ජානෙය්‍ය, න පස්සෙය්‍ය. එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති විචිකිච්ඡාපරෙතෙන. උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං නප්පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති, න පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති, න පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං න ජානාති, න පස්සති. දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා. අයං ඛො බ්‍රාහ්මණ, හෙතු අයං පච්චයො යෙනෙකදා දීඝරත්තං සජ්ඣායකතාපි මන්තා නප්පටිභන්ති, පගෙව අසජ්ඣායකතා.

බමුණ නැවත අනෙකක් ද කියමි: යම්කලෙක ථීනමිද්ධයෙන් මඩනා ලද ථීනමිද්ධය අනුව ගිය සිතින් යුතුව වෙසේ ද; උපන් ථීනමිද්ධයාගේ නිස්සරණයත් තතුසේ නො දනී ද එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ නො දනී. නො දකී. පරාර්ථයත්...එසමයෙහි උභයාර්ථයත් තතුසේ නො දනී, නො දකී. දිගුකලක් මුළුල්ලෙහි හදළ මන්ත්‍ර පවා නොවැටහේ. නො හදළ මන්ත්‍ර කියනු කිම? බමුණ, යම්සේ දියබඳුනෙක් පණක සෙවෙලින් හාත්පසින් වැසුණේ වේ ද; ඇස් ඇති පුරුෂයෙක් එහි සිය මුවසටහන බලන්නේ තතුසේ නො දන්නේ ය, නො දක්නේ ය. බමුණ, එසෙයින් ම යම්කලෙක ථීනමිද්ධයෙන් මඩනා ලද ථීනමිද්ධය අනුව ගිය සිතින් යුතුව වෙසේ ද; උපන් ථීනමිද්ධයාගේ නිස්සරණයත් තතුසේ නො දනී ද; එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ නො දනී, නො දකී. පරාර්ථයත් ... එසමයෙහි උභයාර්ථයත් තතුසේ නො දනී නො දකී. දිගුකලක් මුළුල්ලෙහි හදළ මන්ත්‍ර පවා නො වැටහෙයි. නො හදළ මන්ත්‍ර කියනු ම කිම?

බමුණ, නැවත අනෙකක් ද කියමි: යම්කලෙක උද්ධච්චකුක්කුච්චයෙන් මඩනා ලද උද්ධච්චකුක්කුච්චය අනුව ගිය සිතින් යුතුව වෙසේ ද; උපන් උද්ධච්චකුක්කුච්චයාගේ නිස්සරණයත් තතුසේ නො දනී ද; එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ නො දනී, නො දකී. පරාර්ථයත්... එසමයෙහි උභයාර්ථයත් තතුසේ නො දනී, නො දකී. දිගුකලක් මුළුල්ලෙහි නොහදළ මන්ත්‍ර තබා හදළ මන්ත්‍ර පවා නො වැටහේ. බමුණ යම්සේ දියබඳුනෙක් සුළඟින් කම්පිත වූයේ සැලුණේ බැමුණේ හටගත් රළ ඇත්තේ වේ ද; ඇස් ඇති පුරුෂයෙක් එහි සිය මුවසටහන බලන්නේ තතුසේ නො දන්නේ ය, නො දක්නේ ය. බමුණ, එසෙයින් ම යම්කලෙක උද්ධච්චකුක්කුච්චයෙන් මඩනා ලද උද්ධච්චකුක්කුච්චය අනුව ගිය සිතින් වෙසේ ද උපන් උද්ධච්චකුක්කුච්චයාගේ නිස්සරණයත් ඇතිසැටියෙන් නො දනී ද; එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ නො දනී, නො දකී. පරාර්ථයත්... එසමයෙහි උභයාර්ථයත් තතුසේ නො දනී, නො දකී. දිගුකලක් මුළුල්ලෙහි නොහදළ මන්ත්‍ර තබා හදළ මන්ත්‍ර පවා නොවැටහේ.

බමුණ නැවත අනෙකක් ද කියමි: යම්කලෙක විචිකිච්ඡාවෙන් මඩනා ලද විචිකිච්ඡාව අනුව ගිය සිතින් වෙසේ ද උපන් විචිකිච්ඡාවගේ දුරු කිරීමත් ඇතිසැටියෙන් නො දනී ද; එකල්හි ආත්මාර්ථයත් තතුසේ නො දනී, නො දකී. එකල්හි පරාර්ථයත් තතුසේ නො දනී, නො දකී. එකල්හි උභයාර්ථයත් තතුසේ නො දනී, නො දකී. දිගු කලක් මුළුල්ලෙහි හදළ මන්ත්‍ර පවා නො වැටහේ. නොහදළ මන්ත්‍ර කියනුම කිම? බමුණ, යම්සේ දියබඳුනෙක් කැලඹුණේ නොසන්හුන්නේ මඩවූයේ අඳුරෙහි තබන ලද්දේ වේ ද, ඇස් ඇති පුරුෂයෙක් එහි සිය මුවසටහන බලන්නේ ඇතිසැටියෙන් නො දන්නේ ය, නො දක්නේ ය. බමුණ එසෙයින් ම විචිකිච්ඡාවෙන් මඩනා ලද විචිකිච්ඡාව අනුව ගිය සිතින් වෙසේ ද; උපන් විචිකිච්ඡාවගේ නිස්සරණයත් ඇතිසැටියෙන් නො දනී ද, එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ නො දනී, නො දකී. එසමයෙහි පරාර්ථයත් තතුසේ නො දනී, නො දකී. එසමයෙහි උභයාර්ථයත් තතුසේ නො දනී, නො දකී. දිගුකලක් මුළුල්ලෙහි හදළ මන්ත්‍ර පවා නො වැටහේ. නො හදළ මන්ත්‍ර කියනු ම කිම? බමුණ යම්හෙයෙකින් ඇතැම් දිනෙක දිගුකලක් මුළුල්ලෙහි නොහදළ මන්ත්‍ර තබා හදළ මන්ත්‍ර පවා නො වැටහේ නම් එයට මේ හේතුයි, මේ ප්‍රත්‍යයයි.

යස්මිං ච ඛො බ්‍රාහ්මණ සමයෙ න කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති න කාමරාගපරෙතෙන. උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො අසංසට්ඨො ලාඛාය වා හලිද්දියා වා නීලියා වා මඤ්ජිට්ඨාය වා, තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං ජානෙය්‍ය, පස්සෙය්‍ය. එවමෙව ඛො බ්‍රාහ්මණ යස්මිං සමයෙ න කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති, න කාමරාගපරෙතෙන. උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ න බ්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති, න බ්‍යාපාදපරෙතෙන. උප්පන්නස්ස ච බ්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති. පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො න අග්ගිනා සන්තත්තො න උක්කට්ඨිතො න උස්සදකජාතො -පෙ- පගෙව සජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ න ථීනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති න ථීනමිද්ධපරෙතෙන. උප්පන්නස්ස ච ථීනමිද්ධස්ස නිස්සරණං යථාභූතං පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති. පගෙව සජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො න සෙවාලපණකපරියොනද්ධො -පෙ- පගෙව සජ්ඣායකතා.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ න උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති, න උද්ධච්චකුක්කුච්චපරෙතෙන. උප්පන්නස්ස ච උද්ධච්චකුක්කුච්චස්ස නිස්සරණං යථාභූතං පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති, පගෙව සජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො න වාතෙරිතො, න චලිතො, න භන්තො, න ඌමිජාතො -පෙ- පගෙව සජ්ඣායකතා.

බමුණ, යම්කලෙක වූකලී කාමරාගයෙන් නොමඩනා ලද කාමරාගය අනුව නොගිය සිතින් යුතුව වෙසේ ද; උපන් කාමරාගය දුරු කිරීමත් ඇතිසැටියෙන් දනී ද, එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ දනී, දකී. එසමයෙහි පරාර්ථයත් තතුසේ දනී, දකී. එසමයෙහි උභයාර්ථයත් තතුසේ දනී, දකී. දිගුකලක් මුළුල්ලෙහි හදළ මන්ත්‍ර තබා නො හදළ මන්ත්‍ර පවා වැටහේ. බමුණ යම්සේ දියබඳුනෙක් ලතුයෙන් හෝ කහපැහැයෙන් හෝ නිල් පැහැයෙන් හෝ මදටිය පැහැයෙන් හෝ නුමුසු වූයේ වේ ද; ඇස් ඇති පුරුෂයෙක් එහි සිය මුවසටහන බලන්නේ ඇතිසැටියෙන් දන්නේ ය, දක්නේ ය. බමුණ, එසෙයින් ම යම්කලෙක කාමරාගයෙන් නො මඩනා ලද කාමරාගය අනුව නොගිය සිතින් යුතුව වෙසේ ද; උපන් කාමරාගය දුරු කිරීමත් ඇතිසැටියෙන් දනී ද, එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ දනී, දකී. එසමයෙහි පරාර්ථයත් තතුසේ දනී, දකී. එසමයෙහි උභයාර්ථයත් තතුසේ දනී, දකී. දිගුකලක් මුළුල්ලෙහි හදළ මන්ත්‍ර තබා නො හදළ මන්ත්‍ර පවා වැටහේ.

බමුණ, නැවත අනෙකක් ද කියමි: යම්කලෙක ව්‍යාපාදයෙන් නොමඩනා ලද ව්‍යාපාදය අනුව නොගිය සිතින් වෙසේ ද. උපන් ව්‍යාපාදයාගේ නිස්සරණයත් ඇතිසැටියෙන් දනී ද, එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ දනී, දකී. එසමයෙහි පරාර්ථයත් තතුසේ දනී, දකී. එසමයෙහි උභයාර්ථයත් තතුසේ දනී, දකී. දිගුකලක් මුළුල්ලෙහි නොහදළ මන්ත්‍ර පවා වැටහේ. හදළ මන්ත්‍ර කියනු ම කිම? බමුණ, යම්සේ දිය බඳුනෙක් ගින්නෙන් නොතැවූණේ නොකැකෑරුණේ නොහටගත් උණුසුම ඇත්තේ වේ ද ... හදළ මන්ත්‍ර කැල මැ වැටහෙයි.

බමුණ, නැවත අනෙකක් ද කියමි; යම්කලෙක ථිනමිද්ධයෙන් නොමඩනා ලද ථිනමිද්ධය අනුව නොගිය සිතින් වෙසේ ද, උපන් ථිනමිද්ධයාගේ නිස්සරණයත් ඇතිසැටියෙන් දනී ද, එසමයෙහි ආත්මාර්ථයත් තතුසේ දනී, දකී. එසමයෙහි පරාර්ථයත් තතුසේ දනී, දකී. එසමයෙහි උභයාර්ථයත් තතුසේ දනී, දකී. දිගුකලක් මුළුල්ලෙහි නොහදළ මන්ත්‍ර පවා වැටහේ. හදළ මන්ත්‍ර කියනුම කිම? බමුණ, යම්සේ දියබඳුනෙක් සෙවෙල්පෙණින් හාත්පසින් නො වැසුනේ වේ ද ... හදළ මන්ත්‍ර කැල මැ වැටහෙයි.

බමුණ, නැවත අනෙකක් ද කියමි; යම්කලෙක උද්ධච්ච-කුක්කුච්චයෙන් නොමඩනා ලද උද්ධච්චකුක්කුච්චය අනුව නොගිය සිතින් වෙසේ ද; උපන් උද්ධච්චකුක්කුච්චයාගේ නිස්සරණයත් ඇතිසැටියෙන් දනී ද; එකල්හි ආත්මාර්ථයත් තතුසේ දනී, දකී. එකල්හි පරාර්ථයත් තතුසේ දනී, දකී. එකල්හි උභයාර්ථයත් තතුසේ දනී දකී. දිගුකලක් මුළුල්ලෙහි නොහදළ මන්ත්‍ර පවා වැටහේ. හදළ මන්ත්‍ර කියනුම කිම? බමුණ, යම්සේ දියබඳුනෙක් සුළඟින් කම්පිත නොවූයේ නොසැලුණේ නොබැමුණේ නොහටගත් රළ ඇත්තේ වේ ද ... හදළ මන්ත්‍ර කැල මැ වැටහෙයි.

පුන ච පරං බ්‍රාහ්මණ, යස්මිං සමයෙ න විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති, න විචිකිච්ඡාපරෙතෙන. උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති. පස්සති. උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති. පගෙව සජ්ඣායකතා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ, උදපත්තො අච්ඡො විප්පසන්නො අනාවිලො ආලොකෙ නික්ඛිත්තො. තත්ථ චක්ඛුමා පුරිසො සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො යථාභූතං ජානෙය්‍ය, පස්සෙය්‍ය. එවමෙව ඛො බ්‍රාහ්මණ, යස්මිං සමයෙ න විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති. න විචිකිච්ඡාපරෙතෙන. උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං පජානාති. අත්තත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති. පරත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති, පස්සති, උභයත්ථම්පි තස්මිං සමයෙ යථාභූතං පජානාති පස්සති. දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති. පගෙව සජ්ඣායකතා. අයං ඛො බ්‍රාහ්මණ හෙතු. අයං පච්චයො. යෙනෙකදා දීඝරත්තං අසජ්ඣායකතාපි මන්තා පටිභන්ති. පගෙව සජ්ඣායකතා.

සත්තිමෙ බ්‍රාහ්මණ, බොජ්ඣඞ්ගා අනාවරණා අනීවරණා චෙතසො අනුපක්කිලෙසා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තන්ති. කතමෙ සත්ත? සතිසම්බොජ්ඣඞ්ගො ඛො බ්‍රාහ්මණ, අනාවරණො අනීවරණො චෙතසො අනුපක්කිලෙසො භාවිතො බහුලීකතො විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තති. -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඛො බ්‍රාහ්මණ, අනාවරණො අනීවරණො චෙතසො අනුපක්කිලෙසො භාවිතො බහුලීකතො විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තති. ඉමෙ ඛො බ්‍රාහ්මණ, සත්ත බොජ්ඣඞ්ගා අනාවරණා අනීවරණා චෙතසො අනුපක්කිලෙසා භාවිතා බහුලීකතා විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය සංවත්තන්තී ති. එවං වුත්තෙ සංගාරවො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

## 2. 6. 6

### අභයසුත්තං

602. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. අථ ඛො අභයො රාජකුමාරො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො අභයො රාජකුමාරො භගවන්තං එතදවොච: පූරණො භන්තෙ, කස්සපො එවමාහ: "නත්ථි හෙතු නත්ථි පච්චයො අඤ්ඤාණාය අදස්සනාය. අහෙතුඅප්පච්චයා[1] අඤ්ඤාණං අදස්සනං හොති. නත්ථි හෙතු නත්ථි පච්චයො ඤාණදස්සනාය[2] අහෙතු අප්පච්චයා ඤාණදස්සනං[3] හොතීති. ඉධ භගවා කිමාහා"ති. අත්ථි රාජකුමාර, හෙතු අත්ථි පච්චයො

1. අහෙතුඅප්පච්චයො - ස්‍යා, මජ්සං.
2. ඤාණාය දස්සනාය - මජ්සං, ස්‍යා.
3. ඤාණං දස්සනං - මජ්සං, ස්‍යා.

බමුණ, නැවත අනෙකක් ද කියමි: යම් කලෙක විචිකිච්ඡාවෙන් නො මඩනා ලද විචිකිච්ඡාව අනුව නො ගිය සිතින් වෙසේ ද, උපන් විචිකිච්ඡාවගේ නිශ්ශරණයත් තතු සේ දනී ද, එසමයෙහි ආත්මාර්ථයත් තතු සේ දනී දකී. එසමයෙහි පරාර්ථයත් තතු සේ දනී දකී. එසමයෙහි උභයාර්ථයත් තතු සේ දනී දකී. දිගුකලක් මුළුල්ලෙහි නො හදළ මන්ත්‍ර පවා වැටහේ. හදළ මන්ත්‍ර කියනුම කිම? බමුණ, යම් සේ පහන් වූ වෙසෙසින් පහන් වූ නො කැලඹුණු දියබඳුනෙක් එළියෙහි තබන ලද්දේ වේ ද, ඇස් ඇති පුරුෂයෙක් එහි සිය මුව සටහන බලන්නේ තතු සේ දන්නේය. දක්නේය. බමුණ, එසෙයින් ම යම් කලෙක විචිකිච්ඡාවෙන් නොමඩනා ලද විචිකිච්ඡාව අනුව නො ගිය සිතින් වෙසේ ද, උපන් විචිකිච්ඡාවගේ නිශ්ශරණයත් ඇති සැටියෙන් දනී ද, එකල්හි ආත්මාර්ථයත් තතු සේ දනී, දකී. එකල්හි පරාර්ථයත් තතු සේ දනී, දකී. එකල්හි උභයාර්ථයත් තතු සේ දනී, දකී. දිගුකලක් මුළුල්ලෙහි නොහදළ මන්ත්‍ර පවා වැටහේ. හදළ මන්ත්‍ර කියනු ම කිමැ යි. බමුණ, යම් හෙයෙකින් ඇතැම් දිනෙක දිගු කලක් මුළුල්ලෙහි හදළ මන්ත්‍ර තබා නොහදළ මන්ත්‍ර පවා වැටහේ නම් (එයට) මේ හේතුයි. මේ ප්‍රත්‍යයයි.

බමුණ, මේ සත්තබොජ්ඣඞ්ගයෝ (සිත) නො අවුරන්නෝය. නොවසන්නෝය. සිත නො කෙලෙසන්නෝය. වඩන ලද්දහු බහුල කරන ලද්දහු විජ්ජාවිමුත්තිඵල පසක් කිරීම පිණිස පවතිත්. කවර සතෙකැයත්: බමුණ, සතිසම්බොජ්ඣඞ්ගය (සිත) නොඅවුරන්නෙකි.. නොවසන්නෙකි. සිත නොකෙලෙසන්නෙකි. වඩන ලද්දේ බහුල කරන ලද්දේ විජ්ජාවිමුත්තිපල පසක් කිරීම පිණිස පවතී... බමුණ, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය නො අවුරන්නෙකි. නො වසන්නෙකි. සිත නො කෙලෙසන්නෙකි. වඩන ලද්දේ බහුල කරන ලද්දේ විජ්ජාවිමුත්තිඵල පසක් කිරීම පිණිස පවතී. බමුණ මේ සත්තබොජ්ඣඞ්ගයෝ නො අවුරන්නෝය; නො වසන්නෝය. සිත නො කෙලෙසන්නෝය. වඩන ලද්දහු බහුල කරන ලද්දහු විජ්ජාවිමුත්තිඵල පසක් කිරීම පිණිස පවතිතැ යි. මෙසේ වදළ කල්හි සඞ්ගාරව බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය: භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි... අද පටන් දිවිහිමියෙන් සරණ ගිය මා උවසුවකු කොට දරනසේක් වා යි.

## 2. 6. 6

## අභය සූත්‍රය

602. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහි ගිජ්ඣකූළපව්වෙහි වැඩවසනසේක. එකල්හි අභය රාජකුමාර භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්නේය. එකත්පස් ව හුන් අභයරාජකුමාර භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය: වහන්ස, පූරණකස්සපයෝ මෙසේ කියති: නො දන්මට නො දක්මට හේතුවෙක් නැත. ප්‍රත්‍යයෙක් නැත. අහේතුක ව අප්‍රත්‍යය ව නො දන්ම නො දක්ම වේ. දන්මට දක්මට හේතුවෙක් නැත. ප්‍රත්‍යයෙක් නැත. අහේතුක ව අප්‍රත්‍යය ව දන්ම දක්ම වේ'' යි. මෙහිලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදරනසේක් ද යි... රාජකුමාරය, නො දන්මට නො දක්මට හේතුවෙක් ඇත.

අඤ්ඤාණාය අදස්සනාය. සහෙතු සපච්චයා[1] අඤ්ඤාණං අදස්සනං හොති. අත්ථි රාජකුමාර හෙතු අත්ථි පච්චයො ඤාණදස්සනාය. සහෙතු සපච්චයා ඤාණදස්සනං හොතීති. කතමො පන භන්තෙ, හෙතු කතමො පච්චයො අඤ්ඤාණාය අදස්සනාය. කථං සහෙතු සපච්චයා අඤ්ඤාණං අදස්සනං හොතීති.

යස්මිං ඛො රාජකුමාර, සමයෙ කාමරාගපරියුට්ඨිතෙන චෙතසා විහරති කාමරාගපරෙතෙන, උප්පන්නස්ස ච කාමරාගස්ස නිස්සරණං යථාභූතං න ජානාති න පස්සති. අයම්පි ඛො රාජකුමාර, හෙතු අයං පච්චයො අඤ්ඤාණාය අදස්සනාය. එවං සහෙතු සපච්චයා අඤ්ඤාණං අදස්සනං හොති. පුනචපරං රාජකුමාර, යස්මිං සමයෙ බ්‍යාපාදපරියුට්ඨිතෙන චෙතසා විහරති බ්‍යාපාදපරෙතෙන. උප්පන්නස්ස ච බ්‍යාපාදස්ස නිස්සරණං යථාභූතං න ජානාති න පස්සති. අයම්පි ඛො රාජකුමාර, හෙතු අයං පච්චයො අඤ්ඤාණාය අදස්සනාය. එවම්පි සහෙතුසපච්චයා අඤ්ඤාණං අදස්සනං හොති. පුනචපරං රාජකුමාර, යස්මිං සමයෙ ථීනමිද්ධපරියුට්ඨිතෙන චෙතසා විහරති ථීනමිද්ධපරෙතෙන. උප්පන්නස්ස ච ථීනමිද්ධස්ස නිස්සරණං යථාභූතං න ජානාති න පස්සති. අයම්පි ඛො රාජකුමාර, හෙතු අයං පච්චයො අඤ්ඤාණාය අදස්සනාය. එවම්පි සහෙතුසපච්චයා අඤ්ඤාණං අදස්සනං හොති. පුනචපරං රාජකුමාර, යස්මිං සමයෙ උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන චෙතසා විහරති උද්ධච්චකුක්කුච්චපරෙතෙන, උප්පන්නස්ස ච උද්ධච්චකුක්කුච්චස්ස නිස්සරණං යථාභූතං න ජානාති න පස්සති. අයම්පි ඛො රාජකුමාර, හෙතු අයං පච්චයො අඤ්ඤාණාය අදස්සනාය. එවම්පි සහෙතුසපච්චයා අඤ්ඤාණං අදස්සනං හොති. පුන ච පරං රාජකුමාර, යස්මිං සමයෙ විචිකිච්ඡාපරියුට්ඨිතෙන චෙතසා විහරති විචිකිච්ඡාපරෙතෙන, උප්පන්නාය ච විචිකිච්ඡාය නිස්සරණං යථාභූතං න ජානාති, න පස්සති. අයම්පි ඛො රාජකුමාර, හෙතු අයං පච්චයො අඤ්ඤාණාය අදස්සනාය එවං සහෙතුසපච්චයා අඤ්ඤාණං අදස්සනං හොතීති.

කො නාමොයං භන්තෙ ධම්මපරියායොති. නීවරණා නාමෙතෙ රාජකුමාරාති. තග්ඝ භගව නීවරණා, තග්ඝ සුගත නීවරණා. එකමෙකෙනපි ඛො භන්තෙ නීවරණෙන අභිභූතො යථාභූතං න ජානෙය්‍ය න පස්සෙය්‍ය, කො පන වාදො පඤ්චහි නීවරණෙහි. කතමො පන භන්තෙ, හෙතු කතමො පච්චයො ඤාණදස්සනාය කථං සහෙතුසපච්චයා ඤාණදස්සනං හොතීති.

ඉධ රාජකුමාර, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සො සතිසම්බොජ්ඣඞ්ගං භාවිතෙන චිත්තෙන යථාභූතං ජානාති පස්සති. අයම්පි ඛො රාජකුමාර, හෙතු අයං පච්චයො ඤාණදස්සනාය. එවං සහෙතු සපච්චයා ඤාණදස්සනං හොති -පෙ- පුන ච පරං රාජකුමාර, භික්ඛු උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවිතෙන චිත්තෙන යථාභූතං ජානාති පස්සති. අයම්පි ඛො රාජකුමාර, හෙතු අයං පච්චයො ඤාණදස්සනාය. එවම්පි සහෙතුසපච්චයා ඤාණදස්සනං හොතීති.

---

1. සහෙතුසපච්චයො - මජ්ඣං, ස්‍යා.

ප්‍රත්‍යයෙක් ඇත. සහේතු සප්‍රත්‍යය ව නොදන්ම නොදක්ම වේ. රාජකුමාරය, දන්මට දක්මට හේතුවෙක් ඇත. ප්‍රත්‍යයෙක් ඇත. සහෙතු සප්‍රත්‍යයව දන්ම දක්ම වේ'' යි. වහන්ස, නොදන්මට නොදක්මට හේතුව කවරේ ද? ප්‍රත්‍යය කවරේ ද? කෙසේ සහේතු සප්‍රත්‍යය ව නො දන්ම නො දක්ම වේ දැ යි.

රජකුමර, යම්කලෙක කාමරාගයෙන් මඩනා ලද කාමරාගය අනුව ගිය සිතින් යුතු ව වෙසේද; උපන් කාමරාගය දුරු කිරීමත් තතුසේ නො දනී ද; නො දකී ද; රජකුමර, නොදන්මට නොදක්මට මෙ ද හේතුවකි, මෙ ද ප්‍රත්‍යයෙකි. මෙසේ සහේතු සප්‍රත්‍යය ව නොදන්ම නොදක්ම වේ. රජකුමර, නැවත අනෙකක් ද කියමි: යම්කලෙක ව්‍යාපාදයෙන් මඩනා ලද ව්‍යාපාදය අනුව ගිය සිතින් යුතුව වෙසේ ද; උපන් ව්‍යාපාදයාගේ නිස්සරණයත් තතුසේ නො දනී ද; නො දකී ද; රජකුමර, නොදන්මට නොදක්මට මෙ ද හේතුයෙකි, මෙ ද ප්‍රත්‍යයෙකි. මෙසේත් සහේතුසප්‍රත්‍යය ව නොදන්ම නොදක්ම වේ. රජකුමර, නැවත අනෙකක් ද කියමි: යම්කලෙක ථිනමිද්ධයෙන් මඩනා ලද ථිනමිද්ධය අනුව ගිය සිතින් වෙසේ ද, උපන් ථිනමිද්ධයාගේ නිස්සරණයත් තතුසේ නො දනී ද, නො දකී ද; රජකුමර, නොදන්මට නොදක්මට මෙ ද හේතුවෙකි, මෙ ද ප්‍රත්‍යයෙකි. මෙසේත් සහේතු සප්‍රත්‍යය ව නොදන්ම නොදක්ම වේ. රජකුමර, නැවත අනෙකක් ද කියමි: යම්කලෙක උද්ධච්චකුක්කුච්චයෙන් මඩනා ලද උද්ධච්චකුක්කුච්චය අනුව ගිය සිතින් වෙසේ ද; උපන් උද්ධච්චකුක්කුච්චයාගේ නිස්සරණයත් ඇතිසැටියෙන් නො දනී ද; නො දකී ද; රජකුමර, නොදන්මට නො දක්මට මෙ ද හේතුවෙකි, මෙ ද ප්‍රත්‍යයෙකි. මෙසේත් සහේතු සප්‍රත්‍යය ව නොදන්ම නොදක්ම වේ. රජකුමර, නැවත අනෙකක් ද කියමි: යම්කලෙක විචිකිච්ඡාවෙන් මඩනා ලද විචිකිච්ඡාව අනුව ගිය සිතින් වෙසේ ද; උපන් විචිකිච්ඡාවගේ නිස්සරණයත් ඇතිසැටියෙන් නො දනී ද; නො දකී ද; රජකුමර, නොදන්මට නොදක්මට මෙ ද හේතුවෙකි, මෙ ද ප්‍රත්‍යයෙකි. මෙසේ සහේතුසප්‍රත්‍යය ව නොදන්ම නොදක්ම වේ යි.

වහන්ස. මේ දහම්හය කිනම් දැ යි. රජකුමර, මොහු නීවරණ නම්හ යි. භාග්‍යවතුන් වහන්ස, ඒකාන්තයෙන් නීවරණයහ. සුගතයන් වහන්ස, ඒකාන්තයෙන් නීවරණයහ. වහන්ස, එක්එක් නීවරණයෙකුදු මඩනා ලද්දේ තතුසේ නො දන්නේය, නො දක්නේය. පඤ්චනීවරණයන්ගෙන් (මඩනා ලද්දේ) කවර කථා ද? වහන්ස, දන්මට දක්මට හේතු කවරේ ද? ප්‍රත්‍යය කවරේ ද? කෙසේ සහේතුසප්‍රත්‍යය ව දනීම දකීම වේ දැ යි.

රජකුමර, මෙසස්නෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී කොට සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. හේ සතිසම්බොජ්ඣඞ්ගය වැඩූ සිතින් තතුසේදනී දකී. රජකුමර, දකීමට දනීමට මෙ ද හේතුවෙකි, මෙ ද ප්‍රත්‍යයෙකි. මෙසේ සහේතු සප්‍රත්‍යය ව දනීම දකීම වේ.... රජකුමර, නැවත අනෙකක් ද කියමි: මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ග පරිණාමී කොට උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. හෙතෙමේ උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වැඩූසිතින් තතුසේ දනී, දකී. රජකුමර, දනීමට දකීමට මෙ ද හේතුවෙකි. මෙ ද ප්‍රත්‍යයෙකි. මෙසේත් සහේතුසප්‍රත්‍යය ව දන්ම දක්ම වේ යි.

කොනාමොයං භන්තෙ, ධම්මපරියායො'ති. බොජ්ඣඞ්ගා නාමෙතෙ රාජකුමාරාති. තග්ඝ භගව බොජ්ඣඞ්ගා, තග්ඝ සුගත බොජ්ඣඞ්ගා. එකමෙකෙනපි භො භන්තෙ, බොජ්ඣඞ්ගෙන සමන්නාගතො යථාභූතං ජානෙය්‍ය පස්සෙය්‍ය, කො පන වාදො සත්තහි බොජ්ඣඞ්ගෙහි. යො'පි මෙ භන්තෙ, ගිජ්ඣකූටපබ්බතං ආරොහන්තස්ස කායකිලමථො චිත්තකිලමථො සො'පි මෙ පටිප්පස්සද්ධො, ධම්මො ච මෙ අභිසමිතොති.

## බොජ්ඣඞ්ගවග්ගො පඨමො.

තස්සුද්දානං:–

ආහාරපරියායග්ගි මෙත්තං සඞ්ගාරවෙන ච
අභයො පුච්ඡිතො පඤ්හං ගිජ්ඣකූටම්හි පබ්බතෙති.

වහන්ස, මේ දහම්නය කිනම් දැ යි. රජකුමර, මොහු බොජ්ඣඞ්ග නම්හ යි. භාග්‍යවතුන් වහන්ස, ඒකාන්තයෙන් බොජ්ඣඞ්ගයහ. සුගතයන් වහන්ස, ඒකාන්තයෙන් බොජ්ඣඞ්ගයහ. වහන්ස, එක්එක් බොජ්ඣඞ්ගයෙනුදු යුතු වූයේ තතුසේ දන්නේය, දක්නේය. සත්‍ත-බොජ්ඣඞ්ගයෙන් යුතු වූයේ කවර කථා ද? වහන්ස, ගිජුකුළුපව්වට නැගෙන මාගේ කයෙහි යම් විඩාවෙක් සිතෙහි විඩාවෙක් වී ද, හෙ ද සන්හිඳුනේය. මා විසින් දහම ද අවබෝධ කරන ලද්දේ යි.

**සවැනි බොජ්ඣඞ්ගවර්ග ය යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

ආහාර, පරියාය, අග්ගි, මෙත්ත, සඞ්ගාරව යන සූත්‍ර පස ද ගිජුකුළුපව්වෙහි අභයරාජකුමරුන් ප්‍රශ්න විචාළ සූත්‍රය වූ අභය සූත්‍රය දැ යි සූත්‍රසයෙකි.

# 7. ආනාපානවග්ගො

## 2. 7. 1

## අට්ඨිකසුත්තං

603. අට්ඨිකසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. කථං භාවිතා ච භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤා කථං බහුලීකතා මහප්ඵලා හොති, මහානිසංසා: ඉධ භික්ඛවෙ, භික්ඛු අට්ඨිකසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. -පෙ- අට්ඨිකසඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤා එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසාති.

## 2. 7. 2

## දුතිය අට්ඨිකසුත්තං

604. අට්ඨිකසඤ්ඤාය භික්ඛවෙ, භාවිතාය බහුලීකතාය ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා. කථං භාවිතාය ච ඛො භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤාය කථං බහුලීකතාය ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා. ඉධ භික්ඛවෙ, භික්ඛු අට්ඨිකසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- අට්ඨිකසඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතාය ඛො භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤාය එවං බහුලීකතාය ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතාති.

## 2. 7. 3

## තතිය අට්ඨිකසුත්තං

605. අට්ඨිකසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහතො අත්ථාය සංවත්තති. කථං භාවිතා භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤා කථං බහුලීකතා මහතො අත්ථාය සංවත්තති: ඉධ භික්ඛවෙ, භික්ඛු අට්ඨිකසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- අට්ඨිකසඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤා එවං බහුලීකතා මහතො අත්ථාය සංවත්තතීති.

# 7. ආනාපාන වර්ගය

## 2. 7. 1

## අට්ඨික සූත්‍රය

603. මහණෙනි, අට්ඨිකසංඥාව වඩන ලද්දී බහුල කරන ලද්දී මහත්ඵල මහත් අනුසස් ඇති වෙයි. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද අට්ඨිකසංඥාව මහත්ඵල මහානිසංස වේ ද යත්: මහණෙනි, මෙහි මහණ විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරොධය ඇසුරු වූවක් නිවනට නැමුරු වූවක් කොට අට්ඨික සංඥාවෙන් යුක්ත සති සම්බොජ්ඣඞ්ගය වඩයි ... විවෙකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරෝධය ඇසුරු වූවක් නිවනට නැමුරු වූවක් කොට අට්ඨිකසංඥාවෙන් යුක්ත උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද අට්ඨිකසංඥාව මහත් ඵල ඇත්තී මහත් අනුසස් ඇත්තී වේ යි.

## 2. 7. 2

## දුතිය අට්ඨික සූත්‍රය

604. මහණෙනි, අට්ඨිකසංඥාව වඩන ලද කල්හි බහුල කරන ලද කල්හි ඵල දෙකින් එක්තරා ඵලයක් කැමැති වියයුතු ය. දිටුදැමි-යෙහි ම රහත්බව හෝ උපාදන සේස ව ඇති කල්හි අනගැමි බව හෝ යි. මහණෙනි, අට්ඨිකසංඥාව කෙසේ වැඩූ කල්හි කෙසේ බහුල කළ කල්හි දිටුදැමියෙහි රහත්බව ද උපාදන සේස ව ඇති කල්හි අනගැමි බව ද යන ඵල දෙකින් එක්තරා ඵලයක් කැමැති වියයුතු ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී කොට අට්ඨිකසඤ්ඤාසහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... අට්ඨිකසඤ්ඤාසහගත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, අට්ඨිකසංඥාව මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි දිටුදැමියෙහි ම රහත් බව ද උපාදන සේස ව ඇති කල්හි අනගැමි බව ද යන ඵල දෙකින් එක්තරා ඵලයක් කැමැති විය යුතු යි.

## 2. 7. 3

## තතිය අට්ඨික සූත්‍රය

605. මහණෙනි, අට්ඨිකසංඥාව වඩන ලද්දී බහුල කරන ලද්දී මහත් වැඩ පිණිස පවතී. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද අට්ඨිකසංඥාව මහත් වැඩ පිණිස පවතී ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ග පරිණාමී කොට අට්ඨිකසඤ්ඤා සහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි...අට්ඨිකසඤ්ඤා සහගත උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද අට්ඨිකසඤ්ඤාව මහත් වැඩ පිණිස පවතී යි.

## 2. 7. 4

## චතුත්ථ අට්ඨිකසුත්තං

606. අට්ඨිකසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහතො යොගක්ඛෙමාය සංවත්තති. කථං භාවිතා ච භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤා කථං බහුලීකතා මහතො යොගක්ඛෙමාය සංවත්තති: ඉධ භික්ඛවෙ භික්ඛු අට්ඨිකසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති –පෙ– අට්ඨිකසඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤා එවං බහුලීකතා මහතො යොගක්ඛෙමාය සංවත්තතීති.

## 2. 7. 5

## පඤ්චම අට්ඨිකසුත්තං

607. අට්ඨිකසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහතො සංවෙගාය සංවත්තති. කථං භාවිතා ච ඛො භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤා කථං බහුලීකතා මහතො සංවෙගාය සංවත්තති; ඉධ භික්ඛවෙ, භික්ඛු අට්ඨිකසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති –පෙ– අට්ඨිකසඤ්ඤා-සහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤා එවං බහුලීකතා මහතො සංවෙගාය සංවත්තතීති.

## 2. 7. 6

## ඡට්ඨ අට්ඨිකසුත්තං

608. අට්ඨිකසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහතො ඵාසුවිහාරාය සංවත්තති. කථං භාවිතා ච ඛො භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤා කථං බහුලීකතා මහතො ඵාසුවිහාරාය සංවත්තති: ඉධ භික්ඛවෙ, භික්ඛු අට්ඨිකසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති –පෙ– අට්ඨික-සඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, අට්ඨිකසඤ්ඤා එවං බහුලීකතා මහතො ඵාසුවිහාරාය සංවත්තතීති.

## 2. 7. 7–12

## පුළවකසුත්තානි

609–614. පුළවකසඤ්ඤා භික්ඛවෙ –පෙ– සංවත්තතීති.

## 2. 7. 4

## චතුත්‍ථ අට්ඨිකසූත්‍රය

606. මහණෙනි, අට්ඨිකසඤ්ඤාව වඩන ලද්දී බහුල කරන ලද්දී මහත් යොගක්ෂෙමය (නිවන) පිණිස පවතී. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද අට්ඨිකසඤ්ඤාව මහත් යොගක්ෂෙමය පිණිස පවතී ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී කොට අට්ඨික සඤ්ඤ සහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... අට්ඨිකසඤ්ඤ සහගත උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද අට්ඨිකසඤ්ඤාව මහත් යොගක්ෂෙමය පිණිස පවති යි.

## 2. 7. 5

## පඤ්චම අට්ඨිකසූත්‍රය

607. මහණෙනි, අට්ඨික සඤ්ඤාව වඩන ලද්දී බහුල කරන ලද්දී මහත් සංවෙග පිණිස පවතී. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද අට්ඨිකසංඥාව මහත් සංවේග පිණිස පවතී ද යත්: මහණෙනි, මෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී කොට අට්ඨිකසඤ්ඤසහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි...අට්ඨිකසඤ්ඤ සහගත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද අට්ඨිකසඤ්ඤාව මහත්සංවෙගය පිණිස පවතී යි.

## 2. 7. 6

## ඡට්ඨ අට්ඨිකසූත්‍රය

608. මහණෙනි, අට්ඨිකසඤ්ඤාව වඩන ලද්දී බහුල කරන ලද්දී මහත් පහසු විහරණ පිණිස පවතී. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද අට්ඨිකසඤ්ඤාව මහත් පහසු විහරණ පිණිස පවතී ද යත්: මහණෙනි, මෙහි මහණ විවේකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී කොට අට්ඨිකසඤ්ඤ සහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි -ප- අට්ඨික සඤ්ඤ සහගත උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද අට්ඨිකසඤ්ඤාව මහත් පහසු විහරණ පිණිස පවතී යි.

## 2. 7. 7 — 12

## පුළවක සූත්‍ර

609 – 614 මහණෙනි, පුළවකසඤ්ඤාව ... පවතී යි.

## 2. 7. 13–18

### විනීලකසුත්තානි

615–620. විනීලකසඤ්ඤා භික්ඛවෙ –පෙ– සංවත්තතීති.

## 2. 7. 19–24

### විච්ඡිද්දකසුත්තානි

621–626. විච්ඡිද්දකසඤ්ඤා භික්ඛවෙ –පෙ– සංවත්තතීති.

## 2. 7. 25–30

### උද්ධුමාතකසුත්තානි

627–632. උද්ධුමාතකසඤ්ඤා භික්ඛවෙ –පෙ– සංවත්තතීති.

## 2. 7. 31–36

### මෙත්තාසුත්තානි

633–638. මෙත්තා භික්ඛවෙ –පෙ– සංවත්තතීති.

## 2. 7. 37–42

### කරුණාසුත්තානි

639–644. කරුණා භික්ඛවෙ –පෙ– සංවත්තතීති.

## 2. 7. 43–48

### මුදිතාසුත්තානි

645–650. මුදිතා භික්ඛවෙ –පෙ– සංවත්තතීති.

## 2. 7. 49–54

### උපෙක්ඛාසුත්තානි

651–656. උපෙක්ඛා භික්ඛවෙ –පෙ– සංවත්තතීති.

## 2. 7. 55–60

### ආනාපානසතිසුත්තානි

657–662. ආනාපානසති භික්ඛවෙ –පෙ– සංවත්තතීති.

**ආනාපානවග්ගො සත්තමො.**

තස්සුද්දානං:

අට්ඨි පුළව විනීල විච්ඡිද්දකොද්ධුමාතකා
මෙත්තා කරුණා මුදිතොපෙක්ඛානාපානෙන චාති.

## 2. 7. 13 – 18

## විනීලක සූත්‍ර

615 – 620 මහණෙනි, විනීලක සඤ්ඤාව ... පවතී යි.

## 2. 7. 19 – 24

## විච්ඡිද්දක සූත්‍රය

621 – 626 මහණෙනි, විච්ඡිද්දක සඤ්ඤාව ... පවතී යි.

## 2. 7. 25 – 30

## උද්ධුමාතක සූත්‍ර

627 – 632 මහණෙනි, උද්ධුමාතක සඤ්ඤාව ... පවතී යි.

## 2. 7. 31 – 36

## මෙත්තා සූත්‍ර

633 – 638 මහණෙනි, මෛත්‍රිය ... පවතී යි.

## 2. 7. 37 – 42

## කරුණා සූත්‍ර

639 – 644 මහණෙනි, කරුණාව ... පවතී යි.

## 2. 7. 43 – 48

## මුදිතා සූත්‍ර

645 – 650 මහණෙනි, මුදිතාව ... පවතී යි.

## 2. 7. 49 – 54

## උපෙක්ඛා සූත්‍ර

651 – 656 මහණෙනි, උපේක්ෂාව ... පවතී යි.

## 2. 7. 55 – 60

## ආනාපානසති සූත්‍ර

657 – 662 මහණෙනි, ආනාපානසතිය ... පවතී යි.

### සත්වැනි ආනාපානවර්ග යි.

**එහි සූත්‍ර නාමාවලි ය:**

අට්ඨික, පුළවක, විනීලක, විච්ඡිද්දක, උද්ධුමාතක, මෙත්තා, කරුණා, මුදිතා උපෙක්ඛා, ආනාපාන යි ෂට්ක දශයෙකි. සූත්‍ර මුළුල්ල සැටෙකි.

## 8. නිරොධවග්ගො

### 2. 8. 1–6

### අසුභසුත්තානි

663–668. අසුභසඤ්ඤා භික්ඛවෙ -පෙ- සංවත්තතීති.

### 2. 8. 7–12

### මරණසුත්තානි

669–674. මරණසඤ්ඤා භික්ඛවෙ -පෙ- සංවත්තතීති.

### 2. 8. 13–18

### ආහාරෙ පටික්කූලසුත්තානි

675–680. ආහාරෙ පටික්කූලසඤ්ඤා භික්ඛවෙ -පෙ- සංවත්තතීති.

### 2. 8. 19–24

### සබ්බලොකෙ අනභිරතසුත්තානි

681–686. සබ්බලොකෙ අනභිරතසඤ්ඤා භික්ඛවෙ -පෙ- සංවත්තතීති.

### 2. 8. 25–30

### අනිච්චසුත්තානි

687–692. අනිච්චසඤ්ඤා භික්ඛවෙ -පෙ- සංවත්තතීති.

### 2. 8. 31–36

### අනිච්චෙ දුක්ඛසුත්තානි

693–698. අනිච්චෙ දුක්ඛසඤ්ඤා භික්ඛවෙ -පෙ- සංවත්තතීති.

### 2. 8. 37–42

### දුක්ඛෙ අනත්තසුත්තානි

699–704. දුක්ඛෙ අනත්තසඤ්ඤා භික්ඛවෙ -පෙ- සංවත්තතීති.

### 2. 8. 43–48

### පහානසුත්තානි

705–710. පහානසඤ්ඤා භික්ඛවෙ -පෙ- සංවත්තතීති.

# 8, නිරොධ වර්ගය

## 2. 8. 1 – 6

### අසුභ සූත්‍ර

663 – 668. මහණෙනි, අසුභසඤ්ඤාව ... පවතී යි.

## 2. 8. 7 – 12

### මරණ සූත්‍ර

669 – 674. මහණෙනි, මරණසඤ්ඤාව ... පවතී යි.

## 2. 8. 13 – 18.

### ආහාරෙ පටික්කූල සූත්‍ර

675 – 680. මහණෙනි, ආහාරෙ පටික්කූලසඤ්ඤාව ... පවතී යි.

## 2. 8. 19 – 24

### සබ්බලොකෙ අනභිරත සූත්‍ර

681 – 686. මහණෙනි, සබ්බලොකෙ අනභිරතසඤ්ඤාව ... පවතී යි.

## 2. 8. 25 – 30

### අනිච්ච සූත්‍ර

687 – 692. මහණෙනි, අනිච්චසඤ්ඤාව ... පවතී යි.

## 2. 8. 31 – 36

### අනිච්චෙ දුක්ඛ සූත්‍ර

693 – 698. මහණෙනි, අනිච්චෙ දුක්ඛසඤ්ඤාව ... පවතී යි.

## 2. 8. 37 – 42

### දුක්ඛෙ අනත්ත සූත්‍ර

699 – 704. මහණෙනි, දුක්ඛෙ අනත්ත සඤ්ඤාව ... පවතී යි.

## 2. 8. 43 – 48

### පහාන සූත්‍ර

705 – 710. මහණෙනි, පහානසඤ්ඤාව ... පවතී යි.

## 2. 8. 49–54

## විරාගසුත්තානි

711–716. විරාගසඤ්ඤා භික්ඛවෙ –පෙ– සංවත්තතීති.

## 2. 8. 55

## නිරොධසුත්තං

717. නිරොධසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා. කථං භාවිතා ච භික්ඛවෙ, නිරොධසඤ්ඤා කථං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා: ඉධ භික්ඛවෙ, භික්ඛු නිරොධසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති –පෙ– නිරොධසඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, නිරොධසඤ්ඤා එවං බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසාති.

## 2. 8. 56

## දුතිය නිරොධසුත්තං

718. නිරොධසඤ්ඤාය භික්ඛවෙ, භාවිතාය බහුලීකතාය ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා. කථං භාවිතාය භික්ඛවෙ, නිරොධසඤ්ඤාය කථං බහුලීකතාය ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා. ඉධ භික්ඛවෙ, භික්ඛු නිරොධසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති –පෙ– නිරොධසඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතාය ඛො භික්ඛවෙ, නිරොධසඤ්ඤාය එවං බහුලීකතාය ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතාති.

## 2. 8. 57

## තතිය නිරොධසුත්තං

719. නිරොධසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහතො අත්ථාය සංවත්තති. කථං භාවිතා ච භික්ඛවෙ, නිරොධසඤ්ඤා කථං බහුලීකතා මහතො අත්ථාය සංවත්තති: ඉධ භික්ඛවෙ, භික්ඛු නිරොධසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති –පෙ– නිරොධසඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ නිරොධසඤ්ඤා එවං බහුලීකතා මහතො අත්ථාය සංවත්තතීති.

## 2. 8. 49 – 54

## විරාග සූත්‍ර

711 – 716. මහණෙනි, විරාගසඤ්ඤාව ... පවතී යි.

## 2. 8. 55

## නිරෝධ සූත්‍රය

717. මහණෙනි, නිරොධසඤ්ඤාව වඩන ලද්දී බහුල කරන ලද්දී මහපළ මහානිසංස වේ. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද නිරොධසඤ්ඤාව මහප්ල මහානිසංස වේ ද යත්: මහණෙනි, මෙහි මහණ විවේකය ඇසුරු වූවක් විරාගය ඇසුරු වූවක් නිරොධය ඇසුරු වූවක් නිවනට නැමෙනසුල්ලක් කොට නිරොධසඤ්ඤාසහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... නිරොධසඤ්ඤා සහගත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද්‍ද නිරොධසඤ්ඤාව මහප්ල මහානිසංස වේ යි.

## 2: 8. – 56

## දුතිය නිරොධ සූත්‍රය

718. මහණෙනි, නිරොධ සඤ්ඤාව වැඩූ කල්හි බහුල කළ කල්හි ඵලදෙකින් එක්තරා ඵලයක් කැමැති වියයුතු: දිටුදමියෙහි රහත්බව හෝ උපාදන සෙස ව ඇති කල්හි අනගැමි බව හෝ යි. මහණෙනි, නිරොධ සඤ්ඤාව කෙසේ වැඩූ කල්හි කෙසේ බහුල කළ කල්හි දිටුදමියෙහි ම රහත්බව හෝ උපාදන සෙස ව ඇති කල්හි අනගැමි බව හෝ යන ඵලදෙකින් එක්තරා ඵලයක් කැමැති වියයුතු ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ග පරිණාමී කොට නිරොධසඤ්ඤාසහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... නිරොධසඤ්ඤාසහගත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, නිරොධසඤ්ඤාව මෙසේ වැඩූ කල්හි මෙසේ බහුල කළ කල්හි දිටුදමියෙහි ම රහත්බව හෝ උපාදන සෙස ව ඇති කල්හි අනගැමිබව හෝ යනඵල දෙකින් එක්තරා ඵලයක් කැමැති වියයුතු යි.

## 2. 8. 57

## තතිය නිරොධ සූත්‍රය

719. මහණෙනි, නිරොධසඤ්ඤාව වඩන ලද්දී බහුල කරන ලද්දී මහත් වැඩ පිණිස පවතී. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද නිරොධසඤ්ඤාව මහත් වැඩ පිණිස පවතී ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ග පරිණාමී කොට නිරොධ සඤ්ඤාව සමග යෙදුණු සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... නිරොධ සඤ්ඤාව සමග යෙදුණු උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද නිරොධ සඤ්ඤාව මහත් වැඩ පිණිස පවතී යි.

## 2. 8. 58

## චතුත්ථ නිරොධසුත්තං

720. නිරොධසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහතො යොගක්ඛෙමාය සංවත්තති. කථං භාවිතා ච භික්ඛවෙ, නිරොධසඤ්ඤා කථං බහුලීකතා මහතො යොගක්ඛෙමාය සංවත්තති: ඉධ භික්ඛවෙ, භික්ඛු නිරොධසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- නිරොධසඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, නිරොධසඤ්ඤා එවං බහුලීකතා මහතො යොගක්ඛෙමාය සංවත්තතීති.

## 2. 8. 59

## පඤ්චම නිරොධසුත්තං

721. නිරොධසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහතො සංවෙගාය සංවත්තති. කථං භාවිතා ච භික්ඛවෙ, නිරොධසඤ්ඤා කථං බහුලීකතා මහතො සංවෙගාය සංවත්තති: ඉධ භික්ඛවෙ, භික්ඛු නිරොධසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- නිරොධසඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, නිරොධසඤ්ඤා එවං බහුලීකතා මහතො සංවෙගාය සංවත්තතීති.

## 2. 8. 60

## ඡට්ඨ නිරොධසුත්තං

722. නිරොධසඤ්ඤා භික්ඛවෙ, භාවිතා බහුලීකතා මහතො ඵාසුවිහාරාය සංවත්තති. කථං භාවිතා ච භික්ඛවෙ, නිරොධසඤ්ඤා කථං බහුලීකතා මහතො ඵාසුවිහාරාය සංවත්තති: ඉධ භික්ඛවෙ, භික්ඛු නිරොධසඤ්ඤාසහගතං සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති -පෙ- නිරොධසඤ්ඤාසහගතං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං භාවිතා ඛො භික්ඛවෙ, නිරොධසඤ්ඤා එවං බහුලීකතා මහතො ඵාසුවිහාරාය සංවත්තතීති.

**නිරොධවග්ගො අට්ඨමො.**

**තත්‍රුද්දානං:-**

අසුභමරණාහාර පටික්කූලානභිරතා
අනිච්චදුක්ඛානත්තපහාන විරාගනිරොධනාති.

## 1. 8. 58

## චතුත්ථනිරොධ සූත්‍රය

720. මහණෙනි, නිරොධසඤ්ඤාව වඩන ලද්දී බහුල කරන ලද්දී මහත් යොගක්ෂෙමය පිණිස පවතී. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද නිරොධසඤ්ඤාව මහත් යොගක්‍ෂෙමය පිණිස පවතී ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත වොස්සග්ගපරිණාමී කොට නිරොධ සඤ්ඤා සහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි. ... නිරොධසඤ්ඤාසහගත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද නිරොධසඤ්ඤාව මහත් යොගක්‍ෂෙමය පිණිස පවතී යි.

## 2. 8. 59

## පඤ්චම නිරොධ සූත්‍රය

721. මහණෙනි, නිරොධසඤ්ඤාව වඩන ලද්දී බහුල කරන ලද්දී මහත් සංවෙගය පිණිස පවතී. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද නිරොධසඤ්ඤාව මහත් සංවෙගය පිණිස පවතී ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිස්සිත විරාගනිස්සිත නිරොධනිස්සිත වොස්සග්ග පරිණාමී කොට නිරොධසඤ්ඤාසහගත සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... නිරොධසඤ්ඤාසහගත උපෙක්ඛාසම්බො-ජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද නිරොධසඤ්ඤාව මහත් සංවෙගය පිණිස පවතී යි.

## 2. 8. 60

## ඡට්ඨ නිරොධ සූත්‍රය

722. මහණෙනි, නිරොධසඤ්ඤාව වඩන ලද්දී බහුල කරන ලද්දී මහත් පහසුවිහරණ පිණිස පවතී. මහණෙනි, කෙසේ වඩන ලද කෙසේ බහුල කරන ලද නිරොධ සඤ්ඤාව මහත් පහසු විහරණ පිණිස පවතී ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිස්සිත විරාග නිස්සිත නිරොධනිස්සිත වොස්සග්ගපරිණාමී කොට නිරොධසඤ්ඤාව සමග යෙදුණු සතිසම්බොජ්ඣඞ්ගය වඩයි ... නිරොධසඤ්ඤාව සමග යෙදුණු උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ වඩන ලද මෙසේ බහුල කරන ලද නිරොධසඤ්ඤාව මහත් පහසු විහරණය පිණිස පවතී යි.

## අටවැනි නිරොධ වර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය;**

අසුභ, මරණ, ආහාරෙ පටික්කූල, අනභිරත, අනිච්ච, දුක්ඛ, අනත්ත, පහාන, විරාග, නිරොධ යි ෂට්ක දශයෙකි. සූත්‍ර මුළුල්ල සැටෙකි.

## 9. ගඞ්ගාපෙය්‍යාලො

### 2. 9. 1–12

### ගඞ්ගාදිසුත්තානි

723–734. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගානදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති, නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. ඉධ භික්ඛවෙ, භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති –පෙ– උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සත්තබොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති –පෙ– නිබ්බානපබ්භාරොති. (ද්වාදසසුත්තන්තානි විත්ථාරෙතබ්බානි.)

**ගඞ්ගාපෙය්‍යාලො නවමො.**

තත්‍රුද්දානං:

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො
එතෙ ද්වෙ ඡ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

## 10. අප්පමාදවග්ගො

### 2. 10. 1–10

### තථාගතාදි සුත්තානි

735–744. යාවතා භික්ඛවෙ, සත්තා අපද වා ද්විපද වා චතුප්පද වා බහුප්පද වා –පෙ– බහුලීකරොන්තීති.

(බොජ්ඣඞ්ගවසෙන දස සුත්තන්තානි විත්ථාරෙතබ්බානි)

**අප්පමාදවග්ගො දසමො.**

තත්‍රුද්දානං:

තථාගතං පදං කූටං මූලං සාරෙන වස්සිකං
රාජා චන්දිමසුරියා ච වත්ථෙන දසමං පදන්ති.

## 9. ගඞ්ගාපෙය්‍යාල වර්ගය

### 2. 9. 1 - 12

### ගඞ්ගාදි සූත්‍ර

723-734 මහණෙනි, යම්සේ ගඞ්ගානදිය පෙරදිගට නැමුණී පෙර දිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ සත්බොජඣ වඩන්නේ සත්බොජඣ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බරවූයේ වේ. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ සත්බොජඣ වඩන්නේ සත්බොජඣ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවේකනිස්සිත විරාගනිස්සිත නිරොධ නිස්සිත වොස්සග්ගපරිණාමී කොට සතිසම්බොජ්ඣඞ්ගය වඩයි...උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගය වඩයි. මහණෙනි, මෙසේ මහණ සත්බොජඣ වඩන්නේ සත්බොජඣ බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ යි. ... නිවනට බර වූයේ යි.

(දෙළොස් සූත්‍රාන්තයෝ විස්තර කට යුත්තාහ)

### නවවැනි ගඞ්ගාපෙය්‍යාල වර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

පාචීනනින්න සූත්‍ර සයෙකි. සමුද්දනින්න සූත්‍ර සයෙකි. මේ ඡට්ක දෙක සූත්‍ර දෙළසෙක් වේ. එයින් වර්ග යි කියනු ලැබේ.

## 10. අප්පමාද වර්ගය

### 2. 10. 1 - 10

### තථාගතාදි සූත්‍ර

735-744. මහණෙනි, අපා වූද දෙපා වූද සිවුපා වූ ද බහුපා වූ ද යම් තාක් සත්ත්වයෝ වෙද්ද ... බහුල කෙරේ යි.

(බොජ්ඣඞ්ග වශයෙන් දශසූත්‍රාන්තයෝ විතර කටයුතු.)

### දශවැනි අප්පමාද වර්ග යි.

**එහි සූත්‍ර නාමාවලිය:**

තථාගත, පද, කූට, මූල, සාර, වස්සික, රාජ, චන්දිම, සූරිය, වත්‍ථ යි සූත්‍ර දශයෙකි.

# 11. බලකරණීයවග්ගො

## 2. 11. 1–12

### බලාදිසුත්තානි

745–756. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කයිරන්ති –පෙ– බහුලීකරොතීති.

(බොජ්ඣඞ්ගවසෙන ද්වාදසසුත්තන්තා විත්ථාරෙතබ්බා)

**බලකරණීයවග්ගො එකාදසමො.**

තස්සුද්දානං:–

බලං බීජඤ්ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකෙන
ආකාසෙන ච ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදීති.

# 12. එසනාවග්ගො

## 2. 12. 1–40

### එසනාදිසුත්තානි

757–796. තිස්සො ඉමා භික්ඛවෙ, එසනා. කතමා තිස්සො: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා –පෙ– භාවෙතබ්බාති.

(මග්ගසංයුත්තස්ස එසනාවග්ගො විය විත්ථාරෙතබ්බො)

**එසනාවග්ගො ද්වාදසමො.**

තස්සුද්දානං:–

එසනා විධා ආසවො භවො ච දුක්ඛතා තිස්සො
ඛිලං මලඤ්ච නීඝො ච වෙදනා තණ්හාති තෙදසාති.

# 13. ඔඝවග්ගො

## 2. 13. 1 –40

### ඔඝාදිසුත්තානි

797–836. චත්තාරොමෙ භික්ඛවෙ, ඔඝා. කතමෙ චත්තාරො: කාමොඝො භවොඝො දිට්ඨොඝො අවිජ්ජොඝො –පෙ– භාවෙතබ්බාති

(මග්ගසංයුත්තස්ස ඔඝවග්ගො විය විත්ථාරෙතබ්බො)

**ඔඝවග්ගො තෙළසමො.**

තස්සුද්දානං:

ඔඝො යොගො උපාදානං ගන්ථා අනුසයෙන ච
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධමහාගියාති.

# 11. බලකරණීය වර්ගය

## 2. 11. 1 – 12

### බලාදි සූත්‍ර

745 – 756 මහණෙනි, යම්සේ යම්කිසි බලකරණීයකර්මාන්තයෝ කරනු ලැබෙද්ද ... බහුල කෙරේ යි.

(බොජ්ඣඞ්ග වශයෙන් දෙළොස් සූත්‍රාන්තයෝ විතර කටයුතු.)

**එකොළොස්වැනි බලකරණීයවර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය:**

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාසසූත්‍ර ද මෙඝසූත්‍ර දෙක ද නාවා, ආගන්තුක, නදී සූත්‍රද යි දොළසෙකි.

# 12. ඒසනා වර්ගය

## 2. 12. 1 –40

### එසනාදි සූත්‍ර

757–796 මහණෙනි, මේ එසනා තුනෙකි. කවර තුනෙක් ද යත්: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා යි. ... වැඩිය යුත්තේ යි.

(මග්ගසංයුත්තයෙහි එසනාවර්ගය මෙන් විතර කටයුතු)

**දොළොස්වැනි එසනා වර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය:**

එසනා, විධා, ආසව, භව, දුක්ඛතා, ඛිල, මල, නීඝ, වෙදනා, තණ්හා යි චතුෂ්ක දශයෙකි. සූත්‍ර මුළුල්ල සාළිසෙකි.

# 13. ඕඝවර්ගය

## 2. 13. 1 – 40

### ඕඝාදි සූත්‍ර

797–836 මහණෙනි, මේ ඕඝ සතරෙකි. කවර සතරෙක් ද යත්: කාමොඝ භවොඝ දිට්ඨොඝ අවිජ්ජොඝ යි. ... වැඩිය යුත්තේ යි.

(මග්ගසංයුත්තයෙහි ඕඝවර්ගය මෙන් විතර කටයුතු.)

**තෙළෙස්වැනි ඕඝවර්ග යි.**

**එහි සූත්‍ර නාමාවලිය:**

ඕඝ, යොග, උපාදාන, ගන්ථ, අනුසය, කාමගුණ, නීවරණ, ඛන්ධ ඕරම්භාගිය, උද්ධම්භාගිය යි චතුෂ්ක දශයෙකි. මුළුල්ල සාළිසෙකි.

# 14. පුන ගඞ්ගාපෙය්‍යාලො

## 2. 14. 1–36

### ගඞ්ගාදිසුත්තානි

837–872. (රාගවිනය අමතොගධ නිබ්බානනින්නාදිවසෙන විත්ථාරෙතබ්බානි)

**පුනගඞ්ගාපෙය්‍යාලො චුද්දසමො.**

තස්සුද්දානං:

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො,
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

# 15. පුන අප්පමාදවග්ගො

## 2. 15. 1–30

### තථාගතාදිසුත්තානි

873–902. (රාගවිනයාදිවසෙන විත්ථාරෙතබ්බානි)

**පුන අප්පමාදවග්ගො පණ්ණරසමො.**

තස්සුද්දානං:

තථාගතං පදං කූටං මූලං සාරෙන වස්සිකං,
රාජා චන්දිමසූරියා ච වත්ථෙන දසමං පදන්ති.

# 16. පුනබලකරණීයවග්ගො

## 2. 16. 1–36

### බලාදිසුත්තානි

903–938. (රාගවිනයාදිවසෙන විත්ථාරෙතබ්බානි)

**පුනබලකරණීයවග්ගො සොළසමො.**

තස්සුද්දානං:

බලං බීජඤ්ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකෙන
ආකාසෙන ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදීති.

## 14. පුනගඞ්ගාපෙය්‍යාල වර්ගය

### 2. 14. 1 – 36

### ගඞ්ගාදි සූත්‍ර

837–872 (රාගවිනය අමතොගධ නිබ්බානනින්නාදි විසින් විතර කට යුතු.)

**තුදුස්වැනි පුනගඞ්ගාපෙය්‍යාල වර්ග යි.**

එහි සූත්‍ර නාමාවලිය:

පාචීනනින්න ත්‍රික සයෙකි. සමුද්දනින්න ත්‍රික සයෙකි. මේ සටක දෙක දෙළසෙක් වේ.

(සූත්‍ර මුළුල්ල සතිසෙකි.) එයින් වර්ග යි කියනු ලැබේ.

## 15. පුන අප්පමාද වර්ගය

### 2. 15. 1 – 30

### තථාගතාදි සූත්‍ර

873–902 (රාගවිනයාදි විසින් විතර කටයුතු.)

**පසළොස්වැනි පුන අප්පමාද වර්ග යි.**

එහි සූත්‍ර නාමාවලිය:

තථාගත, පද, කූට, මූල, සාර, වස්සික, රාජ, චන්දිම, සූරිය, වත්‍ථ යි ත්‍රික දශයෙකි. සූත්‍ර තිසෙකි.

## 16. පුන බලකරණීය වර්ගය

### 2. 16. 1 – 36

### බලාදි සූත්‍ර

903–938 (රාගවිනයාදි වශයෙන් විතර කටයුතු.)

**සොළොස්වැනි පුන බලකරණීය වර්ග යි.**

එහි සූත්‍ර නාමාවලිය:

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාස යන ත්‍රික ද මෙස ත්‍රික දෙක ද නාවා, ආගන්තුග, නදී ත්‍රික තුන ද යි ත්‍රික දෙළසෙකි. සූත්‍ර සතිසෙකි යි.

## 17. පුන එසනා වග්ගො

### 2. 17. 1–120

### එසනාදිසුත්තානි

939–1058. (රාගවිනයාදිවසෙන විත්ථාරෙතබ්බානි)

**පුනඑසනාවග්ගො සත්තරසමො.**

**තත්‍රුද්දානං:–**

එසනා විධා ආසවො භවො ච දුක්ඛතා තිස්සො,
ඛිලං මලඤ්ච නීඝො ච වෙදනා තණ්හාති තෙ දසාති.

## 18. පුන ඔඝවග්ගො

### 2. 18. 1–120

### ඔඝාදිසුත්තානි

1059–1178. (රාගවිනයාදිවසෙන විත්ථාරෙතබ්බානි)

**පුනඔඝවග්ගො අට්ඨාරසමො.**

**තත්‍රුද්දානං:–**

ඔඝො යොගො උපාදානං ගන්ථා අනුසයෙන ච,
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධම්භාගියාති.

**බොජ්ඣඞ්ගසංයුත්තං සමත්තං.**

**තත්‍ර වග්ගුද්දානං:–**

පබ්බතො ගිලානුදයී නීවරණො චක්කවත්ති
බොජ්ඣඞ්ගො ආනාපානො ච නිරොධගඞ්ගාපෙය්‍යාලා
අප්පමාදෙ බලකරණීයො එසනොඝා පුනාදිහි
ගඞ්ගාපෙය්‍යාල ආදීහි පඤ්චහට්ඨාරසෙව තෙති.

# 17. පුන ඒසනාවර්ගය

## 2. 17. 1 – 120

### ඒසනාදි සූත්‍ර

939–1058. (රාගවිනයාදි විසින් විතර කටයුතු.)

**සතළොස්වැනි පුන ඒසනාවර්ගය යි.**

එහි සූත්‍ර නාමාවලිය:

ඒසනා, විධා, ආසව, භව, දුක්ඛතා, ඛීල. මල. නීඝ. වේදනා, තණ්හා යි ද්වාදශක දශයෙකි. සූත්‍ර එක්සියවිස්සෙකි.

# 18. පුන ඕඝවර්ගය

## 2. 18. 1 – 120

### ඕඝාදි සූත්‍ර

1059–1178 (රාගවිනයාදි විසින් විතර කටයුතු.)

**අටළොස්වැනි පුනඕඝ වග්ග යි.**

එහි සූත්‍ර නාමාවලිය:

ඕඝ, යොග, උපාදාන, ගන්ථ, අනුසය, කාමගුණ, නීවරණ, ඛන්ධ, ඔරම්භාගිය, උද්ධම්භාගියයි ද්වාදශක දශයෙකි. සූත්‍රාන්ත එක්සිය–විස්සෙකි.

**බොජ්ඣඞ්ගසංයුත්තය නිමි.**

එහි වර්ග නාමාවලිය:

පබ්බත, ගිලාන, උදායි, නීවරණ, චක්කවත්ති, බොජ්ඣඞ්ග, ආනාපාන, නිරොධ, ගඞ්ගාපෙය්‍යාල, අප්පමාද, බලකරණීය, ඒසනා, ඕඝ යන මහු පුන යන්න ආදි කොට ඇති (පුනගඞ්ගාපෙය්‍යාල පුනඅප්පමාද පුන බලකරණීය පුනඒසනා පුනඕඝ යන පසත් සමග (බොජ්ඣඞ්ගසංයුත්ත යෙහි වර්ග) අටළොසෙක් ම වේ.

# 3. සතිපට්ඨානසංයුත්තං

## 1. අම්බපාලිවග්ගො

### 3. 1. 1

### අම්බපාලිසුත්තං

1179. එවං මෙ සුතං, එකං සමයං භගවා වෙසාලියං විහරති අම්බපාලිවනෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: 'භික්ඛවො'ති. 'භදන්තෙ'ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච: එකායනො අයං[1] භික්ඛවෙ, මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං[2] සමතික්කමාය දුක්ඛදෙමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය. යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. එකායනො අයං භික්ඛවෙ, මග්ගො සත්තානං විසුද්ධියා, සොකපරිද්දවානං සමතික්කමාය, දුක්ඛදෙමනස්සානං අත්ථඞ්ගමාය, ඤායස්ස අධිගමාය, නිබ්බානස්ස සච්ඡිකිරියාය. යදිදං චත්තාරො සතිපට්ඨානාති. ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

### 3. 1. 2

### සතොසුත්තං

1180. එකං සමයං භගවා වෙසාලියං විහරති අම්බපාලිවනෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි -පෙ- සතො භික්ඛවෙ, භික්ඛු විහරෙය්‍ය සම්පජානො. අයං වො අම්හාකං අනුසාසනී. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සතො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සතො හොති.

---

1. එකායනොවායං - මජ්ඣං, සත්‍ය.
2. සොකපරිදෙවානං මජ්ඣං, සත්‍ය.

# 3. සතිපට්ඨානසංයුත්තය

## 1. අම්බපාලි වර්ගය

### 3. 1. 1

### අම්බපාලි සූත්‍රය

1179. මා විසින් මෙසේ අසන ලදී. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර අම්බපාලි වෙනෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි" යි භික්ෂූන් ඇමතූ සේක. ඒ භික්ෂූහු "පින්වතුන් වහන්සැ"යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක: මහණෙනි, යම් මේ සතර සතිපට්ඨාන කෙනෙක් වෙත් ද, සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස ශෝකපරිදේවයන් ඉක්මවීම පිණිස දුක්දොම්නස් දුරු කිරීම පිණිස න්‍යාය සංඛ්‍යාත ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය අවබෝධ කිරීම පිණිස නිවන පසක් කිරීම පිණිස මේ එකම මාර්ගය වේ. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇතිව කාලෙව්හි දැඩි ලොබ හා දොම්නස් දුරු කොට වෙසේ. විඳුම්හි විඳුම් අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇතිව විඳුම්ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. සිත්හි සිත් අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව සිත්ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. දහම්හි දහම් අනුව බලන සුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, යම් මේ සතර සතිපට්ඨාන කෙනෙක් වෙත් නම් සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස ශෝකපරිදේවයන් ඉක්මවනු පිණිස දුක්දොම්නස් දුරු කරනු පිණිස න්‍යාය අවබෝධ කරනු පිණිස නිවන පසක් කරනු පිණිස මේ එකම මාර්ගය"යි මෙය භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගත්හ යි.

### 3. 3. 2

### සතො සූත්‍රය

1180. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර අම්බපාලි වෙනෙහි වැඩ වසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක... මහණෙනි. මහණ සිහි ඇති ව මනා දැනුම් ඇති ව වෙසෙන්නේ ය. මේ තොපට අපගේ අනුශාසනා යි. මහණෙනි, කෙසේ නම් මහණ සිහි ඇත්තේ වේ ද යත්: මහණෙනි. මෙහි මහණ කයෙහි කය අනුව බලන සුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. ... වේදනාවන්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව බලන සුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇතිව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, මෙසේ මහණ සිහි ඇත්තේ වෙයි.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සම්පජානො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති. ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති. සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති. සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති. අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සම්පජානො හොති. සතො භික්ඛවෙ, භික්ඛු විහරෙය්‍ය සම්පජානො. අයං වො අම්හාකං අනුසාසනීති.

## 3. 1. 3

## භික්ඛුසුත්තං

1181. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: "සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති". එවමෙව පනිධෙකච්චෙ මොඝපුරිසා මමෙව[1] අජ්ඣෙසන්ති ධම්මෙ ච භාසිතෙ මමෙව අනුබන්ධිතබ්බං මඤ්ඤන්තීති: "දෙසෙතු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං, දෙසෙතු සුගතො සංඛිත්තෙන ධම්මං, අප්පෙවනාමාහං භගවතො භාසිතස්ස අත්ථං ආජානෙය්‍යං, අප්පෙවනාමාහං භගවතො භාසිතස්ස දායාදො අස්සන්ති."

තස්මාතිහ ත්වං භික්ඛු ආදිමෙව විසොධෙහි කුසලෙසු ධම්මෙසු. කො ච ආදි කුසලානං ධම්මානං: සීලඤ්ච සුවිසුද්ධං, දිට්ඨි ච උජුකා. යතො ඛො තෙ භික්ඛු, සීලං සුවිසුද්ධං භවිස්සති, දිට්ඨි ච උජුකා, තතො ත්වං භික්ඛු, සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය චත්තාරො සතිපට්ඨානෙ තිවිධෙන භාවෙය්‍යාසි. කතමෙ චත්තාරො: ඉධ ත්වං භික්ඛු අජ්ඣත්තං[2] කායෙ කායානුපස්සී විහරාහි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. බහිද්ධා[3] කායෙ කායානුපස්සී විහරාහි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අජ්ඣත්තබහිද්ධා[4] කායෙ කායානුපස්සී විහරාහි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං.

1. මමෙව - මජසං.
2. අජ්ඣත්තං වා - මජසං, සයා.
3. බහිද්ධා වා - මජසං, සයා.
4. අජ්ඣත්තං බහිද්ධා - සී. මු.

Free Distribution www.aathaapi.org

මහණෙනි, මහණ කෙසේ නම් මනා දැනුම් ඇත්තේ වේද යත්: මහණෙනි, මෙහි මහණ ඉදිරිගමන්හි ද පෙරළා ගමන්හි ද මනා දැනුම් ඇතිව කරනසුලු වෙයි. ඉදිරිබැලුම්හි ද අවට බැලුම්හි ද මනා දැනුම් ඇති ව කරන සුලු වෙයි. (අත්පා) හැකිළීමෙහි දිග හැරීමෙහි මනා දැනුම් ඇති ව කරන සුලු වෙයි. සඟළ පාසිවුරු දැරීමෙහි මනා දැනීම් ඇති ව කරනසුලු වෙයි. බීදීමෙහි පීමෙහි කෑමෙහි රස විඳුමෙහි මනා දැනුම් ඇතිව කරන සුලු වෙයි. මලමූ කම්හි මනා දැනුම් ඇති ව කරන සුලු වෙයි. ගමන්හි සිටුම්හි හිඳුම්හි නිඳුම්හි නිදි වැරුම්හි බිණුම්හි නිසදබැව්හි මනා දැනුම් ඇති ව කරනසුලු වෙයි. මහණෙනි, මෙසේ මහණ මනාදැනුම් ඇත්තේ වෙයි. මහණෙනි, මහණ සිහි ඇතිව මනා දැනුම ඇතිව වෙසෙන්නේ ය. මේ තොපට අපගේ අනුශාසනයි.

## 3. 1. 3

## භික්ඛු සූත්‍රය

1181. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය ... එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකලා වූයෙම් ගණයා කෙරෙන් වෙන් වූයෙම් නොපමා වූයෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් නිවන් පිණිස මෙහෙයූ සිත් ඇතියෙම් වෙසෙන්නෙම් නම් එබඳු දහමක් මට සැකෙවින් දෙසන සේක්වා යි. මෙහි ඇතැම් හිස් පුරුෂයෝ මෙමෙසේම මට ආරාධනා කෙරෙත්. දහම් දෙසූ කල්හි මා ම ලුහුබැඳියයුතු කොට හඟිති යි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සැකෙවින් මට දහම් දෙසන සේක්වා. සුගතයන් වහන්සේ සැකෙවින් මට දහම් දෙසන සේක්වා මම භාග්‍යවතුන් වහන්සේගේ දහම් අරුත දැනගන්නෙම් නම් ඉතා යෙහෙකැ. මම භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය පිළිබඳ දායාදයෙක් වන්නෙම් නම් ඉතා යෙහෙකැ යි.

මහණ, එසේ නම් තෙපි කුසල්දහම්හි මුල ම පිරිසිදු කරවූ. කුසල් දහමුන්ගේ මුල කවරේ ද යත්: ඉතා පිරිසිදු ශීලයත් සෘජු වූ දෘෂ්ටියත් ය. මහණ, යම් කලෙක තොපගේ ශීලය ඉතා පිරිසිදු වන්නේ ද, දෘෂ්ටියත් සෘජු වන්නී ද එකල්හි මහණ තෙපි ශීලය ඇසුරු කොට ශීලයෙහි පිහිටා සතර සිව්වටන් තුන් අයුරෙකින් වඩන්නහු ය. කවර සිව්දෙනෙක් ද යත්: මහණ මෙහි තෙපි සිය කයෙහි කය අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙවූ. මෙරමා කයෙහි කය අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇතිව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරුකොට වෙසෙවූ. සිය මෙරමාකයෙහි කය අනුව බලමින් කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇතිව සිහි ඇති ව කාය ලොකයෙහි දැඩිලොබ හා දෙම්නස දුරුකොට වෙසෙවූ.

අජ්ඣත්තං වෙදනාසු -පෙ- බහිද්ධා වෙදනාසු -පෙ- අජ්ඣත්තබහිද්ධා වෙදනාසු වෙදනානුපස්සී විහරාහි -පෙ- අජ්ඣත්තං චිත්තෙ -පෙ- බහිද්ධා චිත්තෙ -පෙ- අජ්ඣත්තබහිද්ධා චිත්තෙ චිත්තානුපස්සී විහරාහි -පෙ- අජ්ඣත්තං ධම්මෙසු -පෙ- බහිද්ධා ධම්මෙසු -පෙ- අජ්ඣත්තබහිද්ධා ධම්මෙසු ධම්මානුපස්සී විහරාහි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. යතො ඛො ත්වං භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං තිවිධෙන භාවෙස්සසි, තතො තුය්හං භික්ඛු, යා රත්ති වා දිවසො වා ආගමිස්සති වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො පරිහානීති.

අථ ඛො සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සො භික්ඛු එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

## 3. 1. 4

### සාලාසුත්තං

1182. එවං මෙ සුතං. එකං සමයං භගවා කොසලෙසු විහරති සාලායං[1] බ්‍රාහ්මණගාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි[2]. යෙ තෙ භික්ඛවෙ, භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙ වො[3] භික්ඛවෙ, භික්ඛූ චතුන්නං සතිපට්ඨානානං භාවනාය සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා. කතමෙසං චතුන්නං: එථ තුම්හෙ ආවුසො, කායෙ කායානුපස්සිනො විහරථ, ආතාපිනො සම්පජානා එකොදිභූතා විප්පසන්නචිත්තා සමාහිතා එකග්ගචිත්තා කායස්ස යථාභූතං ඤාණාය. වෙදනාසු වෙදනානුපස්සිනො විහරථ, ආතාපිනො සම්පජානා එකොදිභූතා විප්පසන්නචිත්තා සමාහිතා එකග්ගචිත්තා, වෙදනානං යථාභූතං ඤාණාය. චිත්තෙ චිත්තානුපස්සිනො විහරථ ආතාපිනො සම්පජානා එකොදිභූතා විප්පසන්නචිත්තා සමාහිතා එකග්ගචිත්තා චිත්තස්ස යථාභූතං ඤාණාය. ධම්මෙසු ධම්මානුපස්සිනො විහරථ, ආතාපිනො සම්පජානා එකොදිභූතා විප්පසන්නචිත්තා සමාහිතා එකග්ගචිත්තා ධම්මානං යථාභූතං ඤාණාය.

---

1. සාලාය - මජසං, කොසලායං - සයා.
2. ආමන්තෙසි පෙ- එතදවොච -මජසං, සයා.
3. තෙ වො - සී I, 2

සිය වේදනාවන්හි ... මෙරමා වේදනාවන්හි...සිය මෙරමා වේදනාවන්හි වේදනා අනුව බලනසුලු ව වෙසෙවු ... සිය සිත්හි ... මෙරමා සිත්හි ... සිය මෙරමා සිත්හි සිත් අනුව බලනසුලු ව වෙසෙවු ... සිය දහම්හි ... මෙරමා දහම්හි ... සිය මෙරමා දහම්හි දහම් අනුව බලන සුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇතිව දහම් ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙවු. මහණ, යම් කලෙක තෙපි සිලය ඇසුරු කොට සිලයෙහි පිහිටා මේ සිවු සිවටන් මෙසේ තුන් අයුරෙන් වඩන්නහු නම් මහණ එකල්හි තොපට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණෙන්නේ නම් කුසල්දහම්හි වැඩීමෙක් ම කැමැති වියයුතු. පිරිහීමෙක් නොකැමති වියයුතු.

ඉක්බිති ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේ ය. එකල්හි ඒ මහණ එකලා ව ගණයා කෙරෙන් වෙන් වූයේ නොපමා ව කෙලෙස් තවන වැර ඇත්තේ නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන්නේ නොබෝ කලකින් ම කුලපුත්තු යමක් පිණිස මැනවින් ම ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙද්ද, මහබඹසර කෙළවර වූ ඒ අනුත්තර අර්හත්ඵලය තෙමේ ම වෙසෙස්නුවණින් පසක් කොට ඊට පැමිණ විසී ය. ඉපැද්ම ගෙවීණ. බඹසර වැස නිමවන ලදී. කටයුතු කරන ලදී, මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දැනගත්තේ ය. ඒ මහණ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වී යයි.

## 3. 1. 4

## සාලා සූත්‍රය

1182. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වෙහි සාලා නම් බමුණුගම්හි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, අලුත පැවිදි වූ ළඟ දී මෙසස්නට පැමිණි යම් ඒ නවක භික්ෂූහු වෙත් නම් මහණෙනි, ඒ භික්ෂූහු තොප විසින් සිවුසිවටන් වඩනු පිණිස සමාදන් කරවිය යුතුවහ. වැස්වියයුතුවහ. පිහිටුවියයුතුවහ. කවර සතරක් ද යත්: ඇවැත්නි, එව තෙපි කයෙහි කය අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව එකඟ සිත් ඇති ව වෙසෙසින් පහන් සිත් ඇති ව කය තතුසේ දැනුම පිණිස සමාහිත ව එකාග්‍රචිත්ත ව වෙසෙවු. විඳුම්හි විඳුම් අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව එකඟසිත් ඇති ව වෙසෙසින් පහන් සිත් ඇති ව වේදනාවන් තතුසේ දැනුම පිණිස සමාහිත ව එකාග්‍රචිත්ත ව වෙසෙවු. සිත්හි සිත් අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව එකඟසිත් ඇති ව වෙසෙසින් පහන් සිත් ඇති ව සිත තතුසේ දැනුම පිණිස සමාහිත ව එකාග්‍රචිත්ත ව වෙසෙ වු. දහම්හි දහම් අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇතිව එකඟ සිත් ඇති ව වෙසෙසින් පහන් සිත් ඇති ව දහම් තතුසේ දැනුම පිණිස සමාහිත ව එකාග්‍රචිත්ත ව වෙසෙවු.

යෙ'පි තෙ භික්ඛවෙ, භික්ඛූ සෙඛා අප්පත්තමානසා අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානා විහරන්ති. තෙ'පි කායෙ කායානුපස්සිනො විහරන්ති, ආතාපිනො සම්පජානා එකොදිභූතා විප්පසන්නචිත්තා සමාහිතා එකග්ගචිත්තා කායස්ස පරිඤ්ඤාය. වෙදනාසු වෙදනානුපස්සිනො විහරන්ති -පෙ- වෙදනානං[1] පරිඤ්ඤාය. චිත්තෙ චිත්තානුපස්සිනො විහරන්ති -පෙ- චිත්තස්ස පරිඤ්ඤාය. ධම්මෙසු ධම්මානුපස්සිනො විහරන්ති ආතාපිනො සම්පජානා එකොදිභූතා විප්පසන්නචිත්තා සමාහිතා එකග්ගචිත්තා ධම්මානං පරිඤ්ඤාය.

යෙ'පි තෙ භික්ඛවෙ, භික්ඛූ අරහන්තො ඛීණාසවා වුසිතවන්තො කතකරණීයා ඔහිතභාරා අනුප්පත්තසදත්ථා පරික්ඛීණභවසංයොජනා සම්මදඤ්ඤාවිමුත්තා. තෙ'පි කායෙ කායානුපස්සිනො විහරන්ති, ආතාපිනො සම්පජානා එකොදිභූතා විප්පසන්නචිත්තා සමාහිතා එකග්ගචිත්තා කායෙන විසංයුත්තා. වෙදනාසු වෙදනානුපස්සිනො විහරන්ති -පෙ- වෙදනාහි විසංයුත්තා. චිත්තෙ චිත්තානුපස්සිනො විහරන්ති -පෙ- චිත්තෙන විසංයුත්තා. ධම්මෙසු ධම්මානුපස්සිනො විහරන්ති ආතාපිනො සම්පජානා එකොදිභූතා විප්පසන්නචිත්තා සමාහිතා එකග්ගචිත්තා ධම්මෙහි විසංයුත්තා. යෙ'පි තෙ භික්ඛවෙ, භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං, තෙ වො භික්ඛවෙ, භික්ඛූ ඉමෙසං චතුන්නං සතිපට්ඨානානං භාවනාය සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බාති.

## 3. 1. 5

## කුසලරාසිසුත්තං

1183. අකුසලරාසීති භික්ඛවෙ, වදමානො[2] පඤ්චනීවරණෙ සම්මා වදමානො වදෙය්‍ය. කෙවලො හ'යං භික්ඛවෙ, අකුසලරාසි යදිදං පඤ්ච නීවරණා. කතමෙ පඤ්ච: කාමච්ඡන්දනීවරණං බ්‍යාපාදනීවරණං ථීනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං. අකුසලරාසීති භික්ඛවෙ, වදමානො ඉමෙ පඤ්චනීවරණෙ සම්මා වදමානො වදෙය්‍ය. කෙවලො හ'යං භික්ඛවෙ, අකුසලරාසි යදිදං පඤ්ච නීවරණා.

කුසලරාසීති භික්ඛවෙ, වදමානො චත්තාරො සතිපට්ඨානෙ සම්මා වදමානො වදෙය්‍ය. කෙවලො හ'යං භික්ඛවෙ, කුසලරාසි යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. කුසලරාසීති භික්ඛවෙ, වදමානො ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ සම්මා වදමානො වදෙය්‍ය. කෙවලො හ'යං භික්ඛවෙ, කුසලරාසි යදිදං චත්තාරො සතිපට්ඨානාති.

---

1. වෙදනා - සී 1, 2.
2. සම්මාවදමානො - සී 1, 2.

මහණෙනි, යම් ඒ භික්ෂූ කෙනෙක් ශෛක්ෂ වූවාහු නොපැමිණි රහත්බව ඇත්තාහු අනුත්තරයොගක්ෂෙමය (නිවන) පතමින් වෙසෙත් ද, ඔහුත් කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇති ව එකඟසිත් ඇතිව වෙසෙසින් පහන්සිත් ඇති ව කය පිරිසිඳ දැනීම පිණිස සමාහිත ව එකාග්‍රචිත්ත ව වෙසෙත්. විඳීම්හි විඳීම් අනුව බලනසුලුව ... විඳීම් පිරිසිඳ දැනීම පිණිස වෙසෙත්. සිත්හි සිත් අනුව බලනසුලු ව ... සිත් පිරිසිඳ දැනුම පිණිස වෙසෙත්. දහම්හි දහම් අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇතිව එකඟසිත් ඇති ව වෙසෙසින් පහන්සිත් ඇති ව දහම් පිරිසිඳ දැනීම පිණිස සමාහිත ව එකාග්‍රචිත්ත ව වෙසෙත්.

මහණෙනි, රහත් වූ ක්ෂීණ වූ ආශ්‍රව ඇති වැස නිමවූ බඹසර ඇති කළ කටයුතු ඇති බහා තැබූ බර ඇති පිළිවෙළින් පැමිණි ස්වාර්ථ සඞ්ඛ්‍යාත අර්හත්ත්වය ඇති ක්ෂය කළ භවසංයෝජන ඇති මැනවින් දැන මිදුණු යම් ඒ මහණ කෙනෙකුත් වෙත් නම් ඔහුත් කයෙහි කය අනුව දක්නා සුලු ව වැර ඇතිව මනා දැනුම් ඇති ව එකඟ වූ සිත් ඇති ව වෙසෙසින් පහන් සිත් ඇති ව සමාහිත ව එකාග්‍රචිත්ත ව කයින් වෙන් ව වෙසෙත්. විඳුම්හි විඳුම් අනුව බලනසුලු ව ... විඳුමින් වෙන් ව වෙසෙත්. සිත්හි සිත් අනුව බලනසුලු ව ... සිතින් වෙන් ව වෙසෙත්. දහම්හි දහම් අනු ව බලනසුලු ව වැර ඇති ව මනා දැනුම් ඇති ව එකඟසිත් ඇති ව වෙසෙසින් පහන්සිත් ඇති ව සමාහිත ව එකාග්‍රචිත්තව දහමින් වෙන් ව වෙසෙත්. මහණෙනි, යම් ඒ මහණ කෙනෙක් නවක ද, අලුත පැවිදි වූවාහු ද, මෙසස්නට ළඟ දී පැමිණියාහු ද මහණෙනි, ඔහු තොප විසින් සිවුසිවටන් වඩනු පිණිස සමාදන් කරවියයුතුවහ. වැස්වියයුතුවහ. පිහිටුවියයුතුවහ යි.

## 3. 1. 5

## කුසලරාසි සූත්‍රය

1183. මහණෙනි, අකුසලරැසැ යි කියන්නෙක් මැනවින් කියන්නේ පඤ්චනීවරණ කියන්නේ ය. මහණෙනි, යම් මේ පඤ්ච නීවරණයෝ වෙත් නම් මහණෙනි, මේ හුදු අකුසල්රැසෙකි. කවර පසෙක් ද යත්: කාමච්ඡන්ද නීවරණ යැ ව්‍යාපාදනීවරණ යැ ථීනමිද්ධනීවරණ යැ උද්ධච්චකුක්කුච්ච නීවරණ යැ විචිකිච්ඡානීවරණ යි. මහණෙනි, අකුසල්රැසැ යි කියන්නෙක් මැනවින් කියන්නේ මේ පඤ්චනීවරණකියන්නේ ය. මහණෙනි, යම් මේ පඤ්ච නීවරණයෝ වෙත් නම් මේ හුදු අකුසල්රැස යි.

මහණෙනි, කුසල්රැස යි කියන්නෙක් මැනවින් කියන්නේ සිවුසිවටන් කියන්නේ ය. මහණෙනි, යම මේ සිවුසිවටන් වේ නම් මේ හුදු කුසල් රැසෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව ත්‍රාලොවෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලොවෙහි දැඩිලොබ හා දොම්නස දුරුකොට වෙසේ. මහණෙනි, කුසල්රැසැ යි කියන්නෙක් මැනවින් කියන්නේ මේ සිවුසිවටන් කියන්නේ ය. මහණෙනි, යම මේ සිවුසිවටන් වේ නම් මේ හුදු කුසල්රැස යි.

## 3. 1. 6

### සකුණග්ඝිසුත්තං

1184. භූතපුබ්බං භික්ඛවෙ, සකුණග්ඝි ලාපං සකුණං සහසා අජ්ඣප්පත්තා අග්ගහෙසි. අථ ඛො භික්ඛවෙ, ලාපො සකුණො සකුණග්ඝියා හරියමානො එවං හි පරිදෙවෙසි: "මයමෙවම්හා[1] අලක්ඛිකා. මයං අප්පපුඤ්ඤා, යෙ මයං අගොචරෙ චරිම්හා[2] පරවිසයෙ. සචජ්ජ මයං ගොචරෙ චරෙය්‍යාම සකෙ පෙත්තිකෙ විසයෙ, නචායං[3] සකුණග්ඝි අලං අභවිස්ස යදිදං යුද්ධායා"ති. කො පන තෙ ලාප ගොචරො සකො පෙත්තිකො විසයොති. යදිදං නඞ්ගලකට්ඨකරණං ලෙඩ්ඩුට්ඨානන්ති. අථ ඛො භික්ඛවෙ, සකුණග්ඝි සකෙ බලෙ අපත්ථද්ධා සකෙ බලෙ අවචමානා[4] අමුඤ්චි, ගච්ඡ ඛො ත්වං ලාප, තත්‍රාපි මෙ ගන්ත්වා න මොක්ඛසීති.

අථ ඛො භික්ඛවෙ, ලාපො සකුණො නඞ්ගලකට්ඨකරණං ලෙඩ්ඩුට්ඨානං ගන්ත්වා මහන්තං ලෙඩ්ඩුං අභිරූහිත්වා සකුණග්ඝිං අවචමානො[5] අට්ඨාසි, එහි ඛොදනි[6] සකුණග්ඝි, එහි ඛො'දනි සකුණග්ඝීති. අථ ඛො සා භික්ඛවෙ, සකුණග්ඝි සකෙ බලෙ අපත්ථද්ධා සකෙ බලෙ අවචමානා උභො පක්ඛෙ සන්ධාය[7] ලාපං සකුණං සහසා අජ්ඣප්පත්තා. යදා ඛො භික්ඛවෙ, අඤ්ඤාසි ලාපො සකුණො බහු ආගතා[8] ඛො ම්‍යා'යං සකුණග්ඝීති. අථ තස්සෙව ලෙඩ්ඩුස්ස අන්තරං පච්චුපාදි. අථ ඛො භික්ඛවෙ, සකුණග්ඝි තත්ථෙව උරං පච්චතාළෙසි. එවං හෙ'තං[9] භික්ඛවෙ, හොති යො අගොචරෙ චරති පරවිසයෙ.

තස්මාතිහ භික්ඛවෙ, මා අගොචරෙ චරිත්ථ පරවිසයෙ. අගොචරෙ භික්ඛවෙ, චරතං පරවිසයෙ ලච්ඡති මාරො ඔතාරං. ලච්ඡති මාරො ආරම්මණං. කො ච භික්ඛවෙ, භික්ඛුනො අගොචරො පරවිසයො: යදිදං පඤ්ච කාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. අයං භික්ඛවෙ, භික්ඛුනො අගොචරො පරවිසයො.

---

1. මයමෙවම්හ – මජසං, සයා.
2. චරිම්හ – මජසං, සයා.
3. නමායං – මජසං, සයා.
4. අසංවදමානා – මජසං, අවාදමානා – සයා.
5. වදමානො – මජසං, සයා.
6. දනිමෙ – මජසං, සයා.
7. සන්නය්හ – මජසං.
8. බහුං ආගතා – සී 1, 2.
9. හිතං – මජසං.

## 3. 1. 6

## සකුණග්ඝි සූත්‍රය

1184. මහණෙනි, පෙර ගිජුලිහිණියක් සැහැසිකමින් පැමිණ කැට කුරුල්ලකු අල්ලා ගත්තා ය. මහණෙනි, එකල්හි කැට කුරුලු තෙමේ ගිජුලිහිණිය විසින් හැර ගෙන යනු ලබන්නේ මෙසේ හැඬී ය: යම්බඳු අපි අගොචර වූ අනුන් අයත් විෂයෙහි හැසුරුණෙමෝ නම් (ඒ) අපි ම කාලකන්නි වම්හ. අපි ම පින් නැත්තම්හ. ඉදින් අපි ගොදුරු වූ සිය පියසතු විෂයෙහි හැසුරුණෙමෝ නම් මේ ගිජුලිහිණි මේ යුද්ධයට නො ද සමත් වන්නී ය යි. එම්බල කැටකුරුල්ල තාගේ ගොදුරු වූ සියපියසතු විෂය කිමෙක් දැ''යි. නඟුලෙන් සාන ලද කෙතෙහි කැට නැඟි තැනයි. මහණෙනි, එකල්හි ගිජුලිහිණි සිය බලයෙහි තද ව සිට සියබලය වනමින් එම්බල කැටකුරුල්ල, තෝ යා, එහි ද ගොස් මාගෙන් නො මිදෙන්නේ යැ යි මිදුවා ය.

මහණෙනි, ඉක්බිති කැටකුරුලු තෙමේ නඟුලෙන් සාන ලද කැට නැඟි තැනකට ගොස් මහත් කැටකට නැග ''ගිජුලිහිණිය, දැන් එව, ගිජුලිහිණිය දැන් එව''යි ගිජුලිහිණියට කියමින් සිටියේ ය. මහණෙනි, එකල්හි ඒ ගිජුලිහිණි සියබලයෙහි තද කොට සිටගෙන සියබලය වනමින් දෙපියාපත් නහා කැටකුරුල්ලා වෙත සැහැසිකමින් පැමිණියා ය. මහණෙනි, යම් කලෙක කැටකුරුලු තෙමේ ගිජුලිහිණි මා පිණිස බොහෝ දුර ආවා යි දැන ගත්තේ නම් එකල්හි ඒ කැටෙහි ම ඇතුළට පිවිසියේ ය. මහණෙනි, එකල ගිජුලිහිණිය එහි ම ළය තළාගත්තා ය. මහණෙනි, යමෙක් අගෝචර වූ මෙරමා අයත් විෂයෙහි හැසිරේ නම් එය මෙසේ ම වේ.

මහණෙනි, එහෙයින් මෙහි ලා අගෝචර වූ මෙරමා අයත් විෂය යෙහි නහමක් හැසිරෙවු. මහණෙනි, අගෝචර වූ මෙරමා අයත් විෂයෙහි හැසිරෙන්නවුන් පිළිබඳව මරු අවකාශ ලබන්නේ ය. මරු අරමුණක් ලබන්නේ ය. මහණෙනි, මහණහට අගෝචර වූ මෙරමා අයත් විෂය කිමෙක් ද යත්: මේ පඤ්චකාමගුණයෝ යි. කවර පසෙක් ද යත්: ඉටුකැමති මනවඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූපයෝ යැ.. කනින් දතයුතු ශබ්දයෝ යැ ... නැහැයෙන් දතයුතු ගන්ධයෝයැ... දිවෙන් දත යුතු රසයෝ යැ. ඉටු කැමති මන වඩන පියදැ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු ස්පර්ශයෝ යි. මහණෙනි, මේ මහණහට අගෝචර වූ මෙරමා අයත් විෂය යි.

ගොචරෙ භික්ඛවෙ, චරථ සකෙ පෙත්තිකෙ විසයෙ. ගොචරෙ භික්ඛවෙ, චරතං සකෙ පෙත්තිකෙ විසයෙ න ලච්ඡති මාරො ඔතාරං, න ලච්ඡති මාරො ආරම්මණං. කො ච භික්ඛවෙ, භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයො, යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං අයං භික්ඛවෙ, භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයොති.

## 3: 1. 7

### මක්කටසුත්තං.

1185. අත්ථි භික්ඛවෙ, හිමවතො පබ්බතරාජස්ස දුග්ගා විසමා දෙසා, යත්ථ නෙව මක්කටානං චාරී න මනුස්සානං. අත්ථි භික්ඛවෙ, හිමවතො පබ්බතරාජස්ස දුග්ගා විසමා දෙසා යත්ථ මක්කටානඤ්හි ඛො චාරී න මනුස්සානං. අත්ථි භික්ඛවෙ, හිමවතො පබ්බතරාජස්ස සම භූමිභාගා රමණීයා, යත්ථ මක්කටානං චෙව චාරී මනුස්සානඤ්ච. තත්‍ර භික්ඛවෙ, ලුද්දා මක්කටවීථීසු ලෙපං ඔඩ්ඩෙන්ති මක්කටානං බාධනාය තත්‍ර භික්ඛවෙ, යෙ තෙ මක්කටා අබාලජාතිකා[1] අලොලජාතිකා[1] තෙ තං ලෙපං දිස්වා ආරකා පරිවජ්ජෙන්ති[2]. යො පන සො හොති මක්කටො බාලජාතිකො ලොලජාතිකො සො තං ලෙපං උපසඞ්කමිත්වා හත්ථෙන ගණ්හාති. සො තත්ථ බජ්ඣති. හත්ථං මොචෙස්සාමීති දුතියෙන හත්ථෙන ගණ්හාති, සො තත්ථ බජ්ඣති. උභො හත්ථෙ මොචෙස්සාමීති පාදෙන ගණ්හාති, සො තත්ථ බජ්ඣති. උභො හත්ථෙ මොචෙස්සාමීති පාදං චාති[3] දුතියෙන පාදෙන ගණ්හාති, සො තත්ථ බජ්ඣති. උභො හත්ථෙ මොචෙස්සාමි පාදෙ චාති තුණ්ඩෙන ගණ්හාති, සො තත්ථ බජ්ඣති. එවං හි සො භික්ඛවෙ, මක්කටො පඤ්චොඩ්ඩිතො ථුනං[4] සෙති අනයං ආපන්නො ව්‍යසනං ආපන්නො යථාකාමකරණීයො ලුද්දස්ස. තමෙනං භික්ඛවෙ, ලුද්දො විජ්ඣිත්වා[5] තස්මිං යෙව මක්කටං උද්ධරිත්වා අවිස්සජ්ජෙත්වා[6] යෙන කාමං පක්කමති. එවං හි[7] තං භික්ඛවෙ, හොති යො අගොචරෙ චරති පරවිසයෙ.

---

1. ජාතියං – සී 1, 2.
2. පරිවජ්ජන්ති – මජ්සං.
3. පාදං චාති – සිමු, සී 1, 2.
4. පඤ්චොඩ්ඩිතො ථුනං – මජ්සං, සයා
5. කඩ්ඪිත්වා – සී 1, 2.
6. තස්මිං යෙව කට්ඨකතඞ්ගාරෙ අවස්සජ්ජෙත්වා – මජ්සං, තස්මිං යෙව මක්කටං උද්ධරිත්තා ආවජ්ජෙත්වා – සී 1, 2.
7. එවං හෙතං – මජ්සං, එවං හෙතං – සයා.

මහණෙනි, ගෝචර වූ සිය පියසතු විෂයෙහි හැසිරෙවු. මහණෙනි ගෝචර වූ සිය පියසතු විෂයෙහි හැසිරෙන්නවුන් පිළිබඳව මරු අවකාශයක් නො ලබන්නේ ය. මරු අරමුණක් නොලබන්නේ ය. මහණෙනි මහණහට ගෝචර වූ සිය පියසතු විෂය කිමෙක් ද යත්: මේ සිව් සිවටන්හු යි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. විදුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, මේ මහණහට ගෝචර වූ සිය පියසතු විෂය යි.

## 3. 1. 7

## මක්කට සූත්‍රය

1185. මහණෙනි, යම් තැනෙක වඳුරන්ගේත් හැසිරීමෙක් නො වේ ද, මිනිසුන්ගේත් හැසිරීමෙක් නො වේ ද, හිමවත් පවුරදුගේ (එබඳු) යා නොහැකි විසම පෙදෙස් ඇත. මහණෙනි. යම්තැනෙක වඳුරන්ගේ හැසිරීමෙක් වේ ද, මිනිසුන්ගේ හැසිරීමෙක් නො වේ ද, හිමවත් පවුරදුගේ එබඳු යා නොහැකි විසම පෙදෙස් ද ඇත. මහණෙනි, යම් පෙදෙසක වඳුරන්ගේ හැසිරීමත් වේ ද, මිනිසුන්ගේ හැසිරීමත් වේ ද, හිමවත් පවුරදුගේ එබඳු සිත්කලු සමබිම් පෙදෙස් ද ඇත. මහණෙනි. එහි වැද්දෝ වඳුරුමංහි වඳුරන් නසන පිණිස වඳුරුලහටු ගල්වා තබත්. මහණෙනි, එහි යම් ඒ වඳුරුකෙනෙක් බාලගති නැත්තාහු ද ලොල්ගති නැත්තාහු ද ඔහු ඒ ලහටු දැක දුරින් දුරු කෙරෙත්. යම් ඒ වඳුරෙක් බාලගති ඇත්තේ ලොල්ගති ඇත්තේ වේ නම් හේ ඒ ලහටු කරා එළඹ අතින් ගනී. හේ එහි බැඳේ. අත මුදන්නෙමි යි දෙවැනි අතින් ගනී. හේ එහි බැඳේ. දෑත මුදන්නෙමි යි පයින් ගනී. හේ එහි බැඳේ දෑතත් පයත් මුදන්නෙමි යි දෙවැනි පයින් ගනී. හේ එහි බැඳේ. දෑතත් දෙපයත් මුදන්නෙමි යි තුඩින් ගනී. හේ එහි බැඳේ. මහණෙනි, මෙසේ ඒ වඳුරා පස්තැනෙකින් එල්ලන ලද්දේ අනයට පැමිණියේ ව්‍යසනයට පැමිණියේ වැද්දා විසින් යම් කැමති පරිද්දක් කළ හැකි වූයේ තතනමින් හොවී. මහණෙනි, වැද්දා ඒ වඳුරා එහි දීම විද උදුරා අත් නොහැර යම් කැමති දිගකට යේ. මහණෙනි, යමෙක් අගෝචර වූ මෙරමා සතු විෂයෙහි හැසිරේ නම් ඒ මෙසේ ම වෙයි.

තස්මාතිහ භික්ඛවෙ, මා අගොචරෙ චරිත්ථ පරවිසයෙ. අගොචරෙ භික්ඛවෙ, චරතං පරවිසයෙ ලච්ඡති මාරො ඔතාරං, ලච්ඡති මාරො ආරම්මණං. කො ච භික්ඛවෙ, භික්ඛුනො අගොචරො පරවිසයො: යදිදං පඤ්චකාමගුණා. කතමෙ පඤ්ච: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. අයං භික්ඛවෙ, භික්ඛුනො අගොචරො පරවිසයො.

ගොචරෙ භික්ඛවෙ, චරථ සකෙ පෙත්තිකෙ විසයෙ. ගොචරෙ භික්ඛවෙ, චරතං සකෙ පෙත්තිකෙ විසයෙ න ලච්ඡති මාරො ඔතාරං, න ලච්ඡති මාරො ආරම්මණං. කො ච භික්ඛවෙ, භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයො: යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං අයං භික්ඛවෙ, භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයොති.

## 3. 1. 8

### සූදසුත්තං

1186. සෙය්‍යථාපි භික්ඛවෙ, බාලො අබ්‍යත්තො අකුසලො සූදො රාජානං වා රාජමහාමත්තං[1] වා නානච්චයෙහි සූපෙහි පච්චුපට්ඨිතො අස්ස: අම්බිලග්ගෙහිපි තිත්තකග්ගෙහිපි කටුකග්ගෙහිපි මධුරග්ගෙහිපි ඛාරිකෙහිපි අඛාරිකෙහිපි ලොණිකෙහිපි අලොණිකෙහිපි. ස ඛො සො භික්ඛවෙ, බාලො අබ්‍යත්තො අකුසලො සූදො සකස්ස භත්තු[2] නිමිත්තං න උග්ගණ්හාති: ඉදං වා මෙ අජ්ජ භත්තු[2] සූපෙය්‍යං රුච්චති, ඉමස්ස වා අභිහරති, ඉමස්ස වා බහුං ගණ්හාති, ඉමස්ස වා වණ්ණං භාසති, අම්බිලග්ගං වා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති, අම්බිලග්ගස්ස වා අභිහරති, අම්බිලග්ගස්ස වා බහුං ගණ්හාති, අම්බිලග්ගස්ස වා වණ්ණං භාසති, තිත්තකග්ගං වා මෙ අජ්ජ භත්තු -පෙ- කටුකග්ගං වා මෙ අජ්ජ භත්තු -පෙ- මධුරග්ගං වා මෙ අජ්ජ භත්තු -පෙ- ඛාරිකං වා මෙ අජ්ජ භත්තු -පෙ- අඛාරිකං වා මෙ අජ්ජ භත්තු -පෙ- ලොණිකං වා මෙ අජ්ජ භත්තු -පෙ- අලොණිකං වා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති, අලොණිකස්ස වා අභිහරති, අලොණිකස්ස වා බහුං ගණ්හාති, අලොණිකස්ස වා වණ්ණං භාසතීති. ස ඛො සො භික්ඛවෙ, බාලො අබ්‍යත්තො අකුසලො සූදො නෙව ලාභී හොති: අච්ඡාදනස්ස, න ලාභී වෙතනස්ස, න ලාභී අභිහාරානං. තං කිස්ස හෙතු: තථා හි සො භික්ඛවෙ, බාලො අබ්‍යත්තො අකුසලො සූදො සකස්ස භත්තු නිමිත්තං න උග්ගණ්හාති.

1. රාජමහාමත්තානං - සීමු.
2. භත්ත - මජසං, සයා.

මහණෙනි, එහෙයින් මෙහි ලා අගෝචර වූ මෙරමා සතු විෂයෙහි නහමක් හැසිරෙව්. මහණෙනි, අගෝචර වූ මෙරමා සතු විෂයෙහි හැසිරෙන්නවුන්ගේ බැසගැනීම මරු ලබන්නේ ය. මරු අරමුණක් ලබන්නේ ය. මහණෙනි, මහණහට අගෝචර වූ මෙරමා සතු විෂය කිමෙක් ද යත්: මේ පස්කම්ගුණ යි. කවර පසෙක් ද යත්; ඉටු කැමති මන වඩන පිය දෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූ යැ ... ඉටු කැමති මන වඩන පිය දෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු පහස් යැ. මහණෙනි, මේ මහණහට අගෝචර වූ මෙරමා සතු විෂය යි.

මහණෙනි, ගොදුරු වූ සිය පියසතු විෂයෙහි හැසිරෙව්. මහණෙනි, ගොදුරු වූ සිය පියසතු විෂයෙහි හැසිරෙන්නවුන්ගේ බැසගැනීම මරු නො ලබන්නේ ය. මරු අරමුණක් නො ලබන්නේ ය. මහණෙනි, මහණහට ගොදුරු වූ සිය පියසතු විෂය කිමෙක් ද යත්: මේ සිවු සිව්ටනි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කායලොකයෙහි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. වෙදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මේ මහණහට ගොදුරු වූ සිය පියසතු විෂය යි.

## 3. 1. 8

## සූදසූත්‍රය

1186. මහණෙනි, යම්සේ බාල වූ අව්‍යක්ත වූ අදක්‍ෂ වූ අරක්කැමියෙක් ඇඹුල් කොටස් ඇත්තා වූත් තිත්ත කොටස් ඇත්තා වූත් කුළු කොටස් ඇත්තා වූත් මිහිරි කොටස් ඇත්තා වූත් කරරස ඇත්තා වූත් කරරස නැත්තා වූත් ලුණුරස ඇත්තා වූත් ලුණුරස නැත්තා වූත් නන් වැදෑරුම් සූපයෙන් යුතු ව රජු වෙත හෝ රජමහඇමතියකු වෙත හෝ එළඹ සිටියේ වන්නේ ද, මහණෙනි, බාල වූ අව්‍යක්ත වූ අදක්‍ෂ වූ ඒ මේ අරක්කැමි තම ස්වාමියාගේ (භොජන) නිමිත්ත නො උගනියි. ''අද මාගේ ස්වාමිහට මේ සූපරසය රුචි වේ ය හෝ, මෙය ගැනීමට අත දිගුකරයි හෝ, මෙය බොහෝ කොට ගනියි හෝ, මෙහි ගුණ කියා යි හෝ අද මාගේ ස්වාමිහට ඇඹුල් කොටස් ඇති සූපරසය රුචි වේ යි හෝ, ඇඹුල් කොටස් ඇති සූපයට අත දිගුකරයි හෝ ඇඹුල් කොටස් ඇති සූපයෙන් බොහෝ ගනියි හෝ ඇඹුල් කොටස් ඇති සූපයෙහි ගුණ කියා යි හෝ, අද මාගේ ස්වාමිහට කුළු කොටස් ඇති ... හෝ ... අද මාගේ සැමියාට මිහිරි කොටස් ඇති හෝ, ... අද මාගේ සැමියාට කරරස ඇති හෝ, ... අද මාගේ ස්වාමිහට කරරස නැති හෝ ... අද මාගේ ස්වාමිහට ලුණුරස ඇති හෝ .. අද මාගේ ස්වාමිහට ලුණුරස නැති සූපරසය රුචි වේ ය හෝ ලුණුරස නැති සූපයට අත දිගුකරයි හෝ ලුණු රස නැති සූපයෙන් බොහෝ ගනි යි හෝ ලුණු රස නැති සූපයේ ගුණ කියා යි හෝ'' යි. මහණෙනි, බාල වූ අව්‍යක්ත වූ අදක්‍ෂ වූ මේ අරක්කැමි වස්ත්‍ර නො ද ලබනසුලු වෙයි. වැටුප් නො ද ලබනසුලු වෙයි. පඩුරු නො ද ලබනසුලු වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, බාල වූ අව්‍යක්ත වූ අදක්‍ෂ වූ ඒ අරක්කැමි සිය ස්වාමිහුගේ භෝජන නිමිත්ත නො උගනියි ද එහෙයිනි.

එවමෙව ඛො භික්ඛවෙ, ඉධෙකච්චො බාලො අව්‍යත්තො අකුසලො භික්ඛු කායෙ න කායානුපස්සී[1] විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස කායෙ න කායානුපස්සිනො[2] විහරතො චිත්තං න සමාධියති, උපක්කිලෙසා න පහීයන්ති. සො තං නිමිත්තං න උග්ගණ්හාති. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු න ධම්මානුපස්සී[3] විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස ධම්මෙසු න ධම්මානුපස්සිනො[4] විහරතො චිත්තං න සමාධියති, උපක්කිලෙසා න පහීයන්ති, සො තං නිමිත්තං න උග්ගණ්හාති, සඛො සො භික්ඛවෙ, බාලො අව්‍යත්තො අකුසලො භික්ඛු නචෙව ලාභී හොති දිට්ඨධම්මසුඛවිහාරානං,[5] න ලාභී සතිසම්පජඤ්ඤස්ස. තං කිස්ස හෙතු? තථා හි සො භික්ඛවෙ, බාලො අව්‍යත්තො අකුසලො භික්ඛු සකස්ස චිත්තස්ස නිමිත්තං න උග්ගණ්හාති.

සෙය්‍යථාපි භික්ඛවෙ, පණ්ඩිතො වියත්තො කුසලො සූදො රාජානං වා රාජමහාමත්තං වා නානච්චයෙහි සූපෙහි පච්චුපට්ඨිතො අස්ස: අම්බිලග්ගෙහිපි තිත්තකග්ගෙහිපි කටුකග්ගෙහිපි මධුරග්ගෙහිපි ඛාරිකෙහිපි අඛාරිකෙහිපි ලොණිකෙහිපි අලොණිකෙහිපි. සඛො සො භික්ඛවෙ, පණ්ඩිතො වියත්තො කුසලො සූදො සකස්ස භත්තු නිමිත්තං උග්ගණ්හාති: "ඉදං වා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති, ඉමස්ස වා අභිහරති, ඉමස්ස වා බහුං ගණ්හාති, ඉමස්ස වා වණ්ණං භාසති, අම්බිලග්ගං වා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති, අම්බිලග්ගස්ස වා අභිහරති, අම්බිලග්ගස්ස වා බහුං ගණ්හාති, අම්බිලග්ගස්ස වා වණ්ණං භාසති. තිත්තකග්ගං වා මෙ අජ්ජ භත්තු -පෙ- කටුකග්ගං වා මෙ අජ්ජ භත්තු -පෙ- මධුරග්ගං වා මෙ අජ්ජ භත්තු -පෙ- ඛාරිකං වා මෙ අජ්ජ භත්තු -පෙ- අඛාරිකං වා මෙ අජ්ජ භත්තු -පෙ- ලොණිකං වා මෙ අජ්ජ භත්තු -පෙ- අලොණිකං වා මෙ අජ්ජ භත්තු සූපෙය්‍යං රුච්චති, අලොණිකස්ස වා අභිහරති, අලොණිකස්ස වා බහුං ගණ්හාති. අලොණිකස්ස වා වණ්ණං භාසතීති. සඛො සො භික්ඛවෙ, පණ්ඩිතො වියත්තො කුසලො සූදො ලාභී චෙව හොති අච්ඡාදනස්ස, ලාභී වෙතනස්ස, ලාභී අභිහාරානං. තං කිස්ස හෙතු: තථා හි සො භික්ඛවෙ, පණ්ඩිතො ව්‍යත්තො කුසලො සූදො සකස්ස භත්තු නිමිත්තං උග්ගණ්හාති.

---

1. කායෙ කායානුපස්සී - මජසං, සතා.
2. කායෙ කායානුපස්සිනො - මජසං, සතා.
3. ධම්මෙසු ධම්මානුපස්සී - මජසං, සතා.
4. ධම්මෙසු ධම්මානුපස්සිනො - මජසං, සතා.
5. දිට්ඨෙව ධම්මෙ සුඛවිහාරානං - මජසං, සතා

මහණෙනි, එසෙයින් ම මෙහි බාල වූ අව්‍යක්ත වූ අදක්‍ෂ වූ ඇතැම් මහණෙක් කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට නො වෙසෙයි. කයෙහි කය අනුව දක්නාසුලු ව නො වෙසෙන ඔහුගේ සිත එකඟ නො වේ. කෙලෙස් ප්‍රහීණ නො වේ. හේ ඒ නිමිත්ත නො උගනියි වෙදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට නො වෙසේ. දහම්හි දහම් අනු ව දක්නාසුලු ව නො වෙසෙන ඔහු ගේ සිත එකඟ නො වෙයි. කෙලෙස් ප්‍රහීණ නො වේ. හේ ඒ නිමිත්ත නො උගනියි. මහණෙනි, බාල වූ අව්‍යක්ත වූ අදක්‍ෂ වූ ඒ මහණ දිටුදම්යෙහි සුව විහරණ නො ද ලබනසුලු වෙයි. සිහි නුවණ නො ද ලබනසුලු වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, බාල වූ අව්‍යක්ත වූ අදක්‍ෂ වූ ඒ මහණ සිය සිතෙහි නිමිත්ත නො උගනී ද එහෙයිනි.

මහණෙනි, යම්සේ පණ්ඩිත වූ ව්‍යක්ත වූ දක්‍ෂ වූ අරක්කැමියෙක් ඇඹුල් කොටස් ඇත්තා වූත් තිත්ත කොටස් ඇත්තා වූත් කුළු කොටස් ඇත්තා වූත් මිහිරි කොටස් ඇත්තා වූත් කරරස ඇත්තා වූත් කරරස නැත්තා වූත් ලුණුරස ඇත්තා වූත් ලුණුරස නැත්තා වූත් නන් වැදෑරුම් සූපයෙන් යුතු ව රජු වෙත හෝ රජමහඇමතියකු වෙත හෝ එළඹ සිටියේ වන්නේ ද, මහණෙනි, පණ්ඩිත වූ ව්‍යක්ත වූ දක්‍ෂ වූ ඒ අරක්කැමි සිය සැමියාගේ භෝජන නිමිත්ත උගනියි. “අද මාගේ සැමියාට මේ සූපරසය රුචි වේ යි හෝ මෙයට අත දිගුකරයි හෝ මෙයින් බොහෝ ගනියි හෝ මෙහි ගුණ කියායි හෝ අද මාගේ ස්වාමිහට ඇඹුල් කොටස් ඇති සූපරසය රුචි වෙ යි හෝ ඇඹුල් කොටස් ඇති සූපයට අත දිගුකරයි හෝ ඇඹුල් කොටස් ඇති සූපයෙන් බොහෝ ගනී යි හෝ ඇඹුල් කොටස් ඇති සූපයේ ගුණ කියා යි හෝ අද මාගේ ස්වාමිහට තිත්ත කොටස් ඇති ... හෝ, අද මාගේ ස්වාමිහට කුළු කොටස් ඇති හෝ ... අද මාගේ ස්වාමිහට මිහිරි කොටස් ඇති හෝ ... අද මාගේ ස්වාමිහට කරරස ඇති හෝ ... අද මාගේ ස්වාමිහට කරරස නැති හෝ ... අද මාගේ ස්වාමිහට ලුණුරස ඇති හෝ ... අද මාගේ ස්වාමිහට ලුණුරස නැති සූපරසය රුචි වෙ යි හෝ ලුණුරස නැති සූපයට අත දිගුකරයි හෝ ලුණුරස නැති සූපයෙන් බොහෝ ගනි යි හෝ ලුණුරස නැති සූපයෙහි ගුණ කියා යි හෝ” යි. මහණෙනි, පණ්ඩිත වූ ව්‍යක්ත වූ දක්‍ෂ වූ ඒ මේ අරක්කැමි වස්ත්‍ර ලබනසුලු වෙයි. වැටුප් ලබනසුලු වෙයි. පඩුරු ලබනසුලු වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, පණ්ඩිත වූ ව්‍යක්ත වූ දක්‍ෂ වූ ඒ අරක්කැමි සිය ස්වාමිහුගේ භොජන නිමිත්ත උගනී එහෙයිනි.

එවමෙව ඛො භික්ඛවෙ, ඉධෙකච්චො පණ්ඩිතො ව්‍යත්තො කුසලො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස කායෙ කායානුපස්සිනො විහරතො චිත්තං සමාධියති, උපක්කිලෙසා පහීයන්ති, සො තං නිමිත්තං උග්ගණ්හාති. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස ධම්මෙසු ධම්මානුපස්සිනො විහරතො චිත්තං සමාධියති, උපක්කිලෙසා පහීයන්ති, සො තං නිමිත්තං උග්ගණ්හාති. ස ඛො සො භික්ඛවෙ, පණ්ඩිතො ව්‍යත්තො කුසලො භික්ඛු ලාභී චෙව හොති දිට්ඨධම්මසුඛවිහාරානං, ලාභී හොති සතිසම්පජඤ්ඤස්ස. තං කිස්ස හෙතු: තථා හි සො භික්ඛවෙ, පණ්ඩිතො ව්‍යත්තො කුසලො භික්ඛු සකස්ස චිත්තස්ස නිමිත්තං උග්ගණ්හාතීති.

## 3. 1. 9

## ගිලානසුත්තං

1187. එකං සමයං භගවා වෙසාලියං විහරති බෙලුවගාමකෙ[1]. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: "එථ තුම්හෙ භික්ඛවෙ, සාමන්තා[2] වෙසාලියා යථාමිත්තං යථාසන්දිට්ඨං යථාසම්භත්තං වස්සං උපෙථ. ඉධෙවාහං බෙලුවගාමකෙ වස්සං උපගච්ඡාමී"ති. "එවං භන්තෙ"ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා සාමන්තා වෙසාලියා යථාමිත්තං යථාසන්දිට්ඨං යථාසම්භත්තං වස්සං උපගඤ්ඡුං. භගවා පන තත්ථෙව බෙලුවගාමකෙ[3] වස්සං උපගච්ඡි. අථ ඛො භගවතො වස්සූපගතස්ස ඛරො ආබාධො උප්පජ්ජි. බාළ්හා වෙදනා වත්තන්ති මාරණන්තිකා. තා[4] සුදං භගවා සතො සම්පජානො අධිවාසෙසි අවිහඤ්ඤමානො. අථ ඛො භගවතො එතදහොසි: න ඛො පන මෙතං පතිරූපං යො'හං අනාමන්තෙත්වා උපට්ඨාකෙ, අනපලොකෙත්වා භික්ඛුසඞ්ඝං පරිනිබ්බායෙය්‍යං[5]. යන්නූනාහං ඉමං ආබාධං විරියෙන පටිප්පණාමෙත්වා[6] ජීවිතසඞ්ඛාරං අධිට්ඨාය විහරෙය්‍යන්ති. අථ ඛො භගවා තං ආබාධං විරියෙන පටිප්පණාමෙත්වා ජීවිතසඞ්ඛාරං අධිට්ඨාය විහාසි. අථ ඛො භගවා ගිලානා වුට්ඨිතො[7] අචිරවුට්ඨිතො ගෙලඤ්ඤා විහාරපච්ඡායායං[8] පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

---

1. වෙළුවගාමකෙ - මජසං.
2. සමන්තා - මජසං, සයා.
3. භගවා පන බෙලුවගාමකෙ - සී 1, 2.
4. තත්‍ර සුදං - මජසං, සයා.
5. පරිනිබ්බාපෙය්‍යං - සී 1.
6. පටිපණාමෙත්වා - මජසං.
7. ගිලානවුට්ඨිතො - මජසං.
8. විහාරපච්ඡාඡායායං - සී 1, 2, සයා.

මහණෙනි, එසෙයින් ම මෙහි පණ්ඩිත වූ ව්‍යක්ත වූ දක්‍ෂ වූ ඇතැම් මහණෙක් කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කායලෝකයෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. කයෙහි කය අනුව දක්නාසුලු ව වෙසෙන ඔහුගේ සිත එකඟ වෙයි. කෙලෙස් ප්‍රහීණ වේ. හේ ඒ නිමිත්ත උගනී. වේදනාහි ... සිත්හි .. දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. දහම්හි දහම් අනු ව දක්නාසුලු ව වෙසෙන ඔහුගේ සිත එකඟ වෙයි. කෙලෙස් ප්‍රහීණ වේ. හේ ඒ නිමිත්ත උගනී. මහණෙනි, පණ්ඩිත වූ ව්‍යක්ත වූ දක්‍ෂ වූ ඒ මේ මහණ දිටුදැමියෙහි සුඛවිහරණ ලබනසුලු ද වෙයි. සිහිනුවණ ලබනසුලු ද වෙයි. ඒ කවර හෙයින යත්: මහණෙනි, පණ්ඩිත වූ ව්‍යක්ත වූ දක්‍ෂ වූ ඒ මහණ ිය සිතෙහි නිමිත්ත උගනී එහෙයිනි යි.

## 3. 1. 9

## ගිලාන සූත්‍රය

1187. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර සමීපයෙහි බෙළුවගම්හි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන් ඇමතූ සේක: "මහණෙනි, එවු. නෙපි මිතුරුකම් ඇති සේ දුටුපමණින් වූ මිතුරුකම් ඇති සේ දැඩිලෙස වූ මිතුරුකම් ඇති සේ විසල්පුර අවට වස් එළඹෙවු. මම මෙහි බෙලුවගම්හි ම වස් එළඹෙමි"යි. වහන්ස, එසේ යයි ඒ භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දී මිතුරුකම් ඇති සේ දුටුපමණින් වූ මිතුරුකම් ඇති සේ දැඩිලෙස වූ මිතුරුකම් ඇති සේ විසල්පුර අවට වස් එළඹුණාහ. භාග්‍යවතුන් වහන්සේ වනාහි එහි ම බෙලුවගම්හි වස් එළඹුණු සේක. එකල්හි වස් එළඹුණු භාග්‍යවතුන් වහන්සේට කෲර ආබාධයෙක් උපන. මරණය කරා පමුණුවන දැඩි වේදනාවෝ පවතිත්. භාග්‍යවතුන් වහන්සේ සිහි ඇති ව මනා දැනුම් ඇති ව නොපෙළෙමින් ඒ වේදනා ඉවසූ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතෙක් විය: "යම්බඳු මම උවැටන් කරන්නවුන් නො අමතා බික්සඟන නො දන්වා පිරිනිවෙම් නම් මට එය සුදුසු නො වෙයි. මම මේ රොගය වීර්‍ය්‍යයෙන් යටපත් කොට ජීවිතසංස්කාර (ජීවිතය පවතින සේ) අධිෂ්ඨාන කොට වෙසෙන්නෙම් නම් මැනැවැ"යි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ ආබාධය වීර්‍ය්‍යයෙන් යටපත් කොට ජීවිතසංස්කාර අධිෂ්ඨාන කොට වැඩවුසූ සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ගිලන්බවෙන් නැඟීසිටි සේක්. ගිලන්බවෙන් නැඟී සිටි නොබෝකල් ඇති සේක් වෙහෙර පසුපස සෙවණැල්ලෙහි පැනැ වූ අසුන්හි වැඩහුන් සේක.

අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:* "දිට්ඨං භන්තෙ, භගවතො ඛමනීයං, දිට්ඨං භන්තෙ, භගවතො යාපනීයං, අපි මෙ භන්තෙ, මධුරකජාතො විය කායො. දිසාපි මෙ න පක්ඛායන්ති. ධම්මාපි මං නප්පටිභන්ති, භගවතො ගෙලඤ්ඤෙන. අපි ච මෙ භන්තෙ, අහොසි: කාචිදෙව අස්සාසමත්තා[1] න තාව භගවා පරිනිබ්බායිස්සති. න තාව භගවා භික්ඛුසඞ්ඝං ආරබ්භ කිඤ්චිදෙව උදාහරතී"ති.

කිම්පනදානි ආනන්ද භික්ඛුසඞ්ඝො මයි පච්චාසිංසති: දෙසිතො ආනන්ද, මයා ධම්මො අනන්තරං අබාහිරං කරිත්වා, නත්ථානන්ද, තථාගතස්ස ධම්මෙසු ආචරියමුට්ඨි. යස්ස[2] නූන ආනන්ද, එවමස්ස අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමීති වා, මමුද්දෙසිකො භික්ඛුසඞ්ඝොති වා සො නූන ආනන්ද, භික්ඛුසඞ්ඝං ආරබ්භ කිඤ්චිදෙව උදාහරෙය්‍ය. තථාගතස්ස ඛො ආනන්ද, න එවං හොති අහං භික්ඛුසඞ්ඝං පරිහරිස්සාමීති වා මමුද්දෙසිකො භික්ඛුසඞ්ඝොති වා, සකිං ආනන්ද, තථාගතො භික්ඛුසඞ්ඝං ආරබ්භ කිඤ්චිදෙව උදාහරිස්සති: එතරහි ඛො පනානන්ද, ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො ආසීතිකො මෙ වයො වත්තති. සෙය්‍යථාපි ආනන්ද, ජජ්ජරසකටං[3] වෙළමිස්සකෙන[4] යාපෙති, එවමෙව ඛො ආනන්ද, වෙළමිස්සකෙන මඤ්ඤෙ තථාගතස්ස කායො යාපෙති.

යස්මිං ආනන්ද, සමයෙ තථාගතො සබ්බනිමිත්තානං අමනසිකාරා එකච්චානං වෙදනානං නිරොධා අනිමිත්තං චෙතොසමාධිං උපසම්පජ්ජ විහරති. ඵාසුතරං ආනන්ද, තස්මිං සමයෙ තථාගතස්ස හොති. තස්මාතිහානන්ද, අත්තදීපා විහරථ අත්තසරණා අනඤ්ඤසරණා, ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා. කථඤ්චානන්ද, භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො, ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො: ඉධානන්ද, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු —පෙ— චිත්තෙ —පෙ— ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, එවං ඛො ආනන්ද, භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො. යෙ හි කෙචි ආනන්ද, එතරහි වා මමච්චයෙ වා අත්තදීපා විහරිස්සන්ති අත්තසරණා අනඤ්ඤසරණා, ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා තමතග්ගෙ මෙ තෙ ආනන්ද, භික්ඛු භවිස්සන්ති යෙ කෙචි සික්ඛාකාමාති.

---

1. අප්පාදමත්තා - සී 1, 2.
2. යන්නූන - සතා.
3. ජරසකටං - ,
4. වෙසමිස්සකෙන - සී 1, 2. වෙඨමිස්සකෙන - මජසං, වෙධමිස්සකෙන - PTS.

* "දිට්ඨො මෙ භන්තෙ භගවතො ඵාසු" ඉති පාඨො මජසං පොත්ථකෙ එත්ථ දිස්සතෙ.

එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: "වහන්ස, භාග්‍යවතුන් වහන්සේට ඉවසිය හැකි ය යි දක්නා ලදී. වහන්ස, භාග්‍යවතුන් වහන්සේට යැපිය හැකි ය යි දක්නා ලදී. වහන්ස, එතෙකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේගේ ගිලන්බව හේතු කොට ගෙන මාගේ සිරුර ද තද වූවාක් මෙනි. දිශාවෝ ද මට පැහැදිලි නො වෙත්. දහම් ද මට නො වැටහේ. වහන්ස, තව ද භාග්‍යවතුන් වහන්සේ දැන් ම නො පිරිනිවෙන සේක. භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඟන ඇරබ තව ම කිසිවක් ගෙනහැර නොපාන (අන්තිම අවවාදය නොකරන) සේකැ"යි කිසියම් අස්වැසිලි මාත්‍රයෙක් වි ය යි.

ආනන්ද, භික්ෂුසඟන මා කෙරෙහි කුමක් අපේක්ෂා කෙරේ ද? ආනන්ද, මා විසින් අනන්තර–අබාහිර (–නො සඟවා)නො කොට දහම් දෙසන ලදී. ආනන්ද, තථාගත දහම්හි ආචාර්ය මුෂ්ටි නැත. ආනන්ද, "මම භික්ෂුසඟන පරිහරණය කරන්නෙමි යි හෝ භික්ෂුසඟන මා උදෙසියයුතු කොට ඇත්තේ (වේ ව)" යි හෝ යමකුට ඒකාන්ත යෙන් මෙබඳු අදහසෙක් වන්නේ ද ආනන්ද, හේ ඒකාන්තයෙන් භික්ෂුසඟන ඇරබ කිසිවක් ගෙන හැර පාමන් (කිසියම් අවවාදයක් දෙන්නේ) නම් ආනන්ද, "මම භික්ෂුසඟන පරිහරණය කරන්නෙමි යි හෝ භික්ෂුසඟන මා උදෙසියයුතු කොට ඇත්තේ (වේව)" යි හෝ තථාගතයන් හට වූකලී මෙබඳු සිතෙක් නො වේ. ආනන්ද, ඒ තථාගත භික්ෂුසඟන ඇරබ කිසිවක් ගෙනහැර පාතේ ද ආනන්ද, දැන් වූකලි දිරූයෙම් වෘද්ධයෙම් මහලු වූයෙම් කල්ගත වූයෙම් පිළිවෙළින් මහලුවියට පැමිණියෙම් මාගේ අසූවැනි විය පවතී. ආනන්ද, දිරූ ගැලක් යම්සේ හුණ මුසු පිළිසකරින් යැපේ ද ආනන්ද, එපරිද්දෙන් තථාගතයන්ගේ කය හුණ මුසු පිළිසකරින් මෙන් යැපේ.

ආනන්ද, යම්කලෙක තථාගත තෙමේ සියලු නිමිති මෙනෙහි නො කිරීමෙන් ඇතැම් වේදනාවන්ගේ නිරෝධයෙන් නිමිති රහිත වූ චිත්ත-සමාධියට පැමිණ වෙසේ ද, ආනන්ද, එසමයෙහි තථාගතයන්ට ඉතා පහසු වෙයි. ආනන්ද, එහෙයින් මෙහි ලා තමා පිහිට කොට තමා සරණ කොට අනුන් පිහිට නො කොට දහම් පිහිට කොට දහම් සරණ කොට අනෙකක් පිහිට නො කොට වෙසෙවු. ආනන්ද, කෙසේ නම් මහණ තමා පිහිට කොට තමා සරණ කොට අනුන් පිහිට නො කොට දහම් පිහිට කොට දහම් සරණ කොට අනෙකක් පිහිට නො කොට වෙසේ ද යත්: ආනන්ද, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙහි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. වේදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ආනන්ද, මෙසේ මහණ තමා පිහිට කොට තමා සරණ කොට අනුන් පිහිට නො කොට දහම් පිහිට කොට දහම් සරණ කොට අනෙකක් පිහිට නො කොට වෙසේ. ආනන්ද, යම්කිසි භික්ෂු කෙනෙක් දැන් හෝ මාගේ ඇවෑමෙහි හෝ තමා පිහිට කොට තමා සරණ කොට අනුන් පිහිට නො කොට දහම් පිහිට කොට දහම් සරණ කොට අනෙකක් පිහිට නො කොට වෙසෙත්-නාහු ද, යම්කිසි කෙනෙක් ශික්ෂාකාමී වන්නාහු ද ආනන්ද, ඒ මේ භික්ෂුහු අග්‍රතම වෙති යි.

## 3. 1. 10

### භික්ඛුනුපස්සයසුත්තං

1188. අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙනඤ්ඤතරො භික්ඛුනුපස්සයො[1] තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො සම්බහුලා භික්ඛුනියො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තා භික්ඛුනියො ආයස්මන්තං ආනන්දං එතදවොචුං: "ඉධ භන්තෙ, ආනන්ද, සම්බහුලා භික්ඛුනියො චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තා[2] විහරන්තියො උළාරං පුබ්බෙනාපරං විසෙසං සඤ්ජානන්තී"ති. "එවමෙතං භගිනියො, එවමෙතං භගිනියො, යො හි කොචි භගිනියො, භික්ඛු වා භික්ඛුනී වා චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තො[3] විහරති, තස්සෙතං පාටිකඞ්ඛං" "උළාරං පුබ්බෙනාපරං විසෙසං සඤ්ජානිස්සතී"ති. අථ ඛො ආයස්මා ආනන්දො තා භික්ඛුනියො ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

අථ ඛො ආයස්මා ආනන්දො සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: ඉධාහං භන්තෙ, පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙනඤ්ඤතරො භික්ඛුනුපස්සයො තෙනුපසඞ්කමිං. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදිං. අථ ඛො භන්තෙ, සම්බහුලා භික්ඛුනියො යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො භන්තෙ, තා භික්ඛුනියො මං එතදවොචුං: "ඉධ භන්තෙ ආනන්ද, සම්බහුලා භික්ඛුනියො චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තා විහරන්තියො උළාරං පුබ්බෙනාපරං විසෙසං සඤ්ජානන්තී"ති. එවං වුත්තාහං භන්තෙ, තා භික්ඛුනියො එතදවොචං: "එවමෙතං භගිනියො, එවමෙතං භගිනියො, යො හි කොචි භගිනියො, භික්ඛු වා භික්ඛුනී වා චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තො විහරති, තස්සෙතං පාටිකඞ්ඛං: "උළාරං පුබ්බෙනාපරං විසෙසං සඤ්ජානිස්සතී"ති.

1. භික්ඛුනීපස්සය – සී I.
2. සුපතිට්ඨිතචිත්තා – මජසං.
3. සුපට්ඨිතචිත්තා – සී I.

# 3. 1. 10

## භික්ඛුනූපස්සය සූත්‍රය

1188. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පෙරවරු හැඳ පෙර ව පාසිවුරු ගෙන එක්තරා මෙහෙණ අසපුවක් වෙත එළඹියහ. එළඹ පැනවූ අසුන්හි වැඩ හුන්හ. එකල්හි බොහෝ මෙහෙණහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ඒ මෙහෙණහු ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය කීහ: "වහන්ස, ආනන්දයෙනි, මෙහි බොහෝ මෙහෙණහු සිවුසිවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇති ව වෙසෙන්නාහු පෙරට වඩා උදර විශෙෂයක් පසු ව හඳුනති'' යි. නැගණියෙනි, එය එසේ ය. නැගණියෙනි, එය එසේ ය. නැගණියනි, යම්කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ සිවුසිවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇති ව වෙසේ නම් ඔහු විසින් පෙරට වඩා උදර විශෙෂයක් පසු ව හඳුනන්නේ ය යන මෙය කැමති වියයුතු යි, ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ දහැමි කථාවෙන් ඒ මෙහෙණුන් කරුණු දක්වා සමාදන් කරවා තෙද ගන්වා සතුටු කරවා හුනස්නෙන් නැඟී ගියහ.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ සැවැත් නුවර පිඩු පිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් වැළකුණාහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්-සේට මෙය සැලකළහ: වහන්ස, මෙහි මම පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන එක්තරා මෙහෙණ අසපුවක් කරා එළඹියෙමි. එළඹ පැනවූ අස්නෙහි හුන්නෙමි. වහන්ස, එකල්හි බොහෝ මෙහෙණහු මා වෙත එළඹියහ. එළඹ මා වැඳ එකත්පස්ව හුන්හ. වහන්ස, එකත්-පස් ව හුන් ඒ මෙහෙණහු මට මෙය කීහ: "වහන්ස, ආනන්දයෙනි, මෙහි බොහෝ මෙහෙණහු සිවුසිවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇති ව වෙසෙන්නාහු පෙරට වඩා උදර විශේෂයක් පසු ව හඳුනති'' යි. වහන්ස, එසේ කියන ලද මම ඒ මෙහෙණනට මෙය කීමි: "නැගණියනි, එය එසේය. නැගණියනි, එය එසේය. නැගණියනි, යම්කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ සිවුසිවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇති ව වෙසේ නම් ඔහු විසින් පෙරට වඩා උදර වූ විශේෂයක් පසු ව හඳුනන්නේ ය යන මෙය කැමති විය යුතු''යි.

එවමෙතං ආනන්ද, එවමෙතං ආනන්ද, යො හි කොචි ආනන්ද, භික්ඛු වා භික්ඛුනී වා චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තො විහරති, තස්සෙතං පාටිකඞ්ඛං: "උළාරං පුබ්බෙනාපරං විසෙසං සඤ්ජානිස්සතී"ති. කතමෙසු චතූසු: ඉධානන්ද, භික්ඛු කායෙ කායානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස කායෙ කායානුපස්සිනො විහරතො කායාරම්මණො වා උප්පජ්ජති, කායස්මිං පරිළාහො, චෙතසො වා ලීනත්තං, බහිද්ධා වා චිත්තං වික්ඛිපති. තෙනානන්ද, භික්ඛුනා කිස්මිඤ්චිදෙව පසාදනීයෙ නිමිත්තෙ චිත්තං පණිදහිතබ්බං. තස්ස කිස්මිඤ්චිදෙව පසාදනීයෙ නිමිත්තෙ චිත්තං පණිදහතො පාමුජ්ජං ජායති. පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදියති. සුඛිනො චිත්තං සමාධියති. සො ඉති පටිසඤ්චික්ඛති: යස්ස ඛො'හං අත්ථාය චිත්තං පණිදහිං සො මෙ අත්ථො අභිනිප්ඵන්නො, හන්දදානි පටිසංහරාමීති. සො පටිසංහරති චෙව න ච විතක්කෙති. න ච විචාරෙති. "අවිතක්කොම්හි අවිචාරො අජ්ඣත්තං සතිමා සුඛිතස්මී"ති පජානාති.

පුනචපරං ආනන්ද, භික්ඛු වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස වෙදනාසු වෙදනානුපස්සිනො විහරතො වෙදනාරම්මණො වා උප්පජ්ජති කායස්මිං පරිළාහො -පෙ- පජානාති.

පුනචපරං ආනන්ද, භික්ඛු චිත්තෙ චිත්තානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස චිත්තෙ චිත්තානුපස්සිනො විහරතො චිත්තාරම්මණො වා උප්පජ්ජති කායස්මිං පරිළාහො -පෙ- පජානාති.

පුනචපරං ආනන්ද, භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස ධම්මෙසු ධම්මානුපස්සිනො විහරතො ධම්මාරම්මණො වා උප්පජ්ජති කායස්මිං පරිළාහො, චෙතසො වා ලීනත්තං. බහිද්ධා වා චිත්තං වික්ඛිපති. තෙනානන්ද, භික්ඛුනා කිස්මිඤ්චිදෙව පසාදනීයෙ නිමිත්තෙ චිත්තං පණිදහිතබ්බං. තස්ස කිස්මිඤ්චිදෙව පසාදනීයෙ නිමිත්තෙ චිත්තං පණිදහතො පාමුජ්ජං ජායති, පමුදිතස්ස පීති ජායති, පීතිමනස්ස කායො පස්සම්භති, පස්සද්ධකායො සුඛං වෙදෙති, සුඛිනො චිත්තං සමාධියති. සො ඉති පටිසඤ්චික්ඛති: "යස්ස ඛො'හං අත්ථාය චිත්තං පණිදහිං, සො මෙ අත්ථො අභිනිප්ඵන්නො, "හන්දදානි පටිසංහරාමී"ති. සො පටිසංහරති චෙව න ච විතක්කෙති, න ච විචාරෙති, අවිතක්කොම්හි අවිචාරො අජ්ඣත්තං සතිමා සුඛිතස්මී"ති පජානාති. එවං ඛො ආනන්ද, පණිධාය භාවනා හොති.

ආනන්ද, එය එසේ ය. ආනන්ද, එය එසේ ය. ආනන්ද, යම්කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ සිවුසිවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇති ව වෙසේ නම් ඔහු විසින් පෙරට වඩා උදර වූ විශේෂයක් පසු ව හඳුනන්නේ ය යන මෙය කැමති වියයුතු. කවර සතරෙක ද යත්: ආනන්ද, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙයි. කයෙහි කය අනුව දක්නාසුලු ව වෙසෙන ඔහුට කය අරමුණු කොට ඇති කයෙහි දැවිල්ලෙක් හෝ උපදී. සිතේ සැහවුණු බවෙක් හෝ වේ. පිටත හෝ සිත විසිරෙයි. ආනන්ද, ඒ මහණුහු විසින් කිසියම් පැහැදියයුතු නිමිත්තෙක සිත පිහිටුවියයුතු යි. කිසියම් පැහැදියයුතු නිමිත්තෙක සිත පිහිටුවන ඔහුට ප්‍රමුදිතභාවය උපදී. හටගත් ප්‍රමෝද ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීතසිත් ඇත්තහුගේ කය සැහැල්ලු වේ. සැහැල්ලු කය ඇත්තේ සුව විඳී යි. සුව ඇත්තහුගේ සිත එකඟ වේ. හේ මෙසේ නුවණින් සලකා බලයි: ''මම යමක් පිණිස සිත පිහිටුවෙම් නම් ඒ අරුත මට නිපනි. ඒකාන්තයෙන් දැන් (පැහැදියයුතු නිමිත්-තෙන් සිත) ආපසු හැර ගනිමි'' යි. හෙතෙමේ ආපසු හැර ගැනීමත් කෙරෙයි. නො ද විතර්ක කෙරෙයි. නො ද විචාර කෙරෙයි. විතර්ක නැත්තෙම් විචාර නැත්තෙම් ඇතුළත සිහි ඇත්තෙම් හටගත් සුව ඇත්තෙම් වෙමි යි දැනගනී.

ආනන්ද, නැවත අනෙකක් ද කියමි: මහණ වේදනාවන්හි වේදනා අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව වේදනාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. වේදනාවන්හි වේදනා අනු ව දක්නාසුලු ව වෙසෙන ඔහුට වේදනා අරමුණු කොට ඇති කයෙහි දැවිල්ලෙක් හෝ උපදී ... දැනගනී.

ආනන්ද, නැවත අනෙකක් ද කියමි: මහණ සිත්හි සිත් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව සිත්ලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසෙයි. සිත්හි සිත් අනුව දක්නාසුලු ව වෙසෙන ඔහුට සිත් අරමුණු කොට ඇති කයෙහි දැවිල්ලෙක් හෝ උපදී ... දැනගනී.

ආනන්ද, නැවත අනෙකක් ද කියමි: මහණ දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. දහම්හි දහම් අනු ව දක්නාසුලු ව වෙසෙන ඔහුට දහම් අරමුණු කොට ඇති කයෙහි දැවිල්ලෙක් හෝ උපදී. සිතේ සැහවුණු බවෙක් හෝ වේ. පිටත හෝ සිත විසිරේ. ආනන්ද, ඒ මහණහු විසින් පැහැදිය යුතු කිසියම් නිමිත්තෙක සිත පිහිටුවියයුතු. පැහැදියයුතු කිසියම් නිමිත්තෙක සිත පිහිටුවන ඔහුට ප්‍රමුදිත භාවය උපදී. හටගත් ප්‍රමෝද ඇත්තහුට ප්‍රීතිය උපදී. ප්‍රීතසිත් ඇත්තහුගේ කය සැහැල්ලු වේ. සැහැල්ලු කය ඇත්තේ සුව විඳී. සුව ඇත්තහුගේ සිත එකඟ වේ. හේ මම යමක් පිණිස සිත පිහිටුවෙම් නම් ඒ අරුත මට නිපන. ඒකාන්තයෙන් දැන් ආපසු හැර ගනිමි'' යි මෙසේ නුවණින් සලකා බලයි. හේ ආපසු හැර ගැනීමත් කෙරෙයි. විතර්ක නො ද කෙරෙයි. විචාර නො ද කෙරෙයි. විතර්ක නැත්තෙම් විචාර නැත්තෙම් ඇතුළත සිහි ඇත්තෙම් හටගත් සුව ඇත්තෙම් වෙමි යි දැනගනී. ආනන්ද, මෙසේ (සිත)පිහිටුවා වැඩීම වේ.

කථඤ්චානන්ද, අප්පණිධාය භාවනා හොති: බහිද්ධා ආනන්ද, භික්ඛු චිත්තං අප්පණිධාය "අප්පණිහිතං මෙ බහිද්ධා චිත්තන්ති" පජානාති. අථ පච්ඡා පුරෙ අසඞ්ඛිත්තං විමුත්තං අප්පණිහිතන්ති පජානාති. අථ ච පන කායෙ කායානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා සුඛිතස්මීති පජානාති.

බහිද්ධානන්ද, භික්ඛු චිත්තං අප්පණිධාය "අප්පණිහිතං මෙ බහිද්ධා චිත්තන්ති" පජානාති. අථ පච්ඡා පුරෙ අසඞ්ඛිත්තං විමුත්තං අප්පණිහිතන්ති පජානාති. අථ ච පන වෙදනාසු වෙදනානුපස්සී විහරාමි, ආතාපී සම්පජානො සතිමා සුඛිතස්මීති පජානාති.

බහිද්ධානන්ද, භික්ඛු චිත්තං අප්පණිධාය "අප්පණිහිතං මෙ බහිද්ධා චිත්තන්ති" පජානාති. අථ පච්ඡා පුරෙ අසඞ්ඛිත්තං විමුත්තං අප්පණිහිතන්ති පජානාති. අථ ච පන චිත්තෙ චිත්තානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා සුඛිතස්මීති[1] පජානාති.

බහිද්ධානන්ද, භික්ඛු චිත්තං අප්පණිධාය "අප්පණිහිතං මෙ බහිද්ධා චිත්ත"න්ති පජානාති. අථ පච්ඡා පුරෙ අසඞ්ඛිත්තං විමුත්තං අප්පණිහිතන්ති පජානාති අථ ච පන ධම්මෙසු ධම්මානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා සුඛිතස්මීති පජානාති. එවං ඛො ආනන්ද, අප්පණිධාය භාවනා හොති.

ඉති ඛො ආනන්ද, දෙසිතා මයා පණිධාය භාවනා, දෙසිතා අප්පණිධාය භාවනා. යං ආනන්ද, සත්ථාරා කරණීයං සාවකානං හිතෙසිනා අනුකම්පකෙන අනුකම්පං උපාදාය, කතං වො තං මයා: එතානි ආනන්ද, රුක්ඛමූලානි, එතානි සුඤ්ඤාගාරානි, ඣායථානන්ද, මා පමාදත්ථ, මා පච්ඡා විප්පටිසාරිනො අහුවත්ථ, අයං වො අම්හාකං අනුසාසනීති.

අම්බපාලිවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

අම්බපාලි සතො භික්ඛු සාලා කුසලරාසි ච
සකුණග්ඝි මක්කටො සූදෙ ගිලානො භික්ඛුනූපස්සයොති.

1. සුඛමස්මීති - මජසං, සහං.

ආනන්ද, (සිත) නොපිහිටුවා වැඩීම කෙසේ වේ ද යත්: ආනන්ද, මහණ පිටත සිත නොපිහිටුවා මාගේ සිත පිටත නො පිහිටුවන ලද යි දැනගනී. නැවත පසුව පෙර නො හැකුළුණේ මිදුණේ නො පිහිටුවන ලද්දේ ය යි දැනගනී. එසේ වතුදු කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව වෙසෙමි. හටගත් සුව ඇත්තෙම් වෙමි යි දැනගනී.

ආනන්ද මහණ පිටත සිත නො පිහිටුවා මාගේ සිත පිටත නො පිහිටුවන ලද යි දැනගනී. නැවත පසුව පෙර නො හැකුළුණේ මිදුණේ නො පිහිටුවන ලද්දේ ය යි දැනගනී. එසේ වතු දු වේදනාවන්හි වේදනා අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව වෙසෙමි, හටගත් සුව ඇත්තෙම් වෙමි යි දැනගනී.

ආනන්ද, මහණ පිටත සිත නො පිහිටුවා මාගේ සිත පිටත නො පිහිටුවන ලද යි දැනගනී. යළි පසු ව පෙර නො හැකුළුණේ මිදුණේ නො පිහිටුවන ලද්දේ ය යි දැනගනී. එසේ වතුදු සිත්හි සිත් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව වෙසෙමි, හටගත් සුව ඇත්තෙම් වෙමි යි දැනගනී.

ආනන්ද, මහණ පිටත සිත නො පිහිටුවා මාගේ සිත පිටත නො පිහිටුවන ලදයි දැනගනී. යළි පසු ව පෙර නො හැකුළුණේ මිදුණේ නො පිහිටුවන ලද්දේ ය යි දැනගනී. එසේ වතුදු දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතියෙම් මනාදැනුම් ඇතියෙම් සිහි ඇතියෙම් වෙසෙමි, හටගත් සුව ඇත්තෙම් වෙමි යි දැනගනී. ආනන්ද, මෙසේ (සිත) නො පිහිටුවා වැඩීම වේ.

ආනන්ද, මෙසේ මා විසින් සිත පිහිටුවා වැඩීම දේශනා කරන ලදී. සිත නො පිහිටුවා වැඩීම දේශනා කරන ලදී. ආනන්ද, සච්වන්ට වැඩ කැමති අනුකම්පා කරන ශාස්තෘවරයකු විසින් අනුකම්පාව නිසා යමක් කටයුතු නම් මා විසින් එය තොපට කරන ලදී. ආනන්ද, තෙල රුක්මුල් ඇත. තෙල ශූන්‍යාගාර ඇත. ආනන්ද, ධ්‍යාන කරවු. නහමක් පමාවවු. පසුව නහමක් විපිළිසර ඇත්තෝ වවු. මේ තොපට අපගේ අනුශාසනා යි.

## පළමුවැනි අම්බපාලිවර්ග යි.

**එහි සූත්‍ර නාමාවලිය:**

අම්බපාලි, සතො, භික්ඛු, සාලා, කුසලරාසි, සකුණග්ඝි, මක්කට, සූද, ගිලාන, භික්ඛුනුපස්සය යි දශසූත්‍රාන්තකෙනෙකි යි.

# 2. නාලන්දවග්ගො

## 3. 2. 1

## මහාපුරිසසුත්තං

1189. සාවත්ථියං –

අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. –පෙ– එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: “මහාපුරිසො මහාපුරිසොති භන්තෙ, වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ, මහාපුරිසො හොතී”ති: විමුත්තචිත්තත්තා ඛො’හං සාරිපුත්ත මහාපුරිසොති වදාමි. අවිමුත්තචිත්තත්තා නො මහාපුරිසොති වදාමි, කථඤ්ච සාරිපුත්ත, විමුත්තචිත්තො හොති: ඉධ සාරිපුත්ත, භික්ඛු කායෙ කායානුපස්සී විහරති. ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, තස්ස කායෙ කායානුපස්සිනො විහරතො චිත්තං විරජ්ජති; විමුච්චති, අනුපාදාය ආසවෙහි. වෙදනාසු –පෙ– චිත්තෙ –පෙ– ධම්මෙසු ධම්මානුපස්සී විහරති, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස ධම්මෙසු ධම්මානුපස්සිනො විහරතො චිත්තං විරජ්ජති, විමුච්චති, අනුපාදාය ආසවෙහි. එවං ඛො සාරිපුත්ත, විමුත්තචිත්තො හොති, විමුත්තචිත්තත්තා ඛො’හං සාරිපුත්ත, මහාපුරිසොති වදාමි. අවිමුත්තචිත්තත්තා නො මහාපුරිසොති වදාමීති.

## 3. 2. 2

## නාලන්දසුත්තං

1190. එකං සමයං භගවා නාලන්දායං විහරති පාවාරිකම්බවනෙ. අථ ඛො ආයස්මා සාරිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. –පෙ– එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො භගවන්තං එතදවොච: “එවං පසන්නො’හං භන්තෙ, භගවති ‘න චාහු න ච භවිස්සති, න චෙතරහි විජ්ජති, අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යො’භිඤ්ඤතරො යදිදං සම්බොධියා’”ති.

# 2. නාලන්දාවර්ගය

## 3. 2. 1

## මහාපුරිස සූත්‍රය

1189. සැවැත්නුවර—

එකල්හි ආයුෂ්මත් **සැරියුත්** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ... එකත් පසෙක හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: “වහන්ස, මහාපුරිස මහාපුරිස” යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් මහාපුරිස වේ ද?” යි. සාරිපුත්ත, මිදුණු සිත් ඇති බැවින් මහාපුරිස ය යි මම කියමි. නො මිදුණු සිත් ඇති බැවින් මහාපුරිස නො වේ ය යි කියමි. සාරිපුත්ත කෙසේ නම් මිදුණු සිත් ඇත්තේ වේ ද යත්: සාරිපුත්ත, මෙසස්නෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙවහි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙයි. කයෙහි කය අනු ව දක්නාසුලු ව වෙසෙන ඔහුගේ සිත නො ඇලේ. උපාදාන රහිත ව කෙලෙසුන්ගෙන් මිදේ. විඳුම්හි... සිත්හි... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙවහි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. දහම්හි දහම් අනු ව දක්නාසුලු ව වෙසෙන ඔහුගේ සිත නො ඇලේ. උපාදාන රහිත ව කෙලෙසුන්ගෙන් මිදේ. සාරිපුත්ත, මෙසේ මිදුණු සිත් ඇත්තේ වෙයි. සාරිපුත්ත, මිදුණුසිත් ඇති බැවින් මහාපුරිස ය යි මම කියමි. නොමිදුණු සිත් ඇති බැවින් මහාපුරිස නො වේ ය යි කියමි යි.

## 3. 2. 2

## නාලන්ද සූත්‍රය

1190. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **නාලන්දානුවර සම්පයෙහි පාවාරික අඹවෙනෙහි** වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් **සැරියුත් තෙරණුවෝ** භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ.. එකත්පස් ව හුන් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: “වහන්ස, යම් මේ සව්නේ නුවණෙහි හෝ රහත්මග නුවණෙහි ලා භාග්‍යවතුන් වහන්සේට වඩා උත්තරීතර නුවණ ඇති අන් මහණෙක් හෝ බමුණෙක් හෝ නො ද වී ය. නො ද වන්නේ ය. දැනුදු නැත්තේ ය”යි මෙසේ මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදිණිමි” යි.

උළාරා ත්‍යායං[1] සාරිපුත්ත, ආසභි වාචා භාසිතා, එකංසො ගහිතො, සීහනාදො නදිතො, එවං පසන්නො'හං භන්තෙ, භගවති: “න චාහු න ච භවිස්සති න චෙතරහි විජ්ජති අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යොභිඤ්ඤතරො යදිදං සම්බොධිය”න්ති. කින්නු තෙ සාරිපුත්ත, යෙ තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා සබ්බෙ තෙ භගවන්තො චෙතසා චෙතො පරිච්ච විදිතා. එවංසීලා තෙ භගවන්තො අහෙසුං ඉති වා, එවංධම්මා තෙ භගවන්තො අහෙසුං ඉති වා, එවංපඤ්ඤා තෙ භගවන්තො අහෙසුං ඉති වා, එවංවිහාරිනො තෙ භගවන්තො අහෙසුං ඉති වා එවංවිමුත්තා තෙ භගවන්තො අහෙසුං ඉති වාති? නොහෙතං භන්තෙ,

කිම්පන තෙ සාරිපුත්ත, යෙ තෙ භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, සබ්බෙ තෙ භගවන්තො චෙතසා චෙතො පරිච්ච විදිතා: “එවංසීලා තෙ භගවන්තො භවිස්සන්ති ඉති වා, එවංධම්මා තෙ භගවන්තො භවිස්සන්ති ඉති වා, එවංපඤ්ඤා තෙ භගවන්තො භවිස්සන්ති ඉති වා, එවංවිහාරිනො තෙ භගවන්තො, භවිස්සන්ති ඉති වා, එවංවිමුත්තා තෙ භගවන්තො භවිස්සන්ති ඉති වාති? නො හෙතං භන්තෙ,

කිං පන තෙ[2] සාරිපුත්ත, එතරහි අරහං සම්මාසම්බුද්ධො චෙතසා චෙතො පරිච්ච විදිතො: “එවංසීලො භගවා ඉති වා, එවංධම්මො භගවා ඉති වා, එවංපඤ්ඤො භගවා ඉති වා, එවංවිහාරී භගවා ඉති වා, එවංවිමුත්තො භගවා ඉතිපපවා”ති? නො හෙතං භන්තෙ. එත්ථ ච තෙ සාරිපුත්ත, අතීතානාගතපච්චුප්පන්නෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු චෙතොපරියඤාණං[3] නත්ථි. අථ කිඤ්චරහි තයා[4] සාරිපුත්ත, උළාරා ආසභී වාචා භාසිතා. එකංසො ගහිතො, සීහනාදො නදිතො: “එවං පසන්නාහං භන්තෙ, භගවති නචාහු නච භවිස්සති න චෙතරහි විජ්ජති අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා භගවතා භිය්‍යොභිඤ්ඤතරො යදිදං සම්බොධිය”න්ති.

---

1. උළාරා ඛො ත්‍යායං - මජසං, සහා.
2. ත්‍යාහං - මජසං, සහා.
3. චෙතොපරියායඤාණං - සී 1, 2. සහා.
4. ත්‍යායං - මජසං, සහා,

සාරිපුත්ත, සච්තෝ නුවණෙහි හෝ රහත්මඟ නුවණෙහි ලා භාග්‍යවතුන් වහන්සේට වඩා උත්තරිතර ඥාණ ඇති අන් මහණෙක් හෝ බමුණෙක් හෝ නො ද වී ය, නො ද වන්නේ ය, දැනුදු නැත්තේ ය යි මෙසේ මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදිණිමි'' යි යන මේ ශ්‍රේෂ්ඨය අකම්පය වචනයෙක් මෙහි ලා කියන ලදී. ඒකාන්තයෙන් ගන්නා ලද සිංහනාදයෙක් පවත්වන ලදී. සාරිපුත්ත, කිම? ඉකුත්කල යම ඒ අර්හත් සම්මාසම්බුද්ධවරයෝ පහළ වූ සේක් නම් ඒ සියලු සම්බුද්ධවරයෝ ''තොප විසින් ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු සිල් ඇත්තෝ වූ සේකැයි හෝ ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු දහම් ඇත්තෝ වූ සේකැ යි හෝ ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු නුවණ ඇත්තෝ වූ සේකැ යි හෝ ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු විහරණ ඇත්තෝ වූ සේකැ යි හෝ ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු විමුක්ති ඇත්තෝ වූ සේකැ'' යි හෝ සිතින් සිත පිරිසිඳ දන්නා ලද්දෝ දැ? යි වහන්ස මෙය නැත් ම ය.

සාරිපුත්ත, කිමෙක් ද? මතුසල යම් ඒ අර්හත් සම්මාසම්බුද්ධවරයෝ පහළ වන සේක් නම් ඒ සියලු සම්බුද්ධවරයෝ තොප විසින් ''ඒ සියලු භාග්‍යවතුන් වහන්සේ ලා මෙබඳු සිල් ඇත්තෝ වන්නාහ යි හෝ ඒ සියලු භාග්‍යවතුන් වහන්සේ ලා මෙබඳු දහම් ඇත්තෝ වන්නාහ යි හෝ ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු නුවණ ඇත්තෝ වන්නාහ යි හෝ ඒ සියලු භාග්‍යවතුන් වහන්සේ ලා මෙබඳු විහරණ ඇත්තෝ වන්නාහ යි හෝ ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු විමුක්ති ඇත්තෝ වන්නාහ'' යි හෝ සිතින් සිත පිරිසිඳ දන්නා ලද්දහු ද? යි වහන්ස, මෙය නැත් ම ය.

සාරිපුත්ත, කිමෙක් ද? තොප විසින් දැන් අර්හත් සම්මාසම්බුද්ධරජ ''භාග්‍යවතුන් වහන්සේ මෙබඳු සිල් ඇති සේකැ යි හෝ භාග්‍යවතුන් වහන්සේ මෙබඳු දහම් ඇති සේකැ යි හෝ භාග්‍යවතුන් වහන්සේ මෙබඳු ප්‍රඥා ඇති සේකැ යි හෝ භාග්‍යවතුන් වහන්සේ මෙබඳු විහරණ ඇති සේකැ යි හෝ භාග්‍යවතුන් වහන්සේ මෙබඳු විමුක්ති ඇති සේකැ යි හෝ සිතින් සිත පිරිසිඳ දන්නා ලද්දහු ද?යි. වහන්ස, මෙය නැත් ම ය. සාරිපුත්ත, මෙහි ලා තොපට අතීතානාගතපච්චුප්පන්න අර්හත් සම්මාසම්බුද්ධවරයන් කෙරෙහි චේතොපරියඥාණයෙක් (=සිතින් සිත පිරිසිඳ දැනීමේ නුවණෙක්) නැත. එකල්හි කුමක් හෙයින් තොප විසින් ''වහන්ස, යම් මේ සච්තෝ නුවණෙහි හෝ රහත්මගනුවණෙහි ලා භාග්‍යවතුන් වහන්සේට වඩා උත්තරීතර නුවණ ඇති අන් මහණෙක් හෝ බමුණෙක් නො ද වී ය. නො ද වන්නේ ය. දැනුදු නැතැ යි මෙසේ මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදිණිමි'' යි ශ්‍රේෂ්ඨ අකම්පය වචනයෙක් කියන ලද ද: ඒකාන්තයෙන් ගන්නා ලද සිංහනාදයෙක් පවත්වන ලද ද? යි.

T 19

න ඛො මෙ[1] භන්තෙ, අතීතානාගතපච්චුප්පන්නෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු චෙතොපරියඤාණං අත්ථි. අපි ච ධම්මන්වයො විදිතො. සෙය්‍යථාපි භන්තෙ, රඤ්ඤො පච්චන්තිමං නගරං දළ්හුද්දාපං[2] දළ්හපාකාරතොරණං එකද්වාරං, තත්‍රස්ස දොවාරිකො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී අඤ්ඤාතානං නිවාරෙතා ඤාතානං පවෙසෙතා, සො තස්ස නගරස්ස සමන්තා අනුපරියායපථං අනුක්කමමානො න පස්සෙය්‍ය පාකාරසන්ධිං වා පාකාරවිවරං වා අන්තමසො බිළාලනික්ඛමනමත්තම්පි, තස්ස එවමස්ස, යෙ කෙචි ඔළාරිකා පාණා ඉමං නගරං පවිසන්ති වා නික්ඛමන්ති වා සබ්බෙ තෙ ඉමිනාව ද්වාරෙන පවිසන්ති වා නික්ඛමන්ති වාති.

එවමෙව ඛො මෙ[3] භන්තෙ, ධම්මන්වයො විදිතො: ''යෙපි තෙ භන්තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා. සබ්බෙ තෙ භගවන්තො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තා[4] සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣිංසු. යෙපි තෙ භන්තෙ. භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා සබ්බෙ තෙ භගවන්තො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තා[4] සත්ත-බොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣිස්සන්ති. භගවාපි භන්තෙ, එතරහි අරහං සම්මා සම්බුද්ධො පඤ්චනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තො සත්තබොජ්ඣඞ්ගෙ යථාභූතං භාවෙත්වා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො''ති.

සාධු සාධු සාරිපුත්ත, තස්මාතිහ ත්වං සාරිපුත්ත, ඉමං ධම්මපරියායං අභික්ඛණං භාසෙය්‍යාසි[5], භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං. යෙසම්පි හි සාරිපුත්ත, මොඝපුරිසානං භවිස්සති තථාගතෙ කඞ්ඛා වා විමති වා තෙසම්පිමං ධම්මපරියායං සුත්වා යා තථාගතෙ[6] කඞ්ඛා වා විමති වා සා පහීයිස්සතී ති.

---

1. න ඛො මෙ තං - සයා.
2. දළ්හුද්ධාපං - මජ්ඣං, දළ්හද්ධාලං - සයා.
3. ඛො භන්තෙ - සී 1, 2.
4. සුපතිට්ඨිතචිත්තා - මජ්ඣං, සයා.
5. භාවෙය්‍යාසි - සී 1.
6. සුත්වා තථාගතෙ - සී 1, 2.

වහන්ස, අතීතානාගතපච්චුප්පන්න වූ අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේ කෙරෙහි චේතොපරිය ඥාණයෙක් මට නැත. එසේ වුව ද, දහම් අනු ව දන්නා ලදී. වහන්ස, යම්සේ රජකුට දැඩිපවුරු ඇති දැඩිපවුරු තොරන් ඇති එක් දොරක් ඇති පසල්නුවරෙක් වේ ද; එහි පණ්ඩිත වූ ව්‍යක්ත වූ නුවණ ඇති නො අඳුනන්නවුන් වළක්වන අඳුනන්නවුන් ඇතුළු කරන දොරටුපල්ලෙක් වන්නේ ය. හේ ඒ නුවර හාත්පස පවුර අවට මහ අනුව යන්නේ යටත් පිරිසෙයින් බළලුන් නික්මෙන පමණ වූත් පවුරුසන්ධියක් (=ගඩොළු දෙකක් ඉවත් වූ තැනක්) හෝ පවුරු සිදුරක් (=සුන්තැනක්) හෝ නොදක්නේ ය. ඔහුට මෙසේ සිත් වන්නේ ය. යම්කිසි ඖදරික ප්‍රාණීහු මේ නුවරට පිවිසෙත් නම් හෝ නික්මෙත් නම් හෝ ඒ සියල්ලෝ මේ දොරින් ම පිවිසෙත් හෝ නික්මෙත් හෝ යි.

වහන්ස, එසෙයින් ම මා විසින් දහම් අනු ව දන්නා ලද්දේ ය. වහන්ස, ඉකුත්කල යම් ඒ අර්හත් සම්මාසම්බුද්ධවරයෝ පහළ වූ සේක් ද; ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලා සිත කෙලෙසන නුවණ දුබල කරන පස්නීවරණ පහ කොට සිවුසිවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇති සේක් සත්බොජඟ තතු සේ වඩා අනුත්තර වූ සම්මා සම්බොධිය අවබොධ කළ සේක. වහන්ස, මතුකලදු යම් ඒ අර්හත් සම්මාසම්බුද්ධවරයෝ පහළවන සේක් නම් ඒ සියලු භාග්‍යවතුන් වහන්සේලා සිත කෙලෙසන නුවණ දුබල කරන පස්නීවරණ පහ කොට සිවුසිවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇති සේක් සත්බොජඟ තතුසේ වඩා අනුත්තර සම්මාසම්බෝධිය අවබෝධ කරන සේක. වහන්ස, මෙකල අර්හත් සම්මා සම්බුද්ධ වූ භාග්‍යවතුන් වහන්සේ ද සිත කෙලෙසන නුවණ දුබල කරණ පස්නීවරණ පහ කොට සිවුසිවටන්හි මැනවින් එළඹ සිටි සිත් ඇතිසේක් සත්බොජඟ තතුසේ වඩා අනුත්තර වූ සම්මා සම්බෝධිය අවබෝධ කළ සේකැ යි..

සාරිපුත්ත, මැනවි, මැනවි, සාරිපුත්ත, එහෙයින් මෙහි ලා තෙපි මේ දහම්නය මහණුනට මෙහෙණනට උවසුනට උවසියනට එක්වන් කියන්නහු. සාරිපුත්ත, යම් හිස්පුරුෂයනට ද තථාගතයන් කෙරෙහි යම් සැකයෙක් හෝ විමතියෙක් හෝ වන්නේ නම් මේ දහම්නය අසා ඔවුන්ගේත් තථාගතයන් කෙරෙහි වූ යම් සැකයෙක් හෝ විමතියෙක් හෝ වේ ද; එය ප්‍රහීණ වන්නේ යි.

## 3. 2. 3

## චුන්දසුත්තං

1191. එකං සමයං භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ අනාථ-**පිණ්ඩිකස්ස** ආරාමෙ තෙන ඛො පන සමයෙන ආයස්මා **සාරිපුත්තො** මගධෙසු විහරති **නාළකගාමකෙ**[1], ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො. **චුන්දො ච** සමණුද්දෙසො ආයස්මතො සාරිපුත්තස්ස උපට්ඨාකො හොති. අථ ඛො ආයස්මා සාරිපුත්තො තෙනෙව ආබාධෙන පරිනිබ්බායි. අථ ඛො චුන්දො සමණුද්දෙසො ආයස්මතො සාරිපුත්තස්ස පත්තචීවරං ආදාය යෙන **සාවත්ථි ජෙතවනං අනාථපිණ්ඩිකස්ස** ආරාමො, යෙනායස්මා **ආනන්දො** තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවා-දෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො චුන්දො සමණුද්දෙසො ආයස්මන්තං ආනන්දං එතදවොච:

"ආයස්මා භන්තෙ, සාරිපුත්තො පරිනිබ්බුතො. ඉදමස්ස පත්ත-චීවර"න්ති. අත්ථි ඛො ඉදං ආවුසො කථාපාභතං භගවන්තං දස්සනාය. ආයාමාවුසො චුන්ද, යෙන භගවා තෙනුපසඞ්කමිස්සාම. උපසඞ්කමිත්වා භගවතො එතමත්ථං ආරොචෙස්සාමාති. එවං භන්තෙ'ති ඛො චුන්දො සමණුද්දෙසො ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසි. අථ ඛො ආයස්මා ච ආනන්දො චුන්දො ච සමණුද්දෙසො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "අයං භන්තෙ, චුන්දො සමණුද්දෙසො එවමාහ. ආයස්මා භන්තෙ, සාරිපුත්තො පරිනිබ්බුතො, ඉදමස්ස පත්තචීවර"න්ති. අපි ච මෙ භන්තෙ, මධුරක-ජාතො විය කායො. දිසාපි මෙ න පක්ඛායන්ති. ධම්මාපි මං නප්පටිභන්ති. ආයස්මා සාරිපුත්තො පරිනිබ්බුතො'ති සුත්වාති.

කින්නු ඛො තෙ ආනන්ද, සාරිපුත්තො සීලක්ඛන්ධං වා ආදාය පරි-නිබ්බුතො, සමාධික්ඛන්ධං වා ආදාය පරිනිබ්බුතො, පඤ්ඤාක්ඛන්ධං වා ආදාය පරිනිබ්බුතො, විමුත්තික්ඛන්ධං වා ආදාය පරිනිබ්බුතො, විමුත්තිඤාණ-දස්සනක්ඛන්ධං වා ආදාය පරිනිබ්බුතොති? න ඛො මෙ භන්තෙ.[2] ආයස්මා සාරිපුත්තො සීලක්ඛන්ධං වා ආදාය පරිනිබ්බුතො -පෙ- විමුත්තිඤාණදස්ස-නක්ඛන්ධං වා ආදාය පරිනිබ්බුතො. අපි ච භන්තෙ, ආයස්මා සාරිපුත්තො ඔවාදකො අහොසි, විඤ්ඤාපකො සන්දස්සකො සමාදපකො සමුත්තෙජකො සම්පහංසකො අකිලාසු ධම්මදෙසනාය, අනුග්ගාහකො සබ්‍රහ්මචාරීනං. තං මයං ආයස්මතො සාරිපුත්තස්ස ධම්මොජං ධම්මභොගං ධම්මානුග්ගහං අනුස්සරාමාති.

---

1. නාලගාමකෙ - සී 1, 2.
2. න ඛො මෙ තං භන්තෙ - සී 1, 2.
   න ච ඛො මෙ භන්තෙ - මජ්ඣං.

## 3. 2. 3

## චුන්ද සූත්‍රය

1191. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවත සමීපයෙහි අනේපිඩු සිටුහුගේ දෙව්රම්හි වැඩවසන සේක. එසමයෙහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මගදදනව්වෙහි නාළකගම්හි හටගත් ආබාධ ඇත්තාහු දුකට පැමිණියාහු දැඩියේ ගිලන් වූවාහු වැඩවෙසෙති. චුන්දහෙරණ තෙමේත් ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ට උවටැන් කරන්-නේ වේ. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ඒ ආබාධයෙන් ම පිරිනිවියහ. ඉක්බිති චුන්ද හෙරණ ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ පාසිවුරු ගෙන සැවැත්නුවර අනේපිඩුසිටුහුගේ දෙව්රම්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වැඳ එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් චුන්ද හෙරණ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය කී ය.

වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ පිරිනිවියහ. මේ උන්වහන්සේගේ පාසිවුරු යි ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ දකිනු වස් මේකතාපඩුරෙක් ඇත. ඇවත චුන්ද, යමු. භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹෙන්නෙමු. එළඹ භාග්‍යවතුන් වහන්සේට මේ අරුත සැලකරන්නෙමු යි. වහන්ස, එසේ ය යි චුන්දහෙරණ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට පිළිතුරු දිනි. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝත් චුන්දහෙරණුවෝත් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක හුන්හ. එකත්පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, මේ චුන්ද හෙරණ මෙසේ කියයි: ''වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ පිරිනිවියහ. මේ උන්වහන්සේගේ පාසිවුරු'' යි. වහන්ස, තව ද ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ පිරිනිවියහ යි අසා මාගේ සිරුර තද වූවාක් මෙනි. දිශාවෝ ද මට පැහැදිලි නො වෙත්. දහම් ද මට නොවැටහේ යි.

ආනන්ද, කිමෙක් ද? සැරියුත් තොපගේ ශීලස්කන්ධය හෝ රැගෙන පිරිනිවියේ ද? සමාධිස්කන්ධය හෝ රැගෙන පිරිනිවියේ ද? ප්‍රඥාස්කන්ධය හෝ රැගෙන පිරිනිවියේ ද? විමුක්තිස්කන්ධය හෝ රැගෙන පිරිනිවියේ ද? විමුක්තිඥානදර්ශනස්කන්ධය හෝ රැගෙන පිරිනිවියේ ද?යි. වහන්ස, ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ මාගේ ශීලස්කන්ධය හෝ රැගෙන නො පිරිනිවියහ ... මාගේ විමුක්තිඥාන-දර්ශනස්කන්ධය හෝ රැගෙන නො ම පිරිනිවියහ. වහන්ස, එතෙකුදු වුවත් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ අවවාද කරන්නෙක් කරුණු අඟවන්නෙක් කරුණු දක්වන්නෙක් සමාදන් කරවන්නෙක් තෙද ගන්වන්නෙක් සතුටු කරවන්නෙක් දම්දෙසුම්හි නො පසුබස්නෙක් සබ්‍රම්සරුන්ට අනුග්‍රහ කරන්නෙක් වූහ. අපි ආයුෂ්මත් සැරියුත් තෙරණුවන්ගේ ඒ ධර්මෞජස ධම්භොගය ධර්මානුග්‍රහ සිහි කරමු යි.

නනු තං ආනන්ද, මයා පටිගච්චෙව අක්ඛාතං: "සබ්බෙහි පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො, තං කුතෙත්ථ ආනන්ද, ලබ්භා යං තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මා පලුජ්ජීති, නෙතං ඨානං විජ්ජති, සෙය්‍යථාපි ආනන්ද, මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො සො මහන්තතරො ඛන්ධො සො පලුජ්ජෙය්‍ය, එවමෙව ඛො ආනන්ද, මහතො භික්ඛුසඞ්ඝස්ස තිට්ඨතො සාරවතො සාරිපුත්තො පරිනිබ්බුතො, තං කුතෙත්ථ ආනන්ද, ලබ්භා, යං තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මා පලුජ්ජීති, නෙතං ඨානං විජ්ජති. තස්මාතිහානන්ද, අත්තදීපා විහරථ, අත්තසරණා අනඤ්ඤසරණා ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා.

කථඤ්චානන්ද, භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො. ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො: ඉධානන්ද, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එවං ඛො ආනන්ද, භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො. යෙහි කෙචි ආනන්ද, එතරහි වා මමච්චයෙ වා අත්තදීපා විහරිස්සන්ති අත්තසරණා අනඤ්ඤසරණා ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා. තමතග්ගෙ මෙ තෙ ආනන්ද, භික්ඛු භවිස්සන්ති යෙ කෙචි සික්ඛාකාමා''ති.

## 3. 2. 4

## උක්කචෙලසුත්තං

1192. එකං සමයං භගවා වජ්ජීසු විහරති උක්කචෙලායං නදියා තීරෙ මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අචිරපරිනිබ්බුතෙසු සාරිපුත්තමොග්ගල්ලානෙසු. තෙන ඛො පන සමයෙන භගවා භික්ඛුසඞ්ඝපරිවුතො අබ්භොකාසෙ නිසින්නො හොති. අථ ඛො භගවා තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා භික්ඛූ ආමන්තෙසි:

---

න ඛො මෙතං භන්තෙ - සී - 1, 2, න ච ඛො මෙ භන්තෙ මජ්සං.

Free Distribution www.aathaapi.org

ආනන්ද, සියලු ප්‍රියමනාප වස්තුවලින් වෙනස්වනබව වෙන්වන බව අන්අයුරකට පැමිණෙනබව මා විසින් පළමු කොට ම කියන ලද්දේ නො වේ ද? ආනන්ද, ඒ යමක් උපන්නේ ද වූයේ ද හෙතු ප්‍රත්‍යයෙන් හටගත්තේ ද වැනසෙන සැහැවි ඇත්තේ ද; එය ඒකාන්ත-යෙන් විනාශ නො වේවා යන ඒ කරුණ මෙහි ලා කොයින් ලැබිය හැකි ද මේ කරුණ නැත්තේ ය. ආනන්ද, යම්සේ පවත්නා හර ඇති මහත්රුකෙක යම් ඉතාමහත් කඳෙක් වේ ද; එය නැසෙන්නේ ය. ආනන්ද, එසෙයින් ම පවත්නා හර ඇති මහත් භික්ෂුසඞ්ඝ පිළිබඳ සැරියුත් පිරිනිවියේ ය. ආනන්ද, යමක් උපන්නේ ද වූයේ ද හෙතු-ප්‍රත්‍යයෙන් හටගත්තේ ද වැනසෙන ස්වභාව ඇත්තේ ද; එය ඒකාන්ත-යෙන් නො නැසේ වා යන ඒ කාරණය මෙහි ලා කොයින් ලැබිය හැකි ද මේ කාරණය නැත්තේ ය. ආනන්ද, එහෙයින් මෙහි ලා තමා පිහිට කොට තමා සරණ කොට මෙරමා පිහිට නො කොට දහම් පිහිට කොට දහම් සරණ කොට අනෙකක් පිහිට නො කොට වෙසෙවු.

ආනන්ද, කෙසේ නම් මහණ තමා පිහිට කොට තමා සරණ කොට මෙරමා පිහිට නො කොට දහම් පිහිට කොට දහම් සරණ කොට අනෙකක් පිහිට නො කොට වෙසේ ද යත්; ආනන්ද, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. වෙදනාහි… සිත්හි … දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. ආනන්ද, මෙසේ මහණ තමා පිහිට කොට තමා සරණ කොට මෙරමා පිහිට නො කොට දහම් පිහිට කොට දහම් සරණ කොට අනෙකක් පිහිට නො කොට වෙසේ. ආනන්ද, යම්කිසි භික්ෂු කෙනෙක් දැන් හෝ මාගේ ඇවෑමෙහි හෝ තමා පිහිට කොට තමා සරණ කොට මෙරමා පිහිට නො කොට දහම් පිහිට කොට දහම් සරණ කොට අනෙකක් පිහිට නො කොට වෙසෙන්නාහු නම් ආනන්ද, යම්කිසි භික්ෂු කෙනෙක් ශික්ෂාකාමී වන්නාහු නම් ඒ මේ භික්ෂූහු අග්‍රතම වෙති යි.

## 3. 2. 4

## උක්කචෙල සූත්‍රය

1192. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැරියුත්මුගලන් දෙනම පිරිනිවී නො බෝකල් ඇති සමයෙහි වැදෑදනවවෙහි උක්කවෙලා නුවර සමීපයෙහි ගඞ්ගා ගංඉවුරෙහි මහත් භික්සඝන සමග වැඩවසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ භික්සඝන විසින් පිරිවරන ලද සේක් එළිමහන්හි වැඩහුන් සේක් වෙති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ නිහඬ භික්සඝන දෙස බලා භික්ෂූන් ඇමතූ සේක:

“අපි ච ඛ්වායං[1] භික්ඛවෙ, පරිසා සුඤ්ඤා විය ඛායති පරිනිබ්බුතෙසු සාරිපුත්තමොග්ගල්ලානෙසු අසුඤ්ඤා මෙ[2] සා භික්ඛවෙ, පරිසා[3] හොති අනපෙක්ඛා තස්සං දිසායං හොති, යස්සා දිසායං සාරිපුත්තමොග්ගල්ලානා විහරන්ති. යෙ'පි තෙ භික්ඛවෙ, අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමං යෙව සාවකයුගං අහොසි, සෙය්‍යථාපි මය්හං සාරිපුත්තමොග්ගල්ලානා. යෙ'පි තෙ භික්ඛවෙ, භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා, තෙසම්පි භගවන්තානං එතපරමං යෙව සාවකයුගං භවිස්සති, සෙය්‍යථාපි මය්හං සාරිපුත්තමොග්ගල්ලානා. අච්ඡරියං භික්ඛවෙ, සාවකානං අබ්භුතං භික්ඛවෙ, සාවකානං සත්ථුසමානා ච[4] සාසනකරා භවිස්සන්ති ඔවාදපතිකරා චතුන්නඤ්ච පරිසානං පියා භවිස්සන්ති මනාපා ගරුභාවනීයා ච. අච්ඡරියං භික්ඛවෙ, තථාගතස්ස, අබ්භුතං භික්ඛවෙ, තථාගතස්ස එවරූපෙපි නාම සාවකයුගෙ[5] පරිනිබ්බුතෙ නත්ථි තථාගතස්ස සොකො වා පරිදෙවො වා. තං කුතෙත්ථ භික්ඛවෙ, යං තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං, තං වත මා පලුජ්ජීති නෙතං ඨානං විජ්ජති.

සෙය්‍යථාපි භික්ඛවෙ, මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො යෙ මහන්තතරා ඛන්ධා තෙ පලුජ්ජෙය්‍යුං, එවමෙව ඛො භික්ඛවෙ, මහතො භික්ඛුසඞ්ඝස්ස තිට්ඨතො සාරවතො සාරිපුත්තමොග්ගල්ලානා පරිනිබ්බුතා. තං කුතෙත්ථ භික්ඛවෙ ලබ්භා, යං තං ජාතං භූතං සඞ්ඛතං පලොක-ධම්මං, තං වත මා පලුජ්ජීති නෙතං ඨානං විජ්ජති. තස්මාතිහ භික්ඛවෙ, අත්තදීපා විහරථ අත්තසරණා අනඤ්ඤසරණා ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො ඉධ භික්ඛවෙ- භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු අත්තදීපො විහරති අත්තසරණො අනඤ්ඤසරණො ධම්මදීපො ධම්මසරණො අනඤ්ඤසරණො. යෙ හි කෙචි භික්ඛවෙ, එතරහි වා මමච්චයෙ වා අත්තදීපා විහරිස්සන්ති අත්තසරණා අනඤ්ඤසරණා, ධම්මදීපා ධම්මසරණා අනඤ්ඤසරණා. තමතග්ගෙ මෙ තෙ භික්ඛවෙ, භික්ඛූ භවිස්සන්ති යෙ හි කෙචි සික්ඛාකාමාති.

1. අපි ම්‍යායං – මජසං, අපි ඛො ම්‍යායං – සයා.
2. අසුඤ්ඤා සා – සී 1, 2, අසුඤ්ඤා මෙ භික්ඛවෙ – මජසං.
3. දිසා – සී 1, 2, සයා.
4. සත්ථු ච නාම – මජසං, සයා,
5. සාවකයුගෙපි - සී 1, 2.

මහණෙනි, සැරියුත්මුගලන් දෙනම පිරිනිවි කල්හි මේ මුළු පිරිස ම හිස් වූවාසේ වැටහේ. මහණෙනි, යම් දිගෙක සැරියුත් මුගලන් දෙනම වෙසෙත් නම් මාගේ ඒ පිරිස නො සිස් වේ. ඒ දික්හි පුනපුනා අපේක්ෂාව වේ. මහණෙනි, අතීතකාලයෙහි යම් ඒ අර්හත් සම්මාසම්බුද්ධවරයෝ වූ නම් ඒ භාග්‍යවතුන්ට ද දූන් මට සැරියුත්-මුගලන් දෙනම යම්සේ නම් එබඳු වූ ම සවුයුවලෙක් වී ය. මහණෙනි, අනාගතකාලයෙහි යම් ඒ අර්හත්සම්මාසම්බුද්ධවරයෝ වන්නාහු නම් ඒ භාග්‍යවතුන්ට ද දූන් මට සැරියුත්මුගලන් දෙනම යම්සේ නම් එබඳු වූ ම සවුයුවලෙක් වන්නේ ය. මහණෙනි, සව්වන්ගේ අසිරියෙකි. මහණෙනි, සව්වන්ගේ පුදුමයෙකි. ශාස්තෘසම වූවෝ ම සන්න කරන්නෝ අවවාදය අනු ව ක්‍රියා කරන්නෝ වන්නාහ. සිවුපිරිසට ප්‍රිය වූවෝ ද මන වඩන්නෝ ද ගරු කටයුත්තෝ ද වන්නාහ. මහණෙනි, තථාගතයන්ගේ අසිරියෙකි. මහණෙනි, තථාගතයන්ගේ පුදුමයෙකි. මෙබඳු වූ ම ශ්‍රාවකයුග්මයක් පිරිනිවිකල්හි දු තථාගතයන්ට ශොකයෙක් හෝ වැලපීමෙක් හෝ නැති මහණෙනි, ඒ යමක් උපන්නේ ද පහළ වූයේ ද හේතුයෙන් හටගත්තේ ද වැනසීම සවභාව කොට ඇත්තේ ද; එය ඒකාන්තයෙන් නො වැනසේවා යන මේ කාරණය මෙහි ලා කොයින් ලැබිය හැකි ද, මේ කාරණය නැත්තේ ය.

මහණෙනි. යම්සේ හර ඇති සිටුනා මහත්රුකෙක යම් ඉතා මහත් කඳහු වෙත් නම් ඔහු වැනසෙන්නාහ. මහණෙනි, එසෙයින් ම හර ඇති සිටුනා මහත්භික්සඝනගේ සැරියුත්මුගලන්හු පිරිනිවියහ. මහණෙනි, ඒ යමක් උපන්නේ ද පහළ වූයේ ද හේතුයෙන් හට-ගත්තේ ද වැනසීම සවභාව කොට ඇත්තේ ද; එය ඒකාන්තයෙන් නො වැනසේවා යන මේ කාරණය මෙහි ලා කොයින් ලැබිය හැකි ද, මේ කාරණය නැත්තේ ය. මහණෙනි, එහෙයින් මෙහි ලා තමා පිහිට කොට තමා සරණ කොට මෙරමා පිහිට නො කොට දහම පිහිට කොට දහම සරණ කොට අනිකක් පිහිට නො කොට වෙසෙවූ.

මහණෙනි, කෙසේ නම් මහණ තමා පිහිට කොට තමා සරණ කොට මෙරමා පිහිට නො කොට දහම පිහිට කොට දහම සරණ කොට අනිකක් පිහිට නො කොට වෙසේ ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනු ව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ වේදනාහි... සිත්හි... දහම්හි දහම් අනු ව බලනසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මහණ මෙසේ තමා පිහිට කොට තමා සරණ කොට මෙරමා පිහිට නො කොට දහම පිහිට කොට දහම සරණ කොට අනිකක් පිහිට නො කොට වෙසේ. මහණෙනි, යම්කිසි භික්ෂු කෙනෙක් දූන් හෝ මාගේ ඇවෑමෙහි හෝ තමා පිහිට කොට තමා සරණ කොට මෙරමා පිහිට නො කොට දහම පිහිට කොට දහම සරණ කොට අනිකක් පිහිට නො කොට වසන්නාහු ද, මහණෙනි, යම්කිසි කෙනෙක් ශික්ෂාකාමී වන්නාහු ද, මහණෙනි, ඒ මේ භික්ෂූහු අග්‍රතම වෙති යි.

## 3. 2. 5

## බාහියසුත්තං

1193. අථ ඛො ආයස්මා බාහියො[1] යෙන භගවා තෙනුපසඞ්කමි. -පෙ- එකමන්තං නිසින්නො ඛො ආයස්මා බාහියො භගවන්තං එතදවොච: "සාධු මෙ භන්තෙ භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති".

තස්මාතිහ ත්වං බාහිය, ආදිමෙව විසොධෙහි කුසලෙසු ධම්මෙසු. කො චාදි කුසලානං ධම්මානං: සීලඤ්ච සුවිසුද්ධං, දිට්ඨි ච උජුකා. යතො ඛො තෙ බාහිය, සීලඤ්ච සුවිසුද්ධං භවිස්සති, දිට්ඨි ච උජුකා. තතො ත්වං බාහිය, සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය චත්තාරො සතිපට්ඨානෙ භාවෙය්‍යාසි. කතමෙ චත්තාරො: ඉධ ත්වං බාහිය කායෙ කායානුපස්සී විහරසි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරසි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අජ්ඣාදොමනස්සං. යතො ඛො ත්වං බාහිය, සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙස්සසි තතො තුය්හං බාහිය, යා රත්ති වා දිවසො වා ආගමිස්සති වුද්ධියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු, නො පරිහානී"ති.

අථ ඛො ආයස්මා බාහියො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො ආයස්මා බාහියො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව ආගාරස්මා අනාගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි, ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච පනායස්මා බාහියො අරහතං අහොසීති.

## 3. 2. 6

## උත්තියසුත්තං

1194. අථ ඛො ආයස්මා උත්තියො[2] යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- තතො ත්වං උත්තිය, ගමිස්සසි මච්චුධෙය්‍යස්ස පාරන්ති -පෙ- අඤ්ඤතරො ච පනායස්මා උත්තියො අරහතං අහොසීති.

1. බාහිකො - සී 1, 2.
2. උත්තිකො - සී 1, 2.

## 3. 2. 5

## බාහිය සූත්‍රය

1193. ඉක්බිති ආයුෂ්මත් බාහිය භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය. ... එකත්පසෙක හුන් ආයුෂ්මත් බාහිය භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: "වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකලා වූයෙම් ගණයා කෙරෙන් වෙන් වූයෙම් නොපමා වූයෙම් කෙලෙස් තවන වැර ඇතියෙම් කායචිත්තදෙක්හි අපේක්‍ෂා රහිතයෙම් වසන්නෙම් නම් එබඳු දහමක් මට සැකෙවින් දෙසන සේක්වා යි.

බාහිය එහෙයින් මෙහි ලා තෙපි කුසල්දහම්හි මුල ම පිරිසිදු කරවු. කුසල්දහමුන්ගේ මුල කවරේ ද යත්: ඉතා පිරිසිදු වූ සීලයත් ඉතා ඍජු වූ දෘෂ්ටියත් ය. බාහිය, යම් කලෙක තොපගේ ශීලය ඉතා පිරිසිදුත් දෘෂ්ටිය ඉතා ඍජුත් වන්නේ නම් බාහිය, එකල්හි තෙපි සීලය ඇසුරු කොට සීලයෙහි පිහිටා සිවුසිවටන් වඩන්නහු ය. කවර සිවු දෙනෙක් ද යත්: බාහිය, මෙහි තෙපි කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙවු. වේදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙවු. බාහිය, යම් කලෙක තෙපි සීලය ඇසුරු කොට සීලයෙහි පිහිටා මේ සිවුසිවටන් මෙසේ වඩන්නහු ද, බාහිය, එකල්හි තොපට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණෙන්නේ නම්, කුසල්දහම්හි වැඩීමෙක් ම කැමැති වියයුතු, පිරිහීමෙක් නො කැමැති වියයුතු යි.

ඉක්බිති ආයුෂ්මත් බාහිය භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට පිටත් ව ගියේ ය. ඉක්බිති ආයුෂ්මත් බාහිය තෙරණුවෝ එකලා ව ගණයා කෙරෙන් වෙන් ව නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන්නාහු නො බෝකලකින් ම යමක් පිණිස කුලපුත්තු මැනවින් ම ගිහිගෙන් නික් ම සස්නෙහි පැවිදි වෙත් නම් අනුත්තර වූ මහබඹසර කෙළවර වූ ඒ අර්හත්වය දිටුදැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වියුහ. ඉපැද් ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි කටයුතු කරන ලදී. මේබැව් පිණිස අනෙකක් නැතැ යි දැන-ගත්හ. ආයුෂ්මත් බාහිය තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූහ යි.

## 3. 2. 6

## උත්තිය සූත්‍රය

1194. එකල්හි ආයුෂ්මත් **උත්තිය** තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ .. උත්තිය, එකල්හි තෙපි සසර පරතෙරට යන්නහු යි ... ආයුෂ්මත් උත්තිය තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූහ යි.

## 3. 2. 7

### අරියසුත්තං

1195. චත්තාරොමෙ භික්ඛවෙ, සතිපට්ඨානා භාවිතා බහුලීකතා අරියා නිය්‍යානිකා නිය්‍යන්ති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු –පෙ– චිත්තෙ –පෙ– ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානා භාවිතා බහුලීකතා අරියා නිය්‍යානිකා නිය්‍යන්ති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති.

## 3. 2. 8

### බ්‍රහ්මසුත්තං

1196. එකං සමයං භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‍රොධෙ පඨමාභිසම්බුද්ධො. අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: "එකායනො'යං මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: කායෙ වා භික්ඛු කායානුපස්සී විහරෙය්‍ය, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු වා භික්ඛු –පෙ– චිත්තෙ වා භික්ඛු –පෙ– ධම්මෙසු වා භික්ඛු ධම්මානුපස්සී විහරෙය්‍ය ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එකායනොයං මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා"ති.

අථ ඛො බ්‍රහ්මා සහම්පති භගවතො චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං බ්‍රහ්මලොකෙ අන්තරහිතො භගවතො පුරතො පාතුරහොසි. අථ ඛො බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච:

## 3. 2. 7

## අරිය සූත්‍රය

1195. මහණෙනි, වඩන ලද බහුල කරන ලද ආර්‍ය්‍ය වූ නෛර්‍ය්‍යාණික වූ මේ සිවුසිවටන්හු ඒ අනු ව පිළිපන්නහු මැනවින් දුක් ගෙවීම පිණිස පමුණුවත්. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙහි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. වෙදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, ආර්‍ය්‍ය වූ නෛර්‍ය්‍යාණික වූ මේ සිවු–සිවටන්හු වඩන ලදහු බහුල කරන ලදහු ඒ අනු ව පිළිපන්නහු මැනවින් දුක් ගෙවීම පිණිස පමුණුවති යි.

## 3. 2. 8

## බ්‍රහ්ම සූත්‍රය

1196. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ බුදු ව පළමු කොට **උරුවෙල්** දනව්වෙහි **නෙරඤ්ජරා** ගංඉවුරෙහි **අජපල්** නුගරුකමුල වැඩවසන සේක. එකල්හි රහසිගත ව විවෙකයෙන් යුතු ව වැඩවෙසෙන භාග්‍යවතුන් වහන්සේට මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය: යම් මේ සිවුසිවටන්හු වෙද් ද; සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස ශෝක–පරිදෙවයන් ඉක්මවීම පිණිස දුක්දොම්නස් දුරු කිරීම පිණිස අරිඅටඟිමඟ අවබෝධ කිරීම පිණිස නිවන පසක් කිරීම පිණිස මේ එක ම මඟ ය. කවර සතරෙක් ද යත්: මහණ කයෙහි හෝ කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙන්නේ ය. මහණ වෙදනාහි හෝ ... මහණ සිත්හි හෝ ... මහණ දහම්හි හෝ දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙන්නේ ය. යම් මේ සිවුසිවටන්හු වෙත් නම් සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස ශෝක–පරිදේවයන් ඉක්ම වීම පිණිස දුක්දොම්නස් දුරු කිරීම පිණිස අරිඅටඟිමඟ අවබෝධ කිරීම පිණිස නිවන පසක් කිරීම පිණිස මේ එක ම මඟ වේ යි.

එකල්හි **සහම්පතී** බ්‍රහ්ම සියසිතින් භාග්‍යවතුන් වහන්සේගේ චිත්තපරිවිතර්කය දැන යම් සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් හෝ දිගු කරන්නේ ද; දිගුකළ අතක් හෝ හකුළුවන්නේ ද එසෙයින් ම බඹලොව අතුරුධන් ව භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පහළ විය. ඉක්බිති සහම්පති බ්‍රහ්ම උතුරුසඟ එකස් කොට ඇඳිලිබැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ'' ය.

“එවමෙතං භගවා, එවමෙතං සුගත, එකායනො’යං භන්තෙ, මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථංගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: කායෙ වා භන්තෙ, භික්ඛු කායානුපස්සී විහරෙය්‍ය, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු වා භන්තෙ, භික්ඛු –පෙ– චිත්තෙ වා භන්තෙ, භික්ඛු –පෙ– ධම්මෙසු වා භන්තෙ, භික්ඛු ධම්මානුපස්සී විහරෙය්‍ය, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එකායනො’යං භන්තෙ, මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථංගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං[1] චත්තාරො සතිපට්ඨානා”ති. ඉදමවොච බ්‍රහ්මා සහම්පති, ඉදං වත්වා අථාපරං එතදවොච:

එකායනං ජාතිඛයන්තදස්සී මග්ගං පජානාති හිතානුකම්පී
එතෙන මග්ගෙන අතරිංසු පුබ්බෙ තරිස්සන්ති යෙ ච තරන්ති ඔඝන්ති.

## 3. 2. 9

### සෙදකසුත්තං

1197. එකං සමයං භගවා සුම්භෙසු[2] විහරති සෙදකං නාම සුම්භානං නිගමො. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භූතපුබ්බං භික්ඛවෙ, චණ්ඩාලවංසිකො චණ්ඩාලවංසං උස්සාපෙත්වා මෙදකථාලිකං අන්තෙවාසිං ආමන්තෙසි: “එහි ත්වං සම්ම මෙදකථාලිකෙ, චණ්ඩාලවංසං අභිරුහිත්වා මම උපරික්ඛන්ධෙ තිට්ඨාහීති. එවං ආචරියාති ඛො භික්ඛවෙ, මෙදකථාලිකා අන්තෙවාසී චණ්ඩාලවංසිකස්ස පටිස්සුත්වා චණ්ඩාලවංසං අභිරුහිත්වා ආචරියස්ස උපරික්ඛන්ධෙ අට්ඨාසි. අථ ඛො භික්ඛවෙ, චණ්ඩාලවංසිකො මෙදකථාලිකං අන්තෙවාසිං එතදවොච: “ත්වං සම්ම මෙදකථාලිකෙ, මමං රක්ඛ. අහං තවං රක්ඛිස්සාමි. එවං මයං අඤ්ඤමඤ්ඤගුත්තා අඤ්ඤමඤ්ඤරක්ඛිතා සිප්පානි චෙව දස්සෙස්සාම, ලාභෙ ච ලච්ඡාම, සොත්ථිනා ච චණ්ඩාලවංසා ඔරොහිස්සාමාති. එවං වුත්තෙ භික්ඛවෙ, මෙදකථාලිකා අන්තෙවාසී චණ්ඩාලවංසිකං එතදවොච: “න ඛො නාමෙතං ආචරිය, එවං භවිස්සති, ත්වං ආචරිය, අත්තානං රක්ඛ, අහං අත්තානං රක්ඛිස්සාමි. එවං මයං අත්තගුත්තා අත්තරක්ඛිතා සිප්පානි චෙව දස්සෙස්සාම, ලාභඤ්ච ලච්ඡාම, සොත්ථිනා ච චණ්ඩාලවංසා ඔරොහෙස්සාමා”ති.

1. යදිදමෙ – සී 1, 2.
2. සුබ්භෙසු – සී 1, 2. සුම්භෙසු – සයා.

භාග්‍යවතුන් වහන්ස, මෙය එසේ ය. සුගතයන් වහන්ස, මෙය එසේ ය. වහන්ස, යම් මේ සිවු සීවටන්හු වෙත් නම් සත්ත්වයන්ගේ විසුද්ධියට සෝකපරිදේවයන් ඉක්මවීමට දුක්දෙම්නස් දුරු කිරීමට අරිඅටඟිමඟ අවබෝධ කිරීමට නිවන පසක් කිරීමට මේ එක ම මඟ ය. කවර සතරෙක් ද යත්: වහන්ස, මහණ කයෙහි හෝ කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙන්නේ ය. වහන්ස, මහණ වෙදනාහි හෝ ... වහන්ස, මහණ සිත්හි හෝ ... වහන්ස, මහණ තෙමේ දහම්හි හෝ දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙන්නේ ය. වහන්ස, යම් මේ සිවුසීවටන්හු වෙත් නම් සත්ත්වයන්ගේ විසුද්ධියට සෝකපරිදේවයන් ඉක්මවීමට දුක්දෙම්නස් දුරු කිරීමට ඤායය අවබෝධ කිරීමට නිවන පසක් කිරීමට මේ එක ම මඟ වේ යි. සහම්පතී බ්‍රහ්ම මෙය කීය: මෙය කියා යළි මතු ද මෙය කී ය:

නිවන දක්නා වූ හිතානුකම්පා ඇති (භාග්‍යවතුන් වහන්සේ) එක ම මඟ දන්නාසේක. යම් කෙනෙක් චතුරෝඝය පෙර තරණය කළාහු ද, මතු තරණය කරන්නාහු ද, දැන් තරණය කෙරෙද්ද, (ඔහු) මේ මඟින් තරණය කළහ. කරන්නාහ. කෙරෙති යි.

## 3. 2. 9

## සේදක සූත්‍රය

1197. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සුම්හ දනව්වෙහි සුම්හයන්ගේ සේදක නම් නියම්ගම්හි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූසේක. මහණෙනි, පෙර චණ්ඩාලවංශිකයෙක් සැඩොල්හුණගස ඔසොවා "යහළු මෙදකථාලිකාවනි, එවු තෙපි සැඩොල්හුණගසට නැඟී මාගේ කඳ මතුයෙහි සිටිවු" යි. මෙදකථාලිකා නම් අතැවැස්සා ඇමතී ය.

මහණෙනි, ඇදුර, එසේ ය යි මෙදකථාලිකා අතවැසි චණ්ඩාලවංශිකයාට පිළිතුරු දී චණ්ඩාලවංසයට නැඟී ඇදුරාගේ කඳමතුයෙහි සිටියේ ය. මහණෙනි, එකල්හි චණ්ඩාලවංසික මෙදකථාලිකා අතවැස්සාට මෙය කී ය: යහළු මෙදකථාලිකාවනි, තෙපි මා රකිවු. මම තෙපි රකින්නෙමි. මෙසේ අපි ඔවුනොවුන් විසින් ගොපනය කරන ලද්දමෝ ඔවුනොවුන් විසින් රක්නා ලද්දමෝ ශිල්ප ද දක්වන්නෙමු ලාභ ද ලබන්නෙමු. සුවසේ යැඩොල්හුණගසින් ද බසින්නෙමු'' යි. මහණෙනි, එසේ කී කල්හි මෙදකථාලිකා අතවැසි චණ්ඩාලවංසිකයාට මෙය කී ය: ඇදුර, මෙය එසේ නො ම වන්නේ ය. ඇදුර, තෙපි තමා රකිවු. මම ද තමා රක්නෙමි. මෙසේ අපි තමා විසින් ගෝපනය කරන ලද්දමෝ තමා විසින් රක්නා ලද්දමෝ ශිල්ප ද දක්වන්නෙමු ලාභ ද ලබන්නෙමු, චණ්ඩාලවංසයෙන් ද සුවසේ බසින්නෙමු'' යි.

“සො තත්‍ථ ඤායොති භගවා අවොච: යථා මෙදකථාලිකා අන්තෙවාසී ආචරියං අවොච. අත්තානං භික්ඛවෙ, රක්ඛිස්සාමීති සතිපට්ඨානං සෙවිතබ්බං. පරං රක්ඛිස්සාමීති සතිපට්ඨානං සෙවිතබ්බං. අත්තානං භික්ඛවෙ, රක්ඛන්තො පරං රක්ඛති. පරං රක්ඛන්තො අත්තානං රක්ඛති. කථඤ්ච භික්ඛවෙ, අත්තානං රක්ඛන්තො පරං රක්ඛති, ආසෙවනාය භාවනාය බහුලීකම්මෙන. එවං ඛො භික්ඛවෙ, අත්තානං රක්ඛන්තො පරං රක්ඛති. කථඤ්ච භික්ඛවෙ, පරං රක්ඛන්තො අත්තානං රක්ඛති, ඛන්තියා අවිහිංසාය මෙත්තචිත්තතාය අනුද්දයතාය. එවං ඛො භික්ඛවෙ, පරං රක්ඛන්තො අත්තානං රක්ඛති. “අත්තානං භික්ඛවෙ, රක්ඛිස්සාමී”ති සතිපට්ඨානං සෙවිතබ්බං, පරං රක්ඛිස්සාමීති සතිපට්ඨානං සෙවිතබ්බං, අත්තානං භික්ඛවෙ රක්ඛන්තො පරං රක්ඛති, පරං රක්ඛන්තො අත්තානං රක්ඛතීති.

## 3. 2. 10

## ජනපදකල්‍යාණීසුත්තං

1198 එකං සමයං භගවා සුම්භෙසු විහරති සෙදකං නාම සුම්භානං නිගමො. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: “සෙය්‍යථාපි භික්ඛවෙ, ජනපදකල්‍යාණී, “ජනපදකල්‍යාණී”ති ඛො භික්ඛවෙ, මහාජනකායො සන්නිපතෙය්‍ය. සා ඛො පනස්ස ජනපදකල්‍යාණී පරමපාසාවිනී[1] නච්චෙ, පරමපාසාවිනී ගීතෙ, ජනපදකල්‍යාණී නච්චති ගායතීති ඛො භික්ඛවෙ, භිය්‍යොසොමත්තාය මහාජනකායො සන්නිපතෙය්‍ය, අථ පුරිසො ආගච්ඡෙය්‍ය ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටික්කූලො. තමෙනෙවං[2] වදෙය්‍යුං: අයං තෙ අම්භො පුරිස, සමතිත්තිකො තෙලපත්තො අන්තරෙන[3] මහාසමයං[4] අන්තරෙන ජනපදකල්‍යාණියා පරිහාරෙතබ්බො[5], පුරිසො වෙකො[6] උක්ඛිත්තාසිකො පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධිස්සති යත්ථෙව නං ථොකම්පි ඡඩ්ඩෙස්සති තත්ථෙව තෙ සිරො පාතෙස්සතීති. තං කිං මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො අමුං තෙලපත්තං අමනසිකරිත්වා බහිද්ධා පමාදං ආහරෙය්‍යාති?[7] නො හෙතං භන්තෙ.

උපමා ඛො ම්‍යායං භික්ඛවෙ, කතා අත්ථස්ස විඤ්ඤාපනාය. අයං චෙත්ථ අත්ථො: “සමතිත්තිකො තෙලපත්තොති ඛො භික්ඛවෙ, කායගතාය එතං සතියා අධිවචනං. තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං කායගතා නො සති භාවිතා භවිස්සති බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධාති.” එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.

### නාලන්දවග්ගො දුතියො.

තත්‍රුද්දානං:

මහාපුරිසො ච නාලන්දං චුන්දො චෙලො ච බාහියො
උත්තියො අරියො බ්‍රහ්මා සෙදකං ජනපදෙන චාති.

---

1. පරමපාසාවිනී – සී, 1. 2.
2. තමෙනං එවං – මජසං, සයා.
3. අන්තරෙන ච – මජසං, සයා.
4. මහාසමජ්ජං – මජසං, සයා.
5. පරිහරිතබ්බො – මජසං, සයා.
6. ච තෙ – මජසං, සයා.
7. ආහරෙය්‍යාසි – සී 1, 2.

"මෙදකථාලිකා අතවැසි තෙමේ ඇදුරාට යම්සේ කියේ නම් එය එහි න්‍යායය" යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. "මහණෙනි, තමා රක්නෙමි" යි සිවටන් සෙවියයුතු යි. මෙරමා රක්නෙමි යි සිවටන් සෙවියයුතු යි. මහණෙනි, තමා රක්නේ මෙරමා රකියි. මහණෙනි, කෙසේ නම් තමා රක්නේ මෙරමා රකී ද යත්: කමටහන් සෙවුමෙනි, වැඩීමෙනි, බහුල කිරීමෙනි, මෙසේ තමා රක්නේ මෙරමා රකී. මහණෙනි, කෙසේ නම් මෙරමා රක්නේ තමා රකී ද යත්: ඉවසීමෙනි, කරුණායෙනි, මෙත්සිත් ඇති බැවිනි, මුදු බැවිනි. මහණෙනි, මෙසේ මෙරමා රක්නේ තමා රකියි. මහණෙනි, තමා රක්නෙමි යි සිවටන් සෙවියයුතු යි. මෙරමා රක්නෙමි යි සිවටන් සෙවියයුතු යි. මහණෙනි, තමා රක්නේ මෙරමා රකියි. මෙරමා රක්නේ තමා රකී යි.

## 3. 2. 10

## ජනපදකල්‍යාණී සූත්‍රය

1198. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සුම්භදනව්වෙහි සුම්භයන්ගේ සෙදක නම් නියම්ගම්හි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, ජනපදකල්‍යාණිය යම්සේ ද; මහණෙනි, ජනපදකල්‍යාණී යයි (ඇසූකෙණෙහි) මහජන සමූහයා රැස්වන්නේ ය. ඒ ජනපදකල්‍යාණී තොමෝ නැටුමෙහි ඉතා උතුම් පැවතුම් ඇත්තී ගැයුමෙහි ඉතා උතුම් පැවතුම් ඇත්තී වන්නී ය. මහණෙනි, දනවුකලණ නටයි, ගයයි ඇසූ කෙණෙහි බෙහෙවින් ම මහජනසමූහයා රැස්වන්නේ ය. එකල්හි ජීවත්වනු කැමති නො මැරෙනු කැමති සුව කැමති දුක පිළිකුල් කරන පුරුෂයෙක් එන්නේ ය. ඒ මොහුට මෙසේ කියන්නාහු ය: "එම්බල පුරුෂය, මුවවිට සම කොට පිරුණු මේ තෙල් බඳුන මහාසමූහයා අතරෙන් දනවුකලණ අතරෙන් ගෙන යායුතු. ඔසවා ගත් කඩු ඇති පුරුෂයෙක් පසුපස ලුහුබඳනේ ය. යම් මැ තැනෙක එයින් සවල්පයකුදු ඉවනලන්නේ නම් එහි ම තාගේ හිස කපා හෙළන්නේ" යි. මහණෙනි, ඒ කිමැ යි හඟිවු ද? ඒ පුරුෂ තෙමේ ඒ තෙල් බඳුන නො මෙනෙහි කොට බැහැර පමාවට එළඹෙන්නේ ද? වහන්ස, එය නො වේ ම ය.

මහණෙනි, අරුත් දන්වනු පිණිස මා විසින් මේ උපමාවක් කරන ලද. මෙ එහි අර්ථ යි: මහණෙනි, "මුවවිට සම කොට පිරුණු තෙල්බඳුනැ" යි කායිගතාසතියට මේ නමෙකි. මහණෙනි, එහෙයින් මෙහි ලා මෙසේ හික්මියයුතු යි: අප විසින් කායගතාසතිය වඩන ලද්දී බහුල කරන ලද්දී යානයක් මෙන් කරන ලද්දී වස්තුවක් මෙන් කරන ලද්දී දැඩිසේ පිහිටුවන ලද්දී පුරුදු කරන ලද්දී මැනවින් අරඹන ලද්දී වන්නී ය" යි. මහණෙනි, තොප විසින් මෙසේ ම හික්මිය යුතු යි.

## දෙවැනිනාලන්ද වර්ගය යි.

**එහි සූත්‍රනාමාවලිය:**

මහාපුරිස, නාලන්ද, චුන්ද, උක්කචෙල, බාහිය, උත්තිය, අරිය, බ්‍රහ්ම යන සූත්‍ර අට ය. සෙදක ජනපදකල්‍යාණී ය යි සූත්‍ර දශයෙකි.

# 3. සීලට්ඨිතිවග්ගො

## 3. 3. 1

## සීලසුත්තං

1199. එකං සමයං ආයස්මා ච ආනන්දො ආයස්මා ච භද්දො පාටලිපුත්තෙ විහරන්ති කුක්කුටාරාමෙ. අථ ඛො ආයස්මා භද්දො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි -පෙ- ආයස්මන්තං ආනන්දං එතදවොච: "යානිමානි ආවුසො ආනන්ද, කුසලානි සීලානි වුත්තානි භගවතා, ඉමානි කුසලානි සීලානි කිමත්ථියානි වුත්තානි භගවතා"ති. සාධු සාධු ආවුසො භද්ද, භද්දකො ඛො තෙ ආවුසො භද්ද, උම්මඞ්ගො,[1] භද්දකං පටිභානං, කල්‍යාණී පරිපුච්ඡා, "එවං හි ත්වං ආවුසො භද්ද, පුච්ඡසි: යානිමානි ආවුසො ආනන්ද කුසලානි සීලානි වුත්තානි භගවතා ඉමානි කුසලානි සීලානි කිමත්ථියානි වුත්තානි භගවතා"ති. එවමාවුසොති.

යානිමානි, ආවුසො භද්ද, කුසලානි සීලානි වුත්තානි භගවතා, ඉමානි කුසලානි සීලානි යාවදෙව චතුන්නං සතිපට්ඨානානං භාවනාය වුත්තානි භගවතා. කතමෙසං චතුන්නං: ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. යානිමානි ආවුසො භද්ද, කුසලානි සීලානි වුත්තානි භගවතා, ඉමානි කුසලානි සීලානි යාවදෙව ඉමෙසං චතුන්නං සතිපට්ඨානානං භාවනාය වුත්තානි භගවතාති.

## 3. 3. 2

## ඨිතිසුත්තං

1200. කුක්කුටාරාමෙ:

කො නු ඛො ආවුසො ආනන්ද, හෙතු කො පච්චයො යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොති. කො පනාවුසො ආනන්ද, හෙතු කො පච්චයො යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතීති? සාධු සාධු ආවුසො භද්ද, භද්දකො

1. උම්මඞ්ගො – මජසං.

# 3. සීලට්ඨිති වර්ගය

## 3. 3. 1

## සීල සූත්‍රය

1199. එක්කලෙක ආයුෂ්මත් ආනන්දතෙරණුවෝ ද ආයුෂ්මත් භද්දතෙරණුවෝ ද පැළලුප්නුවර කුක්කුටාරාමයෙහි වැඩවෙසෙති. එකල්හි ආයුෂ්මත් භද්දතෙරණුවෝ සවස්කල විවේකයෙන් නැගී සිටියෝ ආයුෂ්මත් ආනන්දතෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් ආනන්දතෙරණුවන් සමග සතුටුවූහ... ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ට මෙය කීහ: ඇවැත්නි, ආනන්දයෙනි, යම් මේ කුසල්සිල් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද ද, මේ කුසල්සිල් කුමක් පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද දැ යි. ඇවැත්නි, භද්දයෙනි, මැනවි මැනවි: ඇවැත්නි භද්දයෙනි, තොපගේ ප්‍රශ්න විමර්ශනය යහපති. ප්‍රතිභානය යහපති. පරිපුච්ඡාව මැනවි. ඇවැත්නි, භද්දයෙනි, මෙසේ තෙපි පුළුවුසුහු ද? ඇවැත්නි, ආනන්දයෙනි, යම් මේ කුසල්සිල් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද නම් මේ කුසල්සිල් කුමක් පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද දැ යි. ඇවැත්නි, එසේ යි.

ඇවැත්නි, භද්දයෙනි, යම් මේ කුසල්සිල් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද නම් මේ කුසල්සිල් සිවුසිවටන් වැඩීම පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදී. කවර සතරෙක් ද යත්: ඇවැත්නි, මෙසස්නෙහි මහණතෙමේ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. විඳුම්හි.. සිත්හි... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඇවැත්නි භද්දයෙනි, යම් මේ කුසල්සිල් භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලද නම් මේ කුසල්සිල් මේ සිවුසිවටන් වැඩීම පිණිස ම භාග්‍යවතුන් වහන්සේ විසින් වදරන ලදැ යි.

## 3. 3. 2

## ඨිති සූත්‍රය

1200. **කුක්කුටාරාමයෙහි** :

ඇවැත්නි **ආනන්දයෙනි,** යම් හෙයෙකින් තථාගතයන් වහන්සේ පිරිනිවිකල්හි සද්ධර්මය චිරස්ථිතික නො වේ නම් ඊට කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය ද? ඇවැත්නි ආනන්දයෙනි, යම් හෙයෙ-කින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික වේ නම් ඊට කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය දැ යි? ඇවැත්නි, භද්දයෙනි, මැනවි, මැනවි. ඇවැත්නි භද්දයෙනි, තොපගේ ප්‍රශ්න විමර්ශනය යහපති. ප්‍රතිභානය යහපති. පරිපුච්ඡාව මැනවි. ඇවැත්නි,

ඛො තෙ ආවුසො භද්ද, උම්මග්ගො, භද්දකං පටිභානං, කල්‍යාණී-පරිපුච්ඡා, එවං හි ත්වං ආවුසො භද්ද, පුච්ඡසි: ''කො නු ඛො ආවුසො ආනන්ද හෙතු, කො පච්චයො යෙන තථාගතෙ පරි-නිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොති, කො පනාවුසො ආනන්ද, හෙතු කො පච්චයො යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතී''ති. එවමාවුසොති.

චතුන්නං ඛො ආවුසො, සතිපට්ඨානානං අභාවිතත්තා අබහුලී-කතත්තා තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොති. චතුන්නඤ්ච ආවුසො සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොති. කතමෙසං චතුන්නං: ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛො ආවුසො චතුන්නං සතිපට්ඨානානං අභාවිතත්තා අබහුලීකතත්තා තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොති. ඉමෙසඤ්ච ඛො ආවුසො චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතීති.

## 3. 3. 3

## පරිහානසුත්තං

1201. **කුක්කුටාරාමෙ :**

කො නු ඛො ආවුසො ආනන්ද, හෙතු කො පච්චයො යෙන සද්ධම්මපරිහානං හොති, කො පනාවුසො[1] ආනන්ද, හෙතු කො පච්චයො යෙන සද්ධම්මඅපරිහානං හොතීති? සාධු සාධු ආවුසො භද්ද, භද්දකො ඛො තෙ ආවුසො භද්ද, උම්මග්ගො, භද්දකං පටිභානං, කල්‍යාණී පරිපුච්ඡා එවං හි ත්වං ආවුසො භද්ද, පුච්ඡසි: ''කො නු ඛො ආවුසො ආනන්ද, හෙතු කො පච්චයො යෙන සද්ධම්මපරිහානං හොති, කො පනාවුසො ආනන්ද, හෙතු කො පච්චයො යෙන සද්ධම්මඅපරිහානං හොතීති. එවමාවුසොති.

චතුන්නං ඛො ආවුසො, සතිපට්ඨානානං අභාවිතත්තා අබහුලී-කතත්තා සද්ධම්මපරිහානං හොති, චතුන්නඤ්ච ඛො ආවුසො සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා සද්ධම්මඅපරිහානං හොති. කතමෙසං චතුන්නං: ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛො ආවුසො, චතුන්නං සතිපට්ඨානානං අභාවිතත්තා අබහුලීකතත්තා සද්ධම්මපරිහානං හොති. ඉමෙසඤ්ච ඛො ආවුසො, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා සද්ධම්මඅපරිහානං හොතීති.

1. කො නු ඛො ආවුසො - මජ්ඣං., ස්‍යා.

භද්දයෙනි, මෙයේ තෙපි පුළුවුසුහු ද? "ඇවැත්නි ආනන්දයෙනි, යම් හෙයකින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික නො වේ නම් එයට කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය ද? ඇවැත්නි, ආනන්දයෙනි, යම් හෙයකින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික වේ නම් ඊට කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය දැ''යි. ඇවැත්නි, එසේ යි.

ඇවැත්නි, සිවුසිවටන් නො වැඩූ බැවින් නො බහුල කළ බැවින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික නො වෙයි. ඇවැත්නි, සිවුසිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික වේ. කවර සතරෙක් ද යත්: ඇවැත්නි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙච්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. වේදනාහි... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. ඇවැත්නි, මේ සිවුසිවටන් නො වැඩූ බැවින් නො බහුල කළ බැවින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික නො වෙයි. ඇවැත්නි, මේ සිවුසිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගතයන් වහන්සේ පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික වේ යි.

## 3. 3. 3

## පරිහාන සූත්‍රය

1201. **කුක්කුටාරාමයෙහි :**

**ඇවැත්නි, ආනන්දයෙනි, යම් හෙයකින් සදහම් පිරිහීම වේ නම් එයට කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය ද? ඇවැත්නි, ආනන්දයෙනි, යම් හෙයකින් සදහම් නො පිරිහීම වේ නම් එයට කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය දැ? යි. ඇවැත්නි භද්දයෙනි,** මැනවි මැනවි. ඇවැත්නි භද්දයෙනි, තොපගේ නුවණ සෙවීම යහපති. වැටහීම යහපති. පිළිවිසුම මැනවි. ඇවැත්නි භද්දයෙනි, තෙපි මෙසේ පුළුවුසුහු ද? "ඇවැත්නි ආනන්දයෙනි, යම් හෙයකින් සදහම් පිරිහීම වේ නම් එයට කිමෙක් හේතු ද, කිමෙක් ප්‍රත්‍යය ද, ඇවැත්නි, ආනන්දයෙනි, යම් හෙයකින් සදහම් නො පිරිහීම වේ නම් එයට කිමෙක් හේතු ද, කිමෙක් ප්‍රත්‍යය දැ'' යි. ඇවැත්නි, එසේ යි.

ඇවැත්නි, සිවුසිවටන් නො වැඩූ බැවින් නො බහුල කළ බැවින් සදහම් පිරිහීම වෙයි. ඇවැත්නි, සිවුසිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් සදහම් නො පිරිහීම වේ. කවර සතරෙක් ද යත්: ඇවැත්නි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වෙර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙච්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. වේදනාහි... සිත්හි... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. ඇවැත්නි, මේ සිවුසිවටන් නො වැඩූ බැවින් නො බහුල කළ බැවින් සදහම් පිරිහීම වේ. ඇවැත්නි, මේ සිවුසිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් සදහම් නො පිරිහීම වේ යි.

## 3. 3. 4

## සුද්ධකසුත්තං

1202. සාවත්ථියං :

චත්තාරො මෙ භික්ඛවෙ, සතිපට්ඨානා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානාති.

## 3. 3. 5

## බ්‍රාහ්මණසුත්තං

1203. සාවත්ථියං :

අථ ඛො අඤ්ඤතරො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "කො නු ඛො භො ගොතම හෙතු කො පච්චයො යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොති, කො පන භො ගොතම, හෙතු කො පච්චයො යෙන තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතී"ති.

චතුන්නං ඛො බ්‍රාහ්මණ සතිපට්ඨානානං අභාවිතත්තා අබහුලීකතත්තා තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොති. චතුන්නඤ්ච ඛො බ්‍රාහ්මණ, සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොති. කතමෙසං චතුන්නං: "ඉධ බ්‍රාහ්මණ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛො බ්‍රාහ්මණ, චතුන්නං සතිපට්ඨානානං අභාවිතත්තා අබහුලීකතත්තා තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො න චිරට්ඨිතිකො හොති. ඉමෙසඤ්ච ඛො බ්‍රාහ්මණ චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා තථාගතෙ පරිනිබ්බුතෙ සද්ධම්මො චිරට්ඨිතිකො හොතී"ති. එවං වුත්තෙ සො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගත"න්ති.

## 3. 3. 4

## සුද්ධක සූත්‍රය

1202. සැවැත්නුවර:

මහණෙනි, මේ සතිපට්ඨාන සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නා සුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. වේදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නා සුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මොහු සතර සතිපට්ඨානයෝ යි.

## 3. 3. 5

## බ්‍රාහ්මණ සූත්‍රය

1203. සැවැත්නුවර:

එකල්හි එක්තරා බමුණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කතා කොට නිමවා එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් ඒ බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: ''භවත් ගෞතමයෙනි, යම් හෙයෙකින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික නො වේ නම් එයට කිමෙක් හේතු ද? කිමෙක් ප්‍රත්‍යය ද? භවත් ගෞතමයෙනි, යම් හෙයකින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික වේ නම් එයට කිමෙක් හෙතු ද? කිමෙක් ප්‍රත්‍යය ද? යි.''

බමුණ, සිවු සීවටන් නො වැඩූ බැවින් නො බහුල කළ බැවින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික නො වෙයි. බමුණ සිවු සීවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික වේ. කවර සතරෙක් ද යත්: බමුණ, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. වේදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව් කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. බමුණ, මේ සිවුසීවටන් නො වැඩූ බැවින් නො බහුල කළ බැවින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික නො වෙයි. බමුණ, මේ සිවු සීවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් තථාගතයන් පිරිනිවි කල්හි සද්ධර්මය චිරස්ථිතික වේ යි. මෙසේ වදළ කල්හි ඒ බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය: ''භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි, භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි, ... අද පටන් දිවිහිම් කොට සරණ ගිය (මා උවසුවකු කොට දරන සේක්වා)'' යි.

## 3. 3. 6

## පදෙසසුත්තං

1204. එකං සමයං ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාමොග්ගල්ලානො ආයස්මා ච අනුරුද්ධො සාකෙතෙ විහරන්ති, කණ්ටකීවනෙ[1]. අථ ඛො ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාමොග්ගල්ලානො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතා යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මතා අනුරුද්ධෙන සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො ආයස්මා සාරිපුත්තො ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: "සෙඛො සෙඛොති[2] ආවුසො අනුරුද්ධ, වුච්චති, කිත්තාවතා නු ඛො ආවුසො සෙඛො හොතී"ති.

චතුන්නං ඛො ආවුසො සතිපට්ඨානානං පදෙසං භාවිතත්තා සෙඛො හොති. කතමෙසං චතුන්නං: ඉධාවුසො භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු –පෙ– චිත්තෙ –පෙ– ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛො ආවුසො චතුන්නං සතිපට්ඨානානං පදෙසං භාවිතත්තා සෙඛො හොතීති.

## 3. 3. 7

## සමත්තසුත්තං

1205. කණ්ටකීවනෙ :

අසෙඛො අසෙඛොති ආවුසො අනුරුද්ධ වුච්චති, කිත්තාවතා නු ඛො ආවුසො, අසෙඛො හොතීති: චතුන්නං ඛො ආවුසො, සතිපට්ඨානානං සමත්තං භාවිතත්තා අසෙඛො හොති. කතමෙසං චතුන්නං: ඉධාවුසො, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු –පෙ– චිත්තෙ –පෙ– ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං ඉමෙසං ඛො ආවුසො, චතුන්නං සතිපට්ඨානානං සමත්තං භාවිතත්තා අසෙඛො හොතීති.

---

1. කණ්ඩකිවනෙ – මජසං.
2. සෙක්ඛො සෙක්ඛොති – සයා.

## 3. 3. 6

## පදෙස සූත්‍රය

1204. එක්කලෙක ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝත් ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝත් ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝත් සාකෙත-නුවර සමීපයෙහි කණ්ටකී වනයෙහි වැඩ වෙසෙති. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝත් ආයුෂ්මත් මහමුගලන් තෙරණුවෝත් සවස්කල විවේකයෙන් නැගී සිටියාහු ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන් වෙත එළඹියහ. එළඹ ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන් සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කට යුතු කතා කොට නිමවා එකත්පසෙක හුන්හ. එකක්පසෙක හුන් ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවන්ට මෙය වදාළහ: ''ඇවැත්නි, අනුරුද්ධයෙනි, සෙඛ ය සෙඛ ය යි කියනු ලැබේ. ඇවැත්නි, කෙතෙකින් සෙඛ වේ ද?'' යි.

ඇවැත්නි, සිවු සීවටන් පිළිබඳ කොටසක් වැඩූ බැවින් සෙඛ වෙයි. කවර සතරක ද? යත්: ඇවැත්නි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙයි. වේදනා ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසෙයි. ඇවැත්නි, මේ සිවු සීවටන් පිළිබඳ කොටසක් වැඩූ බැවින් සෙඛ වේ යි.

## 3. 3. 7

## සමත්ත සූත්‍රය

1205. කණ්ටකීවනයෙහි :

ඇවැත්නි අනුරුද්ධයෙනි, අසෙඛ ය අසෙඛ යයි කියනු ලැබේ. ඇවැත්නි, කෙතෙකින් අසෙඛ වේ ද යි. ඇවැත්නි, සිවුසීවටන් මුළුමනින් වැඩූ බැවින් අසෙඛ වේ. කවර සතරෙක් ද? යත්: ඇවැත්නි, මෙහි මහණතෙමේ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙයි. වෙදනා ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. ඇවැත්නි, මේ සිවු සීවටන් මුළුමනින් වැඩූ බැවින් අසෙඛ වේ යි.

## 3. 3. 8

### ලොකසුත්තං

1206. සාකෙතනිදානං :

කතමෙසං ආයස්මා අනුරුද්ධො[1] ධම්මානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තොති? "චතුන්නං ඛො ආවුසො, සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තො. කතමෙසං චතුන්නං: ඉධාහං ආවුසො, කායෙ කායානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු –පෙ– චිත්තෙ –පෙ– ධම්මෙසු ධම්මානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛො ආවුසො චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා මහාභිඤ්ඤතං පත්තො. ඉමෙසඤ්ච ඛො පනාහං ආවුසො චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා සහස්සං ලොකං අභිජානාමී"ති.

## 3. 3. 9

### සිරිවඩ්ඪසුත්තං

1207. එකං සමයං ආයස්මා ආනන්දො රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන සිරිවඩ්ඪො ගහපති ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො සිරිවඩ්ඪො ගහපති අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: "එහි ත්වං අම්භො පුරිස, යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කම, උපසඞ්කමිත්වා මම වචනෙන ආයස්මතො ආනන්දස්ස පාදෙ සිරසා වන්ද, සිරිවඩ්ඪො භන්තෙ ගහපති ආබාධිකො හොති දුක්ඛිතො බාළ්හගිලානො, සො ආයස්මතො ආනන්දස්ස පාදෙ සිරසා වන්දතී"ති. එවඤ්ච වදෙහි:[2] සාධු කිර භන්තෙ, ආයස්මා ආනන්දො යෙන ච සිරිවඩ්ඪස්ස ගහපතිනො නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායා"ති.

---

1. ආවුසො අනුරුද්ධ – මජසං.
2. වදෙහි – සීමු, සී 2, වදේහි – සී 1.

## 3. 3. 8

## ලෝක සූත්‍රය

1206. **කණ්ටකීවනයෙහි**:

ආයුෂ්මත් **අනුරුද්ධයෝ** කවර දහම් වැඩූ බැවින් බහුල කළ බැවින් මහාභිඥ (මහනුවණැති) බවට පැමිණියෝ ද යි. ඇවැත්නි, සිවුසිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මහනුවණැති බවට පැමිණියෙමි යි. කවර සතරෙක් ද යත්: ඇවැත්නි, මෙහි මම කයෙහි කය අනු ව දක්නාසුලුව කෙලෙස් තවන වැර ඇතියෙම් මනාදැනුම් ඇතියෙම් සිහි ඇතියෙම් කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙමි. වේදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලුව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇතිව සිහි ඇතිව දහම්ලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසෙමි. ඇවැත්නි, මේ සිවු සිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මහනුවණැති බවට පැමිණියෙමි. ඇවැත්නි, මේ සිවුසිවටන් වැඩූ බැවින් බහුල කළ බැවින් මම දහසක් ලොව වෙසෙසින් දනිමි යි.

## 3. 3. 9

## සිරිවඩ්ඪ සූත්‍රය

1207. එක්සමයෙක ආයුෂ්මත් **ආනන්ද තෙරණුවෝ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප** නම් **වෙළුවනාරාමයෙහි** වැඩවෙසෙති. එසමයෙහි **සිරිවඩ්ඪ** ගැහැවි හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩි සේ ගිලන් වූයේ වෙයි. එකල්හි සිරිවඩ්ඪ ගැහැවි එක්තරා පුරුෂයකු ඇමතී ය. එම්බල පුරුෂය, එව. තෝ ආයුෂ්මත් **ආනන්ද තෙරණුවන්** වෙත එළඹෙව. එළඹ "වහන්ස, සිරිවඩ්ඪ ගැහැවි හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩි සේ ගිලන් වූයේ වෙයි. හෙතෙමේ ආනන්ද ආයුෂ්මතුන් වහන්සේගේ පා හිසින් වදී" යි මා වදනින් ආයුෂ්මත් ආනන්ද තෙරණුවන්ගේ පා හිසින් වඳුව, මෙසේත් කියව: වහන්ස, ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ අනුකම්පා පිණිස සිරිවඩ්ඪ ගැහැවිහුගේ නිවෙස වෙත එළඹෙන සේක් නම් මැනැවැ යි.

"එවං භන්තෙ"ති ඛො සො පුරිසො සිරිවඩ්ඪස්ස ගහපතිස්ස පටිස්සුත්වා යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං ආනන්දං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො ආයස්මන්තං ආනන්දං එතදවොච: "සිරිවඩ්ඪො භන්තෙ, ගහපති ආබාධිකො දුක්ඛිතො බාළ්හගිලානො, සො ආයස්මතො ආනන්දස්ස පාදෙ සිරසා වන්දති, එවඤ්ච වදෙති: "සාධු කිර භන්තෙ, ආයස්මා ආනන්දො යෙන සිරිවඩ්ඪස්ස ගහපතිස්ස නිවෙසනං, තෙනුපසඞ්කමතු, අනුකම්පං උපාදායා"ති. අධිවාසෙසි ඛො ආයස්මා ආනන්දො තුණ්හීභාවෙන.

අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන සිරිවඩ්ඪස්ස ගහපතිස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො ආයස්මා ආනන්දො සිරිවඩ්ඪං ගහපතිං එතදවොච: කච්චි තෙ ගහපති ඛමනීයං, කච්චි යාපනීයං, කච්චි දුක්ඛා වෙදනා පටික්කමන්ති නො අභික්කමන්ති, පටික්කමොසානං පඤ්ඤායති නො අභික්කමොති? න මෙ භන්තෙ ඛමනීයං, න යාපනීයං බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති, අභික්කමොසානං පඤ්ඤායති නො පටික්කමොති. තස්මාතිහ තෙ ගහපති, එවං සික්ඛිතබ්බං: "කායෙ කායානුපස්සී විහරිස්සාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරිස්සාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සන්ති" එවං හි තෙ ගහපති, සික්ඛිතබ්බන්ති.

යෙ'මෙ භන්තෙ, භගවතා චත්තාරො සතිපට්ඨානා දෙසිතා, සංවිජ්ජන්ති තෙ ධම්මා[1] මයි. අහඤ්ච තෙසු ධම්මෙසු සන්දිස්සාමි. අහං භන්තෙ, කායෙ කායානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. යානි චිමානි භන්තෙ, භගවතා පඤ්චොරම්භාගියානි සංයොජනානි දෙසිතානි, නාහං තෙසං කිඤ්චි අත්තනි අප්පහීනං සමනුපස්සාමීති. ලාභා තෙ ගහපති, සුලද්ධං තෙ ගහපති, අනාගාමිඵලං තයා ගහපති, බ්‍යාකතන්ති.

1. සංවිජ්ජන්තෙ එතෙ ධම්මා මයි සිමු, සී 1, 2.

"එසේ ය හිමියනි" යි ඒ පුරිස් සිරිවඩ්ඪ ගැහැවිහට පිළිතුරු දී ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් ආනන්ද තෙරණුවන් වැඳ එකත්පස් ව හුන්නේ ය. එකත්පස් ව හුන් ඒ පුරිස් ආයුෂ්මත් අනඳතෙරණුවන්ට මෙය සැලකෙළේ ය: වහන්ස, සිරිවඩ්ඪ ගැහැවි තෙමේ හටගත් ආබාධ ඇත්තේ ය. දුකට පැමිණියේ ය. දැඩි සේ ගිලන් වූයේ ය. හෙතෙමේ ආනන්ද ආයුෂ්මතුන් වහන්සේගේ පා හිසින් වඳියි. මෙසේත් කියයි: "වහන්ස, ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ අනුකම්පා පිණිස සිරිවඩ්ඪ ගැහැවිහුගේ නිවෙස වෙත එළඹෙන සේක්නම් මැනවැ" යි. ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ නිහඬබැවින් ඉවසූහ.

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පෙරවරු හැඳ පෙර ව පාසිවුරු ගෙන සිරිවඩ්ඪ ගැහැවිහුගේ නිවෙස වෙත එළඹියහ. එළඹ පැන වූ අස්නෙහි වැඩහුන්හ. වැඩහිඳ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ සිරිවඩ්ඪ ගැහැවිහට මෙය වදළහ: ගැහැවි, කිම තොපට ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? කිම දුක් වේදනාවෝ අඩු වෙද්ද? වැඩි නො වෙද් ද? ඔවුන්ගේ අඩු වීම පැනේ ද? වැඩි වීමෙක් නො පැනේ ද? යි. වහන්ස, මට ඉවසිය නො හැක්ක. යැපිය නො හැකි. මාගේ දැඩි දුක් වේදනාවෝ වැඩි වෙති. අඩු නො වෙත්. ඔවුන්ගේ වැඩි වීම පැනෙයි, අඩු වීමෙක් නො පැනේ යි. ගැහැවි, එහෙයින් මෙහි ලා තොප විසින් මෙසේ හික්මිය යුතු: "කයෙහි කය අනු ව දක්නාසුලුව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇතිව සිහි ඇතිව කාලෙවිහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙන්නෙමි. වේදනා ... සිත්හි .. දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනාදැනුම් ඇතිව සිහි ඇතිව දහම්ලෙවිහි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙන්නෙමි" යි. ගැහැවි, මෙසේ ම තොප විසින් හික්මිය යුතු යි.

වහන්ස, යම් මේ සිවුසිවටන්හු භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දහු ද, ඒ දහම්හු මා කෙරෙහි ඇතියහ. මම ද ඒ දහම්හි මැනවින් දිස්වෙමි. වහන්ස, මම කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇත්තෙම් මනාදැනුම් ඇත්තෙම් සිහි ඇත්තෙම් කාලෙවිහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙමි. වේදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නා-සුලුව කෙලෙස් තවන වැර ඇත්තෙම් මනාදැනුම් ඇත්තෙම් සිහි ඇත්තෙම් දහම්ලෙවිහි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙමි. වහන්ස, යම් මේ පස්ඹ ඔරම්භාගියසංයෝජන කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දහු නම් ඔවුන-තුරෙන් ප්‍රහීණ නො වූ කිසිවක් තමා කෙරෙහි මම නො ම දකිම් යි. ගැහැවි, තොපට ලාභයෙකි. ගැහැවි, තොපට මනා ලැබීමෙකි. ගැහැවි, අනාගාමි ඵලය තොප විසින් පවසන ලදැ යි.

## 3. 3. 10

## මානදින්නසුත්තං

1208. එකං සමයං ආයස්මා ආනන්දො රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන මානදින්නො ගහපති ආබාධිකො හොති, දුක්ඛිතො බාළ්හගිලානො. අථ ඛො මානදින්නො ගහපති අඤ්ඤතරං පුරිසං ආමන්තෙසි: –පෙ– එවරූපාය චාහං භන්තෙ, දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො කායෙ කායානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු –පෙ– චිත්තෙ –පෙ– ධම්මෙසු ධම්මානුපස්සී විහරාමි ආතාපී සම්පජානො සතිමා විනෙය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. යානි චි'මානි භන්තෙ භගවතා පඤ්චොරම්භාගියානි සංයොජනානි දෙසිතානි, නාහං භන්තෙ තෙසං කිඤ්චි අත්තනි අප්පහීනං සමනුපස්සාමී''ති. ලාභා තෙ ගහපති සුලද්ධං තෙ ගහපති ''අනාගාමිඵලං තයා ගහපති, බ්‍යාකතන්ති.''

### සීලට්ඨිතිවග්ගො තතියො.

**තත්‍රුද්දානං:**

සීලං ඨිති පරිහානං සුද්ධකං බ්‍රාහ්මණෙන ච
පදෙසං සමත්තං ලොකො සිරිවඩ්ඪො මානදින්නොති.

## 3. 3. 10

## මානදින්න සූත්‍රය

1208. එක්කලෙක ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාස නම් වෙළුවනාරාමයෙහි වැඩ වෙසෙති. එසමයෙහි මානදින්න ගැහැවි හටගත් ආබාධ ඇත්තේ දුකට පැමිණියේ දැඩි සේ ගිලන් වූයේ වෙයි. එකල්හි මානදින්න ගැහැවි එක්තරා පුරුෂයකු ඇමතී ය. ... වහන්ස, මම මෙබඳු දුක්වෙදනාවකින්නුදු පහස්නා ලද්දෙම් කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇත්තෙම් මනාදැනුම් ඇත්තෙම් සිහි ඇත්තෙම් කාලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසෙමි. වෙදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලුව කෙලෙස් තවන වෙර ඇත්තෙම් මනාදැනුම් ඇත්තෙම් සිහි ඇත්තෙම් දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසෙමි. වහන්ස, යම් මෙ පඤ්ච ඔරම්භාගිය සංයෝජන කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලදහු නම් වහන්ස, ඔවුනතර අප්‍රහීණ කිසිවක් තමා කෙරෙහි මම නො ම දක්මි යි. ගැහැවි, තොපට ලාභයෙකි. ගැහැවි, තොපට මනා ලැබ්මෙකි. ගැහැවි, තොප විසින් අනාගාමිඵලය පවසන ලද යි.

## තෙවැනි සීලට්ඨිතිවර්ග යි

**එහි සූත්‍ර නාමාවලිය:**

සීල, ඨිති, පරිහාණ, සුද්ධක, බ්‍රාහමණ, පදෙස, සමත්ත, ලොක සිරිවඩ්ඪ, මානදින්නයි සූත්‍රාන්ත දශයෙකි යි.

# 4. අනනුස්සුතවග්ගො

## 3. 4. 1

## අනනුස්සුතසුත්තං

1209. සාවත්ථියං :

අයං කායෙ කායානුපස්සනා'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. සා ඛො පනායං කායෙ කායානුපස්සනා භාවෙතබ්බා'ති මෙ භික්ඛවෙ -පෙ- භාවිතා'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. අයං වෙදනාසු වෙදනානුපස්සනා'ති -පෙ- අයං චිත්තෙ චිත්තානුපස්සනා'ති -පෙ- අයං ධම්මෙසු ධම්මානුපස්සනා'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි; විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, සා ඛො පනායං ධම්මෙසු ධම්මානුපස්සනා භාවෙතබ්බා'ති මෙ භික්ඛවෙ -පෙ- භාවිතා'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදී'ති.

## 3. 4. 2

## විරාගසුත්තං

1210. චත්තාරොමෙ භික්ඛවෙ, සතිපට්ඨානා භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානා භාවිතා බහුලීකතා එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්තීති.

# 4. අනනුස්සුත වර්ගය

## 3. 4. 1

## අනනුස්සුත සූත්‍රය

1209. සැවැත්නුවර:

මහණෙනි, මේ කයෙහි කය අනුව දුක්ම ය යි මා විසින් පෙර නො ඇසූවිරූ දහම්හි ඇස පහළ විය, නැණ පහළ විය. පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ විය. මහණෙනි, ඒ මේ කයෙහි කය අනුව දුක්ම වැඩිය යුතු ය යි මා විසින් ... මහණෙනි, වඩන ලදු යි මා විසින් පෙර නො ඇසූවිරූ දහම්හි ඇස පහළ විය. නැන පහළ විය. පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ විය. මේ වෙදනාවන්හි වෙදනා අනුව දුක්ම යයි. ... මේ සිත්හි සිත් අනුව දුක්ම යයි ... මහණෙනි, මේ දහම්හි දහම් අනුව දුක්ම යයි මා විසින් පෙර නො ඇසූවිරූ දහම්හි ඇස පහළ විය. නැන පහළ විය. පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ විය. මහණෙනි; ඒ මේ දහම්හි දහම් අනුව දුක්ම වැඩිය යුතු යයි මා විසින් ... මහණෙනි, වඩන ලදු යි මා විසින් පෙර නො ඇසූවිරූ දහම්හි ඇස පහළ විය. නැන පහළ විය. පැන පහළ විය. විදු පහළ විය. එළිය පහළ වී යයි.

## 3. 4. 2

## විරාග සූත්‍රය

1210. මහණෙනි, මේ සිවුසිවටන්හු වඩන ලද්දහු බහුල කරන ලද්දහු ඒකාන්ත නිර්වෙදය විරාගය නිරොධය කෙලෙශව්‍යපශමය විශිෂ්ටඥානය චතුස්සත්‍යාවබොධය නිර්වාණය පිණිස පවතිත්. කවර සිවුසිවටන්හු ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙවහි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. වෙදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙවහි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙස්. මහණෙනි, මේ සිවුසිවටන්හු වඩන ලදහු බහුල කරන ලදහු එකාන්ත නිර්වෙදය විරාගය නිරොධය ක්ලේශව්‍යපශමය විශිෂ්ටඥානය චතුස්සත්‍යාවබොධය නිර්වාණය පිණිස පවතිත් යි.

## 3. 4. 3

## විරද්ධසුත්තං

1211. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානා විරද්ධා විරද්ධො තෙසං අරියො[1] මග්ගො සම්මා දුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානා ආරද්ධා, ආරද්ධො තෙසං අරියො මග්ගො සම්මා දුක්ඛක්ඛයගාමී. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, ඉමෙ චත්තාරො සතිපට්ඨානා විරද්ධා, විරද්ධො තෙසං අරියො මග්ගො සම්මා දුක්ඛක්ඛයගාමී. යෙසං කෙසඤ්චි භික්ඛවෙ, ඉමෙ චත්තාරො සතිපට්ඨානා ආරද්ධා, ආරද්ධො තෙසං අරියො මග්ගො සම්මා දුක්ඛක්ඛයගාමීති.

## 3. 4. 4

## භාවිතසුත්තං

1212. චත්තාරොමෙ භික්ඛවෙ, සතිපට්ඨානා භාවිතා බහුලීකතා අපාරා පාරං ගමනාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී -පෙ- වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානා භාවිතා බහුලීකතා අපාරා පාරං ගමනාය සංවත්තන්තීති.

## 3. 4. 5

## සතොසුත්තං

1213. සතො භික්ඛවෙ, භික්ඛු විහරෙය්‍ය සම්පජානො, අයං වො අම්හාකං අනුසාසනී. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සතො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී -පෙ- වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සතො හොති. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සම්පජානො හොති: ඉධ භික්ඛවෙ, භික්ඛුනො විදිතා වෙදනා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. විදිතා විතක්කා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. විදිතා සඤ්ඤා උප්පජ්ජන්ති, විදිතා උපට්ඨහන්ති, විදිතා අබ්භත්ථං ගච්ඡන්ති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සම්පජානො හොති. සතො භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය සම්පජානො, අයං වො අම්හාකං අනුසාසනීති.

---

1. අරියො අට්ඨඞ්ගිකො මග්ගො - සයා.

## 3. 4. 3
## විරද්ධ සූත්‍රය

1211. මහණෙනි, යම් කිසි කෙනකුන් විසින් සිව්සතිපට්ඨානයෝ වරද්දන ලද්දාහු නම් ඔවුන් විසින් මැනවින් දුක් ගෙවීමට යන අරිමග වරද්දන ලද්දේ ය. මහණෙනි, යම් කිසි කෙනකුන් විසින් සිව්සතිපට්ඨානයෝ අරඹන ලද්දාහු නම් ඔවුන් විසින් මැනවින් දුක් ගෙවීමට යන අරිමග අරඹන ලද්දේ ය. කවර සිව්සතිපට්ඨානයෝ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ කයෙහි කය අනුව දක්නා සුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. වේදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, යම් කිසි කෙනකුන් විසින් මේ සිව්සතිපට්ඨානයෝ වරද්දන ලද්දාහු නම් ඔවුන් විසින් මැනවින් දුක් ගෙවීමට යන අරිමග වරද්දන ලද්දේ ය. මහණෙනි, යම් කිසි කෙනකුන් විසින් මේ සිව්සතිපට්ඨානයෝ අරඹන ලද්දාහු නම් ඔවුන් විසින් මැනවින් දුක් ගෙවීමට යන අරිමග අරඹන ලද්දේ යි.

## 3. 4. 4
## භාවිත සූත්‍රය

1212. මහණෙනි, මේ සතරසතිපට්ඨානයෝ වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු මෙතෙරින් එතෙරට යෑම පිණිස පවතිත්, කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව .. වේදනාහි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, මේ සතර සතිපට්ඨානයෝ වඩන ලද්දාහු බහුල කරන ලද්දාහු මෙතෙරින් එතෙරට යෑම පිණිස පවතිත් යි.

## 3. 4. 5
## සතො සූත්‍රය

1213. මහණෙනි, මහණ සිහි ඇති ව මනා දැනුම් ඇති ව වෙසෙන්නේය. මෙය තොපට අපගේ අනුසාසනා යි. මහණෙනි, කෙසේ නම් මහණ සිහි ඇත්තේ වේ ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව ... විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, මෙසේ මහණ සිහි ඇත්තේ වෙයි. මහණෙනි, කෙසේ නම් මහණ මනා දැනුම් ඇත්තේ වේ ද යත්: මහණෙනි, මෙහි මහණහට වේදනාවෝ දන්නා ලද්දාහු උපදිත්. දන්නා ලද්දාහු එළඹ සිටිත්. දන්නා ලද්දාහු වැනසීමට යෙත්. විතර්කයෝ දන්නා ලද්දාහු උපදිත්. දන්නා ලද්දාහු එළඹ සිටිත්. දන්නා ලද්දාහු වැනසීමට යෙත්. සංඥාවෝ දන්නා ලද්දාහු උපදිත්. දන්නා ලද්දාහු එළඹ සිටිත්. දන්නා ලද්දාහු වැනසීමට යෙත්. මහණෙනි, මෙසේ මහණ මනා දැනුම් ඇත්තේ වෙයි. මහණෙනි, මහණ සිහි ඇති ව මනා දැනුම් ඇති ව වෙසෙන්නේ ය. මේ තොපට අපගේ අනුශාසනා යි.

## 3. 4. 6

### අඤ්ඤාසුත්තං

1214. චත්තාරො මෙ භික්ඛවෙ, සතිපට්ඨානා, කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී -පෙ- වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං සතිපට්ඨානානං භාවිතත්තා බහුලීකතත්තා ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: ‘‘දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා’’ති.

## 3. 4. 7

### ඡන්දසුත්තං

1215. චත්තාරොමෙ භික්ඛවෙ, සතිපට්ඨානා කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස කායෙ කායනුපස්සිනො විහරතො යො කායස්මිං ඡන්දො සො පහීයති. ඡන්දස්ස පහානා අමතං සච්ඡිකතං හොති. වෙදනාසු -පෙ- යො වෙදනාසු[1] ඡන්දො සො පහීයති. ඡන්දස්ස පහානා අමතං සච්ඡිකතං හොති. චිත්තෙ -පෙ- යො චිත්තස්මිං ඡන්දො සො පහීයති. ඡන්දස්ස පහානා අමතං සච්ඡිකතං හොති. ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස ධම්මෙසු ධම්මානුපස්සිනො විහරතො යො ධම්මෙසු ඡන්දො සො පහීයති, ඡන්දස්ස පහානා අමතං සච්ඡිකතං හොතීති.

## 3. 4. 8

### පරිඤ්ඤාතසුත්තං

1216. චත්තාරොමෙ භික්ඛවෙ, සතිපට්ඨානා.. කතමෙ චත්තාරො; ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස කායෙ කායානුපස්සිනො විහරතො කායො පරිඤ්ඤාතො හොති. කායස්ස පරිඤ්ඤාතත්තා අමතං සච්ඡිකතං හොති. වෙදනාසු -පෙ- වෙදනා පරිඤ්ඤාතා හොන්ති. වෙදනානං[2] පරිඤ්ඤාතත්තා අමතං සච්ඡිකතං හොති. චිත්තෙ -පෙ- චිත්තං පරිඤ්ඤාතං හොති. චිත්තස්ස පරිඤ්ඤාතත්තා අමතං සච්ඡිකතං හොති. ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. තස්ස ධම්මෙසු ධම්මානුපස්සිනො විහරතො ධම්මා පරිඤ්ඤාතා හොන්ති, ධම්මානං පරිඤ්ඤාතත්තා අමතං සච්ඡිකතං හොතීති.

---

1. වෙදනාය - සීමු.
2. වෙදනාය - සීමු.

## 3. 4. 6

## අඤ්ඤා සූත්‍රය

1214. මහණෙනි, මේ සතිපට්ඨාන සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව ... විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මේ සතර සතිපට්ඨාන වැඩූ බැවින් බහුල කළ බැවින් උභය ඵලයන් අතුරෙන් එක්තරා ඵලයක් කැමති විය යුතු යි. දිටුදැමියෙහි රහත්බව හෝ උපාදානශේෂ ව ඇති කල්හි අනගැමි බව හෝ යි.

## 3. 4. 7

## ඡන්ද සූත්‍රය

1215. මහණෙනි, මේ සතිපට්ඨාන සතරකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. කයෙහි කය අනුව දක්නාසුලු ව වෙසෙන ඔහුට කයෙහි යම් තෘෂ්ණාඡන්දයෙක් වේ නම් එය ප්‍රහීණ වේ. ඡන්දය ප්‍රහීණ වීමෙන් නිවන පසක් කරන ලද්දේ වේ. වෙදනාහි ... වෙදනායෙහි යම් තෘෂ්ණාඡන්දයෙක් වේ නම් එය ප්‍රහීණ වේ. ඡන්දය ප්‍රහීණ වීමෙන් නිවන පසක්කරන ලද්දේ වේ සිත්හි ... සිත්හි යම් තෘෂ්ණාඡන්දයෙක් වේ නම් එය ප්‍රහීණ වේ. ඡන්දය ප්‍රහීණ වීමෙන් නිවන පසක්කරන ලද්දේ වේ. දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. දහම්හි දහම් අනුව දක්නාසුලු ව වෙසෙන ඔහුට දහම්හි යම් තෘෂ්ණාඡන්දයෙක් වේ නම් එය ප්‍රහීණ වේ. ඡන්දය ප්‍රහීණ වීමෙන් නිවන පසක්කරන ලද්දේ වේ යි.

## 3. 4. 8

## පරිඤ්ඤාත සූත්‍රය

1216. මහණෙනි, මේ සතිපට්ඨාන සතරෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. කයෙහි කය අනුව දක්නාසුලු ව වෙසෙන ඔහු විසින් කය පිරිසිඳ දන්නා ලද්දේ වෙයි. කය පිරිසිඳ දත් බැවින් නිවන පසක් කරන ලද්දේ වේ. වේදනාහි ... වේදනාව පිරිසිඳ දන්නා ලද්දී වේ. වේදනාව පිරිසිඳ දත් බැවින් නිවන පසක් කරන ලද්දේ වේ. සිත්හි ... සිත පිරිසිඳ දන්නා ලද්දේ වේ. සිත පිරිසිඳ දත් බැවින් නිවන පසක්කරන ලද්දේ වේ. දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. දහම්හි දහම් අනුව දක්නාසුලු ව වෙසෙන ඔහු විසින් දහම්හු පිරිසිඳ දන්නා ලද්දහු වෙති. දහම් පිරිසිඳ දත් බැවින් නිවන පසක්කරන ලද්දේ වේ යි.

## 3. 4. 9

### භාවනාසුත්තං

1217. චතුන්නං භික්ඛවෙ, සතිපට්ඨානානං භාවනං දෙසිස්සාමි. තං සුණාථ. කතමා ච භික්ඛවෙ, චතුන්නං සතිපට්ඨානානං භාවනා: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අයං ඛො භික්ඛවෙ,[1] චතුන්නං සතිපට්ඨානානං භාවනාති.

## 3. 4. 10

### විභඞ්ගසුත්තං

1218. සතිපට්ඨානඤ්ච වො භික්ඛවෙ, දෙසිස්සාමි සතිපට්ඨානභාවනඤ්ච සතිපට්ඨානභාවනාගාමිනිඤ්ච පටිපදං. තං සුණාථ. කතමඤ්ච භික්ඛවෙ, සතිපට්ඨානං: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉදං වුච්චති භික්ඛවෙ සතිපට්ඨානං.

කතමා ච භික්ඛවෙ, සතිපට්ඨානභාවනා: ඉධ භික්ඛවෙ, භික්ඛු සමුදයධම්මානුපස්සී කායස්මිං විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වයධම්මානුපස්සී කායස්මිං විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. සමුදයවයධම්මානුපස්සී කායස්මිං විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. සමුදයධම්මානුපස්සී වෙදනාසු විහරති -පෙ- වයධම්මානුපස්සී වෙදනාසු විහරති -පෙ- සමුදයවයධම්මානුපස්සී වෙදනාසු විහරති -පෙ- සමුදයධම්මානුපස්සී චිත්තස්මිං

1. අයං භික්ඛවෙ - සී 1, 2.

## 3. 4. 9

## භාවනා සූත්‍රය

1217. මහණෙනි, සිවු සිවටන් වැඩීම දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, සිවු සිවටන් වැඩීම කවරේ ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙයේ. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙයේ. මහණෙනි, මේ සිවුසිවටන් වැඩීම යි.

## 3. 4. 10

## විභඞ්ග සූත්‍රය

1218. මහණෙනි, සතිපට්ඨානයත් සතිපට්ඨාන වැඩීමත් සතිපට්ඨාන වැඩීමට යන පිළිවෙතත් තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, සතිපට්ඨාන කවරේ ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනාදැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙයේ. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා-දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරුකොට වෙයේ. මහණෙනි, මේ සතිපට්ඨාන යයි කියනු ලැබේ.

මහණෙනි, සතිපට්ඨාන වැඩීම කවරේ ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි හටගැනුම් සබාවය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙයේ. කයෙහි වැනසුම් සැහැවි පුනපුනා දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙයේ. කයෙහි හටගැනුම් සබාවය හා වැනසුම් සබාවය පුනපුනා දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙයේ. වේදනාවන්හි හටගැනුම් සබාවය අනුව දක්නාසුලු ව ... වෙයේ. වේදනාවන්හි වැනසුම් සබාවය අනු ව දක්නාසුලු ව ... වෙයේ. වේදනාවන්හි හටගැනුම් සබාවය හා වැනසුම් සබාවය අනුව දක්නාසුලු ව ... වෙයේ ... සිත්හි

විහරති -පෙ- වයධම්මානුපස්සී චිත්තස්මිං විහරති -පෙ- සමුදයවයධම්මානුපස්සී චිත්තස්මිං විහරති -පෙ- සමුදයධම්මානුපස්සී ධම්මෙසු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වයධම්මානුපස්සී ධම්මෙසු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. සමුදයවයධම්මානුපස්සී ධම්මෙසු විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අයං වුච්චති භික්ඛවෙ සතිපට්ඨානභාවනා.

කතමා ච භික්ඛවෙ, සතිපට්ඨානභාවනාගාමිනී පටිපදා: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි. අයං වුච්චති භික්ඛවෙ, සතිපට්ඨානභාවනාගාමිනීපටිපදාති.

## අනනුස්සුතවග්ගො චතුත්ථො.

තස්සුද්දානං :

අනනුස්සුතං විරාගො ච විරද්ධං භාවිතො සතො
අඤ්ඤා ච ඡන්දො පරිඤ්ඤාතො භාවනා විභඞ්ගෙන චාති.

හටගැනුම් ස්වභාවය පුනපුනා දක්නාසුලු ව ... වෙසේ. සිත්හි වැනසුම් ස්වභාවය පුනපුනා දක්නාසුලු ව ... වෙසේ. සිත්හි හටගැනුම් ස්වභාවය හා වැනසුම් ස්වභාවය පුනපුනා දක්නාසුලු ව වෙසේ. දහම්හි හටගැනුම් ස්වභාවය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. දහම්හි වැනසුම් ස්වභාවය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. දහම්හි හටගැනුම් ස්වභාවය හා වැනසුම් ස්වභාවය පුනපුනා දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මෙ සතිපට්ඨාන වැඩීමය යි කියනු ලැබේ.

මහණෙනි, සතිපට්ඨාන වැඩීමට යන පිළිවෙත කවරේද යත්: මෙ අරිඅටඟිමග මැ යි. එනම්: සම්මාදිට්ඨි ... සම්මාසමාධි යි. මහණෙනි, මේ සතිපට්ඨාන වැඩීමට යන පිළිවෙතැ යි කියනු ලැබේ යි.

## සිවුවැනි අනනුස්සුතවග් යි.

**එහි සූත්‍රනාමාවලිය:**

අනනුස්සුත, විරාග, විරද්ධ, භාවිත, සතො, අඤ්ඤ, ඡන්ද, පරිඤ්ඤාත, භාවනා යන සූත්‍ර නවය විභඞ්ග සූත්‍රයෙන් දසයෙක් වේ යි.

# 5. අමතවග්ගො

## 3. 5. 1

### අමතසුත්තං

1219. චතූසු භික්ඛවෙ, සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තා විහරථ. මා වො අමතං පනස්ස. කතමෙසු චතූසු: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසු භික්ඛවෙ, චතූසු සතිපට්ඨානෙසු සුපට්ඨිතචිත්තා විහරථ, මා වො අමතං පනස්සාති.

## 3. 5. 2

### සමුදයසුත්තං

1220. සාවත්ථියං :

චතුන්නං භික්ඛවෙ, සතිපට්ඨානානං සමුදයඤ්ච අත්ථගමඤ්ච දෙසිස්සාමි. තං සුණාථ. කො ච භික්ඛවෙ, කායස්ස සමුදයො. ආහාරසමුදයා කායස්ස සමුදයො[1], ආහාරනිරොධා කායස්ස අත්ථගමො. ඵස්සසමුදයා වෙදනානං සමුදයො.[2] ඵස්සනිරොධා වෙදනානං අත්ථගමො. නාමරූපසමුදයා චිත්තස්ස සමුදයො. නාමරූපනිරොධා චිත්තස්ස අත්ථගමො. මනසිකාරසමුදයා ධම්මානං සමුදයො. මනසිකාරනිරොධා ධම්මානං අත්ථගමොති.

## 3. 5. 3

### මග්ගසුත්තං

1221. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. එකමිදාහං භික්ඛවෙ, සමයං උරුවෙලායං විහරාමි, නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‍රොධෙ පඨමාභිසම්බුද්ධො. තස්ස මය්හං භික්ඛවෙ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි:

1. කායසමුදයො - සීමු.
2. වෙදනාසමුදයො - සීමු, සී 1.

# 5. අමත වර්ගය

## 3. 5. 1

## අමත සූත්‍රය

1219. මහණෙනි, සිවු සිවටන්හි එළඹ සිටි සිත් ඇති ව වෙසෙවු. තොපට තිවන නො නැසේවා. කවර සිවු සිවටන්හි ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිළොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙයි. මහණෙනි, මෙ සිවු සිවටන්හි එළඹ සිටි සිත් ඇති ව වෙසෙවු. තොපට තිවන නො නැසේවා යි.

## 3. 5. 2

## සමුදය සූත්‍රය

1220. සැවැත්නුවර :

මහණෙනි, සිවුසිවටන් හි සමුදයත් අත්‍ථගමයත් දේශනා කරන-නෙමි. එය අසවු. මහණෙනි, කයෙහි සමුදය කිමෙක් ද යත්: ආහාරසමුදයයෙන් කයෙහි හට ගැනීම වේ, ආහාරනිරොධයෙන් කයෙහි අස්තඞගමය වේ. ඵස්ස සමුදයයෙන් වෙදනාවන්ගේ හට ගැනීම වේ. ඵස්ස නිරොධයෙන් වෙදනාවන්ගේ අස්තඞගමය වේ. නාමරූපසමුදයයෙන් සිතේහටගැනීම වේ. නාමරූපනිරොධයෙන් සිතේ අස්තඞගමය වේ. මනසිකාරසමුදයයෙන් ධර්මයන්ගේ හටගැනීම වේ. මනසිකාරනිරොධ-යෙන් ධර්මයන්ගේ අස්තඞගමය වේ යි.

## 3. 5. 3

## මග්ග සූත්‍රය

1221. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේපිඩු සිටුහුගේ දෙව්රම්හි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන් ඇමතූ සේක: මහණෙනි, මම බුදු ව පළමු කොට එක්සමයෙක උරුවෙල්දනවුහි නෙරඤ්ජා ගංඉවුරෙහි අජපල්නුගරුක මුල්හි වෙසෙමි. මහණෙනි, එකලා වූ විවේකයෙන් යුත් ඒ මට මෙබඳු විතතවිතර්කයෙක් පහළ විය:

ඒකායනො'යං[1] මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං[2] සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය, යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: කායෙ වා භික්ඛු කායානුපස්සී විහරෙය්‍ය, ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු වා භික්ඛු වෙදනානුපස්සී විහරෙය්‍ය -පෙ- චිත්තෙ වා භික්ඛු චිත්තානුපස්සී විහරෙය්‍ය -පෙ- ධම්මෙසු වා භික්ඛු ධම්මානුපස්සී විහරෙය්‍ය ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඒකායනො'යං මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා''ති.[3]

අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මා සහම්පති මම චෙතසා චෙතො පරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය. එවමෙවං බ්‍රහ්මලොකෙ අන්තරහිතො මම පුරතො පාතුරහොසි. අථ ඛො භික්ඛවෙ, බ්‍රහ්මා සහම්පති ඒකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙනාහං තෙනඤ්ජලිං පනාමෙත්වා මං එතදවොච:

එවමෙතං භගවා, එවමෙතං සුගත, ඒකායනො'යං භන්තෙ, මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: කායෙ වා භන්තෙ, භික්ඛු කායානුපස්සී විහරෙය්‍ය ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු වා භන්තෙ භික්ඛු වෙදනානුපස්සී විහරෙය්‍ය -පෙ- චිත්තෙ වා භන්තෙ භික්ඛු චිත්තානුපස්සී විහරෙය්‍ය -පෙ- ධම්මෙසු වා භන්තෙ, භික්ඛු ධම්මානුපස්සී විහරෙය්‍ය ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඒකායනො'යං භන්තෙ මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානාති. ඉදමවොච භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති ඉදං වත්වා අථාපරං එතදවොච:

ඒකායනං ජාතිඛයන්තදස්සී[4]
මග්ගං පජානාති හිතානුකම්පී
එතෙන මග්ගෙන අතංසු[5] පුබ්බෙ
තරිස්සන්ති යෙ ච තරන්ති ඔඝන්ති.

1. ඒකායනවායං - සයා, මජසං.
2. සොකපරිදෙවානං - මජසං, සයා.
3. සතිපට්ඨානා - සයා.
4. ඛයඤ්ච දස්සී - සී 2.
5. අතරිංසු - සයා, තරිංසු, මජසං.

''යම් මේ සතරසතිපට්ඨාන කෙනෙක් වෙත් නම් සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස ශෝකපරිදේවයන් ඉක්මවීම පිණිස දුක් දොම්නස් දුරු කිරීම පිණිස අරිඅටඟිමඟ අවබෝධ කරනු පිණිස නිවන පසක්කිරීම පිණිස මේ එක ම මඟ ය. කවර සතරෙක් ද යත්: මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇතිව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසෙන්නේ ය. මහණ විඳුම්හි හෝ විඳුම් අනුව දක්නාසුලු ව ... වෙසෙන්නේ ය. මහණ සිත්හි හෝ සිත් අනුව දක්නාසුලු ව වෙසෙන්නේ ය. මහණ දහම්හි හෝ දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙන්නේ ය. යම් මේ සතරසතිපට්ඨාන කෙනෙක් වෙත් නම් සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස ශෝකපරිදේවයන් ඉක්මවනු පිණිස දුක් දොම්නස් දුරු කරනු පිණිස අරිඅටඟිමඟ අවබෝධ කරනු පිණිස නිවන පසක්කරනු පිණිස මේ එක ම මඟ වේ''යි.

මහණෙනි, එකල්හි සහම්පතී බ්‍රහ්මතෙමේ මාගේ චිත්තපරිවිතර්කය සියසිතින් දැන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුලු අතක් හෝ දිගු කරන්නේ ද: දිගු කළ අතක් හෝ හකුලුවන්නේ ද: එසෙයින් ම බඹලොව අතුරුදන් ව මා ඉදිරියෙහි පහළ විය. මහණෙනි, ඉක්බිති සහම්පති බ්‍රහ්ම උතුරුසඟ එකස් කොට මා වෙත එළඹැ ඇඳිලි බැඳ මට මෙසේ සැලකෙළේ ය:

භාග්‍යවතුන් වහන්ස, මෙය එසේ ය. සුගතයන් වහන්ස, මෙය එසේ ය. වහන්ස, යම් මේ සතරසතිපට්ඨාන කෙනෙක් වෙත් නම් සත්ත්වයන්ගේ විශුද්ධියට ශෝකපරිදේවයන් ඉක්මවීමට දුක් දොම්නස් දුරු කිරීමට ඤායය අවබෝධ කිරීමට නිවන පසක්කිරීමට මේ එක ම මඟ ය. කවර සතරෙක් ද යත් වහන්ස, මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙන්නේ ය. වහන්ස, මහණ විඳුම්හි හෝ විඳුම් අනුව දක්නාසුලු ව...වෙසෙන්නේ ය. වහන්ස, මහණ සිත්හි හෝ සිත අනුව දක්නාසුලු ව...වෙසෙන්නේ ය. වහන්ස, මහණ දහම්හි හෝ දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙන්නේ ය. වහන්ස යම් මේ සතර සතිපට්ඨානකෙනෙක් වෙත් නම සත්ත්වයන්ගේ විශුද්ධියට ශෝකපරිදේවයන් ඉක්මවීමට දුක් දොම්නස් දුරු කිරීමට ඤායය අවබෝධ කිරීමට නිවන පසක් කිරීමට මේ එක ම මඟ වේ යි. මහණෙනි, සහම්පති බ්‍රහ්ම තෙමේ මෙය කී ය. මෙය කියා යළි මේ ගය ද කී:

නිවන දක්නාසුලු වූ හිතානුකම්පා ඇති භාග්‍යවතුන් වහන්සේ එකායනමාර්ගය (–සිවුසිවටන්) දන්නා සේක. යම් කෙනෙක් (දූත් යම් මඟකින්) වතුරොස තරණය කෙරෙත් නම් පෙරත් මේ මඟින් තරණය කළහ. (මතුත්) තරණය කරන්නාහ යි.

## 3. 5. 4

### සතොසුත්තං

1222. සතො භික්ඛවෙ, භික්ඛු විහරෙය්‍ය අයං වො අම්හාකං අනුසාසනී. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සතො හොති: ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. එවං ඛො භික්ඛවෙ භික්ඛු සතො හොති. සතො භික්ඛවෙ භික්ඛු විහරෙය්‍ය, අයං වො අම්හාකං අනුසාසනීති.

## 3. 5. 5

### කුසලරාසිසුත්තං

1223. කුසලරාසීති භික්ඛවෙ, වදමානො චත්තාරො සතිපට්ඨානෙ සම්මාවදමානො වදෙය්‍ය. කෙවලො චායං[1] භික්ඛවෙ, කුසලරාසි යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී -පෙ- වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. කුසලරාසීති භික්ඛවෙ, වදමානො ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ සම්මා වදමානො වදෙය්‍ය. කෙවලො හයං භික්ඛවෙ, කුසලරාසි. යදිදං චත්තාරො සතිපට්ඨානාති.

## 3. 5. 6

### පාතිමොක්ඛසුත්තං

1224. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: ''සාධු මෙ භන්තෙ, භගවා සඞ්ඛිත්තෙන ධම්මං දෙසෙතු, යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති.''

---

1. කෙවලොහායං - මජසං, ස්‍යා.

## 3. 5. 4

## සතො සූත්‍රය

1222. මහණෙනි, මහණ සිහි ඇති ව වෙසෙන්නේ ය. මේ තොපට අපගේ අනුශාසනා යි. මහණෙනි, කෙසේ නම් මහණ සිහි ඇත්තේ වේ ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. විඳුම්හි...සිත්හි...දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මෙසේ මහණ සිහි ඇත්තේ වේ. මහණෙනි, මහණ සිහි ඇතිව වෙසෙන්නේ ය. මේ තොපට අපගේ අනුශාසනා යි.

## 3. 5. 5

## කුසලරාසි සූත්‍රය

1223. මහණෙනි, කුසල්රැස යි කියන්නෙක් මැනවින් කියන්නේ සතිපට්ඨානසතර කියන්නේ ය. මහණෙනි, යම් මේ සතිපට්ඨාන සතරෙක් වේ නම් මෙය හුදු කුසල් රැසෙකි. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දොම්නස් දුරු කොට වෙසෙ යි. මහණෙනි, කුසල්රැස යි කියන්නෙක් මැනවින් කියන්නේ මේ සතරසතිපට්ඨාන කියන්නේය. මහණෙනි, යම් මේ සතිපට්ඨාන සතරෙක් වේ නම් මෙය හුදු කුසල් රැසෙකි යි.

## 3. 5. 6

## පාතිමොක්ඛ සූත්‍රය

1224. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පස් ව හුන්නේය. එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේ ය: "වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගෙන් යම් දහමක් අසා එකලා ව ගණයා කෙරෙන් වෙන් වූයෙම් නො පමා ව කෙලෙස් තවන වැර ඇතියෙම් නිවන පිණිස මෙහෙයූ සිත් ඇතියෙම් වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ (එබඳු) දහමක් සැකෙවින් මට දේශනා කරනු මැනවි''යි.

තස්මාතිහ ත්වං භික්ඛු, ආදිමෙව විසොධෙහි කුසලෙසු ධම්මෙසු. කො ච ආදි කුසලානං ධම්මානං: ඉධ ත්වං භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරාහි ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛසි[1] සික්ඛාපදෙසු. යතො ඛො ත්වං භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරිස්සසි ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛසි සික්ඛාපදෙසු, තතො ත්වං භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය චත්තාරො සතිපට්ඨානෙ භාවෙය්‍යාසි. කතමෙ චත්තාරො: ඉධ ත්වං භික්ඛු කායෙ කායානුපස්සී විහරාහි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරාහි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. යතො ඛො ත්වං භික්ඛු, සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙස්සසි, තතො තුය්හං භික්ඛු, යා රත්ති වා දිවසො වා ආගමිස්සති වුඩ්ඪියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු. නො පරිහානීති. අථ ඛො සො භික්ඛු භගවතො භාසිතං -පෙ- අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

## 3. 5. 7

## දුච්චරිතසුත්තං

1225. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: "සාධු මෙ භන්තෙ, භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු, යමහං භගවතො ධම්මං සුත්වා එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරෙය්‍යන්ති."

තස්මාතිහ ත්වං භික්ඛු ආදිමෙව විසොධෙහි කුසලෙසු ධම්මෙසු. කො ච ආදි කුසලානං ධම්මානං. ඉධ ත්වං භික්ඛු, කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙස්සසි. වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙස්සසි. මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙස්සසි. යතො ඛො ත්වං භික්ඛු, කායදුච්චරිතං පහාය කායසුචරිතං භාවෙස්සසි, වචීදුච්චරිතං පහාය වචීසුචරිතං භාවෙස්සසි, මනොදුච්චරිතං පහාය මනොසුචරිතං භාවෙස්සසි, තතො ත්වං භික්ඛු, සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය චත්තාරො සතිපට්ඨානෙ භාවෙය්‍යාසි. කතමෙ චත්තාරො: ඉධ ත්වං භික්ඛු කායෙ කායානුපස්සී විහරාහි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං, වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරාහි ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. යතො ඛො ත්වං භික්ඛු, සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙස්සසි, තතො තුය්හං භික්ඛු, යා රත්ති වා දිවසො වා ආගමිස්සති වුඩ්ඪියෙව පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො පරිහානීති. -පෙ- අඤ්ඤතරො ච පන සො භික්ඛු අරහතං අහොසීති.

---

1. සික්ඛස්සු - මජසං, සයා.

මහණ, එහෙයින් මෙහි ලා තෙපි කුසල්දහම්හි මුල ම පිරිසිඳු කරවු. කුසල්දහමුන්ගේ මුල කිමෙක් ද යත්: මහණ තෙපි මෙහි ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත ව ආචාරගොචරසම්පන්න ව අණුමාත්‍ර වූ ද වරදෙහි බිය දක්නාසුලු ව වෙසෙවු. සික්ඛපදෙහි සමාදන් ව හික්මෙවු. මහණ, යම්කලෙක තෙපි ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත ව ආචාරගොචරසම්පන්න ව අණුමාත්‍ර වූ ද වරදෙහි බිය දක්නාසුලු ව වෙසෙන්නහු නම් සික්ඛපදෙහි සමාදන් ව හික්මෙවු නම් මහණ, එකල තෙපි සීලය නිසා සීලයෙහි පිහිටා සිවුසීවටන් වඩන්නහු. කවර සිවුසීවටන් හු ද යත්: මහණ, මෙහි තෙපි කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙච්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙවු. විඳුම්හි...සිත්හි...දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙච්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙවු. මහණ, යම් කලෙක තෙපි සීලය නිසා සීලයෙහි පිහිටා මේ සිවුසීවටන් මෙසේ වඩන්නහු නම් මහණ, එකල තොපට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණේ ද, කුසල්දහම්හි වැඩීම ම කැමති විය යුතු. පිරිහීම නොකැමති විය යුතු. එකල්හි ඒ මහණ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව ... ඒ මහණ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූහ යි.

## 3. 5. 7

## දුච්චරිත සූත්‍රය

1225. එකල්හි එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය ... එකත්පසෙක හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: ''වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේගේ යම් දහමක් අසා එකලා ව ගණයා කෙරෙන් වෙන් වූයෙම් නො පමා ව කෙලෙස් තවන වැර ඇතියෙම් කාදිවිදෙක්හි නිරපෙක්ෂකයෙම් වෙසෙන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ (එබඳු) දහමක් සැකෙවින් මට දේශනා කරන සේක් නම් මැනැවි''යි.

මහණ, එසේ නම් තෙපි මෙහිලා කුසල්දම්හි මුල ම පිරිසිඳු කරවු. කුසල්දහමුන්ගේ මුල කිමෙක් ද යත්: මහණ මෙහි තෙපි කාය දුශ්චරිතය හැර කායසුචරිතය වඩන්නහු වාග්දුශ්චරිතය හැර වාක්සුචරිතය වඩන්නහු. මනො දුශ්චරිතය හැර මනඃසුචරිතය වඩන්නහු. මහණ, තෙපි යම් කලෙක කායදුශ්චරිතය හැර කායසුචරිතය වඩන්නහු නම් වාග්දුශ්චරිතය හැර වාක්සුචරිතය වඩන්නහු නම් මනොදුශ්චරිතය හැර මනඃසුචරිතය වඩන්නහු නම් මහණ, එකල්හි තෙපි සීලය නිසා සීලයෙහි පිහිටා සිවුසීවටන් වඩන්නහු.කවර සිවුසීවටන්හු ද යත්: මහණ, මෙහි තෙපි කයෙහි කය අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇතිව කාලෙච්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙවු. විඳුම්හි ... සිත්හි .. දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙච්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙවු. මහණ, තෙපි යම් කලෙක සීලය නිසා සීලයෙහි පිහිටා මේ සිවුසීවටන් මෙසේ වඩන්නහු ද; මහණ, එකල්හි තොපට යම් රැයෙක් හෝ දවාලෙක් හෝ පැමිණෙන්නේ නම් කුසල්දහම්හි පිරිහීමෙක් නො ව වැඩීමෙක් ම කැමති විය යුතුයි ... ඒ මහණ ද රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ යි.

## 3. 5. 8

### මිත්තසුත්තං

1226. යෙ භික්ඛවෙ, අනුකම්පෙය්‍යාථ, යෙ ච සොතබ්බං මඤ්ඤෙය්‍යුං, මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා, තෙ වො භික්ඛවෙ, චතුන්නං සතිපට්ඨානානං භාවනාය සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බා. කතමෙසං චතුන්නං: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. යෙ භික්ඛවෙ, අනුකම්පෙය්‍යාථ, යෙ ච සොතබ්බං මඤ්ඤෙය්‍යුං, මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා තෙ වො භික්ඛවෙ, ඉමෙසං චතුන්නං සතිපට්ඨානානං භාවනාය සමාදපෙතබ්බා, නිවෙසෙතබ්බා, පතිට්ඨාපෙතබ්බාති.

## 3. 5. 9

### වෙදනාසුත්තං

1227. තිස්සො ඉමා භික්ඛවෙ වෙදනා, කතමා තිස්සො: සුඛා වෙදනා, දුක්ඛා වෙදනා, අදුක්ඛමසුඛා වෙදනා. ඉමා ඛො භික්ඛවෙ තිස්සො වෙදනා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං වෙදනානං පරිඤ්ඤාය චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී -පෙ- වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං වෙදනානං පරිඤ්ඤාය ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

## 3. 5. 10

### ආසවසුත්තං

1228. තයො'මෙ භික්ඛවෙ ආසවා. කතමෙ තයො: කාමාසවො භවාසවො අවිජ්ජාසවො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො ආසවා. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං ආසවානං පහානාය චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං ආසවානං පහානාය ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

**අමතවග්ගො පඤ්චමො.**

**තත්‍රුද්දානං:**

අමතං සමුදයො මග්ගො සතො කුසලරාසි ච,
පාතිමොක්ඛං දුච්චරිතං මිත්තො වෙදනා'සවෙනාති.

## 3. 5. 8

## මිත්ත සූත්‍රය

1226. මහණෙනි, මිතුරු වූ හෝ ඇමති (යහළු) වූ හෝ නෑ වූ හෝ සහලේ නෑ වූ හෝ යම් කෙනෙකුන්ට අනුකම්පා කරන්නහු නම් යම් කෙනෙක් ඇහුම්කන් දිය යුතු කොට හඟනාහු නම් මහණෙනි, තොප විසින් ඔහු සිවුසිවටන් වැඩීමෙහි සමාදන් කරවිය යුතු හ. වැස් විය යුතු හ. පිහිටු විය යුතු හ. කවර සිවුසිවටන් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලුව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මිතුරු වූ හෝ ඇමති වූ හෝ සහලේ නෑ වූ හෝ යම් කෙනකුන්ට අනුකම්පා කරන්නහු නම් යම් කෙනකුන් ඇහුම්කන් දිය යුතු කොට හඟනාහු නම් මහණෙනි, තොප විසින් ඔහු මේ සිවුසිවටන් වැඩීමෙහි සමාදන් කරවිය යුතුහ, වැස්විය යුතුහ, පිහිටු විය යුතුහ යි.

## 3. 5. 9

## වේදනා සූත්‍රය

1227. මහණෙනි, මේ වේදනා තුනෙකි. කවර තුනෙක් ද යත්: සුවවේදනා ය, දුක්වේදනා ය, නොදුක්නොසුවවේදනා යි. මහණෙනි, මොහු තුන්වේදනාවෝ යි. මහණෙනි, මේ තුන්වේදනාවන් පිරිසිඳ දැනීම පිණිස සිවුසිවටන් වැඩිය යුතු. කවර සිවුසිවටන්හු ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව ... විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මේ තුන්වේදනාවන් පිරිසිඳ දැනීම පිණිස මේ සිවුසිවටන්හු වැඩිය යුතුහ යි.

## 3. 5. 10

## ආසව සූත්‍රය

1228. මහණෙනි, මේ ආසුව තුනෙකි. කවර තුනෙක් ද යත්: කාමාසුවය, භවාසුවය, අවිද්‍යාසුවය යි. මහණෙනි, මේ ආසුව තුන යි. මහණෙනි, මේ ආසුව තුන පැහීම පිණිස සතිපට්ඨාන සතර වැඩිය යුතු. කවර සතරෙක් ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව කාලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙව්හි දැඩි ලොබ හා දෙම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මේ ආසුව තුන පැහීම පිණිස මේ සතිපට්ඨාන සතර වැඩිය යුතු යි.

## පස්වැනි අමත වග යි.

එහි සූත්‍රනාමාවලිය:

අමත, සමුදය, මග්ග, සතො කුසලරාසි, පාතිමොක්ඛ, දුච්චරිත, මිත්ත, වේදනා, ආසව යී දශසූත්‍රාන්තකෙනෙකි යි.

# 6. ගඞ්ගාපෙය්‍යාලවග්ගො

## 3. 6. 1 – 48

### ගඞ්ගාදිසුත්තානි

1229–1276. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා –පෙ– නිබ්බානපබ්භාරොති. (ගඞ්ගාපෙය්‍යාලං සතිපට්ඨානවසෙන විත්ථාරෙතබ්බං )

**ගඞ්ගාපෙය්‍යාලවග්ගො ඡට්ඨො.**

තස්සුද්දානං:–

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො,
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

(විවෙකනිස්සිතාදිවසෙන රාගවිනයපරියොසානාදිවසෙන අමතොගධාදිවසෙන නිබ්බානනින්නාදිවසෙන ච එකෙකස්මිං චත්තාරො චත්තාරො කත්වා අට්ඨචත්තාලීසසුත්තන්තා විත්ථාරෙතබ්බා.)

# 7. අප්පමාදවග්ගො

## 3. 7. 1 – 40

### තථාගතාදි සුත්තානි

1277–1316. යාවතා භික්ඛවෙ, සත්තා අපද වා ද්විපද වා චතුප්පද වා බහුප්පද වා –පෙ– බහුලීකරොතීති. (අප්පමාදවග්ගො සතිපට්ඨානවසෙන විත්ථාරෙතබ්බො.)

**අප්පමාදවග්ගො සත්තමො.**

තස්සුද්දානං:

තථාගතං පදං කූටං මූලං සාරෙන වස්සිකං,
රාජා චන්දිමසූරියා ච වත්ථෙන දසමං පදන්ති.

(අත්‍රාපි එකෙකස්මිං චත්තාරො චත්තාරො කත්වා චත්තාලීසසුත්තන්තා විත්ථාරෙතබ්බා.)

## 6. ගඞ්ගාපෙය්‍යාල වර්ගය

### 3. 6. 1 – 48

### ගඞ්ගාදි සූත්‍ර

1229 – 1276. මහණෙනි, යම්සේ ගඞ්ගානදිය පෙරදිගට නැමුනී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද ... නිවනට බර වූයේ වේ යි.

(ගඞ්ගාපෙය්‍යාලවර්ගය සතිපට්ඨාන වශයෙන් විස්තර කට යුතු)

### සවැනි ගඞ්ගාපෙය්‍යාලවග්ග යි.

එහි සූත්‍රනාමාවලිය:

පාචීනනින්නාදිසූත්‍ර චතුෂ්ක සයෙකි. සමුද්දනින්නාදිසූත්‍ර චතුෂ්ක සයෙකි. මේ දෙකොටස දෙළොස් චතුෂ්කයෙක් වේ. එයින් වර්ගය යි කියනු ලැබේ. (සූත්‍ර මුළුල්ල අටසාලිසෙකි).

(විවෙක නිස්සිතාදි වශයෙන් ද රාගවිනයපරියොසානාදි වශයෙන් ද අමතොගධාදිවශයෙන් ද නිබ්බානනින්නාදි වශයෙන් ද එකෙක සතරක් සතරක් කොට අටසාලිස් සූත්‍රාන්තයෝ විතර කට යුතු වෙත්.)

## 7. අප්පමාද වර්ගය

### 3. 7. 1 – 40

### තථාගතාදි සූත්‍ර

1277 – 1316. මහණෙනි, අපා වූ ද දෙපා වූ ද සිවුපා වූ ද බුහුපා වූ ද යම්තාක් සත්වයෝ වෙද්ද ... බහුල කෙරේ යි.

(අප්පමාදවර්ගය සිවටන් විසින් විතර කට යුතු)

### සත්වැනි අප්පමාදවග්ග යි.

එහි සූත්‍රනාමාවලිය:

තථාගත, පද, කූට, මූල, සාර වස්සික, රාජ, චන්දිම, සූරිය, වත්ථ යි චතුෂ්ක දශයෙ කි. මුළුල්ල සාලිසෙකි යි.

(මෙහි ද එකෙක සතරක් සතරක් කොට සමසාලිස්සූත්‍රාන්තයෝ විතර කට යුතුහ).

# 8. බලකරණීයවග්ගො

## 3. 8. 1 – 48

### බලාදිසුත්තානි

1317-1364. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කයිරන්ති - පෙ– බහුලීකරොති.

(බලකරණීයවග්ගො සතිපට්ඨානවසෙන විත්ථාරෙතබ්බො.)

**බලකරණීයවග්ගො අට්ඨමො.**

තත්‍රුද්දානං:

බලං බීජඤ්ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකිතං,
ආකාසෙන ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදීති.

(අත්‍ර ච එකස්මිං චත්තාරො චත්තාරො කත්වා අට්ඨචත්තාලීස-සුත්තන්තා විත්ථාරෙතබ්බා.)

# 9. එසනාවග්ගො

## 3. 9. 1 – 160

### එසනාදිසුත්තානි

1365-1524. තිස්සො ඉමා භික්ඛවෙ, එසනා. කතමා තිස්සො: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. –පෙ– භාවෙතබ්බාති.

(එසනාවග්ගො සතිපට්ඨානවසෙන විත්ථාරෙතබ්බො.)

**එසනාවග්ගො නවමො.**

තත්‍රුද්දානං:

එසනා විධා ආසවො භවො දුක්ඛතා ච තිස්සො,
ඛීලං මලඤ්ච නීඝො ච වෙදනාතණ්හාහි චාති.

(වුත්තනයෙන ච තානි අභිඤ්ඤාය පරිඤ්ඤාය පරික්ඛයාය පහා-නායාති චතුධා විභජන්තෙන ච එකෙකස්මිං සොළස සොළස කත්වා එකසතසට්ඨි සුත්තන්තා විත්ථාරෙතබ්බා.)

# 8. බලකරණීය වර්ගය

## 3. 8. 1 – 48

## බලාදි සූත්‍ර

1317 – 1364. මහණෙනි, යම්සේ යම්කිසි බලකරණීයකර්මාන්තයෝ කරනු ලැබෙද්ද ... බහුල කෙරේ යි.

(බලකරණීයවර්ගය ද සීවටත් විසින් විතර කට යුතු)

### අටවැනි බලකරණීයවර්ග යි.

එහි සූත්‍රනාමාවලිය:

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාස, යන චතුෂ්ක සත ද මෙසවතුෂ්ක දෙක ද නාවා, ආගන්තුග, නදී, චතුෂ්ක තුන දූ යී මුළුල්ල දෙළොසෙකි. සූත්‍ර අටසාලිසෙකි යි.

(මෙහි දූ එකෙක සතරක් සතරක් කොට අටසාලිස් සූත්‍රාන්තයෝ විතර කට යුතුහ.)

# 9. එසනා වර්ගය

## 3. 9. 1 – 160

## ඒසනාදි සූත්‍ර

1365 – 1524. මහණෙනි, මේ ඒසනා තුනෙ කි. කවර තුනෙක් ද යත්: කාමේසනා භවේසනා, බ්‍රහ්මචරියේසනා යි ... වැඩිය යුත්තේ යි.

(ඒසනාවර්ගය ද, සීවටත් විසින් විතර කට යුතු)

### නවවැනි එසනාවර්ග යි·

එහි සූත්‍රනාමාවලිය:

එසනා විධා ආසව භව දුක්ඛතා ඛීල මල නීඝ වෙදනා තණ්හා යි ෂොඩශක දශයෙ කි. සූත්‍ර මුළුල්ල එක්සිය සැටෙකි.

(කියන ලද සිවුනයින් ද, නැවත ඔවුන් අභිඤ්ඤ ය පරිඤ්ඤ ය පරික්ඛයාය පහානාය යී සිවුනයින් ද බෙදන්නහු විසින් එකෙක සොළස සොළස කොට එක්සියසැට සූත්‍රාන්තයෝ විතර කට යුතු හ.)

# 10. ඔඝවග්ගො

## 3. 10. 1-159

### ඔඝාදිසුත්තානි

1625-1683. චත්තාරො මෙ භික්ඛවෙ ඔඝා. කතමෙ චත්තාරො: කාමොඝො භවොඝො දිට්ඨොඝො අවිජ්ජොඝො. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ඔඝා. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඔඝානං අභිඤ්ඤාය චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බා. කතමෙ චත්තාරො: -පෙ- භාවෙතබ්බාති.

## 3. 10. 160

### උද්ධම්භාගියසුත්තං

1684. පඤ්චිමානි භික්ඛවෙ, උද්ධම්භාගියානි සංයොජනානි කතමානි පඤ්ච: රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය ඉමෙ චත්තාරො සතිපට්ඨානා භාවෙතබ්බාති.

(ඔඝවග්ගො සතිපට්ඨානවසෙන විත්ථාරෙතබ්බො.)

**ඔඝවග්ගො දසමො.**

තත්‍රුද්දානං:

ඔඝො යොගො උපාදානං ගන්ථං අනුසයෙන ච,
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධම්භාගියාති.

(අත්‍රා'පි යථා එසනාවග්ගො එකසතසට්ඨි සුත්තන්තා විත්ථාරෙතබ්බා.)

**සතිපට්ඨානසංයුත්තං සමත්තං.**

තත්‍ර වග්ගුද්දානං:

අම්බපාලි ච නාලන්දෙ සීලට්ඨිත්‍යානනුස්සුතා
අමතා ගඞ්ගාප්පමාද බලකරණීයෙසනොඝාති.

# 10. ඔඝවර්ගය

## 3. 10. 1 – 159

### ඔඝාදි සූත්‍ර

1525 – 1683 මහණෙනි, මේ ඔඝ සතරෙකි. කවර සතරෙක් ද යත්: කාමෞඝ භවෞඝ දිට්ඨෞඝ අවිජ්ජෞඝ යි. මහණෙනි, මේ ඔඝ සතර යි. මහණෙනි, මේ චතුරෞඝයන් වෙසෙයින් දැනීම පිණිස සිවුසිවටන් වැඩිය යුතු. කවර සතරෙක් ද යත්: ... වැඩිය යුත්තේ යි.

## 3. 10. 160

### උද්ධම්භාගිය සූත්‍රය

1684. මහණෙනි, මේ උද්ධම්භාගියසංයෝජන පසෙකි. කවර පසෙක් ද යත්: රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යී. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පස යි. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පස පැහීම පිණිස සිවුසිවටන් වැඩිය යුතු. කවර සිවුසිවටන්හු ද යත්: මහණෙනි, මෙහි මහණ කයෙහි කය අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මුනා දැනුම ඇති ව සිහි ඇති ව කාලෙච්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසේ. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනුව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම් ලෙච්හි දැඩිලොබ හා දොම්නස දුරු කොට වෙසේ. මහණෙනි, මේ උද්ධම්භාගියසංයෝජන පස පැහීම පිණිස මේ සිවුසිවටන්හු වැඩිය යුතුහ යි.

(ඔඝ වර්ගය ද සිවටන් විසින් විතර කට යුතු)

**දශවැනි ඔඝවග් යි.**

එහි සූත්‍රනාමාවලිය:

ඔඝ, යෝග, උපාදන, ගන්ථ, අනුසය, කාමගුණ, නීවරණ, ඛන්ධ, ඔරම්භාගිය, උද්ධම්භාගිය යී ෂොඩශක දශයෙකි. (සූත්‍ර එක්සියසැටෙකි) යි.

(මෙහි ද එසනාවර්ගයෙහි මෙන් එක්සියසැටසූත්‍රාන්තයෝ විතර කට යුතුහ.)

**සතිපට්ඨානසංයුත්තය නිමියේ යි.**

එහි වර්ගනාමාවලිය:

අම්බපාලි, නාලන්ද, සීලට්ඨිති, අනනුස්සුත, අමත, ගඞ්ගාපෙය්‍යාල, අප්පමාද, බලකරණීය, එසනා, ඔඝ යි (සතිපට්ඨානසංයුත්තයෙහි වර්ග දශයෙකි යි.)

# 4. ඉන්ද්‍රියසංයුත්තං

## 1. සුද්ධකවග්ගො

### 4. 1. 1

### සුද්ධ[1]කසුත්තං

1685. සාවත්ථියං —

පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං, ඉමානි ඛො භික්ඛවෙ, පඤ්ච ඉන්ද්‍රියානීති.

### 4. 1. 2

### සොතසුත්තං

1686. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. යතො ඛො භික්ඛවෙ, අරියසාවකො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං[2] අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

### 4. 1. 3

### දුතිය සොතසුත්තං

1687. පඤ්චිමානි භික්ඛවෙ. ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. යතො ඛො භික්ඛවෙ, අරියසාවකො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

### 4. 1. 4

### අරහන්තසුත්තං

1688. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. යතො ච ඛො භික්ඛවෙ, භික්ඛු[3] ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාද විමුත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තොති.

---

1. සුද්ධික - මජසං, සයා.
2. ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච - සයා.
3. යතො ඛො භික්ඛවෙ අරියසාවකො - මජසං.

# 4. ඉන්ද්‍රිය සංයුත්තය

## 1. සුද්ධකවර්ගය

### 4. 1. 1

### සුද්ධක සූත්‍රය

1685. සැවැත්නුවර–

මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි, කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මේ පස ඉන්ද්‍රියෝ යි.

### 4. 1. 2

### සොත සූත්‍රය

1686. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්; සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, යම්කලෙක අරීසවූ මේ පසිඳුරන්ගේ රස විඳගැන්මත් දෙසත් නික්ම යැමත් තතුසේ දනී ද: මහණෙනි, මේ අරීසවූ නිරැහි නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝතාපන්න යි කියනු ලැබේ යි.

### 4. 1. 3

### දුතිය සොත සූත්‍රය

1687. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්; සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, යම්කලෙක අරීසවූ මේ පසිඳුරන්ගේ හටගැන්මත් වැනසුමත් රස විඳගැන්මත් දෙසත් නික්ම යැමත් තතුසේ දනී ද; මහණෙනි, මේ අරීසවූ නිරැහි නොහෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝතාපන්න යි කියනු ලැබේ යි.

### 4. 1. 4

### අරහන්ත සූත්‍රය

1688. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, යම් කලෙක මහණ, මේ පසිඳුරන්ගේ ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ දැන උපාදාන රහිත ව මිදුණේ වේ ද; මහණෙනි, මේ මහණ ක්‍ෂයවූ ආසුව ඇති වැස නිම වූ බඹසර ඇති කළ කටයුතු ඇති බහා තැබූ බර ඇති පිළිවෙළින් පැමිණි රහත්බැව් ඇති ක්‍ෂය වූ භවසංයොජන ඇති මැනවින් දැන මිදුණු රහතැ යි කියනු ලැබේ යි.

## 4. 1. 5

## දුතිය අරහන්තසුත්තං

1689. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. යතො ඛො භික්ඛවෙ, භික්ඛු ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාද විමුත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තොති.

## 4. 1. 6

## සමණසුත්තං

1690. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති, න මෙතෙ භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පන තෙ[1] ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති.

යෙ ච ඛො කෙචි[2] භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානන්ති, තෙ ඛො, මෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා[3] සමණසම්මතා බ්‍රාහ්මණෙසු වා[4] බ්‍රාහ්මණසම්මතා. තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 4. 1. 7

## දුතිය සමණසුත්තං

1691. යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සද්ධින්ද්‍රියං නප්පජානන්ති. සද්ධින්ද්‍රියසමුදයං නප්පජානන්ති, සද්ධින්ද්‍රියනිරොධං නප්පජානන්ති, සද්ධින්ද්‍රියනිරොධගාමිනිපටිපදං නප්පජානන්ති. විරියින්ද්‍රියං නප්පජානන්ති -පෙ- සතින්ද්‍රියං නප්පජානන්ති -පෙ- සමාධින්ද්‍රියං නප්පජානන්ති -පෙ- පඤ්ඤින්ද්‍රියං නප්පජානන්ති, පඤ්ඤින්ද්‍රියසමුදයං නප්පජානන්ති, පඤ්ඤින්ද්‍රියනිරොධං නප්පජානන්ති, පඤ්ඤින්ද්‍රියනිරොධගාමිනිපටිපදං නප්පජානන්ති. නමෙතෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු වා සමණසම්මතා බ්‍රාහ්මණෙසු වා බ්‍රාහ්මණසම්මතා. න ච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති

1. පනෙතෙ - මජසං, සතා
2. ඓත සතා
3. සමණෙසු චෙව - සීමු, සී 1, 2
4. බ්‍රාහ්මණෙසු ච - සීමු, සී 1, 2

## 4. 1. 5

## දුතිය අරහන්ත සූත්‍රය

1689. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, යම් කලෙක මහණ මේ පසිඳුරන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිශ්ශරණයත් තතුසේ දැන උපාදාන රහිත ව මිදුණේ වේ ද; මහණෙනි, මේ මහණ ක්‍ෂය වූ ආස්‍රව ඇති වැය නිම වූ බඹසර ඇති කළ සිවුමඟ කිස ඇති බහා තැබූ බර ඇති පිළිවෙළින් පැමිණි ස්වාර්ථ ඇති ක්‍ෂය වූ භවසංයොජන ඇති මැනවින් දැන මිදුණු රහතැ යි කියනු ලැබේ යි.

## 4. 1. 6

## සමණ සූත්‍රය

1690. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ පසිඳුරන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිඃශරණයත් තතුසේ නොදනිත් ද; මහණෙනි, ඒ මේ මහණහු හෝ බමුණුහු හෝ මහණුන් කෙරෙහි හෝ මහණහ යි සම්මත නො වෙත්. බමුණන් කෙරෙහි හෝ බමුණහයි සම්මත නො වෙති. ඒ ආයුෂ්මත් හු මහණබවෙහි අරුත හෝ බමුණු බවෙහි අරුත හෝ දිටුදැමියෙහි තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ නො ද වෙසෙත්.

මහණෙනි, යම්කිසි මහණකෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ පසිඳුරන්ගේ සමුදයත් අස්තඞ්ගමයත් ආස්වාදයත් ආදීනවයත් නිඃශරණයත් තතුසේ දනිද්ද; මහණෙනි, ඒ මේ මහණෝ හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහිත් මහණහ යි සම්මතහ. බමුණන් කෙරෙහිත් බමුණහ යි සම්මතහ. ඒ ඇවැත්හු ද (මාර්ගඵල සඞ්ඛ්‍යාත) ශ්‍රාමණ්‍යාර්ථය බ්‍රහ්මණ්‍යාර්ථය දිටුදැමියෙහි තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙති යි.

## 4. 1. 7

## දුතිය සමණ සූත්‍රය

1691. මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ සද්ධින්ද්‍රිය නො දනිත් ද, සද්ධින්ද්‍රිය සමුදය නො දනිත්ද, සද්ධින්ද්‍රිය නිරෝධය නො දනිත්ද, සද්ධින්ද්‍රිය නිරෝධගාමිනීපටිපදාව නො දනිත්ද, විරියින්ද්‍රිය නොදනිත්ද, ... සතින්ද්‍රිය නො දනිත්ද, ... සමාධින්ද්‍රිය නො දනිත් ද,... පඤ්ඤින්ද්‍රිය නො දනිත් ද, පඤ්ඤින්ද්‍රිය සමුදය නො දනිත් ද, පඤ්ඤින්ද්‍රිය නිරොධය නො දනිත්ද, පඤ්ඤින්ද්‍රිය නිරොධගාමිනීපටිපදාව නො දනිත් ද, මහණෙනි, ඒ මේ මහණෝ හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහි හෝ මහණ යයි සම්මත නො වෙත්. බමුණන් කෙරෙහි හෝ බමුණු යයි සම්මත නො වෙත්. ඒ ඇවැත්හු ශ්‍රාමණ්‍යාර්ථය හෝ බ්‍රහ්මණ්‍යාර්ථය හෝ දිටුදැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ නො ද වෙසෙත්.

යෙ ච ඛො කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සද්ධින්ද්‍රියං පජානන්ති, සද්ධින්ද්‍රියසමුදයං පජානන්ති, සද්ධින්ද්‍රියනිරොධං පජානන්ති සද්ධින්ද්‍රියනිරොධගාමිනිපටිපදං පජානන්ති, විරියින්ද්‍රියං පජානන්ති -පෙ- සතින්ද්‍රියං පජානන්ති -පෙ- සමාධින්ද්‍රියං පජානන්ති -පෙ- පඤ්ඤින්ද්‍රියං පජානන්ති, පඤ්ඤින්ද්‍රියසමුදයං පජානන්ති, පඤ්ඤින්ද්‍රියනිරොධං පජානන්ති, පඤ්ඤින්ද්‍රියනිරොධගාමිනිපටිපදං පජානන්ති, තෙ ඛො මෙ භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සමණෙසු චෙව[1] සමණසම්මතා බ්‍රාහ්මණෙසු ච[2] බ්‍රාහ්මණසම්මතා. තෙ ච පනායස්මන්තො සාමඤ්ඤත්ථඤ්ච බ්‍රහ්මඤ්ඤත්ථඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 4. 1. 8

### දට්ඨබ්බසුත්තං

1692. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. කත්ථ ච භික්ඛවෙ, සද්ධින්ද්‍රියං දට්ඨබ්බං: චතූසු සොතාපත්තිඅඞ්ගෙසු.[3] එත්ථ සද්ධින්ද්‍රියං දට්ඨබ්බං. කත්ථ ච භික්ඛවෙ, විරියින්ද්‍රියං දට්ඨබ්බං: චතූසු සම්මප්පධානෙසු. එත්ථ විරියින්ද්‍රියං දට්ඨබ්බං. කත්ථ ච භික්ඛවෙ, සතින්ද්‍රියං දට්ඨබ්බං: චතූසු සතිපට්ඨානෙසු. එත්ථ සතින්ද්‍රියං දට්ඨබ්බං. කත්ථ ච භික්ඛවෙ, සමාධින්ද්‍රියං දට්ඨබ්බං: චතූසු ඣානෙසු. එත්ථ සමාධින්ද්‍රියං දට්ඨබ්බං. කත්ථ ච භික්ඛවෙ, පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං: චතූසු අරියසච්චෙසු. එත්ථ පඤ්ඤින්ද්‍රියං දට්ඨබ්බං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානීති.

## 4. 1. 9

### විභඞ්ගසුත්තං

1693. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, සද්ධින්ද්‍රියං, ඉධ භික්ඛවෙ, අරියසාවකො සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී[4] සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ඉදං වුච්චති භික්ඛවෙ, සද්ධින්ද්‍රියං.

කතමඤ්ච භික්ඛවෙ විරියින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො ආරද්ධවිරියො විහරති, අකුසලානං ධම්මානං පහානාය, කුසලානං ධම්මානං උපසම්පදය[5] ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. ඉදං වුච්චති භික්ඛවෙ, විරියින්ද්‍රියං.

---

1. සමණෙසු වා - සීමු, සී 1, 2
2. බ්‍රාහ්මණෙසු වා - සීමු, සී 1, 2
3. සොතාපත්තියඞ්ගෙසු - මජසං, සျා
4. සාරථී - මජසං, සျා
5. උපපාදය - සී 1, 2

මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ සද්ධින්ද්‍රිය දනිත් ද, සද්ධින්ද්‍රිය සමුදය දනිත් ද, සද්ධින්ද්‍රිය නිරොධය දනිත් ද, සද්ධින්ද්‍රිය නිරොධගාමිනීපටිපදව දනිත් ද, විරියින්ද්‍රිය දනිත් ද ... සතින්ද්‍රිය දනිත් ද ... සමාධින්ද්‍රිය දනිත් ද ... පඤ්ඤින්ද්‍රිය දනිත් ද. පඤ්ඤින්ද්‍රිය සමුදය දනිත් ද, පඤ්ඤින්ද්‍රිය නිරොධය දනිත් ද, පඤ්ඤින්ද්‍රිය නිරොධගාමිනී පටිපදව දනිත් ද, මහණෙනි, ඒ මේ මහණෝ හෝ බමුණෝ හෝ මහණුන් කෙරෙහි ත් මහණ යයි සම්මත හ. බමුණන් කෙරෙහිත් බමුණු යයි සම්මත හ. ඒ ඇවැත්හු ද ශ්‍රාමණ්‍යාර්ථය ද, බ්‍රහ්මණ්‍යාර්ථය ද, දිටුදැමියෙහි ම වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙති යි.

## 4. 1. 8

## දට්ඨබ්බ සූත්‍රය

1692. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, සද්ධින්ද්‍රිය කොහි ලා දත යුතු ද යත්; සිවුසොවත්අඟෙහිය. මෙහි ලා සද්ධින්ද්‍රිය දතයුතු. මහණෙනි, විරියින්ද්‍රිය කොහි ලා දත යුතු ද යත්: සිවුසම්පදහන්හි ය. මෙහි ලා විරියින්ද්‍රිය දත යුතු. මහණෙනි, සතින්ද්‍රිය කොහි ලා දත යුතු ද යත්: සිවුසිවටන් හි ය. මෙහි ලා සතින්ද්‍රිය දත යුතු. මහණෙනි, සමාධින්ද්‍රිය කොහි ලා දත යුතු ද යත්: සිවුදැහැන් හි ය. මෙහි ලා සමාධින්ද්‍රිය දත යුතු. මහණෙනි, පඤ්ඤින්ද්‍රිය කොහි ලා දත යුතු ද යත්: සිවුඅරිසස් හි ය. මෙහි ලා පඤ්ඤින්ද්‍රිය දත යුතු. මහණෙනි, මොහු පසිඳුරෝ යි.

## 4. 1. 9

## විභඞ්ග සූත්‍රය

1693. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, සද්ධින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවු සැදැහැ ඇත්තේ වේ, "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනු දු අර්හත් හ. සම්මාසම්බුද්ධ හ. විජ්ජාචරණ සම්පන්නහ. සුගත්හ. ලොකවිදූහ. අනුත්තරපුරිසදම්මසාරථිහ. දෙව් මිනිසුන් ට ශාස්තෘහ. බුද්ධහ. භගවත්හ" යි තථාගතයන් වහන්සේගේ බුදුබව හදහ යි. මහණෙනි, මේ සද්ධින්ද්‍රියයි කියනු ලැබේ.

මහණෙනි, විරියින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවු-අකුසල්දහම් පැහීම පිණිස කුසල්දහම් රැස්කිරීම පිණිස පිරිපුන් වැර ඇත්තේ කුසල්දහම්හි තිර වැර ඇත්තේ දැඩි පැරකුම් ඇත්තේ නො බහා තැබූ ධුර ඇත්තේ වෙසෙයි. මහණෙනි, මේ විරියින්ද්‍රිය යි කියනු ලැබේ.

කතමඤ්ච භික්ඛවෙ, සතින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. ඉදං වුච්චති භික්ඛවෙ, සතින්ද්‍රියං.

කතමඤ්ච භික්ඛවෙ, සමාධින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො වොස්සග්ගාරම්මණං[1] කරිත්වා ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං. ඉදං වුච්චති භික්ඛවෙ සමාධින්ද්‍රියං.

කතමඤ්ච භික්ඛවෙ පඤ්ඤින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො, අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. ඉදං වුච්චති භික්ඛවෙ පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානීති.

## 4. 1. 10

## දුතිය විභඞ්ගසුත්තං

**1694.** **පඤ්චිමානි** භික්ඛවෙ, ඉන්ද්‍රියානි: කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, සද්ධින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං. "ඉතිපි සො භගවා -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ඉදං වුච්චති භික්ඛවෙ සද්ධින්ද්‍රියං.

කතමඤ්ච භික්ඛවෙ, විරියින්ද්‍රියං: ඉධ භික්ඛවෙ අරියසාවකො ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. සො අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා[2] අසම්මොසාය භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉදං වුච්චති භික්ඛවෙ, විරියින්ද්‍රියං.

1. වවස්සග්ගාරම්මණං වා - සී 1, 2
2. සමාපත්තියා - සයා

මහණෙනි, සතින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවු-තෙමේ සිහි ඇත්තේ උතුම් බලවත් සිහියෙන් යුතු වූයේ ඉතා පෙර කරන ලද්ද කියන ලද්ද පවා සිහි කරනුයේ පුනපුනා සිහි කරනුයේ වෙයි. මහණෙනි, මේ සතින්ද්‍රිය යි කියනු ලැබේ.

මහණෙනි, සමාධින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවු නිවන අරමුණු කොට සමාධිය ලබයි. සිත්හි එකඟබව ලබයි. මහණෙනි, මේ සමාධින්ද්‍රියයි කියනු ලැබේ.

මහණෙනි, ප්‍රඥින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවු පැණ ඇතියේ උදයව්‍යය පිරිසිඳ දක්නා ආර්‍ය්‍ය වූ නිර්වේදයට සමත් වූ, මැනවින් දුක් ගෙවීමට පමුණුවන නුවණින් යුතු වූයේ වෙයි. මහණෙනි, මේ ප්‍රඥින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, මොහු පසිඳුරෝ යි.

## 4. 1. 10

## ද්‍රුතිය විභඩ්ග සූත්‍රය

**1694.** මහණෙනි, මේ ඉඳුරෝ පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... ප්‍රඥින්ද්‍රිය යි. මහණෙනි, සද්ධින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවු සැදැහැත්තේ වෙයි. "ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනු ද ... දෙව්මිනිසුන්ට ශාස්තෘහ, බුද්ධහ, භගවත් හ යි තථාගතයන් වහන්සේගේ බුද්ධබව හදහයි. මහණෙනි, මේ සද්ධින්ද්‍රිය යි කියනු ලැබේ.

මහණෙනි, විරියින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවු අකුසල්දහම් පැහීම පිණිස කුසල්දහම් රැස් කිරීම පිණිස ඇරඹුණු වැර ඇතියේ කුසල්දහම්හි තිරවැර ඇතියේ දැඩිපැරකුම් ඇතියේ නොබහා තැබූ වැර ඇතියේ වෙසෙයි. හේ නූපන් ලාමක අකුසල්දහම් නොඉපැද්ම පිණිස සඳ දනවයි. වැයම් කෙරෙ යි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. පදහන් වැර කෙරෙයි. උපන් ලාමක අකුසල්දහම් පැහීම පිණිස සඳ දනවයි. වැයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. පදහන් වැර කෙරෙයි. නූපන් කුසල්දහම් ඉපැත්ම පිණිස සඳ දනවයි. වැයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. පදහන් වැර කෙරෙයි. උපන් කුසල්දහම් පැවැත්ම පිණිස නොමුළා බව පිණිස බොහෝ බව පිණිස විපුලබව පිණිස වැඩීම පිණිස පිරීම පිණිස සඳ දනවයි. වැයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. පදහන් වැර කෙරෙයි. මහණෙනි, මෙය විරියින්ද්‍රිය යි කියනු ලැබේ.

T-23

කතමඤ්ච භික්ඛවෙ, සතින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො සතිමා හොති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. සො කායෙ කායානුපස්සී විහරති -පෙ- වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. ඉදං වුච්චති භික්ඛවෙ, සතින්ද්‍රියං.

කතමඤ්ච භික්ඛවෙ, සමාධින්ද්‍රියං: ඉධ භික්ඛවෙ අරියසාවකො වොස්සග්ගාරම්මණං කරිත්වා ලභති සමාධිං, ලභති චිත්තස්සෙකග්ගතං. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා -පෙ- දුතියජ්ඣානං -පෙ- තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. ඉදං වුච්චති භික්ඛවෙ, සමාධින්ද්‍රියං.

කතමඤ්ච භික්ඛවෙ, පඤ්ඤින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. සො 'ඉදං දුක්ඛන්ති' යථාභූතං පජානාති. 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා'ති යථාභූතං පජානාති. ඉදං වුච්චති භික්ඛවෙ, පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානීති.

## සුද්ධකවග්ගො පඨමො.

තස්සුද්දානං:

සුද්ධකඤ්ච ද්වෙ සොතා අරහන්තා පරෙ දුවෙ,
ද්වෙ සමණා ච දට්ඨබ්බං විභඞ්ගා අපරෙ දුවෙති.

මහණෙනි, සතින්ද්‍රිය කවරේද යත්: මහණෙනි, මෙහි අරිසවූ සිහි ඇතියේ උතුම් බලවත් සිහියෙන් යුතු වූයේ ඉතා පෙර කරන ලද්ද කියන ලද්ද පවා සිහි කරනුයේ පුනපුනා සිහි කරනුයේ වෙයි. හෙ කයෙහි කය අනු ව දක්නාසුලු ව ... වෙසෙයි. විඳුම්හි ... සිත්හි ... දහම්හි දහම් අනු ව දක්නාසුලු ව කෙලෙස් තවන වැර ඇති ව මනා දැනුම් ඇති ව සිහි ඇති ව දහම්ලෙව්හි දැඩි ලොබ හා දොම්නස දුරු කොට වෙසෙ යි. මහණෙනි, මේ සතින්ද්‍රිය යි කියනු ලැබේ.

මහණෙනි, සමාධින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවූ නිවන අරමුණු කොට සමාධිය ලබයි. සිතෙහි එකඟබව ලබයි. හේ කාමයන්ගෙන් වෙන් ව ම අකුසල්දහමුන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමුවන දැහැනට පැමිණ වෙසෙයි. විතර්කවිචාරයන් සන්හිඳීමෙන් ... දෙවන දැහැනට ... තෙවන දැහැනට පැමිණ වෙසෙයි, සුවක් පැහීමෙන් දුකත් පැහීමෙන් පළමු ම සොම්නස් දොම්නසුන්ගේ අස්තඞ්ගමයෙන් නොදුක් වූ නොසුව වූ මැදහත් බැවින් හා සිහියෙන් හටගත් පිරිසුදුබැව් ඇති සිවු වන දැහැනට පැමිණ වෙසෙයි. මහණෙනි, මේ සමාධින්ද්‍රිය යි කියනු ලැබේ.

මහණෙනි, පඤ්ඤින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවු පැණැතියේ උදයව්‍යය පිරිසිඳ දන්නා ආර්‍ය වූ නිර්වේදයට සමත් වූ මැනැවින් දුක් ගෙවීමට පමුණුවන නුවණින් යුතු වූයේ වෙයි. හේ මේ දුකැයි තතුසේ දනියි. මේ දුක්ඛසමුදය යි තතුසේ දනියි. මේ දුක්ඛනිරෝධය යි තතුසේ දනියි මේ දුක්ඛනිරොධගාමිණී පටිපදය යි තතුසේ දනියි. මහණෙනි, මේ පඤ්ඤින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, මොහු පසිඳුරෝ යි.

## පළමුවැනි සුද්ධක වර්‍ග යි.

එහි සූත්‍රනාමාවලිය:

සුද්ධක සූත්‍රය ද සොත සූත්‍ර දෙක ද අනෙක් අරහන්ත සූත්‍ර දෙක ද සමණ සූත්‍ර දෙක ද දට්ඨබ්බසූත්‍රය ද අනෙක් විභඞ්ග සූත්‍ර දෙකදු යි (මුළුල්ල දශයෙකි)යි.

# 2. මුදුතරවග්ගො

## 4. 2. 1

## පටිලාභසුත්තං

**1695.** පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, සද්ධින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං: "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො -පෙ- සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති. ඉදං වුච්චති භික්ඛවෙ, සද්ධින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, විරියින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, චතුරො සම්මප්පධානෙ ආරබ්භ විරියං පටිලභති, ඉදං වුච්චති භික්ඛවෙ, විරියින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, සතින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, චතුරො සතිපට්ඨානෙ ආරබ්භ සතිං පටිලභති, ඉදං වුච්චති භික්ඛවෙ, සතින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, සමාධින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො වොස්සග්ගාරම්මණං කරිත්වා ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං, ඉදං වුච්චති භික්ඛවෙ, සමාධින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, පඤ්ඤින්ද්‍රියං: ඉධ භික්ඛවෙ, අරියසාවකො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. ඉදං වුච්චති භික්ඛවෙ, පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානීති.

## 4. 2. 2

## සඞ්ඛිත්තසුත්තං

**1696.** පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං සමත්තා පරිපූරත්තා අරහං හොති. තතො මුදුතරෙහි අනාගාමී හොති. තතො මුදුතරෙහි සකදාගාමී හොති. තතො මුදුතරෙහි සොතාපන්නො හොති. තතො මුදුතරෙහි ධම්මානුසාරී හොති. තතො මුදුතරෙහි සද්ධානුසාරී හොතීති.

## 4. 2. 3

## දුතිය සඞ්ඛිත්තසුත්තං

**1697.** පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං සමත්තා පරිපූරත්තා අරහං හොති. තතො මුදුතරෙහි අනාගාමී හොති. තතො මුදුතරෙහි සකදාගාමී හොති. තතො මුදුතරෙහි සොතාපන්නො හොති. තතො මුදුතරෙහි ධම්මානුසාරී හොති. තතො මුදුතරෙහි සද්ධානුසාරී හොති. ඉති ඛො භික්ඛවෙ, ඉන්ද්‍රියවෙමත්තතා ඵලවෙමත්තතා [හොති, ඵලවෙමත්තතා පුග්ගලවෙමත්තතා*]ති.

---

* අයං පාඨො B 1, 2 පොත්ථකෙසු න දිස්සතෙ

# 2. මුදුනර වර්ගය

## 4. 2. 1

## පටිලාභ සූත්‍රය

1695. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, සද්ධින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරීසවු සැදැහැතියේ වෙයි. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනුදු අරහත්හ. සම්මාසම්බුද්ධහ. ... දෙව්මිනිසුන්ට ශාස්තෘහ. බුද්ධහ. භගවත්හ යි. තථාගතයන් වහන්සේගේ බුදුබව හදහයි. මහණෙනි, මේ සද්ධින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, විරියින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, සිවුසම්පදහන් ඇරබ යම් වැරක් පිළිලබා නම් මහණෙනි, මේ විරියින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, සතින්ද්‍රිය කවරේද යත්: මහණෙනි, සිවුසිවටන් ඇරබ යම් සිහියක් පිළිලබා නම් මහණෙනි, මේ සතින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, සමාධින්ද්‍රිය කවරේද යත්: මහණෙනි, මෙහි අරිසවු නිවන අරමුණු කොට සමාධිය ලබා නම් සිතේ එකඟකම ලබා නම් මහණෙනි, මේ සමාධින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, පඤ්ඤින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, මෙහි අරිසවු පැණැතියේ උදයව්‍යය පිරිසිඳ දන්නා ආර්‍ය්‍ය වූ නිර්වේදයට සමත් වූ මැනවින් දුක් ගෙවීමට පමුණුවන නුවණින් යුතු වූයේ වේ නම් මහණෙනි, මේ පඤ්ඤින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, මොහු පසිඳුරෝ යි.

## 4. 2. 2

## සඞ්ඛිත්ත සූත්‍රය

1696. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි. මහණෙනි, මේ පසිඳුරන් රැස්කළ බැවින් පිරූ බැවින් රහත් වෙයි. එයට වඩා මොළොක් ඉඳුරන් හෙතු කොට ගෙන අනගැමි වෙයි. එයට වඩා මොළොක් වූවන් හෙතු කොට ගෙන සෙදගැමි වෙයි. එයට වඩා මොළොක් වූවන් හෙතු කොට ගෙන සෝවන් වෙයි. එයට වඩා මොළොක් වූවන් හෙතු කොට ගෙන ධම්මානුසාරී වෙයි. එයට වඩා මොළොක් වූවන් හෙතු කොට ගෙන සද්ධානුසාරී වේ යි.

## 4. 2. 3

## දුතිය සඞ්ඛිත්ත සූත්‍රය

1697. මහණෙනි, මේ ඉඳුරෝ පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි. මහණෙනි, මේ පසිඳුරන් සවාරෙන් පිරිපුන් බැවින් රහත් වෙයි. එයට වඩා මොළොක් ඉඳුරන්ගෙන් අනගැමි වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සෙදගැමි වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සෝවන් වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් ධම්මානුසාරී වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සද්ධානුසාරී වෙයි. මහණෙනි, මෙසේ ඉන්ද්‍රියනානාත්වයෙන් ඵලනානාත්වය ද [ඵලනානාත්වයෙන් පුද්ගලනානාත්වය ද] වේ යි.

## 4. 2. 4

## තතිය සඞ්ඛිත්තසුත්තං

1698. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං සමත්තා පරිපූරත්තා අරහං හොති. තතො මුදුතරෙහි අනාගාමී හොති. තතො මුදුතරෙහි සකදාගාමී හොති. තතො මුදුතරෙහි සොතාපන්නො හොති. තතො මුදුතරෙහි ධම්මානුසාරී හොති. තතො මුදුතරෙහි සද්ධානුසාරී හොති. ඉති ඛො භික්ඛවෙ, පරිපූරං පරිපූරකාරී ආරාධෙති. පදෙසං පදෙසකාරී ආරාධෙති. අවඤ්ඣානීත්වෙවාහං භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි වදාමීති.

## 4. 2. 5

## විත්ථාරසුත්තං

1699. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං සමත්තා පරිපූරත්තා අරහං හොති. තතො මුදුතරෙහි අන්තරා පරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි උපහච්ච පරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි අසඞ්ඛාර පරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි සසඞ්ඛාරපරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. තතො මුදුතරෙහි සකදාගාමී හොති. තතො මුදුතරෙහි සොතාපන්නො හොති. තතො මුදුතරෙහි ධම්මානුසාරී හොති. තතො මුදුතරෙහි සද්ධානුසාරී හොතීති.

## 4. 2. 6

## දුතිය විත්ථාරසුත්තං

1700. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං සමත්තා පරිපූරත්තා අරහං හොති. තතො මුදුතරෙහි අන්තරාපරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි උපහච්චපරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි අසඞ්ඛාර පරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි සසඞ්ඛාරපරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. තතො මුදුතරෙහි සකදාගාමී හොති. තතො මුදුතරෙහි සොතාපන්නො හොති. තතො මුදුතරෙහි ධම්මානුසාරී හොති. තතො මුදුතරෙහි සද්ධානුසාරී හොති. ඉති ඛො භික්ඛවෙ, ඉන්ද්‍රියවෙමත්තතා ඵලවෙමත්තතා හොති ඵලවෙමත්තතා පුග්ගලවෙමත්තතාති.

## 4. 2. 4

## තතියසඞ්ඛිත්ත සූත්‍රය

1698. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි. මහණෙනි, මේ පසිඳුරන් මුළුමනින් පිරිපුන් බැවින් රහත් වෙයි. එයට වඩා මෘදු ඉඳුරන්ගෙන් අනගැමි වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සෙදගැමි වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සෝවන් වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් ධම්මානුසාරී වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සද්ධානුසාරී වෙයි. මහණෙනි, මෙසේ පිරිපුන් රහත්මඟ කරන්නේ රහත්බව සපයයි. පෙදෙස් වූ යට තුන්මඟ කරන්නේ යට තුන් පල සපයයි. මහණෙනි, පසිඳුරෝ නො ම වඳහයි මම කියමියි.

## 4. 2. 5

## විත්ථාර සූත්‍රය

1699 මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි. මහණෙනි, මේ පසිඳුරන් මුළුමනින් පිරිපුන් බැවින් රහත් වෙයි. එයට වඩා මොළොක් ඉඳුරන්ගෙන් (ආයු මැද නොයික්මවා) අතර කෙලෙස් පිරිනිවනින් පිරිනිවෙනසුලු හෙවත් රහත්වනසුලු වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් (ආයු මැද ඉක්මවා) කෙලෙස් පිරිනිවනින් පිරිනිවෙනසුලු වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් පියෝ නැති ව (සුවසේ) කෙලෙස් පිරිනිවනින් පිරිනිවෙනසුලු වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් පියෝ ඇති ව (දුකසේ) කෙලෙස් පිරිනිවනින් පිරිනිවෙනසුලු වෙයි. එයට වඩා මොළොක්වූවන්ගෙන් අකනිට්ඨා යනසුලු උද්ධංසොතයෙක් හෙවත් අව්හයෙහි පටන් සිවුබඹලොව උපදින්නෙක් වෙයි. එයට වඩා මොළොක්වූවන්ගෙන් සෙදගැමි වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සෝවන් වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් ධම්මානුසාරී වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සද්ධානුසාරී වේ යි.

## 4. 2. 6

## දුතිය විත්ථාර සූත්‍රය

1700. මහණෙනි, මේ ඉඳුරෝ පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි. මහණෙනි, මේ පසිඳුරන් මුළුමනින් පිරිපුන් බැවින් රහත් වෙයි. එයට වඩා මෘදු වූවන්ගෙන් අන්තරාපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් උපහච්චපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් අසඞ්ඛාරපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් සසඞ්ඛාරපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් අකනිට්ඨගාමී උද්ධංසොත වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් සකදාගාමී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් සොතාපන්න වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් ධම්මානුසාරී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් සද්ධානුසාරී වේ. මහණෙනි, මෙසේ ඉන්ද්‍රියනානාත්වයෙන් ඵලනානාත්වය ද ඵලනානාත්වයෙන් පුද්ගලනානාත්වය ද වේ යි.

## 4. 2. 7

## තතිය විත්ථාරසුත්තං

1701. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං සමත්තා පරිපූරත්තා අරහං හොති. තතො මුදුතරෙහි අන්තරාපරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි උපහච්චපරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි අසඞ්ඛාරපරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි සසඞ්ඛාරපරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. තතො මුදුතරෙහි සකදාගාමී හොති. තතො මුදුතරෙහි සොතාපන්නො හොති. තතො මුදුතරෙහි ධම්මානුසාරී හොති. තතො මුදුතරෙහි සද්ධානුසාරී හොති. ඉති ඛො භික්ඛවෙ, පරිපූරං පරිපූරකාරී ආරාධෙති. පදෙසං පදෙසකාරී ආරාධෙති. අවඤ්ඣානිත්වෙවාහං භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි වදාමීති.

## 4. 2. 8

## පටිපන්නසුත්තං

1702. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං සමත්තා පරිපූරත්තා අරහං හොති. තතො මුදුතරෙහි අරහත්තඵලසච්ඡිකිරියාය පටිපන්නො හොති. තතො මුදුතරෙහි අනාගාමී හොති. තතො මුදුතරෙහි අනාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො හොති. තතො මුදුතරෙහි සකදාගාමී හොති. තතො මුදුතරෙහි සකදාගාමිඵලසච්ඡිකිරියාය පටිපන්නො හොති. තතො මුදුතරෙහි සොතාපන්නො හොති. තතො මුදුතරෙහි සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො හොති. යස්ස ඛො භික්ඛවෙ, ඉමානි පඤ්චින්ද්‍රියානි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං නත්ථි, තමහං බාහිරො පුථුජ්ජනපක්ඛෙ ඨිතොති වදාමීති.

## 4. 2. 7

## තතිය විත්ථාර සූත්‍රය

1701. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි. මහණෙනි, මේ පසිඳුරන් මුළුමනින් පිරිපුන් බැවින් රහත් වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් අන්තරාපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් උපහච්චපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් අසඞ්ඛාරපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් සසඞ්ඛාරපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් අකනිට්ඨගාමී උද්ධංසොත වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සකදගාමී වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සොතාපන්න වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් ධම්මානුසාරී වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සද්ධානුසාරී වෙයි. මහණෙනි, මෙසේ පිරිපුන් රහත්මග කරන්නේ රහත්බව සපය යි, යට තුන්මග කරන්නේ යට තුන්පල සපය යි. මහණෙනි, පසිඳුරෝ නො ම වඳහයි මම කියමි යි.

## 4. 2. 8

## පටිපන්න සූත්‍රය

1702. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි. මහණෙනි, මේ පසිඳුරන් මුළුමනින් පිරිපුන් බැවින් රහත් වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් රහත්පල පසක් කරනු වස් පිළිපන්නේ වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් අනගැමි වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් අනගැමිපල පසක් කරනු වස් පිළිපන්නේ වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සෙදගැමි වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සෙදගැමිපල පසක් කරනු වස් පිළිපන්නේ වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සෝවන් වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සෝවන්පල පසක් කරනු වස් පිළිපන්නේ වෙයි. මහණෙනි, යමකුට මේ පසිඳුරෝ මුළුමනින් සියලු අයුරින් නැද්ද, හෙතෙමේ බැහැර වූ පුහුදුන් පසෙහි සිටියේ ය යි මම කියමි යි.

## 4. 2. 9

### සම්පන්නසුත්තං

1703. අථ ඛො අඤ්ඤතරො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි -පෙ- එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච: "ඉන්ද්‍රියසම්පන්නො ඉන්ද්‍රියසම්පන්නො''ති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ, ඉන්ද්‍රියසම්පන්නො හොතීති? ඉධ භික්ඛු, භික්ඛු සද්ධින්ද්‍රියං භාවෙති උපසමගාමිං සම්බොධගාමිං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවෙති උපසමගාමිං සම්බොධගාමිං. එත්තාවතා ඛො භික්ඛු, ඉන්ද්‍රියසම්පන්නො හොතීති.

## 4. 2. 10

### ආසවක්ඛයසුත්තං

1704. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤාසච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

### මුදුතරවග්ගො දුතියො.

**තත්‍රුද්දානං:**

පටිලාභො තිසඞ්ඛිත්තා විත්ථාරා අපරෙ තයො
පටිපන්නො ච සම්පන්නො දසමො ආසවක්ඛයොති.

## 4. 2. 9

## සම්පන්න සූත්‍රය

1703. ඉක්බිති එක්තරා මහණෙක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹියේ ය ... එකත්පස් ව හුන් ඒ මහණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය. වහන්ස, ඉන්ද්‍රියසම්පන්නය ඉන්ද්‍රියසම්පන්නය යි කියනු ලැබේ. වහන්ස, කෙතෙකින් ඉන්ද්‍රියසම්පන්න වේද යි? මහණ, මෙහි මහණතෙමේ කෙලෙස් සංහිඳීමට පමුණුවනසුලු සිවුමඟනැණ පිළිවිදුමට පමුණුවනසුලු සද්ධින්ද්‍රිය වඩයි ... කෙලෙස් සංසිඳුවීමට පමුණුවනසුලු සිවුමඟනැණ පිළිවිදුමට පමුණුවනසුලු පඤ්ඤින්ද්‍රිය වඩයි. මහණ මෙතෙකින් ඉන්ද්‍රියසම්පන්න (-පිරිපුන් ඉඳුරන් ඇත්තේ) වේ යි.

## 4. 2. 10

## ආසවක්ඛය සූත්‍රය

1704. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි. මහණෙනි, මේ පසිඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් මහණ තෙමේ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් අනාස්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටුදැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

### දෙවෙනි මුදුතර වර්ග යි.

එහි සූත්‍රනාමාවලිය:

පටිලාභ සූත්‍රය, සඞ්ඛිත්ත සූත්‍ර තුන ය, අනෙක් විත්ථාර සූත්‍ර තුන ය, පටිපන්නසම්පන්නසූත්‍ර දෙක ය. දශවන ආසවක්ඛයසූත්‍ර ය යි දශසූත්‍රාන්ත කෙනෙකි යි.

# 3. ඡළින්ද්‍රියවග්ගො

## 4. 3. 1

## පුනබ්භවසුත්තං

1705. පඤ්චිමානි භික්ඛවෙ. ඉන්ද්‍රියානි කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං. -පෙ- පඤ්ඤින්ද්‍රියං. යාවකීවාහං[1] භික්ඛවෙ, ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නාබ්භඤ්ඤාසිං, නෙව තාවාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං. යතො ච ඛො'හං භික්ඛවෙ, ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතොවිමුත්ති, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවොති.

## 4. 3. 2

## ජීවිතින්ද්‍රියසුත්තං

1706. තීනිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි තීනි: ඉත්ථින්ද්‍රියං පුරිසින්ද්‍රියං ජීවිතින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, තීනි ඉන්ද්‍රියානීති.

## 4. 3. 3

## අඤ්ඤින්ද්‍රියසුත්තං

1707. තීනිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි කතමානි තීනි: අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, අඤ්ඤින්ද්‍රියං, අඤ්ඤාතාවින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, තීනි ඉන්ද්‍රියානීති.

1. යාවකීවඤ්චාහං - මජසං, ස්‍යා

# 3. ජළින්ද්‍රිය වර්ගය

## 4. 3. 1

## පුනබ්භව සූත්‍රය

1705. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්‍ද්‍රිය ... පඤ්ඤින්‍ද්‍රිය යි. මහණෙනි, මම යම්තාක් මේ පසිඳුරන්ගේ සමුදයයත් අස්තගමයත් ආස්වාදයත් නිස්සරණයත් තතුසේ නො දත්තෙම් ද, මහණෙනි, ඒතාක් මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි මහණබමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජායෙහි අනුත්තර වූ සම්මාසම්බෝධිය (=බුද්ධත්වය) අවබෝධ කෙළෙමැ යි නො ම පිළිණ කෙළෙම්. මහණෙනි, මම යම් කලෙක මේ පසිඳුරන්ගේ සමුදයයත් අස්තගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ දත්තෙම් ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෙව්හි මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි අනුත්තර වූ සම්මාසම්බෝධිය අවබෝධ කෙළෙමැ යි පිළින කෙළෙම්. මට පස්විකුම්නැණ ද පහළ විය. මාගේ අරහත්ඵලවිමුක්තිය නො සැලේ (නො පිරිහේ). මේ අන්තිම ඉපැද්ම යි. දැන් පුනර්භවයෙක් නැතැ යි.

## 4. 3. 2

## ජීවිතින්‍ද්‍රිය සූත්‍රය

1706. මහණෙනි, මේ ඉන්‍ද්‍රිය තුනෙකි. කවර තුනෙක් ද යත්: ඉත්ථින්‍ද්‍රිය පුරිසින්‍ද්‍රිය ජීවිතින්‍ද්‍රිය යි. මහණෙනි, මොහු තුන් ඉඳුරෝ යි.

## 4. 3. 3

## අඤ්ඤින්ද්‍රිය සූත්‍රය

1707. මහණෙනි, මේ ඉන්‍ද්‍රිය තුනෙකි. කවර තුනෙක් ද යත්, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්‍ද්‍රිය, අඤ්ඤින්‍ද්‍රිය, අඤ්ඤාතාවින්‍ද්‍රිය යි. මහණෙනි, මොහු තුන් ඉඳුරෝ යි.

## 4. 3. 4

### ඒකබීජිසුත්තං

1708. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං සමත්තා පරිපූරත්තා අරහං හොති. තතො මුදුතරෙහි අන්තරා පරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි උපහච්චපරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි අසංඛාර පරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි සසඞ්ඛාරපරිනිබ්බායී හොති. තතො මුදුතරෙහි උද්ධංසොතො හොති අකනිට්ඨගාමී. තතො මුදුතරෙහි සකදාගාමී හොති. තතො මුදුතරෙහි ඒකබීජී හොති. තතො මුදුතරෙහි කොලංකොලො හොති. තතො මුදුතරෙහි සත්තක්ඛත්තුපරමො[1] හොති. තතො මුදුතරෙහි ධම්මානුසාරී හොති. තතො මුදුතරෙහි සද්ධානුසාරී හොතීති.

## 4. 3. 5

### සුද්ධකසුත්තං

1709. ඡයිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි ඡ: චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, ඡ ඉන්ද්‍රියානීති.

## 4. 3. 6

### සොතාපන්නසුත්තං

1710. ඡයිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි ඡ: චක්ඛුන්ද්‍රියං -පෙ- මනින්ද්‍රියං. යතො ඛො භික්ඛවෙ, අරියසාවකො ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති. අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

## 4. 3. 7

### අරහන්තසුත්තං

1711. ඡයිමානි භික්ඛවෙ; ඉන්ද්‍රියානි. කතමානි ඡ: චක්ඛුන්ද්‍රියං -පෙ- මනින්ද්‍රියං. යතො ඛො භික්ඛවෙ, භික්ඛු ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාද විමුත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්ත-සදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තොති.

---

1. සත්තක්ඛත්තුං පරමො - සතා

## 4. 3. 4

## ඒකබීජී සූත්‍රය

1708. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සැදැහැඉඳුරිය ... පඤ්ඤින්ද්‍රිය යි, මහණෙනි, මොහු පසිඳුරෝ ය. මහණෙනි, මේ පසිඳුරන් මුළුමනින් පිරිපුන් බැවින් රහත් වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් අන්තරාපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් උපහච්චපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන් ගෙන් අසඞ්ඛාරපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් සසඞ්ඛාරපරිනිබ්බායී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් අකනිට්ඨ-ගාමී උද්ධංසොත වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් සකදාගාමී වේ. එයට වඩා මොළොක් වූවන්ගෙන් ඒකබීජී (=එක් පිළිසඳක් ඇත්තේ) වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් කොලංකොල (=දෙතුන් පිළිසඳක් ඇත්තේ) වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සත්තක්ඛත්තුපරම (=සත්වන පිළිසඳ කෙළවරකොට ඇත්තේ) වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් ධම්මානුසාරී වෙයි. එයට වඩා මොළොක් වූවන්ගෙන් සද්ධානුසාරී වේ යි.

## 4. 3. 5

## සුද්ධක සූත්‍රය

1709. මහණෙනි, මේ ඉන්ද්‍රිය සයෙකි. කවර සයෙක් ද යත්: චක්ඛුන්ද්‍රිය සොතින්ද්‍රිය ඝානින්ද්‍රිය ජිව්හින්ද්‍රිය කායින්ද්‍රිය මනින්ද්‍රිය යි. මහණෙනි, මොහු සඉඳුරෝ යි.

## 4. 3. 6

## සොතාපන්න සූත්‍රය

1710. මහණෙනි, මේ ඉන්ද්‍රිය සයෙකි. කවර සයෙක් ද යත්: චක්ඛුන්ද්‍රිය ... මනින්ද්‍රිය යි. මහණෙනි, යම් කලෙක අරිසවු මේ සයිඳුරන්ගේ සමුදයත් අස්තගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ දනී ද, මහණෙනි, මේ අරිසවු සිවුඅපාහි නොහෙන සැහැවි ඇති නියත වූ මතු තුන්මඟ නමැති සම්බෝධිය පිහිට කොට ඇති සෝවන් පුඟුල් යි කියනු ලැබේ යි.

## 4. 3. 7

## අරහන්ත සූත්‍රය

1711. මහණෙනි, මේ ඉන්ද්‍රිය සයෙකි. කවර සයෙක් ද යත්: චක්ඛුන්ද්‍රිය ... මනින්ද්‍රිය යි. මහණෙනි, යම්කලෙක මහණ මේ සයිඳුරන්ගේ සමුදයයත් අස්තගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ දැන උපාදාන රහිත ව මිදුනේ වේ ද, මහණෙනි, මේ මහණ ක්ෂය කළ ආස්‍රව ඇති වැස නිම වූ බඹසර ඇති කළ සිවුමඟ කටයුතු ඇති බහා තැබූ කෙලෙස් බර ඇති පිළිවෙළින් පැමිණි ස්වාර්ථය ඇති ක්ෂය කළ භවසංයොජන ඇති මැනවින් දැන මිදුණු රහතැයි කියනු ලැබේ යි.

## 4. 3. 8

### බුද්ධසුත්තං

1712. ඡයිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි කතමානි ඡ; චක්ඛුන්ද්‍රියං -පෙ- මනින්ද්‍රියං. යාවකීවාහං භික්ඛවෙ, ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නාබ්භඤ්ඤාසිං -පෙ- ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි. අකුප්පා මෙ චෙතොවිමුත්ති. අයමන්තිමා ජාති. නත්ථිදානි පුනබ්භවොති.

## 4. 3. 9

### සමණබ්‍රාහ්මණසුත්තං

1713. ඡයිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි ඡ; චක්ඛුන්ද්‍රියං -පෙ- මනින්ද්‍රියං. යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං ඡන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති -පෙ- පජානන්ති -පෙ- සයං අභිඤ්ඤාසච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 4. 3. 10

### දුතිය සමණබ්‍රාහ්මණසුත්තං

1714. යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා චක්ඛුන්ද්‍රියං නප්පජානන්ති, චක්ඛුන්ද්‍රියසමුදයං නප්පජානන්ති, චක්ඛුන්ද්‍රියනිරොධං නප්පජානන්ති, චක්ඛුන්ද්‍රියනිරොධගාමිනිපටිපදං නප්පජානන්ති. සොතින්ද්‍රියං නප්පජානන්ති -පෙ- ඝානින්ද්‍රියං නප්පජානන්ති -පෙ- ජිව්හින්ද්‍රියං නප්පජානන්ති -පෙ- කායින්ද්‍රියං නප්පජානන්ති -පෙ- මනින්ද්‍රියං නප්පජානන්ති, මනින්ද්‍රියසමුදයං නප්පජානන්ති, මනින්ද්‍රියනිරොධං නප්පජානන්ති, මනින්ද්‍රියනිරොධගාමිනිපටිපදං නප්පජානන්ති -පෙ- පජානන්ති -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

### ඡළින්ද්‍රියවග්ගො තතියො.

**තත්‍රුද්දානං:**

පුනබ්භවො ජීවිතඤ්ඤා, එකබීජි ච සුද්ධකං,
සොතාපන්නො'රහං බුද්ධො දෙව්ච සමණබ්‍රාහ්මණාති.

## 4. 3. 8

## බුද්ධ සූත්‍රය

1712. මහණෙනි, මේ ඉන්ද්‍රිය සයෙකි. කවර සයෙක් ද යත්: චක්ඛුන්ද්‍රිය ... මනින්ද්‍රිය යි. මහණෙනි, මම යම්තාක් මේ සඉඳුරන්ගේ සමුදයයත් අස්තගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ නො දත්තෙම් ද ... මට පස්විකුම් නැණ ද පහළ විය. මාගේ අර්හත්ඵල විමුක්තිය නො සැලේ. මේ කෙළවර ඉපැද්ම ය. දැන් පුනර්භවයෙක් නැතැ යි.

## 4. 3. 9

## සමණබ්‍රාහ්මණ සූත්‍රය

1713. මහණෙනි, මේ ඉන්ද්‍රිය සයෙකි. කවර සයෙක් ද යත්: චක්ඛුන්ද්‍රිය ... මනින්ද්‍රිය යි. මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ පසිඳුරන්ගේ සමුදයයත් අස්තගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතුසේ නො දනිත් ද ... දනිත් ද ... තුමූ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙති යි.

## 4. 3. 10

## දුතිය සමණබ්‍රාහ්මණ සූත්‍රය

1714. මහණෙනි, යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ චක්ඛුන්ද්‍රියය නො දනිත්ද, චක්ඛුන්ද්‍රිය සමුදය නො දනිත්ද, චක්ඛුන්ද්‍රිය නිරොධය නො දනිත්ද, චක්ඛුන්ද්‍රිය නිරොධගාමිනීපටිපදව නො දනිත්ද, සොතින්ද්‍රිය නො දනිත්ද ... ඝානින්ද්‍රිය නො දනිත් ද ... ජිව්හින්ද්‍රිය නො දනිත් ද ... කායින්ද්‍රිය නො දනිත්ද ... මනින්ද්‍රිය නො දනිත්ද, මනින්ද්‍රිය සමුදය නො දනිත්ද, මනින්ද්‍රිය නිරොධය නො දනිත් ද, මනින්ද්‍රිය නිරොධගාමිනීපටිපදව නො දනිත්ද ... දනිත්ද ... තුමූ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙති යි.

### තෙවැනි ජලින්ද්‍රියවග්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

පුනබ්භව, ජීවිතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, ඒකබීජී, සුද්ධක, සොතාපන්න, අරහන්ත, බුද්ධ යි සූත්‍ර අටෙක් ද සමණබ්‍රාහ්මණ සූත්‍ර දෙකෙක් ද වෙති යි.

T–24

# 4. සුඛින්ද්‍රියවග්ගො

## 4. 4. 1

### සුද්ධකසුත්තං

1715. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සුඛින්ද්‍රියං දුක්ඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං, ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානීති.

## 4. 4. 2

### සොතාපන්නසුත්තං

1716. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සුඛින්ද්‍රියං දුක්ඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං. යතො ඛො භික්ඛවෙ, අරියසාවකො ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානාති, අයං වුච්චති භික්ඛවෙ, අරියසාවකො සොතාපන්නො අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායණොති.

## 4. 4. 3

### අරහන්තසුත්තං

1717. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සුඛින්ද්‍රියං -පෙ- උපෙක්ඛින්ද්‍රියං. යතො ඛො භික්ඛවෙ, භික්ඛු ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං විදිත්වා අනුපාද විමුත්තො හොති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤාවිමුත්තොති.

# 4. සුඛින්ද්‍රිය වර්ගය

## 4. 4. 1

## සුද්ධක සූත්‍රය

1715. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සුඛින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය දෞමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි.

## 4. 4. 2

## සොත සූත්‍රය

1716. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සුඛින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය දෞමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය යි. මහණෙනි, යම් කලෙක අරිසවු තෙමේ මේ පසිඳුරන්ගේ සමුදයත් අස්තගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ දනී ද, මහණෙනි, මේ අරිසවු තෙමේ සිවුඅපායෙහි නො හෙනඳුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවන් යි කියනු ලැබේ යි.

## 4. 4. 3

## අරහන්ත සූත්‍රය

1717. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සුඛින්ද්‍රිය ... උපෙක්ඛින්ද්‍රිය යි. මහණෙනි, යම් කලෙක මහණ මේ පසිඳුරන්ගේ සමුදයයත් අස්තගමයත් ආස්වාදයත්, ආදීනවයත් නිස්සරණයත් තතුසේ දැන මිදුණේ වේ ද, මහණෙනි, මේ මහණ ක්‍ෂය කළ ආසුව ඇති වැස නිම වූ බඹසර ඇති කළ කටයුතු ඇති බහා තැබූ බර ඇති පිළිවෙළින් පැමිණි ස්වාර්ථ ඇති සහමුලින් ක්‍ෂය වූ භවසංයොජන ඇති මැනවින් දැන මිදුණු රහතැ යි කියනු ලැබේ යි.

## 4. 4. 4

## සමණබ්‍රාහ්මණසුත්තං

1718. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සුඛින්ද්‍රියං -පෙ- උපෙක්ඛින්ද්‍රියං. යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං සමුදයඤ්ච අත්ථගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති -පෙ- පජානන්ති -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 4. 4. 5

## දුතිය සමණබ්‍රාහ්මණසුත්තං

1719. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සුඛින්ද්‍රියං -පෙ- උපෙක්ඛින්ද්‍රියං. යෙ හි කෙචි භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා සුඛින්ද්‍රියං නප්පජානන්ති, සුඛින්ද්‍රියසමුදයං නප්පජානන්ති, සුඛින්ද්‍රියනිරොධං නප්පජානන්ති, සුඛින්ද්‍රියනිරොධගාමිනිපටිපදං නප්පජානන්ති. දුක්ඛින්ද්‍රියං නප්පජානන්ති -පෙ- සොමනස්සින්ද්‍රියං නප්පජානන්ති -පෙ- දෙමනස්සින්ද්‍රියං නප්පජානන්ති-පෙ-උපෙක්ඛින්ද්‍රියං නප්පජානන්ති. උපෙක්ඛින්ද්‍රියසමුදයං නප්පජානන්ති උපෙක්ඛින්ද්‍රියනිරොධං නප්පජානන්ති, උපෙක්ඛින්ද්‍රියනිරොධගාමිනිපටිපදං නප්පජානන්ති -පෙ- පජානන්ති -පෙ- සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්තීති.

## 4. 4. 6

## විභඞ්ගසුත්තං

1720. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සුඛින්ද්‍රියං -පෙ- උපෙක්ඛින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, සුඛින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, කායිකං සුඛං, කායිකං සාතං කායසම්ඵස්සජං සුඛං සාතං වෙදයිතං, ඉදං වුච්චති භික්ඛවෙ, සුඛින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, කායිකං දුක්ඛං කායිකං අසාතං කායසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං, ඉදං වුච්චති භික්ඛවෙ, දුක්ඛින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, සොමනස්සින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, චෙතසිකං සුඛං චෙතසිකං සාතං මනොසම්ඵස්සජං සුඛං සාතං වෙදයිතං, ඉදං වුච්චති භික්ඛවෙ, සොමනස්සින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, දෙමනස්සින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, චෙතසිකං දුක්ඛං චෙතසිකං අසාතං මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං, ඉදං වුච්චති භික්ඛවෙ, දෙමනස්සින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, උපෙක්ඛින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, කායිකං වා චෙතසිකං වා නෙව සාතං නාසාතං වෙදයිතං, ඉදං වුච්චති භික්ඛවෙ, උපෙක්ඛින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානීති.

## 4. 4. 4

## සමණබ්‍රාහ්මණ සූත්‍රය

1718. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සුඛින්ද්‍රිය ... උපෙක්ඛින්ද්‍රිය යි. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ මේ පසිඳුරන්ගේ සමුදයත් අස්තංගමයත් ආස්වාදයත් ආදීනවයත් නිස්සරණයත් තතු සේ නො දනිත්ද ... දනිත්ද ... තුමූ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙති යි.

## 4. 4. 5

## දුතිය සමණබ්‍රාහ්මණ සූත්‍රය

1719. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සුඛින්ද්‍රිය ... උපෙක්ඛින්ද්‍රිය යි. මහණෙනි, යම් කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ සුඛින්ද්‍රිය නො දනිත් ද. සුඛින්ද්‍රියසමුදයය නො දනිත් ද සුඛින්ද්‍රියනිරොධය නො දනිත් ද සුඛින්ද්‍රියනිරොධගාමිනීපටිපදාව නො දනිත් ද දුක්ඛින්ද්‍රිය නො දනිත් ද ... සොමනස්සින්ද්‍රිය නො දනිත් ද ... දොමනස්සින්ද්‍රිය නො දනිත් ද ... උපෙක්ඛින්ද්‍රිය නො දනිත්ද...උපෙක්ඛින්ද්‍රියසමුදය නො දනිත්ද ... උපෙක්ඛින්ද්‍රියනිරොධය නො දනිත් ද... උපෙක්ඛින්ද්‍රියනිරොධගාමිනීපටිපදාව නො දනිත් ... දනිත් ... තුමූ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසෙති යි.

## 4. 4. 6

## විභඞ්ග සූත්‍රය

1720. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සුඛින්ද්‍රිය ... උපෙක්ඛින්ද්‍රිය යි. මහණෙනි, සුඛින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, කායප්‍රසාදය වස්තු කොට ඇති සුව වූ කායප්‍රසාදය වස්තු කොට ඇති මිහිරි වූ කායපහසින් හටගත් සුව වූ මිහිරි වූ යම් වේදනාවක් වේ ද, මහණෙනි, මේ සුඛින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, දුක්ඛින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, කායප්‍රසාදය වස්තු කොට ඇති දුක් වූ කායප්‍රසාදය වස්තු කොට ඇති අමිහිරි වූ කායපහසින් හටගත් දුක් වූ අමිහිරි වූ යම් වේදනාවක් වේ ද, මහණෙනි, මේ දුක්ඛින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, සොමනස්සින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, සිත පිළිබඳ සුව වූ සිත පිළිබඳ මිහිරි වූ මනපහසින් හටගත් සුව වූ මිහිරි වූ යම් වේදනාවක් වේ ද, මහණෙනි, මේ සොමනස්සින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, දොම්නස්සින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, සිත පිළිබඳ දුක් වූ සිත පිළිබඳ අමිහිරි වූ මනපහසින් හටගත් දුක් වූ අමිහිරි වූ යම් වේදනාවක් වේ ද, මහණෙනි, මේ දොමනස්සින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, උපෙක්ඛින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, චක්ඛු සොත ඝාන ජිව්හාප්‍රසාද වස්තු කොට ඇත්තා වූ හෝ සිත පිළිබඳ වූ හෝ නො ම මිහිරි වූත් නොම අමිහිරි වූත් යම් වේදනාවක් වේ ද, මහණෙනි, මේ උපෙක්ඛින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, මොහු පසිඳුරෝ යි.

## 4. 4. 7

## දුතිය විභඞ්ගසුත්තං

1721. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි කතමානි පඤ්ච: සුඛින්ද්‍රියං –පෙ– උපෙක්ඛින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, සුඛින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, කායිකං සුඛං කායිකං සාතං කායසම්ඵස්සජං සුඛං සාතං වෙදයිතං, ඉදං වුච්චති භික්ඛවෙ, සුඛින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, දුක්ඛින්ද්‍රියං: –පෙ– කතමඤ්ච භික්ඛවෙ, උපෙක්ඛින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, කායිකං වා චෙතසිකං වා නෙව සාතං නාසාතං වෙදයිතං, ඉදං වුච්චති භික්ඛවෙ, උපෙක්ඛින්ද්‍රියං. තත්‍ර භික්ඛවෙ යඤ්ච සුඛින්ද්‍රියං යඤ්ච සොමනස්සින්ද්‍රියං සුඛා සා වෙදනා දට්ඨබ්බා. යඤ්ච දුක්ඛින්ද්‍රියං යඤ්ච දෙමනස්සින්ද්‍රියං තත්‍ර භික්ඛවෙ, දුක්ඛා සා වෙදනා දට්ඨබ්බා. තත්‍ර භික්ඛවෙ, යම්දං[1] උපෙක්ඛින්ද්‍රියං අදුක්ඛමසුඛා සා වෙදනා දට්ඨබ්බා. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානීති.

## 4. 4. 8

## තතිය විභඞ්ගසුත්තං

1722. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සුඛින්ද්‍රියං –පෙ– උපෙක්ඛින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, සුඛින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, කායිකං සුඛං, කායිකං සාතං, කායසම්ඵස්සජං සුඛං සාතං වෙදයිතං, ඉදං වුච්චති භික්ඛවෙ, සුඛින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ දුක්ඛින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, කායිකං දුක්ඛං කායිකං අසාතං, කායසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං, ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, සොමනස්සින්ද්‍රියං: යං ඛො භික්ඛවෙ, චෙතසිකං සුඛං චෙතසිකං සාතං මනොසම්ඵස්සජං සුඛං සාතං වෙදයිතං. ඉදං වුච්චති භික්ඛවෙ, සොමනස්සින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, දෙමනස්සින්ද්‍රියං: යඤ්ච භික්ඛවෙ, චෙතසිකං දුක්ඛං චෙතසිකං අසාතං මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං. ඉදං වුච්චති භික්ඛවෙ, දෙමනස්සින්ද්‍රියං. කතමඤ්ච භික්ඛවෙ, උපෙක්ඛින්ද්‍රියං. යං ඛො භික්ඛවෙ, කායිකං වා චෙතසිකං වා නෙවසාතං නාසාතං වෙදයිතං, ඉදං වුච්චති භික්ඛවෙ, උපෙක්ඛින්ද්‍රියං.

1. යදිදං - මජසං., සතා

## 4. 4. 7

## දුතිය විභඞ්ග සූත්‍රය

1721. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සුඛින්ද්‍රිය ... උපෙක්ඛින්ද්‍රිය යි. මහණෙනි, සුඛින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, කායප්‍රසාදය වස්තු කොට ඇති සුව වූ කායප්‍රසාදය වස්තු කොට ඇති මිහිරි වූ කාපහසින් හටගත් සුව වූ මිහිරි වූ යම් වෙදනාවක් වේ ද, මහණෙනි, මෙය සුඛින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, දුක්ඛින්ද්‍රිය කවරේ ද යත්: ... මහණෙනි, උපෙක්ඛින්ද්‍රිය කවරේද යත්: මහණෙනි, චක්ඛු සොත ඝාන ජිව්හාප්‍රසාදවාස්තුක වූ හෝ චෛතසික වූ හෝ නො ම මිහිරි වූ ත් නො ම අමිහිරි වූ ත් යම් වෙදනාවක් වේ ද, මහණෙනි, මේ උපෙක්ඛින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, එහි යම් සුඛින්ද්‍රියයකුත් යම් සොමනස්සින්ද්‍රියයකුත් වේ නම් එය සුවවෙදනා යි දැක්කයුතු. මහණෙනි, එහි යම් දුක්ඛින්ද්‍රියයකුත් යම් දෙමනස්සින්ද්‍රියයකුත් වේ නම් එය දුක් වෙදනා යි දැක්කයුතු. මහණෙනි, එහි යම් මේ උපෙක්ඛින්ද්‍රියයෙක් වේ නම් එය නොදුක් නොසුවවෙදනා යි දැක්කයුතු. මහණෙනි, මොහු පසිඳුරෝ යි.

## 4. 4. 8

## තතිය විභඞ්ග සූත්‍රය

1722. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: සුඛින්ද්‍රිය ... උපෙක්ඛින්ද්‍රිය යි. මහණෙනි, සුඛින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, කායප්‍රසාදවාස්තුක සුව වූ කායප්‍රසාදවාස්තුක මිහිරි වූ කාපහසින් හටගත් සුව වූ මිහිරි වූ යම් වේදනාවක් වේ නම මහණෙනි, මේ සුඛින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, දුක්ඛින්ද්‍රිය කවරේ ද යත්: මහණෙනි, කායප්‍රසාදවාස්තුක දුක් වූ කායප්‍රසාද-වාස්තුක අමිහිරි වූ කාපහසින් හටගත් දුක් වූ අමිහිරි වූ යම් වෙදනාවක් වේ නම් මහණෙනි, මේ දුක්ඛින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, සොමනස්සින්ද්‍රියය කවරේ ද යත්: මහණෙනි, සිත පිළිබඳ සුව වූ සිත පිළිබඳ මිහිරි වූ මනපහසින් හටගත් සුව වූ මිහිරි වූ යම් වෙදනාවක් වේ නම් මහණෙනි, මේ සොමනස්සින්ද්‍රිය යි කියනු ලැබේ. මහණෙනි, දෙමනස්සින්ද්‍රියය කවරේ ද යත්: මහණෙනි, සිත පිළිබඳ දුක් වූ සිත පිළිබඳ අමිහිරි වූ මනපහසින් හටගත් දුක් වූ අමිහිරි වූ යම් වෙදනාවක් වේ නම් මහණෙනි, මේ දෙමනස්සින්ද්‍රියයි කියනු ලැබේ. මහණෙනි, උපෙක්ඛින්ද්‍රියය කවරේ ද යත්: මහණෙනි, චක්ඛුරාදිචතුඃප්‍රසාදවාස්තුක වූ හෝ චෛතසික වූ හෝ නො ම මිහිරි වූ ත් නො ම අමිහිරි වූත් යම් වෙදනාවක් වේ නම් මහණෙනි, මේ උපෙක්ඛින්ද්‍රිය යි කියනු ලැබේ.

තත්‍ර භික්ඛවෙ, යඤ්ච සුඛින්ද්‍රියං යඤ්ච සොමනස්සින්ද්‍රියං සුඛා සා වෙදනා දට්ඨබ්බා. තත්‍ර භික්ඛවෙ, යඤ්ච දුක්ඛින්ද්‍රියං යඤ්ච දෙමනස්සින්ද්‍රියං දුක්ඛා සා වෙදනා දට්ඨබ්බා. තත්‍ර භික්ඛවෙ, යමිදං උපෙක්ඛින්ද්‍රියං අදුක්ඛමසුඛා සා වෙදනා දට්ඨබ්බා. ඉති ඛො භික්ඛවෙ, ඉමානි පඤ්චින්ද්‍රියානි පඤ්ච හුත්වා තීණි හොන්ති. තීණි හුත්වා පඤ්ච හොන්ති පරියායෙනාති.

## 4. 4. 9

### කට්ඨොපමසුත්තං

1723. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සුඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං දුක්ඛින්ද්‍රියං දෙමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං. සුඛවෙදනීයං භික්ඛවෙ, ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛින්ද්‍රියං. සො සුඛිතො ව සමානො සුඛිතොස්මීති පජානාති. තස්සෙව සුඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං, සුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නං සුඛින්ද්‍රියං තං නිරුජ්ඣති. තං වූපසම්මතීති[1] පජානාති. දුක්ඛවෙදනීයං භික්ඛවෙ, ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛින්ද්‍රියං. සො දුක්ඛිතොව සමානො දුක්ඛිතොස්මීති පජානාති. තස්සෙව දුක්ඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නං දුක්ඛින්ද්‍රියං තං නිරුජ්ඣති. තං වූපසම්මතීති පජානාති.

සොමනස්සවෙදනීයං භික්ඛවෙ, ඵස්සං පටිච්ච උප්පජ්ජති සොමනස්සින්ද්‍රියං. සො සුමනො ව සමානො සුමනොස්මීති පජානාති. තස්සෙව සොමනස්සවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං සොමනස්සවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නං සොමනස්සින්ද්‍රියං, තං නිරුජ්ඣති. තං වූපසම්මතීති පජානාති. දෙමනස්සවෙදනීයං භික්ඛවෙ, ඵස්සං පටිච්ච උප්පජ්ජති දෙමනස්සින්ද්‍රියං. සො දුම්මනොව සමානො දුම්මනොස්මීති පජානාති. තස්සෙව දෙමනස්සවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං දෙමනස්සවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නං දෙමනස්සින්ද්‍රියං තං නිරුජ්ඣති. තං වූපසම්මතීති පජානාති. උපෙක්ඛාවෙදනීයං භික්ඛවෙ, ඵස්සං පටිච්ච උප්පජ්ජති උපෙක්ඛින්ද්‍රියං. සො උපෙක්ඛකොව සමානො උපෙක්ඛකොස්මීති පජානාති. තස්සෙව උපෙක්ඛාවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං උපෙක්ඛාවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නං උපෙක්ඛින්ද්‍රියං තං නිරුජ්ඣති. තං වූපසම්මතීති පජානාති.

1. වූපසමති - සයා.

මහණෙනි, එහි යම් සුඛින්ද්‍රියයෙකුත් යම් සොමනස්සින්ද්‍රියයෙකුත් වේ නම් එය සුවවෙදනා යි දක්කයුතු. මහණෙනි, එහි යම් දුක්ඛින්ද්‍රියයෙකුත් යම් දෙමනස්සින්ද්‍රියයෙකුත් වේ නම් එය දුක්වෙදනා යි දක්කයුතු. මහණෙනි, එහි යම් මේ උපෙක්ඛින්ද්‍රියයෙක් වේ නම් එය නොදුක් නොසුව වෙදනා යි දක්කයුතු. මහණෙනි, මෙසේ මේ පසිඳුරෝ පස් අයුරු ව ත්‍රිවිධ වෙති, තුන් අයුරු ව පඤ්චවිධ වෙති යි.

## 4. 4. 9

## කට්ඨොපම සූත්‍රය

1723. මහණෙනි, මේ ඉඳුරෝ පසෙකි. කවර පසෙක් ද යත්: සුඛින්ද්‍රිය දුක්ඛින්ද්‍රිය සොමනස්සින්ද්‍රිය දෙමනස්සින්ද්‍රිය උපෙක්ඛින්ද්‍රිය යි. මහණෙනි, සුව වෙදනාවට හිත වූ පහස නිසා සුඛින්ද්‍රිය උපදී. හෙතෙමේ හටගත් සුව ඇත්තේ ම සුඛිතයෙමි යි දනගනී. සුවවෙදනාව ට හිත වූ ඒ පහසෙහි ම නිරොධයෙන් එයින් හටගත් යම් වෙදනාවක්, සුවවෙදනාවට හිත වූ පහස නිසා උපන් යම් සුඛින්ද්‍රියයෙක් වේ නම් එය නිරුද්ධ වේ. එය සන්හිඳේ යි දනගනී. මහණෙනි, දුක්වෙදනාවට හිත වූ පහස නිසා දුක්ඛින්ද්‍රිය උපදී. හෙතෙමේ හටගත් දුක් ඇත්තේ ම දුක්ඛිතයෙමි යි දනගනී. දුක්වෙදනාවට හිත වූ ඒ පහසෙහි ම නිරොධයෙන් එයින් හටගත් යම් වෙදනාවක්, දුක්වෙදනාවට හිත වූ පහස නිසා උපන් යම් දුක්ඛින්ද්‍රියයෙක් වේ නම් එය නිරුද්ධ වේ, එය සන්හිඳේ යි දනගනී.

මහණෙනි, සොමනස්සවෙදනාවට හිත වූ පහස නිසා සොමනස්සින්ද්‍රිය උපදී. හෙතෙමේ සුඛිත සිත් ඇත්තේ ම සුමනස්මි යි දනගනී. සොමනස්වෙදනාවට හිත වූ ඒ පහසෙහි ම නිරොධයෙන් එයින් හටගත් යම් වෙදනාවක්, සොමනස් වෙදනාවට හිත වූ පහස නිසා උපන් යම් සොමනස්සින්ද්‍රියයෙක් වේ නම් එය නිරුද්ධ වේ, එය සන්හිඳේ යි දනගනී. මහණෙනි, දෙමනස්වෙදනාවට හිත වූ පහස නිසා දෙමනස්සින්ද්‍රියය උපදී. හෙතෙමේ දුක්ඛිත සිත් ඇත්තේ ම දුර්මනස්මි යි දනගනී. දෙමනස් වෙදනාවට හිත වූ ඒ පහසෙහි ම නිරොධයෙන් එයින් හටගත් යම් වෙදනාවක්, දෙමනස් වෙදනාවට හිත වූ පහස නිසා උපන් යම් දෙමනස්සින්ද්‍රියයෙක් වේ නම් එය නිරුද්ධ වේ, එය සන්හිඳේ යි දනගනී. මහණෙනි, මැදහත්වෙදනාවට හිත වූ පහස නිසා උපෙක්ඛින්ද්‍රිය උපදී. හෙතෙමේ මැදහත් බැව් ඇත්තේ ම උපෙක්ෂකයෙමි යි දනගනී. උපෙක්ෂා වෙදනාවට හිත වූ ඒ පහසෙහි ම නිරොධයෙන් එයින් හටගත් යම් වෙදනාවක්, උපෙක්ෂාවෙදනාවට හිත වූ පහස නිසා උපන් යම් උපෙක්ඛින්ද්‍රියයෙක් වේ නම් එය නිරුද්ධ වේ. එය සන්හිඳේ යි දනගනී.

සෙය්‍යථාපි භික්ඛවෙ, ද්වින්නං කට්ඨානං සඞ්ඝට්ටනසමොධානා උස්මා ජායති. තෙජො අභිනිබ්බත්තති. තෙසං යෙව කට්ඨානං නානාභාවා විනික්ඛෙපා[1] යා තජ්ජා උස්මා සා නිරුජ්ඣති. සා වූපසම්මති, එවමෙව ඛො භික්ඛවෙ, සුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛින්ද්‍රියං. සො සුඛිතොව සමානො සුඛිතොස්මීති පජානාති. තස්සෙව සුඛවෙදනියස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං, සුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නං සුඛින්ද්‍රියං තං නිරුජ්ඣති, තං වූපසම්මතීති පජානාති. දුක්ඛවෙදනියං -පෙ- සොමනස්සවෙදනියං -පෙ- දොමනස්සවෙදනියං -පෙ- උපෙක්ඛාවෙදනියං භික්ඛවෙ, ඵස්සං පටිච්ච උප්පජ්ජති උපෙක්ඛින්ද්‍රියං, සො උපෙක්ඛකොව සමානො උපෙක්ඛකොස්මීති පජානාති. තස්සෙව උපෙක්ඛාවෙදනියස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං, උපෙක්ඛාවෙදනියං ඵස්සං පටිච්ච උප්පන්නං උපෙක්ඛින්ද්‍රියං. තං නිරුජ්ඣති, තං වූපසම්මතීති පජානාතීති.

## 4. 4. 10

## උප්පටිපාටිකසුත්තං

1724. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: දුක්ඛින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං සුඛින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං. ඉධ භික්ඛවෙ, භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති දුක්ඛින්ද්‍රියං. සො එවං පජානාති: "උප්පන්නං ඛො මෙ ඉදං දුක්ඛින්ද්‍රියං, තඤ්ච ඛො සනිමිත්තං සනිදානං සසඞ්ඛාරං සප්පච්චයං. තං වත[2] අනිමිත්තං අනිදානං අසඞ්ඛාරං අප්පච්චයං දුක්ඛින්ද්‍රියං උප්පජ්ජිස්සතී"ති නෙතං ඨානං විජ්ජති. සො දුක්ඛින්ද්‍රියඤ්ච පජානාති. දුක්ඛින්ද්‍රියනිරොධඤ්ච පජානාති. යත්ථ චුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති. තඤ්ච පජානාති. කත්ථ චුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති: ඉධ භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. එත්ථ චුප්පන්නං දුක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අඤ්ඤාසි දුක්ඛින්ද්‍රියස්ස නිරොධං තථත්තාය[3] චිත්තං උපසංහරති.[4]

1. නානාභාවනික්ඛෙපා - ස්‍යා.
2. තඤ්ච - මජසං, ස්‍යා.
3. තදත්ථාය - මජසං, ස්‍යා
4. උපසංහාසි සී 1, 2.

මහණෙනි, යම්සේ ගිනිගානා දඬු දෙකෙක ගැටීමෙන් හා එක්වීමෙන් උණුසුම උපදී ද, ගින්න හටගනී ද, ඒ දඬු දෙකේ ම වෙන් වීමෙන් වෙන් කොට තැබීමෙන් එයින් හටගත් යම් උණුසුමෙක් වේ නම් එය නිරුද්ධ වේ ද, එය සන්හිඳේ ද, මහණෙනි, එසෙයින් ම සුවවේදනාවට හිත වූ පහස නිසා සුඛින්ද්‍රිය උපදී. හෙතෙමේ හටගත් සුව ඇත්තේ ම සුඛිතයෙමි යි දනගනී. සුවවේදනාවට හිත වූ ඒ පහසෙහි ම නිරෝධයෙන් එයින් හටගත් යම් වේදනාවක්, සුවවේදනාවට හිත වූ පහස නිසා උපන් යම් සුඛින්ද්‍රියයෙක් වේ නම් එය නිරුද්ධ වේ, එය සන්හිඳේ යි දනගනී. දුක්වේදනාවට හිත වූ ... සොම්නස්වේදනාවට හිත වූ ... දොම්නස්වේදනාවට හිත වූ ... මැදහත්වේදනාවට හිත වූ පහස නිසා උපෙක්ඛින්ද්‍රිය උපදී. හෙතෙමේ උපෙක්‍ෂා ඇත්තේ ම උපේක්‍ෂකයෙමි යි දනගනී. උපේක්‍ෂාවේදනාවට හිත වූ ඒ පහසෙහි ම නිරෝධයෙන් එයින් හටගත් යම් වේදනාවක්, උපේක්‍ෂාවෙදනාවට හිත වූ පහස නිසා උපන් යම් උපෙක්ඛින්ද්‍රියයෙක් වේ නම් එය නිරුද්ධ වේ. එය සන්හිඳේ යි දනගනි යි.

## 4. 4. 10

## උප්පටිපාටික සූත්‍රය

1724. මහණෙනි, මේ ඉන්ද්‍රිය පසෙකි. කවර පසෙක් ද යත්: දුක්ඛින්ද්‍රිය, දොමනස්සින්ද්‍රිය, සුඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය යි. මහණෙනි, මෙහි, නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන මහණහට දුක්ඛින්ද්‍රිය උපදී. හේ මෙසේ දනගනී. මට මේ දුක්ඛින්ද්‍රිය උපන, එහෙ ද නිමිති සහිත ය, නිදන සහිත ය, සංස්කාර සහිත ය, ප්‍රත්‍යය සහිත ය, ඒ දුක්ඛින්ද්‍රිය නිමිති රහිත ව නිදන රහිත ව සංස්කාර රහිත ව ප්‍රත්‍යය රහිත ව උපදනේය යන මෙකරුණ එකාන්තයෙන් නැත. හේ දුක්ඛින්ද්‍රියයත් දනගනී. දුක්ඛින්ද්‍රිය සමුදයයත් දනගනී. දුක්ඛින්ද්‍රියනිරෝධයත් දනගනී. යම් තැනක උපන් දුක්ඛින්ද්‍රිය නිරවශෙෂයෙන් නිරුද්ධ වේ නම් එ ද දනගනී. කොහි උපන් දුක්ඛින්ද්‍රිය නිරවශේෂයෙන් නිරුද්ධ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව ම අකුසල් දහමුන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත විචාර සහිත විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමුවන දහනට පැමිණ වෙසේ. මෙහි උපන් දුක්ඛින්ද්‍රිය නිරවශේෂයෙන් නිරුද්ධ වෙයි. මහණෙනි, මේ මහණ දුක්ඛින්ද්‍රියයේ නිරෝධය දත්තේ ය, ඒ බැව් පිණිස සිත එළවා යි කියනු ලැබේ.

ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති දෙමනස්සින්ද්‍රියං. සො එවං පජානාති: "උප්පන්නං ඛො මෙ ඉදං දෙමනස්සින්ද්‍රියං. තඤ්ච ඛො සනිමිත්තං, සනිදානං සසඞ්ඛාරං සප්පච්චයං. තං වත අනිමිත්තං අනිදානං අසඞ්ඛාරං අප්පච්චයං දෙමනස්සින්ද්‍රියං උප්පජ්ජිස්සතී"ති නෙතං ඨානං විජ්ජති. සො දෙමනස්සින්ද්‍රියඤ්ච පජානාති. දෙමනස්සින්ද්‍රියසමුදයඤ්ච පජානාති. දෙමනස්සින්ද්‍රියනිරොධඤ්ච පජානාති. යත්ථ චුප්පන්නං දෙමනස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති තඤ්ච පජානාති. කත්ථ චුප්පන්නං දෙමනස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති: ඉධ භික්ඛවෙ, භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. එත්ථ චුප්පන්නං දෙමනස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අඤ්ඤාසි දෙමනස්සින්ද්‍රියස්ස නිරොධං තථත්තාය චිත්තං උපසංහරති.

ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති සුඛින්ද්‍රියං. සො එවං පජානාති: "උප්පන්නං ඛො මෙ ඉදං සුඛින්ද්‍රියං තඤ්ච ඛො සනිමිත්තං සනිදානං සසඞ්ඛාරං සප්පච්චයං, තං වත අනිමිත්තං අනිදානං අසඞ්ඛාරං අප්පච්චයං සුඛින්ද්‍රියං උප්පජ්ජිස්සතී"ති නෙතං ඨානං විජ්ජති. සො සුඛින්ද්‍රියඤ්ච පජානාති, සුඛින්ද්‍රියසමුදයඤ්ච පජානාති, සුඛින්ද්‍රියනිරොධඤ්ච පජානාති, යත්ථ චුප්පන්නං සුඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති තඤ්ච පජානාති. කත්ථ චුප්පන්නං සුඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති: ඉධ භික්ඛවෙ, භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති. සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. එත්ථ චුප්පන්නං සුඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අඤ්ඤාසි සුඛින්ද්‍රියස්ස නිරොධං තථත්තාය චිත්තං උපසංහරති.

මහණෙනි, මෙහි නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන මහණහට දොමනස්සින්ද්‍රිය උපදී. හෙතෙමේ මෙසේ දැනගනී. මට මේ දොමනස්සින්ද්‍රිය උපන. එ ද නිමිති සහිත ය. නිදන සහිත ය. සංස්කාර සහිත ය. ප්‍රත්‍යය සහිත ය. ඒ දොමනස්සින්ද්‍රිය නිමිති රහිත ව නිදන රහිත ව සංස්කාර රහිත ව ප්‍රත්‍යය රහිත ව උපදනේ ය යන මේ කරුණ ඒකාන්තයෙන් නැත. හෙතෙම දොමනස්සින්ද්‍රියත් දැනගනී. දොමනස්සින්ද්‍රියසමුදයයත් දැනගනී. දොමනස්සින්ද්‍රියනිරොධයත් දැනගනී. යම් තැනෙක උපන් දොමනස්සින්ද්‍රිය නිරවශෙෂ ව නිරුද්ධ වේ නම් එ ද දැනගනී කොහි උපන් දොමනස්සින්ද්‍රියය නිරවශේෂ ව නිරුද්ධ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ විතර්ක විචාරයන් සන්හිඳීමෙන් තම සිත්හි පැහැදීම ඇති සිතේ එකඟ බැව් ඇති විතර්ක-රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති දෙවන දහැනට පැමිණ වෙසෙයි. මෙහි උපන් දොමනස්සින්ද්‍රිය නිරවශේෂයෙන් නිරුද්ධ වෙයි. මහණෙනි, මේ මහණ දොමනස්සින්ද්‍රියයේ නිරොධය දත්තේ ය. ඒ බැව් පිණිස සිත එළවා යි කියනු ලැබේ.

මහණෙනි, මෙහි නොපමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන මහණහට සුඛින්ද්‍රිය උපදී. හේ මෙසේ දැනගනී. මට මේ සුඛින්ද්‍රිය උපන. එ ද නිමිති සහිත ය. නිදන සහිත ය. සංස්කාර සහිත ය. ප්‍රත්‍යය සහිත ය. ඒ සුඛින්ද්‍රියය නිමිති රහිත ව නිදන රහිත ව සංස්කාර රහිත ව ප්‍රත්‍යය රහිත ව උපදනේ ය යන මේ කරුණ ඒකාන්ත-යෙන් නැත. හෙතෙම සුඛින්ද්‍රියයත් දැනගනී. සුඛින්ද්‍රියසමුදයත් දැනගනී. සුඛින්ද්‍රියනිරොධයත් දැනගනී. යම් තැනෙක උපන් සුඛින්ද්‍රිය නිරවශෙෂ ව නිරුද්ධ වේ නම් එ ද දැනගනී. කොහි උපන් සුඛින්ද්‍රිය නිරවශේෂ ව නිරුද්ධ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ ප්‍රීතියෙහිත් නො ඇල්මෙන් උපෙක්ෂක ව වෙසෙයි. සිහි ඇත්තේත් මනා දැනුම් ඇත්තේත් කයින් සුවත් විඳියි. ආර්‍ය්‍යයෝ යම් ඒ දහැනක් උපේක්ෂා ඇත්තේ ය සිහි ඇත්තේ ය සුව විහරණ ඇත්තේ යයි කියත් නම් (ඒ) තෙවන දහැනට පැමිණ වෙසෙ යි. මෙහි උපන් සුඛින්ද්‍රිය නිරවශේෂ ව නිරුද්ධ වෙයි. මහණෙනි, මේ මහණ සුඛින්ද්‍රියයේ නිරොධය දත්තේ ය. ඒ බැව් පිණිස සිත එළවා යි කියනු ලැබේ.

ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති සොමනස්සින්ද්‍රියං. සො එවං පජානාති ''උප්පන්නං ඛො මෙ ඉදං සොමනස්සින්ද්‍රියං. තඤ්ච සනිමිත්තං සනිදානං සසඞ්ඛාරං සප්පච්චයං. තං වත අනිමිත්තං අනිදානං අසඞ්ඛාරං අප්පච්චයං සොමනස්සින්ද්‍රියං උප්පජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති. ''සො සොමනස්සින්ද්‍රියඤ්ච පජානාති. සොමනස්සින්ද්‍රියසමුදයඤ්ච පජානාති. සොමනස්සින්ද්‍රියනිරොධඤ්ච පජානාති. යත්ථ චුප්පන්නං සොමනස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති, තඤ්ච පජානාති. කත්ථ චුප්පන්නං සොම-නස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති: ඉධ භික්ඛවෙ, භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. එත්ථ චුප්පන්නං සොමනස්සින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අඤ්ඤාසි සොමනස්සින්ද්‍රියස්ස නිරොධං, තදත්ථාය චිත්තං උපසංහරති.

ඉධ පන භික්ඛවෙ, භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො උප්පජ්ජති උපෙක්ඛින්ද්‍රියං. සො එවං පජානාති. 'උප්පන්නං ඛො මෙ ඉදං උපෙක්ඛින්ද්‍රියං. තඤ්ච ඛො සනිමිත්තං සනිදානං සසඞ්ඛාරං සප්පච්චයං' තං වත අනිමිත්තං අනිදානං අසඞ්ඛාරං අප්පච්චයං උපෙක්ඛින්ද්‍රියං උප්පජ්ජිස්සතීති නෙතං ඨානං විජ්ජති, සො උපෙක්ඛින්ද්‍රියඤ්ච පජානාති, උපෙක්ඛින්ද්‍රියසමුදයඤ්ච පජානාති, උපෙක්ඛින්ද්‍රිය-නිරොධඤ්ච පජානාති. යත්ථ චුප්පන්නං උපෙක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති තඤ්ච පජානාති. කත්ථ චුප්පන්නං උපෙක්ඛින්ද්‍රියං අපරිසෙසං නිරුජ්ඣති: ඉධ භික්ඛවෙ, භික්ඛු සබ්බසො නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමතික්කම්ම සඤ්ඤාවෙදයිතනිරොධං උපසම්පජ්ජ විහරති. එත්ථ චුප්පන්නං උපෙක්ඛින්ද්‍රියං අපරිසෙයං නිරුජ්ඣති. අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු අඤ්ඤාසි උපෙක්ඛින්ද්‍රියස්ස නිරොධං, තදත්ථාය 'චිත්තං උපසංහරතීති.

**සුඛින්ද්‍රියවග්ගො චතුත්ථො.**

**තත්‍රුද්දානං:**

සුද්ධකං සොතො අරහං ද්වෙ සමණබ්‍රාහ්මණා,
විභඞ්ගෙන තයො වුත්තා කට්ඨො උප්පටිපාටිකෙන.

මහණෙනි, මෙහි නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන මහණහට සොමනස්සින්ද්‍රිය උපදී. හෙතෙමේ මෙසේ දනගනී: මට මේ සොමනස්සින්ද්‍රිය උපන. එ ද නිමිති සහිත ය, නිදන සහිත ය, සංස්කාර සහිත ය, ප්‍රත්‍යය සහිත ය. ඒ සොමනස්සින්ද්‍රිය නිමිති රහිත ව නිදන රහිත ව සංස්කාර රහිත ව ප්‍රත්‍යය රහිත ව උපදනේ ය යන මෙකරුණ ඒකාන්තයෙන් නැත්තේ ය. හෙතෙමේ සොමනස්සින්ද්‍රියයත් දන ගනී. සොමනස්සින්ද්‍රියසමුදයයත් දන ගනී. සොමනස්සින්ද්‍රියනිරොධයත් දනගනී. යම් තැනෙක උපන් සොමනස්සින්ද්‍රිය නිරවශෙෂයෙන් නිරුද්ධ වේ නම් එයත් දනගනී. කොහි උපන් සොමනස්සින්ද්‍රියය නිරවශෙෂයෙන් නිරුද්ධ වේ ද යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ සුවත් පැහීමෙන් දුකත් පැහීමෙන් පළමු ම සොම්නස්දොම්නසුන්ගේ අස්තගමයෙන් නොදුක් වූ නොසුව වූ මැදහත් බැවින් හා සිහියෙන් හටගත් පිරිසුදු බැව් ඇති සිවුවන දහැනට පැමිණ වෙසෙයි. මෙහි උපන් සොමනස්සින්ද්‍රිය නිරවශෙෂයෙන් නිරුද්ධ වේ. මහණෙනි, මේ මහණ සොමනස්සින්ද්‍රියයේ නිරොධය දත්තේ ය. ඒ බැව් පිණිස සිත එලවා යී කියනු ලැබේ.

මහණෙනි, මෙහි නො පමා ව කෙලෙස් තවන වැර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන මහණහට උපෙක්ඛින්ද්‍රිය උපදී. හෙතෙමේ මෙසේ දනගනී. මට මේ උපෙක්ඛින්ද්‍රිය උපන. එ ද නිමිති සහිත ය, නිදන සහිත ය, සංස්කාර සහිත ය, ප්‍රත්‍යය සහිත ය. ඒ උපෙක්ඛින්ද්‍රිය නිමිති රහිත ව නිදන රහිත ව සංස්කාර රහිත ව ප්‍රත්‍යය රහිත ව උපදනේ ය යන මෙකරුණ එකාන්තයෙන් නැත. හෙතෙමේ උපෙක්ඛින්ද්‍රියයත් දනගනී, උපෙක්ඛින්ද්‍රියසමුදයයත් දනගනී, උපෙක්ඛින්ද්‍රියනිරොධයත් දනගනී, යම් තැනෙක උපන් උපෙක්ඛින්ද්‍රිය නිරවශේෂ ව නිරුද්ධ වේ නම් එ ද දනගනී. කොහි උපන් උපෙක්ඛින්ද්‍රිය නිරවශේෂ ව නිරුද්ධ වේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිතනිරොධයට පැමිණ වෙසේ. මෙහි උපන් උපෙක්ඛින්ද්‍රිය නිරවශේෂ ව නිරුද්ධ වේ. මහණෙනි, මේ මහණ උපෙක්ඛින්ද්‍රියයේ නිරොධය දත්තේ ය. ඒ බැව් පිණිස සිත එලවා යී කියනු ලැබේ යී.

## සිවුවැනි සුඛින්ද්‍රිය වර්ග යි.

**එහි සූත්‍ර නාමාවලිය:-**

සුද්ධක, සොතාපන්න, අරහන්ත යී සූත්‍ර තුනෙකි. සමණබ්‍රාහ්මණ සූත්‍ර දෙකෙකි. විභඞ්ග නමින් තුනෙක් කියන ලදී. කට්ඨොපම, උප්පටිපාටික යී සූත්‍ර දෙකකි යි මුළුල්ල දශයෙකි.

# 5. ජරාවග්ගො

## 4. 5. 1

## ජරාසුත්තං

1725. එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ. තෙන ඛො පන සමයෙන භගවා සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො පච්ඡාතපෙ[1] නිසින්නො හොති පිට්ඨිං ඔතාපයමානො. අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා භගවතො ගත්තානි පාණිනා අනොමජ්ජන්තො භගවන්තං එතදවොච: "අච්ඡරියං භන්තෙ, අබ්භුතං භන්තෙ, න චෙවදානි[2] භන්තෙ, භගවතො තාව පරිසුද්ධො හොති ඡවිවණ්ණො පරියොදාතො. සිථිලානි ච ගත්තානි සබ්බානි[3] වලිජාතානි.[4] පුරතො පබ්භාරො ච කායො. දිස්සති ච ඉන්ද්‍රියානං අඤ්ඤථත්තං: චක්ඛුන්ද්‍රියස්ස සොතින්ද්‍රියස්ස ඝානින්ද්‍රියස්ස ජිව්හින්ද්‍රියස්ස කායින්ද්‍රියස්සාති.

එවං හෙතං ආනන්ද, හොති ජරාධම්මො යොබ්බඤ්ඤෙ. බ්‍යාධිධම්මො ආරොග්‍යෙ. මරණධම්මො ජීවිතෙ. න චෙව තාව පරිසුද්ධො හොති ඡවිවණ්ණො පරියොදාතො. සිථිලානි ච හොන්ති ගත්තානි සබ්බානි වලිජාතානි. පුරතො පබ්භාරො ච කායො. දිස්සති ච ඉන්ද්‍රියානං අඤ්ඤථත්තං: චක්ඛුන්ද්‍රියස්ස සොතින්ද්‍රියස්ස ඝානින්ද්‍රියස්ස ජිව්හින්ද්‍රියස්ස කායින්ද්‍රියස්සාති. ඉදමවොච භගවා. ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

ධීතං[5] ජම්මි ජරෙ අත්ථු දුබ්බණ්ණකරණී ජරෙ,
තාව මනොරමං බිම්බං ජරාය අභිමද්දිතං.

යො[6] ච වස්සසතං ජීවෙ සොපි මච්චුපරායණො[7]
න කිඤ්චි පරිවජ්ජෙති සබ්බමෙවාභිමද්දතීති.

## 4. 5. 2

## උණ්ණාභබ්‍රාහ්මණසුත්තං

1726. අථ ඛො උණ්ණාභො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො උණ්ණාභො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: "පඤ්චිමානි භො ගොතම, ඉන්ද්‍රියානි නානාවිසයානි නානාගොචරානි න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්ති. කතමානි පඤ්ච: චක්ඛුන්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං. ඉමෙසං නු ඛො භො ගොතම, පඤ්චන්නං ඉන්ද්‍රියානං නානාවිසයානං නානාගොචරානං න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්තානං කිං පටිසරණං කො ච නෙසං ගොචරවිසයං පච්චනුභොතීති.

1. පච්ඡාතපකෙ - ස්‍යා.
2. චෙවංදනී - මජසං.
3. සත්තානි - ස්‍යා 1 සී 1, 2.
4. වලියජාතානි - මජසං.
5. ධීතං - සීමු, ධිතං - ස්‍යා.
6. යොපි - ස්‍යා.
7. සබ්බෙ මච්චුපරායණා - ස්‍යා.

# 5. ජරාවර්ගය

## 4. 5. 1

## ජරා සූත්‍රය

1725. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවත සමීපයෙහි **මිගාරමාතුපාසාද** නම් **පූර්වාරාමයෙහි** වැඩවසන සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ සවස්කල පලසමවතින් නැගී සිටි සේක් වෙහෙර පසුපස සෙවනෙහි පිට තවමින් වැඩහුන් සේක් වෙති. එකල්හි ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ භාග්‍යවතුන් වහන්සේගේ අවයව අතින් පිරිමදිමින් භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, ඇසිරියෙකි, වහන්ස, පුදුමයෙකි, වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ සිවිපැහැය පෙරමෙන් දැන් නො ද පිරිසිදු වේ. නො ද හාත්පසින් බබළන්නේ වේ. සියලු අවයවයෝ ලිහිල්හ. හටගත් රැලි ඇතියහ. කය ද ඉදිරියට නැඹුරු වූයේ ය. ඉඳුරන්ගේත් එනම්; චක්ඛුන්ද්‍රියයේත් සොතින්ද්‍රියයේත් ඝානින්ද්‍රියයේත් ජිව්හින්ද්‍රියයේත් කායින්ද්‍රියයේත් වෙනස් බවෙක් පෙනේ.

ආනන්ද, ඒ එසේ ම ය. යොවුන් බැව්හි දිරන ස්වභාව ඇත්තේ නිරෝගී බැව්හි රෝගී ස්වභාව ඇත්තේ දිවියෙහි මැරෙන ස්වභාව ඇත්තේ වෙයි. සිවිපැහැය ඒතාක් නො ද පිරිසිදු වේ. නො ද හාත්පසින් බබළන්නේ වේ. සියලු අවයවයෝ ලිහිල් වූවාහු හටගත් රැලි ඇත්තාහු ද වෙති. කය ද ඉදිරියට නැඹුරු වූයේ වේ. ඉඳුරන්ගේ ද එනම් චක්ඛුන්ද්‍රියයේත් සොතින්ද්‍රියයේත් ඝානින්ද්‍රියයේත් ජිව්හින්ද්‍රියයේත් කායින්ද්‍රියයේත් වෙනස්බවෙක් පෙනේ යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා යලි මතු ද මෙය වදාළ සේක:

එම්බල ලාමක ජරාව, දුර්වර්ණතා කරනසුලු ජරාව, තට නින්ද වේවා. එතාක් මනරම් සිරුර ජරාවෙන් මඩනා ලද්දේ ය.

යමෙක් සියවසක් ජීවත්වතු දු හෙතෙමේත් මරු වසඟ වන්නේ ය. කිසිවක් අත් නො හරී. සියල්ල ම මැඩලා යි.

## 4. 5. 2

## උණ්ණාභබ්‍රාහ්මණ සූත්‍රය

1726. එකල්හි උණ්ණාභ බමුණු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්නේ ය. එකත්පසෙක හුන් උණ්ණාභ බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය කීය: "භවත් ගෞතමයෙනි, මේ පසිඳුරෝ වෙන් වෙන් විෂය ඇත්තාහු වෙන් වෙන් අරමුණු ඇත්තාහු ඔවුනොවුන්ගේ අරමුණු විෂය නො විඳිත්. කවර පසෙක් ද යත්: චක්ඛුන්ද්‍රියය ... කායින්ද්‍රිය යි. භවත් ගෞතමයෙනි, වෙන් වෙන් විෂය ඇති වෙන් වෙන් අරමුණු ඇති ඔවුනොවුන්ගේ අරමුණු විෂය නො විඳිනා මේ පසිඳුරන්ට කිමෙක් පිළිසරණ ද? කවරෙක් ඔවුන්ගේ අරමුණු විෂය විඳී ද යි.



Free Distribution www.aathaapi.org

පඤ්චිමානි බ්‍රාහ්මණ, ඉන්ද්‍රියානි නානාවිසයානි නානාගොචරානි න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්ති. කතමානි පඤ්ච: චක්ඛුන්ද්‍රියං -පෙ- කායින්ද්‍රියං. ඉමෙසං ඛො බ්‍රාහ්මණ, පඤ්චන්නං ඉන්ද්‍රියානං නානාවිසයානං නානාගොචරානං න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්තානං මනො පටිසරණං. මනොව[1] නෙසං ගොචරවිසයං පච්චනුභොතීති. මනස්ස පන භො ගොතම කිං පටිසරණන්ති? මනස්ස ඛො බ්‍රාහ්මණ, සති පටිසරණන්ති. සතියා පන භො ගොතම, කිං පටිසරණන්ති? සතියා ඛො බ්‍රාහ්මණ; විමුත්ති පටිසරණන්ති. විමුත්තියා පන භො ගොතම කිං පටිසරණන්ති? විමුත්තියා ඛො බ්‍රාහ්මණ, නිබ්බානං පටිසරණන්ති. නිබ්බානස්ස පන භො ගොතම, කිං පටිසරණන්ති? අච්චසරා බ්‍රාහ්මණ, පඤ්හං. නාසක්ඛි පඤ්හස්ස පරියන්තං ගහෙතුං. නිබ්බානොගධං හි බ්‍රාහ්මණ බ්‍රහ්මචරියං වුස්සති නිබ්බානපරායණං නිබ්බානපරියොසානන්ති. අථ ඛො උණ්ණාභො බ්‍රාහ්මණො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

අථ ඛො භගවා අචිරපක්කන්තෙ උණ්ණාභෙ බ්‍රාහ්මණෙ භික්ඛූ ආමන්තෙසි; "සෙය්‍යථාපි භික්ඛවෙ, කූටාගාරෙ වා කූටාගාරසාලායං වා[2] පාචීනවාතපානා සූරියෙ උග්ගච්ඡන්තෙ වාතපානෙන රස්මි පවිසිත්වා ක්වාස්ස පතිට්ඨිතාති. පච්ඡිමාය භණෙ භිත්තියන්ති. එවමෙව ඛො භික්ඛවෙ, උණ්ණාභස්ස බ්‍රාහ්මණස්ස තථාගතෙ සද්ධා නිවිට්ඨා, මූලජාතා පතිට්ඨිතා දළ්හා අසංහාරියා සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං. ඉමම්හි චෙ භික්ඛවෙ, සමයෙ උණ්ණාභො බ්‍රාහ්මණො කාලං කරෙය්‍ය, නත්ථි තං සංයොජනං යෙන සංයොජනෙන සංයුත්තො උණ්ණාභො බ්‍රාහ්මණො පුන ඉමං ලොකං ආගච්ඡෙය්‍යාති.

## 4. 5. 3

### සාකෙතසුත්තං

1727. එකං සමයං භගවා සාකෙතෙ විහරති අඤ්ජනවනෙ මිගදායෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි. අත්ථි නු ඛො භික්ඛවෙ පරියායො යං පරියායං ආගම්ම යානි පඤ්චින්ද්‍රියානි තානි පඤ්ච බලානි හොන්ති, යානි පඤ්ච බලානි තානි පඤ්චින්ද්‍රියානි හොන්තීති? භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ-

1. මනො ච - ස්‍යා, සී 1.
2. කූටාගාරං වා කූටාගාරසාලා වා උත්තරාය - සීමු.

බමුණ, මේ පසිඳුරෝ වෙන් වෙන් විෂය ඇත්තාහු වෙන් වෙන් අරමුණු ඇත්තාහු ඔවුනොවුන්ගේ අරමුණු විෂය නො විඳිත්. කවර පසෙක් ද යත්: **චක්ඛුන්ද්‍රිය** ය ... කායින්ද්‍රිය යි. බමුණ, වෙන් වෙන් විෂය ඇති වෙන් වෙන් අරමුණු ඇති ඔවුනොවුන්ගේ අරමුණු විෂය නො විඳින මේ පසිඳුරන්ට සිත පිළිසරණ යි. සිත ම ඔවුන්ගේ අරමුණු විෂය විඳී යි. භවත් ගෞතමයෙනි, සිතට කිමෙක් පිළිසරණ ද යි? බමුණ, සිතට සිහිය පිළිසරණ යි. භවත් ගෞතමයෙනි, සිහියට කිමෙක් පිළිසරණ ද යි? බමුණ, සිහියට විමුක්තිය පිළිසරණ යි. භවත් ගෞතමයෙනි, විමුක්තියට කිමෙක් පිළිසරණ ද යි? බමුණ, විමුක්තියට නිවන පිළිසරණ යි. භවත් ගෞතමයෙනි, නිවනට කිමෙක් පිළිසරණ ද යි? බමුණ ප්‍රශ්නය ඉක්මවා ගියෙහි ය. ප්‍රශ්නයෙහි කෙළවර ගැනීමට නො හැකි විය. බමුණ නිවනට ඇතුළත් වූවක් නිවන පිහිට කොට ඇත්තක් නිවන කෙළවර කොට ඇත්තක් කොට බඹසර වෙයෙන්නේ යි. එකල්හි උණ්ණාභ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව පිළිගෙන අනුමෝදන් ව හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේ ය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ උණ්ණාභ බමුණා නික්ම ගිය නොබෝ කලකින් **භික්ෂූන්** ඇමතූසේක. මහණෙනි, කුළුගෙයක හෝ කුළුගේහලක හෝ පෙරදිග වාකවුළු යම් සේ ද හිරු උදවන කල්හි වාකවුළුවෙන් හිරුරැස් පිවිස කොහි පිහිටියා වන්නේ ද යි? වහන්ස, පැසුළු බිතෙහි ය, මහණෙනි, එසෙයින් ම උණ්ණාභ බමුණාට තථාගතයන් කෙරෙහි ඇතුළට පිවිසි හටගත් මුල් ඇති දැඩි වූ මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොව කිසිවකු විසින් හෝ නො වැනසිය හැකි සැදැහැ පිහිටියා ය. මහණෙනි, ඉදින් උණ්ණාභ බමුණු මෙසමයෙහි කලුරිය කරන්නේ නමුදු යම් සංයොජනයෙකින් යුත් උණ්ණාභ බමුණු නැවත මෙලොවට පැමිණෙන්නේ නම් එබඳු සංයොජනයෙක් නැතැ යි.

## 4. 5. 3

## සාකෙතසූත්‍රය

1727. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සාකේතනුවර** සමීපයෙහි **මිගදය නම් වූ අඤ්ජනවෙනෙහි** වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ **භික්ෂූන්** ඇමතූ සේක: මහණෙනි, යම් නයකට පැමිණ යම් කෙනෙක් පසිඳුරෝ වෙත් නම් ඔහු පස්බලයෝ වෙද්ද? යම් කෙනෙක් පස්බලයෝ වෙත් නම් ඔහු පසිඳුරෝ වෙද්ද? එබඳු නයෙක් ඇද්ද යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ගෙන ඇතියහ ...

අත්ථි භික්ඛවෙ පරියායො යං පරියායං ආගම්ම යානි පඤ්චින්ද්‍රියානි තානි පඤ්ච බලානි හොන්ති, යානි පඤ්ච බලානි තානි පඤ්චින්ද්‍රියානි හොන්ති. කතමො ච භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම යානි පඤ්චින්ද්‍රියානි තානි පඤ්ච බලානි හොන්ති, යානි පඤ්ච බලානි තානි පඤ්චින්ද්‍රියානි හොන්ති: යං භික්ඛවෙ, සද්ධින්ද්‍රියං තං සද්ධාබලං, යං සද්ධාබලං තං සද්ධින්ද්‍රියං. යං විරියින්ද්‍රියං තං විරියබලං, යං විරියබලං තං විරියින්ද්‍රියං, යං සතින්ද්‍රියං තං සතිබලං, යං සතිබලං තං සතින්ද්‍රියං. යං සමාධින්ද්‍රියං තං සමාධිබලං, යං සමාධිබලං තං සමාධින්ද්‍රියං. යං පඤ්ඤින්ද්‍රියං තං පඤ්ඤාබලං, යං පඤ්ඤාබලං තං පඤ්ඤින්ද්‍රියං.

සෙය්‍යථාපි භික්ඛවෙ නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා, තස්සා අස්ස මජ්ඣෙ[1] දීපො, අත්ථි භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම තස්සා නදියා එකො සොතොත්වෙව සඞ්ඛං ගච්ඡති. අත්ථි පන භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම තස්සා නදියා ද්වෙ සොතානිත්වෙව. සඞ්ඛං ගච්ඡන්ති. කතමො ච භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම තස්සා නදියා එකො සොතොත්වෙව සඞ්ඛං ගච්ඡති? යං[2] භික්ඛවෙ, තස්ස දීපස්ස පුරත්ථිමන්තෙ[3] උදකං යඤ්ච පච්ඡිමන්තෙ උදකං, අයං ඛො භික්ඛවෙ පරියායො යං පරියායං ආගම්ම තස්ස නදියා එකො සොතොත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමො ච භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම තස්සා නදියා ද්වෙ සොතානිත්වෙව සඞ්ඛං ගච්ඡන්ති, යං භික්ඛවෙ, තස්ස දීපස්ස උත්තරන්තෙ උදකං යඤ්ච දක්ඛිණන්තෙ උදකං, අයං ඛො භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම තස්සා නදියා ද්වෙ සොතානිත්වෙව සඞ්ඛං ගච්ඡන්ති. එවමෙව ඛො භික්ඛවෙ, යං සද්ධින්ද්‍රියං තං සද්ධාබලං යං සද්ධාබලං තං සද්ධින්ද්‍රියං -පෙ- යං පඤ්ඤින්ද්‍රියං තං පඤ්ඤාබලං, යං පඤ්ඤාබලං තං පඤ්ඤින්ද්‍රියං. පඤ්චන්නං භික්ඛවෙ, ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති.

## 4. 5. 4

## පුබ්බකොට්ඨකසුත්තං

1728. එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බකොට්ඨකෙ. තත්‍ර ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි. සද්දහාසි[4] ත්වං සාරිපුත්ත, සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති, අමතපරායනං අමතපරියොසානං, විරියින්ද්‍රියං -පෙ- සතින්ද්‍රියං -පෙ- සමාධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති?

---

1. තස්සා මජ්ඣෙ - මජසං, සතා.
2. යඤ්ච - මජසං, සතා.
3. පුරිමන්තෙ - මජසං.
4. සද්දහසි - මජසං, සතා.

මහණෙනි යම් නයකට පැමිණ යම් කෙනෙක් පසිඳුරෝ වෙත් නම් ඔහු පස්බලයෝ වෙද්ද, යම් කෙනෙක් පස්බලයෝ වෙත් නම් ඔහු පසිඳුරෝ වෙද්ද, එබඳු නයෙක් ඇත. මහණෙනි, යම් නයකට පැමිණ යම් කෙනෙක් පසිඳුරෝ වෙත් නම් ඔහු පස්බලයෝ වෙද්ද, යම් කෙනෙක් පස්බලයෝ වෙත් නම් ඔහු පසිඳුරෝ වෙද්ද, ඒ නය කවරේ ද, යත්: මහණෙනි, යමෙක් සද්ධින්ද්‍රියය වේ නම් එය සද්ධාබලය වේ. යමෙක් සද්ධාබලය වේ නම් එය සද්ධින්ද්‍රිය වේ. යමෙක් විරියින්ද්‍රිය වේ නම් එය විරියබලය වේ. යමෙක් විරියබලය වේ නම් එය විරියින්ද්‍රිය වේ. යමෙක් සතින්ද්‍රිය වේ නම් එය සතිබලය වේ. යමෙක් සතිබලය වේ නම් එය සතින්ද්‍රිය වේ. යමෙක් සමාධින්ද්‍රිය වේ නම් එය සමාධිබලය වේ. යමෙක් සමාධිබලය වේ නම් එය සමාධින්ද්‍රිය වේ. යමෙක් පඤ්ඤින්ද්‍රිය වේ නම් එය පඤ්ඤාබලය වේ. යමෙක් පඤ්ඤාබලය වේ නම් එය පඤ්ඤින්ද්‍රිය වේ.

මහණෙනි, යම්සේ පෙරදිගට නැමුණු පෙරදිගට නැඹුරු වූ පෙරදිගට බර වූ නදියක් වේද. එහි මැද දිවයිනෙක් වන්නේ ය. මහණෙනි, යම් නයකට පැමිණ ඒ නදියෙහි එක ම සැඩපහරෙකැයි ගිණුමට යේ නම් එබඳු නයෙක් ඇත. මහණෙනි, යම් නයකට පැමිණ ඒ නදියෙහි දෙසැඩපහරෙකැයි ම ගිණුමට යේ නම් එබඳු නයෙක් ඇත. මහණෙනි, යම් නයකට පැමිණ ඒ නදියෙහි එක ම සැඩපහරෙකැ යි ගිණුමට යේ නම් ඒ නය කවරේ ද යත්: මහණෙනි, ඒ දිවයිනෙහි පෙරදිග කෙළවර යම් දියක් වේ ද. පැළදිග කෙළවර යම් දියකුත් වේ ද, මහණෙනි, යම් නයකට පැමිණ ඒ නදියෙහි එක ම දියපහරෙකැ යි ගිණුමට යේ නම් මේ ඒ නය යි. මහණෙනි, යම් නයකට පැමිණ ඒ නදියෙහි දෙදියපහරෙකැ යි ම ගිණුමට යේ නම් ඒ නය කවරේ ද යත්: මහණෙනි, ඒ දිවයිනෙහි උතුරු කෙළවර යම් දියෙක් වේ ද, දකුණු කෙළවර යම් දියකුත් වේ ද මහණෙනි, යම් නයකට පැමිණ ඒ නදියෙහි දෙදියපහරෙකැයි ම ගිණුමට යේ නම් මේ ඒ නයයි. මහණෙනි, එසෙයින් ම යමෙක් සද්ධින්ද්‍රිය වේ නම් එය සද්ධාබලය වේ. යමෙක් සද්ධාබලය වේ නම් එය සද්ධින්ද්‍රියය වේ ... යමෙක් පඤ්ඤින්ද්‍රිය වේ නම් එය පඤ්ඤාබලය වේ. යමෙක් පඤ්ඤාබලය වේ නම් එය පඤ්ඤින්ද්‍රිය වේ. මහණෙනි, මේ පසිඳුරන් වැඩූ බැවින් මහණතෙමේ ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් අනාශ්‍රව වූ ඵලසමාධියත් ඵලප්‍රඥාවත් දිටු දැමියෙහි ම තෙමේ වෙසෙසින් දැන පසක් කොට එයට පැමිණ වෙසේ යි.

## 4. 5. 4

## පුබ්බ කොට්ඨක සූත්‍රය

1728. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි **පුබ්බකොට්ඨකයෙහි** වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් **සැරියුත් තෙරණුවන්** ඇමතූ සේක: සාරිපුත්ත සද්ධින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ. විරියින්ද්‍රිය ... සතින්ද්‍රිය ... සමාධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ යි තෙපි හදහවූ ද යි.

නාහං එත්ථ භන්තෙ, භගවතො සද්ධාය ගච්ඡාමි "සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං. යෙසං හි භන්තෙ, අඤ්ඤාතං අස්ස අදිට්ඨං[1] අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං[2] පඤ්ඤාය, තෙ තත්ථ පරෙසං සද්ධාය ගච්ඡෙය්‍යුං: සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති. යෙසඤ්ච ඛො එතං භන්තෙ, ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, නික්කඞ්ඛා තෙ තත්ථ නිබ්බිචිකිච්ඡා, සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං. මය්හම්පි ඛො එතං භන්තෙ, ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය. නික්කඞ්ඛවාහං තත්ථ නිබ්බිචිකිච්ඡො සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති.

සාධු සාධු සාරිපුත්ත, යෙසං හෙතං[3] සාරිපුත්ත, අඤ්ඤාතං අස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය තෙ තත්ථ පරෙසං සද්ධාය ගච්ඡෙය්‍යුං, සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං. යෙසඤ්ච ඛො එතං සාරිපුත්ත, ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය නික්කඞ්ඛා තෙ තත්ථ නිබ්බිචිකිච්ඡා, සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති.

---

1. අඤ්ඤාතං අදිට්ඨං - සයා.
2. අපස්සිතං - සී 1. සයා.
3. යෙසඤ්හි තං - සයා.

වහන්ස, සද්ධින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වෙයි ... පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වෙයි. මෙහි ලා මම භාග්‍යවතුන් වහන්සේගේ (වදන්) ඇදහීමෙන් (නිමාවට) නො යෙමි. වහන්ස, සද්ධින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ ... පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ යි යම් කෙනකුන් විසින් නො දන්නා ලද්දේ නො දක්නා ලද්දේ අවබෝධ නො කරන ලද්දේ නො පසක් කරන ලද්දේ නුවණින් නො පහස්නා ලද්දේ වන්නේ නම් ඔහු එහි ලා මෙරමා (වදන්) ඇදහීමෙන් (නිමාවට) යන්නාහු ය. වහන්ස, සද්ධින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ ... පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ යි යම් කෙනකුන් විසිනුදු මෙය දන්නා ලද්දේ දක්නා ලද්දේ අවබෝධ කරන ලද්දේ පසක් කරන ලද්දේ නුවණින් පහස්නා ලද්දේ වේ නම් ඔහු එහි ලා නිසැක වූවාහු පහවූ විචිකිච්ඡා ඇත්තාහු වෙත්. වහන්ස, සද්ධින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ ... පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ ම විසිනුදු මෙය දන්නා ලද්දේ ය. දක්නා ලද්දේ ය. අවබෝධ කරන ලද්දේ ය. පසක් කරන ලද්දේ ය. නුවණින් පහස්නා ලද්දේ ය. මම එහි ලා නිසැකයෙමි. පහ වූ විචිකිච්ඡා ඇතියෙමි යි.

සාරිපුත්ත මැනවි, මැනවි, සාරිපුත්ත, සද්ධින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ ... පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ යි යම් කෙනකුන් විසින් මෙය නොදන්නා ලද්දේ නො දක්නා ලද්දේ අවබෝධ නො කරන ලද්දේ නො පසක් කරන ලද්දේ නුවණින් නො පහස්නා ලද්දේ වන්නේ නම් ඔහු එහිලා මෙරමා (වදන්) ඇදහීමෙන් (නිමාවට) යන්නාහු ය. සාරිපුත්ත, සද්ධින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ වේ ... පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ යි යම් කෙනකුන් විසිනුදු මෙය දන්නා ලද්දේ දක්නා ලද්දේ අවබෝධ කරන ලද්දේ පසක් කරන ලද්දේ නුවණින් පහස්නා ලද්දේ වේ නම් ඔහු එහි ලා නිසැකයහ. පහ වූ විචිකිච්ඡා ඇතියහ යි.

## 4. 5. 5

## පුබ්බාරාමසුත්තං

1729. එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි –පෙ– කතින්නං[1] නු ඛො භික්ඛවෙ ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං ව්‍යාකරොති: "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. භගවම්මූලකා නො භන්තෙ, ධම්මා –පෙ– එකස්ස ඛො භික්ඛවෙ, ඉන්ද්‍රියස්ස භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං ව්‍යාකරොති: "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. කතමස්ස එකස්ස? පඤ්ඤින්ද්‍රියස්ස. පඤ්ඤවතො භික්ඛවෙ, අරියසාවකස්ස තදන්වයා සද්ධා සණ්ඨාති. තදන්වයං විරියං සණ්ඨාති. තදන්වයා සති සණ්ඨාති. තදන්වයො සමාධි සණ්ඨාති. ඉමස්ස ඛො භික්ඛවෙ, එකස්ස ඉන්ද්‍රියස්ස භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං ව්‍යාකරොති: "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමීති"ති.

## 4. 5. 6

## දුතිය පුබ්බාරාමසුත්තං

1730. කතින්නං නු ඛො භික්ඛවෙ, ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං ව්‍යාකරොති: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති? භගවම්මූලකා නො භන්තෙ, ධම්මා –පෙ– ද්වින්නං ඛො භික්ඛවෙ, ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති. "ඛීණා ජාති වුසිතං, බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමීති. කතමෙසං ද්වින්නං: අරියාය ච පඤ්ඤාය, අරියාය ච විමුත්තියා. යා හිස්ස භික්ඛවෙ, අරියා පඤ්ඤා තදස්ස පඤ්ඤින්ද්‍රියං, යා හිස්ස භික්ඛවෙ, අරියා විමුත්ති තදස්ස සමාධින්ද්‍රියං, ඉමෙසං ඛො භික්ඛවෙ, ද්වින්නං ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති: "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති.

---

1. කතීනං – සයා.

## 4. 5. 5

## පුබ්බාරාම සූත්‍රය

1729. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර සමීපයෙහි මිගාරමාතුපාසාද** නම් **පූර්වාරාමයෙහි** වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක ... මහණෙනි, කෙතෙක් ඉඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් ක්ෂීණාශ්‍රව මහණ තෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි අර්හත්ත්වය ප්‍රකාශ කෙරේ ද යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ. ... මහණෙනි, එක් ඉන්ද්‍රියයක් වැඩූ බැවින් බහුල කළ බැවින් ක්ෂීණාශ්‍රව මහණ තෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව පිණිස අනෙකක් නැතැයි දනිමි"යි අර්හත්ත්වය ප්‍රකාශ කෙරෙයි. කවර එකක් ද යත්: ප්‍රඥේන්ද්‍රිය යි. මහණෙනි, පැනවත් අරිසවුහට ඒ අනුව යන සැදැහැ පිහිටයි. ඒ අනුව යන වැර පිහිටයි. ඒ අනුව යන සිහිය පිහිටයි. ඒ අනුව යන සමාධිය පිහිටයි. මහණෙනි, මේ එක් ඉන්ද්‍රියය වැඩූ බැවින් බහුල කළ බැවින් රහත් මහණ තෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි රහත් බව ප්‍රකාශ කෙරේ යි.

## 4. 5. 6

## දුතිය පුබ්බාරාම සූත්‍රය

1730. මහණෙනි, කෙතෙක් ඉඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් රහත් මහණ තෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි අර්හත්ත්වය ප්‍රකාශ කෙරේ ද යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ .. මහණෙනි, ඉන්ද්‍රිය දෙකක් වැඩූ බැවින් බහුල කළ බැවින් රහත් මහණ තෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව පිණිස අනෙකක් නැතැයි දනිමි"යි අර්හත්ත්වය ප්‍රකාශ කෙරෙයි. කවර දෙකක් ද යත්: ආර්‍ය්‍ය වූ ප්‍රඥාවත් ආර්‍ය්‍යවූ විමුක්තියත් ය. මහණෙනි, ඔහුගේ යම් ආර්‍ය්‍ය වූ ප්‍රඥාවක් වේ නම් එය ඔහුගේ ප්‍රඥේන්ද්‍රිය යි. මහණෙනි ඔහුගේ යම් ආර්‍ය්‍ය වූ විමුක්තියක් වේ නම් එය ඔහුගේ සමාධීන්ද්‍රිය යි. මහණෙනි, මේ දෙඉඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් රහත් මහණ තෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි අර්හත්ත්වය ප්‍රකාශ කෙරේ යි.

## 4. 5. 7

## තතිය පුබ්බාරාමසුත්තං

1731. කතිනං නු ඛො භික්ඛවෙ, ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති? භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ- චතුන්නං ඛො භික්ඛවෙ, ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. කතමෙසං චතුන්නං: විරියින්ද්‍රියස්ස සතින්ද්‍රියස්ස සමාධින්ද්‍රියස්ස පඤ්ඤින්ද්‍රියස්ස. ඉමෙසං ඛො භික්ඛවෙ, චතුන්නං ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමීති"ති.

## 4. 5. 8

## චතුත්ථ පුබ්බාරාමසුත්තං

1732. කතිනං නු ඛො භික්ඛවෙ, ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති? භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ- පඤ්චන්නං ඛො භික්ඛවෙ, ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. කතමෙසං පඤ්චන්නං: සද්ධින්ද්‍රියස්ස විරියින්ද්‍රියස්ස සතින්ද්‍රියස්ස සමාධින්ද්‍රියස්ස පඤ්ඤින්ද්‍රියස්ස. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඛීණාසවො භික්ඛු අඤ්ඤං බ්‍යාකරොති: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමීති"ති.

## 4. 5. 9

## පිණ්ඩොලසුත්තං

1733. එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ, තෙන ඛො පන සමයෙන ආයස්මතා පිණ්ඩොලභාරද්වාජෙන අඤ්ඤා බ්‍යාකතා හොති: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසංකමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං: "ආයස්මතා භන්තෙ පිණ්ඩොලභාරද්වාජෙන අඤ්ඤා බ්‍යාකතා: "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. කින්නුඛො භන්තෙ, අත්ථවසං සම්පස්සමානෙන ආයස්මතා පිණ්ඩොලභාරද්වාජෙන අඤ්ඤා බ්‍යාකතා: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං. කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමීති,

## 4. 5. 7

## තතිය පුබ්බාරාම සූත්‍රය

1731. මහණෙනි, කෙතෙක් ඉඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් රහත් මහණ තෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි අර්හත්ත්වය ප්‍රකාශ කෙරේ ද? යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ ... මහණෙනි, ඉඳුරන් සිවුදෙනකුන් වැඩූ බැවින් බහුල කළ බැවින් ක්ෂීණාශ්‍රව මහණ තෙමේ: "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි අර්හත්වය ප්‍රකාශ කෙරේ. කවර සිවුදෙනෙකුන් ද යත්: විරියින්ද්‍රියය සතින්ද්‍රියය සමාධින්ද්‍රියය පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මේ සිවුඉඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් රහත් මහණතෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි රහත් බව පවසා යි.

## 4. 5. 8

## චතුත්ථ පුබ්බාරාම සූත්‍රය

1732. මහණෙනි, කෙතෙක් ඉඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් රහත් මහණ තෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි රහත් බව පවසා ද? යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ ... මහණෙනි, ඉන්ද්‍රිය පසක් වැඩූ බැවින් බහුල කළ බැවින් රහත් මහණ තෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි. දනිමි"යි රහත් බව පවසයි. කවර පසක් ද යත්: සද්ධින්ද්‍රියය විරියින්ද්‍රිය ය සතින්ද්‍රිය ය සමාධින්ද්‍රිය ය පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මේ පසිඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් රහත් මහණ තෙමේ "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි රහත්බව පවසා යි.

## 4. 5. 9

## පිණ්ඩොල සූත්‍රය

1733. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර සමීපයෙහි ඝෝසිතාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි ආයුෂ්මත් පිණ්ඩෝලභාරද්වාජ තෙරණුවන් විසින් "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි රහත් බව පවසන ලද්දේ වෙයි. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හුන්හ. එකත්පස් ව හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළහ: වහන්ස, ආයුෂ්මත් පිණ්ඩෝලභාරද්වාජ තෙරණුවන් විසින් "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි රහත් බව පවසන ලද්දේ ය. වහන්ස, කිනම් කරුණක් දක්නා ආයුෂ්මත් පිණ්ඩෝලභාරද්වාජ තෙරණුවන් විසින් "ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි"යි රහත් බව පවසන ලද්දේ ද? යි.

තිණ්ණං[1] ඛො පන භික්ඛවෙ, ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා පිණ්ඩොලභාරද්වාජෙන භික්ඛුනා අඤ්ඤා බ්‍යාකතා: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. කතමෙසං තිණ්ණන්නං: සතින්ද්‍රියස්ස සමාධින්ද්‍රියස්ස පඤ්ඤින්ද්‍රියස්ස. ඉමෙසං ඛො භික්ඛවෙ, තිණ්ණන්නං ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා පිණ්ඩොලභාරද්වාජෙන භික්ඛුනා අඤ්ඤා බ්‍යාකතා: "ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාමී"ති. ඉමානි ච භික්ඛවෙ, තීණි ඉන්ද්‍රියානි කිමන්තානි: ඛයන්තානි. කිස්ස ඛයන්තානි: ජාතිජරාමරණස්ස. ජාතිජරාමරණං ඛයන්තං[2] ඛො භික්ඛවෙ, සම්පස්සමානෙන පිණ්ඩොලභාරද්වාජෙන භික්ඛුනා අඤ්ඤා බ්‍යාකතා: "ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා"ති පජානාමී"ති.

## 4. 5. 10

### ආපණසුත්තං

1734. එකං සමයං භගවා අඞ්ගෙසු විහරති ආපණං නාම අඞ්ගානං නිගමො. තත්‍ර ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි: "යො සො සාරිපුත්ත, අරියසාවකො තථාගතෙ එකන්තගතො,[3] අභිප්පසන්නො අපි නු සො[4] තථාගතෙ වා තථාගතසාසනෙ වා කඞ්ඛෙය්‍ය වා විචිකිච්ඡෙය්‍ය වා"ති?

යො සො භන්තෙ, අරියසාවකො තථාගතෙ එකන්තගතො[3] අභිප්පසන්නො න සො තථාගතෙ වා තථාගතසාසනෙ වා කඞ්ඛෙය්‍ය වා විචිකිච්ඡෙය්‍ය වා. සද්ධස්ස හි භන්තෙ, අරියසාවකස්ස එතං පාටිකඞ්ඛං: "යං ආරද්ධවිරියො විහරිස්සති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. යං හිස්ස භන්තෙ, විරියං තදස්ස විරියින්ද්‍රියං. සද්ධස්ස හි භන්තෙ, අරියසාවකස්ස ආරද්ධවිරියස්ස එතං පාටිකඞ්ඛං: "යං සතිමා භවිස්සති පරමෙන සතිනෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා අනුස්සරිතා. යා හිස්ස භන්තෙ, සති, තදස්ස සතින්ද්‍රියං. සද්ධස්ස හි භන්තෙ, අරියසාවකස්ස ආරද්ධවිරියස්ස උපට්ඨිතසතිනො එතං පාටිකඞ්ඛං: "යං වොස්සග්ගාරම්මණං කරිත්වා ලභිස්සති සමාධිං ලභිස්සති චිත්තස්සෙකග්ගතං. යො හිස්ස භන්තෙ, සමාධි තදස්ස සමාධින්ද්‍රියං.

1. තිණ්ණං - ස්‍යා, සිමු.
2. ඛයන්ති - මජ්ඣං, ස්‍යා, සිමු.
3. එකන්තිගතො - සිමු.
4. න සො - මජ්ඣං, ස්‍යා.

මහණෙනි, ඉන්ද්‍රිය තුනක් වැඩූ බැවින් බහුල කළ බැවින් පිණ්ඩෝල භාරද්වාජ මහණහු විසින් ඉපැද්ම ගෙවිණ, බඹසර වැස නිමවන ලදි, කටයුතු කරන ලදි, මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි''යි රහත් බව පවසන ලද්දේ ය. කවර තුනක් ද යත්: සතින්ද්‍රියය සමාධින්ද්‍රියය ප්‍රඥින්ද්‍රිය යි. මහණෙනි, මේ ඉන්ද්‍රිය තුන වැඩූ බැවින් බහුල කළ බැවින් පිණ්ඩෝලභාරද්වාජ මහණහු විසින් ඉපැද්ම ගෙවිණ, බඹසර වැස නිමවන ලදි, කටයුතු කරන ලදි, මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි''යි රහත් බව පවසන ලද්දේ ය. මහණෙනි, මේ තුන්ඉඳුරෝ කුමක් කෙළවර කොට ඇත්තෝ ද යත්: ක්‍ෂය කිරීම කෙළවර කොට ඇත්තෝ ය. කුමක් ක්‍ෂය කිරීම කෙළවර කොට ඇත්තෝ ද යත්: ජාතිජරාමරණ යි. මහණෙනි, ජාතිජරාමරණ ක්‍ෂය අන්තය යි දක්නා වූ පිණ්ඩෝල භාරද්වාජ මහණහු විසින් ''ඉපැද්ම ගෙවිණ. බඹසර වැස නිමවන ලදි. කටයුතු කරන ලදි. මේ බැව් පිණිස අනෙකක් නැතැ යි දනිමි''යි රහත් බව පවසන ලද්දේ යි.

## 4. 5. 10

## ආපණ සූත්‍රය

1734. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ අඟුත්තරාපයෙහි අඟුත්තරාපවැස්සන්ගේ ආපණ නම් නියම්ගමෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් සැරියුත් තෙරුන් ඇමතූ සේක. සාරිපුත්ත, යම් ඒ අරීසව්වෙක් තථාගතයන් කෙරෙහි නොසැලෙන සැදැහැත්තේ වෙසෙසින් පහන් වූයේ වේ නම් හෙතෙමේ තථාගතයන් කෙරෙහි හෝ තථාගතසස්නෙහි හෝ සැක කරන්නේ හෝ විචිකිච්ඡා කරන්නේ හෝ වේ ද? යි.

වහන්ස, යම් ඒ අරීසව්වෙක් තථාගතයන් කෙරෙහි නොසැලෙන සැදැහැත්තේ වෙසෙසින් පහන් වූයේ වේ නම් හෙතෙමේ තථාගතයන් කෙරෙහි හෝ තථාගතසස්නෙහි හෝ සැක නො කරන්නේ ය. විචිකිච්ඡාත් නො කරන්නේ ය. වහන්ස, ''අකුසල්දහම් ප්‍රහාණ පිණිස කුසල්දහම් ඉපදවීම පිණිස ඇරඹූ වැර ඇත්තේ කුසල්දහම්හි නොපසුබස්නා වැර ඇත්තේ දැඩිපැරකුම් ඇත්තේ නොබහාතැබූ ධුර ඇත්තේ වෙසෙන්නේ ය. යන යමෙක් ඇද් ද, සැදැහැති අරීසව්හු විසින් එය කැමති වියයුතු. වහන්ස, ඔහුට යම් වීර්‍ය්‍යයෙක් වේ නම් එය ඔහුගේ විරියින්ද්‍රිය යි. වහන්ස, ''සිහි ඇත්තේ උතුම් බලවත් සිහියෙන් යුතු වූයේ ඉතා පෙර කරන ලද්ද කියන ලද්ද පවා සිහි කරනුයේ පුනපුනා සිහිකරනුයේ වන්නේ ය, යන යමෙක් ඇද්ද, ඇරඹූ වැර ඇති සැදැහැති අරීසව්හු විසින් මෙය කැමති විය යුතු. වහන්ස, ඔහුට යම් සිහියෙක් වේ නම් එය ඔහුගේ සතින්ද්‍රිය යි. වහන්ස, නිවන අරමුණු කොට සමාධිය ලබන්නේ ය, සිතේ එකඟකම ලබන්නේ ය යන යමෙක් ඇද්ද, ඇරඹූ වෙර ඇති එළඹසිටි සිහි ඇති සැදැහැති අරීසව්හු විසින් මෙය කැමැති වියයුතු. වහන්ස, ඔහුට යම් සමාධියෙක් වේ නම් එය ඔහුගේ සමාධින්ද්‍රිය යි.

සද්ධස්ස හි භන්තෙ, අරියසාවකස්ස ආරද්ධවිරියස්ස උපට්ඨිත-සතිනො සමාහිතචිත්තස්ස එතං පාටිකඞ්ඛං: "යං එවං ජානිස්සති අනමතග්ගො ඛො සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජා-නීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං අවිජ්ජායත්වෙව තමොකායස්ස[1] අසෙසවිරාගනිරොධො, සන්තමෙතං පදං, පණීතමෙතං පදං, යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටි-නිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, යා හිස්ස භන්තෙ, පඤ්ඤා තදස්ස පඤ්ඤින්ද්‍රියං, ස ඛො සො[2] භන්තෙ, අරියසාවකො එවං පදහිත්වා පදහිත්වා එවං සරිත්වා සරිත්වා එවං සමාද-හිත්වා සමාදහිත්වා එවං පජානිත්වා පජානිත්වා එවං අභිසද්දහති: "ඉමෙ ඛො තෙ ධම්මා යෙ'මෙ පුබ්බෙ සුතාව[3] අහෙසුං, තෙ'දානාහං එතරහි කායෙන ච ඵුසිත්වා[4] විහරාමි. පඤ්ඤාය ච අතිවිජ්ඣ[5] පස්සාමී''ති. යා හි'ස්ස භන්තෙ, සද්ධා තදස්ස සද්ධින්ද්‍රියන්ති.

සාධු සාධු සාරිපුත්ත, යො සො සාරිපුත්ත, අරියසාවකො තථාගතෙ එකන්තගතො අභිප්පසන්නො, න සො තථාගතෙ වා තථාගතසාසනෙ වා කඞ්ඛෙය්‍ය වා විචිකිච්ඡෙය්‍ය වා. සද්ධස්ස හි සාරිපුත්ත, අරියසාවකස්ස එතං පාටිකඞ්ඛං: "යං ආරද්ධවිරියො විහරිස්සති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු, යං හිස්ස සාරිපුත්ත, විරියං, තදස්ස විරියින්ද්‍රියං. සද්ධස්ස හි සාරිපුත්ත, අරියසාවකස්ස ආරද්ධවිරියස්ස එතං පාටිකඞ්ඛං -පෙ- යා හිස්ස සාරිපුත්ත, පඤ්ඤා තදස්ස පඤ්ඤින්ද්‍රියං. ස ඛො සො සාරිපුත්ත, අරියසාවකො එවං පදහිත්වා පදහිත්වා එවං සරිත්වා සරිත්වා එවං සමාදහිත්වා සමාදහිත්වා එවං පජානිත්වා පජානිත්වා එවං අභිසද්දහති: "ඉමෙ ඛො තෙ ධම්මා යෙ'මෙ පුබ්බෙ සුතාව අහෙසුං තෙදානාහං[6] එතරහි කායෙන ච ඵුසිත්වා විහරාමි පඤ්ඤාය ච අතිවිජ්ඣ පස්සාමී''ති. යා හිස්ස සාරිපුත්ත, සද්ධා තදස්ස සද්ධින්ද්‍රියන්ති.

## ජරාවග්ගො පඤ්චමො.

තත්‍රුද්දානං:

ජරා උණ්ණාභබ්‍රාහ්මණො සාකෙතො පුබ්බකොට්ඨකො,
පුබ්බාරාමෙන චත්තාරි පිණ්ඩොලො ආපණෙන චාති.[7]

---

1. තමොකායස්සෙව – සිමු, සී 2.
2. සද්ධො සො – මජසං.
3. සුතවා – මජසං.
4. ඵුසිත්වා – සී 1, 2.
5. පටිවිජ්ඣ – මජසං.
6. තෙනාහං – සයා.
7. සද්ධෙන – සයා.

වහන්ස, අවිද්‍යාව නීවරණ කොට ඇති තෘෂ්ණාව සංයෝජන කොට ඇති දිවෙන සැරිසරන සත්ත්වයන්ගේ සසර නොදන්නා ලද අග්මුල් ඇත්තේ ය. පූර්ව කෙළවර නො පෙනේ. අවිද්‍යාසඞ්ඛ්‍යාත තමස්කායයාගේ යම් මේ නිරවශේෂ විරාගනිරෝධයෙක් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ බැහැර ලීමෙක් තෘෂ්ණාක්ෂයයෙක් විරාගයෙක් නිරෝධයෙක් නිර්වාණයෙක් වේ නම් මේ නිවන්පදය ශාන්ත ය, මේ නිවන්පදය ප්‍රණීත ය යි මෙසේ දන්නේ ය යන යමෙක් වේ ද, ඇරඹූ වැර ඇති එළඹසිටි සිහි ඇති එකඟ වූ සිත් ඇති සැදැහැති අරිසච්හු විසින් මෙය කැමති වියයුතු. වහන්ස, ඔහුට යම් ප්‍රඥාවක් වේ නම් එය ඔහුගේ පඤ්ඤින්ද්‍රිය යි. වහන්ස, ඒ මේ අරිසවු මෙසේ ප්‍රධන්වීර්‍ය්‍ය කොට කොට මෙසේ සිහිකොට කොට මෙසේ සමාදන් ව සමාදන් ව මෙසේ දැන දැන "පෙර මා විසින් යම් දහම් කෙනෙක් අසන ලද්දෝ වූහු නම් මොහු ඒ දහම්හු ම ය. මම දැන් ඔවුන් නාමකයින් ද පැහැස වෙසෙමි. නුවණින් ද පිළිවිද දක්මි"යි මෙසේ වෙසෙසින් හදහයි. වහන්ස, ඔහුට යම් සැදැහැයෙක් වේනම් එය ඔහුගේ සද්ධින්ද්‍රිය යි.

සාරිපුත්ත, මැනවි, මැනවි. සාරිපුත්ත, යම් ඒ අරිසච්වෙක් තථාගතයන් කෙරෙහි නොසැලෙන සැදැහැතියේ වෙසෙසින් පහන් වූයේ නම් හෙතෙමේ තථාගතයන් කෙරෙහි හෝ තථාගත සස්නෙහි හෝ සැක නො කරන්නේ ය. විචිකිච්ඡාත් නො කරන්නේ ය. සාරිපුත්ත, අකුසල්දහම් ප්‍රහාණ පිණිස කුසල්දහම් ඉපදවීම පිණිස ඇරඹූ වැර ඇතියේ කුසල්දහම්හි නො පසුබස්නා වැර ඇතියේ දැඩි පැරකුම් ඇතියේ නො බහා තැබූ ධුර ඇතියේ වෙසෙන්නේ ය යන යමෙක් වේ ද, සැදැහැති අරිසවුහු විසින් මෙය කැමැති විය යුතු. සාරිපුත්ත, ඔහුට යම් වීර්‍ය්‍යයෙක් වේ නම් එය ඔහුගේ විරියින්ද්‍රිය යි. සාරිපුත්ත .. ඇරඹූ වැර ඇති සැදැහැති අරිසවුහු විසින් මෙය කැමති වියයුතු, සාරිපුත්ත, ඔහුට යම් ප්‍රඥාවක් වේ නම් එය ඔහුගේ පඤ්ඤින්ද්‍රිය යි. සාරිපුත්ත ඒ මේ අරිසවු මෙසේ ප්‍රධන්වීර්‍ය්‍ය කොට කොට මෙසේ සිහි කොට කොට මෙසේ සමාදන් ව සමාදන් ව මෙසේ දැන දැන "පෙර මවිසින් යම් දහම් කෙනෙක් අසන ලද්දෝ වූහු නම් මොහු ඒ දහම්හු ම ය; මම දැන් ඔවුන් නාමකයින්නුදු පැහැස වෙසෙමි. නුවණින්නුදු පිළිවිද දක්මි"යි මෙසේ වෙසෙසින් හදහ යි. සාරිපුත්ත, ඔහුට යම් සැදැහැයෙක් වේ නම් එය ඔහුගේ සද්ධින්ද්‍රිය යි.

## පස්වැනි ජරාවග්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

ජරා උණ්ණාභබ්‍රාහ්මණ, සාකේත, පුබ්බකොට්ඨක යි සිවු සූතුරෙක් ද පුබ්බාරාම නමින් සිවු සූතුරෙක් ද, පිණ්ඩෝල ආපණ යි දෙසූතුරෙක් ද යි දසසූතුරෙකි යි.

# 6. සූකරඛතවග්ගො

## 4. 6. 1

### සාලාසුත්තං

1735. එකං සමයං භගවා කොසලෙසු විහරති සාලායං[1] බ්‍රාහ්මණගාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි -පෙ- සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි තිරච්ඡානගතා පාණා, සීහො තෙසං මිගරාජා[2] අග්ගමක්ඛායති; යදිදං ථාමෙන ජවෙන සූරියෙන[3] එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛියා ධම්මා, පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ග-මක්ඛායති: යදිදං බොධාය.

කතමෙ ච භික්ඛවෙ, බොධිපක්ඛියා ධම්මා? සද්ධින්ද්‍රියං භික්ඛවෙ, බොධිපක්ඛියො ධම්මො තං බොධාය සංවත්තති. විරියින්ද්‍රියං බොධි-පක්ඛියො ධම්මො, තං බොධාය සංවත්තති. සතින්ද්‍රියං බොධිපක්ඛියො ධම්මො, තං බොධාය සංවත්තති. සමාධින්ද්‍රියං බොධිපක්ඛියො ධම්මො තං බොධාය සංවත්තති. පඤ්ඤින්ද්‍රියං බොධිපක්ඛියො ධම්මො. තං බොධාය සංවත්තති. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි තිරච්ඡානගතා පාණා, සීහො තෙසං මිගරාජා අග්ගමක්ඛායති, යදිදං ථාමෙන ජවෙන සූරියෙන. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛියා ධම්මා, පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති: යදිදං බොධායාති.

## 4. 6. 2

### මල්ලකසුත්තං

1736. එකං සමයං භගවා මල්ලකෙසු[4] විහරති උරුවෙලකප්පං නාම මල්ලකානං නිගමො. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: යාව කීවඤ්ච භික්ඛවෙ, අරියසාවකස්ස අරියං ඤාණං[5] නුප්පන්නං[6] හොති නෙව තාව චතුන්නං ඉන්ද්‍රියානං සණ්ඨිති හොති, නෙව තාව චතුන්නං ඉන්ද්‍රියානං අවට්ඨිති හොති, යතො ච ඛො භික්ඛවෙ, අරිය-සාවකස්ස අරියඤාණං උප්පන්නං හොති, අථ චතුන්නං ඉන්ද්‍රියානං සණ්ඨිති හොති, අථ චතුන්නං ඉන්ද්‍රියානං අවට්ඨිති හොති.

1. කොසලායං - සයා.
2. සීහො මිගරාජා තෙසං - මජසං, සයා.
3. සූරෙන - මජසං.
4. මල්ලිකෙසු - මජසං.
5. අරියඤාණං - මජසං, සයා.
6. න උප්පන්නං - මජසං, සයා.

# 6. සූකරඛතවර්ගය

## 4. 6. 1

## සාලා සූත්‍රය

1735. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ **කොසොල්දනව්වෙහි සාලාතම්** බමුණුගම්හි වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක ... මහණෙනි, යම්සේ යම්කිසි තිරිසන්ගත ප්‍රාණීහු වෙද්ද, මෘගරාජ වූ සිංහ තෙමේ ශක්තියෙන් ද වෙගයෙන් ද ශූරභාවයෙන් ද ඔවුන්ට අග්‍රය යි කියනු ලැබේ. මහණෙනි එසෙයින් ම යම්කිසි බොධිපාක්ෂිකධර්මයෝ වෙද්ද, අවබෝධය පිණිස ප්‍රඥෙන්ද්‍රිය ඔවුන්ට අග්‍රය යි කියනු ලැබේ.

මහණෙනි, බෝපැකි දහම්හු කවරහ යත්: මහණෙනි, සද්ධින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය අවබොධය පිණිස පවතියි. විරියින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය අවබෝධය පිණිස පවතියි. සතින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය අවබෝධය පිණිස පවතියි. සමාධින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය අවබෝධය පිණිස පවතියි. ප්‍රඥෙන්ද්‍රිය බෝපැකි දහමෙකි. එය අවබෝධය පිණිස පවතියි. මහණෙනි, යම් කිසි තිරිසන්ගත ප්‍රාණීහු වෙද්ද මෘගරාජ වූ සිංහ තෙමේ ශක්තියෙන් ද වෙගයෙන් ද ශූරභාවයෙන් ද ඔවුන්ට අග්‍රයයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම යම්කිසි බෝධිපාක්ෂිකධර්මයෝ වෙද්ද, අවබෝධය පිණිස ප්‍රඥෙන්ද්‍රිය ඔවුන්ට අග්‍රය යි කියනු ලැබේ යි.

## 4. 6. 2

## මල්ලක සූත්‍රය

1736. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **මල්ලකදනව්වෙහි උරුවෙලකප්ප** නම් මල්ලකයන්ගේ නියම්ගම්හි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, අරිසවුහට යම්තාක් අරිනැණ නූපන්නේ වේ නම් ඒ තාක් සිවු ඉඳුරන්ගේ නො ම පිඩු වී සිටීම වේ. ඒ තාක් සිවුඉඳුරන්ගේ නො ම බැසගෙන සිටීම වේ. මහණෙනි, යම්කලෙක අරියවුහට අරිනැණ උපන්නේ වේ නම් එකල සිවුඉඳුරන්ගේ පිඩුවී සිටීම වේ. එකල සිවුඉඳුරන්ගේ බැසගෙන සිටීම වේ.



Free Distribution www.aathaapi.org

සෙය්‍යථාපි භික්ඛවෙ, යාවකීවඤ්ච කූටාගාරස්ස කූටං න උස්සිතං හොති, නෙව තාව[1] ගොපානසීනං සණ්ඨිති හොති, නෙව තාව ගොපානසීනං අවට්ඨිති හොති. යතො ච ඛො භික්ඛවෙ, කූටාගාරස්ස කූටං උස්සිතං හොති, අථ ඛො ගොපානසීනං සණ්ඨිති හොති, අථ ඛො ගොපානසීනං අවට්ඨිති හොති. එවමෙව ඛො භික්ඛවෙ, යාවකීවඤ්ච අරියසාවකස්ස අරියඤාණං න උප්පන්නං හොති, නෙව තාව චතුන්නං ඉන්ද්‍රියානං සණ්ඨිති හොති, නෙව තාව චතුන්නං ඉන්ද්‍රියානං අවට්ඨිති හොති, යතො ච ඛො භික්ඛවෙ, අරියසාවකස්ස අරියඤාණං උප්පන්නං හොති, අථ චතුන්නං ඉන්ද්‍රියානං සණ්ඨිති හොති, අථ චතුන්නං ඉන්ද්‍රියානං අවට්ඨිති හොති. කතමෙසං චතුන්නං: සද්ධින්ද්‍රියස්ස විරියින්ද්‍රියස්ස සතින්ද්‍රියස්ස සමාධින්ද්‍රියස්ස. පඤ්ඤවතො භික්ඛවෙ, අරියසාවකස්ස තදන්වයා සද්ධා සණ්ඨාති, තදන්වයං විරියං සණ්ඨාති, තදන්වයා සති සණ්ඨාති, තදන්වයො සමාධි සණ්ඨාතීති.

## 4. 6. 3

### සෙඛසුත්තං

1737. එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: අත්ථි නු ඛො භික්ඛවෙ,[2] පරියායො: යං පරියායං ආගම්ම සෙඛො[3] භික්ඛු සෙඛභූමියං ඨිතො[4] සෙඛො'ස්මීති පජානෙය්‍ය, අසෙඛො භික්ඛු අසෙඛභූමියං ඨිතො අසෙඛො'ස්මීති පජානෙය්‍යා'ති. භගවම්මූලකා නො භන්තෙ, ධම්මා -පෙ- අත්ථි භික්ඛවෙ, පරියායො: යං පරියායං ආගම්ම සෙඛො භික්ඛු සෙඛභූමියං ඨිතො සෙඛොස්මී'ති පජානෙය්‍ය, අසෙඛො භික්ඛු අසෙඛභූමියං ඨිතො අසෙඛොස්මී'ති පජානෙය්‍ය. කතමො ච භික්ඛවෙ, පරියායො, යං පරියායං ආගම්ම සෙඛො භික්ඛු සෙඛභූමියං ඨිතො සෙඛොස්මී'ති පජානාති? ඉධ භික්ඛවෙ, සෙඛො භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. අයම්පි ඛො භික්ඛවෙ, පරියායො, යං පරියායං ආගම්ම සෙඛො භික්ඛු සෙඛභූමියං ඨිතො සෙඛොස්මී'ති පජානාති.

පුනචපරං භික්ඛවෙ, සෙඛො භික්ඛු ඉති පටිසඤ්චික්ඛති: අත්ථි නු ඛො ඉතො බහිද්ධා අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා යො එවං භූතං තච්ඡං තථං[5] ධම්මං දෙසෙති, යථා භගවා'ති. සො එවං පජානාති: නත්ථි ඉතො[6] බහිද්ධා අඤ්ඤො සමණො වා බ්‍රාහ්මණො වා යො එවං භූතං තච්ඡං තථා ධම්මං දෙසෙති, යථා භගවා'ති. අයම්පි ඛො භික්ඛවෙ, පරියායො: යං පරියායං ආගම්ම සෙඛො භික්ඛු සෙඛභූමියං ඨිතො සෙඛොස්මී''ති පජානාති.

---

1. තාවඤ්ච - සී 1, 2.
2. අත්ථි නු ඛො මෙ භික්ඛවෙ - සී 1 2.
3. සෙක්ඛො - ස්‍යා.
4. සණ්ඨිතො - ස්‍යා.
5. තථං - මජසං, ස්‍යා.
6. නත්ථි ඛො ඉතො - මජසං.

මහණෙනි, යම්සේ කුළුගෙහි කැණිමඩල යම් තාක් නොඔසවන ලද්දේ වේ නම් ඒ තාක් ගොනැසුන්ගේ නො ම පිඩුවී සිටීම වේ. ඒ තාක් ගොනැසුන්ගේ කුළෙහි පිවිස සිටීම නො ම වේ. මහණෙනි, යම් කලෙක කුළුගෙහි කැණිමඬල ඔසවන ලද්දේ වේ නම් එකල ගොනැසුන්ගේ පිඩු වී සිටීම වේ. එකල ගොනැසුන්ගේ පිවිස සිටීම වේ. මහණෙනි, එසෙයින් ම යම් තාක් අරිසවුහට අරිනැණ නූපන්නේ වේ නම් ඒ තාක් සිවුඉඳුරන්ගේ නො ම පිඩු වී සිටීම වේ. ඒ තාක් සිවුඉඳුරන්ගේ නො ම බැසගෙන සිටීම වේ. මහණෙනි, යම්කලෙක අරිසවුහට අරිනැණ උපන්නේ වේ නම් එකල සිවු ඉඳුරන්ගේ පිඩුවී සිටීම වේ. එකල සිවුඉඳුරන්ගේ බැසගෙන සිටීම වේ. කවර සිවුඉඳුරන්ගේ ද යත්: සද්ධින්ද්‍රියයේත් විරියින්ද්‍රියයේත් සතින්ද්‍රියයේත් සමාධින්ද්‍රියයේත් ය. මහණෙනි, පැනවත් අරිසවුහට ඒ අනුව යන සැදැහැ සිටී. ඒ අනුව යන වෙර සිටී. ඒ අනුව යන සිහිය සිටී. ඒ අනුව යන සමාධිය සිටී''යි.

## 4. 6. 3

## සෙඛ සූත්‍රය

1737. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර සමීපයෙහි ඝෝසිතාරාමයෙහි වැඩවසන සේක. එහි දී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: ''මහණෙනි, යම් නයකට පැමිණ සෙඛ මහණ තෙමේ සෙඛබිම සිටියේ සෙඛයෙමි යි දැනගන්නේ නම් අසෙඛ මහණ තෙමේ අසෙඛබිම සිටියේ අසෙඛයෙමි යි දැනගන්නේ නම් එබඳු නයෙක් ඇද්ද යි. වහන්ස, අපගේ දහම්හු භගවත්හු මුල් කොට ඇතියහ ... මහණෙනි, යම් නයකට පැමිණ සෙඛ මහණ තෙමේ සෙඛබිම සිටියේ සෙඛයෙමි යි දැනගන්නේ නම් අසෙඛ මහණ තෙමේ අසෙඛබිම සිටියේ අසෙඛයෙමි යි දැනගන්නේ නම් එබඳු නයෙක් ඇත. මහණෙනි, යම් නයකට පැමිණ සෙඛ මහණ තෙමේ සෙඛබිම සිටියේ සෙඛයෙමි යි දැනගනී නම් අසෙඛ මහණ තෙමේ අසෙඛබිම සිටියේ අසෙඛයෙමියි දැනගනී නම් ඒ නය කවරේද යත්: මහණෙනි, මෙහි සෙඛමහණ-තෙමේ මේ දුකැයි තතුසේ දනී. මේ දුක් හටගැනීමැයි තතුසේ දනී. මේ දුක් වැළැක්මැයි තතුසේ දනී. මේ දුක් වැළැක්මට පමුණුවන පිළිවෙතැයි තතුසේ දනී. මහණෙනි, යම් නයකට පැමිණ සෙඛ මහණ තෙමේ සෙඛබිම සිටියේ සෙඛයෙමියි දැනගනී නම් මෙ ද නයෙකි.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි. සෙඛ මහණ තෙමේ මෙසේ නුවණින් සලකා බලයි. ''යමෙක් භාග්‍යවතුන් වහන්සේ මෙන් මෙබඳු සිද්‍ධ වූ සැබෑ වූ නොවෙනස් වනසුලු දහමක් දෙසා නම් එබඳු අන් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙසස්නෙන් පිටත ඇද්දෝ යි හෙතෙමේ මෙසේ දැනගනී: යමෙක් භාග්‍යවතුන් වහන්සේ මෙන් මෙබඳු සිද්‍ධ වූ සැබෑ වූ නොවෙනස් වනසුලු දහමක් දෙසා නම් එබඳු අන් මහණෙක් හෝ බමුණෙක් හෝ මෙසස්නෙන් බැහැර නැතැ'යි. මහණෙනි, යම් නයකට පැමිණ සෙඛ මහණ තෙමේ සෙඛ බිම සිටියේ සෙඛයෙමි යි දැනගනී නම් මෙ ද නයෙකි.

පුනචපරං භික්ඛවෙ, සෙඛො භික්ඛු පඤ්චින්ද්‍රියානි පජානාති: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං, යංගතිකානි යංපරමානි යංඵලානි[1] යංපරියොසානානි, නහෙව ඛො කායෙන ඵුසිත්වා[2] විහරති, පඤ්ඤාය ච අතිවිජ්ඣ පස්සති. අයම්පි ඛො භික්ඛවෙ: පරියායො: යං පරියායං ආගම්ම සෙඛො භික්ඛු සෙඛභූමියං ඨිතො සෙඛොස්මී'ති පජානාති.

කතමො ච භික්ඛවෙ, පරියායො, යං පරියායං ආගම්ම අසෙඛො භික්ඛු අසෙඛභූමියං ඨිතො අසෙඛොස්මීති පජානාති? ඉධ භික්ඛවෙ, අසෙඛො භික්ඛු පඤ්චින්ද්‍රියානි පජානාති සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං යංගතිකානි යංපරමානි යංඵලානි යංපරියොසානානි. කායෙන ච ඵුසිත්වා විහරති, පඤ්ඤාය ච අතිවිජ්ඣ පස්සති. අයම්පි ඛො භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම අසෙඛො භික්ඛු අසෙඛභූමියං ඨිතො අසෙඛොස්මීති පජානාති.

පුනචපරං භික්ඛවෙ, අසෙඛො භික්ඛු ඡ ඉන්ද්‍රියානි පජානාති. චක්ඛුන්ද්‍රියං සොතින්ද්‍රියං ඝානින්ද්‍රියං ජිව්හින්ද්‍රියං කායින්ද්‍රියං මනින්ද්‍රියං, ඉමානි ඡ[3] ඉන්ද්‍රියානි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අපරිසෙසං නිරුජ්ඣිස්සන්ති.[4] අඤ්ඤානි ඡ[5] ඉන්ද්‍රියානි න කුහිඤ්චි කිස්මිඤ්චි[6] උප්පජ්ජිස්සන්තීති පජානාති. අයම්පි ඛො භික්ඛවෙ, පරියායො යං පරියායං ආගම්ම අසෙඛො භික්ඛු අසෙඛභූමියං ඨිතො අසෙඛොස්මීති පජානාතීති.

## 4. 6. 4

### පදසුත්තං

1738. සෙය්‍යථාපි භික්ඛවෙ, යානි කානිචි ජඞ්ගමානං පාණානං පදජාතානි, සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති, හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති යදිදං මහන්තත්තෙන. එවමෙව ඛො භික්ඛවෙ, යානි කානිචි පදානි බොධාය සංවත්තන්ති, පඤ්ඤින්ද්‍රියං පදං තෙසං අග්ගමක්ඛායති යදිදං බොධාය. කතමානි ච භික්ඛවෙ, පදානි බොධාය සංවත්තන්ති: සද්ධින්ද්‍රියං භික්ඛවෙ පදං, තං බොධාය සංවත්තති. විරියින්ද්‍රියං පදං, තං බොධාය සංවත්තති. සතින්ද්‍රියං පදං, තං බොධාය සංවත්තති. සමාධින්ද්‍රියං පදං, තං බොධාය සංවත්තති. පඤ්ඤින්ද්‍රියං පදං, තං බොධාය සංවත්තති. සෙය්‍යථාපි භික්ඛවෙ, යානි කානිචි ජඞ්ගමානං පාණානං පදජාතානි සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති. හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති. යදිදං මහන්තත්තෙන. එවමෙව ඛො භික්ඛවෙ, යානි කානිචි පදානි බොධාය සංවත්තන්ති. පඤ්ඤින්ද්‍රියං පදං තෙසං අග්ගමක්ඛායති. යදිදං බොධායාති.

1. යමඵලානි - මජසං, සයා.
2. ඵස්සිත්වා - සී 1, 2.
3. ඉමානි ඛො ඡ - මජසං, සයා.
4. නිරුජ්ඣිස්සන්ති - මජසං, සයා.
5. අඤ්ඤානි ච ඡ - මජසං, සයා.
6. කිස්මිචි - සී 1, 2.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි: සෙඛ මහණ යමක් ස්වභාව කොට ඇති යමක් පරම කොට ඇති යමක් බල කොට ඇති යමක් කෙළවර කොට ඇති සද්ධින්ද්‍රියය විරියින්ද්‍රියය සතින්ද්‍රියය සමාධින්ද්‍රියය පඤ්ඤින්ද්‍රියය යන පසිඳුරන් දනී ද. නාමකයින් පැහැස නොම වෙසේ ද. පස්විකුම් නුවණින් පිළිවිද දකී ද. මහණෙනි, යම් නයකට පැමිණ සෙඛ මහණ සෙඛයෙමි යි දැනගනී නම් මෙ ද නයෙකි.

මහණෙනි, යම් නයකට පැමිණ අසෙඛ මහණ අසෙඛබිම සිටියේ 'අසෙඛයෙමි' යි දැනගනී නම් ඒ නය කවරේ ද යත්: මහණෙනි, මෙහි අසෙඛ මහණ යමක් ස්වභාව කොට ඇති යමක් පරම කොට ඇති යමක් බල කොට ඇති යමක් කෙළවර කොට ඇති සද්ධින්ද්‍රියය ... පඤ්ඤින්ද්‍රියය යන පසිඳුරන් දනී ද. නාමකයිනුදු පැහැස වෙසේ ද. පස්විකුම් නුවණිනුදු පිළිවිද දකී ද. මහණෙනි, යම් නයකට පැමිණ අසෙඛ මහණ අසෙඛබිම සිටියේ 'අසෙඛයෙමි'යි දැනගනී නම් මෙ ද නයෙකි.

මහණෙනි, නැවත අනෙකක් ද කියමි: අසෙඛ මහණ තෙමේ චක්ඛුන්ද්‍රියය සොතින්ද්‍රියය ඝානින්ද්‍රියය ජිව්හින්ද්‍රියය කායින්ද්‍රියය මනින්ද්‍රියය යන සඳුරන් දනී. මේ සඳුරෝ මුළුමනින් සියල්ල සියලු අයුරින් සියල්ල නිරවශෙෂයෙන් නිරුද්ධ වෙති. අන් සඳුරු කෙනෙක් කොහි වත් කොතැනෙක වත් නූපදනාහයි දනී. මහණෙනි, යම් නයකට පැමිණ අසෙඛ මහණ තෙමේ අසෙඛබිම සිටියේ 'අසෙඛයෙමි'යි දැනගනී නම් මෙ ද නයෙකි යි.

## 4. 6. 4

## පද සූත්‍රය

1738. මහණෙනි, යම්සේ යම්කිසි ජඞගම‍ප්‍රාණීන්ගේ පියවර සමූහයෝ වෙත් නම් ඒ සියල්ලෝ ඇත්පියවරෙහි ඇතුළත් වීමට යෙති. ඇත් පියවර මහත්බැවින් ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම යම්කිසි දහම් පද කෙනෙක් අවබෝධය පිණිස පවතිත් නම් පඤ්ඤින්ද්‍රිය දහම්පදය අවබෝධය පිණිස ඔවුන් ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, කවර දහම්පද අවබෝධ පිණිස පවතී ද යත්: මහණෙනි, සද්ධින්ද්‍රිය පදයෙකි. එය අවබෝධය පිණිස පවතී. විරියින්ද්‍රිය පදයෙකි. එය අවබෝධය පිණිස පවතී. සතින්ද්‍රිය පදයෙකි. එය අවබෝධය පිණිස පවතී. සමාධින්ද්‍රිය පදයෙකි. එය අවබෝධය පිණිස පවතී. පඤ්ඤින්ද්‍රිය පදයෙකි. එය අවබෝධය පිණිස පවතී. මහණෙනි, ජඞගම‍ප්‍රාණීන්ගේ යම්කිසි පියවර සමූහයෝ වෙත් නම් ඒ සියල්ලෝ ඇත්පියවරෙහි ඇතුළත් වීමට යෙති. මහත් බැවින් ඇත්පියවර ඔවුන්ට අග්‍ර ය යි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම යම්කිසි දහම් පද කෙනෙක් අවබෝධය පිණිස පවතිත් නම් පඤ්ඤින්ද්‍රිය දහම්පදය අවබෝධය පිණිස ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ යි.

## 4. 6. 5

## සාරසුත්තං

1739. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි සාරගන්ධා ලොහිතචන්දනං තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛිකා ධම්මා පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති, යදිදං බොධාය. කතමෙ ච භික්ඛවෙ, බොධිපක්ඛිකා ධම්මා: සද්ධින්ද්‍රියං භික්ඛවෙ, බොධිපක්ඛිකො ධම්මො, තං බොධාය සංවත්තති. විරියින්ද්‍රියං –පෙ– සතින්ද්‍රියං –පෙ– සමාධින්ද්‍රියං –පෙ– පඤ්ඤින්ද්‍රියං බොධිපක්ඛිකො ධම්මො තං බොධාය සංවත්තති. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි සාරගන්ධා ලොහිතචන්දනං තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛිකා ධම්මා පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති යදිදං බොධායාති.

## 4. 6. 6

## පතිට්ඨිතසුත්තං

1740. සාවත්ථියං:

එකධම්මෙ පතිට්ඨිතස්ස භික්ඛවෙ, භික්ඛුනො පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි. කතමස්මිං එකධම්මෙ: අප්පමාදෙ... කතමො ච භික්ඛවෙ, අප්පමාදො. ඉධ භික්ඛවෙ භික්ඛු චිත්තං රක්ඛති ආසවෙසු ච සාසවෙසු ච ධම්මෙසු. තස්සිං[1] චිත්තං රක්ඛතො ආසවෙසු ච සාසවෙසු ච ධම්මෙසු සද්ධින්ද්‍රියම්පි භාවනාපාරිපූරිං ගච්ඡති. විරියින්ද්‍රියම්පි –පෙ– සතින්ද්‍රියම්පි –පෙ– සමාධින්ද්‍රියම්පි –පෙ– පඤ්ඤින්ද්‍රියම්පි භාවනාපාරිපූරිං ගච්ඡති. එවං ඛො[2] භික්ඛවෙ, එකධම්මෙ පතිට්ඨිතස්ස භික්ඛුනො පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානීති.

## 4. 6. 7

## බ්‍රහ්මසුත්තං

1741. එවං මෙ සුතං, එකං සමයං භගවා උරුවෙලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‍රොධෙ පඨමාභිසම්බුද්ධො. අථ ඛො භගවතො රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො–පරිවිතක්කො උදපාදි: පඤ්චින්ද්‍රියානි. භාවිතානි බහුලීකතානි අමතොගධානි හොන්ති අමතපරායනානි අමතපරියොසානානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං. විරියින්ද්‍රියං –පෙ– සතින්ද්‍රියං –පෙ– සමාධින්ද්‍රියං –පෙ– පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං. ඉමානි පඤ්චින්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අමතොගධානි හොන්ති අමතපරායනානි අමතපරියොසානානී''ති.

---

1. තස්ස – මජ්ඣං, සතා.
2. එවම්පි ඛො – මජ්ඣං, සතා.

## 4. 6. 5

## සාර සූත්‍රය

1739. මහණෙනි, යම්සේ යම්කිසි හරගඳහු වෙත් නම් රත්සඳන ඔවුනට අග්‍ර ය යි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම යම්කිසි බෝපැකි දහම්හු අවබොධය පිණිස වෙත් නම් පඤ්ඤින්ද්‍රිය ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, බෝපැකි දහම්හු කවරහ යත්: මහණෙනි, සද්ධින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය අවබොධය පිණිස පවතී. විරියින්ද්‍රිය ... සතින්ද්‍රිය ... සමාධින්ද්‍රිය .. පඤ්ඤින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය අවබොධය පිණිය පවතී. මහණෙනි, යම්සේ යම්කිසි හරගඳහු වෙත් නම් රත්සඳන ඔවුනට අග්‍ර ය යි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම යම්කිසි බෝපැකි දහම්හු අවබොධය පිණිස වෙත් නම් පඤ්ඤින්ද්‍රිය ඔවුනට අග්‍ර ය යි කියනු ලැබේ යි.

## 4. 6. 6

## පතිට්ඨිත සූත්‍රය

1740. **සැවැත්නුවර** :

මහණෙනි, එක්දහමෙක පිහිටි මහණහුගේ පසිඳුරෝ වඩන ලදහු මැනවින් වඩන ලදහු වෙති. කවර එක් දහමෙක ද යත්: නොපමාවෙහි ය. මහණෙනි, නොපමාව කවරේ ද යත්: මහණෙනි, මෙහි මහණ තෙමේ ආස්‍රව වූද සාස්‍රව වූද දහම් නිමිති කොට සිත රකී. ආස්‍රව වූද සාස්‍රව වූද දහම් නිමිති කොට සිත රක්නා ඔහුගේ සද්ධින්ද්‍රිය ද වැඩීමෙන් පිරීමට යේ. විරියින්ද්‍රිය ද ... සතින්ද්‍රිය ද ... සමාධින්ද්‍රිය ද .... පඤ්ඤින්ද්‍රිය ද වැඩීමෙන් පිරීමට යේ. මහණෙනි, මෙසේ එක් දහමෙක පිහිටි මහණහුගේ පසිඳුරෝ වඩන ලදහු මැනවින් වඩන ලදහු වෙති යි.

## 4. 6. 7

## බ්‍රහ්ම සූත්‍රය

1741. මා විසින් මෙසේ අසන ලදී. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ බුදුව පළමු කොට **උරුවෙල්දනව්වෙහි නෙරඤ්ජරා** ගංඉවුරෙහි **අජපල්නුගරුක්** මුල්හි වැඩවසන සේක. එකල්හි එකලා වූ විවෙකයෙන් යුත් භාග්‍යවතුන් වහන්සේට මෙබඳු විතාවිතර්කයෙක් පහළ විය: ''පසිඳුරෝ වඩන ලද්දහු බහුල කරන ලද්දහු නිවනට ඇතුළත් වූවාහු නිවන පිහිට කොට ඇත්තාහු නිවන කෙළවර කොට ඇත්තාහු වෙති. කවර පසිඳුරෝ ද යත්: සද්ධින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වෙයි. විරියින්ද්‍රිය ... සතින්ද්‍රිය ... සමාධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය වඩන ලද්දේ බහුල කරන ලද්දේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට නිවන කෙළවර කොට ඇත්තේ වේ. මේ පසිඳුරෝ වඩන ලද්දහු බහුල කරන ලද්දහු නිවනට ඇතුළත් වූවාහු නිවන පිහිට කොට ඇත්තාහු නිවන කෙළවර කොට ඇත්තාහු වෙති''යි.

අථ ඛො බ්‍රහ්මා සහම්පති භගවතො චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය, එවමෙවං බ්‍රහ්මලොකෙ[1] අන්තරහිතො භගවතො පුරතො පාතුරහොසි. අථ ඛො බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: එවමෙතං භගවා, එවමෙතං සුගත, පඤ්චින්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අමතොගධානි හොන්ති, අමතපරායනානි අමතපරියොසානානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති, අමතපරායනං අමතපරියොසානං. ඉමානි පඤ්චින්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අමතොගධානි හොන්ති අමතපරායනානි අමතපරියොසානානි.[2]

භූතපුබ්බා'හං භන්තෙ, කස්සපෙ සම්මාසම්බුද්ධෙ බ්‍රහ්මචරියං අචරිං. තත්‍ර'පි[3] මං එවං ජානන්ති: "සහකො භික්ඛු, සහකො භික්ඛූ"ති. සො ඛො'හං භන්තෙ, ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා කාමෙසු කාමච්ඡන්දං විරාජෙත්වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං බ්‍රහ්මලොකං උපපන්නො. තත්‍ර'පි මං එවං ජානන්ති "බ්‍රහ්මා සහම්පති බ්‍රහ්මා සහම්පතී"ති. එවමෙතං භගවා, එවමෙතං සුගත, අහමෙතං ජානාමි, අහමෙතං පස්සාමි.[4] යථා ඉමානි පඤ්චින්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අමතොගධානි හොන්ති, අමතපරායනානි අමතපරියොසානානීති.

## 4. 6. 8

## සූකරඛතසුත්තං

1742. එවං මෙ සුතං. එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ සූකරඛතායං[5]. තත්‍ර ඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං ආමන්තෙසි: "කින්නු ඛො සාරිපුත්ත, අත්ථවසං සම්පස්සමානො ඛීණාසවො භික්ඛු තථාගතෙ වා තථාගතසාසනෙ වා පරමනිපච්චකාරං[6] පවත්තමානො පවත්තතී"ති?[7] අනුත්තරං හි භන්තෙ, යොගක්ඛෙමං[8] සම්පස්සමානො ඛීණාසවො භික්ඛු තථාගතෙ වා තථාගතසාසනෙ වා පරමනිපච්චකාරං පවත්තමානො පවත්තතීති.

සාධු, සාධු, සාරිපුත්ත, අනුත්තරං හි සාරිපුත්ත, යොගක්ඛෙමං සම්පස්සමානො ඛීණාසවො භික්ඛු තථාගතෙ වා තථාගතසාසනෙ වා පරමනිපච්චකාරං පවත්තමානො පවත්තති. කතමො ච සාරිපුත්ත, අනුත්තරො යොගක්ඛෙමො, යං සම්පස්සමානො ඛීණාසවො භික්ඛු තථාගතෙ වා තථාගතසාසනෙ වා පරමනිපච්චකාරං පවත්තමානො පවත්තතීති. ඉධ භන්තෙ, ඛීණාසවො භික්ඛු සද්ධින්ද්‍රියං භාවෙති උපසමගාමිං සම්බොධගාමිං, විරියින්ද්‍රියං -පෙ- සතින්ද්‍රියං -පෙ- සමාධින්ද්‍රියං -පෙ-

1. බ්‍රහ්මලොකතො - සී 1, 2
2. පරියොසානානීති - 1, 2.
3. අචරිං පෙ තත්‍රපි - සී 1, 2.
4. එත්ථ සී 1, 2 පොත්ථකෙසු ඌනතා දිස්සතෙ.
5. සූකරඛාතායං - සයා.
6. නිපච්චාකාරං - සීමු, සී 1, 2.
7. පවත්තයමානො පවත්තෙන්ති - සීමු, සී 1, 2.
8. අනුත්තරං යොගක්ඛෙමං - මජසං, සයා.

එකල්හි **සහම්පති බ්‍රහ්ම** තෙමේ සියසිතින් භාග්‍යවතුන් වහන්සේගේ **චිත්තපරිවිතර්කය** දැන යම්සේ බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දිගු කරන්නේ හෝ වේ ද, දිගු කළ අතක් හකුළන්නේ හෝ වේ ද. එසෙයින් ම බඹලොව අතුරුදන් වූයේ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පහළ විය. ඉක්බිති සහම්පති බ්‍රහ්ම තෙමේ උතුරුසඟ එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල-කෙළේ ය: "භාග්‍යවතුන් වහන්ස, එය එසේ ය. සුගතයන් වහන්ස, එය එසේ ය. පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු නිවනට ඇතුළත් වූවාහු නිවන පිහිට කොට ඇත්තාහු නිවන කෙළවර කොට ඇත්තාහු වෙති. කවර පසිඳුරෝ ද: සද්ධින්ද්‍රිය වඩන ලදුයේ බහුල කරන ලදුයේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ ... පඤ්ඤින්ද්‍රිය වඩන ලදුයේ බහුල කරන ලදුයේ නිවනට ඇතුළත් වූයේ නිවන පිහිට කොට ඇත්තේ නිවන කෙළවර කොට ඇත්තේ වේ. මේ පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු නිවනට ඇතුළත් වූවාහු නිවන පිහිට කොට ඇත්තාහු නිවන කෙළවර කොට ඇත්තාහු වෙති.

වහන්ස, පෙර මම කසුප් සම්මාසම්බුදුන් කෙරෙහි බඹසර කෙළෙමි. එහි දූ මා "සහක මහණ සහක මහණැ"යි මෙසේ දනිත්. වහන්ස, ඒ මම මේ පසිඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් කාමයන්හි කාමච්ඡන්දය දුරු කොට කාබුන් මරණින් මතු සොභන ගති ඇති බඹලොවට පැමිණියෙමි. එහි දූ මා "සහම්පති බඹ, සහම්පති බඹැ"යි මෙසේ දනිත්. භාග්‍යවතුන් වහන්ස, එය එසේ ය. සුගතයන් වහන්ස, එය එසේ ය, මේ පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු යම්සේ නිවනට ඇතුළත් වූවාහු නිවන පිහිට කොට ඇත්තාහු නිවන කෙළවර කොට ඇත්තාහු වෙත් නම් මම මෙය දනිමි. මම මෙය දකිමි"යි.

## 4. 6. 8

## සූකරඛත සූත්‍රය

1742. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ **රජගහනුවර** සමීපයෙහි **ගිජ්ඣකූළපව්වෙහි සූකරඛත ලෙනෙහි** වැඩවසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ **ආයුෂ්මත් සැරියුත් තෙරුන්** ඇමතූ සේක. සාරිපුත්ත, රහත් මහණ කුමන කරුණක් දකිමින් තථාගතයන් කෙරෙහි හෝ තථාගතසස්නෙහි හෝ ඉතා යටහත් ව පවත්නේ පවතී ද යි වහන්ස, අනුත්තර වූ අර්හත්ත්වය දකිමින් රහත් මහණ තථාගතයන් වහන්සේ කෙරෙහි හෝ තථාගතසස්නෙහි හෝ ඉතා යටහත් ව පවත්නේ පවතී යි.

සාරිපුත්ත, මැනවි මැනවි. සාරිපුත්ත, අනුත්තර වූ රහත් බව දකිමින් රහත් මහණ තථාගතයන් කෙරෙහි හෝ තථාගත-සස්නෙහි හෝ ඉතා යටහත් ව පවත්නේ පවතී. සාරිපුත්ත, යමක් දකිමින් රහත් මහණ තථාගතයන් කෙරෙහි හෝ තථාගත-සස්නෙහි හෝ ඉතා යටහත් ව පවත්නේ පවතී නම් ඒ අනුත්තර වූ රහත් බව කවරේ ද යි වහන්ස, මෙහි රහත් මහණ සත්හිඳීමට යනසුලු කොට සම්බෝධියට යනසුලු කොට සද්ධින්ද්‍රිය වඩයි ... විරියින්ද්‍රිය ... සතින්ද්‍රිය ... සමාධින්ද්‍රිය වඩයි.

පඤ්ඤින්ද්‍රියං භාවෙති උපසමගාමිං සම්බොධගාමිං. අයං ඛො භන්තෙ, අනුත්තරො යොගක්ඛෙමො යං සම්පස්සමානො ඛීණාසවො භික්ඛු තථාගතෙ වා තථාගතසාසනෙ වා පරමනිපච්චකාරං පවත්තමානො පවත්තතීති.

සාධු, සාධු, සාරිපුත්ත, එසො හි සාරිපුත්ත, අනුත්තරො යොගක්ඛෙමො යං සම්පස්සමානො ඛීණාසවො භික්ඛු තථාගතෙ වා තථාගතසාසනෙ වා පරමනිපච්චකාරං පවත්තමානො පවත්තති. කතමො ච සාරිපුත්ත, පරමනිපච්චකාරො යං ඛීණාසවො භික්ඛු තථාගතෙ වා තථාගතසාසනෙ වා පරමනිපච්චකාරං පවත්තමානො පවත්තතීති. ඉධ භන්තෙ, ඛීණාසවො භික්ඛු සත්ථරි සගාරවො විහරති සප්පතිස්සො.[1] ධම්මෙ සගාරවො විහරති සප්පතිස්සො. සඞ්ඝෙ සගාරවො විහරති සප්පතිස්සො. සික්ඛාය සගාරවො විහරති සප්පතිස්සො. සමාධිස්මිං සගාරවො විහරති සප්පතිස්සො. අයං ඛො භන්තෙ, පරමනිපච්චකාරො යං ඛීණාසවො භික්ඛු තථාගතෙ වා තථාගතසාසනෙ වා පරමනිපච්චකාරං පවත්තමානො පවත්තතීති.

සාධු, සාධු, සාරිපුත්ත, එසො හි සාරිපුත්ත පරමනිපච්චකාරො යං ඛීණාසවො භික්ඛු තථාගතෙ වා තථාගතසාසනෙ වා පරමනිපච්චකාරං පවත්තයමානො පවත්තතීති.

## 4. 6. 9

## උප්පාදසුත්තං

1743. සාවත්ථියං :

පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි, භාවිතානි බහුලීකතානි අනුප්පන්නානි උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර තථාගතස්ස පාතුභාවා අරහතො සම්මාසම්බුද්ධස්ස. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අනුප්පන්නානි උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර තථාගතස්ස පාතුභාවා අරහතො සම්මාසම්බුද්ධස්සාති.

## 4. 6. 10

## දුතිය උප්පාදසුත්තං

1744. සාවත්ථියං :

පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අනුප්පන්නානි උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර සුගතවිනයා. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං සතින්ද්‍රියං සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ' පඤ්චින්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අනුප්පන්නානි උප්පජ්ජන්ති නාඤ්ඤත්‍ර සුගතවිනයාති.

## සූකරඛතවග්ගො ඡට්ඨො.

**තත්‍රුද්දානං:**

සාලා මල්ලිකං සෙඛො ච පදං සාරං පතිට්ඨිතං
බ්‍රහ්මා සූකරඛතඤ්ච උප්පාදෙ අපරෙ දුවෙති.

1. සප්පටිස්සො - සහා.

සත්හිඳීමට යනසුලු කොට පඤ්ඤින්ද්‍රිය වඩයි. වහන්ස, රහත් මහණ තෙමේ යමක් දකිමින් තථාගතයන් වහන්සේ කෙරෙහි හෝ තථාගතසස්නෙහි හෝ ඉතා යටහත් ව පවත්නේ පවතී නම් මේ (ඒ) අනුත්තර වූ රහත් බවයි.

සාරිපුත්ත, මැනවි මැනවි. සාරිපුත්ත, යමක් දකිමින් රහත් මහණ තෙමේ තථාගතයන් කෙරෙහි හෝ තථාගතසස්නෙහි හෝ ඉතා යටහත් ව පවත්නේ පවතී නම් මේ ඒ අනුත්තර වූ රහත්බව යි. සාරිපුත්ත, රහත් මහණ තථාගතයන් කෙරෙහි හෝ තථාගත-සස්නෙහි හෝ යම් ඉතා යටත්බවක් පවත්වන්නේ පවතී නම් ඒ ඉතා යටත්බව කවරේ ද යි. වහන්ස, මෙහි රහත් මහණ තෙමේ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව සහිත ව වැඩිහිටියකු සහිත ව වෙසෙයි. ධර්මය කෙරෙහි ගෞරව සහිත ව වැඩිහිටියකු සහිත ව වෙසෙයි. සඞ්ඝයා කෙරෙහි ගෞරව සහිත ව වැඩිහිටියකු සහිත ව වෙසෙයි. ශික්ෂාවෙහි ගෞරව සහිත ව වැඩිහිටියකු සහිත ව වෙසෙයි. සමාධියෙහි ගෞරව සහිත ව වැඩිහිටියකු සහිත ව වෙසෙයි. වහන්ස, රහත් මහණ තථාගතයන් වහන්සේ කෙරෙහි හෝ තථාගත-සස්නෙහි හෝ යම් ඉතා යටත් බවක් පවත්වමින් පවතී නම් මේ ඒ ඉතා යටහත් බව යි.

සාරිපුත්ත, මැනවි, මැනවි. සාරිපුත්ත රහත් මහණ තථාගතයන් කෙරෙහි හෝ තථාගතසස්නෙහි හෝ යම් ඉතා යටහත් බවක් පවත්වමින් පවතී නම් මේ ඒ ඉතා යටහත් බව යි.

## 4. 6. 9

## උප්පාද සූත්‍රය

1743. **සැවැත්නුවර:**

මහණෙනි, මේ පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු තථාගත අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේගේ පහළවීමෙන් අන් කල්හි නූපන්නාහු නූපදිති. කවර පසිඳුරෝ ද යත්: සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මේ පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු තථාගත අර්හත් සම්මා සම්බුද්ධ-රජාණන් වහන්සේගේ පහළවීමෙන් අන් කල්හි නූපන්නාහු නූපදිත් යි.

## 4. 6. 10

## දුතිය උප්පාද සූත්‍රය

1744. **සැවැත්නුවර:**

මහණෙනි, මේ පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු බුදුසස්නෙන් අන් තන්හි නූපන්නාහු නූපදිති. කවර පසිඳුරෝ ද යත්: සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය සමාධින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මේ පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු බුදුසස්-නෙන් අන් තන්හි නූපන්නාහු නූපදිත් යි.

## සවැනි සූකරඛාත වර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

සාලා මල්ලික සෙඛ පද සාර පතිට්ඨිත බ්‍රහ්ම සූකරඛාත යි අටෙක. අනෙක් උප්පාද සූත්‍ර දෙකෙකැ යි දස සූත්‍රයෙකි යි.

# 7. සම්බොධිවග්ගො

## 4. 7. 1

### සංයොජනසුත්තං

1745. සාවත්ථියං :

පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි භාවිතානි බහුලීකතානි සංයොජනප්පහානාය[1] සංවත්තන්ති. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි භාවිතානි බහුලීකතානි සංයොජනප්පහානාය සංවත්තන්තීති.

## 4. 7. 2

### අනුසයසුත්තං

1746. පඤ්චිමානි, භික්ඛවෙ, ඉන්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අනුසයසමුග්ඝාතාය සංවත්තන්ති. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අනුසයසමුග්ඝාතාය සංවත්තන්තීති.

## 4. 7. 3

### අද්ධානසුත්තං

1747. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අද්ධානපරිඤ්ඤාය සංවත්තන්ති. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි භාවිතානි බහුලීකතානි අද්ධානපරිඤ්ඤාය සංවත්තන්තීති.

## 4. 7. 4

### ආසවක්ඛයසුත්තං

1748. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි භාවිතානි බහුලීකතානි ආසවානං ඛයාය සංවත්තන්ති. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි භාවිතානි බහුලීකතානි ආසවානං ඛයාය සංවත්තන්තීති.

---

1. සංයොජනානං පහානාය - සතා.

# 7. සම්බොධි වර්ගය

## 4. 7. 1

## සංයොජන සූත්‍රය

1745. සැවැත්නුවර:

මහණෙනි, මේ පසිඳුරු කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු සංයොජනප්‍රහාණය පිණිස පවතිත්. කවර පසිඳුරු කෙනෙක් ද යත්: සද්ධින්‍ද්‍රිය ... පඤ්ඤින්‍ද්‍රිය යි. මහණෙනි, මේ පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු සංයොජනප්‍රහාණය පිණිස පවතිත් යි.

## 4. 7. 2

## අනුසය සූත්‍රය

1746. මහණෙනි, මේ පසිඳුරු කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු අනුසය නැසීම පිණිස පවතිත්. කවර පසිඳුරු කෙනෙක් ද යත්: සද්ධින්‍ද්‍රිය ... පඤ්ඤින්‍ද්‍රිය යි. මහණෙනි, මේ පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු අනුසය නැසීම පිණිස පවතිත් යි.

## 4. 7. 3

## අද්ධාන සූත්‍රය

1747. මහණෙනි, මේ පසිඳුරු කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු අදන්මග පිරිසිඳ දැනුම පිණිස පවතිත්. කවර පසිඳුරු කෙනෙක් ද යත්: සද්ධින්‍ද්‍රිය ... පඤ්ඤින්‍ද්‍රිය යි. මහණෙනි, මේ පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු අදන්මඟ පිරිසිඳ දැනුම පිණිස පවතිත් යි.

## 4. 7. 4

## ආසවක්ඛය සූත්‍රය

1748. මහණෙනි, මේ පසිඳුරු කෙනෙක් වඩන ලදහු බහුල කරන ලදහු ආස්‍රවක්‍ෂයය පිණිස පවතිත්. කවර පසිඳුරු කෙනෙක් ද යත්: සද්ධින්‍ද්‍රිය ... පඤ්ඤින්‍ද්‍රිය යි. මහණෙනි, මේ පසිඳුරෝ වඩන ලදහු බහුල කරන ලදහු ආස්‍රවක්‍ෂය පිණිස පවතිත් යි.

## 4. 7. 5

### ඵලසුත්තං

1749. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං: දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා'ති.

## 4. 7. 6

### දුතියඵලසුත්තං

1750. පඤ්චිමානි භික්ඛවෙ, ඉන්ද්‍රියානි. කතමානි පඤ්ච: සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චින්ද්‍රියානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා සත්තඵලා සත්තානිසංසා පාටිකඞ්ඛා. කතමෙ සත්තඵලා සත්තානිසංසා: දිට්ඨෙව ධම්මෙ පටිගච්ච[1] අඤ්ඤං ආරාධෙති, නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, අථ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති. නො චෙ දිට්ඨෙව ධම්මෙ පටිගච්ච අඤ්ඤං ආරාධෙති, නො චෙ මරණකාලෙ අඤ්ඤං ආරාධෙති, අථ පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා[2] අන්තරාපරිනිබ්බායී හොති, උපහච්චපරිනිබ්බායී හොති. අසඞ්ඛාරපරිනිබ්බායී හොති, සසඞ්ඛාරපරිනිබ්බායී හොති, උද්ධංසොතො අකනිට්ඨගාමී. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා ඉමෙ සත්තඵලා සත්තානිසංසා පාටිකඞ්ඛාති.

## 4. 7. 7

### රුක්ඛසුත්තං

1751. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි ජම්බුදීපකා රුක්ඛා, ජම්බු තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛිකා ධම්මා, පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති: යදිදං බොධාය. කතමෙ ච භික්ඛවෙ, බොධිපක්ඛිකා ධම්මා: සද්ධින්ද්‍රියං භික්ඛවෙ, බොධිපක්ඛියො ධම්මො, තං බොධාය සංවත්තති. විරියින්ද්‍රියං -පෙ- සතින්ද්‍රියං -පෙ- සමාධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං බොධිපක්ඛියො ධම්මො, තං බොධාය සංවත්තති. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි ජම්බුදීපකා රුක්ඛා, ජම්බු තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛිකා ධම්මා, පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති යදිදං බොධායාති.

1. පටිකච්ච - මජසං, සහා, පටිහච්ච - සීමු, සී 1, 2.
2. පරික්ඛයාය - සීමු, සී 1, 2, සහා.

## 4. 7. 5

## ඵල සූත්‍රය

1749. මහණෙනි, මේ ඉඳුරෝ පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි. මහණෙනි, මේ පසිඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් ඵල දෙකින් එක්තරා ඵලයක් කැමති වියයුතු යි. දිටුදමියෙහි රහත්බව හෝ උපාදානශෙෂ ව ඇති කල්හි අනගැමි බව හෝ යි.

## 4. 7. 6

## දුතියඵල සූත්‍රය

1750. මහණෙනි, මේ ඉඳුරෝ පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය යි. මහණෙනි, මොහු පසිඳුරෝ යි. මහණෙනි, මේ පසිඳුරන් වැඩූ බැවින් බහුල කළ බැවින් සත්පල කෙනෙක් සත් අනුසස් කෙනෙක් කැමති වියයුතු. කවර සත්පල කෙනෙක් සත් අනුසස් කෙනෙක් ද යත්: දිටුදමියෙහි ම පෙරාතුව රහත් බව ලබයි. ඉදින් දිටුදමියෙහි ම පෙරාතුව රහත්බව නො ලබා නම් එකල මරණසමයෙහි රහත් බව ලබයි. ඉදින් දිටුදමියෙහි ම පෙරාතු ව රහත් බව නො ලබා නම් ඉදින් මරණ සමයෙහි රහත් බව නො ලබා නම් එකල පස් ඔරම්භාගිය සංයොජනයන් ක්‍ෂය කිරීමෙන් අන්තරාපරිනිබ්බායී වේ. උපහච්ච පරිනිබ්බායී වේ. අසංඛාරපරිනිබ්බායී වේ. සසංඛාරපරිනිබ්බායි වේ. අකනිට්ඨගාමී උද්ධංසොතයෙක් වෙයි. මහණෙනි, මේ පසිඳුරන්වැඩූ බැවින් බහුල කළ බැවින් මේ සත් පල සත් අනුසස් කැමති වියයුතු යි.

## 4. 7. 7

## රුක්ඛ සූත්‍රය

1751. මහණෙනි, යම්සේ දඹදිව හටගත් යම් කිසි රුක්හු වෙද්ද, දඹරුක ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම අවබොධය පිණිස වූ යම් කිසි බෝපැකි දහම්හු වෙද්ද, පඤ්ඤින්ද්‍රිය ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, බෝපැකි දහම්හු කවරහ යත්: මහණෙනි, සද්ධින්ද්‍රිය, බෝපැකි දහමෙකි. එය බොධිය පිණිස පවතී. විරියින්ද්‍රිය ... සතින්ද්‍රිය ... සමාධින්ද්‍රිය ... පඤ්ඤින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය බොධිය පිණිස පවතී. මහණෙනි, යම්සේ දඹදිව හටගත් යම්කිසි රුක්හු වෙත් නම් දඹරුක ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම බොධිය පිණිස වූ යම්කිසි බෝපැකි දහම්හු වෙත් නම් පඤ්ඤින්ද්‍රිය ඔවුන්ට අග්‍ර ය යි කියනු ලැබේ යි.

## 4. 7. 8

## දුතිය රුක්ඛසුත්තං

1752. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි දෙවානං **තාවතිංසානං** රුක්ඛා, **පාරිච්ඡත්තකො** තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛිකා ධම්මා පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති: යදිදං බොධාය. කතමෙ ච භික්ඛවෙ, බොධිපක්ඛිකා ධම්මා: සද්ධින්ද්‍රියං භික්ඛවෙ, බොධිපක්ඛිකො ධම්මො. තං බොධාය සංවත්තති -පෙ- පඤ්ඤින්ද්‍රියං බොධිපක්ඛිකො ධම්මො, තං බොධාය සංවත්තති. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි දෙවානං තාවතිංසානං රුක්ඛා, පාරිච්ඡත්තකො තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛිකා ධම්මා. පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති යදිදං බොධායාති.

## 4. 7. 9

## තතිය රුක්ඛසුත්තං

1753. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි අසුරානං රුක්ඛා, **චිත්තපාටලි** තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ. යෙ කෙචි බොධිපක්ඛිකා ධම්මා, පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති යදිදං බොධාය, කතමෙ ච භික්ඛවෙ, බොධිපක්ඛිකා ධම්මා: සද්ධින්ද්‍රියං භික්ඛවෙ, බොධිපක්ඛිකො ධම්මො. තං බොධාය සංවත්තති. -පෙ- පඤ්ඤින්ද්‍රියං බොධිපක්ඛිකො ධම්මො. තං බොධාය සංවත්තති. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි අසුරානං රුක්ඛා, චිත්තපාටලි තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛිකා ධම්මා පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති, යදිදං බොධායාති.

## 4. 7. 10

## චතුත්ථ රුක්ඛසුත්තං

1754. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි සුපණ්ණානං රුක්ඛා, **කොටසිම්බලි**[1] තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛිකා ධම්මා, පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති; යදිදං බොධාය. කතමෙ ච භික්ඛවෙ, බොධිපක්ඛිකා ධම්මා: සද්ධින්ද්‍රියං භික්ඛවෙ, බොධිපක්ඛිකො ධම්මො. තං බොධාය සංවත්තති -පෙ- පඤ්ඤින්ද්‍රියං බොධිපක්ඛිකො ධම්මො. තං බොධාය සංවත්තති. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි සුපණ්ණානං රුක්ඛා, කූටසිම්බලි තෙසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ, යෙ කෙචි බොධිපක්ඛිකා ධම්මා පඤ්ඤින්ද්‍රියං තෙසං අග්ගමක්ඛායති යදිදං බොධායාති.

**සම්බොධිවග්ගො සත්තමො.**

**තත්‍රුද්දානං :**

සංයොජනං අනුසයං අද්ධානං ආසවක්ඛයං,
ද්වෙ ඵලා චතුරො රුක්ඛා වග්ගො තෙන පවුච්චතීති.

1. කූටසිම්බලි - සීමු, මජසං.

## 4. 7. 8

## දුතියරුක්ඛ සූත්‍රය

1752. මහණෙනි, යම්සේ තව්තිසාවැසි දෙවියන්ගේ යම් කිසි රුක්හු වෙද්ද, **පරසතුරුක** ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම බෝධිය පිණිස වූ යම් කිසි බෝපැකි දහම්හු වෙත් නම් පඤ්ඤින්ද්‍රිය ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, බෝපැකි දහම්හු කවරහ යත්: මහණෙනි, සද්ධින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය බෝධිය පිණිස පවතී ... පඤ්ඤින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය බෝධිය පිණිස පවතී. මහණෙනි, යම්සේ තව්තිසාවැසියන්ගේ යම් කිසි රුක්හු වෙත් නම් පරසතු රුක ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම බෝධිය පිණිස වූ යම් කිසි බෝපැකි දහම්හු වෙත් නම් පඤ්ඤින්ද්‍රිය අග්‍ර යයි කියනු ලැබේ යි.

## 4. 7. 9

## තතියරුක්ඛ සූත්‍රය

1753. මහණෙනි, යම්සේ අසුරයන්ගේ යම් කිසි රුක්හු වෙත් නම් **සිත්පලොල්රුක** ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම බෝධිය පිණිස වූ යම් කිසි බෝපැකි දහම්හු වෙත් නම් පඤ්ඤින්ද්‍රිය ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, බෝපැකි දහම්හු කවරහ යත්: මහණෙනි, සද්ධින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය බොධිය පිණිස පවතී.... පඤ්ඤින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය බොධිය පිණිය පවතී. මහණෙනි, යම්සේ අසුරයන්ගේ යම් කිසි රුක්හු වෙත් නම් සිත්පලොල් රුක ඔවුනට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම බොධිය පිණිස වූ යම් කිසි බෝපැකි දහම්හු වෙත් නම් පඤ්ඤින්ද්‍රිය ඔවුනට අග්‍ර යයි කියනු ලැබෙ යි.

## 4. 7. 10

## චතුත්ථරුක්ඛ සූත්‍රය

1754. මහණෙනි, යම්සේ ගුරුළුන්ගේ යම් කිසි රුක්හු වෙත් නම් **කොටහිඹුල්රුක** ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම බොධිය පිණිස වූ යම්කිසි බෝපැකි දහම්හු වෙත් නම් පඤ්ඤින්ද්‍රිය ඔවුන්ට අග්‍ර යයි කියනු ලැබේ. මහණෙනි, බෝපැකි දහම්හු කවරහ යත්: මහණෙනි, සද්ධින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය බොධිය පිණිය පවතී. ... පඤ්ඤින්ද්‍රිය බෝපැකි දහමෙකි. එය බෝධිය පිණිස පවතී. මහණෙනි, යම්සේ ගුරුළුන්ගේ යම් කිසි රුක්හු වෙත් නම් කොටහිඹුල් රුක ඔවුනට අග්‍ර ය යි කියනු ලැබේ. මහණෙනි, එසෙයින් ම බොධිය පිණිස වූ යම් කිසි බෝපැකි දහම්හු වෙත් නම් පඤ්ඤින්ද්‍රිය ඔවුනට අග්‍ර ය යි කියනු ලැබෙ යි.

## සත්වැනි සම්බොධි වර්ග යි.

එහි සූත්‍රනාමාවලිය:

සංයොජන අනුසය අද්ධාන ආසවක්ඛය යි සූත්‍ර සතරෙකි. ඵලසූත්‍ර දෙකෙකි. රුක්ඛසූත්‍ර සතරෙකි. එයින් වර්ග යි කියනු ලැබෙ යි.



Free Distribution www.aathaapi.org

## 8. ගඞ්ගාපෙය්‍යාලො

### 4. 8. 1–12

### පාචීනනින්නාදිසුත්තානි

1755–1766. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගානදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා -පෙ- නිබ්බානපබ්භාරොති.

(ඉන්ද්‍රියසංයුත්තස්ස ගඞ්ගාපෙය්‍යාලො විවෙකනිස්සිතාදිවසෙන විත්ථාරෙතබ්බො)

**ගඞ්ගාපෙය්‍යාලි යි.**

**තස්සුද්දානං:**

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො,
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

## 9. අප්පමාදවග්ගො

### 4. 9. 1–10

### තථාගතාදි සුත්තානි

1767–1776. යාවතා භික්ඛවෙ, සත්තා අපද වා දිපද වා චතුප්පද වා බහුප්පද වා –පෙ– බහුලීකරොතීති.

(අප්පමාදවග්ගො විවෙකනිස්සිතාදිවසෙන විත්ථාරෙතබ්බො.)

**අප්පමාදවග්ගො නවමො.**

**තස්සුද්දානං:**

තථාගතං පදං කූටං මූලං සාරඤ්ච වස්සිකං,
රාජා චන්දිමසූරියා ච වත්ථෙන දසමං පදන්ති.

## 10. බලකරණීයවග්ගො

### 4. 10. 1–12

### බලාදි සුත්තානි

1777–1788. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කයිරන්ති –පෙ– බහුලීකරොතීති.

(බලකරණීයවග්ගො විවෙකනිස්සිතාදිවසෙන විත්ථාරෙතබ්බො.)

**බලකරණීයවග්ගො දසමො.**

**තස්සුද්දානං:**

බලං බීජඤ්ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකිනං,
ආකාසෙන ච ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදීති.

## 8. ගඞ්ගාපෙය්‍යාලය

### 4. 8. 1–12

### පාචීනනින්නාදි සූත්‍ර

1755–1766. මහණෙනි, යම්සේ ගඞ්ගානදී නොමෝ පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බර වූවා වේ ද ... නිවනට බර වූයේ වේ යි.

(ඉන්ද්‍රියසංයුත්තයේ ගඞ්ගාපෙය්‍යාල වර්ගය විවේකනිස්සිතාදි විසින් විතර කටයුතු.)

**අටවැනි ගඞ්ගාපෙය්‍යාල යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

පාචීනනින්න සයෙකි. සමුද්දනින්න ද සයෙකි. මේ ෂට්ක දෙක සූත්‍ර දොළොසෙක් වේ. එයින් වර්ග යි කියනු ලැබේ යි.

## 9. අප්පමාදවර්ගය

### 4. 9. 1–10

### තථාගතාදි සූත්‍ර

1767–1776. මහණෙනි, අපා වූ ද දෙපා වූ ද සිව්පා වූ ද බහුපා වූ ද යම්තාක් සත්වයෝ වෙත් නම් ... බහුල කෙරේ යි.

(අප්පමාද වර්ගය ද විවේකනිස්සිතාදි විසින් විතර කටයුතු යි.)

**නවවැනි අප්පමාදවර්‍ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

තථාගත පද කූට මූල සාර වස්සික රාජ චන්‍ද්‍ර සූරිය වත්‍ථ යි දශසූත්‍රාන්ත කෙනෙකි.

## 10. බලකරණීයවර්ගය

### 4. 10. 1–12

### බලාදි සූත්‍ර

1777–1788. මහණෙනි, යම්සේ යම්කිසි බලකරණීයකර්මාන්තයෝ කරනු ලැබෙද්ද ... බහුල කෙරේ යි.

(බලකරණීය වර්ගය ද විවේකනිස්සිතාදි විසින් විතර කටයුතු)

**දසවැනි බලකරණීයවර්‍ග යි.**

**එහි සූත්‍රනාමාවලි ය:**

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාස යි සූත්‍ර සතෙකි. මෙස සූත්‍ර දෙකෙකි. නාවා ආගන්තුක නදී යි තුනෙකි. මුළුල්ල දොළොසෙකි.

# 11. එසනාවග්ගො

## 4. 11. 1–40

### එසනාදි සුත්තානි

1789–1828. තිස්සො ඉමා භික්ඛවෙ, එසනා. කතමා තිස්සො: -පෙ- භාවෙතබ්බාති.

(එසනාවග්ගො ච විවෙකනිස්සිතාදිවසෙන විත්ථාරෙතබ්බො.)

**එසනාවග්ගො එකාදසමො.**

**තත්‍රුද්දානං:**

එසනා විධා ආසවො භවො දුක්ඛතා ච තිස්සො,
ඛීලං මලඤ්ච නීඝො ච වෙදනා තණ්හාභි චාති.

# 12. ඔඝවග්ගො

## 4. 12. 1–40

### ඔඝාදි සුත්තානි

1829–1868. චත්තාරොමෙ භික්ඛවෙ, ඔඝා. කතමෙ චත්තාරො: -පෙ- භාවෙතබ්බාති.

(ඔඝවග්ගොපි විවෙකනිස්සිතාදිවසෙන විත්ථාරෙතබ්බො.)

**ඔඝවග්ගො ද්වාදසමො.**

**තත්‍රුද්දානං:**

ඔඝො යොගො උපාදානං ගන්ථා අනුසයෙන ච,
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධම්භාගියාති.

# 13. පුනගඞ්ගාපෙය්‍යාලො

## 4. 13. 1–36

### පාචීනනින්නාදි සුත්තානි

1869–1904. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගානදී -පෙ- නිබ්බානපබ්භාරොති.

(ඉන්ද්‍රියසංයුත්තස්ස පුනගඞ්ගාපෙය්‍යාලවග්ගො රාගවිනයාදිවසෙන අමතොගධාදිවසෙන නිබ්බානනින්නාදිවසෙන ච විත්ථාරෙතබ්බො. එකෙකස්මිං තයො තයො කත්වා ඡත්තිංසති සුත්තන්තා වෙදිතබ්බා.)

**පුනගඞ්ගාපෙය්‍යාලි.**

**තත්‍රුද්දානං:**

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො,
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

## 11. එසනාවර්ගය

### 4. 11. 1–40

### ඒසනාදි සූත්‍ර

1789–1828. මහණෙනි, මේ එසනා තුනෙකි. කවර තුනෙක් ද යත්: ... වැඩියයුතුයි.

(ඒසනාවර්ගය ද විවෙකනිස්සිතාදි වශයෙන් විතර කටයුතු)

**එකළොස්වැනි එසනාවග්ග යි.**

එහි සූත්‍රනාමාවලිය:

එසනා, විධා, ආසව, භව, දුක්ඛතා, ඛිල, මල, නීඝ, වෙදනා, තණ්හා ය යි සූත්‍ර චතුෂ්ක දශයෙකි. මුළුල්ල සාළිසෙකි යි.

## 12. ඔඝවර්ගය

### 4. 12. 1–40

### ඔඝාදි සූත්‍ර

1829–1868. මහණෙනි, මේ ඔඝ සතරෙකි. කවර සතරෙක් ද යත්: ... වැඩියයුතු යි ...

(ඔඝ වර්ගය ද විවෙකනිස්සිතාදි වශයෙන් විතර කටයුතු.)

**දෙළොස්වැනි ඔඝවග්ග යි.**

එහි සූත්‍රනාමාවලිය:

ඔඝ, යොග, උපාදන, ගන්ථ, අනුසය, කාමගුණ, නීවරණ, ඛන්ධ, ඔරම්භාගිය, උද්ධම්භාගිය යි සූත්‍ර චතුෂ්ක දශයෙකි මුළුල්ල සාළිසෙකි යි.

## 13. පුනගඞ්ගාපෙය්‍යාලවර්ගය

### 4. 13. 1–36

### පාචීනනින්නාදි සූත්‍ර

1869–1904. මහණෙනි, යම්සේ ගඞ්ගා නදිය ... නිවනට බර වූයේ වේ යි.

(ඉන්ද්‍රියසංයුක්තයේ පුනගඞ්ගාපෙය්‍යාලවර්ගය රාගවිනයාදිවශයෙන් ද අමතොගධාදිවශයෙන් ද නිබ්බානනින්නාදිවශයෙන් ද විතර කට යුතු. එකෙක තුනක් තුනක් කොට සතිස් සූත්‍රාන්ත කෙණෙක් දතයුතු.)

**තෙළෙස්වැනි පුනගඞ්ගාපෙය්‍යාල යි.**

එහි සූත්‍රනාමාවලිය:

පාචීනනින්නසූත්‍ර ත්‍රික සයෙකි. සමුද්දනින්න ත්‍රික ද සයෙකි. මේ ෂට්ක දෙක ත්‍රික දෙළොසෙක් වේ. එයින් වර්ගය යි කියනු ලැබේ. සූත්‍ර මුළුල්ල සතිසෙකි යි.

# 14. පුත්තඅප්පමාදවග්ගො

## 4. 14. 1–30

### තථාගතාදි සුත්තානි

1905–1934. යාවතා භික්ඛවෙ, සත්තා අපද වා -පෙ- බහුලී-කරොතීති.

(යථා වුත්තනයෙන විත්ථාරෙතබ්බා තිංසති සුත්තන්තා වෙදිතබ්බා.)

**පුත්ත අප්පමාදවග්ගො චුද්දසමො.**

**තත්‍රුද්දානං:**

තථාගතං පදං කූටං මූලං සාරඤ්ච වස්සිකං,
රාජා චන්දිමසූරියා ච වත්ථෙන දසමං පදන්ති.

# 15. පුත්තබලකරණීයවග්ගො

## 4. 15. 1–36

### බලාදි සුත්තානි

1935–1970. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා -පෙ- බහුලීකරොතීති.

(වුත්තනයෙනෙව විත්ථාරෙතබ්බා ඡත්තිංසති සුත්තන්තා වෙදිතබ්බා.)

**පුත්තබලකරණීයවග්ගො පණ්ණරසමො.**

**තත්‍රුද්දානං:**

බලං බීජඤ්ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකිනං,
ආකාසෙන ච ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදීති.

# 16. පුත්තඑසනාවග්ගො

## 4. 16. 1–120

### එසනාදි සුත්තානි

1971–2090. තිස්සො ඉමා භික්ඛවෙ එසනා -පෙ- භාවෙ-තබ්බානි.

(පුබ්බෙ වුත්තනයෙන ච අභිඤ්ඤාදිවසෙන ච විත්ථාරෙතබ්බා වීසතිසතං සුත්තන්තා වෙදිතබ්බා.)

**පුත්තඑසනාවග්ගො සොළසමො.**

**තත්‍රුද්දානං:**

එසනා විධා ආසවො භවො දුක්ඛතා ච තිස්සො,
ඛීලං මලඤ්ච නීඝො ච වෙදනා තණ්හාහි චාති

# 14. පුනඅප්පමාදවර්ගය

## 4. 14. 1–30

### තථාගතාදි සූත්‍ර

1905–1934. මහණෙනි, අපා වූ හෝ ... යම්තාක් සත්වයෝ වෙද්ද ... බහුල කෙරේ යි.

කියන ලද නය අනුව විතර කටයුතු. තිස් සූත්‍රාන්ත කෙනෙක් දතයුතුවහ.)

### තුදුස්වැනි පුනඅප්පමාදවග්ග යි.

**එහි සූත්‍රනාමාවලි ය:**

තථාගත, පද, කූට, මූල, සාර, වස්සික. රාජ, චන්‍දිම, සූරිය, වත්‍ථ යී සූත්‍ර ත්‍රික දශයෙකි. මුළුල්ල තිසෙකි යි.

# 15. පුනබලකරණීයවර්ගය

## 4. 15. 1–36

### බලාදි සූත්‍ර

1935–1970. මහණෙනි, යම් කිසි බලකරණීය කර්මාන්තයෝ ... බහුල කෙරේ යි.

(කී නයින් ම විතර කරන්නහු විසින් සතිස් සූත්‍රාන්ත කෙනෙක් දතයුත්තාහ.)

### පසළොස්වැනි පුනබලකරණීයවග්ග යි.

**එහි සූත්‍රනාමාවලි ය:**

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාස යී ත්‍රික සතෙක් ද මෙඝසූත්‍ර ත්‍රික දෙකෙක් ද නාවා ආගන්තුක නදී යී ත්‍රික තුනෙක් ද යී ත්‍රික දොළසෙකි. සූත්‍ර සතිසෙකි යි.

# 16. පුනඑසනාවර්ගය

## 4. 16. 1–120

### එසනාදි සූත්‍ර

1971–2090. මහණෙනි, මේ එසනා තුනෙකි. ... වැඩියයුතු යි.

(පෙර කී නයින් ද අභිඥාවශයෙන් ද විතර කරන්නහු විසින් එක්සියවිසි සූත්‍රාන්ත කෙනෙක් දතයුත්තාහ.)

### සොළොස්වැනි පුනඑසනාවග්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

එසනා විධා ආසව භව දුක්ඛතා ඛිල මල නීඝ වෙදනා තණ්හා යී සූත්‍ර ද්වාදශක දශයෙකි මුළුල්ල එක්සිය විස්සෙකි යි.

# 17. පුනඔඝවග්ගො

## 4. 17. 1-119

## ඔඝාදි සුත්තානි

2091-2209. චත්තාරො'මෙ භික්ඛවෙ, ඔඝා -පෙ- භාවෙතබ්බානීති.

## 4. 17. 120

## උද්ධම්භාගියසුත්තං

2210. පඤ්චිමානි භික්ඛවෙ, උද්ධම්භාගියානි සංයොජනානි කතමානි පඤ්ච: රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි, ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය පඤ්චින්ද්‍රියානි භාවෙතබ්බානි. කතමානි පඤ්ච: ඉධ භික්ඛවෙ, භික්ඛු සද්ධින්ද්‍රියං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවෙති නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය ඉමානි පඤ්චින්ද්‍රියානි භාවෙතබ්බානීති.

(එත්ථ ච වුත්තනයෙන අභිඤ්ඤාදි වසෙන ච විත්ථාරෙන්තෙන වීසංසතං සුත්තන්තා වෙදිතබ්බා.)

## පුනඔඝවග්ගො සත්තරසමො.

තස්සුද්දානං :

ඔඝො යොගො උපාදානං ගන්ථා අනුසයෙන ච,
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධම්භාගියානි.

## ඉන්ද්‍රියසංයුත්තං සමත්තං.

තත්‍රවග්ගුද්දානං:

සුද්ධකමුදුතර ඡළින්ද්‍රියා සුඛින්ද්‍රියා ජරාවග්ගෙහි පඤ්ච
සූකරඛත සම්බොධයොගඞ්ගාප්පමාදබලකරණීයෙසනොඝා
පුනගඞ්ගාපෙය්‍යාල ආදීහිපි පඤ්චහි වග්ගා සත්තරස හොන්තීති.

# 17. පුනඔඝවර්ගය

## 4. 17. 1–119

## ඔඝාදි සූත්‍ර

2091–2209. **මහණෙනි,** මේ ඔඝ සතරෙකි ... වැඩියයුත්තාහ යි.

## 4. 17. 120

## උද්ධම්භාගිය සූත්‍රය

2210. මහණෙනි, මේ උද්ධම්භාගියසංයෝජන පසෙකි. කවර පසෙක් ද යත්: "රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා" යි. මහණෙනි, මොහු පස් උද්ධම්භාගිය සංයෝජනයෝ යි. මහණෙනි, මේ පස් උද්ධම්භාගියසංයෝජනයන් ප්‍රහීණ කිරීම පිණිස පසිඳුරෝ වැඩියයුත්තාහ. කවර පසිඳුරෝ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නිවනට නැමුණක් නිවනට නැඹුරු වූවක් නිවනට බර වූවක් කොට සද්ධින්ද්‍රිය වඩයි ... නිවනට නැමුණක් නිවනට නැඹුරු වූවක් නිවනට බර වූවක් කොට පඤ්ඤින්ද්‍රිය වඩයි. මහණෙනි, මේ පස් උද්ධම්භාගියසංයෝජනයන් ප්‍රහීණ කිරීම පිණිස මේ පසිඳුරෝ වැඩියයුත්තාහ යි.

(මෙහි දූ කී නයින් ද අභිඤ්ඤාවශයෙන් ද විතර කරන්නවුන් විසින් එක්සියවිසි සූත්‍රාන්ත කෙනෙක් දතයුත්තාහ.)

## සතළොස්වැනි පුනඔඝවග්ග යි.

**එහි සූත්‍රනාමාවලි ය:**

ඔඝ, යෝග, උපාදාන, ගන්ථ, අනුසය, කාමගුණ නීවරණ, ඛන්ධ, ඔරම්භාගිය, උද්ධම්භාගිය යි සූත්‍ර ද්වාදශක දශයෙකි. මුළුල්ල එක්සිය විස්සෙකි යි.

## ඉන්ද්‍රියසංයුත්තය නිමි.

**එහි වර්ගනාමාවලි ය:**

සුද්ධක, මුදුතර, ඡළින්ද්‍රිය වර්ගයෝ සුඛින්ද්‍රිය ජරාවර්ග දෙක සමග පසෙක් වේ. (නැවත) සූකරඛාත, සම්බොධි, ගඞ්ගාපෙය්‍යාල, අප්පමාද, බලකරණීය, එසනා, ඔඝවර්ගයෝ වෙති. ඔහු පුනගඞ්ගාපෙය්‍යාල ආදි පසන් සමග (ඉන්ද්‍රියසංයුත්තයෙහි) වර්ග සතළොසෙක් වේ යි.

# 5. සම්මප්පධාන සංයුත්තං

## 1. ගඞ්ගාපෙය්‍යාලො

### 5. 1. 1

### පාචීනනින්නසුත්තං

2211. සාවත්ථියං:

චත්තාරො'මෙ භික්ඛවෙ, සම්මප්පධානා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො සම්මප්පධානාති.

සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු චත්තාරො සම්මප්පධානෙ භාවෙන්තො චත්තාරො සම්මප්පධානෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු චත්තාරො සම්මප්පධානෙ භාවෙන්තො චත්තාරො සම්මප්පධානෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු චත්තාරො සම්මප්පධානෙ භාවෙන්තො චත්තාරො සම්මප්පධානෙ බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති.

# 5. සම්මප්පධාන සංයුත්තය

## 1. ගඞ්ගාපෙය්‍යාලය

### 5. 1. 1

### පාචීනනින්න සූත්‍රය

2211. සැවැත්නුවර:

මහණෙනි, මේ සම්මප්පධාන සතරෙකි. සතර සතරෙක් ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නූපන් ලාමක අකුසල් දහම් නූපදනා පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනී. ප්‍රධන් වීය්‍ර්‍යය කෙරෙයි. උපන් ලාමක අකුසල දහම් ප්‍රහීණ කිරීම පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන් වීය්‍ර්‍ය කෙරෙයි. නූපන් කුසල් දහම් ඉපදවීම පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන් වීය්‍ර්‍ය කෙරෙයි. උපන් කුසල්දහමුන්ගේ පැවැත්ම පිණිස නුමුළාබව පිණිස බොහෝ බව පිණිස විපුලබව පිණිස වැඩීම පිණිස පිරීම පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන් වීය්‍ර්‍ය කෙරෙයි. මහණෙනි, මොහු සතර සම්මප්පධානයෝ යි.

මහණෙනි, යම්සේ ගඞ්ගානදී තොමෝ පෙරදිගට නැමුණී පෙරදිගට නැඹුරු වූවා පෙරදිගට බරවූවා වේ ද, මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ සිවුසම්පදහන් වඩනුයේ සිවුසම්පදහන් බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ සිවුසම්පදහන් වඩනුයේ සිවුසම්පදහන් බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නූපන් ලාමක අකුසල් දහම් නූපදනා පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන් වීය්‍ර්‍යය කෙරෙයි. උපන් ලාමක අකුසල් දහම් ප්‍රහාණය පිණිස සඳ දනවයි, වෑයම් කෙරෙයි, වැර අරඹයි, සිත දැඩි කොට ගනියි, ප්‍රධන් වීය්‍ර්‍යය කෙරෙයි. නූපන් කුසල් දහම් උපදනා පිණිස සඳ දනවයි, වෑයම් කෙරෙයි, වැර අරඹයි, සිත දැඩි කොට ගනියි, ප්‍රධන් වීය්‍ර්‍යය කෙරෙයි. උපන් කුසල් දහමුන්ගේ පැවැත්ම නුමුළා බව බොහෝ බව විපුල බව වැඩීම පිරීම පිණිස සඳ දනවයි, වෑයම් කෙරෙයි, වැර අරඹයි, සිත දැඩි කොට ගනියි, ප්‍රධන් වීය්‍ර්‍යය කෙරෙයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ සිවුසම්පදහන් වඩනුයේ සිවුසම්පදහන් බහුල කරනුයේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යි.

## 5. 1. 2-48

## දුතියපාචීනනින්නාදි සුත්තානි

2212-2258. චත්තාරොමෙ භික්ඛවෙ, සම්මප්පධානා, කතමෙ චත්තාරො -පෙ- නිබ්බානපබ්භාරොති.

(මුත්තන්තයෙන විත්ථාරෙතබ්බා.)

**ගඞ්ගාපෙය්‍යාලො පඨමො.**

තත්‍රුද්දානං:

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො,
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

## 2. අප්පමාදවග්ගො

## 5. 2. 1-40

## තථාගතාදි සුත්තානි

2259-2298. යාවතා භික්ඛවෙ, සත්තා අපද වා දිපද වා චතුප්පද වා බහුප්පද වා -පෙ- බහුලීකරොතීති.

(යථාවුත්තන්තයෙන විත්ථාරෙතබ්බා.)

**අප්පමාදවග්ගො දුතියො.**

තත්‍රුද්දානං:

තථාගතං පදං කූටං මූලං සාරෙන වස්සිකං,
රාජා චන්දිමසුරියා ච වත්ථෙන දසමං පදන්ති.

## 5. 1. 2–48

### දුතිය පාචීනනින්නාදි සූත්‍ර

2212–2258. මහණෙනි, මේ සම්පදහන් සතරෙකි. කවර සතරෙක් ද යත්: ... නිවනට බර වූයේ වේ යි.

(කී නයින් විතර කටයුතු.)

### පළමුවැනි ගඞ්ගාපෙයාාල යි.

**එහි සූත්‍රනාමාවලි ය:**

පාචීනනින්නසූත්‍ර චතුෂ්ක සයෙකි. සමුද්දනින්න චතුෂ්ක ද සයෙකි. මේ ෂට්ක දෙක චතුෂ්ක දෙළොසෙක් වේ. එයින් වර්ග යි කියනු ලැබේ. සූත්‍ර මුළුල්ල අටසාලිසෙකි යි.

## 2. අප්පමාදවර්ගය

## 5. 2. 1–40

### තථාගතාදි සූත්‍ර

2259–2298. මහණෙනි, අපා වූ ද දෙපා වූ ද සිවුපා වූ ද බුහුපා වූ ද යම්තාක් සත්ත්වයෝ වෙද්ද ... බහුල කෙරේ යි.

(කියන ලද නයින් විතර කටයුතු.)

### දෙවෙනි අප්පමාදවර්ග යි.

**එහි සූත්‍රනාමාවලි ය:**

තථාගත, පද, කූට, මූල, සාර, වස්සික, රාජ, චන්දිම, සූරිය, වත්‍ථ යි සූත්‍ර චතුෂ්ක දශයෙකි. මුළුල්ල සාලිසෙකි යි.

# 3. බලකරණීයවග්ගො

## 5. 3. 1-48

## බලාදි සුත්තානි

2299-2346. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කයිරන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය එවමෙතෙ බලකරණීයා කම්මන්තා කයිරන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය චත්තාරො සම්මප්පධානෙ භාවෙති, චත්තාරො සම්මප්පධානෙ බහුලීකරොති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය චත්තාරො සම්මප්පධානෙ භාවෙති, චත්තාරො සම්මප්පධානෙ බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය -පෙ- අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදය -පෙ- උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා. ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය චත්තාරො සම්මප්පධානෙ භාවෙති, චත්තාරො සම්මප්පධානෙ බහුලීකරොතීති -පෙ- බහුලීකරොතීති.

(එවං අට්ඨතාලීස සුත්තන්තා විත්ථාරෙතබ්බා.)

**බලකරණීයවග්ගො තතියො.**

**තස්සුද්දානං:**

බලං බීජඤ්ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකිතං,
ආකාසෙන ච ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදීති.

# 4. එසනාවග්ගො

## 5. 4. 1 - 160

## එසනාදි සුත්තානි

2347 - 2506. තිස්සො ඉමා භික්ඛවෙ, එසනා. කතමා තිස්සො: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා. ඉමා ඛො භික්ඛවෙ, තිස්සො එසනා. ඉමාසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං අභිඤ්ඤාය චත්තාරො සම්මප්පධානා භාවෙතබ්බා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු අනුප්පන්නානං-පෙ-උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉමෙසං ඛො භික්ඛවෙ, තිස්සන්නං එසනානං අභිඤ්ඤාය ඉමෙ චත්තාරො සම්මප්පධානා භාවෙතබ්බාති -පෙ- භාවෙතබ්බාති.

# 3. බලකරණීයවර්ගය

## 5. 3. 1-48

## බලාදි සූත්‍ර

2299-2346. මහණෙනි, යම්සේ යම් කිසි බලකරණීය කර්මාන්තයෝ කරනු ලැබෙත් ද, ඒ සියල්ලෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා මෙසේ මේ බලකරණීය කර්මාන්තයෝ කරනු ලැබෙත්. මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා සිවුසම්පදහන් වඩයි. සිවුසම්පදහන් බහුල කෙරෙයි. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා සිවුසම්පදහන් වඩා ද, සිවුසම්පදහන් බහුල කෙරේ ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නූපන් ලාමක අකුසල්දහම් නූපදනා පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන්වීය්‍යීය කෙරෙයි. උපන් ලාමක අකුසල් දහම් පහකරනු පිණිස ... නූපන් කුසල්දහම් ඉපදවීම පිණිස .. උපන් කුසල්දහමුන්ගේ පැවැත්ම නුමුළා බව බොහෝ බව විපුල බව වැඩීම පිරීම පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන්වීය්‍යීය කෙරෙයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ ශීලය නිසා ශීලයෙහි පිහිටා සිවුසම්පදහන් වඩයි. සිවුසම්පදහන් බහුල කෙරේ යි ... බහුල කෙරේ යි.

(මෙසේ අටසාලිස් සූත්‍රාන්තයෝ විතර කටයුත්තාහ.)

**තෙවෙනි බලකරණීයවර්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාස යි සූත්‍ර චතුෂ්ක සතෙකි. මෙස චතුෂ්ක දෙකෙකි. නාවා, ආගන්තුක, නදී යි චතුෂ්ක තුනෙකි යි මෙසේ චතුෂ්ක දොළොසෙකි. සූත්‍ර මුළුල්ල අටසාලිසෙකි යි.

# 4. ඒසනාවර්ගය

## 5. 4. 1-160

## එසනාදි සූත්‍ර

2347-2506. මහණෙනි, මේ එසනා තුනෙකි. කවර තුනෙක් ද යත්: කාමෙසනා භවෙසනා බ්‍රහ්මචරියෙසනා යි. මහණෙනි, මේ තුන් එසනා යි. මහණෙනි, මේ තුන් ඒසනාවන් වෙසෙසින් දැනුම පිණිස සිවුසම්පදහන් වැඩියයුතු. කවර සිවුසම්පදහන්හු ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නූපන් ... උපන් කුසල්දහමුන්ගේ පැවැත්ම නුමුළා බව බොහෝ බව විපුල බව වැඩීම පිරීම පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන්වීය්‍යීය කෙරෙයි. මහණෙනි, මේ තුන් ඒසනාවන් වෙසෙසින් දැනුම පිණිස මේ සිවුසම්පදහන් වැඩිය යුතු යි ... වැඩියයුතු යි.

(එවං අභිඤ්ඤාය පරිඤ්ඤාය පරික්ඛයාය පහානාය’ති ච එකෙකස්මිං සොළස සොළස කත්වා එකසතසට්ඨි සුත්තන්තා විත්ථාරෙතබ්බා.)

එසනාවග්ගො චතුත්ථො.

තත්‍රුද්දානං:

එසනා විධා ආසවො භවො දුක්ඛතා ච තිස්සො
ඛීලං මලඤ්ච නීඝො ච වෙදනා තණ්හාහි චාති.

## 5. ඔඝවග්ගො

## 5. 5. 1 – 159

## ඔඝාදිසුත්තානි

2507 – 2665. චත්තාරොමෙ භික්ඛවෙ. ඔඝා–පෙ–භාවෙතබ්බාති. (විත්ථාරෙතබ්බා)

## 5. 5. 160

## උද්ධම්භාගියසුත්තං

2666. පඤ්චිමානි, භික්ඛවෙ, උද්ධම්භාගියානි සංයොජනානි. කතමානි පඤ්ච: රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය චත්තාරො සම්මප්පධානා භාවෙතබ්බා. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භීය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය ඉමෙ චත්තාරො සම්මප්පධානා භාවෙතබ්බාති.

(වුත්තනයෙනෙව එකසතසට්ඨිසුත්තන්තා විත්ථාරෙතබ්බා)

ඔඝවග්ගො පඤ්චමො.

තත්‍රුද්දානං:

ඔඝො යොගො උපාදානං ගන්ථා අනුසයෙන ච
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධම්භාගියාති.

සම්මප්පධානසංයුත්තං සමත්තං.

තත්‍ර වග්ගුද්දානං:

ගඞ්ගාපෙය්‍යාලොප්පමාදෙ බලකරණීයෙසනා
ඔඝොති පඤ්චවග්ගා සම්මප්පධානසංයුත්තෙති.

(මෙසේ අභිඤ්ඤාය පරිඤ්ඤාය පරික්ඛයාය පහාණාය යි ද එකෙක සොළොස සොළොස කොට එක්සිය සැට සූත්‍රාන්ත කෙනෙක් විස්තර කටයුතුවහ.)

## සිවුවැනි එසනාවර්ග යි.

එහි සූත්‍රනාමාවලි ය:

එසනා, විධා, ආසව, භව, දුක්ඛතා, ඛීල, මල, නීඝ, වෙදනා, තණ්හා යි සූත්‍ර ෂොඩශක දශයෙකි. මුළුල්ල එක්සිය සැටෙකි යි.

# 5. ඕඝවර්ගය

## 5. 5. 1–159

## ඕඝාදි සූත්‍ර

2507–2665. මහණෙනි, මේ ඕඝ සතරෙකි ... වැඩිය යුත්තාහ යි. (විස්තර කටයුතු.)

## 5. 5. 160

## උද්ධම්භාගිය සූත්‍රය

2666. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයොජන පසෙකි. කවර පසෙක් ද යත්: රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යි. මහණෙනි, මොහු පස් උද්ධම්භාගිය සංයොජනයෝ යි. මහණෙනි, මේ පස් උද්ධම්භාගිය සංයොජනයන් පහකරනු පිණිස සිවුසම්පදහන් වැඩියයුතු. කවර සිවුසම්පදහන්හු ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ නූපන් ලාමක අකුසල් දහම් නූපදනා පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. උපන් අකුසල්දහම් පහකරනු පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. නූපන් කුසල්දහම් ඉපදවීම පිණිස සඳ දනවයි. වෑයම් කෙරෙයි. වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. උපන් කුසල්දහමුන්ගේ පැවැත්ම නුමුළා බව බොහෝ බව විපුල බව වැඩීම පිරීම පිණිස සඳ දනවයි, වෑයම් කෙරෙයි, වැර අරඹයි. සිත දැඩි කොට ගනියි. ප්‍රධන්වීර්‍ය්‍ය කෙරෙයි. මහණෙනි, මේ පස් උද්ධම්භාගිය සංයොජනයන් ප්‍රහාණය පිණිස මේ සිවුසම්පදහන්හු වැඩියයුත්තාහ යි.

(කියන ලද නයින් ම එක්සියසැට සූත්‍රාන්තයෝ විස්තර කටයුතුවහ.)

## පස්වැනි ඕඝවර්ග යි.

එහි සූත්‍රනාමාවලි ය:

ඕඝ, යොග, උපාදාන, ගන්ථ, අනුසය, කාමගුණ, නීවරණ, ඛන්ධ, ඕරම්භාගිය, උද්ධම්භාගිය, යි ෂොඩශක දශයෙකි. සූත්‍ර මුළුල්ල එක්සිය සැටෙකි යි.

# සම්මප්පධානසංයුත්තය නිමි.

එහි වර්ගනාමාවලි ය:

ගඞ්ගාපෙය්‍යාල, අප්පමාද, බලකරණීය, එසනා, ඕඝ යි සම්මප්පධාන සංයුත්තයෙහි වර්ග පසෙක් ම වේ යි.

# 6. බලසංයුත්තං

## 1. ගඞ්ගාපෙය්‍යාලවග්ගො

### 6. 1. 1 – 12

### පාචීනනින්නාදි සුත්තානි

2667 – 2678. සාවත්ථියං:

පඤ්චිමානි භික්ඛවෙ, බලානි, කතමානි පඤ්ච: සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්ච බලානි. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී පාචීනනින්නා පාචීනපොණා පාචීනපබ්භාරා එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු පඤ්ච බලානි භාවෙන්තො පඤ්ච බලානි බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු පඤ්ච බලානි භාවෙන්තො පඤ්ච බලානි බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු සද්ධාබලං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. විරියබලං –පෙ– සතිබලං –පෙ– සමාධිබලං –පෙ– පඤ්ඤාබලං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු පඤ්ච බලානි භාවෙන්තො පඤ්ච බලානි බහුලීකරොන්තො නිබ්බානනින්නො හොති නිබ්බානපොණො නිබ්බානපබ්භාරොති –පෙ– නිබ්බානපබ්භාරොති.

ගඞ්ගාපෙය්‍යාලවග්ගො පඨමො.

තත්‍රුද්දානං:

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

## 2. අප්පමාදවග්ගො

### 6. 2. 1 – 10

### තථාගතාදි සුත්තානි

2679 – 2688. යාවතා භික්ඛවෙ සත්තා අපද වා දිපද වා –පෙ– බහුලීකරොතීති.

(විවෙකනිස්සිතාදිවසෙන විත්ථාරෙතබ්බානි.)

අප්පමාදවග්ගො දුතියො.

තත්‍රුද්දානං:

තථාගතං පදං කූටං මූලං සාරෙන වස්සිකං,
රාජා චන්දිම සුරියා ච වත්ථෙන දසමං පදන්ති.

# 6. බලසංයුත්තය

## 1. ගඞ්ගාපෙය්‍යාලවර්ගය

### 6. 1. 1–12

### පාචීනනින්නාදි සූත්‍ර

2667–2678. සැවැත්නුවර

මහණෙනි, මේ බල පසෙකි. කවර පසෙක් ද යත්: සද්ධාබල විරියබල සතිබල සමාධිබල පඤ්ඤාබල යි. මහණෙනි, මේ බල පස යි. මහණෙනි, යම්සේ ගඞ්ගානදී නොමෝ පැදුම්දිගට නැමුණී පැදුම්දිගට නැඹුරු වූවා පැදුම්දිගට බර වූවා වේ ද මහණෙනි, එසෙයින් ම මහණ තෙමේ පස්බල වඩන්නේ පස්බල බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වෙයි. මහණෙනි, කෙසේ නම් මහණ තෙමේ පස්බල වඩන්නේ පස්බල බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ ද යත්: මහණෙනි, මේසස්නෙහි මහණ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී කොට සද්ධාබලය වඩයි. විරියබලය ... සතිබලය ... සමාධිබලය ...විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී කොට පඤ්ඤාබලය වඩයි. මහණෙනි, මෙසේ මහණ තෙමේ පස්බල වඩන්නේ පස්බල බහුල කරන්නේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට බර වූයේ වේ යි ... නිවනට බර වූයේ වේ යි.

### පළමුවැනි ගඞ්ගාපෙය්‍යාලවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

පාචීනනින්න සූත්‍ර සයෙකි. සමුද්දනින්න සූත්‍ර ද සයෙකි. මේ ෂට්ක දෙක දෙළොසෙක් වේ. එයින් වර්ග යි කියනු ලැබේ යි.

## 2. අප්පමාදවර්ගය

### 6. 2. 1–10

### තථාගතාදි සූත්‍ර

2679–2688. මහණෙනි, අපා වූ ද දෙපා වූ ද ... යම්තාක් සත්ත්වයෝ වෙද්ද ... බහුල කෙරේ යි.

(විවෙකනිඃසිතාදි විසින් විතර කටයුත්තාහ.)

### දෙවෙනි අප්පමාදවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

තථාගත, පද, කූට, මූල, සාර, වස්සික, රාජ, චන්දිම, සූරිය, වත්ථ යි දශ සූත්‍රාන්ත කෙනෙකි යි.

## 3. බලකරණීයවග්ගො

### 6. 3. 1 – 12

### බලාදිසුත්තානි

2689 – 2700. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා–පෙ–බහුලීකරොතීති.

(වුත්තනයෙන විත්ථාරෙතබ්බානි.)

බලකරණීයවග්ගො තතියො.

තස්සුද්දානං:

බලං බීජඤ්ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකිනං
ආකාසෙන ච ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදීති.

## 4. එසනාවග්ගො

### 6. 4. 1 – 40

### එසනාදි සුත්තානි

2701 – 2740. තිස්සො ඉමා භික්ඛවෙ, එසනා. කතමා තිස්සො: –පෙ–භාවෙතබ්බානීති.

(විත්ථාරෙතබ්බානි.)

එසනාවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

එසනා විධා ආසවො භවො දුක්ඛතා ච තිස්සො
ඛිලං මලඤ්ච නීඝො ච වෙදනා තණ්හාහි චාති.

## 5. ඔඝවග්ගො

### 6. 5. 1 – 39

### ඔඝාදි සුත්තානි

2741 – 2779 චත්තාරොමෙ භික්ඛවෙ, ඔඝා. කතමෙ චත්තාරො: –පෙ–භාවෙතබ්බානීති.

## 3. බලකරණීයවර්ගය

### 6. 3. 1-12

### බලාදි සූත්‍ර

2689-2700. මහණෙනි, යම්සේ යම්කිසි බලකරණීය කර්මාන්තයෝ ... බහුල කෙරේ යි.

(කී නයින් විස්තර කටයුතුවහ.)

### තෙවෙනි බලකරණීයවර්ග යි.

එහි සූත්‍රනාමාවලිය:

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාශ යී සතෙකි. මෙඝ සූත්‍ර දෙකෙකි. නාවා, ආගන්තුක, නදී යි තුනෙකි. දෙළොස් සූත්‍රයෙකි යි.

## 4. එසනාවර්ගය

### 6. 4. 1-40

### එසනාදි සූත්‍ර

2701-2740. මහණෙනි, මේ එසනා තුනෙකි. කවර තුනෙක් ද යත්: ... වැඩිය යුත්තාහ යි.

(විස්තර කටයුත්තාහ.)

### සිවුවැනි එසනාවර්ග යි.

එහි සූත්‍රනාමාවලිය:

එසනා, විධා, ආසව, භව, දුක්ඛතා, ඛීල, මල, නීඝ, වෙදනා, තණ්හා යි චතුෂ්ක දශයෙකි. සූත්‍ර සාලිසෙකි යි.

## 5. ඔඝවර්ගය

### 6. 5. 1-39

### ඔඝාදි සූත්‍ර

2741-2779. මහණෙනි, මේ ඔඝ සතරෙකි. කවර සතරෙක් ද යත්: ... වැඩියයුත්තාහ යි.

## 6. 5. 40

## උද්ධම්භාගියසුත්තං

2780. පඤ්චිමානි භික්ඛවෙ, උද්ධම්භාගියානි සංයොජනානි. කතමානි පඤ්ච: රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං අභිඤ්ඤාය පඤ්ච බලානි භාවෙතබ්බානි. කතමානි පඤ්ච: ඉධ භික්ඛවෙ, භික්ඛු සද්ධාබලං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. විරියබලං -පෙ- සතිබලං -පෙ- සමාධිබලං -පෙ- පඤ්ඤාබලං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං අභිඤ්ඤාය ඉමානි පඤ්ච බලානි භාවෙතබ්බානීති.

### ඔඝවග්ගො පඤ්චමො.

තත්‍රුද්දානං:

ඔඝො යොගො උපාදානං ගන්ථා අනුසයෙන ච,
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධම්භාගියානි.

## 6. ගඞ්ගාපෙය්‍යාලො

## 6. 6. 1 – 36

## පාචීනනින්නාදි සුත්තානි

2781 – 2816. සෙය්‍යථාපි භික්ඛවෙ, ගඞ්ගා නදී පාචීනනින්නා -පෙ- නිබ්බානපබ්භාරොති.

(රාගවිනයපරියොසානාදිවසෙන අමතොගධාදිවසෙන නිබ්බානනින්නාදිවසෙන චාති එකෙකස්මිං තයො තයො කත්වා ඡත්තිංස සුත්තන්තා විත්ථාරෙතබ්බා.)

### ගඞ්ගාපෙය්‍යාලි.

තත්‍රුද්දානං:

ඡ පාචීනතො නින්නා ඡ ච නින්නා සමුද්දතො,
එතෙ ද්වෙ ද්වාදස හොන්ති වග්ගො තෙන පවුච්චතීති.

## 6. 5. 40

## උද්ධම්භාගිය සූත්‍රය

2780. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයොජන පසෙකි. කවර පසෙක් ද යත්: රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යි. මහණෙනි, මොහු පස් උද්ධම්භාගිය සංයෝජනයෝ යි. මහණෙනි, මේ පස් උද්ධම්භාගිය සංයොජනයන් වෙසෙයින් දැනුම පිණිස පස්බල වැඩියයුතු. කවර පසෙක් ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී කොට සද්ධාබලය වඩයි. විරියබලය ... සතිබලය ... සමාධිබලය ... විවෙකනිඃසිත විරාගනිඃසිත නිරොධනිඃසිත වොස්සග්ගපරිණාමී කොට පඤ්ඤාබලය වඩයි. මහණෙනි, මේ පස් උද්ධම්භාගිය සංයෝජනයන් වෙසෙයින් දැනුම පිණිස මේ පස්බල වැඩියයුතු යි.

### පස්වැනි ඔඝවර්ග යි.

එහි සූත්‍රනාමාවලිය:

ඔඝ, යොග, උපාදාන, ගන්ථ, අනුසය, කාමගුණ, නීවරණ, ඛන්ධ, ඔරම්භාගිය, උද්ධම්භාගිය යි චතුෂ්ක දශයෙකි. සාලිස් සූතුරෙකි යි.

# 6. පුනගඞ්ගාපෙය්‍යාලය

## 6. 6. 1–36

## පාචීනනින්නාදි සූත්‍ර

2781–2816. මහණෙනි, යම්සේ ගඞ්ගානදී තොමෝ පෙරදිගට නැමුණි ... නිවනට බර වූයේ වේ යි.

(රාගවිනයපරියොසානාදි විසිනුදු අමතොගධාදි විසිනුදු නිබ්බාන නින්නාදි විසිනුදු එකෙක තුනක් තුනක් කොට සතිස් සූත්‍රාන්ත කෙනෙනක් විතර කටයුත්තාහ.

### සවැනි පුන ගඞ්ගාපෙය්‍යාලවර්ග යි.

එහි සූත්‍රනාමාවලිය:

පාචීනනින්න සූත්‍ර ත්‍රික සයෙකි. සමුද්දනින්න ත්‍රික ද සයෙකි. මේ ෂට්ක දෙක ත්‍රික දොළොසෙක් වේ. එයින් වර්ග යි කියනු ලැබේ. මුළුල්ල සතිස් සූතුරෙකි යි.

## 7. පුනඅප්පමාදවග්ගො

### 6. 7. 1 – 30

### තථාගතාදි සුත්තානි

2817 – 2846. යාවතා භික්ඛවෙ, සත්තා අපදා වා –පෙ– බහුලීකරොතීති.

(වුත්තනයෙන තිංස සුත්තන්තා විත්ථාරෙතබ්බා)

**පුනඅප්පමාදවග්ගො සත්තමො.**

**තස්සුද්දානං:**

තථාගතං පදං කූටං මූලං සාරෙන වස්සිකං,
රාජා චන්දිමසූරියා ච වත්ථෙන දසමං පදන්ති.

## 8. පුනබලකරණීයවග්ගො

### 6. 8. 1 – 36

### බලාදි සුත්තානි

2847 – 2882. සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා –පෙ– බහුලීකරොතී ති.

(ඡත්තිංස සුත්තන්තා විත්ථාරෙතබ්බා)

**පුනබලකරණීයවග්ගො අට්ඨමො.**

**තස්සුද්දානං:**

බලං බීජඤ්ච නාගො ච රුක්ඛං කුම්භෙන සූකිතං,
ආකාසෙන ච ද්වෙ මෙඝා නාවා ආගන්තුකා නදීති.

## 9. පුනඑසනාවග්ගො

### 6. 9. 1 – 120

### එසනාදි සුත්තානි

2883 – 3002. තිස්සො ඉමා භික්ඛවෙ, එසනා. කතමා තිස්සො: –පෙ– භාවෙතබ්බානීති.

(විවෙකනිස්සිතාදිවසෙන අභිඤ්ඤාදිවසෙන ච එකෙකස්මිං ද්වාදස ද්වාදස කත්වා වීසංසත සුත්තන්තා විත්ථාරෙතබ්බා.

**එසනාවග්ගො නවමො.**

**තස්සුද්දානං:**

එසනා විධා ආසවො භවො දුක්ඛතා ච තිස්සො,
ඛිලං මලඤ්ච නීඝො ච වෙදනා තණ්හාභි චාති.

# 7. පුනඅප්පමාදවර්ගය

## 6. 7. 1-30

## තථාගතාදි සූත්‍ර

2817-2846. මහණෙනි, අපා වූ ද ... යම්තාක් සත්ත්වයෝ වෙත් ද, ... බහුල කෙරේ යි.

(කී නයින් තිස් සූතුරෙක් විතර කටයුතු.)

**සත්වැනි පුනඅප්පමාදවග්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

තථාගත, පද, කූට, මූල, සාර, වස්සික, රාජ, චන්දිම, සූරිය, වත්ථ යි ත්‍රික දශයෙකි. සූතුරු තිසෙකි.

# 8. පුනබලකරණීය වර්ගය

## 6. 8. 1-36

## බලාදි සූත්‍ර

2847-2882. මහණෙනි, යම්සේ යම් කිසි බලකරණීය කර්මාන්තයෝ ... බහුල කෙරේ යි.

(සතිස් සූතුරු කෙනෙක් විතර කටයුත්තාහ.)

**අටවැනි පුනබලකරණීයවග්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

බල, බීජ, නාග, රුක්ඛ, කුම්භ, සූක, ආකාස යි ත්‍රික සතෙක් ද මෙස ත්‍රික දෙකෙක් ද නාවා ආගන්තුක නදී යි ත්‍රික තුනෙක් ද යි ත්‍රික දොළොසෙකි. සතිස් සූතුරෙකි යි.

# 9. පුනඑසනාවර්ගය

## 6. 9. 1-120

## එසනාදි සූත්‍ර

2883-3002. මහණෙනි, මේ එසනා තුනෙකි. කවර තුනෙක් ද යත්: ... වැඩිය යුතුවහ යි.

(විවෙකනිස්සිතාදි විසිනුදු අභිඤ්ඤාදි විසිනුදු එකෙක දොළසක් දොළසක් කොට එක්සියවිසි සූතුරු කෙනෙක් විතර කටයුත්තාහ.)

**නවවැනි එසනාවග්ග යි.**

**එහි සූත්‍රනාමාවලිය:**

එසනා, විධා, ආසව, භව, දුක්ඛතා, ඛිල, මල, නීඝ, වෙදනා, තණ්හා යි ද්වාදශක දශයෙකි. එක්සියවිසි සූතුරෙකි යි.

# 10. ඔඝවග්ගො

## 6. 10. 1 – 119

### ඔඝාදි සුත්තානි

3003 – 3121. චත්තාරොමෙ භික්ඛවෙ, ඔඝා. කතමෙ චත්තාරො: –පෙ–භාවෙතබ්බානීති.

(වුත්තනයෙනෙව විත්ථාරෙතබ්බානි.)

## 6. 10. 120

### උද්ධම්භාගියසුත්තං

3122. පඤ්චිමානි භික්ඛවෙ, උද්ධම්භාගියානි සංයොජනානි කතමානි පඤ්ච: රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චුද්ධම්භාගියානි සංයොජනානි. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය පඤ්චබලානි භාවෙතබ්බානි. කතමානි පඤ්ච: ඉධ භික්ඛවෙ, භික්ඛු සද්ධාබලං භාවෙති, නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. විරියබලං –පෙ– සතිබලං –පෙ– සමාධිබලං –පෙ–පඤ්ඤාබලං භාවෙති, නිබ්බානනින්නං නිබ්බානපොණං නිබ්බානපබ්භාරං. ඉමෙසං ඛො භික්ඛවෙ, පඤ්චන්නං උද්ධම්භාගියානං සංයොජනානං පහානාය ඉමානි පඤ්ච බලානි භාවෙතබ්බානීති.

ඔඝවග්ගො දසමො.

තත්‍රුද්දානං:

ඔඝො යොගො උපාදානං ගන්ථා අනුසයෙන ච,
කාමගුණා නීවරණා ඛන්ධා ඔරුද්ධම්භාගියානි.

බලසංයුත්තං සමත්තං.

තත්‍ර වග්ගුද්දානං:

ගඞ්ගාපෙය්‍යාලොප්පමාදෙ බලකරණීයෙසනා
ඔඝො හොති පුනාදීහි බලසංයුත්තකා ලසානි.

# 10. පුනඔඝවර්ගය

## 6. 10. 1-119

## ඔඝාදි සූත්‍ර

3003-3121. මහණෙනි, මේ ඔඝ සතරෙකි. කවර සතරෙක් ද යත්: ... වැඩියයුත්තාහ යි.

(කී නයින් ම විතර කටයුත්තා හ.)

## 6. 10. 120

## උද්ධම්භාගිය සූත්‍රය

3122. මහණෙනි, මේ උද්ධම්භාගිය සංයෝජන පසෙකි. කවර පසෙක් ද යත්: රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යි. මහණෙනි, මොහු පස් උද්ධම්භාගිය සංයෝජනයෝ යි. මහණෙනි, මේ පස් උද්ධම්භාගිය සංයොජනයන් පහකරනු පිණිස පස්බල වැඩිය යුතු. කවර පසෙක් ද යත්: මහණෙනි, මෙසස්හෙහි මහණ නිවනට නැමුණක් නිවනට නැඹුරු වූවක් නිවනට බර වූවක් කොට සද්ධාබලය වඩයි. විරියබලය ... සතිබලය ... සමාධිබලය ... නිවනට නැමුණක් නිවනට නැඹුරු වූවක් නිවනට බර වූවක් කොට පඤ්ඤාබලය වඩයි. මහණෙනි, මේ පස් උද්ධම්භාගිය සංයොජනයන් පහකරනු පිණිස මේ පස්බල වැඩියයුතු යි.

## දශවැනි පුනඔඝවර්ග යි.

**එහි සූත්‍රනාමාවලිය:**

ඔඝ, යොග, උපාදාන, ගන්ථ, අනුසය, කාමගුණ, නීවරණ, ඛන්ධ, ඔරම්භාගිය, උද්ධම්භාගිය යි ද්වාදශක දශයෙකි. සූත්‍ර එක්සිය විස්සෙකි යි.

## බලසංයුත්තය නිමි.

**එහි වර්ගනාමාවලිය:**

ගඞ්ගාපෙයයාල, අප්පමාද, බලකරණීය, එසනා, ඔඝ, යන මොහු පුන යන්න මුල්කොට ඇති ඒ පසම කරණ කොට ගෙන බල සංයුත්තයට අයත් වර්ග දශයෙක් වේ යි.

# ගාථාදිපාද අනුක්කමණිකා


| | පිට්ඨඞ්කා |
|---|---|
| අප්පකා තෙ මනුස්සෙසු | 40, 168 |
| අව්‍යාපාදෙ අවිහිංසා | 10 |
| එකායනං ජාතිඛයන්තදස්සී | 302, 332 |
| එතදත්තනි සම්භූතං | 10 |
| කණ්හං ධම්මං විප්පහාය | 40, 168 |
| තත්‍රාභිරතිමිච්ඡෙය්‍ය | 40, 168 |
| ධී තං ජම්මි ජරෙ අත්‍ථු | 384 |
| යස්ස සද්ධා ච පඤ්ඤා ච | 10 |
| යෙච ඛො සම්මදක්ඛාතෙ | 40, 168 |
| යෙසං සම්බොධි අඞ්ගෙසු | 40, 168 |
| යො ච වස්සසතං ජීවෙ | 384 |
| රථො සීලපරික්ඛාරො | 10 |


Free Distribution www.aathaapi.org

# සඤ්ඤානාමානුක්කමණිකා


අ — පිට්ඨංකා

අඞ්ගෙසු 396
අචිරවතී 74, 76, 78, 82, 84, 88, 90
අජපාලනිග්‍රොධෙ 300, 330, 406
අඤ්ජනවනෙ 154
අනාථපිණ්ඩිකස්ස ආරාමෙ 2, 150, 292, 330, 386
අනුරුද්ධො 312, 314
අභයො 234
අම්බපාලිවනෙ 260
ආනන්දෙ 4, 8, 26, 280, 292, 306, 308, 314, 318, 384
ආපණං 396

උ

උක්කාවෙලා (නදී) 294
උණ්ණාභො (බ්‍රාහ්මණො) 384
උත්තියො 36, 298
උදායී 176, 178, 180
උපවානො 158
උරුවෙලකප්පං 400
උරුවෙලායං 300, 330, 406

ක

කණ්ටකිවනෙ 312, 314
කලන්දකනිවාපෙ 164, 166, 314, 318
කුක්කුටාරාමෙ 26, 306, 308
කුණ්ඩලියො (පරිබ්බාජකො) 154
කොටසිම්බලි 416
කොලියෙසු 218
කොසම්බියං 158, 394, 402
කොසලෙසු 264, 400

ග

ගඞ්ගා (නදී) 74, 76, 78, 82, 84, 88, 90, 118, 252, 340, 418. 420, 426, 438
ගිජ්ඣකූට පබ්බතං 166, 234, 238, 408

ඝො — පිට්ඨංකා

ඝොසිතාරාමෙ 158, 394, 402

ච

චණ්ඩාලවංසිකො 302
චිත්තපාටලි 416
චුන්දෙ 292

ජා

ජාණුස්සොණිං
ජෙතවනෙ 2, 150, 292, 330

තා

තාවතිංසානං 416

න

නන්දියො පරිබ්බාජකො 18
නාගරකං (සක්‍යානං නිගමො) 4
නාලන්දායං 286
නාළකගාමකෙ 292
නෙරඤ්ජරාය 300, 330, 406

පා

පාටලිපුත්තෙ 26, 28, 306,
පාරිච්ඡත්තකො 416
පාවාරිකම්බවනෙ 286
පිණ්ඩොලභාරද්වාජෙන 394
පිප්ඵලිගුහායං 164
පුබ්බකොට්ඨකෙ 388
පුබ්බාරාමෙ 384, 392
පූරණො කස්සපො 234

බ

බ්‍රහ්මා සහම්පති 300
බාහියො 298
බාළ්හා 164, 166
බෙලුවගාමකෙ 276

භ

භද්දෙ 26, 306, 308

ම පිටඅඞ්කා

මගධෙසු 292
මල්ලෙසු 400
මහාකස්සපො 164
මහාචුන්දො 166
මහාමොග්ගල්ලානො 166, 312
මහී 76, 78, 82, 84, 88, 90
මානදින්නො 318
මිගදායෙ 154; 386
මිගාරමාතුපාසාදෙ 384, 392
මෙදකථාලිකං 302

ය

යමුනා 74, 76, 78, 82, 84, 88, 90, 96

රා

රාජගහෙ 164, 166, 234, 314, 318, 408

ව

වජ්ජීසු 294
වෙසාලියං 260, 276
වෙළුවනෙ 164, 166

ස

සක්කෙසු 4
සඞ්ගාරවො (බ්‍රාහ්මණො) 228

ස

සරභූ 74, 76, 78, 82, 84, 88, 90
සහකො (භික්ඛු) 408
සහම්පති 332, 408
සාකෙතෙ 154, 312, 386
සාරිපුත්ත මොග්ගල්ලානෙසු 294
සාරිපුත්තො 6, 150, 158, 286, 292, 312, 388 396, 408
සාලායං (බ්‍රාහ්මණගාමෙ) 264, 400
සාවත්ථියං 2, 6, 8, 10, 12, 14 16, 18, 20, 22, 24, 30, 32, 34, 36, 38, 44, 58, 66, 74, 98, 140, 150, 210, 216, 280, 286, 292, 320, 330, 384, 388, 392, 410, 412, 426, 434
සිරිවඩ්ඪො 314
සුම්භෙසු 180, 302, 304
සූකරඛතායං 408
සෙතකං 180
සෙදකං (නිගම) 302, 304

හ

හලිද්දවසනං 218
හිමවතො 270
හිමවන්තං 140

# විසෙසපදානුක්කමණිකා


අ

අකනිට්ඨගාමී 150
අකිඤ්චනො 168
අකිලාසු 292
අකුසලරාසි 266
අඛාරිකෙහි 272, 274
අගාරිකභූතො 180
අචක්ඛුකරණා 194
අචිරපබ්බජිතා 264
අචිරපරිනිබ්බුතෙසු 294
අචිරවුට්ඨිතො 276
අච්චසරා 386
අච්ඡාදනස්ස 272, 274
අච්ඡෙජ්ජා 234
අජ්ඣත්තං 16
අජ්ඣත්තබහිද්ධා 262
අජ්ඣප්පත්තා 268
අජ්ඣාරූහා 192
අජ්ඣාරුළ්හා 192
අජ්ඣුපෙක්ඛිතා 148
අජ්ඣොසානා 178
අඤ්ඤං 148, 392
අඤ්ඤතිත්ථියා 10
අඤ්ඤා 240
අඤ්ඤාණකරණා 194
අඤ්ඤාණාය 234
අඤ්ඤාතාවින්ද්‍රියං 364
අඤ්ඤින්ද්‍රියං 364
අට්ඨිකත්වා 158, 190
අට්ඨිකසඤ්ඤා 240
අඩ්ඪමාසං 20
අත්තදීපා 278
අත්තවාදුපාදානං 132
අත්තසම්පදා 52, 54, 58, 62
66, 70.
අත්තසරණා 278
අතිවිජ්ඣ 398
අත්ථගමා 16
අත්ථවසං 394
අදස්සනාය 234
අදළිද්දා 198
අදීනමනසො 164
අද්ධානපරිඤ්ඤත්ථං 46
අද්ධානපරිඤ්ඤාය 412

අ

අධිගමාය 260
අධුනාගතා 264
අනඞ්ගණ 24
අනඤ්ඤසරණා 278
අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං 364
අනත්තසඤ්ඤා 246
අනනුස්සුතෙසු 320
අනන්තරං 278
අනපලොකෙත්වා 276
අනමතග්ගො 398
අනාගාමිතා 240
අනාධාරො 34
අනාවරණා 188, 192
අනාවිලා 234
අනික්ඛිත්තධුරො 350, 352
අනිච්චසඤ්ඤා 246
අනිබ්බානසංවත්තනිකා 194
අනිබ්බිද්ධපුබ්බං 178
අනීවරණා 188, 192
අනුක්කමමානො 290
අනුද්දයතාය 304
අනුප්පත්තසදත්ථා 266
අනුප්පත්තසදත්ථො 346, 348
අනුපක්කිලෙසා 188
අනුපබ්බජ්ජං 146
අනුපරියාය පථං 290
අනුපාදපරිනිබ්බානත්ථං 48
අනුබන්ධිතබ්බං 262
අනුබිජා 192
අනුමතෙසු 336
අනුසයසමුග්ඝාතත්ථං 44
අනුසයසමුග්ඝාතාය 46, 412
අනුස්සතිං 146
අනුස්සරිතා 352
අනෙළමූගො 198
අනොකං 168
අනොමජ්ජෙන්තා 384
අන්තරාපරිනිබ්බායී 148, 358, 414
අන්තරෙන ජනපදකල්‍යාණියා 304
අන්තරෙන මහාසමයං 304
අන්ධකරණා 194
අපතිජීවිතෙනා 154
අපත්ථද්ධා 268




Free Distribution www.aathaapi.org

අ


අපද 90
අපාරා 38, 168, 322
අප්පටිකූලසඤ්ඤී 224
අප්පටික්කූලෙ 224
අප්පටිවිජ්ඣිතො 224
අප්පණිධාය 284
අප්පණිහිතං 390 284
අප්පත්තමානසා 266
අප්පදලිතපුබ්බං 178
අප්පමාණො 152
අප්පමාදසමොසරණා 184
අප්පමාදසම්පද 52, 56, 60, 62
68, 70.
අප්පමාදෙ 98 406
අප්පාසසිකං 390
අබහුකතො 180
අබාහිරං 278
අබ්භාතං 322
අබ්භාචික්ඛාම 10
අබ්‍යාඝතනිමිත්තං 144, 204
අබ්‍යාපජ්ජන 220, 222
අබ්‍යාපජ්ඣං 176
අබ්‍යාපන්නචෙතසො 154
අබ්‍රහ්මචරියං 26
අභික්කන්තො 262
අභික්කමො 164
අභික්ඛණං 290
අභිජ්ඣා 134
අභිජ්ඣාදොමනස්සං 16, 156, 260
අභික්කන්තතරො 286
අභිනිවජ්ජෙත්වා 224
අභිප්පවුට්ඨානි 106
අභිප්පසන්නා 396
අභිසමිතො 180, 238
අභිහාරානං 272, 274
අමච්චා 338
අමතං 12, 324
අමතගාමිමග්ගො 12
අමතපරායණං 86, 122
අමතපරියොසානං 86, 122
අමතොගධං 86, 122
අම්බිලග්ගෙහි 272, 274
අමයා 186


අ


අයොනිසොමනසිකාර
බහුලීකාරො 202
අරති 142, 202
අරුණග්ගං 50, 52, 54, 56, 162,
200
අරූපරාගො 138
අරූපිනො 98
අලක්ඛිකා 268
අලොණිකෙහි 272, 274
අලොලජාතිකා 270
අලලාති 216, 218
අවචමානා 268
අවසෙඛානි 358
අවට්ඨිති 400, 402
අවිසාතපස්සියා 194
අවිජ්ජානුසයො 134
අවිජ්ජාසවො 338
අවිජ්ජොඝො 254, 344
අවිතක්ක අවිචාරා 214
අවිද්දසුනො 2
අවිනිපාතධම්මො 346, 366
අවිසයස්මිං 212, 216
අවිහඤ්ඤමානො 276
අවිහිංසාසඞ්කප්පො 14
අවූපසන්තො 20, 22
අවූපසමො 142, 202
අව්‍යාපාදසඞ්කප්පො 14
අසඞ්ඛාරපරිනිබ්බායී 148, 358
අසඞ්ඛිත්තං 284
අසඤ්ඤිනො 90
අසප්පුරිසතරං 34
අසප්පුරිසං 32
අසම්මොසාය 14, 352
අසල්ලීනං 146
අසංහාරියා 386
අසාතං 372, 374
අසිතෙ 262
අසුභනිමිත්තං 206
අසුභසඤ්ඤා 246
අසෙඛො 312
අස්සද්ධා 192
අස්සරතනස්ස 196
අස්සාසමත්තා 278
අහෙතු අප්පච්චයා 234

ආ

ආකාසානඤ්චායතනං 224
ආකිඤ්චඤ්ඤායතනං 226
ආගන්තුකාගාරං 116
ආචරියමුට්ඨි 278
ආචාරගොචරසම්පන්නො 336
ආචාරො 154
ආනාපි 16, 156, 260
ආදානපටිනිස්සග්ගෙ 168
ආදිච්චස්ස 200
ආදිච්චො 104
ආනාපානසති 244
ආබාධිකො 164
ආරද්ධවීරියො 350
ආරද්ධො 38, 170, 322
ආරම්භධාතු 144, 204, 206
ආරාධනො 32
ආරාමනිසාදී 154
ආලොකිතෙ 262
ආවරණා 190
ආවිලො 230
ආසනි (වාචා) 288
ආසීතියො 278
ආහාරට්ඨිතිකො 140
ආහාරසමුදයා 330
ආහාරෙපටිකූලසඤ්ඤා 246

ඉ

ඉට්ඨා 134
ඉත්ථත්තාය 180, 392
ඉත්ථින්ද්‍රියං 364
ඉත්ථිරතනස්ස 196
ඉදප්පච්චයා 152
ඉදංසච්චාභිනිවෙසො 134
ඉන්ද්‍රියවෙමත්තතා 356, 358
ඉන්ද්‍රියසම්පන්නො 362
ඉන්ද්‍රියසංවරො 154, 156
ඉන්ද්‍රියානි 346
ඉරියාපථෙ 162

උ

උක්කට්ඨිතො 228
උක්කුජ්ජාවකුජ්ජං 180
උක්ඛිත්තාසිකො 304
උච්චාරපස්සාවකම්මෙ 262
උජුකා 262

උ

උණ්හීසං 8
උත්තරාසඞ්ගං 332
උදකවානං 216
උදපත්තො 228
උදයත්ථගාමිනියා 352, 354, 356
උදුම්බරො 192
උද්දෙසං 212
උද්ධච්චකුක්කුච්චට්ඨානියානං 172
උද්ධච්චකුක්කුච්චනීවරණං 136
උද්ධච්චකුක්කුච්චපරියුට්ඨිතෙන 230, 236
උද්ධච්චකුක්කුච්ච පරෙතෙන 230, 236
උද්ධච්චං 138
උද්ධතං 216, 218
උද්ධම්භාගියානං 138, 344
උද්ධංසොතො 150
උද්ධංසොතො අකනිට්ඨගාමී 358
උද්ධුමාතකසඤ්ඤා 242
උපට්ඨිතස්සතිනො 396
උපඩ්ඪං 4
උපරික්ඛෙඩ 302
උපසමගාමිං 362, 410
උපහච්චපරිනිබ්බායී 148, 358
උපාදානක්ඛන්ධා 136
උපාදානානි 132
උපාදිසෙසෙ 240
උපාරම්භානිසංසං 154
උපාහනා 8
උපෙක්ඛකො 16
උපෙක්ඛා 244
උපෙක්ඛාචෙතොවිමුත්ති 222
උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගට්ඨානියා 144, 204
උපෙක්ඛාවෙදනියං 376
උපෙක්ඛාසතිපාරිසුද්ධිං 16
උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො 150
උපෙක්ඛින්ද්‍රියං 370, 376, 378
උම්මඞ්ගො 26, 306
උස්මා 378
උස්සදකජාතො 228
උස්සිතං 402
උළාරා 288

ඌ

ඌමිජාතො 230


Free Distribution www.aathaapi.org

ඒ

එකද්වාරං 290
එකත්තතඤ් ඡින්දය 170, 320
එකත්තගතො 196
එකංසො 288
එකායනො 26C, 332
එකොදිභාවං 16
එකොදිභූතා 264, 266
එළමූගො 198

ඔ

ඔකා 168
ඔඝා 132
ඔතාපයමානො 384
ඔතාරං 268, 270
ඔභග්ගවිභග්ගා 192
ඔරම්භාගියානි 136, 316, 318
ඔරම්භාගියානං 148
ඔවාදපතිකරා 296
ඔහිතභාරා 266
ඔහිතභාරො 346, 348
ඔහිතසොතො 190

ක

කච්ඡකො 192
කටුකගෙඟහි 272, 274
කට්ඨානි 216
කට්ඨානං 378
කණ්හසුක්කසප්පටිභාගා 142, 204
කණ්හං 168
කතකරණීයො 346, 348
කතිණ්ණං 392
කථාපාභතං 292
කන්තා 134
කපාලං 120
කපිඤ්ජකො 192
කම්මක්ඛයො 176
කරුණා 244
කලලීභූතො 230
කල්‍යාණමිත්තතා 4, 6, 50, 58, 60,66, 68, 162, 200.
කල්‍යාණසම්පවඞ්කතා 4, 6
කල්‍යාණසහායතා 4, 6
කල්‍යාණී 306,
කල්‍යාණී 26
කාමච්ඡන්දනීවරණං 136
කාමච්ඡන්දො 136
කාමරාගට්ඨානියානං 172
කාමරාගපරෙතෙන 228
කාමරාගානුසයො 134
කාමරාගපරියුට්ඨිතෙන 228
කාමාසවො 338
කාමූපසංහිතා 36, 134
කාමූපාදානං 132
කාමෙසනා 254
කාමොඝො 254, 344
කායකිලමථො 238
කායගන්ථො 134
කායපස්සද්ධි 144, 204
කායවූපකාසෙන 146
කායසම්ඵස්සජං 372, 374
කායානුපස්සී 16, 260
කායාරම්මණො 282
කාලානුසාරී 102
කාසිකං 104
කිලමථස්ස 118
කිංගතිකා 222, 224
කිංපරමා 222, 224
කිංපරියොසානා 222, 224
කිංඵලා 222, 224
කුඩ්ඩරාජානො 102
කුද්දාලපිටකං 118
කුහනාදියො 110, 140
කුම්භා 34
කුසලභාගියා 184
කුසලරාසි 266, 334
කුසලානි සීලානි 306
කුසසුබෙහ 110, 140
කූටනිත්තා 158
කූටපක්ඛාරා 158
කූටපොණා 158
කූටාගාරස්ස 102
කූටාගාරෙ 386

ඛ

ඛයන්තානි 396
ඛරො 276
ඛායිතෙ 262
ඛාරිකෙහි 272, 274
ඛීලා 128
ඛීණාසවා 168
ඛීණාසවො 346, 348

ග

ගඞ්ගාපෙය්‍යාලො 254
ගණ්ඩා 132
ගරුභාවනීයා 296
ගහපතිරතනස්ස 196
ගත්තාති 384
ගෙලඤ්ඤ 276
ගොපානසියො 102
ගොපානසීනං 402
ගොමයානි 216

ච

චක්කරතනස්ස 196
චක්කවත්තිස්ස 196
චක්ඛුකරණා 194
චක්ඛුවිඤ්ඤෙය්‍යා 36, 134
චණ්ඩාලවංසං 302
චතුප්පද 98
චන්දිමප්පභා 102
චිත්තකිලමථො 238
චිත්තපස්සද්ධි 144, 204
චිත්තවූපකාසෙන 146
චිත්තානුපස්සී 16, 260
චිත්තාරම්මණො 282
චිරකතං 352
චිරට්ඨිතිකො 306
චිරභාසිතං 352
චෙතොපරියඤාණං 288
චෙතොවිමුත්තිං 362

ඡ

ඡන්දපච්චයා 20, 22
ඡන්දවූපසමපච්චයා 22
ඡන්දසම්පද 52, 54, 58, 62, 66, 70
ඡන්නෙ 324

ජ

ජජ්ජරසකටං 278
ජනපදකල්‍යාණී 304
ජම්බුදීපකා 412
ජම්බු 412
ජාගරිතෙ 262
ජාතරූපස්ස 186
ජීවිතසඞ්ඛාරං 276
ජීවිතින්ද්‍රියං 364
ජුතිමන්තො 168

ඣ

ඣානෙසු 350

ඤ

ඤාණකරණා 194
ඤාණදස්සනට්ඨං 48
ඤායස්ස 260, 332
ඤායං 32

ත

තක්කරස්ස 170
තගර 164, 166, 168
තචං 402
තජ්ජං 376, 378
තණ්හක්ඛයාය 176
තණ්හා 130
තණ්හානිරොධාය 176
තප්පනාය 382
තදන්වයා 392
තන්දි 142, 202
තමතග්ගෙ 278, 294
තමතග්ගා 296
තමොකායස්ස 398
තාරකරූපානං 102
තිත්තකග්ගෙහි 272, 274
තිපු 186
තෙලප්පජ්ජොතං 18
තෙලපත්තො 304

ථ

ථනං 270
ථාමවා 350, 352
ථීනමිද්ධට්ඨානියානං 172
ථීනමිද්ධපරියුට්ඨිතෙන 230, 236
ථීනමිද්ධපරෙතෙන 230, 236

ද

දලිද්දෙ 198
දළ්හපරක්කමො 350, 352
දළ්හපාකාරතොරණං 290
දළ්හුද්දාපං 290
දයාදෙ 262
දිට්ඨධම්මසුඛවිහාරානං 274, 276
දිට්ඨානුසයො 134
දිට්ඨිසම්පද 52, 56, 60, 62, 68, 70
දිට්ඨුප්පාදනං 132
දිට්ඨොඝෙසො 254, 344

ද

දිපද 98
දීපො 388
දුක්ඛක්ඛයගාමී 170
දුක්ඛදුක්ඛතා 128
දුක්ඛසඤ්ඤා 246
දුක්ඛින්ද්‍රියං 370, 376, 378
දුග්ගා 270
දුප්පවත්තියො 34
දුබ්බලීකරණා 190
දුද්ධූපසමං 218
දුස්සකරණ්ඩකො 152
දුස්සමුට්ඨාපයං 216
දෙමනස්සවෙදනියං 376
දෙමනස්සින්ද්‍රියං 370, 376, 378
දෙවාරිකො 290
දෙසක්ඛයො 12, 26, 28, 40, 42
දෙසවිනය පරියොසානං 54, 56, 60, 64, 68, 70, 72
දෙසවිනයපරියොසානා 8
දෙසවිනයො 12

ධ

ධම්මදීපා 278
ධම්මන්වයො 290
ධම්මපරියායො 236, 238
ධම්මභොගං 292
ධම්මයානං 8
ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො 150
ධම්මසරණා 278
ධම්මානුග්ගහං 292
ධම්මානුපස්සී 16, 260
ධම්මානුසාරී 356, 358
ධම්මාරම්මණො 282
ධම්මොජං 292

න

නඞ්ගලකට්ඨකරණං 268
නවා 264
නාගා 110, 140
නානාච්චයෙහි 272, 274
නානත්තසඤ්ඤානං 224
නානාභාවා 378
නානාරතනානං 152
නාභිජ්ඣන්ති 154, 156
නාභිභාසන්ති 154, 156

න

නාසඤ්ඤිනො 98
නික්කඞ්ඛා 390
නික්ඛමධාතු 204, 206
නික්කුජ්ජිතං 18
නිග්‍රොධො 192
නිබ්බානගමා 18
නිබ්බානධාතුයා 12
නිබ්බානනින්නො 74, 252
නිබ්බානපබ්භාරො 74, 252
නිබ්බානපරායනා 18
නිබ්බානපරියොසානා 18
නිබ්බානපොණො 74, 252
නිබ්බානොගධං 386
නිබ්බිචිකිච්ඡා 390
නිබ්බෙධභාගියො 178
නිබ්බෙධාය 178
නිබ්බෙධිකාය 352, 354, 356
නිමිත්තං 272, 274
නිය්‍යානිකා 170, 300
නිය්‍යායනං 8
නිරාමිසා 146
නිරොධනිස්සිතං 4, 6, 18, 50, 52, 58, 66, 68
නිරොධසඤ්ඤා 246
නිස්සරණං 228
නිසා 130
නීලාය 228
නීවරණා 190
නෙක්ඛම්මසඞ්කප්පො 14
නෙවසඤ්ඤානාසඤ්ඤායතනං 382

ප

පච්චත්තං 158
පච්චත්තිමං 290
පච්චවෙක්ඛමානො 228
පච්චුපට්ඨිතො 272, 274
පච්ඡාතපෙ 384
පච්ඡාභත්තං 8
පද්ධූපිතො 270
පඤ්ඤාක්ඛන්ධං 292
පඤ්ඤානිරොධියා 192
පඤ්ඤාබලං 388
පඤ්ඤාවිමුත්තිං 262
පටිසඞ්ඛානෙන 262
පටිසඞ්ගමො 164

ප

පටික්කූලසඤ්ඤී 224
පටික්කූලෙ 224
පටිගච්ච 148, 294
පටිඝනිමිත්තං 142, 202
පටිඝසඤ්ඤානං 224
පටිඝානුසයො 134
පටිපද 12
පටිප්පණාමෙත්වා 276
පටිප්පස්සද්ධා 238
පටිභානං 26
පටිසරණං 384, 386
පටිසංහරාමි 282
පඨමාභිසම්බුද්ධො 20, 330
පඨවිං 106
පණිදහිතබ්බං 282
පතිසල්ලීයිතුං 20
පතොදලට්ඨි 8
පත්ථයමානා 296
පදජාතානි 100
පදෙසං 312
පදෙසෙන 20
පබ්බතරාජං 110
පබ්බතරාජානං 140
පබ්භාරො 384
පභස්සරං 186
පභඞ්ගු 186
පයිරුපාසනං 146
පරක්කමධාතු 144, 204, 206
පරමත්ථපච්චාකාරං 408
පරමපාසාවිනී 304
පරවිසයෙ 268
පරික්ඛීණභවසංයොජනා 266
පරික්ඛීණභවසංයොජනො 346, 349
පරිඤ්ඤෙය්‍යං 10
පරිඤ්ඤාතො 324
පරිඤ්ඤාය 36
පරිනායකරතනස්ස 196
පරිපුච්ඡා 26
පරිපූරකතා 356, 358
පරිබ්බාජකා 10
පරියාතාය 116
පරියොදාතා 24
පරිවිතක්කෙනා 300

පරිවීමංසං 146
පරිසාවචරො 154
පරිහාරෙතබ්බා 304
පරිළාහො 282
පලොකධම්මං 294
පවිචරතො 146
පවිචිනතො 146
පසාදනීයෙ 282
පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො 150
පසාරිතෙ 262
පහානසඤ්ඤා 246
පාකාරවිවරං 90
පාකාරසන්ධිං 290
පාචීනනින්නා 74, 252
පාචීනපබ්භාරා 74, 252
පාචීනපොණා 74, 252
පාචීනවාතපානා 386
පාටිකඞ්ඛං 4, 6
පාතිමොක්ඛසංවරසංවුතො 636
පාරඞ්ගමනාය 38
පාරං 168
පිණ්ඩපාතනීහාරකෙන 20, 22
පිණ්ඩපාතපටික්කන්තා 8, 210
පියරූපා 36, 136
පිලක්ඛො 192
පීතිසම්බොජ්ඣඞ්ගො 150
පීතිසම්බොජ්ඣඞ්ගට්ඨානීයා 144, 204
පීතිසුඛං 16
පීතෙ 262
පුග්ගලවෙමත්තතා 356, 358
පුප්ඵගන්ධිකා 102
පුබ්බෙනාපරං (විසෙසං) 280, 282
පුබ්බණ්හසමයං 150
පුරිසදම්මසාරථි 350
පුරිසින්ද්‍රියං 364
පුළවකසඤ්ඤා 242
පූතිකානි 116
පෙත්තිකෙ 268

ඵ

ඵලවෙමත්තතා 356, 358
ඵාසුවිහාරාය 242


Free Distribution www.aathaapi.org

### බ

බලං 110
බලකරණීයා 254
බහුකාරං බහුකාරො 58, 60, 62, 64
බහුපසද 98
බාළ්හගිලානො 164, 314
බිළාලනිස්සක්කමනමත්තං 290
බීජගාමා 108
බොජ්ඣඞ්ගා 140
බොධිපක්ඛියා 400
බොජ්ඣඞ්ගරතනානං 196
බ්‍යාපාදට්ඨානියානං 172
බ්‍යාපාදපරියුට්ඨිතෙන 228, 236
බ්‍යාපාදපරෙතෙන 228, 236
බ්‍රහ්මං 8
බ්‍රහ්මචරියපරියොසානං 2, 26, 28, 264
බ්‍රහ්මචරියෙසනා 254
බ්‍රහ්මචරියං 12
බ්‍රහ්මඤ්ඤං 40
බ්‍රහ්මඤ්ඤත්ථං 348
බ්‍රහ්මඤ්ඤඵලානි 40
බ්‍රහ්මයානං 8
බ්‍රහ්මයානරූපං 8
බ්‍රාහ්මණසම්මතා 348

### භ

භත්තසම්මදෙ 142, 200
භත්තු 272, 274
භද්දකො 26
භණන්තා 230
භයදස්සාවී 336
භවරාගානුසයො 134
භවාසවො 338
භවෙසනා 254
භවොඝො 254, 344
භික්ඛුනුපස්සයො 280
භූතපාතරාසස්ස 154
භූතගාමා 108
භූතපුබ්බං 408

### ම

මක්කටචීරීසු 270
මක්කටානං 270
මග්ගභාවනාය 16
මග්ගො 12
මඞ්කු 156
මච්චුධෙය්‍යා 168
මච්චුධෙය්‍යස්ස 298
මජ්ඣන්තිකං 150
මඤ්ජෙට්ඨාය 228
මණිරතනස්ස 196
මධුරකජාතො 278, 292
මධුරගෙහි 272, 274
මනොසම්ඵස්සජං 272, 374
මමුද්දෙසිකො 278
මරණසඤ්ඤා 246
මලං 128
මහග්ගතං 176
මහග්ගතෙන 220, 222
මහන්තත්තං 140
මහාකායා 192
මහානදියො 110
මහාපුරිසො 286
මහාභිඤ්ඤතං 314
මහාසමුද්දං 110
මහාසොබ්භා 110, 140
මානානුසයො 134
මානො 138
මාරණන්තිකා 276
මාරසෙනප්පමද්දනං 196
මිච්ඡාඤාණී 34
මිච්ඡාදිට්ඨිපච්චයා 20
මිච්ඡත්තං 30
මිච්ඡාපටිපත්තාධිකරණහෙතු 32
මිච්ඡාපටිපත්ති 38
මිච්ඡාපටිපදං 30
මිච්ඡාපටිපන්නො 32
මිච්ඡාපණිහිතං 16
මිච්ඡාමග්ගො 26
මිච්ඡාවිමුත්ති 34
මුඛනිමිත්තං 228
මුඛවාතං 216
මුණ්ඩා 120
මුදිතා 244
මුදිතාචෙතොවිමුත්ති 222
මූලගන්ධා 102
මූලජාතා 386
මෙත්තචිත්තතාය 304
මෙත්තා 214
මෙත්තාචෙතොවිමුත්ති 206, 222, 224
මොඝපුරිසානං 290
මොහක්ඛයො 12, 26, 28 40, 42

ම

මොහවිනයපරියොසානං 8, 54, 56, 60, 64, 68, 70, 72
මොහවිනයො 12

ය

යංගතිකානි 404
යථාකාමකරණීයො 270
යථාභිරන්තං 276
යථාසන්දිට්ඨං 276
යථාසම්භතං 276
යවසූකං 16, 112
යානිකතා 304
යොගක්ඛෙමාය 242, 250
යොනිසොමනසිකාරො 162, 200
යොනිසොමනසිකාර සම්පද 52, 56, 60, 64, 68, 70
යොනිසොමනසිකාරසමොසරණා 184
යොගා 132
යොබ්බඤ්ඤ 384

ර

රජනීයා 36, 134
රජොජල්ලං 114
රස්මි 386
රස්මියො 8
රාගක්ඛයො 12, 26, 28, 40, 42
රාගවිනයපරියොසානා 8
රාගවිනයපරියොසානං 54, 56, 60, 64, 68, 70, 72
රාගවිනයො 12
රාගවිරාගත්ථං 44
රාගවිරාගාය 44
රූපරාගො 138
රූපසඤ්ඤානං 224
රූපිනො 98

ල

ලාබාය 228
ලාපං (සකුණං) 268
ලීනං 158, 216
ලුද්ද 270
ලුළිතො 230
ලෙඩ්ඩුට්ඨානං 268
ලෙපං 270

ල

ලොකවිදූ 350
ලොණිකෙහි 272, 274
ලොහං 186
ලොහිත චන්දනං 102, 406

ව

වජ්ජෙසු 336
වත්ථුකතා 304
වයධම්මානුපස්සී 326
වලිජාතානි 384
වස්සිකං 102
වළභිරථෙන 8
වාතෙරිතො 230
වාදානුවාදෙ 10
වාලවීජනියා 8
විගතූපක්කිලෙසා 24
විඝාතපක්ඛියා 194
විඝාතස්ස 118
විඝාතං 212, 216
විචිකිච්ඡා 136
විචිකිච්ඡානුයොගො 134
විචිකිච්ඡාට්ඨානියානං 172
විචිකිච්ඡාට්ඨානියා 142, 202
විචිකිච්ඡාපරියුට්ඨිතෙන 230, 234
විචිකිච්ඡාපරෙතෙන 230, 234
විච්ඡිද්දකසඤ්ඤා 242
විජම්භිකා 142, 202
විජ්ජා 138
විජ්ජාචරණසම්පන්නො 350
විජ්ජාවිමුත්තිඵලසච්ඡිකිරියාය 188, 192, 234
විජ්ජාවිමුත්තිඵල සච්ඡිකිරියත්ථං 46
විජ්ජාවිමුත්තිඵලානිසංසො 154
විඤ්ඤාණඤ්චායතනං 226
විඤ්ඤාපකො 292
විතක්කස්ස පච්චයා 20, 22
විතක්කවූපසමපච්චයා 22
විද්දසුනො 2
විදිතා 322
විධා 196
විනීලකසඤ්ඤා 242
විනික්ඛෙපා 378
විමුත්තායතනා 286
මිමුත්තිඤාණදස්සනසම්පන්නා 146
විමුත්තිඤාණදස්සනක්ඛන්ධං 292


T-29B

ව

විමොක්ඛං 224
විපත්තිකා 192
විපරිණාමදුක්ඛතා 128
විප්පටිසාරිනො 284
විප්පසන්නෙන 234
විරද්ධා 38, 170, 322
විරාගනිස්සිතං 4, 6, 18, 50, 52, 58, 66, 68
විරාගසඤ්ඤා 246
විරියබලං 388
විරියසම්බොජ්ඣඞ්ගො 150
විවෙකජං 16
විවෙකනිස්සිතං 4, 6, 18, 50, 52, 58 ,66, 68
විලොකිතෙ 262
විවිච්ච 16
විහාරපච්ඡායායං 276
වුසිතවා 346, 348
වූපකට්ඨා 262, 146
වූපසන්තො 20, 22
වෙතනස්ස 272
වෙත්තබන්ධන බද්ධාය 116
වෙදනා 130
වෙදනානුපස්සී 16, 260
වෙදනාරම්මණො 282
වෙදයිතං 20
වෙපුල්ලත්තං 140
වෙය්‍යාකරණෙන 212, 216
වොමිස්සකෙන 278
වොස්සග්ගපරිණාමිං 4, 6, 18, 50, 52, 58, 66, 68
වොස්සග්ගාරම්මණං 352, 356, 396
ව්‍යාපාදෙ 134, 136
ව්‍යාපාදනීවරණං 136
ව්‍යාකරමානා 10

ස

සඋපනියං 34
සක්කායදිට්ඨි 136
සකුණග්ඝි 268
සඞ්ඛාරදුක්ඛතා 128
සඞ්ගාමවිජයො 8
සඞ්ඝට්ටනසමොධානා 378
සඞ්ඝාටිපත්තචීවරධාරණෙ 262
සජ්ඣායකතා 228
සජකඩු 186
සඤ්ඤාපච්චයා 20
සඤ්ඤාවූපසමපච්චයා 22
සඤ්ඤාවෙදයිතනිරොධං 382
සඤ්ඤිනො 98
සණ්ඨිති 400, 402
සතිනෙපක්කෙන 352, 354
සතිපට්ඨානා 154, 260
සතිපට්ඨානභාවනාගාමිනී පටිපදං 326
සතිබලං 388
සතිසම්පජඤ්ඤස්ස 274, 276
සතිසම්බොජ්ඣඞ්ගට්ඨානියා 142, 202
සතිසම්බොජ්ඣඞ්ගො 150
සතො 260
සද්ධම්මපරිහානං 308
සද්ධානුසාරී 356, 358
සද්ධාබලං 388
සද්ධාය 390
සද්ධින්ද්‍රියං 348, 350
සද්ධින්ද්‍රියසමුදයං 348, 350
සද්ධින්ද්‍රියනිරොධං 348, 350
සද්ධින්ද්‍රියනිරොධගාමිනිපටිපදං 348, 350
සන්තාපෙතා 228
සන්දස්සෙතා 292
සන්ධාවතං 398
සපත්තිකස්ස 410
සප්පුරිසං 32
සප්පුරිසතරං 34
සපරික්ඛාරං 34
සබ්බත්තතාය 220, 222
සබ්බජීකං 218, 222
සබ්බධි 220, 222
සබ්බලොකෙ අනභිරතසඤ්ඤා 246
සබ්බසඞ්ඛාරසමථො 398
සබ්බසෙතෙන 8
සබ්බාවන්තං 220, 222
සබ්බූපධිපටිනිස්සග්ගො 398
සමණසම්මිතා 348
සමණුද්දෙයො 292
සමත්තං 312

ස

සමතික්කමා 224
සමතිත්තිකො 304
සමථනිමිත්තං 144, 204
සමනුපෙක්ඛ 168
සමාදපකො 292
සමාධික්ඛන්ධං 292
සමාධිබලං 388
සමාධිසම්බොජ්ඣඞ්ගො 150
සමාහිතා 264
සමුත්තෙජකො 292
සමුද්දනින්නා 76
සමුද්දපබ්භාරා 76
සමුද්දපොණා 76
සමුදයධම්මානුපස්සී 326
සමොධානං 204
සම්පජානකාරී 262
සම්පජානො 16, 156, 262
සම්පරිවත්තෙන්තො 180
සම්පසාදනං 16
සම්පහංසකො 292
සම්බොධගාමිං 362, 410
සම්බොධිපරායණො 346, 366
සම්මත්තං 30
සම්මදක්ඛාතෙ 168
සම්මදක්ඛාතො 164
සම්මදඤ්ඤාවිමුත්තො 266, 346, 348
සම්මප්පධානෙසු 350
සම්මප්පධානා 426
සම්මප්පධානෙ 356
සම්මාඤාණී 34
සම්මාදිට්ඨිං 98, 100
සම්මාදිට්ඨිපච්චයා 20
සම්මාදිට්ඨිවූපසමපච්චයා 22
සම්මාදුක්ඛක්ඛයගාමිනියා 352, 354, 356
සම්මාදුක්ඛක්ඛයගාමී 38
සම්මාපණිහිතාය 16, 18
සම්මාපටිපත්ති 38
සම්මාපටිපදං 30
සම්මාපටිපන්නානං 38
සම්මාවිමුත්ති 34
සම්මාසඞ්කප්පො 14
සම්මිඤ්ජිතෙ 262
සරදසමයෙ 104

ස

සරිතා 352
සවිචාරං 16
සවිතක්කං 16
සවිතක්කසවිචාරා 214
සසඞ්ඛාරපරිනිබ්බායී 150, 358
සහධම්මිකො 10
සහෙතුසප්පච්චයා 234, 236
සංයොජනප්පහානත්ථං 44
සංයොජනප්පහානාය 412
සංයොජනවිනිබන්ධා 178
සංයොජනානි 136, 138
සංයොජනියානං 178
සංවෙගාය 242
සංසට්ඨා 228
සංසරතං 398
සාතං 372, 374
සාධාරො 34
සාමඤ්ඤං 40
සාමඤ්ඤත්ථං 40, 348
සාමඤ්ඤඵලානි 40
සාමුද්දිකාය 116
සායන්හසමයං 150
සාරගන්ධා 102, 406
සාරවන්තො 294
සාලිසූකං 16, 112
සාලොහිතා 338
සාවජ්ජානවජ්ජා 142, 204
සාසනකරා 296
සාසවෙසු 406
සිථිලානි 384
සීලං 106
සීලක්ඛන්ධං 292
සීලබ්බතපරාමාසො 134, 136
සීලබ්බතුපාදානං 132
සීලසම්පදා 50, 54, 58, 62 66, 70
සීසං 186
සීහනාදෙ 288
සුක්කං 168
සුඛානි 216
සුඛවිහාරී 16
සුඛින්ද්‍රියං 370, 376, 378
සුගතවිනයො 24
සුඤ්ඤාගාරගතො 180
සුපණ්ණානං 416

ස

| | |
|---|---|
| සුප්පටිවිනීතං | 158 |
| සුප්පවත්තියො | 31 |
| සුභනිමිත්තං | 140, 202 |
| සුභපරමං | 224 |
| සුවූපසමං | 218 |
| සුසණ්ඨිතං | 154 |
| සුසමාරද්ධා | 152 |
| සුසමුට්ඨාපයං | 216 |
| සුසමූහතං | 158 |
| සූදෙ | 272 |
| සූපට්ඨිතචිත්තා | 280, 330 |
| සූපට්ඨිතචිත්තො | 290 |
| සූපෙය්‍යං | 272, 264 |
| සූරියෙන | 400 |
| සෙඛො | 22, 312 |
| සෙවාලපණකපරියොනද්ධා | 230 |
| සොකපරිද්දවානං | 260, 332 |
| සොතාපත්තිඅඞ්ගෙසු | 350 |
| සොමනස්සවෙදනීයං | 376 |
| සොමනස්සින්ද්‍රියං | 370, 376, 378 |

හ

| | |
|---|---|
| හත්ථිපදං | 100 |
| හත්ථිරතනස්ස | 196 |
| හලිද්දියා | 228 |
| හීනප්පණීතා | 142, 204 |


Free Distribution www.aathaapi.org